2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.07.25 වේලාව :- ප.ව. 10.20

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා ,ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා, චතුරංග බණ්ඩාර මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතීඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

01.	සම්පූර්ණ නම	:	පනාවලගේ මේනක මධුෂංක පෙරේරා
02.	වයස	:	අවුරුදු 32 යි
03.	ජාතිය	:	සිංහල
04.	ආගම	:	බෞද්ධ
05.	තනතුර	:	උප පොලිස් පරීක්ෂක
06.	රැකියා ස්ථානය	:	රාජ්‍ය බුද්ධි සේවාව

(සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි)

රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා :

ප්‍ර : පෙරේරා මහතා ඔබගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මෙම ගරු කොමිෂන් සභාව පොඩ්ඩක් දැනුවත් කරන්න.

පි : මම සාමාන්‍ය පෙළ A-8 යි, B-1 යි, C-1 යි. A/L වලට A-3 යි. ඊට පස්සේ උපාධිය රුහුණු විශ්ව විද්‍යාලයෙන් කළමනාකරණ පිළිබඳව විශේෂවේදී උපාධියක් ලබා ගත්තා.

ප්‍ර : ඔබ පොලිස් සේවයට බැඳුණේ කුමන වසරේද? කුමන තනතුරක් යටතේද?

පි : 2011.10.01, ආධුනික උප පොලිස් පරික්ෂක විදියට තමයි රාජකාරියට බැඳුණේ.

ප්‍ර : ඊට පස්සේ ඔබ යම්කිසි මුලික පුහුණුවක් ලැබුවද? ඒ කොහේද?

පි : කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පොලිස් නිලධාරියෙක් විදියට පුහුණුව ලැබුවා.

ප්‍ර : මුලික පුහුණුව ලැබීමෙන් පසුව ඔබ යම්කිසි ස්ථානයකට රාජකාරී වාර්තා කළාද?

පි : ඔව්. රාජ්‍ය බුද්ධි සේවාවට 2013 වර්ෂයේ රාජකාරී වාර්තා කළා.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවයට ඔබ රාජකාරී වාර්තා කිරීමෙන් පසු ඔබ එහිදී යම්කිසි පුහුණුවක් ලබා ගත්තාද?

පි : සති දෙකක මුලික බුද්ධි පාඨමාලාවකට සහභාගී වුණා.

ප්‍ර : ඊට පසුවත් ඔබ යම්කිසි පුහුණු පාඨමාලාවල යෙදුණාද?

පි : විවිධ අවස්ථාවලදී පුහුණු පාඨමාලාවලට සහභාගී වෙලා තියෙනවා.

ප්‍ර : සති දෙකක පුහුණුවීමෙන් පසු ඔබ අනුයුක්ත වුණේ රාජ්‍ය බුද්ධි සේවයේ කුමන අංශයටද?

පි : රාජ්‍ය බුද්ධි සේවාවේ QA අංශයට තමයි අනුයුක්ත වුණේ.

ප්‍ර : එහිදී ඔබට පැවරී තිබුණු රාජකාරිය මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහිදී QA අංශයෙන් මුස්ලිම් අන්තවාදී හා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සම්බන්ධව තමයි විමර්ශන කටයුතු සිදු කළේ. ඊට අදාළව සිදු කළ විමර්ශනය කටයුතුවලට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම තමයි මගේ රාජකාරිය වුණේ.

ප්‍ර : පෙරේරා මහතා ඔබ ඔය අංශයේ කොපමණ කාලයක් රාජකාරී කළාද?

පි : මම 2013 වර්ෂයේ ඇවිල්ලා QA අංශයේ රාජකාරී කරලා 2014 වසරේ මම ස්ථාන මාරුවීම් ලබා අක්කරෙයිපත්තු ප්‍රදේශයට යනවා. එතකම් එම අංශයේ රාජකාරි කරනවා.

ප්‍ර : ඔබ දැන් ප්‍රකාශ කළා ඔබ අක්කරපත්තු ප්‍රදේශයට 2014 ජනවාරී මාසේ 14 වෙනිදා යනවා කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එහිදී ඔබට පැවරිච්ච රාජකාරිය කුමක්ද?

පි : එහිදී අක්කරපත්තු දිසා බුද්ධි සේවා බල ප්‍රදේශයේ තියෙන තිරුක්කෝවිල් සහ අක්කරපත්තු පොලිස් බල ප්‍රදේශවල තියෙන ජාතික ආරක්ෂාවට වැදගත් වන බුද්ධි තොරතුරු රැස් කිරීම තමයි මගේ රාජකාරිය වුණේ.

ප්‍ර : ජාතික ආරක්ෂාවට කියන්නේ කොයි වගේ බුද්ධි තොරතුරුද ඔබ ඔය අක්කරපත්තු ස්ථානාධිපති වශයෙන්, බුද්ධි ස්ථානාධිපති වශයෙන් කටයුතු කරන කාලයේ රැස් කරගත් තොරතුරු මොනවද? කෙටියෙන් පොඩි පැහැදිලි කිරීමක් කරන්න?

පි : කෙටියෙන් පැහැදිලි කරනවා නම් ස්වාමිනි දෛනිකව සිදුවන සිදුවීම් ක්‍රියාකාරකම්. එතකොට මොනවා හරි සොයා ගැනීම්, වැටලීම්, සිදු කිරීම් ජාතික ආරක්ෂාව වෙනුවෙන් ඕනම තොරතුරක් සම්බන්ධව වාර්තා කරනවා.

ප්‍ර : අක්කරපත්තු පොලිස් ස්ථානයට අනුයුක්තව ඔබ කටයුතු කිරීමෙන් පසු ඔබ එම ස්ථානයේ කොච්චර කල් සේවය කළාද?

පි : අවුරුද්දයි මාස පහක් වගේ කාලසීමාවක් සේවය කරලා තියෙනවා අක්කරපත්තු.

ප්‍ර : ඊට පස්සේ ඔබ වෙනත් ස්ථානයකට ස්ථාන මාරුවීමක් ලැබුවද? ඒ කොහේටද?

පි : නැවතත් ස්වාමීනි මම එවකට H කොට්ඨාශය යටතෙම HQ 1 අංශයට නැවතත් මම ස්ථාන මාරුවීම් ලබලා ආවා. ඒ වෙනකොට HQ අංශය කියන්නේත් මම පෙර රාජකාරී කරපු QA කියන අංශයම තමයි.

ප්‍ර : ඒ කොයි කාලයේ විතරද ඔබ නැවත ඔය අංශයට යොමු වන්නේ?

පි : 2015 වර්ෂයේ ස්වාමීනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : 2015 වර්ෂයේ ඔබ නැවතත් ඔබ පෙර සිටි අංශයට රාජකාරී වාර්තා කිරීමෙන් පසු ඔබට පැවරී තිබුණු රාජකාරී ඒ ආකාරයෙන්, ඒ කියන්නේ ඔබ ඉස්සරලා සඳහන් කළා ගරු කොමිෂන් සභාවට ඔබ පළමුව පත් වෙන්නෙත් ඔය අංශයටම කියලා?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : එම රාජකාරියමද ඔබට පැවරී තිබුණේ?

පි : එම රාජකාරියම තමයි පැවරී තිබුණේ.

ප්‍ර : 2015?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඔබ 2015 රාජකාරී මුස්ලිම් අන්තවාදය පිළිබඳ කරුණු නැත්නම් සොයා ගැනීම් ඉටු කෙරුවද?

පි : ඉටු කෙරුවා ස්වාමිනි.

ප්‍ර : මොනවද ඔබ 2015 නැවත ඔය කොට්ඨාශයට ආවට පස්සේ ඔබ ලබාගත් නැත්නම් හොයාගත් තොරතුරු?

පි : ස්වාමීනි 2015 න් පස්සේ විවිධ බුද්ධි තොරතුරු ඒ කියන්නේ සමාජ ජාලා හරහා කරන බුද්ධි තොරතුරු එකතු කරන්න පටන් ගත්තා. ඊට පස්සේ අන්තර්ජාලය හරහා විවිධ තොරතුරු එකතු කරන්න පටන් ගත්තා. ඒ වෙනකොට 2014.06.26 පස්සේ IS ත්‍රස්තවාදී සංවිධානය ක්‍රියාත්මක වීමත් සමඟ ඒකේ ජාත්‍යන්තර බලපෑම ශ්‍රී ලංකාවට ව්‍යාප්ත වුණේ කොහොමද කියන එක සම්බන්ධව පවා අන්තර්ජාලය ඔස්සේ විවිධ තැන්වලින් සොයා බලා පරීක්ෂණ කරලා ඒවා සම්බන්ධව වාර්තා කරලා තියෙනවා.

ප්‍ර : ඔබ දැන් සඳහන් කළා IS මතවාදය ගැන. ඔය IS මතවාදය කුමන වර්ෂයේ සිටද ඔබ සොයා ගැනීමකට ලක් කළේ?

පි : ස්වාමීනි 2014.06.29 වන දින IS මතවාදය කියන එක IS සංවිධානයේ කැලිඟට් එකක් නැත්නම් IS සංවිධානය බිහි කිරීමත් සමඟ ඒ මතවාදය ලෝකය පුරා ව්‍යාප්ත වෙන්න පටන් ගත්තා. ඒ එක්කම තමයි ඒ සම්බන්ධව හොයන්න බලන්න පටන් ගත්තේ.

ප්‍ර : ඔය IS මතවාදය ලංකාවට බලපෑමක් ඇති කරන්න පටන් ගත්තේ කුමන වසරේද කියලා ඔබට දැනුමක් තියෙනවද?

පි : ලංකාවට බලපෑමක් කරනවා කියන්නේ 2015.07.02 IS සංවිධානයට ගිය සාමාජිකයෙක් ලංකාවේ ඉඳන් ගිය සාමාජිකයෙක් මිය යනවා. මොහොමඩ් මුසීන් සෆ්‌රාස් නිලාම් කියලා. එතකොට ඒ ලංකාවේ පුද්ගලයෙක් IS සංවිධානයට ගිහිල්ලා මිය ගියා කියන්නේ ඒ බලපෑම ලංකාවට ඇවිත් කියන එක තමයි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : ඔබ ඔය IS මතවාදය සංකල්පය පිළිබඳ තොරතුරු රැස් කර ගත්තේ කුමන ආකාරයටද?

පි : බහුතරයක් කළේ අන්තර්ජාලය හරහා තමයි ස්වාමීනි.

ප්‍ර : අන්තර්ජාලය කිව්වහම ඔබ අන්තර්ජාලයේ යම්කිසි සමාජ මාධ්‍යය භාවිතා කළාද නැත්නම් ඔය සාමාන්‍යයෙන් අපි කරන Google Search ඒ වගේ අපිට පොඩ්ඩක් පැහැදිලි කරන්න ගරු කොමිෂන් සභාවට ඔබ ඔය IS මතවාදය පිළිබඳව නැවත ඔබ ඔය අංශයට වාර්තා කිරීමෙන් පසු කොහොමද දත්ත රැස් කරගත්තේ කියලා ඔබේ රාජකාරී කටයුතු සඳහා?

පි : ස්වාමීනි මූලික වශයෙන් අන්තර්ජාලයේ Google යෙදවුම ඔස්සේ වුණත් IS සංවිධානයේ නැවත යාවත්කාලීන සිදු කරන වෙබ් අඩවි තියෙනවා. ඒවා පරිශීලනය කරන්න පුළුවන්. ඊට අමතරව විවිධ ආයතනවලින් කරන විශ්ලේෂණ වාර්තා දාන Web පිටු තියෙනවා. ඒවා පරිශීලනය කරන්න පුළුවන්. ඊට අමතරව පසුකාලීනව IS සංවිධානය සමාජ මාධ්‍යය ඔස්සේ විවිධ ප්‍රචාරණයන් කරලා, ඒ ප්‍රචාරණයන් ව්‍යාප්ත කරලා මිනිසුන් ආකර්ශනය කර ගන්න හදනකොට ඒගොල්ලෝ ඒ කාලසීමාවල තිබුණු සමාජ ජාලා මෘදුකාංග යොදා ගන්න ගත්තා. ඒ සමාජ ජාලා මෘදුකාංගත්, Facebook, WhatsApp ඒ වගේ සමාජ ජලා මෘදුකාංග, Telegram වගේ මෘදුකාංග ගැන අවබෝධයෙන් ඒවා ගැන පරීක්ෂා කරලා බැලුවා ස්වාමීනි.

දැන් වේලාව : ප.ව. 10.30 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව රාත්‍රී 10.30 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා:</u>

ප්‍ර : දැන් ඔබ සමාජ ජාලා භාවිතා කලා. ඔබ භාවිතා කරපු සමාජ ජාලා මොනවද?

පි : මම ඒ සඳහා Facebook, Telegram ආදී සමාජ ජාලා පරිශීලනය කරලා තියෙනවා.

ප්‍ර : Facebook එකේ ඔබට ගිණුමක් තිබ්බද?

පි : Facebook එකේ මට පෞද්ගලික ගිණුමක් තිබුණා. ඊට අමතරව සමාජ ජාලා පරිශීලනය කරන කොට ඒවා භාවිතා කරන්න ව්‍යාජ ගිණුම් කිහිපයක් පවත්වාගෙන ගියා ස්වාමිනී.

ප්‍ර : ඔබට ඔය Facebook ගිණුම හරහා IS අන්තවාදී මත දරන පුද්ගලයන් පිළිබඳව තොරතුරු රැස්කර ගැනීමට හැකියාවක් තිබ්බද?

පි : හැකි වුණා ස්වාමිණී.

ප්‍ර : ඒ පුද්ගලයන් ලංකාවේ සිටින පුද්ගලයන්ද?

පි : ලංකාවේ සිටින පුද්ගලයන්.

ප්‍ර : ඒ වගේම ඔබ කතා කලා Telegram ගැන?

පි : ඔව් ස්වාමිණී.

ප්‍ර : ඔය Telegram කියන්නේ කුමක්ද කියලා ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න?

පි : Telegram කියන්නේ ස්වාමිණී 2016 න් වගේ පස්සේ IS සංවිධානය භාවිතා කරන්න ගත්ත අපිත් භාවිතා කරන Whatapp, viber වගේ එක මෘදුකාංගයක් පමණයි. ඒ මෘදුකාංගයේ තියෙන ආරක්ෂක ක්‍රමවේදය හින්දා ඒ මෘදුකාංග IS ත්‍රස්තවාදී සංවිධානය ඒගොල්ලන්ගේ ප්‍රචාරයන් සඳහා භාවිතා කළා. ඒකේ තියෙනවා විවිධ උපාංග, ඒවායෙන් පුළුවන් අපි යොදන message එකක් හරි, ඒ message එකක් ඉක්මන් කාලයකින් විනාශ වෙන්න, ඒවගේම හදන channel එකක් ඉක්මණින් විනාශ ආකාරයේ ඒවා කරන්න පුළුවන්කම තිබුණා. ඒ වගේම විශාල ප්‍රමාණයේ Video පට මුදා හැරලා කියන්නේ Film එකක් තරම් විශාල ලොකු මෙගාබයිට් ගානක් යන එකක් වුණත් ඒක හරහා ලේසියෙන් ප්‍රචාරය කරන්න පුළුවන් හැකියාව තිබුණා. අපි සාමාන්‍යයෙන් දෛනිකව භාවිතා කරන මෘදුකාංගවලට වඩා ඒකේ විශේෂිත ආරක්ෂිත ක්‍රමවේද තිබුණා ස්වාමිණී.

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ ඔය සඳහන් කළ ආකාරයට ඔබ Telegram කියන ගිණුම, ඒකට ගිණුමක්ද කියන්නේ?

පි : ගිණුමක් කියන්නේ ස්වාමිණි.

ප්‍ර : ඒකක් ඔබ පාවිච්චි කරලා තියෙනවා?

පි : පාවිච්චි කරලා තියෙනවා.

ප්‍ර : මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න ඔබ Telegram ගිණුමේ ඔබ යම්කිසි Profile එකක් ඔබට ආවේණික Profile එකක් තමාගේ නමට සඳහන් කර ගත් Account එකක් සාදාගත් ආකාරය?

පි : Telegram කියන මෘදුකාංගය මගේ phone එකේ download කරලා ඒකට මගේ දුරකථනය යොදලා

ප්‍ර : ඔබගේ දුරකථනයට බාගත කිරීමක් කරනවා?

පි : බාගත කිරීමක් කරනවා.

ප්‍ර : ඒ දුරකථනය ඔබගේ පෞද්ගලික ජංගම දුරකථනයද?

පි : මගේ පෞද්ගලික දුරකථනය.

ප්‍ර : ඔබ කුමන වසරේද පළවෙනියාටම ඔය Telegram කියන, ඔබට මතකයක් තිබෙනවද ඔය Telegram කියන App එක කවද්ද download නැත්නම් බාගත කිරීමක් කලේ කියලා?

පි : හරියටම දිනය මතක නැහැ ස්වාමිණී.

ප්‍ර : ඔබ බාගත කිරීමෙන් පසු මොකක්ද ඔබ ගත්ත ක්‍රියාමාර්ගය ඕකෙන් කොහොමද ඕකේ රෙජිස්ට්‍රර් වුණේ?

පි : බාගත කිරීමෙන් පසු අපේ දුරකථන අංකය යෙදුවට පස්සේ දුරකථන අංකයට message එකක් එනවා ඊට අදාල අංකයක්. ඒ අංකය install කලාම ඒ මෘදුකාංගය භාවිතා කරන්න පුළුවන්. ඊට පස්සේ ඒකේ user name එකක් අහනවා ස්වාමිණි.

ප්‍ර : ඔබ දැන් කිව්වා දුරකථන අංකයක් දැම්මා කියලා?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඔය දාපු දුරකථන අංකය?

පි : 071-5344512

ප්‍ර : මේ ඔබගේ පෞද්ගලික දුරකථන අංකය?

පි : පෞද්ගලික දුරකථන අංකය.

ප්‍ර : ඔබට යම්කිසි මතකයක් තියෙනවද පළමුවන සැරේට ඔය Telegram කියන App එක බාගත කිරීමෙන් පසු ඔබ පාවිච්චි කරපු දුරකථන ජාතිය? මතකයක් තියෙනවද නැද්ද?

පි : මතකයක් නැහැ ස්වාමිණී

ප්‍ර : ඊට පස්සේ ඔබ download කර ගත්තා ඔබගේ ජංගම ගිණුම ඒකේ ඇතුලත් කළා ඊට පස්සේ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඊට පස්සේ සමහර Telegram ගිණුම් සම්බන්ධව තියෙන ඒවා Facebook හරහා අන්තවාදී මතවාදී දරන පුද්ගලයින්ගේ Facebook වල හුවමාරු කරනවා ඒගොල්ලන්ගේ...

ප්‍ර : ඊට ඉස්සෙල්ලා මට දැන ගන්න ඕනේ පෙරේරා මහත්මා ඔබ ඔබගේ දුරකථන අංකය ඇතුලත් කලා?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ දුරකථන අංකය විතරද ඇතුලත් කරන්නේ?

පි : දුරකථන අංකය ඇතුලත් කරලා මගේ නම යොදන්න තියෙනවා First name and last name කියලා.

ප්‍ර : ඔබ මොකක්ද යොදා ගත්ත පළමු නම සහ අන්තිම නම?

පි : First name එකට සොනික් කියලා යෙදුවා. Second name එකටත් සොනික් කියලා යෙදුවා.

ප්‍ර : ඒ නම ඔබ යෙදීමට හේතුව?

පි : මම සාමාන්‍යයෙන් ව්‍යහාරයේ ඒක භාවිතා කරන හින්දා ඒක යෙදුවා.

ප්‍ර : ඊට පස්සේ ඔබ ඔබගේ Telegram කියන ගිණුම සොනික් සොනික් නමින් තමයි ආරම්භ කලේ?

පි : ආරම්භ කලේ.

ප්‍ර : එතකොට දැන් මුහුණු පොත කියන සාමාන්‍යයෙන් අපි භාවිතා කරන එකට සාමාන්‍යයෙන් අපිට දත්තයන් බාගත කිරීමක් සහ උඩුගත කිරීමට හැකියාවක් තියෙනවා?

පි : තියෙනවා.

ප්‍ර : ඔය Telegram කියන ගිණුමටත් ඔය හැකියාව තියෙනවද? ඔය ක්‍රියාකාරකම් තියෙනවද?

පි : ක්‍රියාකාරකම අපිට සංවාදයේ යෙදෙන්න පුළුවන්. Chat කරන්න පුළුවන්. ඊට අමතරව ඡායාරූප, වීඩියෝ පට ඒවා ඇතුලත් කරන්න පුළුවන් ස්වාමිණි. ඒ වගේම බාගත කර ගන්නත් පුළුවන්.

ප්‍ර : ඔය Telegram App එකේ තියෙන ඒ කියන්නේ Telegram App ඒක කියන්නේ දත්තයන් හුවමාරු කර ගැනීමක් පමණයි එහෙමද?

පි : සංනිවේදනය කරන්න පුළුවන්.

ප්‍ර : එතකොට ඔය Telegram App එකේ අනික් පුද්ගලයන් ඉන්න ඒවා හොයා ගන්නේ කොහොමද? අනික් පුද්ගලයන්ගේ විස්තර හොයා ගන්නේ කොහොමද?

පි : අපි Telegram App එකට යන්න කලින් Facebook හරහා යම්කිසි පුද්ගලයෝ කොටසක් හඳුන ගෙන හිටියා. එතකොට ඒ පුද්ගලයින්ගේ දුරකථන විශ්ලේෂණ අරන් තියෙනවා. ඒ දුරකථන විශ්ලේෂණ වාර්තාවල සමහර තැන්වල ඒ කියන සැක

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කටයුතු පුද්ගලයෙක්ගේ දුරකථන අංකය භාවිතා කරන කොට කතා කරපු තවත් පුද්ගලයෝ ඉන්නවා නම් ඒගොල්ලන්ගේ දුරකථන අංක ගන්නවා. අරගෙන Telegram App එකේ ඒක contact list එකේ save කරන්න පුළුවන්. save කලාට පස්සේ ස්වාමිණී ඒ App එකේ ඒ පුද්ගලයාට Telegram ගිණුමක් තියෙනවාද කියලා අපිට පෙන්නනවා. එතකොට 2017, 18 වගේ කාල සීමාවේ Telegram කියන App එක අපේ ලංකාවේ ජනප්‍රිය එකක් නෙමෙයි. නමුත් අර අන්තවාදී කියන පුද්ගලයෝ තමන්ගේ තොරතුරු රහසේ හුවමාරු කිරීමට ඒක භාවිතා කර ගත්තා. එතකොට අර වගේ අපි මුලින් හඳුනා ගත්ත අන්තවාදී පුද්ගලයෙක්ගේ දුරකථන ජාලයේ ඉන්න අංකයක්. මේ Telegram එකේ තියෙන එකත් යම් සැකයකට භාජනය වෙනවා. ඒ වගේම සමහර විට එයාගේ අපි ඒ අංකය යෙදුවට පස්සේ එන Profile එකේ ඡායාරූපය අන්තවාදී පුද්ගලයෙකුගේ වෙනවා නම් අපි ඒකත් තව ටිකක් බලනවා. එතකොට ඒ දුරකථන අංකය වෙනම විශ්ලේෂණය කරලා ගේනවා. ඒ වගේ ඒ පුද්ගලයෝ හඳුනා ගන්න පුළුවන් හැකියාවක් තියෙනවා ස්වාමිණී.

ප : පෙරේරා මහත්මයා ඔබ දැන් පවසා සිටියා ඔය අන්තවාදී පුද්ගලයන්ගේ දුරකථන අංක පිළිබඳව?

පි : ඔව් ස්වාමිණී.

ප : දැන් ඔබට ඔය දුරකථන අංකයන් ලැබෙන්නේ කොහෙන්ද?

පි : මුලිකව දුරකථන අංකයක් ලැබෙනවා අපි මුලින්ම කරපු Facebook සමාජ ජාලා හරහා කරපු විමර්ශනවලදී ගොඩක් Facebook කියන එකේ මෑතක් කාලය වෙන කොට ආරක්ෂක ක්‍රමවේද තිබුණට මීට කලින් තිබුණ 2016 වගේ වෙන කොට ඒකේ දුරකථන අංකය පෙන්නුම් කරනවා. එතකොට අපි විමර්ශනය කරන කොට දුරකථන අංක හම්බ වෙලා තියෙනවා. ඒවායෙන් හඳුනා ගත්තු පුද්ගලයෝ ඉන්නවා, ඒ හඳුන ගත්ත පුද්ගලයන්ගේ දුරකථන විශ්ලේෂණය කර තව පුද්ගලයන්ගේ අංක සොයාගෙන තියෙනවා ස්වාමිණී.

ප : ඔබ මෙම ගරු කොමිෂන් සභාවට පවසා සිටින්නේ ඔබ Facebook කියන. එහෙම නැත්නම් මුහුණු පොත කියන සමාජ ජාලය ඔස්සේ දත්ත රැස් කරගෙන ඒ සම්බන්ධව තියෙන දුරකථන අංක රැස්කර ගෙන ඒක ඔබගේ ජංගම දුරකථනයේ save කරලා ඊට පස්සේ ඒ නොම්මරයට Telegram කියන ගිණුමේ ඒ පුද්ගලයා සිටිනවාද නැද්ද කියලා පෙන්නුම් කිරීමක්?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : පෙන්නුම් කිරීමක් කරනවා ස්වාමිණී. ඒ වගේම ස්වාමිනි ඒ වගේ දවස් වෙන කොට ඒකේ channel කියලා එකක් තියෙනවා. Telegram channel කියලා. අපි හඳුනා ගත්ත පුද්ගලයෙක් ඉන්නවා ආදිල් අහමඩ් කියලා. අපේ 94 සහ 129 list එකේ තියෙනවා ආදිල් අහමඩ් කියලා එයාගේ Did you know Telegram කියලා සමාජ ජාලා channel එකක් තිබ්බා. එතකොට ඒකත් එක්ක අපිට සංවාද කරන්න බැහැ, එයාගේ channel එකට ගියාට පස්සේ channel එකේ publish කරන ඒවා අපිට බලන්න පුළුවන්. එතකොට ඒ channel එක දිහා බලන කොට ඒකේ ඉන්න subscribers ලා ටිකක් අපිට පෙන්නනවා. ඒකේ මෙන්න මේ කට්ටිය ඉන්නේ කියලා. ඒ පුද්ගලයා අන්තවාදි මතවාද ප්‍රචාරය කරන කොට එයාගේ subscriber එකේ ඉන්න අනිත් කට්ටිය ගැනත් අපි අවධානය යොමු කරනවා. ඒ හරහාත් අපි ඒ වගේ අන්තවාදී පුද්ගලයෝ ඉන්නවා කියලා හඳුනා ගත්තා ස්වාමිණී.

ප්‍ර : දැන් ඔය Facebook එකේ ඔබ ලබා ගත්තු තොරතුරු පුද්ගලයන්. ඒ පුද්ගලයන්ම Telegram App එකෙත් හිටියද?

පි : හිටියා ස්වාමිනී.

ප්‍ර : ඔබට Telegram App එකේ සම්බන්ධව දැනටම මෙම කොමිෂන් සභාව ඉදිරියේ එම පුද්ගලයාගේ නම මෙහෙයවලා තියෙනවා. පස්රූල් රහුමාන් මොහොමඩ් සහරාන් පිළිබඳව යම්කිසි තොරතුරු සොයා බැලීමක් කිරීමට ඔබට උපදෙසක් ලැබුනද?

පි : ලැබුනා ස්වාමිනී.

ප්‍ර : කාගෙන්ද ඒ උපදෙස ලැබුණේ?

පි : මගේ සහකාර අධ්‍යක්ෂතුමා සහ අංශ භාර ප්‍රධානීතුමා සහ

ප්‍ර : කවුද සහකාර අධ්‍යක්ෂතුමා ලෙස නම් වශයෙන්?

පි : සහකාර අධ්‍යක්ෂතුමා වශයෙන් සහකාර පොලිස් අධිකාරී මල්ලවආරච්චි මහතා කටයුතු කළා. එවකට කටයුතු කරපු මහත්තයා.

ප්‍ර : ඔහුද ඔබට පවසා සිටියේ මේ පිළිබඳව සොයා බලා ගැනීමක් කරන්න කියලා.

පි : ඔව් ස්වාමිණී.

ප්‍ර : ඔහුට ඉහළින් කවුරු හරි ?

පි : ස්වාමිණී එතුමාට ඉහළින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් ඉන්නවා. එතුමාගෙන් තමයි එතුමට නියෝග ලැබෙන්නේ. ඒ හරහා මගේ අංශ ප්‍රධානියාට සහ මට ලැබෙනවා. මා සහ අංශ ප්‍රධානියා තමයි එවකට හිටිය පර්යේෂණ නිලධාරී වශයෙන් අංශයේ කටයුතු

FAIR COMMENT BY JEZEEM

කලේ. ඒ වෙන කොටත් සහකාර පොලිස් අධිකාරීවරයා යම්කිසි රාජකාරියක් තිබ්බොත් ඒක දැනුවත් කිරීමක් කරනවා .

ප්‍ර : ෆස්රූල් රහුමාන් මොහොමඩ් සහරාන් පිළිබඳව ඔබට සොයා බැලීමට ඔබට ලබා දුන් දත්ත කුමක්ද?

පි : ස්වාමිනී IS සංවිධානයේ මතවාදය ඉංග්‍රීසියෙන් ආපු ලියුමක් තිබුණා. ඒකේ තිබුනේ Qatar based IS Sympathizer කෙනෙක් කාශ්මීරයට යන්න බලාපොරොත්තු කෙනෙක්ගේ user name එකක් පමණයි තිබුණේ. ඒක තිබුණේ @ muh-szah-JR කියලා තිබුනේ user name එකක් පමණයි ස්වාමිණී තිබුණේ.

ප්‍ර : ඔබගේ දැනීම අනුව ඔය පුද්ගලයා ගැන සොයා බැලීමට ඔබ විතරද පත් කළේ, නැත්නම් වෙනත් නිලධාරීන් හට මෙම පුද්ගලයා ගැන සොයා බැලීමට නියෝගයක් ඉහළින් ලැබී තිබුණද ඔබ දැනුවත්ව?

පි : මම දැනුවත්ව මට තමයි මේක ගැන බලන්න කියලා කිව්වේ ස්වාමිණී.

ප්‍ර : ඔබට ඔය user name එක හම්බ වුනාට පස්සේ ඔබ ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද?

පි : අපිට ලබා දෙන බුද්ධි තොරතුරුවලදි අපි සාමාන්‍යයෙන් පුද්ගලයෙක් ගැන විමර්ශනය කරනවා නම් නමක්, ජාතික හැඳුනුම්පත් අංකයක්, දුරකථන අංකයක් වගේ දේවල් ලැබෙනවා. එතකොට අපිට පුළුවන් අපේ තියෙන දත්ත පරිශීලනය කරලා ඒ පුද්ගලයා ගැන සොයා ගන්න. නමුත් මේකේදී හම්බ වුනේ user name එකක් පමණයි. ඇත්තටම ඒකෙන් අරන් අපිට හොයා ගන්න තරම් දෙයක් නැහැ අපේ අංශයේ තියෙන දේවල් එක්ක අපිට ඒකෙන් ගන්න දෙයක් තිබුණේ නැහැ. නමුත් මේක තියාගෙන ඉදලා user name එක මගේ Telegram ගිණුමේ අර contact එකක් විදියට මේකත් save කර ගත්තා ස්වාමිනී. එතකොට මේ පුද්ගලයාගේ account එක මට පෙන්නුම් කලා.

ප්‍ර : එතකොට ඔබට මෙම පුද්ගලයත් සමඟ සංනිවේදනය කිරීමට හැකියාවක් තිබ්බද? මුලින්ම ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද?

පි : මම මුලින්ම ගත්තේ ස්වාමිනී ඒක save කරලා 2019 පෙබරවාරී මාසේ දිනයක මම ඒ අංකයට Telegram හරහා ඇමතුමක් ගන්නවා. Missed call එකක් ඇමතුම අරන් මම cut කරනවා. එච්චරයි මම පළවෙනි ක්‍රියාමාර්ගය විදියට ගන්නේ. ඊට පස්සේ ඒ පුද්ගලයා මගෙන් අවස්ථාවකදි අහනවා ඇයි ඔයා මට කතා කලේ කියලා.

ප්‍ර : කොයි කාලේ වගේද ඔය.

FAIR COMMENT BY JEZEEM

පි : 2019 පෙබරවාරී මාසේ තමයි එහෙම කරන්නේ ස්වාමිනී.

ප්‍ර : ඔබට දිනයක් නිශ්චිතව මතක නැහැ?

පි : මතක නැහැ. පෙබරවාරී මාසේමයි.

ප්‍ර : ඔබ කෝල් එකක් දෙනවා ඊට පස්සේ ඔහු ඔබට ඒකට ප්‍රතිචාර දක්වනවා මොනවා කියලද?

පි : ඇයි ගත්තේ එකක් කියලා.

ප්‍ර : ඊට පස්සේ?

පි : ඊට පස්සේ මම දින කිහිපයක් යන්න ඇති මම ඔය IS සමාජ ජාලාවල පලවන දිග document එකක් ඒකට යැව්වා. යැව්වට පස්සේ එක් අවස්ථාවකදී ඒ පුද්ගලයා අහනවා ඇයි මට මේක එවන්නේ, මම කිව්වා මේක අපේ අවශ්‍ය දෙයක්, අපි දැන ගන්න ඕන දෙයක් කියලා ඒ වගේ එයත් එක්ක සංනිවේදනය කරන්න පටන් ගත්තා. අවශ්‍යතාවයක් තියෙනවා කියලා පෙන්නුම් කළා.

ප්‍ර : ඔබ සංනිවේදනය කලේ ඔහු වගේම ඔබත් අන්තවාදී පුද්ගලයෙක් වශයෙන්ද?

පි : ප්‍රථම ඒ පුද්ගලයා අන්තවාදී පුද්ගලයෙක් කියලා අපිට විදේශ බුද්ධි අංශයෙන් පහදලා දිපු හින්දා අනිවාර්යයෙන්ම මේ පුද්ගලයා අන්තවාදී පුද්ගලයෙක් හින්දා මම අන්තවාදී කරුණු තියෙන document එකක් තමයි මම ඉස්සෙල්ලම share කලේ. ඊට පස්සේ එයත් එක්ක ගණුදෙනු කරද්දි එයාගේ අන්තවාදී මතවාදීයට නැඹුරු පුද්ගලයෙක් විදියට හඳුනා ගත්තා. ඊට පස්සේ මම එයත් එක්ක අන්තවාදී පුද්ගලයෙක් විදියට තමයි සංනිවේදනය කරන්න පටන් ගත්තේ.

ප්‍ර : ඔබ ඔය Telegram App එකේ ඔබගේ නම ඒ කියන්නේ ප්‍රදර්ශන නාමය වශයෙන් වෙන්නේ සොනික් සොනික් කියන එක?

පි : ඔව් ස්වාමිනී.

ප්‍ර : යම්කිසි අවස්ථාවක මෙම පුද්ගලයට ඔබගේ ඇත්ත නම ඔහුට හෙළි කිරීමක් සිදු කලාද?

පි : මම කිසිම නමක් හෙළි කලේ නැහැ.

ප්‍ර : ඔහු ඔබව දැනගෙන හිටියේ සොනික් සොනික් කියලා පමණයි?

පි : පමණයි ස්වාමිනී.

ප්‍ර : සම්බන්ධ වුණාට පස්සේ ඔබලා සාමාන්‍යයෙන් මොන වගේ දේවල් ගැනද සංනිවේදනය කලේ?

පි : සංනිවේදනය කලේ මට අවශ්‍යතාවයක් තිබ්බා මේ පුද්ගලයා කටාර් බේස් කෙනෙක් හින්දා මෙයාගේ විදේශ සම්බන්ධතා ගොඩක් තියෙන්න පුළුවන් එතකොට අපිට තොරතුරු ගන්න පුළුවන් තියෙන අර වගේ IS සංවිධානයේ channel ගැන මට දැන

FAIR COMMENT BY JEZEEM

ගැනීමට අවශ්‍ය වුණා. ඒ හින්දා මම අවස්ථා කිහිපයකදී එයාගෙන් අහනවා IS සංවිධානය සම්බන්ධ channel තියෙනවා නම් මට එවන්න කියලා. එයා ඊට පස්සේ මට ඒවා එවන්න පටන් ගන්නවා. IS සංවිධානයට සම්බන්ධ නිළ Telegram channel සම්බන්ධව link මට එවන්න පටන් ගන්නවා.

ගරු ස්වාමිනී C843, C844, C844A, C844A(1) යන ලේඛනයන් C ලේඛන ලෙස දැනටමත් ලකුණු කොට ඉදිරිපත් කර තිබෙනවා. එම ලේඛන මෙම C ලේඛන කොටයාශයෙන් ඉවත් කොට X ලේඛනයක් ලෙස ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

ඒ වගේ ම ගරු සභාපතිතුමනි

C843 දරන CD තැටිය X196 ලෙසත්,

C844 දරන ලේඛනය X197 ලෙසත්,

C844 ලේඛනයේ ලකුණු කොට ඇති C844A දරන ලේඛනය X197A ලෙසත්,

C844A(1) දරන ලේඛනය X197A(1) ලෙසත් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:

ඒ කරන ලද ඉල්ලීම අනුව C843 වශයෙන් දැනට ලකුණු කර ඇති CD තැටිය X196 වශයෙන් ලකුණු විය යුතු බව සටහන් කරමි.

එසේම C844 වශයෙන් ලකුණු කර ඇති ලේඛනය X197 වශයෙනුත්,

එම ලේඛනයේ ඇති C844A දරන කොටස X197A වශයෙනුත්, C844A(1) වශයෙන් සටහන් කර ඇති කොටස X197A(1) වශයෙනුත් සටහන් විය යුතු බව සඳහන් කරමි. එසේම කොමිෂන් සභාව ඉදිරියේ ලකුණු කරන ලද ලේඛනවල C843 සහ C844 වශයෙන් ලේඛන ලකුණුවීමක් සිදුනොවන බවත්, එම අංක දෙක හිස්ව තිබිය යුතු බවත් සටහන් කර තබමි.

****

රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා:

ප්‍ර : පෙරේරා මහතා ඔබ සහ ඒ කියන්නේ ඔබගේ අනුවර්ථ නමේ වන සොනික් සොනික් සහ මෙම සැකකරු මොහොමඩ් රහුමාන් සහරාන් යන පුද්ගලයන් අතර වූ සංවාදයේ මුද්‍රිත පිටපතක් ඔබ මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබෙනවද?

පි : ඔව් ස්වාමිනී.

FAIR COMMENT — BY JEZEEM

ප : එය ඔබට නැවත දුටුවොත් හඳුනා ගැනීමට හැකිද?

පි : හඳුනා ගන්න පුළුවන් ස්වාමිනී.

(සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වීමට අවසර ඉල්ලා සිටිනවා)

පි : මම ලබා දුන්න පිටපත තමයි ස්වාමිනී.

<u>ගරු සභාපතිතුමනි මෙම සාක්ෂිකරු විසින් හඳුනා ගත් ලේඛනය X197B ලෙස ඉදිරිපත් කොට ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා.</u>

ප : පෙරේරා මහත්මා මෙම ලේඛනය ඔබ සංවාදය පටන් ගන්නේ කවදාද? මෙම ලේඛනයට අනුව?

පි : 2019 මාර්තු 28 ස්වාමිනී.

ප : ඔබ මොකක්ද ඔහුට පවසන්නේ?

පි : පළමුව පවසන්නේ Telegram හරහා යන stranger කියන ගිණුමක් තියෙනවා ඒකේ link එක තියෙනවද කියලා තමයි මම පළමුවෙන් අහන්නේ.

ප : ඔහුගේ පිළිතුරක් ලෙස ඔබට ප්‍රතිචාර දක්වන්නේ කොහොමද?

පි : ඔහු පිළිතුරක් ලබා දෙන්නේ නැහැ, ඒ පුද්ගලයට මේ ගිණුම හොයා ගන්න බැරි වෙනවා මම හිතන්නේ.

ප : ඔහු ඊට පස්සේ ඔබට ප්‍රතිචාර දක්වනවද?

පි : පසුව ප්‍රතිචාර දක්වනවා.

ප : මොනවද ඔහු දක්වන ප්‍රතිචාරය?

පි : ඊට පසු දිනයේ ඔහු කුරසාන් Province එකට ඇෆ්ගනිස්ථානයට යන්න සූදානමක් තියෙනවා යන්න කැමතිද කියලා අහනවා ස්වාමිනී.

ප : එතකොට ඔබ ඔහුට කැමැත්ත පළ කරනවා?

පි : කැමැත්ත පළ කරනවා ස්වාමිනී.

ප : පෙරේරා මහත්මයා ඔබ දැනටමත් මෙම ඔබගේ සංවාදය මෙම කොමිෂම ඉදිරියේ දීර්ඝ වශයෙන් ඉදිරිපත් කරලා මේ ගැන විස්තර සාක්ෂි අනුව මෙහෙයවලා තියෙනවා?

පි : ඔව් ස්වාමිනී.

ප : මම ඔබගේ අවධානයට යොමු කරන්නේ මෙම සංවාදයේ සමහර කොටස්වලට පමණයි.

පි : හොඳයි ස්වාමිනී.

ප : දැන් පෙරේරා මහතා ඕකේ අප්‍රේල් 3 යම්කිසි අරාබි භාෂාවෙන් යම්කිසි කරුණක් ඔබ වෙත මෙම පුද්ගලයා විසින් ලබා දී තියෙනවා?

පි : ඔව් ස්වාමිනී.

ප : මොකකද ඒ?

FAIR COMMENT — BY JEZEEM —

පි : මම හිතන විදියට ස්වාමිනී මේක අර මුස්ලිම් ජාතිකයෙක් මුස්ලිම් ජාතිකයෙකුට අස්සලාම් අලෙයිකුම් රහමතතුල්ලා විබරකාතු කියන වචනය තමයි මෙතන තියෙන්නේ.

ප්‍ර : මොකක්ද ඒකේ තියෙන්නේ?

පි : අස්සලාම් අලෙයිකුම් වරනමතුල්ලා (විබරකාතු)

ප්‍ර : ඊට පස්සේ ඔහු ඔබට එවපු එකට ඔබ ප්‍රතිචාරයක් ලෙස මොකක් ද දක්වා තිබෙන්නේ?

පි : වාලෙයිකුම් සලාම් වරහමතුල්ලා විබරකාතු කියලා ප්‍රතිචාර දක්වනවා.

ප්‍ර : එතකොට අප්‍රේල් 5 වෙනිදා ඔහු ඔබට යම්කිසි විශේෂ දෙයක් පවසා සිටිනවද?

පි : ඔව් ස්වාමිණි ඔහු කියනවා එයාට සහරාන් මවුලවි හම්බ වෙන්න අවශ්‍යතාවයක් තියෙනවා කියලා. එයා හම්බ වෙන්න කවුරු හරි දන්නවද කියලා අහනවා.

ප්‍ර : ඊට පස්සේ ඔබ මොනවද එයට ප්‍රතිචාරයක් විදියට දක්වන්නේ?

පි : ප්‍රතිචාරයක් විදියට නම්බඩි ෂෙයික් ඒ කියන්නේ අපේ නායකතුමා ද කියන අර්ථය දෙන විදියට මං එයාගෙන් අහනවා. ඊට පස්සේ මම කියනවා එයාව හම්බ වෙන කෙනෙක් මට සූදානම් කරලා දෙන්න පුළුවන් කියන අදහස දෙන විදියට තමයි එයත් එක්ක සංවාදයේ යෙදෙන්නේ.

ප්‍ර : ඊට පස්සේ ඔහුගේ දුරකථන අංකය ඔබට ලබා දෙනවද?

පි : දුරකථන අංකය ලබා දෙනවා ස්වාමිනී.

ප්‍ර : මොකක්ද ලබාදෙන දුරකථන අංකය?

පි : 077-4962280

ප්‍ර : ඊට පස්සේ ඔය සංවාදයේ තවත් පල්ලෙහා තියෙනවා Tell him I have a message from Kilafath. Kilafath කියලා ඔහු අදහස් කලේ කුමක්ද කියලා ඔබට අදහසක් තියෙනවද?

පි : මගේ දැනීමේ හැටියට කිලාෆත් කියලා කියන්නේ ඉස්ලාම් රාජ්‍යය නැත්නම් කලීෆා, කිලාෆත්, Islamic State ඒ කියන හැම වචනයෙන්ම හඳුන්වන්නේ ඉස්ලාම් රාජ්‍යය කියන එක නැත්නම් IS සංවිධානය කියන එක.

ප්‍ර : ඊට පස්සේ ඔය සංවාදයේ 15 වෙනිදා, 2019 අප්‍රේල් 15 වෙනිදා ?

පි : ඔව් ස්වාමිනී.

ප්‍ර : 15 වෙනිදා යම්කිසි විශේෂත්වයක් තියෙනවද?

පි : අපි හඳුනා ගත්ත පුද්ගලයා ලංකාවට ආවා කියලා මාව දැනුවත් කරනවා.

ප්‍ර : ඒ 15 වෙනිදා තමයි ඔහු ඔබව දැනුවත් කරන්නේ?

පි : ඔව් ස්වාමිනී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ වගේම ඊට පස්සේ ඔහු ආවා කියලා දැනගත්තට පස්සේ කොහේ හරි හමුවීමක් කරන්න ඕන කියලා ඔබට දැනුම් දෙනවද?

පි : ඔව් එයාට සහරාන් හම්බ වෙන්න අවශ්‍යතාවයක් තියෙනවා කියන එක මට පුන පුනා කියනවා. ඊට පස්සේ මම කියනවා අපි කල්මුණේ දී හම්බ වෙමු කල්මුණේට එන්න කියලා. මොකද මම එයාට මුලින්ම හඳුන්වලා දෙන කොට මම කියනවා මම අක්කරෙයිපත්තු පදිංචිකරුවෙක් කියලා.

ප්‍ර : ඔහු ඔබගෙන් උදව් ඉල්ලනවා සහරාන් හම්බ වෙන්න?

පි : ඔව් ස්වාමිනී.

ප්‍ර : ඔබ සහරාන්ව දන්නවද?

පි : සහරාන් කියන පුද්ගලයා ගැන මම දන්නවා ස්වාමිනී.

ප්‍ර : ඔබ කොහොමද මෙම ෆස්රූල් රහුමාන්ව සහරාන්ව හම්බ වෙන්න යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නවද මොනවද ඔහුට කියන්නේ?

පි : මම ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ මම එයාට කියනවා මෙහෙම හම්බ වෙන්න පුළුවන් ඔයාට අවස්ථාවක් තියෙනවා කියන එක මම කියනවා. විශ්වාසය ගොඩනඟා ගැනීමක්.

ප්‍ර : කොහොමද හම්බ වෙන්න පුළුවන් කියලා කියන්නේ?

පි : එයාගේ මල්ලීව මම දන්නවා, මල්ලී හරහා ඔයාට එයාව හම්බ වෙන්න පුළුවන් අවස්ථාව ලබා දෙන්න පුළුවන් කියලා කියනවා ස්වාමිනී.

ප්‍ර : ඔබ ඔහුට බලාපොරොත්තුවක් දෙනවා සහරාන්..?

පි : ඔව් ස්වාමිනී.

ප්‍ර : ඔහු සහරාන්ව දන්නේ කවුරු හැටියටද?

පි : සහරාන් දන්නේ ෂෙයික් සහරාන් කියලා තමයි හඳුන්වන්නේ. සහරාන් නායකයා කියන එක තමයි හඳුන්වන්නේ.

ප්‍ර : ඒ කියන්නේ සහරාන් කියන්නේ යාළුවෙක් වශයෙන්ද නැත්නම් මවුලවි කෙනෙක් වශයෙන්ද?

පි : මවුලවි කෙනෙක් වශයෙන්. ඒ කියන්නේ සහරාන් කියන පුද්ගලයාගේ තිබුණා වීඩියෝ පට හරහා සහරාන් කියන පුද්ගලයා ගැන මුස්ලිම් සමාජයේ දැනීමක් තිබුණා.

ප්‍ර : එතකොට ඔබට සහරාන් ගැන දැනුමක් තිබුණද?

පි : දැනුමක් තිබුණා ස්වාමිනී.

ප්‍ර : ඔහු ඔබට පවසනවාද නැත්නම් ඔබලා දෙදෙනා අතර සංවාදයේ යෙදෙනවද කවදා හරි දවසක හමුවීමට යම්කිසි දවසක් ඔබලා අතර එකඟතාවයක් පල වෙනවද?

පි : 20 වෙනිදා මාව කල්මුණේ දී හම්බ වෙන්නම් කියන එකඟතාවයකට එනවා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : ඊට පස්සේ ඔය සංවාදය බලන්න 21 වෙනිදා. ඔහු ඔබට එවනවා ප්‍රශ්නයක්. මොකක්ද ඒ ප්‍රශ්නය?

පි : අපිට කලින් කවුරු හරි සටන් කරන්න පටන් ගත්තද? ඒ වෙන හරි කණ්ඩායමක්ද? අපිත් මොනවා හරි කරන්න ඕන කියන එක තමයි කියන්නේ.

ප්‍ර : ඊට පස්සේ ඔබ මොනවද ඔහුත් එක්ක..

පි : මට මතක හැටියට එදා නම් සංවාදයේ යෙදුනේ නැහැ. අප්‍රේල් 21 වෙනිදා සංවාදයේ යෙදුනේ නැහැ ස්වාමිනී,

ප්‍ර : අප්‍රේල් 21 වෙනිදා ඔබට යම්කිසි මතකයක් තියෙනවද යම්කිසි විශේෂ දෙයක් සිදු වුනා කියලා?

පි : ඔව් අප්‍රේල් 21 සහරාන් ඇතුළු ජාලයේ පිරිස පාස්කු ප්‍රහාරය දියත් කළා.

ප්‍ර : ඊට පස්සේ ඔය පුද්ගලයා ඔබට සංවාදයේ යෙදෙන්නේ කීයට විතරද?

පි : 21 දින 11.40 ට ස්වාමිනී.

ප්‍ර : ඊට පස්සේ 21 වෙනිදා සංවාදය පටන් අරන් ඉවර වෙන්නේ කීයටද එදාම?

පි : 17.56 ට ස්වාමිනී.

ප්‍ර : ඊට පස්සේ 22 වෙනිදා ඔබ ඔහු සම්බන්ධ වෙනවද?

පි : ඔව් ස්වාමිනී. 22 වෙනිදා සම්බන්ධ වෙනවා.

ප්‍ර : මොනවද ඔහු 22 වෙනිදා ඔබගෙන් විමසන්නේ? කෙටියෙන් පැහැදිලි කරන්න මොකද අපි ඒ ඔක්කොම ගිහිල්ලා තියෙන්නේ?

පි : ස්වාමිනී ඔහු කියනවා මේක අපේ වැඩක්. මේකට අවශ්‍ය දේවල් ප්‍රචාරය කරන්න. අනවශ්‍ය දේවල් ප්‍රචාරය කරන්න යන්න එපා. එහෙම ප්‍රකාශ කලොත් නිළ වශයෙන් IS සංවිධානය කරන ප්‍රචාරණයට, මාධ්‍ය නිවේදනයට මේක බාධාවක් වෙයි කියලා මට කියනවා ස්වාමිනී.

ප්‍ර : ඒ 22 වෙනිදා?

පි : 22 වෙනිදා ස්වාමිනී.

ප්‍ර : 23 වෙනිදා ?

පි : 23 වෙනිදා ස්වාමිනී එයා කියනවා මෙයාට ෂෙයික් නැත්නම් සහරාන් කියන පුද්ගලයාගේ පිංතූර වගයක් ලැබුණා කියලා කියනවා. ඊට පස්සේ එයා Divan Media, Divan Media කියන්නේ Media Ministry කියන එක IS සංවිධානයේ. ඒගොල්ලන්ට බයියත් කරන Video එක අවශ්‍යයි මේ claim කරන එකට කියලා මාව දැනුවත් කරනවා. ඊට පස්සේ ස්වාමිනී එයාට ලැබුණ පිංතූර කීපය මට එවනවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඊට පස්සේ මේ Videos ටික ඔබට එවන්නේ මේ Telegram එකෙන්?

පි : පිංතූර එවන්නේ.

ප්‍ර : ඊට පස්සේ?

පි : ඊට පස්සේ ස්වාමිනී එදිනම 16.22 ට මෙයා කියනවා IS සංවිධානයෙන් මෙම ප්‍රහාරයේ වගකීම භාර ගත්තා කියලා. මම ඒකේ Translation එක කරන ගමන් ඉන්නේ කියලා කියනවා. ඊට පස්සේ මම සතුට ප්‍රකාශ කරන විදියට කතා කරලා මට ඒකේ Statement එක මට එවන්න කියලා කියනවා ස්වාමිනී. පසුව ඒ Statement එක අරාබි භාෂාවෙන් හින්දා මට ඒකේ Translation එකත් තේරෙන්නේ නැති හින්දා මම ඒක දෙමළ භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දෙන්න කියනවා. ඒකත් ලබා දෙනවා. ඒ වගේම එතනදී විශේෂයෙන් එයා කියනවා එයා අමාක් එකත් එක්ක කතා කලා මම පිංතූර video යැව්වා Translations යැව්වා කියන එකත් එයා එතනදී කියනවා ස්වාමිනී.

ප්‍ර : ඔබට අරාබි භාෂාවෙන් යම්කිසි පිංතූරයක් එවලා තියෙනවනේ, ඒක ඔබට තේරුනේ නැහැ කියලා ඔහුට කිව්වා?

පි : තේරුනේ නැහැ කියන එක කියන්න ගියේ නැහැ මම කිව්වේ මට තේරුනේ නැහැ ඇත්ත වශයෙන්ම ඒක තේරෙන්නේ නැහැ, මම මෙයාට කියලා තේරුම මම මෙයාගෙන් ඉල්ලා ගත්තා ස්වාමිනී.

ප්‍ර : ඒ තේරුම එවලා තියෙනවද ඔතන?

පි : එවලා තියෙනවා ස්වාමිනී. ඉස්සෙල්ලාම මට දෙමලෙන් එවන්නේ මොකෝ එයා හිතන්නේ මම දෙමල පුද්ගලයෙක් කියලා. නමුත් මට දෙමල එකත් තේරෙන්නේ නැති හින්දා මට ඒක ඇත්තටම දැන ගන්න ඕන හින්දා මම කිව්වා මේක ඉංග්‍රීසියෙන් තමයි අපිට ඕන කියලා. පස්සේ මට ඉංග්‍රීසියෙනුත් එව්වා ස්වාමිනී.

ප්‍ර : මොනවද ඒ එව්වේ ඔබට?

පි : ඉංග්‍රීසියෙන් එව්වේ ස්වාමීනි ශ්‍රී ලංකාව තුල සිදු කල මේ ප්‍රහාරය කලේ IS සංවිධානයේ සටන්කාමී පිරිසක් කියන එක තමයි ස්වාමිනී.

ප්‍ර : ඊට පස්සේ ඔහු ඔබට මොනවද එව්වේ?

පි : ඊට පස්සේ තව IS සංවිධානයේ නිල මාධ්‍ය ජාලය වන අමාක් News Agency හරහා පල කරන තවත් නිවේදන කිහිපයක් එව්වා. ඒවා ගැන නම් මට සැලකිල්ලක් තිබුණේ නැහැ.

ප්‍ර : ඔබට ඒ ගැන කියන්න අවබෝධයක් තිබුනේ නැහැ?

පි : අවබෝධයක් තිබුනේ නැහැ ස්වාමිනී.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඊට පස්සේ?

පි : ඊට පස්සෙත් සහරාන් ඇතුළු ජාලයේ පිරිස ඉන්න ඡායාරූපයක් එවලා තියෙනවා ස්වාමිනී. ඒවත් විවිධ සමාජ ජාලාවල පරිහරණය වෙච්ච කියලා පේනවා මොකද ඒවා ගිණුම් වෙන තැනකින් කොපි කරලා ගත්තු එක පෙන්වනවා ස්වාමිනී. පසුව ස්වාමිනී මට සැකකරු එවනවා අමාක් නිවුස් හරහා පල වෙච්ච සහරාන් ඇතුළු පිරිස බයියත් කරන වීඩියෝ පටයත් මට එවලා තියෙනවා ස්වාමිනී.

ප්‍ර : ඒක කවදද ඔබට එවන්නේ?

පි : 23 වෙනිදා ස්වාමිනී.

ප්‍ර : 23 වෙනිදා ඒ වීඩියෝ පටය එවනවා?

පි : ඔව් ස්වාමිනී.

ප්‍ර : ඊට පස්සේ ඔබ විමසීමක් කරනවද කොහොමද මේවා ලැබුනේ කියලා?

පි : මම මේක ලැබුන එකක් ගැන විමසීමක් කරන්නේ නැහැ ස්වාමිනී.

ප්‍ර : ඊට පස්සේ?

පි : ස්වාමිනී ඊට පස්සේ මම උත්සාහ කරනවා මේ පුද්ගලයා හරහා මේ IS සංවිධානය claim කරන්න මෙයා දක්වපු දායකත්වය මොකක්ද කියලා බලන්න උත්සාහ කරනවා. මෙයාගෙන් අවස්ථා කිහිපයකදීම මං අහනවා මෙහෙම IS සංවිධානය claim කරන්න කරපු දේ මොකක්ද කියලා මම එයාගෙන් අහනවා. එයා කියනවා මම තමයි මේක claim කරන්න මුලිකත්වය ගත්තේ කියලා ස්වාමිනී.

ප්‍ර : ඕකට එන්න ඉස්සෙල්ලා මේ පුද්ගලයා ඔය එවන පිංතූරවලට පස්සේ මොකක් හරි ඔබට Pdf Document එකක් එවනවා නේද?

පි : ඔව් ස්වාමිනී. එයා කියනවා ඊලඟට අපිට තමයි සටන් කරන්න තියෙන්නේ. අපි ඒකට සුදානම් වෙන්න ඕන කියලා.

ප්‍ර : මොකක්ද ඔය ලේඛනය?

පි : ලේඛනය ස්වාමිනී මට Pdf Document එකක් එවනවා explosive course කියලා. කියන්නේ මෙතන ඒවා නැහැ මම එයාට කියනවා මට දැනීමක් නැහැ මේවා ගැන. මං YouTube එකෙන් නම් videos බලලා තියනවා, ආයුධ සම්බන්ධව බලලා තියෙනවා මට ඒවා ගැන මුකුත් දැනුමක් නැහැ කියලා මම ඒ පුද්ගලයාට කියනවා. ඊට පස්සේ මේ පුද්ගලයා මට explosive course කියලා Pdf Document එකක් එවනවා. ඒකේ ගොඩක් chemistry පොතක් වගේ තියෙන්නේ. බෝම්බ හදන වගේ දේවල් තමයි තිබුනේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ ඒ ලේඛනය පරීක්ෂා කලාද?

පි : මම ඒක හොඳට පරීක්ෂා කලේ නැහැ ඒක සාමාන්‍යයෙන් IS සංවිධානයේ මතවාදය ප්‍රකාශ කරන පුද්ගලයෝ මේවගේ manual නිතරම share කර ගන්නවා. මේකත් ඒ වගේ Document එකක්. ඒකේ මුල පිටුව දැක්කාම තේරෙනවා මේක බෝම්බ හදන දෙයකට යොදා ගන්න දෙයක් කියලා.

ප්‍ර : දැන් ඔබ කියා සිටියා ඔබට Pdf Document එකක් එව්වා කියලා?

පි : ඔව් ස්වාමිනී.

ප්‍ර : දැන් ඒ Document එක ඔබ ලඟ තියෙනවද?

පි : තියෙනවා ස්වාමිනී.

ප්‍ර : එහි මාතෘකාව ලෙස සඳහන් වෙන්නේ කුමක්ද?

පි : ස්වාමිණි The explosive course වශයෙන් මාතෘකාව සඳහන් වෙනවා. පස්සේ ඒකේ නමක් සටහන් වෙනවා යටින් අබු කබාබ් අල්මිස්රි කියලා සඳහන් වෙනවා.

ප්‍ර : ඕකේ මුද්‍රිත අවුරුද්ද සඳහන් වෙනවද?

පි : ස්වාමිනී publish කියලා 1432 H කියලා තිබෙනවා. මගේ දැනුමේ හැටියට මේ හිජ්රත් වර්ෂ තමා මේ සඳහන් වෙන්නේ 1432 කියලා සඳහන් වෙන්නේ.

ප්‍ර : ඕක පිටු කීයකින් සමන්විත ලේඛනයක්ද?

පි : 13 ක් ස්වාමිනී. නමුත් මේ සම්පූර්ණ Document එකේ print out එක ගන්න කොට කෙටි කරලා අරන් තියෙන්නේ. පිටු 101 ක Document එකක් තමා පිටු 18 කට තියෙන්නේ.

<u>ගරු සභාපතිතුමනි මෙම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන්නට වූ ලේඛනය X 198 ලෙස ඉදිරිපත් කර ලකුණු කිරීමට අවසර ඉල්ලා සිටිනවා.</u>

ප්‍ර : දැන් ඔය ලේඛනය ඔබට ඉදිරිපත් කිරීමට පසු ඔබ මොකක්ද ඔහු සමඟ යෙදුණු සංවාදය? ඔබ මීට කලින් ප්‍රකාශ කර සිටියා මෙම IS සංවිධානය මේක භාර ගත්ත බවට ඔහුගෙන් විමසා සිටියා කියලා?

පි : ඔව් ස්වාමිනී

ප්‍ර : ඔහු මොනවද ඒකට දැක්වූ ප්‍රතිචාර?

පි : ස්වාමිනී එයා කියනවා අපි තව ගෘප් එකක් හදමු අපේ කට්ටිය එකතු කරගමු. එකතු කරගෙන අපි බයියත් කරලා අපි සටන්කාමී විදියට සටන් කරමු කියන එක කියනවා. ඊට පස්සේ තවදුරටත් එයා අහනවා රිල්වාන්ව හම්බ වෙන්න පුළුවන්ද කියන එක මගෙන් අහනවා. ඊට පස්සේ එයා කියනවා ශ්‍රී ලංකාව IS සංවිධානයේ විලයට් එකක් නැත්නම් Province එකක් විදියට නිවේදනය කරන්න අවශ්‍ය කටයුතු සලසලා මම IS සංවිධානයේ

FAIR COMMENT BY JEZEEM

නිළ මාධ්‍ය ජාලයත් එක්ක සම්බන්ධ වෙලා කටයුතු කරනවා කියලා කිව්වා. ඒකට අවශ්‍ය කරන දේවල් කිහිපයක් තියෙනවා කියලා කිව්වා ස්වාමිනී. ඊට පස්සේ අපි IS සංවිධානයේ නිළ Province එකක් විදියට establish කලාට පස්සේ අපිට fight කරන්න පුළුවන් කියන එක මට කිව්වා ස්වාමිනී. ඒකට රිල්වාන් අවශ්‍යයි කියන එකත් එයා එතනදී මට කිව්වා.

ප්‍ර : ඔහු යම්කිසි අවස්ථාවක ඔබට සඳහන් කලාද එම IS කියන සමාජ ජාලයත් එක්ක ඔහු සම්බන්ධීකරණයක් කලා කියලා?

පි : කිව්වා ස්වාමිනී.

ප්‍ර : ඒකට ඔහු පැහැදිලි උත්තරයක් දුන්නද?

පි : පැහැදිලි උත්තරයක් දුන්නා ස්වාමිනී. මම අමාක් එකට කිව්වා කියලා.

ප්‍ර : කවද්ද ඒ පිළිතුර ලබා දුන්නේ?

පි : 24 වෙනිදා ස්වාමිනී. ඇ 10.11 ට.

ප්‍ර : 24 න් පස්සේ ඔබ ඔහු සමඟ නැවතත් සම්බන්ධ වුණාද?

පි : 24 දින තමයි ස්වාමිනී සම්බන්ධ වුණේ.

ප්‍ර : ඊට පස්සේ?

පි : 24 වන දින එයා මාතලේ පොලිස් ස්ථානය හරහා අත්අඩංගුවට ලබා ගන්නවා ස්වාමිනී.

ප්‍ර : ඒ පිළිබඳව ඔබ දැන ගන්නේ කවදද?

පි : මම දැන ගන්නේ 25 වෙනිදා උදේ ස්වාමිනී.

ප්‍ර : ඔබ 25 වෙනිදත් ඔහු හා යම්කිසි සංවාදයේ යෙදීමට කටයුතු කළාද?

පි : මම 24 ස්වාමිනී අවසන් වරට කටයුතු කරන්නේ. මම එක අවස්ථාවකදී එයාට කියනවා එයා කියනවා ස්වාමිනී NTJ එකට යවන්න document එකක් එවනවා කියලා. මම කියනවා ඒක ඉක්මණට එවන්න කියලා. නමුත් මට ඒ document එක 24 වෙනිදා රැයින් පස්සේ ඒ document එක එවන්නේ නැහැ. මෙයා සාමාන්‍යයෙන් මම කතා කරන කොට ප්‍රතිචාර දක්වනවා. උදේ බලන කොට මෙයා මට ප්‍රතිචාර එවලා තිබුනේ නැහැ ස්වාමිනී.

ප්‍ර : මේ ගරු කොමිෂන් සභාවේ දැන ගැනීමේ අවශ්‍යතාවයට මම මේ ප්‍රශ්නය අහන්නේ. 2019 අප්‍රේල් මස 20 වන දින ඔබ කොහේද හිටියේ?

පි : අප්‍රේල් මස 20 වන දින ස්වාමිනී මම රාජ්‍ය බුද්ධි සේවා 34 කාර්යාලයේ උදෑසන වැඩ කළා ස්වාමිනී. පස්සේ දවල් වරුවයි එදින රාජකාරී ඊට පස්සේ ඒක අවසන් වෙලා මම රත්නපුරේ පැල්මඩුල්ල ප්‍රදේශයේ මාගේ නිවසට පිටව යනවා ස්වාමිනී.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප : 21 වෙනිදා කොහේද ඔබ සිටියේ?

පි : 21 වෙනිදා ස්වාමිනී මම 21 උදෑසන 4 ට විතර ගෙදරින් පිටත් වෙනවා රාජකාරියට වාර්තා කරන්න. ඊට පස්සේ මම එනවා 21 වෙනි දින උදෑසන අංක 34 කාර්යාලය මලලසේකර මාවතේ අපේ රාජ්‍ය බුද්ධි සේවා කාර්යාලයට. පස්සේ ඇවිල්ලා උදෑසන සිදු වූ පිපිරීම් එක්ක විමර්ශන සඳහා මුලින්ම යනවා ෂැංග්‍රිලා හෝටලය අසලට යනවා. එතන ටිකක් වෙලා ඉන්නවා. ඊට පස්සේ සිනමන් හෝටලය අසලට යනවා. ඊට පස්සේ මට ලිපිනයක් දෙනවා බලන්න කියලා අළුත්කඩේ ප්‍රදේශයේ. කිංස්බරි ප්‍රහාරක අසාක් මුබාරක්ගේ. ගෙදරක නිවසක්. ඒ ගෙදරට යනවා. ඒ ආදී වශයෙන් කියපු ඒ අවස්ථාවලදි විවිධ ප්‍රදේශවලට එදින රාජකාරී කලා ස්වාමිනී කොළඹ ප්‍රදේශයේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : දැන් ඔබ මේ සම්බන්ධ වුණු ෆස්රුල් රහුමාන් මොහොමඩ් සහරාන් කියන පුද්ගලයාට යම් අනුවර්ථ නාමයක් තිබ්බද?

පි : මොහොමඩ් සහරාන් කියලා අරාබි භාෂාවෙන් තිබුණ නමක් තිබුණා ස්වාමිනී.

ප : ඊට අමතරව මතකද වෙන අනුවර්ථ නාමයක් තිබ්බා අබු කියන වචනය පාවිච්චි කරලා?

පි : නැහැ ස්වාමිනී මම සංනිවේදනය කරද්දි මට ඒක ලැබුණේ නැහැ.

ප : ඔබට ඒක ලැබුණේ නැහැ?

පි : නැහැ ස්වාමිනී. දැනුවත් නැහැ ස්වාමිනී.

ප : ඔබ ඔහු සමඟ සංනිවේදනයේ යෙදුනේ මොන නමින්ද?

පි : මම නමක් භාවිතා කලේ නැහැ ස්වාමිනී.

ප : එතකොට ටෙලිග්‍රෑම් ගිණුමට නමක් අවශ්‍ය නැහැ?

පි : ටෙලිග්‍රෑම් ගිණුමේ නම තිබුණා ස්වාමිනී සොනික් සොනික් කියන එක. නමුත් අපි සංනිවේදනය කරද්දි මගේ නම ඒ පුද්ගලයාගේ නම කතා කලේ නැහැ ස්වාමිනී.

ප : මම දන්නවා, මම අහන්නේ ටෙලිග්‍රෑම් ගිණුමේ මොන නමක් සමඟද සංවාදයේ යෙදෙන්නේ කියලා?

පි : ස්වාමිනි මොහොමඩ් සහරාන් කියලා අරාබි භාෂාවෙන් තිබුන නමත් එක්ක ස්වාමිනී.

ප : ඔබගේ නම සොනික් සොනික් හැටියට විතරයි ඔහුට පේන්නේ?

පි : ඔව් ස්වාමිනී.

ප : දැන් ෆස්රුල් සහරාන්ට පේන්නේ ඔබේ නම සොනික් සොනික් විදියට විතරයි?

FAIR COMMENT — BY JEZEEM —

පි : විතරයි පේන්නේ ස්වාමිනී. මගේ දුරකථන අංකයවත් මුකුත් පේන්නේ නැහැ ස්වාමිනී.

ප්‍ර : ඔබ මේ ඉස්ලාම් අන්තවාදීන් සමඟ සොයා ගැනීමේ යෙදන ක්‍රියාදාමයේදී යම් අවස්ථාවක අරසද්ද්‍රෝ කියන නාමය පාවිච්චි කෙරුවද?

පි : නැහැ ස්වාමිනී.

ප්‍ර : එහෙමත් නැත්නම් අර්ෂොට් කියන නම පාවිච්චි කෙරුවද?

පි : නැහැ ස්වාමිනී.

ප්‍ර : ඔබ මේ අංකය දන්නවද? නැත්නම් පාවිච්චි කරලා තියෙනවද? 077-8415738?

පි : නැහැ ස්වාමිනී.

ප්‍ර : 071-5344512 ?

පි : 071-5344512 ද ස්වාමිනී

ප්‍ර : ඔව්.

පි : මගේ දුරකථනය ස්වාමිනී.

ප්‍ර : ඔබ අර්ෂාඩ් කියන නම යම්කිසි අවස්ථාවක භාවිතා කෙරුවද?

පි : නැහැ ස්වාමිනී.

ප්‍ර : ඔබගෙන් මීට පෙරත් ඔය ප්‍රශ්නෙම කවුරු හරි අහලා තියෙනවද?

පි : CID එකෙන් ප්‍රශ්න කරද්දි මගෙන් අහලා තියෙනවා ස්වාමිනී.

ප්‍ර : දැන් ඔබ යම් අවස්ථාවක මේ ෆස්රූල් සහරාන් සමඟ සම්බන්ධ වන විට යම්කිසි අවස්ථාවක ඔබ ඔහුගෙන් ඇහුවද ISIS සංවිධානය ඇයි තවමත් මෙම ප්‍රහාරය පිළිබඳ වගකීම භාර අරන් නැත්තේ කියලා?

පි : මට මතක විදියට ස්වාමිනී මම තාම පරක්කු මොකද කියන එක වගේ මම ඇහුවා. කියන්නේ සාමාන්‍යයෙන් ISIS සංවිධානය ප්‍රහාරයක් දියත් කළාම 04.21 තමයි සිද්ධ වෙන්නේ. 21 වුණාට පස්සේ සාමාන්‍යයෙන් claim කරනවා ලෝකේ පුරාම තිබ්බේ එහෙම තමයි. එයාලා ප්‍රහාර දියත් කලේ නැති ඒවත් claim කලා. නමුත් මේක ප්‍රහාරය claim කලේ නැහැ තාම. මොකද කියලා මටත් දැන ගන්න ඕන වුණා. එහෙම එක තැනක ඇහුවා ස්වාමිනී එහෙම.

ප්‍ර : යම් මතකයක් තියෙනවා?

පි : එහෙම මතකයක් තියෙනවා ස්වාමිනී.ඇයි කියනවා වගේ.

ප්‍ර : පාස්කු දින ප්‍රහාරයට වගකීම ISIS සංවිධානය භාර ගැනීම පරක්කු වෙන්නේ ඇයිද කියන එක ගැන ඔබ ෆස්රූල් සහරාන්ගෙන් ඇහුවා?

පි : මගේ මතකයේ හැටියට එහෙම ඇහුවා ස්වාමිනී.

Proceedings Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : එතකොට ඔහු ඊට ලබාදුන් පිළිතුර මොකක්ද?

පි : ස්වාමිනී ඊට පස්සේ තමයි මම දිවාන් මීඩියාත් එක්ක කතා කලා. වීඩියෝ බයියත් හම්බ වුණා. මට ඡායාරූප එහෙම එව්වේ එතකොට තමයි ස්වාමිනී. ඒ කියන්නේ එතකොට එයා ඒක ගැන කතා කරලා තිබිලා තියෙන්නේ ස්වාමිනී.

ප්‍ර : එතකොට ඔය ෆස්රුල් සහරාන්ට ඔය බයියත් සහ අනෙත් ඡායාරූප ලබා දුන්නේ කවුද කියලා ඔබ දන්නවද?

පි : ඒක දන්නේ නැහැ ස්වාමිනී.

ප්‍ර : නමුත් ඔබගේ සාක්ෂියට අනුව ඔබ කියන්නේ සාමාන්‍යයෙන් ISIS සංවිධානය යම්කිසි ප්‍රහාරයක් එල්ල කෙරුවා නම් ඒ අවස්ථාවේදීම භාර ගන්නවා කියලා?

පි : භාර ගන්නවා ස්වාමිනී. සමහර ප්‍රහාර තියෙනවා ඒගොල්ලෝ කරපු නැති ප්‍රහාර විදෙස් රටවල. ඒත් ඒගොල්ලන්ගේ ප්‍රහාර කියලා භාර ගන්නවා. සමහරවිට ඇෆ්ගනිස්ථානයේ වගේ තියෙන ඒවා තලෙයිබාන් සංවිධානයත් භාර ගන්නවා, IS සංවිධානයත් භාර ගන්නවා. ඒක ක්ෂණිකව භාර ගන්නේ ඒගොල්ලන්ගේ ගොඩට ඒක දා ගන්න. නමුත් මේක භාර ගත්තේ නැහැ ස්වාමිණි.

ප්‍ර : ඔබ කිව්වානේ 071-5344512 කියලා අංකය, ඔබ තමා භාවිතා කෙරුවේ?

පි : ඔව් ස්වාමිනී මම භාවිතා කරපු අංකය ස්වාමිනී.

ප්‍ර : එතකොට ඔබට අමතරව මේ තවත් පුද්ගලයෙක් අබුහයිතම් කියලා යම්කිසි දැනුමක් තියෙනවද?

පි : දැනුමක් තියෙනවා ස්වාමිනී.

ප්‍ර : කවුද අබුහයිතම් කියන්නේ?

පි : මට ඔය අනුවර්ථ නාමයම තමයි මතක අබුහයිතම් කියන කෙනා අපි විමර්ශනය කරද්දි හම්බ වෙච්ච අන්තවාදී මතවාදී දරන පුද්ගලයෙක්. මට මතක විදියට උඩතලවින්න ප්‍රදේශයේ පුද්ගලයෙක්. අබුහයිතම් එක අවස්ථාවකදි ආයුධ මිලදී ගැනීමක් සඳහා ත්‍රිකුණාමලය ප්‍රදේශයට යන සිද්ධියක් ගැන මතකයි ස්වාමිනී. ඒක සම්බන්ධයෙනුත් අපේ අංශයෙන් වාර්තා කරලා තියෙනවා.

ප්‍ර : එතකොට අබුහයිතම් සමඟ යම් සබඳතාවයක් ඔබ ඇති කර ගත්තද?

පි : නැහැ ස්වාමිනී.

ප්‍ර : ඔබගේ යටතේ හිටපු නිලධාරියෙක් ඇති කර ගත්තද?

පි : ඒක ගැන මට දැනීමක් නැහැ ස්වාමිනී.
ස්වාමිනී මට මතකයි අබුහයිතම් නෙමෙයි අබුහයිදර් කියන එක. මට මේක මතකයි ස්වාමිනී එක අවස්ථාවකදී කියන්නද ස්වාමිනී.

FAIR COMMENT
BY JEZEEM

ප : කියන්න?

පි : 2018.12.23, 26 මාවනැල්ලේ ප්‍රහාරයෙන් පස්සේ සාදික් හා සහිඩ් කියන පුද්ගලයෝ දෙන්නා පලා ගිහිල්ලා තිබුණා. අපි ඒ ගැන විමර්ශනය කර කර හිටියා. එතකොට ඒ වගේම 2019 මුල මාසේ වගේ වෙන කොට මට එක්කෙනෙක් හම්බ වෙලා තියෙනවා ස්වාමිනී අබුහයිදර් සේලානි කියලා. ඒ පුද්ගලයා අන්තවාදී මතවාද පෝෂණය කරනවා. ප්‍රචාරය කරනවා. ඊට පස්සේ මෙයාව මට අල්ල ගන්න උවමනාවක් තිබුණා. මං එයත් එක්ක දිගටම chat කලා. එයත් chat කලා. ඊට පස්සේ ස්වාමිනී chat කරලා දවසක් මම නයිට් SDO duty කරලා ඊලඟ දවසේ උදේ මම මෙයත් එක්ක හමුවක් දා ගන්නවා. රාජකාරියට බාධාවක් මං මෙයාට එන්න කියලා හමුවක් දා ගන්නවා ස්වාමිනී. කොළඹ ප්‍රදේශයට එන්න කොටුවට එන්න කියලා. ඊට පස්සේ මේ අබුහයිදර් සේලානි කියන පුද්ගලයා එනවා. මට අවශ්‍යතාවය වුනේ අන්තවාදී පුද්ගලයෙක් ලෙස පෙනී සිටි පුද්ගලයා කවුද කියලා හඳුනා ගන්න. ඊට පස්සේ මේ පුද්ගලයා එනවා කොටුවට. කොටුවට ආවට පස්සේ මායි තව නිලධාරියෙකුයි ගිහිල්ලා අපි දෙන්නා දෙපැත්තේ ඉඳලා මේ පුද්ගලයා එන තැන නිරීක්ෂණය කර ගන්නවා. නමුත් මෙයා ආවේ මොකෙන්ද කියලා බලා ගන්න වෙන්නේ නැහැ ස්වාමිනී. අඩුම තරමේ වාහනයක නම්බර් එකක් තිබ්බා නම් බලා ගන්න පුළුවන්. ඊට පස්සේ ස්වාමිනී කොහොම හරි මම කියනවා මෙයාට අපි ගෝල්ෆේස් පැත්තට යන් කියලා. මෙහේ පොලිසිය වගේ ඉන්න පුළුවන්, අපි ගෝල්ෆේස් පැත්තට යං කියලා කියනවා. එතකොට අපි හම්බ වෙලත් නැහැ නමුත් මම chat කරනවා මේ පුද්ගලයත් chat කරනවා. ඊට පස්සේ ස්වාමිනී ඒ පුද්ගලයා ත්‍රීවිල් එකක නැගලා යනවා ගෝල්ෆේස් පැත්තට. අපි ඒ පිටිපස්සෙන් යනවා. ඒ එක්කම ත්‍රීවීල් එකේ නම්බරය බලා ගන්නවා. ත්‍රීවීල් එකේ number එක තිබුණේ පානදුරේ address එකක්. සිංහල කෙනෙක්ට. ඒකෙනුත් මේ පුද්ගලයා මුස්ලිම් පුද්ගලයෙක්නේ. මුස්ලිම් පුද්ගලයෙක් වෙන්න එපෑ අන්තවාදී පුද්ගලයෙක් නම්. සිංහල address එකකින් අපිව inquiry යන්න බැහැ. පස්සේ කොහොමත් මෙයා ගෝල්ෆේස් එකට ගිහිල්ලා අපි එතනට වෙලා මෙයාගේ වටේ පොඩ්ඩක් බලා බලා ඉන්නවා මොනවා හරි සම්බන්ධතාවයක් තියෙනවද කියා. මෙයා නිතරම දුරකථනයෙන් සම්බන්ධ වෙනවා කාත් එක්ක හරි. ඊට පස්සේ බැරිම තැන මම මෙයාට කිව්වා දැන් දවල් වුණා එතකොට. මම කිව්වා අපි ගැන කවුරු හරි බලන් ඉන්නවා මෙතනින් withdraw

FAIR COMMENT — BY JEZEEM —

වෙමු කියලා. එතකොට මට දැන ගන්න ඕන වුනා එයා කොහාටද යන්නේ කියලා බලා ගන්න. එයා කොහොම හරි ගෝල්ෆේස් එක පැත්තේ ඉදන් කොළඹ පැත්තට ඇවිල්ලා roundabout එකෙන් ගත්තා ත්‍රීවිල් එක. නමුත් ස්වාමීනි මෙයා ත්‍රීවීල් එක අරන් මෙයා රවුන් දෙකක් ගත්තා roundabout එකේ. රවුන් දෙකක් ගන්න කොට මම දැන ගත්තා සාමාන්‍යයෙන් ඔය ආවේක්ෂන රාජකාරී කරන කට්ටිය ආවේක්ෂනය මහහරින්න ඔය roundabout වල වගේ දෙපාරක් යනවා. මම දැන ගත්තා අනිවාර්යයෙන්ම මේක ආරක්ෂක අංශයේ කවුරු හරි වෙන්න ඕන කියලා ඒ ගමන්ම මම කරපු වැඩේ ඒ ත්‍රීවීල් එකත් පහු කරගෙන ගාල්ල පැත්තට ආවා. එතකොට roundabout එකේ පොලිසියේ දෙන්නෙක් හිටියා. මම කිව්වා මම SI මෙහෙම. නවත්වන්න නවත්තලා බලන්න කවුද document මොනවද කියලා බලන්න. එතකොට ඒ මනුස්සයාට මොනවා හරි ගන්න පුළුවන්නේ. ඊට පස්සේ එහෙම නවත්වන්න කියලා මම කෙලවරට ගිහිල්ලා නැවතිලා හිටියා මායි මගේ නිලධාරියයි. ඊට පස්සේ ටිකක් වෙලා ගියාම ආවා සාජන් කෙනෙක් ආවා. සර් මම ආමී එකේ unit එකේ මෙහෙමයි කියලා Identity Card එක දීලා කතා කලා. සර් මොකේද කියලා ඇහුවා. මම කිව්වේ නැහැ මගේ ආයතනය මොකක්ද කියලා මම හරියට කිව්වේ නැහැ. කියලා සර් අපි ඔක්කොම එකමනේ කරන්නේ මෙහෙමයි කියලා කතා කලා. මම දැන ගත්තා මේක අපි දෙගොල්ලොම එකතු වෙලා බොරුවට දෙපැත්ත හොයලා තියෙන්නේ කියලා. ඊට පස්සේ ඒ සම්බන්ධව මම අංශ ප්‍රධානියාටත් කිව්වා. කියලා ඒ සම්බන්ධව කටයුතු කලා ස්වාමිනී. එයින් ඉස්සරහාට යන්න දෙයක් තිබුනේ නැහැ ස්වාමිනී මොකද අන්තවාදී පුද්ගලයෙක් නෙමෙයිනේ තවත් ආරක්ෂක අංශයක් හන්දා.

ප : ඒ කියන්නේ මේ අබුහයිදර් කියන්නෙත් යම් අපේ බුද්ධි අංශයක නිලධාරියෙක්?

පි : ඔව් ස්වාමිනී. මට Identity Card එක පෙන්නුවා ස්වාමිනි. මට දුරකතන අංකයත් දුන්නා. මම ඒක තියා ගත්තේ නැහැ. ඒක ඇත්තටම වැඩක් නැති වැඩක් නිසා.

ප : ඔබ ඇයි අර ෆස්රූල් සහරාන්ගෙන් අර ප්‍රශ්නේ ඇහුවේ. ඇයි IS සංවිධානය තාම මේකේ වගකීම භාරගෙන නැත්තේ කියලා?

පි : ඒක ස්වාමිනී කාටත් තිබුණ ප්‍රශ්නයක්නේ. අපි දන්නවා පරික්ෂණ කරන කොට පළවෙනි දවස වෙන කොට දැන ගත්තා මේකේ හිටියේ සහරාන් කියලා. සම්බන්ධ වෙච්ච කට්ටියගෙන්. සහරාන්

FAIR COMMENT — BY JEZEEM

IS සංවිධානය ගැන ප්‍රචාරය කලා කියලා අපි දන්නවා 2016 ඉදන්. ඇයි මේගොල්ලෝ මෙහෙම සම්බන්ධයක් තිබ්බා නම් IS එක මේකට සම්බන්ධ වුනේ නැත්තේ. ඒ කියන්නේ සහරාන්ලා IS එකත් එක්ක සම්බන්ධ නැද්ද. ඒ ප්‍රශ්නේ තිබුණා. සහරාන්ලා IS එකත් එක්ක සම්බන්ධ නැද්ද, නැත්නම් IS එක මේගොල්ලන් එක්ක සම්බන්ධ නැද්ද මම හිතන්නේ දැනටත් පරීක්ෂණ කරන ආයතන IS එකයි සහරාන් අතරේ තිබුණ සම්බන්ධතාවය හොයාගෙන තිබෙනවා කියලා මම දන්නේ නැහැ ස්වාමිනී. ඒ කියන්නේ එහෙම සම්බන්ධයක් තිබුණද නැද්ද කියන එක. සම්බන්ධතාවයට මැදිහත් වෙලා ඉදලා තියෙන්නේ මේ පුද්ගලයා කියන එක මට මෙයාගෙන් ගන්න පුළුවන් වුනා ස්වාමිනී.

ප්‍ර : ඒ කියන්නේ ෆස්රූල් සහරාන්ගෙන්?

පි : ඔව් ස්වාමිනී.

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු දැන් ෆස්රූල් සහරාන් කොයිම වෙලාවකවත් විදේශගත වෙලා හිටියේ නැහැනේ, ලංකාවේ නේද හිටියේ?

පි : ෆස්රූල් රහුමාන් මොහොමඩ් සහරාන් කටාර්වල තමයි හිටියේ ස්වාමිනී.

ප්‍ර : කටාර්වල ඉදලා 15 වෙනිදා ලංකාවට ආවට පස්සේ දිගටම හිටියා?

පි : ඔව් ස්වාමිනී.

ප්‍ර : එතකොට 15 වෙනිදා ලංකාවට එන්න විශේෂ හේතුවක් ඔබට අවබෝධ වුණාද?

පි : නැහැ ස්වාමිනී නැහැ. එයා කලින් ඉදන් මම සති 2 කින් එනවා කිය කියා හිටියේ ස්වාමිනී. හැබැයි එයාට කුරසාන් ප්‍රොවින්ස් එකට යන්න උවමනාව තිබුනේ. මගෙන් ඇහුවා passport තියෙනවද ඒ වගේ දේවල් ඇහුවා. සමහර විට එයාගේ අරමුණ වෙන්න පුළුවන් ලංකාව හරහා ඇවිල්ලා මම හරහා සහරාන් හම්බ වෙලා එයාට ඇෆ්ගනිස්ථානයට යන්න අරමුණක් තියෙන්න පුළුවන් සමහරවිට.

ප්‍ර : ඔබට හැඟිච්ච විදියට අප්‍රේල් 21 ප්‍රහාරය ගැන එයා දැනන් හිටියේ නැහැ?

පි : නැහැ ස්වාමිනී. මොකද එයා මගෙන් 20 හම්බ වෙමුද කියලත් අහනවානේ ස්වාමිනී. 20 ත් හමු වීමක් දා ගන්න පුළුවන්ද කියලා අහනවානේ.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට මේ විදියට කොහොම හරි මෙයා ලංකාවට ඇවිල්ලා අහම්බෙන් සිද්ධ වෙච්ච පිපිරීම නිසා තමයි මෙයා මේ වගකීම භාර ගන්නවාද කියන එක IS සංවිධානයට යොමු කරන්නේ?

පි : ඔව් ස්වාමිනී. මෙයා ඒකේ මූලිකත්වය ගන්නවා.

ප්‍ර : නැතුව ඇත්ත වශයෙන්ම සම්බන්ධතාවයක් තිබිලා වගකීම භාර ගත්තාය කියලා හිතන්න බැහැ නේද තියෙන විදියට?

පි : කාත් එක්ක සම්බන්ධතාවයක්ද ස්වාමිනී.

ප්‍ර : IS සංවිධානය එක්ක. IS සංවිධානය ඇත්ත වශයෙන්ම ඒ කියන්නේ genuinely වගකීම භාර ගත්තා කියලා කියන්න බැහැ නේද මේ තිබිච්ච කතා බහ අනුව?

පි : කතාබහ අනුව ඒක කියන්න බැහැ ස්වාමිනී. මම හිතන්නේ මේ කරන පරීක්ෂණ ආයතන එක්කවත් කොහේවත් මේ සංවිධානය එක්කෙනා මේකත් එක්ක සම්බන්ධයි කියලා කොහේවත් ඇවිල්ලා තියෙනව කියලා මම දන්නේ නැහැ ස්වාමිනී.

ප්‍ර : ඔබේ පරීක්ෂණ අවස්ථාවලදි, විමර්ශනයේදි දැන් මේ පුද්ගලයාව ඔහුව question කරන්න හම්බ වුනේ නැද්ද ඔබට?

පි : නැහැ ස්වාමිනී නැහැ. මම දැකලාවත් නැහැ.

ප්‍ර : වෙනත් කවුරුන් හෝ ඔහුගෙන් ප්‍රශ්න කල බව ඔබට අනාවරණය වුනාද?

පි : CID එකෙන් ප්‍රශ්න කරලා තියෙනවා. මට කිව්වා ස්වාමිනී.

ප්‍ර : එතකොට ඒ ප්‍රශ්න කිරීම්වල ප්‍රතිඵලය වුනේ ඔහු කටාර් වල ඉන්දැද්දී මේ IS සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දක්වපු කෙනෙක් බව හැඟුනා නේද?

පි : ඔව් ස්වාමිනී.

ප්‍ර : එතකොට ඔහුට ඇත්තටම ජාලය ඇතුලට යන්න පුළුවන්කමක් තිබුනේ නැහැ කියන එක පැහැදිලි වෙනවද?

පි : සහරාන්ගේ ජාලෙට යන්න බැරි වුනා ස්වාමිනී. එයා හිතන් හිටියේ එකම පුද්ගලයා මං හරහා තමයි යන්නේ කියන එක තමයි එයා හිතාගෙන හිටියේ ස්වාමිනී.

දැන් වේලාව : රාත්‍රී 11.30 යි
මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙනවිය විසින්ය.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.11.30
පෙර සටහන්: ධම්මිකා මිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබට මෙම කොමිෂන් සභාවේ ගරු සභාපතිතුමා විසින් දුන්නනේ කිසියම් බුද්ධි ආයතනයක තොරතුරක්?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: අබුහයිදම් ගැන? අබුහයිදම් කියලා ඔබ කිව්වේ?

උ: අබුහයිදර්.

ප්‍ර: දැන් ඔබගේ සොනික් සොනික් දුරකථන අංකයම තමයි ඔය අබුහයිදර් සමඟ එස්.අයි.පෙරේරා සර් කියලා සම්බන්ධ වෙන්නේ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ ඔබද සම්බන්ධ වෙන්නේ එස්.අයි.පෙරේරා සර් කියලා ඔහු සමඟ?

උ: ස්වාමීනි දැන් මගේ අංකේ තියෙනවනේ. එතකොට මේ එස්.අයි.පෙරේරා සර් කියලා මේක දාලා තියෙන මේ Account එකේ මේ Image එක ගත්ත කෙනානේ ස්වාමීනි. මේ Account එක භාවිතා කරපු පුද්ගලයගේ Account එක මාව පෙන්වන විදිය ස්වාමීනි. මාව පෙන්නනව නම් ඒකේ පෙන්නන්න ඕන සොනික් සොනික් කියලා. ඒ පුද්ගලයා මගේ අංකෙත් එක්ක මගේ නම මෙහෙම Save කරොත් තමයි එස්.අයි. පෙරේරා සර් කියලා පෙන්වන්නේ ස්වාමීනි. ඒ කියන්නේ ඒ මේ Account එකක් තිබුණු පුද්ගලයා මේක එස්.අයි. පෙරේරා සර් කියලා Save කරානම් ස්වාමීනි ඒක එහෙම පෙන්වනවා ස්වාමීනි. නැත්නම් මගේ නම සොනික් සොනික් කියලා තමයි පෙන්වන්නේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔය ඔබ දුටුව ඔය Page එක අරන් තියෙන්නේ කාගේ පිටුවකින් ද කාගේ සම්බන්ධතාවයක් තියෙන එකකින් ද?

උ: ස්වාමීනි අපිට කාගේ හරි කණ්ඩායමක මමත් සම්බන්ධවෙලා හිටපු කණ්ඩායමකින් තමයි කණ්ඩායමේ ඉන්න Group එකේ ඉන්න memberලා පෙන්නන තැනකින් තමයි මේ අරන් තියෙන්නේ. මේකේ නැහැ කාගේද මේ Account එක කියලා නැහැ.

ප්‍ර: දැන් ඔබ සම්බන්ධ වුණේ කාත් එක්කද කියලා කියන්න පුළුවන් ද ඕකේ? කණ්ඩායමේ කාත් එක්කද ඔබ සම්බන්ධ වුණේ කියලා?

උ: ස්වාමීනි මම මේ කණ්ඩායමත් එක්ක මෙහෙමයි ස්වාමීනි මං කිව්වේ අර ඉස්සෙල්ලා එක පාරක් මං හැඳින්වුයේ Did you know කියලා ටෙලිග්‍රෑම් නාලිකාවක්. අපි නාලිකාවක් Publish කරාම ඒක Click කරලා මට ඒ නාලිකාවට ඇතුල් වෙන්න පුළුවන් ස්වාමීනි. ඇතුල් වුණාට පස්සේ මට ඒකේ තියෙන ඒවා බලන්න පුළුවන් මට මොකුත් Publish කරන්න බැහැ.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එතකොට ඒ වගේ මේ නාලිකාවක්. ඒ නාලිකාවට මමත් සාමාජිකයෙක් වෙලා ඉඳලා තියෙනවා ස්වාමීනි. ඒ මේ මොකක් හරි IS සංවිධානයට සම්බන්ධ මතවාද ප්‍රචාරය කරන මොකක් හරි නාලිකාවක් ස්වාමීනි. මේ අරාබි භාෂාවෙන් තියෙන්නේ. ඒ අර ටෙලිග්‍රෑම් එක හරහා යන්න පුළුවන් කණ්ඩායමක්. මේකේ සම්බන්ධ වෙන්න ඕනේ නැහැ කාත් එක්කවත් සංවාදයේ යෙදෙන්න ඕනේ නැහැ. අපිට මේකට එකතුවෙලා මේ Group එකට අපිට මේකේ තියෙන දේවල් බලන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ඔය සොනික් සොනික් කියලා ෆස්රදල් රහුමාන් මොහොමඩ් සහරාන් එක්ක සම්බන්ධ වුණානේ. ඒ ඔබට එම User name එක ලැබුණේ කවදද? ඔබගේ අර ඉහළ නිලධාරියෙක්නේ ඔබට දුන්න කිව්වේ?

උ: 2019 පෙබරවාරී මාසයේ ස්වාමීනි.

ප්‍ර: ඔබ සන්නිවේදනය ආරම්භ කළේ මාර්තු 28 වගේ නේද?

උ: නැහැ ස්වාමීනි 2019 පෙබරවාරී මං සන්නිවේදනය ආරම්භ කරා. මගේ සන්තකයේ තියෙන්නේ 2019 මාර්තු ඉඳන් අනිත් ඒව මේකේ තියෙන දේවල් මගේ ෆෝන් එකේ තිබුණේ. පෙළක් ඒවා මකපුවා තියෙනවා . පෙළක් ඒවා මේ ටෙලිග්‍රෑම් මෘදුකාංගය හරහාම මැකෙනවා. ඒක හින්දා පරණ දේවල් මැකෙනවා. සාමාන්‍යයෙන් අපිට පුළුවන් අපේ මෘදුකාංගය දාන්න පුළුවන් දවස් 03 කට කලින් ඉඳන් දවස් 03, දවස් 07, මාස 03 ක් වගේ කාල සීමාවල ඔක්කොම erase වෙලා යන විදියට. ඒ විදියට ගිහිල්ලා මේකේ මුල ටික නැහැ ස්වාමීනි. මගේ තියෙන්නේ මගේ සන්තකයේ තියෙන ටික මේ ටික තමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ බුද්ධි නිලධාරියෙක්නේ ඇයි එහෙම ඔබ මේ Program කරන්නේ දවස් දැන් ඔබ මෙහෙයුමකනේ ඉන්නේ? බුද්ධි මෙහෙයුමකනේ මේ ෆස්රදල් රහුමාන් එක්ක ඉන්නේ. එතකොට ඇයි ඔබ දින තුනක දී මේ මැකී යන විදියට මේක Program කරන්නේ ?

උ: මං Program කරන්නේ නැහැ ස්වාමීනි. ඒක තියෙන දෙයක්. ඒ වගේම ස්වාමීනි මගේ ෆෝන් එක මං භාවිතා කළේ. ඒකේ මේගාබයිට් ගාන වැඩිවෙන කොට මට භාවිතා කරන්න අපහසු වෙනවා. ඒ වගේම මේ වගේ Channel එකක ස්වාමීනි ගොඩක් වීඩියෝ තියෙනවා. ඒ වගේ ඒවා Upload වෙලා පෙන්වන කොට ෆෝන් එක භාවිතා කරන්න අපහසුයි. ඉතිං අර පරණ දේවල් කොහොමත් ඉවත් කරලා දානවා ස්වාමීනි.

ප්‍ර: නමුත් ඔබට අදහසක් නැද්ද බුද්ධි නිලධාරියෙකු ලෙස ඔබ එම අරමුණ කිසියම් අරමුණකටනේ මේක කරන්නේ. බුද්ධි තොරතුරු රැස් කරන්නේ. ඒ පරමාර්ථයෙන් ඔබගේ පෞද්ගලික දුරකතනයේ මෙය Save කිරීමට තරම් ඉඩ ප්‍රස්ථා නැත්නම් මෙය වෙනමම backup වගේ System

FAIR COMMENT
BY JEZEEM

එකකට ගිහිල්ලා Save කරලා මේවා තියන්න ආරක්ෂා කරලා කාට හරි බලන්නට?

උ: ස්වාමීනි දැන් මෙක backup වගේ තියෙන එක ගැන මගේ දැනීමක් නැහැ ස්වාමීනි. මෙක ටෙලිග්‍රෑම් ඇප් එක. මේ Printout එක ගන්න පුළුවන් වෙන්නේත් 2018 වගේ 07 වැනි මාසේ මේ ගොල්ලෝ උපාංගයක් දානවා ඔයගොල්ලන්ට මේ ඔයගොල්ලොන්ගේ Chat එක Export කරලා ගන්න පුළුවන් කියලා. Export Chat History Features කියලා එකක්. ඒක හින්දා තමයි මේකත් අඩුම තරමේ අරන් තියෙන්නේ ස්වාමීනි. නැත්නම් මේවා තියාගන්න අවශ්‍යතාවයක් තිබුණේ නැහැ. මොකෝ අන්තවාදී පුද්ගලයෙක් එක්ක අපි සන්නිවේදනය කරලා ඒ මනුස්සයගේ ටෙලිෆෝන් නම්බරය අරගෙන හඳුනාගත්තට පස්සේ ඒක හොඳටම ප්‍රමාණවත් අන්තවාදී මනුස්සයෙක් හඳුනගන්න එක. මගේ දැනීමේ හැටියට. නැතුව අරවා මං Save කරලා තියාගන්න තරම් මං හිතුවේ නැහැ අවශ්‍යයි කියලා.

ප්‍ර: නැහැ පුද්ගලයා හඳුනාගැනීම නෙවෙයි නේ තොරතුරු ඔබ දෙන අතරේ සන්නිවේදනය වුණු තොරතුරු මොනවද කියලා දැනගැනීමට අයිතියක් දැන් ඔබව රහස් පොලීසියෙනුත් අහලා තියෙනවනේ. එතකොට ඔවුන්ට වුණත් ඇති වෙන්න පුළුවන් නේ . මේ ඔබ මොකද මේ මාර්තු මාසයේ 28 කියන්නේ අප්‍රේල් වලට සති දෙකකට වගේ ආසන්න අප්‍රේල් 21 ප්‍රහාරයට සති තුනකට උඩදී තමයි ඔබ මෙම පුද්ගලයා සමඟ සන්නිවේදනය ආරම්භ කරන්නේ. ඒක නිසයි මං ඔබගෙන් ඒ ප්‍රශ්නය ඇහුවේ. ඔබට කියන්න පුළුවන් ද මෙම කොමිසමට ඔබට මෙම User name එකක් දුන්නනේ.

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: විදේශීය බුද්ධි අංශයකින් කියලා කියලා තියෙනවා. ඔබට කියන්නට පුළුවන්ද මොකක්ද ඒ විදේශීය බුද්ධි අංශය කියන්නට බැරිනම් රටවත් කියන්නට පුළුවන්ද?

උ: ඇමරිකානු බුද්ධි අංශයක් විසින් තමයි ස්වාමීනි දීලා තියෙන්නේ.

ප්‍ර: ඇමරිකානු බුද්ධි අංශයක්?

උ: ඔව් ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදින්ල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට ලබාදෙමි. ප්‍රශ්න නොමැති බව දන්වයි.

FAIR COMMENT BY JEZEEM

මෙම සාක්ෂිකරුගෙන් ලබාදුන් සාක්ෂිය මාධ්‍යය නොමැතිව ලබාගත් සාක්ෂියක් වශයෙන් සටහන් විය යුතු බව සටහන් කර තබමි.

කොමිෂන් සභාවේ කටයුතු ජූලි මස 27 වැනි දින පස්වරු 12 පසුවී විනාඩි 30ට නැවත රැස්වේ.

ප්‍ර : එතකොට දැන් ද්‍රවිඩ අය ඔය රවීන්ද්‍රන් කියන විදියට මුහුණ විතරක් පේන විදියට ඇඟ හැමතැනම ආවරණය වෙන විදිහේ ඇඳුම් අඳිනවද?

පි : ද්‍රවිඩ කාන්තාවන් සාමාන්‍යයෙන් එහෙම අඳින්නේ නැහැ.

ප්‍ර : එහෙමනම් ඒ විදිහේ ඇඳුම් අඳින්නේ මුස්ලිම් ජන කොට්ඨාශයේ අය කියලා මම කිව්වොත් රවීන්ද්‍රන් ඒකට එකඟ වෙනවද?

පි : මුස්ලිම් අය එහෙම අඳිනවා. මම ඒකට එකඟ වෙනවා.

ප්‍ර : එතකොට රවීන්ද්‍රන්, රවීන්ද්‍රන් මුස්ලිම් අය අඳින මේ ඇඟ ඔක්කොම වහලා මුහුණ විතරක් එළියේ තියෙන ඇඳුමක් ඇඳන් හිටපු තැනැත්තිය රවීන්ද්‍රන් දන්න පුලස්තිනී කියලා කොහොමද හඳුන ගත්තේ?

පි : එයාගේ මුහුණ අනුව මම හඳුනා ගත්තා ඇය තමයි කියලා.

****

ගරු සභාපතිතුමා :

මේ අවස්ථාවේදී සාක්ෂිකරු ඔහුගේ අභිරූපණය කරමින් ඔහුගේ අත් දෙක විසි කරමින් මුහුණ විවෘත කළ කොටස පෙන්වමින් ඒ ආධාරයෙන් පුලස්තිනී හඳුනාගත් බව කොමිෂන් සභාවට පෙන්වයි.

දැන් වේලාව ප.ව. 6.50 යි
මෙතැන් සිට සටහන් කළේ මුතුමාලි මෙනෙවිය

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව.06.50 යි.
පෙර සටහන් ල/ලේ : ඉන්ද්‍රාණි මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : එතකොට දැන් ඔය ඒ විදියට එහෙමනම් රවීන්ද්‍රන් එයාව අඳුන ගත්තේ අර පොඩි කාලේ ඉඳලා ඇයව දන්න නිසාද?

පි : ඒ පාරේ යන එන කොට, ඉස්කෝලේ යන එන කොට එයාව දැන ගෙන හිටියා ඒ විදිහයි කියලා.

ප්‍ර : අපි පෙන්නනවා C 918 කියලා ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන ඡායාරූපයක්. බලන්න ඔය වගේද ඔබ දැක්කේ ඇයව කියලා?

පි : ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී C 918 දරණ ඡායාරූපය කොමිෂන් සභාවේ භාෂණ පරිවර්තක විසින් සාක්ෂිකරුට පෙන්නු වහාම ඔහු එම හඳුනා ගැනීම සිදු කළ බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : රවීන්ද්‍රන් දැන් පාන්දර තුන හමාරට විතර පුලස්තිනීව කළුපාට ඇඳුමක් ඇඳගෙන ඔබ දකින කොට ඇයව ඇයගේ මුහුණ දැකලා ඇයව අඳුන ගන්න පුළුවන් විදිහට ආලෝකයක් එතන තිබුණද?

පි : ඒ පාර අයිනේ තිබ්බා light කණුවේ එළියක්. ඒ light එක නිසා ටියුබ් ලයිට් එකක්.

ප්‍ර : ඒ කියන්නේ හොඳ ආලෝකයක් ඒ වෙලාවේ එතන තිබුණයි කියලද රවීන්ද්‍රන් කියන්නේ?

පි : හොඳ power එකක් තියෙන light එකක් තිබ්බා කියලා.

ප්‍ර : රවීන්ද්‍රන් පුලස්තිනීව දකින කොට රවීන්ද්‍රන් හිටපු තැනත් පුලස්තිනී හිටපු තැනත් අතර කොච්චර විතර දුරක්ද තිබ්බේ? අපි මෙහෙම කියමුකෝ රවීන්ද්‍රන් ඔතන තමයි වාහනයේ දැන් ඉන්නේ. එතකොට ඔතන ඉඳලා කොච්චර දුරකින්ද කියලා පෙන්නන්නකෝ අතින් පෙන්නන්න කොයි හරියේද කියලා මේ ශාලාවේ දැක්කේ?

පි : මේ පුටුව තියෙන තැනට සමාන දුර ප්‍රමාණයක් තිබ්බා.

****

Presidential Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරු විසින් ඔහු සාක්ෂි කූඩුවේ සිට සාක්ෂි දෙන ස්ථානයේ සිට ඔහුට ඉදිරියෙන් ඇති ස්ථානයක් කොමිෂන් සභාවට පෙන්වනු ලබයි. එම ස්ථාන දෙක අතර දුර කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක විසින් මැනීමෙන් පසු එම දුර අඩි 10 ක් පමණ බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : රවීන්ද්‍රන් දැන් රවීන්ද්‍රන් ඔය පුලස්තිනීව දකින වෙලාවේදී වාහනයේ ඉස්සරහා ඇන්ටනීට වම් පැත්තෙන්ද හිටියේ?

පි : ඔව් මම එතන තමයි හිටියේ.

ප්‍ර : එතකොට දැන් ඔබ පුලස්තිනීව දකින වෙලාවේ වෙන මොනවා හරි වාහන ඒ වෙලාවේ තිබ්බද ඔය පාරේ?

පි : මොකුත් ආවේ නෑ. මගේ වාහනය සහ එතන Pickup එක විතරයි තිබුණේ.

ප්‍ර : ඒ කියන්නේ තව pickup එකක් තිබුණද පාරේ?

පි : වෙන වාහනයක් තිබුණේ නෑ. Pickup එකක් තිබ්බා.

ප්‍ර : ඔව් ඒ pickup එක කියන වාහනය තමයි තිබ්බේ නේද පාරේ?

පි : ඔව් ඒ වෙලාවේ තිබ්බේ ඒක තමයි.

ප්‍ර : එතකොට දැන් සාරා හිටියා නම් අර ඉස්සර වෙලා රවීන්ද්‍රන් පෙන්නපු තැන ඔය pickup එක තිබුණේ කොයි හරියේද?

පි : එයා හිටපු තැනට පොඩ්ඩක් අයිනට වෙන්න තමයි වාහනය තිබ්බේ.

ප්‍ර : Beach road එක පැත්තෙමයි?

පි : ඒ පැත්තෙම වාහනය තිබ්බා.

ප්‍ර : එතකොට රවීන්ද්‍රන් දැන් ඔය pickup එක දකින අවස්ථාව වෙන කොට pickup එක එළවගෙන කවුරු හරි යනවද නැත්නම් එක තැන නවත්තලද තිබුණේ?

පි : මම දැක්කේ ඒක නවත්තලා තිබ්බා. ඒකේ ඇතුළේ දෙන්නෙක් සිටියා සහ ඒකේ පොඩි light එකක් දාලා තිබ්බා. Side එකේ කළු glass තිබ්බා. නමුත් light එකක් ඇතුළේ තිබ්බා. ඇතුළේ light එකක් දාලා තිබ්බා.

ප්‍ර : දැන් පුලස්තිනීව දැක්කට පස්සේ ඇන්ටනීයි රවීන්ද්‍රනුයි මොකද කළේ? මං මෙහෙම අහන්නම්කෝ. රවින්ද්‍රන්ගෙන් මං මෙහෙම අහන්නම්කෝ නැත්නම්. රවීන්ද්‍රනුයි ඇන්ටනීයි සාරාව දැක්කට පස්සේ අර ආපු විදිහටම වාහනය ඉස්සරහට ගියාද

FAIR COMMENT BY JEZEEM

ඕගොල්ලන්ගේ වාහනේ ඕගොල්ලන්ගේ බඩිය ඉස්සහරට එළවගෙන ගියාද?

පි : ඔව් අපි ඉස්සරහට ඒ විදිහටම ගියා.

ප්‍ර : කොයි පැත්තටද දැන් ඔය යන්නේ රවීන්ද්‍රන්ලා?

පි : ඒ beach පාරේ ඉස්සරහට අපි ගියා.

ප්‍ර : නැත්නම් කල්මුණේ පැත්තටද?

පි : කල්මුණේ පැත්තට ගියා.

ප්‍ර : ආ.. beach road පැත්තට නෙවෙයි කල්මුණේ පැත්තට ගියා?

පි : ඔව්.

ප්‍ර : ඒ ගිහිල්ලා නැවත හැරිලා ආවාද? U turn එකක් දාලා ආවාද කොයි වෙලාවක හරි?

පි : සාරාව දැක්ක ගමන් එතන U turn එක එයාලට එතනින් තමයිලු යන්න ඕන. ඒ නිසා එතනින් යන්නේ නැතුව කෙළින්ම ගිහිල්ලා ආපහු හරවගෙන ඇවිල්ලා එනකොට ඇවිල්ලා තමයිලු ගියේ.

ප්‍ර : එතකොට දැන් ඔබලා U turn එකක් දාලා බඩි ලොරිය හරවගෙන ආපහු එනකොට සාරා ඔබලා දැක්ක තැන හිටියද?

පි : ඒ වෙලාවේ හිටියේ නැහැ.

ප්‍ර : එතකොට දැන් ඔබගේ වාහනය කොහේ හරි නැවැත්තුවද?

පි : නැහැ නැවැත්තුවේ නැහැ.

ප්‍ර : නෑ දැන් සාරා ඉන්න තැනට ඇවිල්ලා ආපහු නැවැත්තුවේ නැද්ද?

පි : සාරා හිටපු තැන නැවැත්තුවා.

ප්‍ර : හිටපු තැන නැවැත්තුවා. එතකොට අර pickup එකක් ඉස්සරවෙලා දැක්කයි කියලා කිව්වනේ දෙන්නෙක් ඉස්සරහා ඉන්නවා light එකක් ඇතුළේ දාලා තියෙනවා. සාරා හිටපු තැනට පොඩ්ඩක් එහායින් pickup එකක් තියෙනවා කියලා ඉස්සෙල්ලා කිව්වේ සාක්ෂියේ?

පි : අපි U turn එක දාලා ආයි එනකොට බඩි එකේ තියෙන එළියට අපි දැක්කා ඒ වාහනේ ඇතුළේ දෙන්නෙක් සහ ඒ කියපු දේම අපි දැක්කා.

ප්‍ර : එතකොට කොයි වෙලාවක හරි නවත්තලා ඒ වාහනය ඇතුළේ ඉන්න කාට හරි කතා කරන්නට ඔබ හරි ඇන්ටනී අයියා හරි උත්සාහ කළාද?

පි : ඔව් ඇන්ටනී අයියා ඒකට උත්සාහ කළා. මම සිංහල දන්නේ නැති නිසා ඇන්ටනී අයියා සිංහල දන්න නිසා එයා ඒකට උත්සාහ කළා. ඒ වාහනේ ඇතුළේ හිටපු කෙනා අඳුරන පොලිසියේ එක්කෙනෙක් වගේ මෙයා දැක්ක නිසා මෙයා බහින්න යන කොට ඇන්ටනී

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

බහින්න යන කොට ඒ වාහනේ ඇඳලා ගියාලු. නමුත් ඒකේ ඇතුළේ ඉන්න කාටවත් කතා කළේ නෑ.

ප්‍ර : ඇන්ටනී අයියා බහින්න ඉස්සර වෙලා කිව්වද එයා දන්න මහත්මයෙක් pickup එකේ ඉන්නවා කියලා?

පි : ඒ වාහනයේ ඇතුළේ ඉන්නේ දන්න පොලිසියේ එක්කෙනෙක් කියලා හිතපු නිසා ඒ කියන්නේ එයා හඳුන ගත්ත නිසා එයා බහින්න කකුල බිමට තිබ්බේ නැල්ලු කකුල තියන්න යන කොටම ඒ වාහනේ ඇඳලා ගියාලු. ඒ නිසා එතෙන්ට එතනින් කතා කළේ නැහැලු.

ප්‍ර : රවීන්ද්‍රන් ඔය කියන්නේ ඇන්ටනී අයියා කරපු ක්‍රියාවන් ගැන නේද?

පි : ඔව්. එතනින් බහින්න අපිට බය හිතුණා. වෙඩි තිබ්බොත් එහෙම බයක් නිසා එතන බැස්සේ නැහැ.

ප්‍ර : නෑ නෑ මේ දැන් ඔය කිව්වේ බහින්න හැදුවා කියලා. නමුත් ඊට ඉස්සර වෙලා pickup එක යන්න ගියා කියලා කිව්වනේ ඒ බහින්න හැදුවේ මෙයාද ඇන්ටනී අයියද?

පි : ඇන්ටනී අයියා.

ප්‍ර : එතකොට දැන් ඇන්ටනී අයියා ඕගොල්ලන් අම්පාරේ යන්න ඉස්සර වෙලා පොලිසියේ කාට හරි කතා කරලා ඔය ගැන කිව්වද?

පි : බඩු ගන්න යන්න ඉස්සෙල්ලා පොලිසියේ කාට හරි එයා කතා කරලා මේ ගැන කිව්වා. ගිහිල්ලා ආපහු එන කොට ආපහු පොලිස් ස්ථානයට ගිහිල්ලා මේ ගැන කිව්වා. මම ගියේ නැහැ. මම එළියේ හිටියා. ඇන්ටනී අයියා තමයි ඇතුළට ගියේ.

ප්‍ර : රවීන්ද්‍රන් කියන්නේ ඔය උදේ සිදු වුණ සිද්ධිය ගැන අම්පාරේ යන්න ඉස්සර වෙලා ඇන්ටනී අයියා call කරලා පොලිසියේ කාට හරි කිව්වා නේද?

පි : වාහනය drive කර ගෙන යන කොට එයා ඒක ගැන කතා කළා.

ප්‍ර : ඊට පස්සේ අර පුරුදු විදිහට එළවළු එකතු කර ගෙන අම්පාරේ ගිහිල්ලා ඒ එළවළු ටික භාර දුන්නනේ?

පි : ඔව් ඒ විදිහට බඩු භාර දීලා ආපහු ආවා.

ප්‍ර : ඒ ආපහු එන අවස්ථාවේද ඇන්ටනී අයියා පොලිසියට ගියේ?

පි : ඔව්.

ප්‍ර : මොන පොලිසියටද ඇන්ටනී අයියා ගියේ?

පි : කලවංචිකුඩි පොලිසියට.

ප්‍ර : කොච්චර විතර ඇන්ටනී අයියා පොලිසිය ඇතුළේ හිටියද?

පි : පැය තුනක් විතර හිටියා. පැය දෙකක් දෙක හමාරක් අතර කාලයක් ගියා කියලා කියනවා.

Proofreader's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මං ඉස්සර වෙලා රවීන්ද්‍රන්ට කතා කරලා අහන කොට පුලස්තිනී ගැන සමහර වෙලාවට රවීන්ද්‍රන් සාරා කියන නම පාවිච්චි කෙරුවා නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට සාරා කියන්නෙයි පුලස්තිනී කියන්නෙයි දෙන්නම එක්කෙනාද?

පි : ඔව්.

ප්‍ර : රවීන්ද්‍රන් එදා ගෙදර ගිහිල්ලා දැන් අම්පාරේ ඉඳලා ආපහු ඇවිල්ලා ගෙදර ගිහිල්ලා මේ සාරාව දැක්ක කරුණ wife ට එහෙම කිව්වද?

පි : ඔව් මම කිව්වා.

ප්‍ර : එතකොට ඊට පස්සේ වෙන කාට හරි කිව්වද මේ සිද්ධිය ගැන?

පි : වෙන කිසි කෙනෙකුට කිව්වේ නෑ.

ප්‍ර : ඇයි ඒ? වෙන කාටවත් ඒ සිද්ධිය ගැන කිව්වේ නැත්තේ ඇයි රවීන්ද්‍රන්?

පි : මට බය හිතුණා මං බය නිසා කිව්වේ නෑ.

ප්‍ර : කොයි වෙලාවක හරි රවීන්ද්‍රන් ඔය සිද්ධියෙන් පස්සේ කාත්තන්කුඩිය පොලිසියට ගියාද?

පි : මම ඊට පස්සේ ගියේ නැහැ.

ප්‍ර : නෑ රවීන්ද්‍රන් ගියේ නෑ. රවීන්ද්‍රන්ව කවුරු හරි එක්කන් ගියාද කාත්තන්කුඩිය පොලිසියට? නෑ හරි දැන් කමක් නෑ රවීන්ද්‍රන්ට ඒක අපහසු නම් කියන්න මේ මං මෙහෙම අහන්නම්කෝ. කොයි වෙලාවක හරි CID එකෙන් කියලා කවුරු හරි ඇවිල්ලා රවීන්ද්‍රන්වයි, ඇන්ටනීවයි පොලිසියකට එක්කන් ගියාද?

පි : පොලිසියට එක්කන් ගියේ නැහැ. ගෙදරට එක්කන් ගිහිල්ලා ප්‍රශ්න කළා.

ප්‍ර : ආ... ඒ කියන්නේ ඒ ගෙදර තියෙන්නේ කොහේද කලවංචිකුඩිද, සූර්යාඩිද?

පි : සූර්යාඩි.

ප්‍ර : ආ.. ඒ ගෙදර කවුද හිටියේ?

පි : CID එකේ එක්කෙනයි, අම්පාර පොලිසියෙන් ආපු දෙන්නෙක් හිටියා ඒකේ.

ප්‍ර : එතකොට දැන් රවීන්ද්‍රන්ගෙන් කට උත්තරයක් ලියා ගත්තද ඒගොල්ලෝ?

පි : දෙන්නා වෙන වෙනම තියලා කට උත්තර දෙකක් ගත්තලු.

ප්‍ර : කවුද වෙන වෙනම කියන්නේ දෙන්නා කවුද?

පි : ඇන්ටනීයි මමයි.

ප්‍ර : ඒ කට උත්තරේ අත්සන් කෙරුවද රවීන්ද්‍රන්?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මම sign කරන්න කිව්වා කට උත්තරේ ගත්තට පස්සේ මං ඒක sign කළා.

ප්‍ර : රවීන්ද්‍රන් ඒ කට උත්තරේදී කිව්වද සාරාව දැක්කා අඳුන ගත්තා කියලා?

පි : ඔව් මම ඒක කිව්වා.

ප්‍ර : කොයි කාලේ වගේද ඔය කට උත්තරේ ලියා ගත්තේ සූර්යාඩි තියෙන ගෙදරදී රවීන්ද්‍රන්?

පි : 2019/06 වෙනි මාසේ වගේ මට මතක හැටියට.

ප්‍ර : හරි රවීන්ද්‍රන්ගෙන් මං මේක අහන්නම්කෝ. ඔය සූර්යාඩි ගෙදරදී ඇන්ටනීගෙයි රවීන්ද්‍රන්ගෙයි කට උත්තර ලියා ගත්තේ අර සාරාව දැක්ක සිද්ධියට පස්සේද?

පි : සාරාව දැක්කට පස්සේ.

ප්‍ර : එතකොට දැන් රවීන්ද්‍රන්ගේ කට උත්තරේ සාරාව දැක්කයි කියලා කිව්වනේ නේද?

පි : ඔව්.

ප්‍ර : ඒ විදිහට ඔබ සාරාව අඳුර ගත්තා කියලා කිව්වාම එම නිලධාරීන්ගේ මුහුණේ ප්‍රතිචාරය, මුහුණේ ඉරියව් වුණේ මොකක්ද?

පි : ඔවුන්ගේ මුණ මැලවිලා ගියා.

ප්‍ර : ගිය මාසේ ඒ කියන්නේ මේ අවුරුද්දේ සැප්තැම්බර් මාසේ රවීන්ද්‍රන්ට මම මේ පෙන්වන ලේඛනය කොහෙන් හරි හම්බ වුණාද?

පි : කලවංචිකුඩි පොලිසියෙන් ගෙනත් මෙයාට දුන්නලු.

ප්‍ර : කලවංචිකුඩි පොලිසියෙන් ගෙනල්ලා ඔබට මං මේ පෙන්වන ලේඛනය දුන්නා?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ මං මේ පෙන්වන ලේඛනය ඒකත් දුන්නද?

පි : ඔව්.

ප්‍ර : දෙකම දුන්නා?

පි : ඔව්.

RS 01 වශයෙන් ස්වාමිනි කලවංචිකුඩි පොලිසියෙන් සාක්ෂිකරු වෙත 2020/09 වන මස 24 වන දින දාතමින් ද්‍රවිඩ භාෂාවෙන් ලැබී තිබෙන පණිවිඩ පෝරමයත්, RS 02 ලෙස එම පොලිස් ස්ථානයෙන්ම සාක්ෂිකරුට සිංහල භාෂාවෙන් ලැබී ඇති පණිවිඩ පෝරමයත් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර : දැන් එම පණිවිඩය ලැබුණට පස්සේ ඔබ දැන ගත්තද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තමයි ඔබට මේ පණිවිඩය එවලා තියෙන්නේ කියලා?

පි : ඔව් මං ඒක දැන ගත්තා.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඔබට CID එකට එන්න කියලා තියෙන්නේ 2020 සැප්තැම්බර් මාසේ 28 වෙනිදා නේද?

පි : ඔව්.

ප : සැප්තැම්බර් මාසේ 28 වෙනිදා ඇත්තටම පැය 09.30 ට?

පි : ඔව්.

ප : දැන් CID එකට යන්න ඉස්සර වෙලා අර සාරාව දැක්කට පස්සේ සූර්යාඩිවලදී රවීන්ද්‍රන්ගේ ප්‍රකාශය ලියා ගත්තා කියලා කිව්වනේ නිලධාරීන් වගයක්?

පි : ඔව්.

ප : ඒ ප්‍රකාශය රවීන්ද්‍රන් අත්සන් කළා කියලත් කිව්වනේ?

පි : ඔව්.

ප : රවීන්ද්‍රන් ඒ ප්‍රකාශය මොන භාෂාවෙන්ද දුන්නේ ඒ නිලධාරීන්ට?

පි : දෙමළ භාෂාවෙන්.

ප : රවීන්ද්‍රන්ට දෙමළ ඇර ද්‍රවිඩ භාෂාව ඇර වෙන භාෂාවක් කතා කරන්න බැයිද?

පි : නෑ මම දන්නේ නෑ.

ප : එතකොට රවීන්ද්‍රන් අත්සන් කරපු අර ප්‍රකාශය ඒ ප්‍රකාශය මොන භාෂාවෙන්ද ලියලා තිබුණේ?

පි : දෙමළෙන් සහ සිංහලෙන් ලියලා තිබ්බා. සිංහලෙන් සහ දෙමළෙන් දෙකෙන්ම ලියලා තිබ්බා.

ප : භාෂා දෙකෙන්ම ලියලා තිබුණා?

පි : ඔව්.

ප : ඒ කියන්නේ ප්‍රකාශ දෙකක්ද නැත්නම් එකම ප්‍රකාශයේ භාෂාවන් දෙකෙන්ම තිබුණද මතකද රවීන්ද්‍රන්ට?

පි : එකම කට උත්තරය තමයි සිංහල සහ දෙමළ භාෂාවෙන් තිබ්බේ.

ප : එතකොට දැන් දෙමළ භාෂාවෙන් තිබුණ එක රවීන්ද්‍රන්ට කියවලා බලන්න පුළුවන්කමක් තිබ්බද?

පි : මට කියවන්න බැහැ.

ප : කියවන්න අපහසුයි රවීන්ද්‍රන්ට නේද?

පි : ඔව්.

ප : එතකොට ඒ නිලධාරීන් ඒ ප්‍රකාශය දෙමළෙන් කියවලා රවීන්ද්‍රන්ට පැහැදිලි කරලා දුන්නද රවීන්ද්‍රන් ඒක අත්සන් කරන්නට ඉස්සර වෙලා?

පි : එහෙම කිසිවක් කරලා දුන්නේ නැහැ.

ප : කියවලා දුන්නේ නෑ. රවීන්ද්‍රන් නිකම්ම අත්සන් කෙරුවා එහෙමද?

පි : ඔව් මම ඒක නිකම්ම අත්සන් කළා.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට අර සිංහලෙනුත් රවීන්ද්‍රන්ගේ කට උත්තරය ලියලා තිබුණයි කිව්වනේ?

පි : ඔව්.

ප්‍ර : ඒ කට උත්තරය රවීන්ද්‍රන් අත්සන් කරන්න ඉස්සර වෙලා රවීන්ද්‍රන්ට කියවලා දුන්නද?

පි : ඔව් සිංහල භාෂාවෙන් තිබුණ එක තේරුම් කරලා දුන්නා.

ප්‍ර : තේරුම් කරලා දුන්නා. ඊට පස්සේද ඒක රවීන්ද්‍රන් අත්සන් කළේ?

පි : ඔව් ඊට පස්සේ තමයි මං ඒක අත්සන් කළේ.

ප්‍ර : එතකොට රවීන්ද්‍රන් සාරාව දැක්කයි කියන එක ඒ විදිහටම ඒකේ සටහන් වෙලා තිබුණද කියවලා දෙන අවස්ථාවේදී?

පි : ඔව් ඒකේ ලියලා තියෙනවා කියලා කිව්ව.

ප්‍ර : එතකොට අර 2020 සැප්තැම්බර් මාසේ 28 වෙනිදා CID එකට ලැබුණ පණිවිඩය අනුව රවීන්ද්‍රන් ගියා කියලා කිව්වනේ?

පි : ඔව්.

ප්‍ර : ඒ ගියේ තනියමද? ඇන්ටනී අයියා එක්කන් ගියේ නැද්ද?

පි : ඇන්ටනී අයියත් එක්ක තමයි ගියේ.

ප්‍ර : එතකොට CID එකේ ගිහිල්ලා කාවද හම්බ වුණේ?

පි : මට ලියුම එවපු කෙනා එතන හිටියා.

ප්‍ර : ඒ මහත්මයාත් එක්ක කතා කළාද?

පි : ඔව් කතා කළා.

ප්‍ර : මොන භාෂාවෙන්ද කතා කළේ?

පි : එයාට දෙමළ දන්නවා. එයා දෙමළෙන් තමයි කතා කළේ.එයා දෙමළ භාෂාවෙන් තමයි කතා කළේ. ඊට පස්සේ ඉතුරු කතාව එයා කියන්නේ.

ප්‍ර : එතකොට ඒ කතා කරන තැන හිටියේ රවීන්ද්‍රනුයි ඒ මහත්මයයි විතරද?

පි : ඔව් මමත් එයත් විතරයි හිටියේ.

ප්‍ර : එතකොට වෙන මහත්මයෙක් එතෙන්ට ආවාද කොයි වෙලාවක හරි?

පි : නැහැ එහෙම ආවේ නෑ කවුරුත්.

ප්‍ර : දැන් ඒ මහත්මයා එක්ක කතා කරන කොට මේ මොකක් ගැනද ඔය කතා කළේ?

පි : මම ගිහිල්ලා හම්බ වුණා. හම්බ වුණාට පස්සේ කතා කරද්දී එයා කිව්වා සාරාව දැක්කේ නැහැ. සාරා ගැන කතාවක් කරන්න එපා කියලා එයා කිව්වලු.

ප්‍ර : කවුද මෙහෙම කිව්වේ රවීන්ද්‍රන්ට?

පි : ඒක එහෙම කියලා ලියලා දෙන්න කිව්වලු නමුත් මම ලියන්න දන්නේ නැති නිසා ලියලා දුන්නේ නැහැ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඉතින් එතකොට වෙන කවුරු හරි ලිව්වද එහෙමනම්?

පි : මාත් එක්ක කතා කරපු කෙනා ඒක ලියා ගත්තා.

ප : එතකොට එහෙම ලියා ගත්තට පස්සේ අත්සන් කරන්න එහෙම වුණාද රවීන්ද්‍රන්ට මොකක් හරි කට උත්තරයක් හරි මොනවා හරි?

පි : ඔව් මට අත්සන් කරන්න කිව්වා.

ප : ඊට පස්සේ කොහාට හරි එන්න කියලා උපදෙසක් දුන්නද රවීන්ද්‍රන්ට?

පි : උසාවියට තමයි එන්න කිව්වේ.

ප : මොන උසාවියටද එන්න කියලා රවීන්ද්‍රන්ට කිව්වේ?

පි : කල්මුණේ උසාවියට එන්න කියලා තමයි කිව්වේ 05 වෙනි සඳුදා දින එන්න කියලා කිව්වා.

ප : ඒ මොනවටද එන්න කියලා කිව්වේ කියන එක පැහැදිලි කරලා දුන්නද CID එකේ මහත්තුරු?

පි : නඩුවට කල්මුණේට එන්න කියලා තමයිලු කිව්වේ.

ප : මොකක්ද මේ නඩුව නොම්බරේ එහෙම මතකද?

පි : මට ඒ අංකය මතක නෑ.

ප : කමක් නෑ. දැන් ඒ ලැබුණු උපදෙස් අනුව 05 වෙනි සඳුදා උදේ කල්මුණේ උසාවියට රවීන්ද්‍රන් ගියාද?

පි : ඔව් මම ගියා.

ප : ඇයි ඉතින් එහෙම රවීන්ද්‍රන් ගියේ?

පි : ඔවුන් මට එන්න කිව්ව නිසා මම ගියා.

ප : රවීන්ද්‍රන්ට කවුරු හරි තර්ජනය කිරීමක් එහෙම කෙරුවද එහෙම උසාවියට එදා එන්න කියලා නැත්නම් කැමැත්තෙන්මද ගියේ?

පි : CID එකෙන් එන්න කියලා තමයි මම ගියේ.

ප : ඔව් ඉතින් උසාවියට ඇවිල්ලා මොනවා කරන්නද මේ උසාවියට එන්නෙයි කියලා කියන්නේ එතකොට CID එක?

පි : ඒක මේ සාරාගේ සිදුවීමත් එක්ක මෙහෙම සිදුවීමක් වුණේ නැහැ. මේ සිදුවීම සිද්ධ වුණා කියලා මොකුත් දන්නෙත් නෑ කියන්නත් එපා එහෙම සිදුවීමක් වුණොත් ඒක නිසා එයාගේ පවුලට හානි කරනවා. මෙහෙම සිදුවීමක් වුණේ නෑ කියලා කියන්න. වුණේ නැහැ කියලා කිවොත් කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. වුණා කියලා ඔබ කොහේ හරි කිව්වොත් භාර්යාවයි ළමයින්වයි arrest කරනවා. සාරා හමුවීමේ සිදුවීම වුණේ නැහැ කියලා ඇවිල්ලා උසාවියට කියන්න. ඔබ එසේ කිව්වොත් ඔබට කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. එසේ ඒ වගේ සිදුවීමක් වුණා කියලා ඔබ පැවසුවොත් ඔබගේ භාර්යාවයි ළමයින්වයි arrest කරනවා.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : CID එකේ ඔහොම තර්ජනය කරපු මහත්මයා කවුද කියන එක රවීන්ද්‍රන් කියන්න දන්නවද නම එහෙම දන්නවද?

පි : මම නම දන්නේ නැහැ නමුත් ඔහුව දන්නවා.

ප්‍ර : කොහොමද ඔහුව විස්තර කරන්න පුළුවන්ද?

පි : මට පුද්ගලයාව දැක්කොත් මට අඳුර ගන්න පුළුවන්.

ප්‍ර : අඳුර ගන්න පුළුවන්. එතකොට අර 05 වෙනිදා ගියා කියලා කිව්වනේ රවීන්ද්‍රන් කල්මුණේ උසාවියට?

පි : ඔව්.

ප්‍ර : රවීන්ද්‍රන්ට තර්ජනය කරපු ඔය CID එකේ මහත්මයා එදා ඇවිල්ලා හිටියද උසාවියට?

පි : ඔව් ඇවිත් හිටියා.

ප්‍ර : ඒ මහත්මයාට දෙමළ කතා කරන්න පුළුවන්ද?

පි : ඔව් හොඳට දෙමළ කතා කරනවා.

ප්‍ර : CID එකේ මහත්මයා රවීන්ද්‍රන්ට මෙහෙම තර්ජනය කරා කියලා තමන් එක්ක එදා CID එකට තමන්ව එක්කන් ආපු ඇන්ටනී අයියට කිව්වද?

පි : ඔව් මං එයාට කිව්වා.

****

දැන් වේලාව : ප.ව.07.50 යි.
මෙතැන් සිට ල/ලේ :- ඉන්ද්‍රාණි මිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ මුතුමාලි මෙනෙවිය
දැන් වේලාව ප.ව. 7.50 යි
මෙතැන් සිට සටහන් කළේ එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය :

ප්‍ර : එතකොට ඇන්ටනී අයියා මොනවා හරි උපදෙසක් දුන්නාද?

පි : ඔව්.

ප්‍ර : මොකද්ද දුන්න උපදෙස?

පි : මේ සිදුවීම නිසා බයයි. ඒ නිසා මෙයාට ලියුමක් ලියලා දෙන්න කිව්වලු මේක අපි හැම තැනටම මේ ලියුම දාමු කියලා ආරක්ෂාව සම්බන්ධව.

ප්‍ර : ඒ අනුව ලියුමක් ලිව්වද?

පි : ඔව්. ඒ සම්බන්ධයෙන්, ආරක්ෂාව සම්බන්ධයෙන් ලියුමක් ලිව්වා. ලියුමක් ලියලා ඒක දුන්නා.

ප්‍ර : මොන භාෂාවෙන්ද ලිව්වේ?

පි : දෙමළ භාෂාවෙන් ඒක ලිව්වේ. ඒක මගේ යාළුවෙක් තමයි ඒක ලිව්වේ.

ප්‍ර : එතකොට දෙමළ භාෂාවෙන් ලියපු ඒ ලියුම කොයි වෙලාවක හරි සිංහලට පරිවර්තනය කළාද?

පි : ඔව්. ඒක කළේ ඇන්ටනී අයියා. ඒක සිංහල භාෂාවට පරිවර්තනය කළේ එයා ගිහිල්ලා. මම ඒක ගැන එහෙම දන්නේ නැහැ. මම යාළුවාට කියලා දෙමළ භාෂාවෙන් ඒ ලියුම ලියවා ගත්තා.

ප්‍ර : එතකොට රවීන්ද්‍රන් දන්නවද කියන්න ඔය විදියට දෙමළ භාෂාවෙන් ලියලා, පස්සේ සිංහලට පරිවර්තනය කරපු ඔය ලියුම කාට හරි නැත්නම් කොහාට හරි යවනු ලැබුවද කියලා?

පි : ඔව් මම දන්නවා.

ප්‍ර : එක තැනකටද යැව්වේ, තැන් කිහිපයකටද යැව්වේ, Fax කරලද යැව්වේ, තැපැල් කරලද යැව්වේ කොහොමද යැව්වේ?

පි : Fax එකෙන් යැව්වා කියලා දන්නවා.

ප්‍ර : දැන් ඔහොම ලියුම ලියලා, ඒවා එක එක තැන්වලට Fax කෙරුවේ කල්මුණේ උසාවියට 05 වෙනිදා යන්න ඉස්සර වෙලාද?

පි : කල්මුණේ උසාවියට යන්න පෙර තමයි කළේ.

ප්‍ර : එතකොට කල්මුණේ උසාවියට යන්න තිබ්බේ 05 වෙනිදා කියලා කිව්වනේ ඔක්තෝම්බර් මාසයේ නේද? දැන් ඔය ලියුම ලියලා, Fax කරලා එහෙම ඉවර වුණාට පස්සේ 05 වෙනිදා, 2020

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඔක්තෝම්බර් 05 රවීන්ද්‍රන් කල්මුණේ උසාවියට යන්න ඉස්සර වෙලා කවුරු හරි රවීන්ද්‍රන්ට CID එකෙන් කථා කෙරුවද?

පි : ඔව් කථා කළා. මාව විමර්ශනය කරපු නිලධාරියා මට කථා කළා.

ප්‍ර : කොහොමද දැන් ඔය විමර්ශනය කරපු නිලධාරියා තමයි කථා කෙරුවේ කියලා රවීන්ද්‍රන් කියන්නේ?

පි : මම දන්නවා.

ප්‍ර : ඒ කටහඬින්ද අඳුන ගත්තේ?

පි : Phone Number එකෙන් තමයි ඔහු කියලා මම දන්නේ.

ප්‍ර : කාගේ Phone Number එකද?

පි : මාව විමර්ශනය කරපු ඒ නිලධාරියාගේ Phone Number එකෙන්.

ප්‍ර : ඒ විමර්ශනය කරපු නිලධාරියාගේ Phone Number එක රවීන්ද්‍රන්ට ලැබුණේ කොයි වෙලාවේද?

පි : ඒ විමර්ශනය කරපු නිලධාරියා 04 වෙනිදා Call එකක් අරන් කිව්වා මම විමර්ශනය කරපු නිලධාරියා මම 05 වෙනිදා උසාවියට එනවා. එයාට ඒ ගැන කථා කරාලු.

ප්‍ර : ඒ දුරකථන අංකය මතකද. මොන දුරකථන අංකයෙන්ද ඒ නිලධාරියා ඔබට කථා කළේ කියලා?

පි : මම ඒක ලියලා තියෙනවා.

ප්‍ර : කොහේද ලියලා තියෙන්නේ?

පි : File එහෙක ලියලා තියෙනවා. ඇන්ටනී ගාව තියෙනවා ඒක.

ප්‍ර : දැන් මේ කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන්ට ඒ තොරතුරු කොයි වෙලාවක හරි රවීන්ද්‍රන් දුන්නාද?

පි : ඔව් මම දුන්නා.

ප්‍ර : ප්‍රකාශය වාර්තා කරනකොට දුන්නාද ඒ තොරතුරු?

පි : ඔව්.

ප්‍ර : මම ඒ තොරතුරු පෙන්නුවොත් නැවත අඳුරන්න පුළුවන්ද රවීන්ද්‍රන්ට?

පි : ඔව්.

ප්‍ර : ඔය කොළයද ගෙනත් දුන්නේ මේ විමර්ශන නිලධාරීන්ට?

පි : ඔව්.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් විමර්ශන නිලධාරීන් වෙත ලබා දී තිබෙන දුරකථන තොරතුරු අඩංගු මෙම ලේඛනය RS-03 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා)

ප්‍ර : එතකොට ඒ ලේඛනයේ තියෙන තොරතුරු, දුරකථන අංකය, කථා කරපු දිනය, කථා කරපු වෙලාව, කොච්චර වෙලාවකටද

President's Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

කථා කරලා තියෙන්නේ, ඒක Incoming Call එකක්ද, Outgoing Call එකක්ද, නැත්නම් ගන්නට බැරි වුණ Call එකක්ද, ඒ කියන්නේ Miss Call එකක්ද කියන එක පිළිබඳව මේ RS-03 සටහන් යොදලා තියෙන්නේ ඔබේ දුරකථනයේ තිබුණ තොරතුරු පරීක්ෂා කරලා බලලාද?

පි : ඔව්. Phone එකේ තිබ්බ විස්තර අනුව තමයි මම ඕක ලියලා තියෙන්නේ.

ප්‍ර : එතකොට ඔබට එදා එකම දවසේ තමයි මේ ඔක්කෝම දුරකථන ඇමතුම් අංක 0772932463 කියන අංකයෙන් ලැබීම් සහ එයට ලබාදීම් සිදුවෙලා තියෙන්නේ නේද?

පි : ඔව්.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද ඇයි මේ අංකයෙන් 0772932463 දරන අංකයෙන් ඔබ අඳුන ගත්ත විදියට ඔය විමර්ශන නිලධාරියා ඔබට කථා කළේ කියලා මේ 04 වෙනිදා?

පි : ඔව්. ඒ Phone Number එකෙන් එයා කථා කරලා ඇහුවා කොහේද ඉන්නේ, තේ බිව්වද, කෑවද, එතකොට හෙට දවස ඔයාට මතකද ඒ වගේ විස්තර එයා මගෙන් විමසුවා.

ප්‍ර : ඒ වගේම කිව්වද එයා ඇවිල්ලා මේ උසාවියේදී අර මොනවා හරි කියන්න ඕන දෙයක් ගැනත් ඔය වෙලාවේ උපදෙස් දුන්නද?

පි : ඒ කාරණාවට අමතරව වෙන කිසිම දෙයක් ඒ ගැන කථා කළේ නැහැ.

ප්‍ර : ඒ කාරණාව ගැන තමයි මමත් අහන්නේ?

පි : තේ බිව්වද, කෑවද, බිව්වද කියලා අහනවට අමතරව වෙන මොනවත් එයා කිව්වේ නැහැලු.

ප්‍ර : හැබැයි කියලා තියෙනවා මම කිව්ව විදියට උසාවියේ කියන්න, එහෙම කිව්වොත් කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා. එහෙම කිව්වේ නැද්ද දන්නේ නැහැ නේ. හරි. පහුවදා ගියාද මේ උසාවියට?

පි : ඔව් මම ගියා.

ප්‍ර : තනියෙමද ගියේ ඇන්ටනී අයියත් එක්කද ගියේ?

පි : ඇන්ටනී අයියත් එක්ක ගියේ.

ප්‍ර : එතන උසාවියේ කවුරු හරි Lawyer කෙනෙක්ට කථා කෙරුවද? Lawyer කෙනෙක් ඇල්ලුවද?

පි : ඔව් අපි Lawyer කෙනෙක්ව ඇල්ලුවා. මුදල් බැඳලා අපි Lawyer කෙනෙක්ව ගත්තා. රුපියල් පන්දාහක්

ප්‍ර : කවුද ඒ සල්ලි දුන්නේ?

FAIR COMMENT — BY JEZEEM —

පි : මම.

ප්‍ර : එතකොට දැන් උසාවියට ගිහිල්ලා ඒ නීතිඥ මහත්මයෙක් රවීන්ද්‍රන් වෙනුවෙන් පෙනී හිටියට පස්සේ විනිශ්චයකාරතුමාව එහෙම එදා උසාවියේදී මුණ ගැහුණද, හම්බ වුණාද?

පි : ඔව්. හම්බ වුණා. මම විනිශ්චයකාරතුමා හම්බ වෙලා මම එතුමාට මේ ලියුම දුන්නා. එතුමා ඉල්ලුවේ නැහැ මම ලියුමක් විනිශ්චයකාරතුමාට දුන්නා.

ප්‍ර : ඒ දුන්න ලියුම දැන් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද රවීන්ද්‍රන්ට?

පි : ඒ ලියුම තමයි මම දුන්නේ.

ප්‍ර : දැන් ඔය විනිශ්චයකාරතුමාට දුන්නා කියලා ඔබ පෙන්නුවානේ ලියුමක්?

පි : ඔව්.

ප්‍ර : ඒ වගේම ඔබ කිව්වා අර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට 28 වෙනිදා ගිහිල්ලා එතන නිලධාරීන් ඔබට තර්ජනය කෙරුවාට පස්සේ ඔබ ඒ ගැන ඇන්ටනී අයියට කිව්වහම ඔබේ යාළුවෙක්ට කියලා ඔබලා ලියුමක් ලියවා ගත්තා කියලා?

පි : ඔව්. ඒ ලියුම තමයි දුන්නේ.

ප්‍ර : ඒ ලියුම තමයි ඔබ කිව්වේ ඇන්ටනී අයියා දන්න කෙනෙක්ට කියලා සිංහලට පරිවර්තනය කර ගත්තයි කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් ඔබ මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නේ ඒ ආකාරයට ඔබලා විසින් පිළියෙල කරවා ගන්නා ලද දෙමළ සහ සිංහල, සමාවෙන්න ස්වාමීනි. ඔබ මේ අවස්ථාවේදී මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නේ එලෙස ඔබ ඔබේ මිතුරාට කියලා පිළියෙල කර ගන්නා ලද ද්‍රවිඩ ලිපියේ ඡායාස්ථිතික පිටපතකුත්, ඒ වගේම එහි සිංහල පරිවර්තනයේ ඡායාස්ථිතික පිටපත්ද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ ඔය දැන් ඉදිරිපත් කරන ද්‍රවිඩ භාෂාවෙන් ඔබේ යාළුවා පිළියෙල කරපු ඒ ඡායාස්ථිතික පිටපතේ වගේ ලිපියක්ද ඔබ ගරු විනිසුරුතුමාට 2020 ඔක්තෝම්බර් මාසේ 05 වෙනිදා ඔබ එතුමා මුණ ගැහුණාම බාර දුන්නේ?

පි : ඔව්.

(ස්වාමීනි ද්‍රවිඩ භාෂාවෙන් තිබෙන එම ලිපිය RS-04 වශයෙනුත්, සිංහල භාෂාවෙන් තිබෙන එහි පරිවර්තනය RS-05 වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කරන්න අවසර පතනවා)

FAIR COMMENT — BY JEZEEM

ප : ඔබ ඔය ලිපිය ගරු විනිශ්චයකාරතුමාට ලබා දුන්නාට පස්සේ එතුමා මොකද කළේ ඒ ලිපියට?

පි : ඒ ලියුම අරගෙන එයාගේ ඒ File එකේ තියාගෙන එතුමා මාත් එක්ක ගිය Lawyerත් එක්ක කථා කළා.

ප : එතකොට ඔය විනිශ්චයාකාරතුමාගේ කාමරයට ඔබව ගෙනිච්චේ ඔබේ නීතිඥ මහතාද, එහෙම නැත්නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඒ කියන්නේ CID එකේ නිලධාරිනුත් ඔබත් එක්ක ඒ විනිශ්චයකාරතුමාගේ මැදිරියට ගියාද? නිල මැදිරියට ගියාද?

පි : මගේ Lawyer තමයි එතැනට එක්කන් ගියේ.

ප : CID එකේ මහත්වරු ආවද?

පි : මෙයාව Lawyer එක්කන් ගියාට පස්සේ එතුමා ගාවට ඊට පස්සෙන් CID එකේ ආපු කට්ටියත් ආවා.

ප : එතකොට කොයි වෙලාවක හරි මේ විනිශ්චයකාරතුමා ළඟ ඔබ සාරා ජස්මීන්ව, නැත්නම් පුලස්තිනී එහෙම නැත්නම් සාරාව ඔබ දැකපු අවස්ථාව පිළිබඳව 2019 දී ප්‍රකාශයක් කෙරුවද? නැත්නම් අනිත් පැත්තට 2019 දී ඔබ සාරාව දැකපු බවට ඔබ මේ විනිශ්චයකාරතුමාට ප්‍රකාශයක් කෙරුවද?

පි : ඔව් මම කිව්වා. මම දැක්කා කියලා ප්‍රකාශයකුත් එක්ක ලබා දුන්නා.

ප : ඔබ ඒ ප්‍රකාශය කළේ විනිශ්චයකාරතුමාට මොන භාෂාවෙන්ද?

පි : දෙමළ භාෂාවෙන්.

ප : විනිශ්චයකාරතුමා ඔබත් සමඟ කථා කළේ මොන භාෂාවෙන්ද?

පි : එතුමා කථා කළේ දෙමළ භාෂාවෙන්.

ප : දැන් ඔය ප්‍රකාශය ඔබ කරනකොට මේ විනිශ්චයකාරතුමාට කවුරු හරි ඒක යතුරුලියනය කළාද නැත්නම් පරිගණකගත කළාද?

පි : එක අක්කා කෙනෙක් එතන ටයිප් කළා.

ප : ඔබ ඒ ප්‍රකාශය ගරු විනිශ්චයකාරතුමාට කරන අවස්ථාවේදී එතන වෙන කවුද හිටියේ?

පි : මමත්, ඒ විනිශ්චයකාරතුමත්, තව CID එකේ ඒ දෙන්නත් විතරයි එතන හිටියේ.

ප : ඒ කියන්නේ හොඳට කල්පනා කරලා බලන්න. ප්‍රකාශය කරන වෙලාවේ, ඒ නිල මැදිරිය ඇතුළේ, විනිශ්චයකාරතුමා ගාව හිටියද ඔය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්?

පි : ඔව් ඒ දෙන්නත් එතන හිටියා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : දැන් ඒ ප්‍රකාශය කරනකොට විනිශ්චයකාරතුමා කිව්වද රවීන්ද්‍රන්ට ඇත්ත කියන්න කියලා?

පි : ඔව් එහෙම කිව්වා.

ප්‍ර : ඒ අනුව ඇත්ත ප්‍රකාශ කෙරුවද රවීන්ද්‍රන් විනිශ්චයකාරතුමාට?

පි : ඔව් මම ඇත්ත කිව්වා.

ප්‍ර : ඒ ප්‍රකාශය තමයි ඔබ කිව්වේ අර අක්කා කෙනෙක් යතුරුලියනය කළා කියලා නේද?

පි : ඔව්.

ප්‍ර : ප්‍රකාශය කරලා ඉවර වුණාට පස්සේ රවීන්ද්‍රන් ඒක අත්සන් කෙරුවද?

පි : ඔව් කළා.

ප්‍ර : ඒක දෙමළ භාෂාවෙන්ද තිබුණේ?

පි : ඔව් දෙමළ භාෂාවෙන් තමයි තිබ්බේ.

ප්‍ර : දැන් ඔය ප්‍රකාශය කරනකොට 2019 දැනට ඔය රවීන්ද්‍රන්ට මතක විදියට අටවෙනි මාසේ හෝ නමවෙනි මාසේ පාන්දර දවසක Beach Road එක ආසන්නයේ සාරාව දැක්ක බව රවීන්ද්‍රන් මේ විනිසුරුතුමාට කිව්වද?

පි : ඔව් මම දැක්කා කියලා ඒ විදිහට එතුමා ඉදිරියේ කිව්වා.

ප්‍ර : එතකොට අර ප්‍රකාශය අත්සන් කරන්න ඉස්සරලා කියවලා එහෙම දුන්නාද? කියවලා දෙන්න ඇතිනේ නේද?

පි : ඔව්. කියවලා දුන්නාට පස්සේ තමයි අත්සන් කරන්නට කිව්වේ.

ප්‍ර : එතකොට අර සාරාව දැක්කයි කියන කරුණ ඒ ප්‍රකාශයේ ඇතුළත් වෙලා තිබුණාද?

පි : ඔව්. ඒක පැහැදිලිව ඒ ලියලා තිබ්බිව එකේ සටහන් වෙලා තිබ්බා.

ප්‍ර : දැන් ඔය සැප්තැම්බර් මාසේ 28 වෙනිදා CID එකට ගියපු වෙලාවේදී රවීන්ද්‍රන්ට CID Officersලා තර්ජනය කළා කියලා කිව්වනේ?

පි : ඔව්.

ප්‍ර : ඒ තර්ජනය කිරීම ගැන රවීන්ද්‍රන් මේ විනිසුරුතුමාට කල්මුණේදී 05 වෙනිදා ඔය ප්‍රකාශය දෙනකොට කිව්වාද?

පි : මම බය නිසා එතනදී කිව්වේ නැහැ.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : දැන් ඔබ ප්‍රකාශය ලබාදෙන අවස්ථාවේදී ගරු විනිශ්චයකාරතුමා ඉදිරියේදී ඔබ කිව්වා ඒ ස්ථානයේදී ඔබේ නීතිඥ මහතාත්, ඒ වගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරිනුත් හිටියා කියලා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : CID එකේ නිලධාරීන් කී දෙනෙක් හිටියද ඒ කාමරය ඇතුළේ?

පි : CID එකේ දෙන්නෙක් හිටියා.

ප්‍ර : ඔබ ප්‍රකාශය ලබාදෙන ස්ථානයට ආසන්නයේමද ඔය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හිටියේ?

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

පි : ඔව් එතන හිටියා. එතන හිටගෙන හිටියා.

ප්‍ර : එතකොට දැන් මම අහපු ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් රවීන්ද්‍රන් කිව්වා රවීන්ද්‍රන් බය වුණා කියලා මේ CID එකේ නිලධාරියා 28 වෙනිදා රවීන්ද්‍රන්ට තර්ජනය කරපු එක පිළිබඳව විනිසුරුතුමාට කියන්න?

පි : ඔව්.

ප්‍ර : ඇයි එහෙම බය වුණේ?

පි : මම එතනින් එළියට ආවට පස්සේ රෑට ගෙදරට ඇවිල්ලා මට, අපට හානියක් කරයි කියලා බය වුණ නිසා.

ප්‍ර : ඒක නිසා අර තර්ජනය කිරීම ගැන මොකුත් කිව්වේ නැහැ රවීන්ද්‍රන් නේද? එහෙම නේද රවීන්ද්‍රන්?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් ඒ වෙලාවේදී ඔය ප්‍රකාශය වාර්තා කරලා ඉවර වුණහම ගරු විනිසුරුතුමා කිව්වද රවීන්ද්‍රන්ට නැවත උසාවියට එන්න ඕන කියලා?

පි : නැහැ එතුමා එහෙම දෙයක් කිව්වේ නැහැ.

ප්‍ර : හැබැයි රවීන්ද්‍රන්ට කවුරු හරි කිව්වද නැවත මේ කල්මුණේ උසාවියට රවීන්ද්‍රන් එන්න ඕන කියලා?

පි : මගේ නීතිඥතුමා තමයි ඒ ගැන කිව්වේ.

ප්‍ර : මොකටද එන්න ඕන කියලා කිව්වද එහෙම? ඇයි එහෙම යන්න ඕන රවීන්ද්‍රන් උසාවියට?

පි : අපි එන්න ඉස්සරලා ඇහුවා මේක මෙතනින් ඉවරද කියලා. එතකොට Lawyer කිව්වා මේක ඉවර නැහැ ඔයාලා 19 වෙනිදා ආයේ උසාවියට එන්න ඕන කියලා.

ප්‍ර : දැන් රවීන්ද්‍රන් කැමතිද එහෙම උසාවියට යන්න?

පි : මම යන්නේ නැහැ මට බයයි.

ප්‍ර : ඇයි බය?

පි : මට බයයි.

ප්‍ර : බයට හේතුවක් තියෙන්න ඕනනේ නේද?

Presidential Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පි : රෑට ඇවිල්ලා මොනවා හරි, මගේ තාත්තා අසනීපයෙන් ඉන්නේ. ඒ වගේම මේක සිදුවීම නිසා ගමේ කට්ටිය එයාලත් එක්ක ඉන්නේ අකැමැත්තෙන්. අකැමැත්තෙන් කියන්නේ ඒක ගැන දැන ගත්ත නිසා තරහකින් ඉන්නේ. ඒ නිසා අපි රෑට නිදිය ගන්නේ බයෙන්. මටයි, මගේ පවුලේ කට්ටියටයි යම්කිසි හානියක් සිද්ධ වෙයි කියලා අපි බයෙන් ඉන්නේ.

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරු සාක්ෂිය ලබා දීමේදී යම් චකිතයකින් එලෙස පිළිතුරු ලබා දුන් බව සටහන් කර තබමි.

පි : එහෙම ප්‍රශ්නයක් ආවොත් මෙයයි, මෙයාගේ පවුලේ කට්ටියයි වස බීලා මැරෙනවා කියන තැනක තමයි ඉන්නේ. මොකද තියෙන බය නිසා ඒ දේ සිද්ධ කරනවා කියලා තමයි කියන්නේ.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය :

ප්‍ර : රවීන්ද්‍රන් එතකොට රවීන්ද්‍රන්ට මේ වෙනකොට 2020 සැප්තැම්බර් මාසේ 28 වෙනිදා CID එකට ගියපු වෙලාවේදී සාරා ජෙස්මින්ව 2019 දී ඔබ දැකලා අඳුනා ගත්තා කියන එක එහෙම කියන්නට එපා කියලා උපදෙස් ලැබුණාය කියලා කිව්වා නේද?

පි : ඔව්.

ප්‍ර : නමුත් රවීන්ද්‍රන් කියන්නේ විනිසුරුතුමා ඇත්ත කියන්නෙයි කියලා රවීන්ද්‍රන්ට කිව්වහම 2020 ඔක්තෝම්බර් 05 වෙනිදා එතුමාගේ නිල මැදිරියේදී රවීන්ද්‍රන් සාරා ජෙස්මින්ව 2019 දී Beach Road එක ළඟදී දැක්කා කියලා ඇත්ත ප්‍රකාශයක් එතුමාට ලබා දුන්නා?

පි : ඔව් මම ඒක කිව්වා.

ප්‍ර : එතකොට CID නිලධාරීන් ඒ දුන්න උපදෙස්වලට වැඩිය වෙනස් දෙයක් රවීන්ද්‍රන් කෙරුව නිසා රවීන්ද්‍රන්ගේ හිතේ යම් බයක් තියෙනවද?

පි : ඔව්.

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂිය හේතුවෙන් 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 25(4) උප වගන්තිය ප්‍රකාර සාක්ෂිකරු හට නීතියට අනුව හිමිවිය යුතු වරප්‍රසාදයන් සහ අයිතීන් සාක්ෂිකරුට ලබා දීම සඳහා සියළු පියවර ගන්නා ලෙස අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත කොමිෂන් සභාව නියෝග කරනවා. මෙම නියෝගය කොමිෂන් සභාවේ ලේකම් විසින් ලිපි දෙකකින් සකසා එක් ලිපියක් එම අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ආමන්ත්‍රණය කරනු ලැබිය යුතු අතර, එහි පිටපතක් මෙම සාක්ෂිකරුටද ලබාදෙන ලෙසට සටහන් විය යුතුයි. මෙ ලිපි දෙකම සාක්ෂිකරු හට කොමිෂන් සභාවේ ලේකම් විසින් ලබා දිය යුතු අතර, අවශ්‍ය වුවහොත් පමණක් එය සාක්ෂිකරුගේ අභිමතය අනුව පාවිච්චි කිරීමේ හැකියාව ඇතිවන පරිදි එම ලිපි සකස් කර සාක්ෂිකරුට ලබා දිය යුතු බව ද නියෝග කරමි.

සාක්ෂිකරු සාක්ෂි ලබා දීම සඳහා කලවංචිකුඩි සිට පැමිණ ඇති බැවින් නීතියට අනුව ඔහුට හිමි විය යුතු දීමනාව ලබාදෙන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරනවා .

ඊට අමතරව සාක්ෂිකරු වෙත දන්වා සිටින්නේ ඔහුට යම් තර්ජනයක් නුදුරු අනාගතයේදී සිදු වුණොත්, කොමිෂන් සභාවේ කාලය තුළදී සිදු වුණොත් එය කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ස්ටැනිස්ලෝස් මහතාගේ අවධානයට යොමු කරන ලෙසයි.

සාක්ෂිකරුව මුදා හරිමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

සටහන් කලේ යමුනා දසනායක විසිනි. වේලාව ප.ව. 2. 50

ගරු විනිසුරු මඩුල්ල -

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති.

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. - සාමාජික

03. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. - සාමාජික

04. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය - සාමාජික

පෙනී සිටීම

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය. , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , රජයේ අධිනීතිඥ නිමේෂාද අල්විස් මෙනවිය , රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර , රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ සහ රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ඉල්ලීම සලකාබැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නිති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමීල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර ලබා දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම - . නාකුර් ඇන්ටනි
වයස - අවු - වයස අවු.44යි
ජාතිය - මුස්ලිම්/දෙමළ ,
ආගම - ක්‍රිස්තියානි.
තනතුර - . ව්‍යාපර,
ලිපිනය- මේන්රෝඩ්, තේතාතිව් ඔන්රු ,කලවන්චිකුඩි
සාක්ෂිකරු දෙමල භාෂාවෙන් ප්‍රතිඥාව ලබා දෙයි.

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර ඇන්ටනි මහත්මයා මිට පෙර අධිකරණයක හරි වෙන කොහෙ හරි සාක්ෂි දිලා තියෙනවාද?

උ උසාවියකට සාක්ෂි දිලා නැහැ මිස්.

ප්‍ර මේ පළවෙනි වතාවට තමයි මේ වගේ තැනකට ඇවිල්ලා සාක්ෂි දෙන්නේ නේද?

උ ඔව්.

ප්‍ර එතකොට ඇන්ටනි මහත්තයා දැන් අද අපේ මේ කොමිෂන් සභාවේ පොලිස් නිලධාරින්ට කටඋත්තර 2ක් දුන්නනේ?

උ 3ක් දිලා තියෙනවා.

ප්‍ර 3ක් දිලා තියෙනවාද?

උ ඔව්.

ප්‍ර ඒ දිලා තියෙන කටඋත්තර මත ඒ තියෙන කරුණු ගැන තමයි අපි මේ ප්‍රශ්න කරන්නෙ ?

උ හරි මිස්.

ප්‍ර ඇන්ටනි මහත්තයා ක්‍රිස්තියානි ආගම වැලදගත්තේ කොයි කාලෙද?

උ මම 2005 මගේ මුස්ලිම් ආගමේ ඉඳලා මම ක්‍රිස්තියානි ආගමට යන්න මම කසාද බැන්දයින් පස්සේ මගේ දරුවෝ නිසා මම ක්‍රිස්තියානි ආගමට යන්න විරකේශරි පත්තරයට මගේ පොටෝ ඔක්කොම දාලා ඔක්කොම කරලා මම මේ ක්‍රිස්තියානි ආගමට වුනා මිස්

ප්‍ර ඒ මොන අවුරුද්දෙද?

උ 2005.

ප්‍ර එතකෙට ප්‍රමිලාව විවාහ කරගත්තේ කොයි කාලෙද නෝනා?

උ 2004.

ප්‍ර 2004

උ ඔව්

ප්‍ර 2004 ද 2003 ද?

උ 2004 ද මතක නැහැ 2003 නැත්නම් 2004 මිස් මතක නැහැ හරියට.

ප්‍ර ප්‍රමිලව කසාද බැන්දට පස්සේ කොහෙද පදිංචියට ගියේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ තේතාතිවු ප්‍රධාන පාරේ එහෙන්ම හිටියා මිස්.

ප්‍ර හිටපු දිහාම .?

උ ඔව්.

ප්‍ර ඒ කියන්නේ තේතාතිවුවලම හිටියා?

උ ඔව්.

ප්‍ර තේතාතිවුවල එතකොට කොච්චර කාලයක් මේ වෙනකොට ජීවත්වෙලා තියෙනවාද ඇන්ටනි මහත්මයා?

උ මම 17, 18 අවුරුදුවල එහේ පදිංචි වෙලා හිටියා මිස් .

ප්‍ර පොඩි කාලයේ ඉපදුන කාලයේ ඉදන්ම එතන හිටියා කියලද කියන්නේ?

උ නැහැ නැහැ පොඩි කාලයේ නෙමෙයි මම කසාද බැඳපු කාලයේ ඉදලා එහේම ඉන්නවා.

ප්‍ර ඒකියන්නේ 2003 , 2004 වගේ ඉදලම එහෙ ඉන්නවා තේතාතිවු වල?

උ ඔව් මිස්.

ප්‍ර එතකොට ඇන්ටනි මහත්මයා දන්නවාද සරාව?

උ ඔව් මිස් පොඩි කාලයේ ඉඳලා දන්නවා.

ප්‍ර කවුරු පොඩි කාලයේ ඉඳලාද දන්නෙ?

උ සාරා.

ප්‍ර සරා පොඩි කාලයේ ඉදලා දන්නවා

උ ඔව් සාරා කියන ගෑනු පොඩි කාලයේ ඉදල මම දන්නවා .

ප්‍ර සරාව පොඩි කාලයේ ඉදලා දැනගත්තේ තේතාතිවු වල ඇන්ටනි මහත්තයාලාගේ ගෙවල් කිට්ටුවද ඇය හිටියේ?

උ අපේ ගෙදරට ඉස්සරහ ගෙදර තමයි ඉස්සරහා කියන්නේ ගෙදර දෙක තුනකට ඉස්සරහා තමයි එයාගේ පුංචි අම්මලාගේ ගෙදර මෙයා පොඩි කාලයේ ඉදලා මෙයයි මෙයාගේ මල්ලියි මෙයාගේ ආච්චි අම්මලා හිටියා ඒ කාලයේ ඉඳලා එයාලා අපේ ගෙදරට ඉස්සරහ තමයි මේ ඉස්කෝලෙටයන්නේ පන්තියට යන්නේ ඒ කාලයේ ඉඳලාම මම දන්නවා මිස්

ප්‍ර පොඩිකාලයේ ඉදලම සරාව දන්නවා?

උ ද න්නවා

ප්‍ර පුංචි අම්මාගේ නම මොකක්ද සාරාගේ?

උ කීදා.

ප්‍ර එතකොට පොඩි කාලයේ සාරා එක්ක කතාකරලා එහෙම තියෙනවාද ඇන්ටනි?

උ මම කතා කරලා තියෙනවා.

ප්‍ර කතා කරලා තියෙනවා.

උ ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප එතකොට සාරා කියලා ඔය කියන එක්කෙනා ඇත්තටම මොන ජාතියෙද මුස්ලිම්ද නැත්නම් දෙමලද?

උ ඉස්සෙල්ලා දෙමළ. ඊට පස්සේ අපි දැනගත්තා මුස්ලිම් ආගමට ගියා කියලා.

ප ඒ කොයි කාලෙද එහෙම දැනගත්තේ?

උ මගෙ මතකයේ හැටියට දැන් මේ අවුරුදු.4කට 5කට කලින්.

ප ඔය සාරා මුස්ලිම් ආගමට ගියා කියලා දැනගන්න කාලය වනකොට සාරාලාගේ ඔය පුංචි අම්මා ආච්චි එහෙම ඇන්ටනි මහත්තයාගේ ගෙදර කිට්ටුව තවදුරටත් පදිංචි වෙලා හිටියාද නැත්නම් එතනින් ඒගොල්ලෝ ගිහිල්ලා තිබ්බාද?

උ නැහැ මිස් අර ඉස්සෙල්ලා පොඩි කාලේ හිටපු ඉඩම විකුණලා ඒ කට්ටිය අර දැන් ඉන්නේ වේම්බු විදියේ ගෙදරකට ඔක්කොමලා එහෙ ගියා .

ප වේම්බු විදියේ ගෙදරක තමයි ඉන්නේ?

උ ඉන්නේ ඔව්.

ප ඒක බීච් රෝඩ් එකේද තියෙන්නේ?

උ නැහැ වේම්බු විදියේ.

ප බීච් රෝඩ් තියෙන්නේ කොයි හරියෙද?

උ බීච් රෝඩ් එක තියෙන්නේ වේම්බු වීදියට පොඩ්ඩක් පහුකරලා යන්න ඕන මිස්

ප ඒ කියන්නේ කිට්ටුවමයි?

උ කිට්ටුවමයි

ප ඔය වේම්බු විදිය පැත්තේ එතකොට බීච් රෝඩ් එකේ එහෙම ඉන්නේ සාමාන්‍යයෙන් පදිංචි වෙලා දෙමළ ජාතියේ අයද එහෙම නැත්නම් මුස්ලිම් ජාතියේ අයද සාමාන්‍යයෙන් වැඩිපුර ඉන්නේ?

උ දෙමළ අය

ප දෙමළ ඒගොල්ලන් ඉන්නේ?

උ ඔව් ඔව් දෙමළ අය තමයි ඉන්නේ මුස්ලිම් කට්ටිය නැහැ.

ප දැන් ඇන්ටනි මහත්තයා සාමාන්‍යයෙන් සල්ලි හම්බ කරන්නෙ මොනවා කරලාද?

උ මම බිස්නස් කරලා මිස්.

ප මොනවාද ඔය බිස්නස් එකට කරන්නෙ?

උ අපි එහෙම කොටුවලටම ගිහිල්ලා මගේ ලොරි එකට ගිහිල්ලා එලවලු එකතු කරලා පොලවලට ගිහිල්ලා තොග දිලා තමයි සල්ලි හම්බ කරන්නෙ මිස්.

ප 2019 වෙනකොට ඇන්ටනි මහත්මයාට තිබුනද ලොරියක්?

උ ලොරියක් තිබුනා මිස්.

ප ඒක බඩි ලොරියක්ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ඔව් බඩියක් තිබ්බේ.

ප්‍ර එතකොට තනියමද ඔය රස්සාව කරන්නෙ නැත්නම් කවුරුහරි උදවු කරනවාද?

උ නැහැ මමයි මගේ ගෝලයයියන්නේ මිස්.

ප්‍ර මොකක්ද ගෝලයාගේ නම?

උ එයා මේ රවීන්ද්‍රන් සිවලිංගම් රවින්ද්‍රන්

ප්‍ර රවින්ද්‍රන් කොහෙද පදිංචි වෙලා ඉන්නේ?

උ එයා මාම්කාඩු වේම්බු විදියේ.

ප්‍ර එතකොට රවින්ද්‍රන් ඔය රස්සාවට යන්න ඇන්ටනි මහත්තයාගේ ගෙදරට එනවාද?

උ ඔව් ගෙදරට ඇවිල්ලා.

ප්‍ර සාමාන්‍යයෙන් රවීන්ද්‍රන් ආවාට පස්සේ ඇන්ටනි මහත්තයාගේ ගෙදරට කීයට විතරද දෙන්නත් එක්ක ඔය බඩි ලොරියේ එලවලු එකතු කරන්න යන්නේ ගෙදරින්?

උ රවින්ද්‍රන් අපේ ගෙදර 3.00ට විතර එනවා .

ප්‍ර උදේ ද හැන්දෑවෙද?

උ පාන්දර 3.00ට විතර එනවා ආවයින් පස්සේ අපි දෙන්නම 3.00 , 3.30ට විතර ඒ වෙලාවෙම අපි හැමදාම යනවා ගිහිල්ලා කොටුවලට බඩු එකතු කරලා පහ හමාර හය වෙනකොට පොළවලට ඉන්න ඕන එහෙම යනවා මිස්.

ප්‍ර එතකෙට ඔය ලොරිය එලවන්නෙ කවුද?

උ මම මම තමයි එලවන්නේ.

ප්‍ර එතකොට රවීන්ද්‍රන් ඉන්නේ උදව් කරන්න?

උ උදව් කරන්න.

ප්‍ර ලොරිය යනකොට දැන් ඇන්ටනි මහත්තයා එලවනවා?

උ ඔව්.

ප්‍ර එතකොට රවින්ද්‍රන් වාඩිවෙන්නේ කොහේද?

උ ගෝලයාගේ ෂිට් එකේ.

ප්‍ර ගෝලයාගේ ෂිට් එකකියන්නේ?

උ අනිත් පැත්තේ.

ප්‍ර ඇන්ටනි මහත්තයාගේ වම් පැත්තේ?

උ ඔව්.

ප්‍ර සාමාන්‍යයෙන් එලවලු දාන තැනක්ද අම්පාර?

උ ඔව්.

ප්‍ර අම්පාරේ මාර්කට් එකට දානවද?

උ අම්පාරේ මාර්කට් එකටත් දානවා.

ප්‍ර සියඹලාණ්ඩුවට යනවාද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ඔව් සියඹලාණ්ඩුවටත් යනවා.

ප්‍ර ඒ අතර මග මාකට් වලට යනවාද පොළවල්වල?

උ ඔව් සති පොළකට යන්නේ හැමදාම එක එක දවසට එක පොලවල් තියෙන්නේ. ඉරිදා තියෙන්නේ අම්පාර පොල ,බදාදා තියෙන්නේ සියඹලාණ්ඩුව පොල, සෙනසුරාදා තියෙන්නේ හිගුරාන පොළ සිකුරාදා තියෙන්නේ උහන පොල ,පොල්වත්ත පොල, ඒ පොලවල් දෙකටම යනවා දවසේ. බ්‍රහස්පතින්දා ආයේ තියෙන්නේ ගොනාගොල්ල, අය තියෙන්නේ පරගහගල ඒ වගේ පොලවලට යනවා.

ප්‍ර ඒ පොලවල්වලට අහල පහල තියෙන කොටුවලින් එළවලු අරගෙන ගිහිල්ලා දානවා කියලා තමයි කියන්නේ?

උ ඔව්.

ප්‍ර ඇන්ටනිට මේ ජනාධිපති කොමිෂන් සභාවෙන් ඇවිල්ලා කටඋත්තරයක් දෙන්න කිව්වා නේද ?

උ ඔව්.

ප්‍ර ඒ ඇවිල්ලා කටඋත්තරයක් දුන්නෙ මොකක් ගැනද මොන සිද්ධියක් ගැනද?

උ මේක අපි මමයි මගේ ගෝලයයි දෙන්නම දවසක් මගේ මතක හැටියට 9 වෙනි මාසේ වගේ.

ප්‍ර මොන අවුරුද්දෙද?

උ 2019 ඒ වගේ යනකොට මිස් අපි මෙහේ ගෙදර ඉදලා 3.00-3.30ට වගේ ගියා.

ප්‍ර පාන්දර නේද?

උ ඔව් පාන්දර .

ප්‍ර කොහෙද මේ ගියේ දැන් යන්නේ?

උ අපි කොටුවලට අර බිච් පාරෙන් යන්න මගේ කොටුවක් තියෙනවා බිච් පාරෙ මිස් එහෙ යන්ට තමයි ගියේ.

ප්‍ර ඔය වගේ උදේ පාන්දර යනකොටයන්නේ මොන පාරෙද?

උ අපියන්නේ මඩකලපු පාරෙ.

ප්‍ර එක පැත්තකට ගියොත් කල්මුණේ අනික් පැත්තට ගියොත් මඩකලපුව?

උ මඩකලපුව .

ප්‍ර එතකොට ඔය පාරෙ ඔය උදේ 3.00ට 3.30ට විතර සාමාන්‍යයෙන් වාහන ගමනාගමනය කරනවාද යනවාද?

උ ඒ වෙලාවට කවුරුත් යන්නේ එන්නෙ නැහැ

ප්‍ර එතකොට රවීන්ද්‍රනුයි ඇන්ටනි මහත්තයයි තමයි ඒ වගේ උදේ පාන්දර පිටත්වෙන්නේ?

උ ඔව් පිටත්වෙන්නේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් ඔය කියන දවසේ 2019 සැප්තැම්බර් මාසේ ඒ කියන්නේ 9 වෙනි මාසේ දවසක ඔහොම ගියා කියලා කිව්වානේ ඉතින් මොකද වුනේ?

උ ඒ යනකොට බීච් පාරෙන් හරවන්න ඒ පාරෙන් තමයි යන්න ඕන අපි ඒ පාරෙන් යනකොට මඩකලපු පැත්තෙන් අර බීච් පාරට ඉස්සරහා වාහනයක් පිකප් එකක් නතර කරලා තිබ්බා. එතකොට මම මගේ ගෝලයාට කිව්වා මේ වෙලාවේ කවුද දන්නේ නැහැ ඔතන නතර කරලා ඉන්නේ වාහනයක් නතර කරලා තියෙනවා කියලා මම කිව්වා මිස් කිව්වායින් පස්සේ ඔහොම යනකොට බීච් පාරෙ ඉඳලා ගෑනු එක්කෙනෙක් එනවා ඇවිදලා.

ප්‍ර ගෑනු කෙනෙක් එනවා?

උ ඔව් මුස්ලිම් කිට් එක ඇදගෙන එනවා .

ප්‍ර මොකක්ද මේ මුස්ලිම් කිට් එක කියන්නේ?

උ කලුපාට මුස්ලිම් කට්ටිය ඇඳගෙන ඉන්නේ ෆුල් කිට් එක ඇදගෙන එනවා මම බැලුවා කවුද දන්නේ නැහැ මේ දෙමළ ගම්මානයෙන් මුස්ලිම් එක්කෙනෙක් එනවා කියලා මම එහෙම යනකොට පාර අයිනෙම තියෙනවා ලයිට් කණුවක් ලයිට් කණුව පල්ලෙහා යටින් තමයි වාහනය නතර කරලා තිබ්බේ එතනින් ඕවර්ටේක් කරලා එනකොට මම මෙහෙම බලාගෙන ගියේ බැලුවා එයා මේ සාරා කියන ගෑනුයි ඇවිල්ලා මෙහෙම හිටගෙන හිටියා.

ප්‍ර කොතනද හිටගෙන හිටියේ?

උ බීච් පාරෙන් ඇවිල්ලා මහ පාර අයිනෙම

ප්‍ර මහ පාර අයිනෙ දැන් සාරා ඇවිල්ලා හිටගෙන ඉන්නවා?

උ ඔව් හිටගන ඉන්නවා.

ප්‍ර එතකොට අර පිකප් එක තිබ්බෙ කොයි පැත්තෙද?

උ පිකප් එක තිබ්බේ පාරට එහා පැත්තේ මඩකලපුව පැත්තට මුහුණ හරවාගෙන තිබ්බා. ඊට පස්සේ සාරා කියන එක්කෙනා ඇවිල්ලා මෙහෙම අපේ වාහනය එනකොට මෙහෙම නතර කලා.

ප්‍ර නතර වුනා?

උ නතර වුනා .නතර වුනාම මම මෙහෙම බලාගෙන ගියාම මෙයා තමයි මම ගෝලයට කිවේ මැරුණා කියලා කිව්වනෙ මේ ඉන්නවා සාරා කියලා මම කිව්වා කිව්වායින් පස්සේ මට හොල්මන් වුනා මිස් මට බයවුනා මම ඒ පාරෙන් තමා හරවලා යන්න ඕන ඒ පාරෙන් හරවන්නෙ නැතිව ඔහොම ගියා කෙලින්ම කෙලින්ම ගිහිල්ලා යනකොට මම මේ පැත්තෙ සයිඩ එකෙන් බැලුවා කණ්ණාඩියෙන් මේ අත පැත්තේ කණ්ණාඩියෙන් බැලුවා.

ප්‍ර දකුණු අත පැත්තෙ කණ්ණාඩියෙන්?

උ ඔව් බලනකොට මෙයා පාර cross කරනවා..

FAIR COMMENT BY JEZEEM

ප්‍ර මෙයා කියන්නේ සාරා?

උ ඔව් අර ගැහැනු කෙනා cross කරනවා cross මම මේ පැත්තේ කන්නාඩියෙන් බැලුවම එයා පිකප් එකේ නැග්ගා.

ප්‍ර ඒ කියන්නේ වම් පැත්තේ කණ්ණාඩියෙන් බැලුවහම පිකප් එකට නගිනවා දැක්කා ?

උ ඔව් නැග්ගා මම ඊට පස්සේ එතනම පොඩ්ඩක් දුරින් හරවා ගත්තා වාහනය

ප්‍ර යූ ටර්න් එකක් දැම්මා?

උ ඔව් යුටර්න් අරගෙන එනකොට වාහනය ඇතුලේ ලයිට් එක දාලා තිබ්බා.

ප්‍ර ඒ කියන්නේ මොන වාහනයේද දැන් ලයිට්?

උ පිකප් එක.

ප්‍ර පිකප් එක ඇතුලේ ලයිට් එක දාලා තිබ්බා?

උ ඔව් දෙන්නෙක් ඩ්‍රයිවරුයි අබුබකර් මහත්තයා කියන එක්කෙනයි මෙහෙම ඉඳලා මෙහෙම හරවනකොට මම බැලුවා එයාව .

ප්‍ර දැන් දෙන්නෙක්ව දැක්කායි කිව්වානේ පිකප් එක ඇතුලේ ඉන්නවා ?

උ ඔව්

ප්‍ර එතකොට ඩ්‍රයිවින් සීට් එකේ හිටියේ කවුද ඩ්‍රයිවර් කෙනෙක්ද?

උ ඔව් ඩ්‍රයිවර්

ප්‍ර එතකොට ඔය අබුබකර් කියන මහත්තයා ඒ පිකප් එකේ කොහේද සිටියේ?

උ ගෝලයා සයිඩ් පැත්තක හිටියා.

ප්‍ර ඩ්‍රයිවර්ට වම් පැත්තෙන්?

උ වම් පැත්තෙන් ඔව්.

ප්‍ර එතකොට අර සාරා මොකද වුනේ එයා මොකක්ද කලේ?

උ එයා මේ මම යනකොට තමයි දැක්කේ කණ්ණාඩි වලින් නැග්ගා. ඊට පස්සේ පිටිපස්සේ කණ්ණාඩියේ කලුපාට වගේ තිබ්බා. ඒක පේන්නේ නැහැ ඊට පස්සේ ඉස්සරහා ලයිට් එකෙන් මෙයාලා දෙන්නම තමයි අපි දැක්කේ ඩ්‍රයිවරුයි අබුබකර් මහත්තයයි ඉන්නවා දැක්කා. දැකලා. මම ගෝලයාට කිව්වා අඳුරන මහත්තයයි ඉන්නවා මම කතා කරන්නත් කියලා දොර ඇරලා මෙහෙම කකුල ගන්න කොට පිකප් එක ගියා මිස් .

ප්‍ර එතකොට කතා කරන්න බැරිවුනා අබුබකර් මහත්තයාත් එක්ක?

උ බැරිවුනා ඔව්

ප්‍ර දැන් අපි පොඩ්ඩක් ඔය කිව්ව දේ ගැන පොඩි පොඩි විස්තර ටිකක් දැනගන්න ඕන හොඳේ?

උ ඔව්

ප්‍ර අබුබකර් මහත්තයාව පිකප් එක ඇතුලේ ඩ්‍රයිවර්ගේ සීට් එකට වම් පැත්තේ ගෝලයා ඉන්න තැන ඉදගෙන ඉන්නවා දැක්කා කියලා කිව්වා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ඔව්

ප්‍ර කොහොමද ඒ ඉඳගෙන හිටපු එක්කෙනා අබුබකර් මහත්තයා කියලා ඇන්ටනි අඳුනාගත්තේ අබුබකර් මහත්තයාව ඔයිට ඉස්සරවෙලා කොහොමද ඇන්ටනි අඳුනන්නේ?

උ මම අබුබකර් මහත්තයා ඉස්සරවෙලා කලවංචිකුඩි පොලිසියේ තමයි වැඩකලේ මිස්. ඒ කාලයේ මම වාහනයේ යනකොට එනකොට ට්‍රැෆික් මහත්තයාලා ඇල්ලුවොත් එහෙම මෙයාට කතා කරලා තමයි එයා උදව් කරලා තියෙන්නේ අපිට.

ප්‍ර අබුබකර් මහත්මයා ?

උ ඔව්. මට උදව් කරපු නිසා එයාව දන්නවා.

ප්‍ර ඒ කියන්නේ මේ මහත්තයා පොලිසියේ එක්කෙනෙක්?

උ පොලිසියේ එක්කෙනෙක් ඒක උදව් කරලා තියෙනවා

ප්‍ර ඒ මහත්තයා ඇන්ටනි දන්න කාලයේ අබුබකර් මහත්තයා මොන පොලිසියේද වැඩකලේ?

උ කලවංචිකුඩි පොලිසියේ.

ප්‍ර එතකොට ඔය පිකප් එක ඇතුලේ දැක්කයි කිව්වේ 2019 සැප්තැම්බර් මාසෙනේ.

උ ඔව්.

ප්‍ර එතකොට අබුබකර් මහත්තයා එතකොටත් වැඩ කලේ කලවංචිකුඩි පොලිසියෙද?

උ නැහැ නැහැ කලංවචිකුඩි පොලිසියේ සිටියේ නැහැ.

ප්‍ර දැන් ඊළඟ ප්‍රශ්නය. ඇන්ටනි කිව්වා බීච් රෝඩ් එක කිට්ටුවට එනකොට දැන් එතනින් තමයි බීච් රෝඩ් එකට තමයි හරවන්න ගියේ ඇන්ටනිලා?

උ ඔව් මිස්

ප්‍ර නමුත් බීච් රෝඩ් එක පැත්තේ ඉඳලා ආපු ගෑනු කෙනා සාරා කියලා අඳුනාගත්තා කියලා කිව්වා ඇන්ටනි?

උ ඔව්

ප්‍ර එතකොට සාරාව ඉස්සරවෙලාම ඇන්ටනි දකිනකොට සාරායි ඇන්ටයි අතර දුර කොච්චර විතර තිබ්බාද?

උ සාමාන්‍යයෙන්.

ප්‍ර ඔතන ඇන්ටනි ඉන්නවානම් දැන්

උ ඔව් මම මේ පාරේ යනවා නම් අර මේ මහත්තයා වගේ කම්පියුටර් එක වගේ දුර තමයි එයා හිටියේ මෙහෙම මම වාහනයේ යනකොට එයා හිටියේ පාර අයිනෙම අර පුටුවට පොඩ්ඩක් මෙහා වගේ.

ප්‍ර පුටුවට මෙහා. කොයි හරියේ වගේද දැන් මේ මහත්තයා ගිහිල්ලා හිටගනියි කියන්නකෝ?

FAIR COMMENT BY JEZEEM

උ අතන වගේ මහත්තයා ඉන්න තැනක වගේ එයා හිටියා මෙහෙම මම බලාගෙන ගියා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා .</u>

මේ අවස්ථාවේදී සාක්ෂිකරු සාක්ෂි කූඩුවේ සිට කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක සිටගෙන ඉන්න ස්ථානයක් පෙන්වයි එම ස්ථානයේ සිට සාක්ෂිකරු සිටින සාක්ෂි කූඩුවට අඩි 8ක් පමණ බව මැනීමෙන් පසුව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර එතකොට දැන් මේ රෑනේ පාන්දර 3.30ට විතරනේ?

උ ඔව්.

ප්‍ර එතකොට ඔය කළු ඇදගත්ත එක්කෙනෙක් තමයි ආවා කියලා කිව්වේ?

උ ඔව්

ප්‍ර රවින්ද්‍රන් කොහොමද ඔය උදේ පාන්දර කලු ඇදගත්ත එක්කෙනා සාරා කියලා හඳුනාගත්තේ?

උ මම හොඳටම බලාගෙන ගියා මිස් අනිත් එක පාර තියෙන්නේ ලයිට් කණුවලින් ලයිට් දාලා තිබ්බා එලිය තිබ්බා ඒ නිසා මම මෙයා කවුද කියලා හොඳටම බලාගෙන ගිය නිසා තමයි එයාව අඳුරකර ගත්තේ ඉස්සෙල්ලා පොඩි කාලෙ එයාව අඳුනන නිසා

ප්‍ර අඳුනන නිසා?

උ ඔව්

ප්‍ර එතකොට එය සාරා දැක්ක හින්දද ඇන්ටනි මහත්තයා බීච් රෝඩ් එකට හැරෙව්වේ නැත්තේ?

උ ඔව් මිස් ඒක තමයි යන්න ආවේ මම ඒ පාරෙන් බිච් පාරෙන් තමයි යන්න ආවේ මෙයාව දැකලා මට හොල්මන් වුනා ඊටපස්සේ තමයි මම කෙලින්ම වාහනයේ ඔහොමම ගියා මම දන්නේ නැතුව ඉස්සරහට ගියා.

ප්‍ර ඒකියන්නේ ඒ තරමට කම්පනයක් ඇතිවුනා?

උ ඔව් එහෙම ගියා. ගියාම මම සයිඩ් කණ්ණාඩි වලින් තමයි දැක්කේ මෙයා ඇවිල්ලා පිකප් එකට නඟිනවා. ඒක ඊටපස්සේ තමයි එතන චුට්ටක් ගිහිල්ලා මං හරවාගෙන ඇවිල්ලා තමයි මම බැලුවා මේ වාහනයේ කවුද ඉන්නේ කියලා. බලනකොට තමයි ඉස්සරහ ලයිට් එක දාලා තිබ්බා හුඩ් ලයිට් එක අබුබකර් මහත්තයා මෙහෙම ඉඳලා හරවනකොට මම දැක්කා මෙයාව දැකලා තමයි මම බැහැලා කතා කරන්න ගියේ ගියාම එයා දකින්න ඇති මාව, දැකලා එයා දන්නවා මගේ වාහනයේ කියලා දැනගෙන තමයි ගිහිල්ලා තියෙන්නේ මිස් මම හිතන්නෙ ඒ විදියට

****

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරු සාක්ෂි කුඩුවේ සිට ඔහු වාහනයේ වාඩිවෙලා සිටින ගමන් හැරී සාරා සහ අබුබකර් යන අයවලුන් දෙදෙනා සිටි දෙස බලපු ආකාරයට ඔහු කොමිෂන් සභාවට පෙන්වා සිටි බව සටහන් කර තබමි

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර දැන් යු ටර්න් එකක් දාලා ආපහු යනකොට බිව් රෝඩ් එක පැත්තට අර පිකප් එක ඇතුලේ ඉන්නේ අබුබකර් මහත්තයා කියලා අඳුනා ගත්තා කිව්වානේ?

උ ඔව්

ප්‍ර එතකොට පෙන්වන්න පුලුවන්ද මේ ගරු කොමිෂන් සභාවට ඇන්ටනි ඔතන ඩ්‍රයිවින් සීට් එකේ හිටියා නම් අබුබකර් මහත්තයාව අඳුනගත්තේ කොච්චර විතර දුරකින්ද කියල? අබුබකර් මහත්තයා එතකොට කොච්චර දුරකින්ද සිටියේ?

උ එයා හිටියේ පොඩ්ඩක් දුර මෙතනයි අර බිත්තියයි වගේ තමා මගේ වාහනේ මගේ වාහනේ නතර කරේ පාර මැද්දේ නතර කරලා පිකප් එක තිබ්බෙ ඔතනින් ඒ වගේ දුරයි.

ප්‍ර එතකොට ඇන්ටනි කියන විදියට ඒ පිකප් එක ඇතුලෙත් ලයිට් එකක් දාලා තිබ්බා ?

උ දාලා තිබ්බා ඔව්.

ප්‍ර දැන් ඇන්ටනිට කතා කරන්න හම්බවුනේ නැහැ කියලා කිව්වා බහින්න හැදුවාට අබුබකර් මහත්තයාත් එක්ක ?

උ ඔව්

ප්‍ර ඒ පිකප් එක පිටත් වුනා කියලා කිව්වා?

උ ඔව්

ප්‍ර ඊට පස්සේ ඇන්ටනි මොකක්ද කලේ

උ ඊට පස්සේ අපි දෙන්නම බිව් රෝඩ් එකට ගියා මිස් බඩු ගන්න යනකොටම මම ඉස්සරවෙලා කලවංචිකුඩි පොලිසියේ වැඩ කලේ CID මහත්තයා කියලා චමින්ද මහත්තයා එයා තමයි ඇවිල්ලා ගමවලින් ඇවිල්ලා වොරන්ට් කේසුයි, ගංජා කේස් කසිප්පු එහෙම අල්ලන්නේ ඉස්සරවෙලා මමත් එක්කෙනෙක් ගංජා විකුණුලා මම අල්ලලා දුන්නා ඒ කේස් එකටත් ගම කට්ටිය මට ගහන්න අරවා මේවා කරන්න ආවා මම කටඋත්තරය ඔක්කොම දිලා තියෙන්නේ. ඒ නිසා තමයි මම එයා අඳුරන නිසා මම එයාට කෝල් කලා ඒ වෙලාවෙම කෝල් කරලා කිව්වා මෙහෙම මෙයාව දැක්කා සාරා කියන ගෑනිව දැක්කා අබුබකර් මහත්තයාත් යනවා පිකප් එකේ ඒකේ තමා නැගලා යන්නේ ඒක පොඩ්ඩක් බලන්න කියලා එයා කිව්වා ඔයා පොළට යනවා නම් ගිහිල්ලා

FAIR COMMENT BY JEZEEM

එන්න මම පොලට යනවා කියලා කිව්වා. ගිහිල්ලා එන්න මම කලංචිකුඩි පොලිසියේ ඉන්නම් කියලා .එතකොට මම ගිහිල්ලා 2, 2.30ට වාගේ පොලේ බඩු දාලා සල්ලි එකතු කරලා ගෙදරට එනකොට කෝල් එකක් දුන්නා මඟ ඒ එද්දී.

ප කාටද කෝල් එකක් දුන්නෙ?

උ චමින්ද මහත්තයාට.

ප චමින්ද මහත්තයා කලවංචිකුඩි පොලිසියේද හිටියේ?

උ ඉස්සෙල්ලා හිටියා ඊට පස්සේ එයාට කිව්වට පස්සේ එයා කිව්වා මම කලවංචිකුඩි පොලිසියේ ඉන්නේ එන්න කියලා. මම ඇවිල්ලා පොලිසිය ගාව වාහනය නතර කරලා ගියා. ගිහිල්ලා මෙයා යනකොට එළියේ හිටියේ.

ප එතකොට රවින්ද්‍රන් කොහෙද හිටියේ?

උ වාහනයේ හිටියේ.

ප රවින්ද්‍රන් වාහනයේ හිටියා ඇන්ටනි මහත්තයා පොලිසිය ඇතුලට ගියා?

උ ඔව්.

ප හම්බවුනාද චමින්ද මහත්තයාව?

උ ඔව් එයා හිටියා එලියේ.මම ගිහිල්ලා මොකක්ද කියලා ඇහුවා මම කිව්වා සාරා කියන ගෑනිව දැක්කා මුස්ලිම් විදියට හිටියා. පිකප් එක අබුබකර් මහත්තයාත් ඉන්නවා නැඟලා යන එක මම බැලුවා එහෙම කියලා මම ආවා එයා කිව්වා අපි බලාගන්නම් කියලා කිව්වා අපි ආවා ගෙදර .

ප දැන් ඔය චමින්ද මහත්තයාත් එක්ක කතා කරන්න කොච්චර විතර වෙලාවක් ගියාද ඇන්ටනි මහත්තයාට?

උ එච්චර වෙලාවක් ගියේ නැහැ විනාඩි 2ක 3කින් මං කියලා ආවා.

ප ඊට පස්සේ වාහනේට නැගලා ගෙදර ගියාද ඇන්ටනි මහත්තයා

උ ඔව් ගෙදර ගියා අපි දෙන්නා.

ප රවින්ද්‍රනුත් ගෙදර ගියා ඇන්ටනි මහත්තයාත් එක්ක?

උ ඔව්

ප ගෙදර ගියාට පස්සේ ඔය සිද්ධිය ගැන කාටහරි කිව්වද ඇන්ටනි මහත්තයා කිව්වද?

උ නැහැ මම ගෙදර ගියාම රෑවෙලා මම පවුලට කිව්වා පවුලට කිව්වාට පස්සේ මම එයාටත් කිව්වේ මේ කේස් එක කාටවත් කියන්න යන්න එපා අපිට කරදර වෙයි කියලා මම අපේ ගෝලයාටත් කිව්වා මිස් කිව්වායින් පස්සේ මම පවුලට කිව්වා මෙහෙම තමයි වුනේ මේක දැක්කා අපි කියලා කිව්වා කිව්වායින් පස්සේ පවුලකිව්වා අපි දරු පවුල්කාරයලා ඔයාලා මේ කේස් එකට යන්න එපා ඉස්සරවෙලාත් මේ කේස් එකට අහුවෙලා අපි බොහොම අමාරුවෙන් ඉන්නේ එහෙම කියන්න එහෙම යන්න එපා කියලා

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඉස්සෙල්ලා අහුවෙච්ච මොන කේස් එක ගැනද ඔය කියන්නේ

උ අර ගංජා එක්කෙනෙක් විකුණලා මම ඒක පෙන්නලා දුන්නා විකුණනවා කියලා. ඒකට ගමේ කට්ටිය මට ගහන්න එහෙම ආවා මිස්.

ප්‍ර ඒ ඔත්තුව දුන්නා කියලා?

උ ඔත්තුව දුන්නා කියලා ඊට පස්සේ ඒක ඒ නිසා පවුල කිව්වා එහෙම කියන්න එහෙම යන්ට එපා කරදර වෙයි කියලා එහෙම කිව්වා කිව්වායින් පස්සේ මම ඒක කියන්න ගියේ නැහැ ඒ පස්සේ ගියෙත් නැහැ ඒක ආරංචිකරලා බැලුවෙත් නැහැ.

ප්‍ර කොයි වෙලාවක හරි ඇන්ටනි මහත්තයාගේ කටඋත්තරයක් කාත්තන්කුඩිය පොලිසියේදි ලිව්වාද ?

උ නැහැ කාත්තන්කුඩිය පොලිසියේදි මගේ කටඋත්තර ගත්තේ නැහැ .

ප්‍ර එහෙනම් කලවංචිකුඩි?

උ නැහැ කලවංචිකුඩි නෙවෙයි ඉස්සෙල්ලා මේක කිව්වායින් පස්සේ මිස් අපේ ගෙදර පාටියක් තිබ්බා මේ අවුරුද්දේ 2020.06.25 වෙනිදා මම පොලිසියට ගියා මේක ගන්න

ප්‍ර මොකක් ගන්නද?

උ අපිට මේ අර කොරෝනා කේස් නිසා පර්මිෂන් දෙනවා වාහනේ බිස්නස් යන්න ඒකට ගියාම ඒ පොලිසියේ ඉන්නවා බණ්ඩාර සාජන්ට් මහත්තයා කියලා එක්කෙනෙක් ගොඩාක් කාලයකින් දැක්කේ. මං අම්පාරේ ඉද්දි අඳුරනවා එයාව දැක්කාම මට කතාකලා එයා ඇන්ටන් අයියා මොකද කියලා මම කිව්වා මහත්තයා මම මෙහෙම ආවේ කියලා කතා කරපුවහම කතා කරලා මම එන්න හදනකොට එයා කිව්වා මොකක්ද අඩියක් ගහන්නෙ නැද්ද එහෙම කියලා ඇහුවා මට මම කිව්වා එහෙමනම් එන්න ගෙදර අඩියක් ගහමු කියලා මම කිව්වා කිව්වායින් පස්සේ මිස් එයායි බන්ඩාර සාජන්ට් මහත්තයයි තව රාළහාමි මහත්තයයි ප්‍රතාප් කියල මහත්තයයි ආවා මම අනිත් මහත්තයලා දෙන්නා මම අඳුරන්නෙ නැහැ

ප්‍ර ඒකියන්නේ ගෙදරට ආවා?

උ ඔව් අපේ ගෙදරට ආවා මිස් ආවයින් පස්සේ ඒ මහත්තයලා දෙන්නා මම අඳුරන්නේ නැහැ බණ්ඩාර සාජන්ට් මහත්තයා විතරයි මම අඳුනන්නේ ඊට පස්සේ ආවයින් පස්සේ හවස 7.30ට වගේ ආවා. ඇවිල්ලා අපිට පෙන්නුවා එක්කෙනෙක් පෙන්නුවා ප්‍රතාප් මහත්තයා මෙයා CID වැඩ කරන්නේ කියලා.ඊට පස්සේ තව රාළහාමි මහත්තයා පොලිසියේ වැඩකරන්නේ කියලා පෙන්වලා දිලා මායි මගේ යාලුවලා දෙන්නයි ඔක්කොම 6 දෙනෙක් අඩියක් ගැහුවා. අර ආපු රාළහාමි මහත්තයලා බෝතලයක් ගෙනාවා මම ගෙදර බයිට්ස් හැදුවේ. මාත් බෝතලයක් ගත්තා ඊට පස්සේ අඩියක් ගැහුවා ගහලා ඉන්නකොට මිස් අර ප්‍රතාප් මහත්තයා කියන එක්කෙනාට කෝල් ආවා මිස් කෝල් එකක් ආවා එයා

FAIR COMMENT BY JEZEEM

දෙමළෙන් තමයි කතා කරේ සාරා සම්බන්ධ කේස් එකද කියලා කතාකලා කතා කරනකොට මම අර ප්‍රතාප් මහත්තයාගෙන් ඇහුවා මොකක්ද මහත්තයා කේස් එක කියලා එයා කිව්වා මෙහෙමයි සාරා සම්බන්ධ කේස් එක අපි තමයි බලන්නේ ඒ නිසා තමයි කෝල් ආවේ ඒක පොඩ්ඩක් බලන්න අරහෙ මෙහෙ කියලා කිව්වා මිස්. කිව්වායින් පස්සේ මම පොඩ්ඩක් වැඩිවෙලා තමයි හිටියේ මිස්. මම එයාට බැන්නා මෙහෙමයි අපි මෙහෙම කරලා කියලා තියෙන්නේ ඒ සම්බන්ධයෙන් කවුරුත් බැලුවේ නැහැ බලන්නකෝ රටට කරන වැඩේ අරවා මේවා කියලා මම මෙයාට බැනලා තමයි එයාට කිව්වා එයාට කිව්වායින් පස්සේ එයා එතන ඉද්දී කෝල් දුන්නා මෙයාට එයාගේ ලොකු මහත්තයාට ගිහිල්ලා කිව්වායින් පස්සේ එයා කියලා තියෙන්නේ එහෙනම් හෙට උදේ එයාට කතා කරමු කියලා. ඊට පස්සේ පහුවදා උදේ මට කෝල් කලා ප්‍රතාප් මහත්තයා කෝල් කරලා ඇහුවා කොහෙද ඉන්නේ කියලා මම කිව්වා මම ගෙදර ඉන්නවා කියලා එයා කිව්වා හරි එහෙනම් හම්බවෙන්න ඕන කියලා මම කිව්වා එන්න කියලා ගෙදරට ආවා ඇවිල්ලා මට ඇහුවා මොකක්ද ඊ කිව්ව කතාව මොකක්ද කියලා මම කිව්වා මෙහෙම තමයි වුනේ මේ කේස් එක තමයි කියලා. ඊට පස්සේ එයා එයාගේ ලොකු මහත්තයාට හේරත් මහත්තයා කියලා ලොකු මහත්මයාට කෝල් කරලා දුන්නා මට කතා කරන්න කියලා මම එයාට වෙච්ච සිද්ධියේ කතාව කිව්වා කිව්වායින් පස්සේ එයා කිව්වා හා හරි අපි එනවා දවසකට බලමු කියලා එයා ෆෝන් එක තිබ්බායින් පස්සේ දවස් 10 කට 15කට පස්සේ මගේ ගෙදරට ජනාධිපති කොමිෂන් එකෙන් කෝල් කරලා ගෙදරට ආවා මහත්තයාලා 4 දෙනෙක් ආවා ඇවිල්ලා මට කිව්වා මෙහෙම සිද්ධියක් වුනේ ජනාධිපති කොමිෂන් එකෙන් ඇවිල්ලා තියෙන්නේ ඔයාට මේ වගේ සිද්ධියක් වෙලා කියලා කටඋත්තරය ගන්න ඕන කියලා ඊට පස්සේ මම කටඋත්තරය දුන්නා ගෙදර .ගෙදර කටඋත්තරය දිලා වෙච්ච සිද්ධිය තැන ඔක්කොම පෙන්නුවා පෙන්නලා කට උත්තරය දුන්නාට පස්සේ ඒ කට්ටිය ආවා මාව ගෙදරට දාලා .

ප්‍ර ජනාධිපති කොමිසමේ ඒ ගොල්ලෝ ආපහු ආවා?

උ ඔව් ආවා ඇවිල්ලා ආය දවස් 15කින් 20කින් පස්සේ සිඅයිසි කියලා කට්ටිය ඒත් 4 දෙනෙක් වගේ ආවා.

ප්‍ර CID කියලා?

උ සිඅයිසි කියලා තමයි කිව්වේ ඒකෙන් ආවේ රත්නයක මහත්තයා කියලා එයාගේ නමත් තියෙනවා නම්බරුත් තියෙනවා මගේ ගාව .

ප්‍ර සිඅයිඩී, සිසිඩි ද

උ CID කියලා තමයි කිව්වේ. ඊට පස්සේ ඒ කට්ටිය ආවාට පස්සේ එයාලටත් කටඋත්තරය දුන්නා. දුන්නාට පස්සේ එයාලා ගෝලයයි අපිත් එක්ක අර එදා අඩිය ගහන්න දෙන්නෙක් මගේ යාලුවලා හිටියනේ ඒ දෙන්නාගෙයි

FAIR COMMENT
BY JEZEEM

කටඋත්තර ඔක්කොම ගත්තා. අරගෙන ආවයින් පස්සේ මිස් ඒ කට්ටිය කටඋත්තර අරගෙන ආවා. ඇවිල්ලා ඊට පස්සේ දෙවෙනි පාර ඊලඟ පාර රත්නායක මහත්තයලා ඇවිල්ලා ප්‍රතාප් මහත්තයලාගේ ගෙදර ඉඳලා මට කෝල් එකක් දුන්නා අපි කලවංචිකුඩි සූරිඅඩි ගෙදර ප්‍රතාප් මහත්තයලාගේ ගෙදර ඉන්නේ ඔයා ඔයාගේ ගෝලයත් එක්කගෙන එහෙ එන්න කියලා .අරයලත් එක්කගෙන ඉස්සෙල්ලා අඩියක් ගහන්න යාලුවලාත් එක්ක එන්න කියලා මම අරයලාටත් කෝල් කරලා කතා කරලා මම පොළට ගිහින් එන ගමන් ලොරිත් එක්කම මෙයාව එක්කගෙන ගියේ එතැන ගිහිල්ලා මිස් එතනටත් කටඋත්තරය දුන්නා දෙන්නම කටඋත්තරය දුන්නා දුන්නාම පස්සේ ඊට පස්සේ දවස් 10,15,20 කින් පස්සේ CID කියලා 3 දෙනෙක් ආවා ගෙදරට එතනින් ආපු කට්ටිය වීරසිංහ මහත්තයායි තව මහත්තයලා දෙන්නෙකුයි ආවා තුන්දෙනාම ඇවිල්ලා මට කටඋත්තරය ගත්තා මම කටඋත්තරය දුන්නාම මම කිව්වා මගේ ගෝලයා ඉන්නවා මම එන්න කියන්නද කියලා කිව්වා නම ඔක්කොම ලියාගත්තා ෆෝන් නම්බරයම එහෙම අරගත්තා මම කිව්වා කතාකරලා ගෙන්න ගන්නද කියලා එයාලා කිව්වා එපා ඕන නැහැ අපි අරගන්නම් කියලා. ඊට පස්සේ මේ කට්ටිය හරි කියලා ගියා මිස් ගියායින් පස්සේ තමයි ගිය මාසේ 29 වෙනිදා අරයට ලියුම යවලා තිබ්බලු කලවංචිකුඩිය කියලා මට ගෙනල්ලා පෙන්නුවා.28 වෙනිදා 24,23,ද ඒ වගේ 28 උදේ 9.00ට එන්න කියලා ගෙනල්ලා පෙන්නුවා

ප්‍ර දැන් ඔය සී.සී.ඩී එකෙන් ආවායි කියලා කිව්වානේ ඇන්ටනි මහත්තයාගේ කටඋත්තරය ගන්න?

උ ඔව්

ප්‍ර මතකද ඒ මේ අවුරද්දෙද ආවේ 2020 ද?

උ ඔව් මේ අවුරුද්දෙ 2020.

ප්‍ර මොන මාසේ වගේද ආවේ?

උ මම හිතන්නේ මිස් 8 වෙනි මාසේ නැත්නම් 9 වෙනි මාසේ මුල CID එකද.

ප්‍ර නැහැ CCD එක

උ CCD එක ආවේ මේ අවුරුද්දෙ තමයි

ප්‍ර ජනාධිපති කොමිසමෙන් ඇවිල්ලා කටඋත්තර ලියා ගත්තානේ ඊට පස්සේ කට්ටියක් ආවනේ ?

උ ඔව්.

ප්‍ර අන්න ඒ ගොල්ල ආව වෙලාවයි මම අහන්නෙ ?

උ ඔව් රත්නායක මහත්තයා.

ප්‍ර රත්තානයක මහත්තයලා කවදද ආවේ?

FAIR COMMENT BY JEZEEM

උ රත්නායක මහත්තයලා ආවේ ජනාධිපති කොමිසන් එකෙන් ඇවිල්ලා දවස් 10, 15කින් පස්සේ ඒක මම හිතන්නේ 7 වෙනි මාසේ නැත්නම් 8 වෙනි මාසේ වෙන්න ඇති.

ප්‍ර එතකොට අර CID එකෙන් වීරසිංහ මහත්තයයි තව දෙන්නෙකුයි ආවා කිව්වානේ?

උ ඔව්.

ප්‍ර ඒ ආවේ කොයි කාලෙද ඒත් මේ අවුරුද්දෙමයි

උ ඔව් මේ අවුරුද්දෙමයි

ප්‍ර මොන මාසෙ වගේද මොන දවස වගේද?

උ 9 වෙනි මාසේ 10 ට ඉස්සෙල්ලා වගේ

ප්‍ර 9 වෙනි මාසේ 10 වෙනිදාට ඉස්සෙල්ලා කියලයි මතක

උ ඔව් එහෙම තමයි මතක

ප්‍ර ඊටපස්සේ අර නැවත CID එකට යන්න කියලා ලියුමක් ආවා මොකක් හරි එකක් කිව්වානේ දැන්

උ CID එකට එන්න කියලා අපේ ගෝලයාට තමයි ලියුම යවලා තිබ්බා කලංචංචිකුඩි පොලිසියෙන් මැසේජ් යැව්වා කියලා පොලිසියෙන් ගෙනල්ලා දුන්නා.

ප්‍ර ඒ පණිවිඩය දැක්කාද ඇන්ටනි මහත්තයා?

උ ඔව් මගේ ගෙදර තමයි ගෙනාවේ එයාට ලියන්ටයි කියවන්ටයි දන්නේ නැහැ මිස්.

ප්‍ර රවින්ද්‍රන්ට බැහැ?

උ ඔව් බැහැ.

ප්‍ර අකුරු කියන්න බැහැ.

උ ඔව් ඒ නිසා මට ගෙනාවා ගෙනල්ලා පෙන්නුවා මේ ඇවිල්ලා තියෙනවා.

ප්‍ර ඒක දැක්කොත් නැවත අඳුනන්න පුලුවන්ද?

උ ඔව්.

ප්‍ර මොන භාෂාවෙන්ද තිබ්බේ?

උ සිංහල භාෂාවෙන් තිබ්බා ඒක ට්‍රාන්සර් කරලා තිබ්බා දෙමළෙන්

ප්‍ර එහෙනම් දැන් ඔය පෙන්වනලේඛන 2 හඳුනාගන්න පුලුවන්ද කියන්නකෝ?

උ මේකත් ආවා මේ දෙකම තමයි ආවා.
ස්වාමිනි RS 01 සහ RS 02ලේඛන අඳුනාගනු ලබනවා සාක්ෂිකරු විසින්

ප්‍ර දැන් ඒ පණිවිඩය අනුව 2020 සැප්තැම්බර් මාසේ 28 වෙනිදා රවින්ද්‍රන්ට CID එකට එන්න කියලා නේද පණිවිඩය ඇවිල්ලා තිබ්බෙ?

උ ඔව් මිස්.

ප්‍ර ඒ අනුව රවින්ද්‍රන් ගියා ද CID එකට?

උ එයාව එක්කගෙන ආවේ මම .

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර CID එකට එක්කගෙන ආවේ ඇන්ටනී මහත්තයා?

උ ඔව් මම ඇවිල්ලා අතන උදේ පාන්දර වාහනයෙන් ඇවිල්ලා වාහනයකියන්නේ හයර් එකට එන වෑන් එකට අපි සීට් අරගෙන ආවා ඇවිල්ලා උදේ පාන්දර ගිහිල්ලා

ප්‍ර කීයවෙන කොටද CID එකට යන්න තිබ්බෙ?

උ ඒක 9.00ට එන්න කිව්වා

ප්‍ර 28 වෙනිදා උදේ 9.00ට

උ 28 වෙනිදා උදේ 9.30 ට එන්න කිව්වේ ඊට පස්සේ අපි උදේ පාන්දර ගියා 5.30ට වගේ ගිහිල්ලා මේ ලියුම පෙන්නුවා එතන reception එකේ හිටපු රාළහාමි මහත්තයාට ලියුම පෙන්නලා මෙතනද මේකේ එන්න කියලා කියල තියෙන තැන කියලා මම ඇහුවා ඇහුවායින් පස්සේ එයා කීව්වා මෙතන තමයි කියලා 9.00ට එන්න කිව්වා. ඉතින් අපි දෙන්නම 9.00ට ගියා ගිහිල්ලා මම reception එකේ වාඩිවෙලා හිටියා මෙයාව 9.00 ට ඇතුලට ගත්තා .

ප්‍ර කොච්චර වෙලා වාඩිවෙලා ඉන්න වුනාද?

උ මම එතන 9.00ට ගිය වෙලාවේ ඉදලා රෑ 7.00ට තමයි එයා එළියට ආවේ.

ප්‍ර රෑ 7.00ට තමයි රවින්ද්‍රන් ආපසු එළියට ආවේ?

උ එළියට ආවේ ඔව්.

ප්‍ර එතකම්ම රවීන්ද්‍රන් එළියට ආවේ නැද්ද?

උ ආවේ නැහැ මම ඉස්සෙල්ලාම තමයි වාඩිවෙලා හිටියේ .

ප්‍ර එතකොට ඇන්ටනි මහත්තයා රවින්ද්‍රන් එළියට ආවාට පස්සේ එයත් එක්ක කතාකලාද?

උ එයා එළියට ආවහම මට කිව්වා මෙහෙමයි අපි ඉස්සෙල්ලා කටඋත්තරය දුන්න විදියට එයා මෙහෙම කිව්වේ නැහැ එයා කිව්වා 5 වෙනිදා මට උසාවියට එන්න කියලා තියෙන්නේ .

ප්‍ර මොන උසාවියටද එන්න කියලාතියෙන්නේ?

උ කල්මුණේ උසාවියට එන්න කියලා තියෙන්නේ ඇවිල්ලා අපි මේ සීන් එක දැක්කේ නෑ. මේක බොරු එහෙම කියලා එහෙ මහත්තයා කෙනෙක් කිව්වා අයියා එහෙම කියලා මට කිව්වා. මම කිව්වේ හරි එහෙම කිව්වාද එහෙනම් ඔයා 5 වෙනිදා උසාවියට යනවානේ ගිහිල්ලා judgeටයි මේක මෙයා මෙහෙම කිව්වනේ මෙහෙම කියන්න එපා කියලා කියලා තියෙනවනේ ඒකත් කියන්න ඕන .ආයේ අපි ජනාධිපති අපිට කට උත්තර ගන්න ආවනේ ඒ කට්ටියටත් දාන්න ඕන ජනාධිපති මහත්තයටත් දාන්න ඕන අපේ ක්‍රිස්තියානි ආගමේ ස්වාමීටත් දාන්න ඕන කියලා මම මේයාව කතා කරගෙන ගිහිල්ලා පහුවදා උදේ 29 උදේ මායි මෙයයි දෙන්නම ගිහිල්ලා මෙයාට වෙච්ච සිද්ධිය කියන්න කියලා ඒ යාලුවෙකුට දිලා තමයි දෙමලෙන් මම ලියුම ලිව්වේ මිස්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර CID එකෙන් එලියට ඇවිල්ලා කතා කලා කියලා කිව්වනේ ඇන්ටනී මහත්තයාත් එක්ක රවින්ද්‍රන්?

උ ඔව්

ප්‍ර ඒ වෙලාවේ දැනුම් දුන්නයි කිව්වා කල්මුනේ උසාවියට ගිහිල්ලා අපි සීන් එක දැක්කේ නැහැ කියලා කියන්න කියලා මොකක්ද මේ සීන් එක?

උ මේ සීන් එක කියන්නේ මිස් අපි යනකොට අර සාරාවයි සාරා යන වාහනය අබුබකර් මහත්තයා හිටියා කියලා ඒක මේ සාක්ෂි දීලා තියෙන එක ඒක බොරු කියලා කියන්න . එතකොට ඔයාට ප්‍රශ්ණ වෙන්නේ නැහැ එයාව මොකුත් ප්‍රශ්න වෙන්නේ නැතිව ඉන්නවා නැත්නම් ඇතුලේ ඉන්න කට්ටිය එළියට දාන්න පුලුවන් . එහෙම කිව්වෙ නැත්නම් ඔයයි ඔයාගේ පවුලේ දරුවෝ කට්ටියයි ඔක්කොම ගෙනල්ලා හිරේට දානවා කියලා මෙයා කිව්වා කියලා කිව්වා මට .

ප්‍ර කවුද මෙහෙම කියලා තියෙන්නේ රවින්ද්‍රන්ට?

උ මගේ ගෙදර 3 වෙනි පාර ආපු වීරසිංහ මහත්තයාත් එක්ක ආපු මහත්තයා කියලා උසාවියෙන් මෙයා පෙන්නුවා.

ප්‍ර ඒ කියන්නේ කල්මුණේ උසාවියට ගියාට පස්සේ අර CID එකේදි රවින්ද්‍රන්ට මෙහෙම කිව්වේ කවුද අර සීන් එක දැක්කේ නෑ කියලා කියන්න උපදෙස් දුන්නෙ කවුද කියන එක්කෙනාව පෙන්නුවා කියලද කියන්නේ ඇන්ටනි?

උ ඔව් මෙයා කිව්වා මෙහෙම කියනවා එහෙ මහත්තයා කෙනෙක් කියනවා කියලා මෙහෙම කියන්න කියලා ඊට පස්සේ මෙහෙම කරමු අපි ගිහිල්ලා ලියුම ලියලා යවමු උසාවියටත් ඔයා judge ගාවට ගිහිල්ලා කියන්න මෙහෙම තමයි කිව්වා කියලා කිව්වා මම කියලා ඊට පස්සේ අපි 5 වෙනිදා ගියායින් පස්සේ මට මේ උසාවියට මම එක්කන් ගියා මිස් රවින්ද්‍රන් ගෝලයාව එක්කන් ගියායින් පස්සේ තමයි .

ප්‍ර දැන් ඒ යන්න ඉස්සරවෙලා අපි අර ලියුම ගැනත් පොඩ්ඩක් කතා කරමුකෝ. දැන් ඒ කරුණු ගැන කියලා ලියුමක් ලියන්න ලැහැස්ති කරා කිව්වානේ?

උ ඔව්

ප්‍ර දැන් රවීන්ද්‍රන්ට අකුරු ලියන්න බැහැ නේද?

උ ඔව්

ප්‍ර එතකොට ඒ ලියුම කාටහරි කියලා ලියවා ගත්තාද?

උ ඔව්

ප්‍ර කාට කියලද ලියවා ගත්තේ?

උ එහෙ අපේ ගමේ යාලුවෙක්ට.

ප්‍ර යාලුවෙක්ට කියලා ඔයගොල්ලන්ට කියන්න ඕන දේ ඒකට ඇතුලත් කරලා ලිව්වා?

FAIR COMMENT — BY JEZEEM —

උ ලීව්වා ඔව්.

ප්‍ර ඒක ලිව්වේ මොන භාෂාවෙන්ද?

උ දෙමළ භාෂාවෙන්.

ප්‍ර ඒ ලියුම දැක්කොත් නැවත අඳුනන්න පුලුවන්ද?

උ ඔව්.පුලුවන්.

RS 04 පෙන්වා සිටිනවා ස්වාමිනි

ඔව් මේක තමයි ලිව්වේ

ප්‍ර දැන් එතකොට ඒක දෙමළෙන්නේ තියෙන්නේ ?

උ ඔව්

ප්‍ර ඊට පස්සේ ඔය ලියුම ගෙනියලා කාටහරි පෙන්නුවාද?

උ ඔව් මේක අරගෙන මමයි මගේ ගෝලයයි ගියා lawyer එක්කෙනෙක් කතා කරගන්න 5 වෙනිදා එන්න කිව්වානේ උසාවියට කල්මුනේට ඒක නිසා lawyerට අරගෙන ගිහිල්ලා අපි මෙහෙම වෙලා තියෙන්නේ අපි CID office එකට ගියා ගියාම මෙයාට එහෙ මහත්තයෙක් මෙයාව බය කරලා තියෙන්නේ ඒකට ලියුම ලියලා තියෙනවා අපි මෙයාලට යවන්න මේකේ තියෙනවා කොපි යවන එක. ඒකට යවනවා කියලා කල්මුනේ lawyer මහත්තයා කෙනෙකුට පෙන්නුවා පෙන්නුවාට පස්සේ lawyer කිව්වා මේක දෙමළෙන් යවලා හරියන්නේ නැහැ.ඒක සිංහල භාෂාවෙන් ට්‍රාන්සර් කරලත් යවන්න කියලා කිව්වා

ප්‍ර කවුද translate කලේ?

උ ඒක කල්මුනෙන් translate කරන එක්කෙනෙක්ගේ නම කිව්වා එතනින් හොයාගෙන යන්න කියලා එතනින් හොයාගෙන ගිහිල්ලා translate කරගෙන

ප්‍ර translate කෙරුවා පරිවර්තනය කරා නේද?

උ ඔව්

ප්‍ර ඊට පස්සේ මොකද කරේ එහෙම translate කරපු ලියුම්වලට? ඒවා fax කරාද කොහාට හරි?

උ ඔව් ෆැක්ස් කරා මම ජනාධිපති කොමිෂන් එකටයි, ජනාධිපති මහත්තයටත් ඒක ජනාධිපති මහත්තයාගේ address එක නැහැ ජනාධිපතිගේ address එක මෙතන දැම්මේ නැහැ ඒක නැති හින්දා ඊටපස්සේ එයා facebook එකට අරගෙන fax number එක අරගෙන fax කරා.

ප්‍ර Human rights එකට දැම්මාද?

උ ඒකටත් දැම්මා

ප්‍ර කාදිනල්ට දැම්මාද?

උ කාදිනල්ට ෆැක්ස් කලා රෙජිස්ට්‍රර් කලා දෙකම කලා.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර Batticalo එකේ කාටහරි යැව්වද?

උ ඕව් Batticaloa වල කොමිෂන් එකට දුන්නා ඊට පස්සේ බිෂොප්ටත් දුන්නා

ප්‍ර එතකොට දැන් අර සිංහලට translate කලා කියලා කිව්වානේ?

උ ඔව්

ප්‍ර මම දැන් පෙන්වනවා RS 05 කියලා ලකුනු කරලා තියෙන ලියුමක් ඒ ලියුම මිට කලින් දැකලා තියෙනවාද?

උ ඔව් මේක තමයි ට්‍රාන්ස්ලේට් කරපු ලියුම

ප්‍ර අර දෙමළ RS 04 කියන ලියුම translate කරලාතියෙන්නේ මේ RS 5 කියන විදියට මේක තමයි ඒ ලියුම නේද ට්‍රාන්ස්ලේට් කරපු එක?

උ ඔව්

ප්‍ර එතකොට 5 වෙනිදා නේද යන්න තිබුනේ කල්මුනේ මහෙස්ත්‍රාත් උසාවියට ?

උ ඔව්.

ප්‍ර එතකොට 5 වෙනිදා ගියාද ඇන්ටනි රවින්ද්‍රනුත් එක්ක ගියා?

උ ඔව් ගියා උදේ.

ප්‍ර දැන් එතකොට සාමාන්‍යයෙන් උසාවියට ගියහම නිතිඥ මහත්තයෙක්ව කතා කරනවානේ අල්ල ගන්නවානේ?

උ ඔව්.

ප්‍ර දැන් ඒ වගේ නීතීඥ මහත්තයෙක් රවින්ද්‍රන් වෙනුවෙන් අල්ලා ගත්තාද?

උ අපි යන්න කලින් මම කෝල් කලා අපි උදේ එනවා කියලා.

ප්‍ර කාටද?

උ lawyerට lawyerලාට ඊට කලින් ගිහිල්ලා අපි කතා කරලා තිබ්බේ 5 වෙනිදා එන්න කියලා තියෙන්නේ එන්න ඕන අපිට කතා කරන්න ඕන කියලා මං කියලා.

ප්‍ර කලින්ම කතා කරලා ලැහැස්ති කරගත්තා?

උ ඔෆිස් එකට ගිහිල්ලා ලැහැස්ති කරලා ආවේ 5 වෙනිදා උදේ ගිහිල්ලා එයාට කෝල් අරගෙන කිව්වා අපි එනවා කියලා ඇවිල්ලා උසාවිය ඇතුලට ඇවිල්ලා හම්බවෙන්න කිව්වා

ප්‍ර උසාවියේදී එතකොට lawyerව හම්බවුනාද?

උ හම්බවුනා.

ප්‍ර එතකොට CID එකේ මහත්තුරු ආවද උසාවියට?

උ නැහැ අපි ගිය වෙලාවේ හිටියේ නැහැ.

ප්‍ර පස්සේ ආවද?

උ ඔව් පස්සේ කියන්නේ අපි ගිහිල්ලා අපේ ගෝලයාට කිව්වා වාඩිවෙලා ඉන්න කියලා උසාවිය ඇතුලේ ඉන්න කිව්වා මම එලියේ හිටියා හිටියට පස්සේ මගේ ගෙදර ආපු විරසිංහ මහත්තයයි, අර එයත් එක්ක ආපු තව

FAIR COMMENT BY JEZEEM

මහත්තයයි දෙන්නමයි තව මහත්තයෙකුත් එක්ක තුන්දෙනයි ආවේ ඇවිල්ලා මෙයාව හොයාගෙන හොයාගෙන ඇවිල්ලා මෙයා ඇතුලේ හිටියේ.

ප්‍ර ඒ කියන්නේ මේ රවින්ද්‍රන්ව හොයාගෙන ගියේ?

උ ඔව් රවින්ද්‍රන්ව හොයාගෙන හොයාගෙන ඇවිල්ලා මෙයා ඉස්සෙල්ලා වාඩිවෙලා ඉන්නවා දැකලා මෙයාව එලියට කතා කලා .කතා කරනකොට මම එලියේ හිටියේ. ඊට පස්සේ කතා කරලා මෙයාට මොනවද කතා කරලා ඒ මහත්තයලා ඇතුලට ගියා ගියායින් පස්සේ රවින්ද්‍රන් ගිහිල්ලා වාඩිවුනා. ඊට පස්සේ මම ඇවිල්ලා රවින්ද්‍රන්ට කතාකරලා මොකක්ද කිව්වේ කියලා ඇහුවා මම. එතකොට තමයි රවින්ද්‍රන් කිවේ අර විරසිංහ මහත්තයා මේ වගේ සුදුපාට කෝට් එහෙම ඇදගෙන ආවා අර අනිත් මහත්තයා සුදුපාට ෂර්ට් එක ඇදගෙන තමයි ආවේ ඊට පස්සේ මට කිව්වා අර සුදුපාට ෂර්ට් එක ඇදගෙන ආව මහත්තයා තමයි මෙහෙම කියන්න කිවේ කියලා මට පෙන්නුවා මම බැලුවා හරි රවින්ද්‍රන් කිව්වා මිස් එහෙනම් මොකද කියන්න යන්නේ කියලා එයා lawyer කෙනෙක් අල්ලා ගන්න කිව්වා සල්ලි නැත්නම් මම දෙන්නම් කියලත් කියලා ගියාලු ඊට පස්සේ මේ රවින්ද්‍රන් කියලාතියෙන්නේ අපි lawyer අල්ලලා තියෙනවා කියලා .

ප්‍ර එතකොට දැන් ඇන්ටනිට පෙන්නුවායි කියලා කිව්වා විරසිංහ මහත්තයාත් එක්ක හිටපු සුදු ෂර්ට් එකක් ඇඳගෙන ආපු එක්කෙනෙක්ව එයා යම් දෙයක් රවින්ද්‍රන්ට කිව්වායි කියලා ඇන්ටනිට රවින්ද්‍රන් එදා කිව්වානේ ?

උ ඔව්

ප්‍ර මොනවා කිව්වායි කියලද කිව්වේ

උ එයා CID office එකේ ඉදලා එනකොටම කිව්වා අපි යනකොට සාරාව දැක්කා අබුබකර් මහත්තය pickup ඉන්න එක දැක්කා කියලා අපි කටඋත්තර දිලා තියෙන්නේ ඒ කට උත්තරය දෙන්න තමයි එන්න කියලා මේ ලියුමේ ලියලා තියෙනවා කියලා තියෙනවා. ඒක කියන්න යනකොට මෙයා කිව්වාලු මේ මහත්තයා කියලා තියෙන්නේ ඒක නෙවෙයි මෙයාට ඇහුවාලු ඉස්සෙල්ලා ඔයාට ලියන්න කියවන්න පුලුවන්ද කියලා .මෙයා කිව්වාලු ඒවා දන්නේ නැහැ මට අත්සන් කරන්න විතරයි දන්නෙ කියලා .ඊට පස්සේ කිව්වාලු එයාගේ පවුලේ කට්ටියගේ විස්තර ඔක්කොම අහගෙන මෙයාම ලියාගෙන ගියා කියලා මෙයා කිව්වේ රවින්ද්‍රන් කිව්වා මට ලියාගෙන කිව්වාලු ඔයා මේකට අත්සන් කරන්න කියලා මෙයා අත්සන් කරාලු කිව්වාලු 5 වෙනිදා කල්මුනේට දාලා තියෙන්නේ කේස් එක මම තමයි එන්නේ මම ඒ කේස් එක

Proofread Sinhala Copy
FAIR COMMENT BY JEZEEM

බලාගන්නම් ඔයාට මොකුත් වෙන්නේ නැහැ ඔයා මේක දැක්කේ නෑ මේ සීන් එක වෙන්නේ නෑ අපි බොරු කිව්වේ කියලා විතරක් කියන්න.

ප ඒ කියන්නේ සාරාව දැක්කේ නැහැ කියලා බොරු කියන්න කියලා

උ බොරු කියන්න කියලා කිව්වාලු මෙයා ඒ වෙලාවේම එළියට ඇවිල්ලා මට කිව්වා.

ප එහෙම කියලා තියෙන්නේ අර සුදු පාට ෂර්ට් එකක් ඇදලා 5 වෙනිදා කල්මුනේ උසාවියේ දැක්ක එක්කෙනා කියලද රවින්ද්‍රන් ඇන්ටනි මහත්තයාට පෙන්නලා කිව්වේ?

උ කිව්වේ ඔව් එතන කල්මුනේ උසාවියේ මෙයාට එලියට එන්න කියලා කතාකරපු මහත්තයා අර සුදුපාට එක ඇඳගෙන හිටිය මහත්තයා තමයි කිව්වේ කියලා මට පෙන්නුවා එතකොට මම දැනගත්තා මේ මගේ ගෙදර ඉස්සෙල්ලා වීරසිංහ මහත්තයයි අර මහත්තයයි ආවේ මට කටඋත්තර ගන්න ඒ මහත්තයා කියලා දැනගත්තා මං

ප ඒ මොකද කලින් අඳුනගෙන තිබ්බ හින්දා?

උ ඔව් දන්නවා මෙයා අපේ ගෙදර ආවා

ප නමුත් නම දන්නවාද ඇන්ටනි ඒ මහත්තයාගේ?

උ නම දන්නෙ නැහැ මිස්

ප දැක්කොත් අඳුනන්න පුලුවන්ද?

උ ඔව් දැක්කොත් අඳුනන්න පුලුවන්.

ප එතකොට තව රවින්ද්‍රන්ගෙන් ඇහුවායි කියලා කිව්වා lawyer කෙනෙක් අල්ලලා තියෙනවාද අල්ලගන්න සල්ලි දෙන්නම් කියලා කිව්වද?

උ එහෙම කියලා මෙයා කිව්වා රවින්ද්‍රන් කිව්වා මට.

ප කවුද එහෙම කියලා තියෙන්නේ රවින්ද්‍රන්ට?

උ අර සුදුපාට ඇඳගෙන ඉන්න මහත්තයා සුදුපාට ෂර්ට් එක ඇඳගෙන ඉන්න මෙයාට මෙහෙම කියන්න එපා කියලා බොරු කියන්න කියලා කියපු මහත්තයා එයා තමයි කතා කලේ මෙහෙ එන්න කියලා කතා කලා ඇතුලේ හිටපු රවින්ද්‍රන්ට. කතා කරලා කිව්වා මෙයාත් එක්ක කතා කලා එලියේ ඉද්දි .ඊට පස්සේ හරි වාඩිවෙන්න කියලා ගියා මහත්තයලා ගියාට පස්සේ තමා මං මෙයාට කතා කරලා මොකක්ද කිව්වේ කියලා ඇහුවා. ඇහුවායින් පස්සේ තමයි මෙයා කිව්වේ මේ lawyer කෙනෙක් අල්ල ගත්තද නැත්නම් සල්ලි දෙන්නද කියලා කිව්වාලු ඊට පස්සේ රවින්ද්‍රන් කියලා තියෙන්නේ නැහැ අපි lawyer අල්ලලා තියෙනවා කියලා කියලා මට කිව්වා අර මගෙත් එක්ක කතාකරන අර සුදුපාට ෂර්ට් එක ඇඳගෙන යන මහත්තයා තමයි මට මෙහෙම බොරු කියන්න දැක්කෙ නැහැ කියලා කියන්න කිවේ මහත්තයා කියල මට කිව්වා

ප 2020 සැප්තැම්බර් මාසේ 28 වෙනිදා **CID** එකට ගියාට පස්සේ 2020 ඔක්තෝම්බර් 05 වෙනිදා කල්මුණේ උසාවියට යන්න ඉස්සරවෙලා ඔය

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කාලය ඇතුලත දී රවින්ද්‍රන්ට CID එකෙන් කවුරු හරි කෝල් කරා කියලා ඇන්ටනිට දැනගන්න හම්බවුනාද

උ ඔව්

ප්‍ර කොහොමද දැනගත්තේ?

උ 5 වෙනිදා අපි උසාවියට යන්න ඕන 4 වෙනිදා දවල්අපේ ගෙදරට ආවා. 4.00ට වගේ එනවා හවස බඩු ගන්න යන්න

ප්‍ර කවුද

උ රවින්ද්‍රන් 4.00ට විතර ඇවිල්ලා හවස ගිහිල්ලා අපි මිරිස් බටු එහෙම ගන්න හවස යනවා කොටුවලට. උදේ පාන්දර යන්නේ බණ්ඩක්කායි, මැකරලුයි, ගන්න තමා යන්නේ එතකොට හවස ඇවිල්ලා කිව්වා මේ නම්බර් එකට කෝල් ඇවිල්ලා මට කතා කලා අර මට මේ බොරු කියන්න කියපු මහත්තයා කතා කරලා කිව්වා කොහෙද ඉන්නේ කොහොමද හොඳින් ඉන්නවාද කියලා හෙට එන්න ඕනේ කතා කරා කියලා මට ෆෝන් එකෙන් නම්බර් එක පෙන්නුවා පෙන්නලා කිව්වා හරි මෙහෙම කතා කලා කියලා කිව්වා එතකොට අර නම්බරෙත් මම ලියාගත්තා. ලියාගෙන ඊට පස්සෙත් මෙයා මේ බඩු ඔක්කොම අරගෙන ගෙදර ගියා ගිහිල්ලා ඇ 8.30 9.00ට වගේ ආපහු මෙයත් එක්ක කතාකරලා තියෙන්නේ අරයා කෝල් අරගෙන අර නම්බරයම අරගෙන කතා කරලා තියෙන්නේ කොහොමද කෑවද බීවද කියලා අහලා කියලා තියෙන්නේ එහෙනම් මතක තියාගන්න හෙට උදේ ඇවිල්ලා ඒ විදියට කියන්න කියලා කිව්වාලු කීව්වායින් පස්සේ ඒ වෙලාවෙම මට කෝල් අරන් රවින්ද්‍රන් කිව්වා මෙහෙම කියනවා එයා කෝල් කරලා කියනවා මචං කියලා කියනවා කියලා කිව්වා කිව්වායින් පස්සේ මම කිව්වා කමක් නැහැ උදේ එන්න ඒක බලාගමු කියලා මම අර ෆෝන් එක අරගෙන බැලුවා ආපු වෙලාව ඔක්කොම තිබ්බා ඒ නම්බර්ය අරගෙන මම ඒක ඔක්කොම බාරදිලා තියෙන්නේ මෙහෙට ඊට පස්සේ

ප්‍ර එතකොට ඒක දැක්කොත් නැවත හඳුනන්න පුලුවන්ද?

උ පුලුවන්.

ප්‍ර ඒ තියෙන්නේ ඇන්ටනිගේ අත් අකුරින්ද ඒ telephone numbers ලියලා තියෙන්නේ?

උ නැහැ නැහැ අර ලියුම ලියපු එක්කෙනාට කියලා තමයි ඒක ලියාගත්තේ.

ප්‍ර ඒ කියන්නේ දෙමළෙන් ලියපු එක්කෙනාද සිංහලෙන් ලියපු එක්කෙනාද?

උ දෙමළෙන් ලියපු එක්කෙනා.

ප්‍ර එයාට කියලා අර ටෙලිෆෝන් එකේ මේ CID officer කතා කරපු වෙලාවල් ලියාගත්තද?

උ ඔව්

ප්‍ර දිනත් ලියාගත්තාද?

Project Court Copy
FAIR COMMENT BY JEZEEM

උ ඔව් දිනත් ලියාගත්තා මේක තමයි ලියාගත්ත එක

ස්වාමිනි සාක්ෂිකරු විසින් මෙම සාක්ෂිය RS 03 ලේඛනය පාවිච්චි කර බැලීමෙන් අනතුරුව දුන් බව ගෞරවයෙන් අවධානයට යොමු කරනවා.

ප්‍ර එතකොට කොයි වෙලාවක හරි රවින්ද්‍රන් කල්මුනේ මහෙස්ත්‍රාත්තුමාව හම්බවෙන්න ගියාද එදා? judge හම්බවෙන්න ගියාද ?

උ judge නෙවෙයි මිස්

ප්‍ර Magistrate ?

උ ඔව් lawyer හම්බවෙන්න ගියේ මායි එයයි මේක ෆෝන් නම්බර් අරගෙන අපි 5 වෙනිදා උසාවියට ඇවිල්ලා lawyer මහත්තයා හම්බවෙලා කතාකරලා අයේ ඊට පස්සේන් ගිහිල්ලා CID මහත්තයලා ඇවිල්ලා කතාකරලා ගියායින් පස්සේ මෙයාගේ නම කියලා අංකය කියලා කතා කලා උසාවියට ඕපන් කෝට් ඉඳගෙන කතාකලා

ප්‍ර මෙයා කියන්නේ රවින්ද්‍රන්ට ?

උ රවින්ද්‍රන්ට කතාකරලා open hall එකට කතා කරලා අපේ lawyer මහත්තයයි CID වීරසිංහ මහත්තයයි CID වීරසිංහ මහත්තයාත් එක්ක ආපු අනිත් මහත්තයයි දෙන්නමයි අපේ ලෝයරුයි ඉස්සරහට ඉඳලා judge මහත්තයාත් එක්ක කතා කලා. කතා කරපු එක මට ඇහුනේ නැහැ මම එලියේ සිටියේ ඊට පස්සේ එයා ෆයිල් එක මේ පැත්තෙන් තිබ්බා මෙයා ඇවිල්ලා වාඩිවෙලා හිටියා රවින්ද්‍රන් lawyer එළියේ ඇවිල්ලා මට කිව්වා ඇතුලේ කාමරේට පස්සේ කතා කරන්නම් කියලා judge මහත්තයා කියලා තියෙනවා කියලා.

ප්‍ර කාටද කියලා තියෙන්නේ ඇතුලේ කාමරයට කතා කරන්නම් කියලා?

උ එතනින් කිව්වලු lawyerට කිව්වා කියලා අතනින් කියලා තියෙන්නේ ඉස්සරහ .

ප්‍ර දැන් උසාවිය ඇතුලේ ඉන්නේ රවින්ද්‍රන්නේ?

උ ඔව්.

ප්‍ර එතකොට judge කාමරයට කතා කරන්නම් කියලා තියෙන්නේ කාවද රවින්ද්‍රන්වද?

උ ඔව් රවින්ද්‍රන්ට පස්සේ කතා කරන්නම් කියලා කිව්වා කියලා lawyer මහත්තයා ඇවිල්ලා මට කිව්වා මං ඇහුවයින් පස්සේ කිව්වා පස්සේ කතා කරන්නම් කියලා තියෙන්නේ කියලා.

ප්‍ර ඊට පස්සේ කොයි වෙලාවක හරි රවින්ද්‍රන්ව ඒ කාමරය ඇතුලට ගත්තද judge?

President's Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

උ ඔව් තව පොඩ්ඩ වෙලාවකින් අපේ ගෝලයා රවින්ද්‍රනුයි, අපේ lawyer, CID මහත්තයාලා දෙන්නයි විරසිංහ මහත්තයයි එයත් එක්ක ආපු 4 දෙනාම කාමරය ඇතුලට අරගෙන කටඋත්තරය අරන්තියෙන්නේ.

ප්‍ර ඔය සුදු ෂර්ට් එකක් ඇඳලා කල්මුනේ උසාවියේ 5 වෙනිදා දැක්කායි කියන ඒ CID මහත්තයාට දෙමළ පුලුවන්ද ඇන්ටනිගේ ගෙදර ආව කිව්වානේ?

උ ඔව් අපේ ගෙදරටත් ඇවිල්ලා කටඋත්තර ගන්නකොට මෙයා දෙමළෙන් තමයි මගේ කටඋත්තරය ගත්තේ දෙමළෙන් අහලා තමයි කටඋත්තරය ලියා ගත්තේ ලිව්වේ සිංහලෙන් මෙයා දෙමළෙන් අහගත්තා මට

ප්‍ර දැන් රවින්ද්‍රන්ට උසාවියට ගිහිල්ලා judge හම්බවෙලා කියනකොට අර ප්‍රකාශයක් දෙන්න කියලා කිව්වානේ එතකොට ඇන්ටනි කිව්වාද CID එකේදි රවින්ද්‍රන්ට තර්ජනය කරපු එක ,ඒ කියන්නේ ඔයා මෙහෙම වැරදි දෙයක් කියන්න සීන් එක දැක්කේ නැහැ කියලා කියන්න ඔයා එහෙම කිව්වොත් ඔයාට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ එහෙම නැතිවුනොත් ඔයාගේ පවුලේ අයට කරදර වෙනවා කියලා CID එකේ මහත්තයා කිව්වයි කියන එක judgeට කියන්න කියලා ඇන්ටනී රවින්ද්‍රන්ට උපදෙස් එහෙම දුන්නාද?

උ ඔව් මම උසාවියේ ඉද්දී කිව්වා එහෙනම් judge මහත්තයා ඇතුලට කතා කෙරුවොත් ඔයා එහෙන් ඔයාව බය කෙරුවා කියලා මෙයාව කියලා පෙන්නලා කියන්න කියලා කිව්වා මම

ප්‍ර පෙන්නලා කියන්න කියලා කිව්වා

උ ඔව් මෙයා තමයි කියලා පෙන්නලා කියන්න කියලා කිව්වා කියලා තමයි යැව්වේ

මින්පසු සටහන්ගැනිම ල/ලේ චන්දිමා.

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව :ප.ව 3.50
පෙර සටහන් :ල/ලේ යමුනා මිය.
මෙතැන් සිට :ල/ලේ චන්දිමා දිල්හානි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති අයෝෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: එතකොට දැන් ඇතුලට ගිහිල්ලා ටිකක් වෙලා ගියාද ආපහු එන්න රවින්ද්‍රන්ට ?

පි: ඔව් ටිකක් වෙලා ගියාට පස්සේ ඔක්කෝමලා එළියට එකපාරට ආවා.

ප්‍ර: එළියට ආවාට පස්සේ රවින්ද්‍රන් නැවත ඇන්ටනිට මුණ ගැහුනානේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට කථා කරාද ඔය දෙන්නා ?

පි: ඔව් මම ඇහුවා රවින්ද්‍රන්ට හරිද ඔක්කෝම කිව්වාද Judge ට කියලා. එයා කිව්වා අපි මේ දැකපු එක කියලා තියෙන්නේ අයියා.

ප්‍ර: සාරාව දැක්ක එක කිව්වා?

පි: දැක්ක එක කිව්වා කියලා එතකොට එයාලා ඔයා බයකරපු එක කිව්වේ නැද්ද කියලා ඇහුවාම එයා කිව්වා එයා අර මේයාව බයකරපු මහත්තයා ඔරවලා බැලුවලු බලලා තියෙන්නේ ඒ බයට කිව්වේ නැහැ කියලා ඊට පස්සේ මම බැන්නා මෙයාට.

ප්‍ර: කාටද බැන්නේ ?

පි: රවින්ද්‍රන්ට බැන්නා.

ප්‍ර: ඇයි බැන්නේ ?

පි: ඔයා ඇයි එහෙම කිව්වේ නැත්තේ ඔයා ඇයි එහෙම Judge කිව්වේ නැත්තේ ඒක විතරක් කියලා තියෙනවා කියලා මං බැන්නා.

ප්‍ර: එතකොට දැන් ඔය රවින්ද්‍රන් බය හින්දා තමයි එතකොට කියලා නැත්තේ?

පි: එයා කිව්වා මට බයයි ඒ කට්ටිය ආවා මෙයා බලාගෙන හිටියලු අර බයකරපු මහත්මයා මෙයාවම බලාගෙන මෙහෙම ඇස් දෙක මෙහෙම බයකරලා තියෙන්නේ එතන ඒක නිසා තමා මං කිව්වේ නැහැ කියලා මේයා කිව්වා.

ප්‍ර: හරි එතකොට එය Judge ව හම්බවෙලා හම්බිලා ආවට පස්සේ පස්වෙනිදා නැවත රවින්ද්‍රන්ට උසාවියට යන්න කියලා එහෙම කවුරුහරි කියලා තියෙනවද?

පි: නැවත එන මේ මාසේ 19 වෙනිදා .

ප්‍ර: ඒ කියන්නේ අනිද්දා?

පි: ඔව් අනිද්ද සඳුදා එන සඳුදා 19 එන්න කියලා මෙයාලා අවායින් පස්සේ ලෝයර් කිව්වා 19 අපහු එන්න කියලා තියෙන්නේ 19 එන්න කියලා.

ප්‍ර: දැන් මොකටද එන්න කියලා තියෙන්නේ ?

පි: ඒක කිව්වේ නැහැ .

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔය කියලා තියෙන්නේ උසාවියේ Judge නෙමෙයි එතන ඉන්න මුඩ්ලියර් නෙමේ?

පි: නැහැ.

ප්‍ර: ඒක කියලා තියෙන්නේ ලෝයර් මහත්මයා?

පි: ලෝයර් මහත්මයා තමයි කිව්වේ.

ප්‍ර: හේතුවක් හැබැයි කියලා නැහැ?

පි: කියලා නැහැ.

ප්‍ර: දැන් රවීන්ද්‍රන් කැමතිද යන්න උසාවියට ?

පි: නැහැ එයා එහේ යන්න කැම ති වෙන්නේ නැහැ. ඒක හැමදාම එයාලාගේ ගෙදර ප්‍රශ්න තියෙන්නේ .

ප්‍ර: මොනවද මේ ප්‍රශ්න කියන එක ගරු කොමසාරිස්වරුන්ට කියන්නකෝ?

පි: ඔව් ස්වාමිනි එයා මාර දුප්පත් එක්කෙනෙක් එයාගේ තාත්තාටත් බැහැ ඇවිදින්න . එයාගේ පවුලත් කුලි වැඩට යන්නේ , ඒ හින්දා එයා මේ පොලිසි කට්ටිය මේ ලියුම් අරවා මේවා ආවාට පස්සේ අහල පහල ඉන්න කට්ටිය ඇවිල්ලා අහනවලු ගෙදර මොකද ගෙදර මොකද ආවේ එහෙම කියලා ඇයි අර සාරා එයාලාගේ ගෙදර තියෙන පාරේ ඉදපු නිසා ඒ සාරාට ඒ ඔක්කෝම ඥාති කට්ටිය.

ප්‍ර: ඥාති අය ඉන්නේ ඒ කියන්නේ කාගේ ඥාතිද?

පි: මේ සාරාගේ ඥාති.

ප්‍ර: සාරාගේ ඥාති ඉන්නේ ඒ කියන්නේ රවින්ද්‍රන්ගේ ගෙදර කිට්ටුව ඉන්නේ සාරාගේ ඥාති අය?

පි: ඥාති අය එතකොට ඒ කට්ටිය ඇවිල්ලා අහනවලු මොකටද පොලිසිය එන්නේ මොකටද CID එන්න කිව්වේ මේ ලියු CID එකෙන් ලියුම ගියාට පස්සෙත්ගිහිල්ලා කට්ටිය ඔක්කෝම ඇහුවලු මේ මොකටද මේ ලියුම CID එකට එන්න කියලාඇවිල්ලා තියෙන්නේ මොකද මොකද කියලා අහනවා කියලා ගෙදරත් රංඩුලු. හැමදාම ඊටපස්සේ මේ මෙයා ඇවිල්ලා අඩනවා මං බෙල්ලදලා මැරෙනවා අරවා මේවා කියලා එහෙම අරයා හේයා කියලා මෙයා ඇවිල්ලා මට කියනවා . මං කියනවා එහෙම පිස්සු වැඩ කරන්න එහෙම කරන්නේ නැතිව ඉන්න කියලා මෙයාටත් බයයි පවුලටත් බයයි. පවුලට හාට් ප්‍රොබ්ලම් තියෙන්නේ ඊට පස්සේ ජනාධිපති කොමිෂන් එකෙන් එදා 16 වෙනිදා කරනවා ලියුමක් ආවා මටයි රවින්ද්‍රටයි එදා එයාගේ පවුල වස බොන්න ගියා . වස බොන්න ගිහින්

ප්‍ර: ඒ කියන්නේ ජනාධිපති කොමිෂමට එන්න කියලා ලියුමක් ආපු වෙලාවේ දී රවින්ද්‍රන්ගේ පවුල වස බොන්න ගියා. ඇයි ඒ?

පි; මේ සම්බන්ධ එකකට මොකට ද ගියේ . මේ කට්ටිය දැනගත්තොත් අපිවත් මරලා දානවානේ අරවා මේවා කියලා මෙයාට බැනලා මේ වස බොන්න ගියාලු. ඊට පස්සේ මං තමයි කිව්වේ ඒකේ ප්‍රශ්නයක් නැහැ අපි එකපාරටම ගිහිල්ලා කියලා ආයේ මෙහෙම වෙන්නැතිව අපි කරලා

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එන්නම් මේක අපිත් දන්නේ නැතිව කරලා තියෙන්නේ වැඩ අපිට සාක්ෂි කියන්න ගිහිල්ලා අපි මේ දැන් මේවාට අස්සාදි වුණා . අපි වැඩ ගිහිල්ලා දවසද් ගානක් අපිත් වැඩට ගිහිල්ලා දැන් දවස් ගානක් ගෙදර ඉදලා එළියට යන්න බැහැ.

ප්‍ර: වැඩට ගිහිල්ලා නෙමේ වැඩට යන්නේ නැතිව දවස් ගානක්?

පි: ඔව් යන්නේ නැති ගෙදර ඉන්නවා බයෙන් ඉන්නවා 6 න් පස්සේ මං එළියට එන්නෙත් නැහැ. මෙයාටත් කියනවා ඔයා යනකොට පරිස්සමින් යන්න අරවා මේවා කියලා බයෙන් ඉන්නේ ගෙදර.

ප්‍ර: දැන් ඇන්ටනිගේ ගෙදර CCTV එහෙම දාලා තියෙනවද?

පි: ඔව් මගේ ගෙදෙර CCTV කැමරා දාලා තියෙන්නේ .

ප්‍ර: ඇයි එහෙම හයි කර ගත්තේ?

පි: මේ බයට තමයි. මේ කට්ටිය ඇවිල්ලා මේවා කරනවා කියලා බයට ෘ එළිවෙනකම් CCTV කැමරා දාලා ඒක බලාගෙනම මං බුදිය ගන්නවා .

ප්‍ර: ඒ මොකද එහෙම කරන්නේ ?

පි: බයට.

ප්‍ර: කවුරු ඇවිල්ලා හානියක් කරයි කියලා බයයිද ?

පි: ඔව් පවුල හැමදාම මට බනිනවා අයැ එහෙම මේ පිස්සු වෙනවා ඔයාට කියලා මට බනිනවා හැමදාම බනිනවා මෙහෙමයි කියලා. මේක දිහා බලාගෙන ඉන්නවා කවුද එන්නේ කවුද එන්නේ කියලා බලාගෙනම ඉන්නවා.නින්ද යන්නේත් නැහැ ගෙදර කන්නෙත් නැහැ පවුල කියනවා ඇයි ඔයා කන්නේ නැත්තේ ඉස්සර වගේ නෙවෙයි දැන් . හිනා වෙන්නෙත් නෑ දරුවලාත් එක්ක සෙල්ලම් කරන්නෙත් නැහැ පිස්සු වගේ මං තනියම ගිහිල්ලා කල්පනා කර ගෙන ඉන්නවා. ඒක පවුලත් මට අහලා බයිනව මෙහෙමයි කියලා.

ප්‍ර: ඒ කියන්නේ ඇන්ටනිගේ හිතේ බයක් තියෙනවද?

පි: මට බයයි තියෙන්නේ මේක මේ අපි දැන් කල්මුණට සාක්ෂි කියන්න ගියා කියලා මේ පත්තරයට දාලා තියෙනවා. ෆේස්බුක් එකට දාලා තියෙනවා.

ප්‍ර: කවුද එහෙම කරලා තියෙන්නේ?

පි: එහේ පඩහුව් කියලා ෆේස් බුක් එකක් තියෙනවා මේ LTTE එයාලාගේ ඒකට දාලා තියෙනවා නම දාන් නැතිව වයස 43 එක්කෙනා මේකට සහරාන් සම්බන්ධයෙන් මේ සහරාන් සම්බන්ධයෙන් කේස් එකට සාක්ෂි කියන්න ඇවිල්ලා තියෙනවා කියලා ෆේස් බුක් එකට දාලා තියෙනවා.

ප්‍ර: එතකොට ඒ කාගේ පින්තූරේද දාලා තියෙන්නේ?

පි ආ මිස්

ප්‍ර: කාගේ පින්තූරයද දාලා තියෙන්නේ ඒ ෆේස් බුක් එකේ සාක්ෂි කියන්න ආවා කියලා ?

FAIR COMMENT
BY JEZEEM

පි: ආවා කියලා නම දැම්මෙත් නැහැ ෆෝටෝ දාලාත් නැහැ නිකම් එහෙම කියලා තියෙන්නේ ඒකත් බලාගෙන ෆේස්බුක් එක මෙයාගේ දුවත් බලලා මෙයාට බැන්නලු.

ප්‍ර: කාගේ දුවද?

පි: මේ ගෝලයා රවින්ද්‍රන්ගේ දුවත් ඒ ෆේස් බුක් එක බලාගෙන පෙන්නුවලු මෙන්න බලන්න ඔයා අද ගියේ කල්මුණට සාක්ෂි කියන්න මේකට මේ එදාම දාලා තියෙන්නේ. මේ ෆේස්බුක් එකට දාලා තියෙන්නේ ඔයා මෙහෙම ඉන්නවාට වැඩිය හොදයි වස බීලා මැරෙන එක අපි ඔක්කෝම එහෙම කරමු කියලා මෙයාගේ දුවත් බැන්නලු .

ප්‍ර: දුවගේ වයස කීයක් වෙනවද?

පි: මෙයාගේ දුවට හරියට දන්නේ නැහැ.

ප්‍ර: ඉස්කෝලේ යනවද රවින්ද්‍රන්ගේ දුව?

පි: A/L කරන්නේ

ප්‍ර: ඉස්කෝලේ යනවනේ තාම ?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන් රවින්ද්‍රන්ගේ ගෙදර නෝනාට පපුවේ අමාරුවක් තියෙනවා කිව්වානේ?

පි පපුවේ අමාරුව කියලා එයත් කිව්වා. රෑත් කෝල් කරා කෝල් කරලා කිව්වා මට මොනවා වගේ තියෙන්නේ ඔයලා තව ඉවර කර ගත්තේ නැද්ද මං කිව්වා මගේ කටුක්කත්තරය තියෙනවා මට ගන්න කියලා කියනවා ඔයා බය වෙන්න එපා කියලා මං කථා කරේ රෑ. හරි හරි ඔයාලා එන කොට අපි ඉන්නවද දන් නෑ කියලා කියලා තිබ්බා ෆෝන් එක.

ප්‍ර: දැන් එතකොට ඔය රවීන්ද්‍රන්ගේ නෝනා සමහර අවස්ථාවලදී ඇන්ටනිගේ ගෙදර ඇවිල්ලා රංඩු කරනවද?

පි: රෑ ඇවිල්ලා රංඩු කරලා තියෙන්නේ පවුලත් එක්ක මේ ඔරොප්පුවෙලා කථා කරලා ගියා කියලා පවුල රෑ මට කෝල් කරලා කිව්වා.

ප්‍ර: ඒ මොනවා සම්බන්ධයෙන් ද රංඩු කරන්නේ?

පි: මේකේ සාක්ෂි කියන්න ආවා කියලා සාක්ෂි කියන්න අපි දෙන්නම ඇවිල්ලා ඉන්නවා මෙහෙම මොකටද මේ කරේ එයාලා නිකම් කියන්නේ නැතිව නිකම් ඉන්න තිබ්බානේ කටවහගෙන කියලා බැනලා ගියාලු එයයි රවින්ද්‍රන්ගේ පවුලයි දුවයි.

ප්‍ර: අර එදා 2019 සැප්තැම්බර් මාසේ සාරාව දැක්කා කියලා කිව්වානේ?

පි: ඔව්.

ප්‍ර: දැන් අපි ෆෝටෝ එකක් පෙන්නුනවා ?

පි: ඔව්

ප්‍ර: ඒ ෆොටෝ එක වගේ කවුරු හරි දැකලා තියෙනවද කියලා කියන්නකෝ?

FAIR COMMENT
BY JEZEEM

පි: හරි. අර යට තියෙන විදියට හිටියා . අර ඉස්සෙල්ලා තියෙන විදියට තමයි එය ඉස්සර පන්තියට යන එන උඩ තියෙන විදියට තමයි පන්තියට යන්නේ එන්නේ. යට තියෙන විදියට තමයි එදා එයා පාරට ඇවිල්ලා හිටියේ.

ප්‍ර: ඒ කියන්නේ මේ Screen එකේ අන්තිමටම තියෙන එකනේ?

C 918 ස්වාමිනි ඉතාම කුඩා ඡායාරූපයක් මේ පුළුල් තිරයේ දැක්වෙන්නේ මේ අවස්ථාවේදී අපේ පරිගණකය ක්‍රියාත්මක කිරීමේ යම් ප්‍රශ්නයක් තියෙන නිසා එය විශාලනය කරන්නට සාක්ෂිකරු එය හදුනා ගන්නවා සාක්ෂි කූඩුවේ සිට ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් ඔහු සාක්ෂි කූඩුවේ සිට අඩි 26 ක් පමණ ඈතින් තිබෙන පුළුල් තිරයේ ඡායාරූප 4ක් ඒ කියන්නේ තිරය වැසෙන පරිදි නෙමේ පරිගණකයක මුහුණත තිබෙන අනෙකුත් ලේඛන අතර ඡායාරූප 04 ක් ඉහල සිට පහලට තිබූ අතර එකී ඡායාරූප විශාල කිරීමට පෙර එම තිබූ තත්ත්වයෙන්ම සාක්ෂිකරු දුටු බව සටහන් කර තබමි. එම ඡායාරූප සාමාන්‍යයෙන් ගමන් බලපත්‍රයකට අවශ්‍ය ප්‍රමාණයේ ඡායාරූපයකටත් වඩා කුඩා පරිගණකයේ icon එකක් වශයෙන් පැවැති ඡායාරූප 4 ක් අතුරින් යටින්ම තිබෙන ඡායාරූපය දුටු විගස එය ඔහු විසින් දන්නා සාරා බවත් ඔහු දුටු දිනයේ දී ඒ ආකාරයට සැරසි සිටි බවත් හඳුනා ගත් බව සටහන් කර තබමි. එසේම ඊට ඉහලින් ඇති ඡායාරූප විශාල කිරීමට පෙර දුටු ගමන්ම ඇය පන්ති යන කාලයේදී ඒ අකාරයට ඇඳගෙන සිටි බව සටහන් කර තබමි. එකී ඡායාරූප C918,C 919 සහ C920 වශයෙන් ලකුණු කර ඇති බව සටහන් කර තබමි. එසේම **C918 දරණ ඡායාරූපය විශාල කර පුළුල් තිරයේ පෙන්නු විට එය සාරා බවත් ඒ ආකාරයෙන් ඇය 2019 සැප්තැම්බර් මාසේ දුටු බවත් සාක්ෂිකරු ප්‍රකාශ කර බවත් සටහන් කර තබමි. මෙම ඡායාරූපය තමා ඊට කුඩා Icon එකක් වශයෙන් පුළුල් තිරයේ සාක්ෂිකරු දුටු ඡායාරූපයම බව සටහන් කර තබමි.**

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති අයෝෂා ජීනසේන මෙනවිය.</u>

ප්‍ර: ඇන්ටනි මහත්මයා දැන් මේ ගරු කොමිෂන් සභාවට දැන් මේ වෙනකොට කියලා තියෙනවා 2019 සැප්තැම්බර් මාසේ සාරාව බීච් රෝඩ් එකේ පාන්දර තුනට, තුන හමාරට විතර දැක්කා කියලා ඒ වගේම ඒ සම්බන්ධයෙන් විමර්ශන කරන ආයතවලට කටඋත්තර දුන්නා කියලත් කිව්වා?

පි: ඔව්.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: ඒ වගේම කිව්වා ඒ කටඋත්තර එහෙම දුන්නාට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඇන්ටනි මහත්මයාගේ ගෝලයා වන රවීන්ද්‍රන්ව ගෙන්නලා ඔහුගේ කට උත්තරයක් ලියා ගන්න අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් ඔහුට මේ සීන් එක දැක්කේ නැහැ. ඒ කියන්නේ සාරාව දැක්කා කියලා මීට ඉස්සර වෙලා දීලා තියෙන කටඋත්තර බොරු කියලා 2020 ඔක්තෝම්බර් මාසේ 05 වෙනිදා කල්මුණේ මහේස්ත්‍රාත් උසාවියට ඇවිල්ලා Judge ප්‍රකාශයක් දෙන්න කියලා උපදෙස් දුන්නා කියලා?

පි: ඔව්.

ප්‍ර: දැන් ඒ ඇතිවුණ සිද්ධීන් නිසා ඇන්ටර්නි මහත්මයාටත් රවින්ද්‍රන්ටත් බයක් ඇතිවෙලා තියෙනවා කියලා පැහැදිලිවම කිව්වා.?

පි: ඔව්.

ප්‍ර: ඒ වගේම රවින්ද්‍රන්ගේ වගේම ඇන්ටනි මහත්මයාගේ ගෙදරත් ඔය ගොල්ලන්ගේ ජීවිත මේ හඳුනා ගැනීම පිළිබඳව සාක්ෂි දීම නිසා ඒවාට විවිධ වෙනස් කම් ඇතිවෙලා දැන් සාමාන්‍යයෙන් අර ජීවත් වෙන විදියට ජීවත් වීමේ අපහසුවක් තියෙනවා කියලත් කිව්වා?

පි: ඔව් .

ප්‍ර: එහෙමනම් ඇන්ටනි මහත්මයා මේ ගරු කොමිෂන් සභාවෙන් මොනවා හරි ඉල්ලීමක් කරනවද?

පි: ඉල්ලීමක් කියන්නේ.

ප්‍ර: මොනවා හරි ඉල්ලනවද?

පි: අපිට මුකුත් එපා මේ අපිට සල්ලි අරවා මේවා මුකුත්ම එපා අපිව බේරන්න මේ කේස් එකට නැතිව .ඒක තමයි අපිට ඕන වෙන්නේ අපිට සල්ලි අරවා මේවා නෙමේ අපේ රට අපි බේරන්න ඕනේ. අපේ රට අපි ආරක්ෂා කරන්න ඕනේ. ඒක නිසා තමයි අපි එළියට ඇවිල්ලා මේක කිව්වේ මේක කියපු නිසා අපිට ගෙදර නිදාගන්න බැහැ. හරිද අපිට කන්න බැහැ , බොන්න බැහැ, හැම තිස්සේම අපි කල්පනා කරගෙන ඉන්නේ ඒක අපිට ඉස්සෙල්ලා හිටපු විදියට ඉන්න අපිට දෙන්න ඒවා ඇති දෙයිනේ කියලා ඒවා ඇති.අනිත් එක මේ මට ඕන වෙලාවක ඕන තැනකින් ඉඳලා ඇවිල්ලා සාක්ෂි කියන්නම් ඒක මං මැරිලා ගියොත් ඒක අවශ්‍ය නැහැ. ඒ මනුස්සයාට බය කරලා එහෙම කරාට පස්සේ මට ගෙරද ඒක තව වැඩි ප්‍රශ්නයක් .

ප්‍ර: ඒ කියන්නේ රවින්ද්‍රන්ව බයකිරීම?

පි: ඒ කියන්නේ රවින්ද්‍රන්ගේ පවුලවල මේ අමාරු කට්ටිය ඒ කට්ටිය නිසා මට හැමදාම ඒක කල්පනා වෙනවා ඒක වෙන පැත්තක්. හැම තිස්සේම තියෙනවා දෙයියන්ගේ පිහිටයි කියලා වැඳලා කියන්නම් මේකේ කේස් එකෙන් අපිව බේරන්න. ඒකට අපිව බේරලා මේවා කරගන්න ඕන වෙලාවකින් කථා කරන්න මං ඇවිල්ලා සාක්ෂි කියන්නම් මාව මොනවා

FAIR COMMENT BY JEZEEM

කෙරුවත් කමක් නැහැ. මාව බේරන්න මට මුකුත්ම එපා. ඒක තමයි කියන්න තියෙන්නේ අවස්ථාව මෙහෙම ඉල්ලන්න.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී සාක්ෂිකරු ඉතා සංවේදිව සාක්ෂි ලබාදුන් බව සටහන් කර තබමි.

ප්‍ර: මේ අවුරුද්දේ ඔක්තෝම්බර් 05 කල්මුණේ උසාවියට ගියා නේද?

පි: ඔව්.

ප්‍ර ඊට පස්සේ අර මේ නීතිඥවරයා ඇවිල්ලා කිව්වා නේද රවින්ද්‍රන්ට පස්සේ නඩුකාරයාගේ කාමරයට කථා කරනවා කියලා?

පි: ඔව්.

ප්‍ර: රවින්ද්‍රන් ඒ නඩුකාරයාගේ කාමරයට යනවා දැක්කද පස්සේ?

පි: ඔව් දැක්කා මං යනවා.

ප්‍ර: කවුද ඒ වෙලාවේ කාමරය ඇතුලට ගියේ රවින්ද්‍රන් එක්ක ?

පි: ඒක අර CID වීරසිංහ මහත්තයයි එයත් එක්ක ආපු අර සුදු පාට shirt එක ඇඳගෙන ආපු මහත්මයා මේ අපේ ගෙදර ආපු මහත්තයාලා දෙන්නයි අපේ, ගෝලයා රවින්ද්‍රනුයි අපේ අපිලා අල්ලගෙන ඉන්න ලෝයර් මහත්මයි. ඒ හතර දෙනාම ගියේ.

ප්‍ර: ඒ හතර දෙනා ගිහිල්ලා ඉස්සෙල්ලා කාමරයෙන් එළියට ආවේ කවුද?

පි: 04 දෙනාම එකටම ආවා.

ප්‍ර: කොච්චර වෙලාවකට පස්සේ ද හතර දෙනාම එළියට ආවේ?

පි: ඒක හරියට කියන්න බැහැ පොඩ්ඩ වෙලාවකින් ආවා. පැය භාගයයි හතලිස් පහෙන් වගේ ආවා එළියට.

ප්‍ර: හොඳටම විශ්වාසද හතර දෙනාම එකට ඇතුලට ගිහිල්ලා හතර දෙනාම තමයි එකට එළියට ආවේ කියලා?

පි: එකට ආවේ. මම බලාගෙන හිටියා .

ප්‍ර: රවින්ද්‍රන්ව තියාගෙන අනිත් අය එළියට ආවේ නැද්ද ?

පි: නෑ නෑ එහෙම ආවේ නැහැ 4 දෙනාම ඉස්සෙල්ලා CID මහත්මයලා ආවා ඊට පස්සේ ලෝයර් මහත්මයා ආවා ඊට පස්සේන් රවින්ද්‍රන් ආවා. ඒ වෙලාමයි එළියට ආවේ 4 දෙනාම .

ප්‍ර: 4 දෙනාම එකටම ද ආවේ?

පි: ඔව්. එකට ආවා එළියට.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඒ නීතිඥ මහත්මයාට මුදල් ගෙව්වේ කවුද ?

පි: මුදල් ගෙව්වේ රවින්ද්‍රන්.

ප්‍ර: රවින්ද්‍රන්ද ගෙව්වේ?

Presidential Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි: ඔව්.

ප්‍ර: එදා නඩුකාරතුමා වශයෙන් හිටියේ හැමදාම ඉන්න නඩුකාරතුමාද ?

පි: තේරුමක් නැහැ.

ප්‍ර: හැමදාම උසාවියේ වැඩ කරන නඩුකාරතුමාද එදා හිටියේ?

පි: ඒක මම ගිහිල්ලා නැහැ උසාවියට එදා තමයි ඉස්සෙල්ලාම ගියේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂිය හේතුවෙන් ඔහුට 2015 අංක 4 දරණ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 25 (4) උපවගන්තිය ප්‍රකාරව ලැබිය යුතු සියලු අයිතීන් සහ වරප්‍රසාදයන් ලබා දෙන ලෙසට අපරාධයක වින්දියතන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.

කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන්නේ ඒ සඳහා ලිපි දෙකක් සකස් කර එකක් එම ජාතික අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ආමන්ත්‍රණය කල යුතු බවත්, එහි පිටපතක් සාක්ෂිකරුගේ නමට සැදීය යුතු බවත්, එම ලේඛනයේ මුල් පිටපත මෙන්ම සාක්ෂිකරුගේ ලේඛනද යන ලේඛන 02 ම සාක්ෂිකරුට ලබා දිය යුතු බවත්, ඔහුට අවශ්‍ය වූ විටක පමණක් එම ලේඛනය භාවිතා කළ හැකි වන පරිදි ඒ ආකාරයට සකස් කළයුතු බවයි.

සාක්ෂිකරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දීම සඳහා මඩකලපුවේ සිට පැමිණ ඇති බැවින් නීතියට අනුව ඔහුට හිමිවිය යුතු සියලු දීමනා ලබා දෙන ලෙසට ද කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

සාක්ෂි කරු මුදා හරිමි.

දැන් වේලාව : ප.ව 4.20

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President's Counsel Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020. 10.19 වේලාව :- ප.ව 6.10

සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධී නිතීඥ සංජීව දිසානායක මහතා, ,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, රජයේ අධි නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා ,රජයේ අධි නිතීඥ චතුරංග බණ්ඩාර මහතා , සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනි සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් දුනික පෙරේරා,සමඟ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය මාධ්‍ය නොමැතිව අප්‍රසිද්ධියේ ලබා ගන්නා බව සටහන් කර තබමි.

සම්පූර්ණ නම් : වලිසුන්දර මුදියන්සේලාගේ හිමාලි ඉන්දිකා කුමාරි සමරකෝන්
වයස : අවුරුදු 44
ආගම : බෞද්ධ
ජාතිය : සිංහල
රැකියව : කාන්තා ප්‍රධාන පොලිස් පරික්ෂක
ලිපිනය : රාජ්‍ය බුද්ධි සේවය
ප්‍රතිඥා පිට සාක්ෂියට කැඳවයි

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහත්මයා</u>

ප්‍ර: මීට පෙර ඔබ සාක්ෂි ලබා දීලා තියෙනවද?
පි: ප්‍රථම අවස්ථාව ස්වාමිනි.
ප්‍ර: සාක්ෂිකාරිය ඔබ 1997 පෙබරවාරි මාසේ 01 වෙනිදා 97 ශ්‍රී ලංකා පොලිස් සේවයට සම්බන්ධ වුණා කියලා කිව්වොත් ඒක හරිද?
පි: නිවැරදියි ස්වාමිනි
ප්‍ර: ඔබ ශ්‍රී ලංකා පොලිස් සේවයට සම්බන්ධ වෙන්නේ කාන්තා ආධුනික උප පොලිස් පරික්ෂකවරියක් ලෙස ?
පි නිවැරදියි ස්වාමිනි.
ප්‍ර: ඔබ විශේෂයෙන් මා ඔබව සම්බන්ධ කරගන්නේ ශ්‍රී ලංකා පොලීසියට ශ්‍රී ලංකා පොලීසියේ රාජ්‍ය බුද්ධි සේවාව වෙනුවෙන් කිව්වොත් එකත් නිවැරදියිද?
පි නිවැරදියි එවකට ජාතික රහස් තොරතුරු කාර්යංශය
ප්‍ර: NIB
පි NIB
ප්‍ර: ඒ 97 .02.01 වෙනිදා පෙබරවාරි 01 වෙනිදා ශ්‍රී ලංකා පොලිසියට ඔබ සම්බන්ධ වෙලා ඔබේ පුහුණුව වසර 06 පමණ පුහුණු කාලෙන් පසුව ඔබ රාජ්‍ය බුද්ධි සේවයට සම්බන්ධ වෙනවා කිව්වොත් හරිද?
පි ස්වාමිනි මාස 08 ක පුහුණුවෙන් පසුව මා අනුයුක්ත කරේ වවුනියාව මුලස්ථාන පොලීසියට ඉන්පසු මාස 04 ක් වගේ වවුනියා ප්‍රදේශයේ රාජකාරි කරලා 98 ජනවාරි මාසේ සිට තමයි ජාතික රහස් තොරතුරු කාර්යාංශයේ රාජකාරි සඳහා වාර්තා කරේ ස්වාමිනි.
ප්‍ර: ජාතික රහස් තොරතුරු කාර්යංශය කියන්නේ වර්තමානයේ රාජ්‍ය බුද්ධි සේවය?
පි එහෙමයි ස්වාමිනි හරි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ උප පොලිස් පරීක්ෂකවරියක් ලෙස ශ්‍රී ලංකා පොලිසියට සම්බන්ධ වුණාට පසුව ඔබගේ ඔබ පොලිස් පරීක්ෂකවරියක් ලෙස ඔබ උසස් වීමක් ලබනවද ?

පි ස්වාමිනි පොලිස් පරීක්ෂක වරියක් ලෙස උසස් වීම් ලබනවා 2003. ජනවාරි. 01.

ප්‍ර: ඉන් අනතුරුව තිබෙන උසස් වීම් තමයි ප්‍රධාන පොලිස් පරීක්ෂවරිය ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඔබ වර්තමානයේ දරන එම තනතුරට උසස් වීම ලබන්නේ කවද්ද ?

පි 2019.07.01 දින සිට ස්වාමිනි.

ප්‍ර: 1998 ජනවාරි මාසේ සිට මේ වසර 22 ක පමණ කාලයක් ඔබ ඔබේ සේවය ඔබ ලබා දුන්නේ රාජ්‍ය බුද්ධි සේවයට?

පි නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා වශයෙන් සිටින්නේ අධ්‍යක්ෂකවරයා කියලා කිව්වොත් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක කිව්වොත් නිවැරදියිද?

පි නිවැරදියි ස්වාමිනි

ප්‍ර : ඔබ මේ වර්ථමානයේ ඒ රාජ්‍ය බුද්ධි සේවයේ කුමන අංශයකට අනුයුක්තවද සේවය කරන්නේ?

පි ස්වාමිනි මම වර්තමානයේ අධ්‍යක්ෂක කාර්යාලයට අනුයුක්තව සේවය කරනවා.

ප්‍ර: අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයට අනුයුක්තව ?

පි එහෙමයි ස්වාමිනි

ප්‍ර: ඒ අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලේ ඔබට යම් තනතුරක් ඔබ හොබවනවද?

පි ස්වාමිනි මම අධ්‍යක්ෂ කාර්යාලයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කරනවා.

ප්‍ර: ඔබ ප්‍රථමයෙන්ම ඔබගේ මේ සේවා කාලය තුළ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයේ ස්ථානිධිපතිවරිය බවට පත් වුණේ කොයි කාලේද කියලා මතකයක් තියෙනවද?

පි 2012 වර්ෂයේ මැයි මස පමණ විට ස්වාමිනි මම අධ්‍යක්ෂක කාර්යාලයේ ස්ථානාධිපති ලෙස සේවය කරනවා.

ප්‍ර: 2012?

පි 2012 වර්ෂයේ තමයි ස්වාමිනි මම අධ්‍යක්ෂක කාර්යාලයට අනුයුක්ත වෙන්නේ

ප්‍ර: ස්ථානාධිපතිවරිය වශයෙන් පත්වෙන්නේ 2014 වගේ කියලා කිව්වොත් හරිද?

පි මම ලේඛන පරීක්ෂා කරන්න අවසර ස්වාමිනි 2014 වර්ෂයේ සිට ස්ථානාධිපති වශයෙන් කටයුතු කරනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ අඛණ්ඩව දැන් ඔබ වසර 06 ක් පමණ අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයේ ස්ථානාධිපතිනිය වශයෙන් තමයි කටයුතු කරන්නේ ?

පි නිවැරදියි ස්වාමිනි

ප්‍ර: දැන් සාක්ෂිකාරිය මේ අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයෙන් සිදුවන යම් විශේෂිත වැඩකොටසක් තියෙනවද ?

පි අධ්‍යක්ෂක කාර්යාලයෙන් සිදුවන වැඩකොටසක් තියෙනවා ස්වාමිනි

ප්‍ර: ඔබට ඒවා 1,2,3,4 කියලා පැහැදිලි කිරීමට හැකියාවක් තියෙනවද?

පි පුළුවන් ස්වාමිනි

ප්‍ර: කරුණාකරලා ප්‍රකාශ කරන්න මොනවද කර්තව්‍යන් කියලා?

පි බොහෝ වේලාවට ස්වාමිනි අධ්‍යක්ෂක කාර්යාලය වෙත භාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන ලිපි ලේඛන දුරකථන පණිවිඩ ආදිය නිසි ලෙස සම්බන්ධීකරණය කරනවා සම්බන්ධීකරණය කිරීමක් අධ්‍යක්ෂ කාර්යාලයෙන් සිදුවෙනවා. ඊට අමතරව අධ්‍යක්ෂ කාර්යාලය වෙත ලැබෙන ලිපි අධ්‍යක්ෂකතුමාගේ පරීක්ෂාවෙන් අනතුරුව එතුමාගේ උපදෙස් අනුව අදාල අංශ වෙත යොමු කිරීම සිදුවෙනවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ස්වාමිනි. ඊට අමතරව ආයතනයේ විවිධ අංශවලින් ලැබෙන ලිපි ලේඛන වාර්තා කෙටුම්පත් අධ්‍යක්ෂතුමාගේ අනුමැතියෙන් පස්සේ අවසන් වාර්තාව සකස් කිරීම සිදු කරනු ලබනවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් අධ්‍යක්ෂතුමාගේ අනුමැතිය සහතිව අධ්‍යක්ෂකතුමා සහභාගි වෙන සාකච්ඡා සම්මන්ත්‍රණ සඳහා අවශ්‍ය කරුණු ඒ අදාල අංශවලින් අධ්‍යක්ෂතුමා වෙත ඉදිරිපත් කලාට පස්සේ අධ්‍යක්ෂතුමාගේ අනුමැතිය සහිතව සම්පිණ්ඩයක් කාර්යාලය මඟින් මඟින් සිදු කරනවා වාර්තාවල අධ්‍යයක්ෂතුමා සහභාගිවෙන ආයතනය තුළ සිදුකෙරෙන සාකාච්ඡා සම්න්ත්‍රණ සම්බන්ධීකරණය කරනවා, ඒවාට කැඳවීම් සිදු කරනු ලබනවා, ඒ වගේම විදේශ බුද්ධි නියෝජිත ආයතනවලින් ලැබෙන ලිපි ඒ සාකච්ඡා රැස්වීම් සංවිධානය කිරීම් කරනු ලබනව සහ අංශයක සමාන්‍ය රාජ්‍ය බුද්ධි සේවයේ අංශයක සිදුවෙන පරිපාලන කටයුතු සිදු කරනවා ස්වාමිනි.

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා වෙත ලැබෙන ඔහුගේ ඔහුගේ නමින් එහෙම නැත්නම් ඔහුගේ නිලනාමයෙන් ලැබෙන ලිපි කෙලින්ම අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයාට ලැබෙනවද නැත්නම් වෙනත් මාර්ගයකින් ද කාර්යාලය වෙත ලැබෙන්නේ?

පි ස්වාමිනි අධ්‍යක්ෂක තනතුරට හෝ නාමයට ලැබෙන සියලුම ලිපි රාජ්‍ය බුද්ධි සේවාවේ පවතින ක්‍රමවේදය අනුව පළමුවම ලැබෙන්නේ ලේඛනාගාරයට එතැනින් ඒ ලේඛනාගාරයේ ඒ ලිපි Inward පස්සේ තමයි අධ්‍යක්ෂ කාර්යාලයට ලිපි රැගෙන එන්නේ ලේඛනාගාරය හරහා තමයි ස්වාමිනි ලිපි රැගෙන එන්නේ අපිට භාර දෙන්නේ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඒ කියන්නෙක් අධ්‍යක්ෂකවරයාගේ නමින් හෝ නිල නාමයෙන් එන සෑම ලිපියක්ම ලේඛනාගාරයයේ ඒ ලේඛන ගත රෙජිස්ට්‍රර්වෙලා inward entry එකක් වශයෙන් ඒ ලේඛන ගත වෙලා තමයි අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයට පැමිණෙන්නේ ?

පි එතනදි ස්වාමිනි අධ්‍යක්ෂකවරයාගේ නමින් තියෙන ලිපි විවෘත කිරීමක් සිදු වෙන්නේ නැහැ ලේඛනාගාරයේ අපිට Seal cover එකක ආවොත් ඒ විදියටම අධ්‍යක්ෂක කාර්යාලය වෙත ලැබෙනවා.

ප්‍ර: අධ්‍යක්ෂකවරයාගේ නමින් එන ලිපි ලේඛනාගාරයෙන් විවෘත කරන්නේ නැහැ?

පි නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: නමුත් නිල නාමයට එන ලිපි ලේඛනාගාරයේදී විවෘත වෙනවද ?

පි නිලනාමයට එන ලිපි විවෘත කරන්න ලේඛනාගාරයට අවසරයක් තියෙනවා ස්වාමිනි

ප්‍ර: ඒ විවෘත කරපු ඒ ලිපි සියල්ලම ඒ කියන්නේ අධ්‍යක්ෂකගේ නිලනාමයෙන් පැමිණෙන ලේඛනගාරය මඟින් විවෘත කරන ලිපි සියල්ලක්ම අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයට ලැබෙනවද ඒ කියන්නේ?

පි අනිවාර්යෙන් ලැබෙනවා ස්වාමිනි.

ප්‍ර: අධ්‍යක්ෂවරයාගේ නමින් පැමිණෙන ලිපි විවෘත කරන්නේ කවුරු විසින්ද?

පි ප්‍රශ්නය නැවතවරක්.

ප්‍ර: අධ්‍යක්ෂකවරයාගේ නමින් ආමන්ත්‍රණය කරන ලිපි ඔබ කියා සිටියානේ ලේඛනාගාරයෙන් විවෘත කරන්නේ නැහැ කියලා හරි එහෙම ලැබෙන ලිපි කවුරු විසින්ද විවෘත කරනු ලබන්නේ?

පි අධ්‍යක්ෂතුමා ඉදිරියේ මා විසින් විවෘත කරනු ලබනවා. අධ්‍යක්ෂතුමාගේ නමින් ලැබෙන ලිපිය ස්වාමිනි

ප්‍ර: ඒ කියන්නේ අධ්‍යක්ෂකවරයාගේ නමින් ලැබෙන සෑම ලිපියක්ම ඔහු ඉදිරියේ ඔබ විසින්ද විවෘත කරනු ලබන්නේ ?

පි මගේ කාර්යාලයේ මගේ සහයට තව නිලධාරීන් පිරිසක් ඉන්නවා මම නැති අවස්ථාවලදී එතන ඉන්න most senior officer අධ්‍යක්ෂකතුමාගේ ළඟට ගිහිල්ලා ඒ ලිපි විවෘත කරනවා.

ප්‍ර: මං ලිපිවලනේ හිටියේ ඒ හා සමානව මා ඒ ප්‍රස්නයට පසුව එන්නම් අධ්‍යක්ෂක කාර්යාලයෙන් එහෙම නැත්නම් අධ්‍යක්ෂකවරයා විසින් යවනු ලබන ලිපි රාජ්‍යය බුද්ධි සේවයෙන් පිටතට යොමු කරනු ලබන්නේ ලේඛනාගාරය හරහාද ?

පි: පිටතට යවනු ලබන සෑම ලිපියක්ම ලේඛනාගාරය හරහා යොමු කරන්නේ ස්වාමිනි

ප්‍ර: දැන් මේ ඔබ ප්‍රකාශ කරේ ලැබෙන සහ යවනු ලබන ලිපි සම්බන්ධයෙන් ?

FAIR COMMENT BY JEZEEM

පි හරි ස්වාමිනි

ප්‍ර: මීට අමතරව අධ්‍යක්ෂකවරයා වෙත විද්‍යුත් තැපැල් මඟිනුත් ලේඛන එහෙම නැත්නම් correspondences තියෙනවද?

පි විද්‍යුත් තැපෑල මඟින් අධ්‍යකෂතුමා වෙත යොමු කරන ලද ලිපි භාහිර පාර්ශවයන්ගෙන් සිදු කිරීමක් වෙන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: එය රාජ්‍ය බුද්ධි සේවාව තුළ විතරද එය සිදු වෙන්නේ?

පි අධ්‍යක්ෂතුමා වෙත ලැබෙන ලිපි ඒ විද්‍යුත් ලිපි හරහා එවීමේ ක්‍රියාවලිය රාජ්‍ය බුද්ධි සේවාව තුළ ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් ද කියලා

ප්‍ර: ඔව්?

පි අනිත් ආයතනවල ක්‍රමවේදය ගැන මට අදහසක් නැහැ ස්වාමිනි නමුත් රාජ්‍ය බුද්ධි සේවාව තුළ බොහෝ අවස්ථාවලදි සෑම අවස්ථාවකදීම ලිපියක් මඟින් තමයි අධ්‍යක්ෂතුමාට කරුණු වාර්තා වෙන්නේ ස්වාමිනි.

ප්‍ර: 2019 අප්‍රේල් මාසය වන විට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක වශයෙන් සිටියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන නිවැරදිද?

පි නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: එම අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයේ එම නිලන්ත ජයවර්ධන මහත්මයාගේ කාර්යාලයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කරේ ඔබ ?

පි නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: දැන් නිලන්ත ජයවර්ධන මහත්මයා ජංගම දුරකථන කාර්යාලයේ හෝ පෞද්ගලික ජංගම දුරකථන කීයක් පාවිච්චි කරාද කියලා ඔබට දැනීමක් තියෙනවද ?

පි කාර්යාල ජංගම දුරකථනයක් එතුමා සතුව තිබුණා. ඒ ඇරෙන්න පෞද්ගලික ජංගම දුරකථනයක් තිබුණා කියලා මම දන්නවා ස්වාමිනි.

ප්‍ර: ඔබට දැනීමක් තියෙවනද ඔබට ජංගම දුරකථනයක් එකක් හෝ දෙකක් කාර්යාලයේ පාවිච්චි කරාද ඔබ

පි කාර්යාලයේ ජංගම දුරකථනයක් මං පාවිච්චි කරා ස්වාමිනි.

ප්‍ර: එයට whatsapp කියන යෙදුම තිබුණද ?

පි තිබුණා ස්වාමිනි

ප්‍ර: නිලන්ත ජයවර්ධන මහත්මයා සමඟ ඔබ සේවය කරපු කාලය මෙම කොමිෂන් සභාවට ලැබී තිබෙන සාක්ෂිවලට අනුව අවුරුදු හතර හමාරක් පමණ කියා සිටියොත් හරිද?

පි නිවැරදියි ස්වාමිනි

ප්‍ර: මෙන්න මේ කාලය තුළ ඔබට නිලන්ත ජයවර්ධන මහත්මයා ඔහුවෙත ලැබෙන whatsapp පණිවිඩ සම්බන්ධයෙන් සිදු කල යුතු කාර්යන් පිළිබඳව නියෝග ලබා දී තියෙනවද?

පි එසේ ලබා දී තියෙනවා ස්වාමිනි.

ප්‍ර: මොන වගේ නියෝග ද ඔබට ඒ අනුව ලබා දී තිබෙන්නේ ?

FAIR COMMENT BY JEZEEM

පි ස්වාමිනි ඇතැම් පණිවිඩ අදාල නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන්ට හෝ සහකාර අධ්‍යක්ෂකවරුන්ට යොමු කරන ලෙස උපදෙස් දෙමින් මා වෙත යොමු කරනවා

ප්‍ර: කොහොමද නිලන්ත ජයවර්ධන අධ්‍යක්ෂකවරයා ඔබට ඒ පණිවිඩ ඔබ වෙත යොමු කරන්නේ?

පි එතුමාගේ කාර්යාලීය ජංගම දුරකථනය හරහා මගේ කාර්යාලීය ජංගම දුරකථනයට යොමු කරනවා ස්වාමිනි.

ප්‍ර: ඒ යොමු කරන වේලාවල් තියෙනවද ඒ කියන්නේ රාජකාරී වේලාවන් තුළ පමණක් ද මේ යොමු කිරීම් සිදු කරනු ලබන්නේ ?

පි ස්වාමිනි රාජ්‍ය බුද්ධි සේවාව තුළ කාර්යාල වේලාවක් කියා අපිට උදේ 8 ඉඳන් 4ට කියලා එහෙම තිබුණේ නැහැ ඇත්තටම අපි 24 පැය රාජකාරියේ ඉන්න විදියට තමයි වැඩ කරේ ස්වාමිනි. හදිසි ඕනම අවස්ථාවක පණිවිඩයක් අපිට යොමු කරනවා සහ දුරකථන ඇමතුම් ලබා ගන්නවා ස්වාමිනි.

ප්‍ර: ඒ අනුව දැන් ඔබ වෙත whatsapp මාර්ගයෙන් යොමු කරනු ලබන පණිවඩයක් අධ්‍යක්ෂකවරයා විසින් ක්ෂණිකවම යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් වෙත යොමු කරන්න කියන නියෝගය ඔබ වෙත ලැබුණම ඔබ එය ක්‍රියාත්මක කිරීම රාත්‍රියේම ලැබුණොත් එවේලේම ඒ කටයුත්තට ඔබ යොමු වෙනවද?

පි හැකි සෑමවිටම මා එම කටයුත්තට යොමු වෙනවා ස්වාමිනි.

ප්‍ර: මේ කොමිෂන් සභාවට පැහැදිලි කරන්න මේ කොයි ආකාරයටද තමා වෙත ලැබෙන whatsapp පණිවිඩ අධ්‍යක්ෂකවරයා විසින් ඔබ වෙත යොමු කරනු ලබන්නේ වෙනත් පාර්ශවයන් වෙත යොමු කරන්න කියලා?

පි ස්වාමිනි අදාල පණිවිඩය whatsapp හරහා මාගේ ජංගම දුරකථනයට යොමු කරනවා ඒත් සමඟම පණිවිඩයක් සමඟම උපදෙස් ලබා දෙනවා මෙම පණිවිඩය කාටද යොමු කරන්න ඕනේ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා හරි සහකාර අධ්‍යක්ෂකතුමාට යොමු කරන්න කියන උපදෙසත් ඒත් සමඟම මට ඒ ඇප් එක හරහාම එවනවා ස්වාමිනි

ප්‍ර: ඒ අධ්‍යක්ෂකතුමා ඒ යොමු කරන ලද පණිවිඩය සමඟ යොමු කල යුතු පුද්ගයන්ගේ නමුත් සඳහන් කරලාද ඔබවෙත whatsapp පණිවිඩය එවනු ලබන්නේ?

පි ඒ යොමු කල යුතු පුද්ගලයා සම්බන්ධයෙන් අධ්‍යක්ෂකතුමා විශේෂ අවධානයක් යොමුකරනවා නම් අහවලාට විතරක් යවන්න කියලා අනිවාර්යෙන්ම ඒ උපදෙස ලැබෙනවා. එහෙම නැත්නම් අදාල අංශය වෙත යොමු කරන්න කියලා පොදුවේ තියෙන පණිවිඩයක් නම් එහෙම උපදෙසකුත් ලැබෙනවා ස්වාමිනි.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඒ අනුව ඔබ යොමු කරන ලද whatsapp පණිවිඩ ඒ නිලධාරිවරයෙකුට හෝ ඒ නිලධාරිවරුන්ට එසේ යොමු කල බවට කිසියම් හෝ ස්ථානයකට ලේඛන ගත කිරීමක් සිදු කරනවද?

පි ලේඛනගත කිරීමක් රෙජිස්ට්‍රර් එකක කෙරෙන්නේ නැහැ ස්වාමිනි. මම ඒ පණිවිඩය පින්ට්අවුට් එකක් අරගෙන නෝට් එකක් දානවා මේ පණිවිඩය අහවලාට මේ වෙලාවට යොමු කරා කියාල ඊට පස්සේ ඒ පණිවිඩයට උත්තර ලැබුණාම process එක වෙනවා කියලා දැනුනම ස්වාමිනි අපි ඒ කොල destroy කරනවා.

ප්‍ර: දැන් මට එක දෙයක් වැටෙහෙන්නේ නැහැ whatsapp පණිවිඩයක් අධ්‍යක්ෂකතුමා වෙත ලැබිලා එක්කෝ එක්කෝ එක් නිලධාරියෙකුට හෝ නිලධාරින් දෙදෙනෙකුට යොමු කරන්න කියලා ඔබට නම් මඟින් සඳහන් කර යොමු කිරීමේදී එය කාලය ගතවෙන ක්‍රියාවලියක් කියලා මා ඔබට කියා සිටියොත් ඔබ ඒක පිළිගන්නවද?

පි නම් වශයෙන් යොමු කෙරෙන්නේ නැහැ ස්වාමිනි. අපේ ආයතනය තුළ හැම නිලධාරියෙකුටම කෝඩ් නේම් එකක් තිබුණා ඒ name එක දැම්මාම අපි දන්නවා අහවලාට අහවලාට තමයි යවන්න ඕනේ කියලා ඒ අනුව තමයි ඒ කටයුත්ත සිදුවෙන්නේ ස්වාමිනි

ප්‍ර: දැන් whatsapp භාවිතා කිරීමේ දී පහසු ක්‍රමය අධ්‍යක්ෂතුමාට ඒ නම ඇතුලත් කරලා යොමු කිරීම පහසුයි කියලා මා ඔබට යෝජනා කරොත් ඔබ ඒක පිළිගන්නවද?

පි ඒක ස්වාමිනි අධ්‍යක්ෂතුමා ඒ වෙලාවේ පසුවන අවස්ථා අනුව අවස්ථානුකූලව සාපේක්ෂයි කියලා තමයි මං හිතන්නේ

ප්‍ර: ඒ කියන්නේ අධ්‍යක්ෂතුමාට එම සංකේත නාමය ඔබ වෙත දැන්වීමට වඩා වේගයෙන් කඩිනමින් ඔහුට අවශ්‍ය නම් එක් නිලධාරියෙක් හෝ දෙදෙනකුගේ නම් තමාගේ whatsapp ගිණුම හරහා ඒ අදාල සුවිශේෂි පණිවිඩයක් යොමු කිරීමේ හැකියාව තියෙනවා

පි එහෙම හැකියාවක් තියෙනවා ස්වාමිනි

ප්‍ර: ඔබට 2019 අප්‍රේල් මාසය වන විට භාවිතා කරන්නට යෙදුණු ඒ රාජකාරි දුරකථන අංකය මතකයිද?

පි මතකයි ස්වාමිනි

ප්‍ර ඔබට එය ගරු කොමිෂන් සභාවට ලබා දෙන්න පුළුවන්ද ?

පි: පුළුවන් ස්වාමිනි.

****

<u>ගරුසභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකාරියගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ලේඛනයක ලියා කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි සාක්ෂිකාරියගෙන් අසන ලද ප්‍රශ්නයට

FAIR COMMENT — BY JEZEEM —

පිළිතුරක් වශයෙන් ජංගම දුරකථන අංකය සඳහන් විය යුතු බවට කොමිෂන් සභාවේ ලස් ලේඛිකාවට නියෝග කරමි.

මේ අවස්ථාවේදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා කොමිෂන් සභාව තුළ සිටින අතර ඔහු වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියද කොමිෂන් සභාව තුළ සිටියි. ඔවුන්ට දන්වා සිටින්නේ කොමිෂන් සභාවේ හෙට දින සාක්ෂි ලබා දීමට නියමිතව ඇති සාක්ෂිකරුවන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා සම්බන්ධයෙන් සාක්ෂි දීමට ඇති හැකියාවක් ඇති බැවින් ඒ සම්බන්ධ යෙන් හෙට දින කොමිෂන් සභාව තුළ පෙනී සිටීමට ඔවුන්ට අයිතියක් ඇති බව දන්වමි. හෙට දින සම්පූර්ණයෙන්ම මෙම සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි ලබා ගැනීම නියමිතව ඇති බවද ඔවුන්ට දන්වයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: සාක්ෂිකාරියවෙත ලේඛනයක් පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා. එය කොටස් තුනකින් සමන්විතයි X 435 පෙන්වා සිටියි එය . X 435 A . X 435 B සහ X 435 C ලෙස අනු අංකනය කර ඇති බවට ගෞරවයෙන් සැල කර සිටිනවා මෙම X 435 කියන්නේ whatsapp පණිවිඩයක් මෙම පණිවිඩය ඔබ වෙත ලැබී තිබෙනවද?

පි මෙම පණිවිඩය මා වෙත ලැබී තිබෙනවා ස්වාමිනි

ප්‍ර: මතකද ලැබිච්ච දිනය ?

පි අප්‍රේල් 04 2019 ස්වාමිනි.

ප්‍ර: 2019.04.04?

පි ඔව්

ප්‍ර: කීයට විතර ද ලැබුනේ?

පි මට මතක විදියට 11 ට වගේ ස්වාමිනි මට වෙක් කරන්නේ නැතිව

ප්‍ර: රාත්‍රියේද උදේද?

පි උදේ 11ට

ප්‍ර: උදේ 11?

පි වේලාව ගැන මට ස්ථිර නැහැ ස්වාමිනි මට phone එක පරීක්ෂා කරලා දැනුම් දෙන්න පුළුවන්.

ප්‍ර: මෙම X 435 කියන මෙම පණිවිඩය ඔබට යොමු කරේ කවුරු විසින්ද ?

පි එවකට හිටපු අධ්‍යක්ෂතුමා නිලන්ත ජයවර්ධන මහතා විසින් යොමු කලේ ස්වාමිනි.

ප්‍ර: ඒ පණිවිඩය ඔබට යොමු කිරීමේදී නිලන්ත ජයවර්ධන මහතා ඔබට යම් උපදෙසක් සහිතව ද මේ X 435 යොමු කරේ?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඒ උපදෙස්?

President Secretariat's Copy
FAIR COMMENT — BY JEZEEM —

පි අදාල නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට සහ සහකාර අධ්‍යක්ෂවරයාට මෙම පණිවිඩය යොමු කරන ලෙස උපදෙස් ලබා දීලා තිබුණා ස්වාමිනි

ප්‍ර: නැවත ඔබේ පිළිතුර කියන්න කරුණා කරලා?

පි අදාල නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට සහ සහකාර අධ්‍යක්ෂකවරයාට මෙම පණිවිඩය යොමු කරන ලෙස උපදෙස් ලබා දීලා තිබුණා ස්වාමිනි

ප්‍ර: කවුද ඒ අධ්‍යක්ෂකවරුන් ?

පි නියෝජ්‍ය අධ්‍යක්ෂ එවකට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සම්පත් ලියනගේ මහතා සහ සහකාර අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරි සුජීව මල්ලව ආරච්චි මහතා වෙත

ප්‍ර: ඔබ ඒ අනුව කුමක්ද ගත්තු ක්‍රියාමාර්ගය ?

පි මම ඒ මහත්වරු දෙදෙනාට ඒ උපදෙස් ලබා දී තිබූ පරිදි පණිවිඩය යොමු කරා ස්වාමිනි.

ප්‍ර: කොහොමද එය ඔබ යොමු කරේ?

පි මාගේ දුරකථනය වට්සැප් මුදුකාංගය හරහාම තමයි යොමු කරේ ඒ නිලධාරීන් දෙදෙනාගේ කාර්යාලීය ජංගම දුරකථනවල whatsapp වෙත

ප්‍ර: හරි මෙම X 435 හි නිලන්ත ජයවර්ධන මහත්මයා උපදෙසක් ලබා දී තිබුණාද ඔබ පෙර නම් සඳහන් කරපු නිලධාරීන් දෙදෙනා වෙත මෙම whatsapp පණිවිඩය ලබාදීමට අමතරව යම් වාර්තාවන් හෝ එහෙම නැත්නම් යම් වාර්තාන් ඉදිරිපත් කරන්න කියලා කැඳවන්න කියලා?

පි අදාල සිද්ධිය සම්බන්ධයෙන් වාර්තාව කැඳවන ලෙස උපදෙස් ලබා දීලා තිබුණා කියලා මගේ මතකයක් තියෙනවා ස්වාමිනි. නමුත් මට phone එක වෙක් කරොත් ඒක ඇති phone එකේ මම ඒ කියපු විදියටම උපදෙස් ලබා දුන්න විදියම නිලධාරීන් යොමු කරලා වාර්තාවක් කැඳවන්න කියලා අධ්‍යක්ෂකතුමා උපදෙස් දුන්නා කියන එක නැවත වතාවක් කෝල් කරලා කියපු එක මතකයකුත් තියෙනවා ස්වාමිනි

ප්‍ර: කවුද කෝල් කරලා කිව්වේ?

පි මම කෝල් කරලා කිව්වේ

ප්‍ර: ආ.....

පි මම කෝල් කරලා සහකාර අධ්‍යක්ෂකවරයාට දැනුම් දුන්නා ස්වාමිනි

ප්‍ර: නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට දැනුම් දුනනේ නැද්ද?

පි නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමාට දැනුම් දීමට උත්සහ කලත් එතුමා සම්බන්ධ කර ගැනීමට හැකියාවක් තිබුණේ නැහැ කියන එක තමයි මට මතක තියෙන්නේ ස්වාමිනි

ප්‍ර: එහිදි වාර්තාවන් ඉදිරිපත් කරන්න කල යුතු දිනයක් එහෙම ලබා දෙනු ලැබුවාද ?

පි මා විසින් එවැනි දැනුම් දීමක් සිදු කරේ නැහැ ස්වාමිනි

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: දැන් මෙම . X 435 කියන whatsapp පණිවිඩය මඟින් දැනුම් දෙන්නට යෙදුණේ ශ්‍රීලංකාව තුළ ජාතික තවුහිද් ජමාත් සංවිධානය විසින් සිදු කල ප්‍රහාරයක් මරාගෙන මැරෙ සහ වෙනත් ක්‍රමවලින් සිදුකල හැකි ප්‍රහාරයක් සම්බන්ධයෙන් කියලා කිව්වොත් හරිද?

පි නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: සාක්ෂිකාරිය වෙත . X 113 පෙන්වා සිටිනවා මේ අවස්ථාවේදී . යම් අවස්ථාවක ඔබ ඉදිරියේ තිබෙන මේ X 435 කියන whatsapp පණිවිඩයේ සඳහන් තොරතුරු ලිඛිතව රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා වෙත ලැබුණද?

පි ලිඛිතව අධ්‍යක්ෂකතුමා වෙත ලැබුණා ස්වාමිනි.

ප්‍ර: ඒ මේ අවස්ථාවේ X 113 A ලේඛනය සාක්ෂිකාරියට පෙන්වයි. ඔබට මතකයක් තිබේද මෙම X 113 A කවද වගේද ලැබුණේ කියන්න?

පි මා whatsapp පණිවිඩය යොමු කල දිනයට පසු දින තමයි ස්වාමිනි ලිඛිතව වාර්තාව ලැබුණේ

ප්‍ර: ඒ කියන්නේ දිනය කවද්ද?

පි අප්‍රේල් 05

ප්‍ර: 2019.?

පි 2019. අප්‍රේල් 05 ස්වාමිනි

ප්‍ර: X 113 A දරණ අවරණ ලිපියට අමුණා තිබෙන දිනය ලේඛනය ලැබුණු දිනය .. ස්ථානවලට

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: X 113 A දරණ ලේඛනයට එය විදේශීය බුද්ධි ආයතනයකින් ලැබුණා කියලා කිව්වොත් නිවැරදිද?

පි නිවැරදියි ස්වාමිනි

ප්‍ර: දැන් එවැනි විදේශීය බුද්ධි ආයතනකින් රාජ්‍ය බුද්ධි සේවයට විවිධ ලේඛනය ලැබෙනවානේ

පි: විවිධ ලේඛනන ලැබෙනවා.

ප්‍ර: එතකොට සමහරක් ලේඛන වල යම් තොරතුරක් නැත්නම් බුද්ධි තොරතුරක් ලබා දීලා තියෙනවානේ?

පි එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ වාර්තා වල ඒ විදේශීය ආයතන එවැනි බුද්ධි තොරතුරු ලබාදීමෙන් රාජ්‍ය බුද්ධි සේවයෙනුත් සම්බන්ධයෙන් යම් ප්‍රතිචාරයක් බලාපොරොත්තු වෙනවද ?

පි ඇතැම් අවස්ථාවල බලාපොරොත්තු වෙනවා ස්වාමිනි විශේෂයෙන් එහෙම සඳහන් නොකරන අවස්ථාත් තියෙනවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: විශේෂයෙන් එහෙම රාජ්‍ය බුද්ධි සේවයෙන් ප්‍රතිචාරනයක් ඉල්ලන අවස්ථාත් තිබෙනවා.

පි එහෙම අවස්ථාත් තිබෙනවා

ප්‍ර: ඒවා ඉල්ලන්නේ ලිඛිතව ?

පි ලිඛිතව ඉල්ලනවා ස්වාමිනි

ප්‍ර: එවැනි ලිඛිතව විදේශිය බුද්ධි ආයතනකින් රාජ්‍ය බුද්ධි සේවයට යම් තොරතුරක් යම් තොරතුරක් ලබා දීමෙන් පසු ඒකට ප්‍රතිචාරයක් ඉල්ලපු අවස්ථාවක ඒකට රාජ්‍ය බුද්ධි සේවයෙන් යවන ප්‍රතිචාරය ලිඛිතව යවනවද ?

පි: ලිඛිතව යවන අවස්ථාත් තිබෙනවා ස්වාමිනි . නමුත් ඇතැම් අවස්ථාවල සමහර විදේශිය බුද්ධි නියෝජිත ආයතන counterparts ලා ඇවිල්ලා කථා කරනවා සහ අධ්‍යක්ෂකතුමා සමඟ අධ්‍යක්ෂකතුමා දුරකථනයෙන් කථා කරන අවස්ථාත් තියෙනවා. එහෙම කථා කරලා ඒ කට්ටිය නිසි පිළිතුරක් ලැබුණොත් ඇතැම් අවස්ථාවල ලිඛිතව නොයවන අවස්ථාත් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: එතකොට එවැනි විදේශිය ආයතනයකින් එවන බුද්ධි තොරතුරක් නැත්නම් තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවයේදී ලේඛනගත වෙනවානේ?

පි රාජ්‍ය බුද්ධිසේවාවේ අනිවාර්යෙන් ලේඛන ගතවෙනවා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒකට රාජ්‍ය බුද්ධි සේවය දක්වපු ප්‍රතිචාරය මොකක්ද කියලා දැන ගන්න කියන එක රාජ්‍ය බුද්ධි සේවයේ කටයුතු වලට ඉතා වැදගත්නේද?

පි ස්වාමිනි මට පැහැදිලි නැහැ.

ප්‍ර: විදේශිය බුද්ධි ආයතනයකින් යම් තොරතුරුක් නැත්නම් බුද්ධි තොරතුරක් නැත්නම් රාජ්‍යය බුද්ධි සේවයට ලැබිලා ඒකට රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රතිචාරයක් ඉල්ලුවාම රාජ්‍ය බුද්ධි සේවයෙන් එකට දක්වන ප්‍රතිචාරය යම් කිසි වාර්තාවක් තබා ගැනීම රාජ්‍යය බුද්ධි සේවයේ ඉදිරි කටයුතු සඳහා වැදගත් නේද කියලා අහන්නේ?

පි: ඉදිරි කටයුතු සඳහා වැදගත් වෙනවා ස්වාමිනි

ප්‍ර: එතකොට ඔබ කියන පරිදි රාජ්‍යය බුද්ධි සේවයට ලිඛිතව විදේශිය බුද්ධි ආයතනයකින් ලැබුණු තොරතුරකට අපෙන් ප්‍රතිචාරයක් ඉල්ලුවාම ඔබ කිව්වානේ වාචිකවත් දෙනවා ලිඛිතවත් දෙනවා කියලා ? ලිඛිතව දුන්නොත් වාර්තා ගත වෙනවා

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: වාචිකව දුන්නත් අර මම ඉස්සෙල්ලා කියපු හේතුවට අනුව විය කොහේ හරි වාර්තා ගත වෙලා තියෙන්න ඕනේ නේද ?

පි: ස්වාමිනි යම් තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවාව වෙත ලැබුණාම විවිධ තොරතුරු තියෙනවා ස්වාමිනි ත්‍රස්වාදය වෙන්න පුළුවන්, අන්තවාදය වෙන්න පුළුවන් මත්ද්‍රව්‍ය වෙන්න පුළුවන් එතකොට ඒ අංශ විසින් ඒ

FAIR COMMENT BY JEZEEM

කියන තොරුතරු සම්බන්ධව කරන විමර්ශන සම්බන්ධයෙන් වාර්තාවන් අධ්‍යක්ෂතුමාට වාර්තාවක් ඉදිරිපත් කරනු ලබනවා ඒ තොරතුරු සම්බන්ධ ඇතැම් අවස්ථාවල ලිඛිතව Counter parts ලාට ලිපි යොමු කරනවා ස්වාමිනි සාකච්ඡා කරලා කථා කරලා කියන අවස්ථාවත් තියෙනවා කථා කරලා කියන අවස්ථාවේදී ස්වාමිනි. අර විමර්ශන අංශයෙන් ගොනුවක් එනවා ඒ සම්බන්ධයෙන් ඒ ගොනුව අනවාර්යෙන් ලේඛනගත වෙනවා .

ප්‍ර: ඒ කියන්නේ ඒ ගොනුවේ විමර්ශන අංශයෙන් එන ගොනුවේ ඒ විදේශීය බුද්ධි ආයතනයෙන් අපිට ලබා දුන්න තොරතුර නැත්නම් බුද්ධි තොරතුර සම්බන්ධයෙන් ඔවුන් යම් ප්‍රතිචාරයක් ඉල්ලුවා නම් ඔවුන්ට ඒ රාජ්‍යය බුද්ධි සේවාව දක්වපු ප්‍රතිචාරය එම විමර්ශන ගොනුවේ තියෙන්න ඔනේ නේද?

පි: ඔවුන් විසින් විමර්ශන වලින් අනාවරණය කර ගන්න කරුණු මත තමයි ස්වාමිනි අපි Counter parts debrief කරන්නේ එහෙම වුණා ම de brief කරන කරුණු ඒ විමර්ශන වාර්තාවේ අඩංගු වෙනවා ස්වාමිනි.

ප්‍ර: අනිවාර්යෙන්ම අඩංගු වෙන්න ඕනේනේ?

පි: අඩංගු වෙනවා ස්වාමිනි. බෝහෝ අවස්ථාව විට.

ප්‍ර: නැත්නම් මොනවද දෙන්නේ කියලා අපිට දැන ගන්න බැහැනේ ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ විමර්ශන ගොනුව මොන අංශයේද තියෙන්නේ?

පි: විමර්ශන ගොනු සමාන්‍යයෙන් ෆයිල් වෙන්නේ ලේඛනාගාරයේ. Final report ඔක්කෝම ලේඛනාගාරයේ තමයි ෆයිල් වෙන්නේ ස්වාමිනි **සාක්ෂිකාරියට රාජ්‍යය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක විසින් එවන ලද 2020. 10.13 දරණ ලේඛනය පෙන්නවයි.**

ප්‍ර: ඔබ ඔය ලේඛන සම්බන්ධයෙන් දැනුවත්නේ?

පි: දැනුවත් ස්වාමිනි.

ප්‍ර: මොකද ඔබනේ දැනටමත් ස්ථානාධිපතිනිය ඉන්නේ ඔබනේ

පි: එහෙමයි.

ප්‍ර: එතකොට අපි ඔය ලේඛනයෙන් අපි ඉල්ලුවේ තොරතුර අර අප්‍රේල් 04 වෙනිදා විදේශීය බුද්ධි සේවයෙන් ලැබුණු තොරතුරට නැත්නම් බුද්ධි තොරතුරට එම තොරතුර නැත්නම් බුද්ධි තොරතුර සම්බන්ධයෙන් රාජ්‍යය බුද්ධි සේවයෙන් ලිඛිත පිළිතුරක් යැව්වද කියන අපි එකයි රාජ්‍ය බුද්ධි සේවයෙන් ඇහුවේ? ඒකට එවලා තියෙන පිළිතුර නේද ඕක?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔය ලේඛනය හදන කොට ඔබ ඒකට සම්බන්ධ වුණා නේද?

පි: සම්බන්ධ වුණා ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: එතකොට ඔය ලේඛනයට කොමිෂන් සභාවට පිළිතුර එවනවා නම් එවන කොට ඒ අදාල විමර්ශන ගොනුව ඔබ නිරීක්ෂණය කරන් ඇතිනේ?

පි: ස්වාමිනි මෙම යොමු ගත ලිපිය අපිට ලැබුණාම අපි අදාල අංශයෙන් වාර්තාවක් කැඳවනවා ස්වාමිනි. ඒ අංශයෙන් තමයි අපිට අධ්‍යක්ෂතුමාට දැනුම් දෙන්නේ මෙහෙම ප්‍රතිචාර විදියට ලිඛිත වාර්තාවක් යොමු කරලා නැහැ කියලා එයාලාගේ ලිපි පරිශීලනය කරලා ඒ අනුව තමයි මේ ලිපිය සකස් වෙන්නේ ස්වාමිනි.

ප්‍ර: ඔබ ඒ විමර්ශණ ගොනුව දැක්කේ නැද්ද ?

පි: මට විමර්ශන ගොනුවක් බලන්න ඇක්ෂස් නැහැ ස්වාමිනි අදාල නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා සහ සහකාර අධ්‍යක්ෂකවරුන්ට තමා තියෙන්නේ

ප්‍ර: ඔබට ඒ තොරතුරු ලබා දුන්නේ මොන විමර්ශන අංශයේ කුමන නිලධාරියාද ?

පි: ස්වාමිනි මේ ලිපියට අදාලව පිළිතුර සපයා දීම සඳහා ස්වාමිනි නමුත් අන්තවාදය සම්බන්ධයෙන් කටයුතු කරන අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා තමයි එවලා තිබුණේ ස්වාමිනි

ප්‍ර: කවුද මිස්ටර් මල්ලවආරච්චිද , සම්පත්ද?

පි: පල්ලේආරච්චි මහත්මයා

ප්‍ර: කවුද?

පි; ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි බුද්ධික පල්ලේආරච්චි මහත්මයා ස්වාමිනි

ප්‍ර: අලුත් නිලධාරියෙක්?

පි: වර්තමාන නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක විසින් අත්සන් කර 2020.10.13 දාතමින් ගරු කොමිෂන් සභාව විසින් යොමු කරන ලද අංක PCI/IIBA/SEC/09 සහ 2020.10.09 දිනැති ලිපියට පිළිතුරු වශයෙන් රාජ්‍ය බුද්ධි සේවාව විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව X 584 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා. මෙමගින් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා ගරු කොමිෂන් සභාව වෙත දන්වා තිබෙන්නේ 2019.04.04 . සහ 05 යන දිනවල එකී සේවාවට යොමු වූ විදේස් බුද්ධිතොරතුරට අදාලව ලිඛිත ප්‍රතිචාරයක් දක්වා නොමැති බවයි

ප්‍ර: ඔබ ඉදිරියේ තිබෙන X 113 A දරණ ලේඛනය රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වෙත ඔහුගගේ නමින් පැමිණි ලේඛනයක් ද නැද්ද කියලා ඔබට මතකයක් තියෙනවද ?

පි: මතකයක් නැහැ ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මෙම ලේඛනය රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක එවකට අධ්‍යක්ෂක සිටි නිලන්ත ජයවර්ධන මහතා වෙත ඉදිරිපත් කරාද නැද්ද කියලා මතකයක් තියෙනවද?

පි: බොහෝ අවස්ථාවලදී ස්වාමිනි විදේශ බුද්ධි නියෝජිතයන්ගෙන් ලැබෙන ලිපි ඉදිරිපත් කරන්නේ මා විසින් අධ්‍යක්ෂකතුමා වෙත මේ ලිපිය ඉදිරිපත් කලේ මා කියලා මතකයක් තියෙනවා ස්වාමිනි

ප්‍ර: මේ X 113 A ඔබ වෙත ඔබ රාජ්‍යය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතා වෙත ඉදිරිපත් කරාම ඔබට එතුමා කිසියම් උපදෙසක් හෝ නියෝගයක් ලබා දුන්නද?

පි: එතුමා මේ ලිපිය අදාල අංශ භාර නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා වෙත ඉදිරිපත් කරා ස්වාමිනි.

ප්‍ර: ඔව්?

පි: ඒ අංශය භාර whatsapp පණිවිඩය මඟින් යොමු කරලා තිබුණ නිසා ඒක අංශ භාර නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා වෙත යොමු කරා කියන මතකය තියෙනවා එහෙම තමයි කෙරුවේ.

ප්‍ර: ඊට අමරතව X 113 A දරණ ලේඛනය ජාතික බුද්ධි ප්‍රධානී වෙත යොමු කරාද නැද්ද කියලා ඔබට මතකයක් තියෙනවද?

පි: ජාතික බුද්ධි ප්‍රධානිතුමා වෙත අනිවාර්යෙන් යොමු කලා ස්වාමිනි. අධ්‍යක්ෂකතුමා උපදෙස් දුන්නා මේ ලිපිය අපිට ලැබුණේ 5 වෙනිදා නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා වෙත යොමු කරලා ඒ අංශයෙන් අනාවරණය වන කරුණු ඇතුලත් වාර්තාවක් අපිට දවස් දෙක තුනක් ඇතුලත ලැබුනේ නැති නිසා මේ ලිපිය ජාතික බුද්ධි ප්‍රධානිතුමා වෙත යවන්න draft කරන්න එතුමා මට dictate කරා ස්වාමිනි එතනදි උපදෙස් දුන්නා ජාතික බුද්ධි ප්‍රධානිතුමා වෙත මේක වැදගත් තොරුතුරක් නිසා බුද්ධි ප්‍රධානිතුමා වෙත ඉදිරිපත් කරාම එතුමාට පුළුවන් අනිත් ආයතනත් එක්ක Share කරන්න කියන උපදෙස ලබා දුන්නා ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ මේ X 113 A කියන ලේඛනය ජාතික බුද්ධි ප්‍රධානි වෙත යොමු කරන්න තීරණය කරා?

පි: එහෙමයි ස්වාමිනි. එතුමා තීරණය කරලා එතුමා මට උපදෙස් දුන්නා ස්වාමිනි

ප්‍ර: ඒ තීරණය කරන අවස්ථාව වන විට ඔබ කියන්නේ මේ X 113 A සහ පෙර ඔබ පෙන්වා සිටපු X 435 යොමු කරන ලද නියෝජ්‍ය අධ්‍යයක්ෂක සහ සහකාර අධ්‍යක්ෂකරුන්ගෙන් එම X 435 සහ X 113 A හි අඩංගු කරුණු ගැන වාර්තාවන් ලැබී තිබුණේ නැද්ද?

පි: ඒ ලිපිය ජාතික බුද්ධි ප්‍රධානිතුමා වෙත ලැබෙන අවස්ථාව වන විට

ප්‍ර: යොමු කරන අවස්ථාවද ලැබෙන අවස්ථාවද ජාතික බුද්ධි ප්‍රධානීතුමා වෙත යොමුකරන අවශ්ථාව වන විටද ?

FAIR COMMENT BY JEZEEM

පි: යොමු කරන්න කියලා අධ්‍යක්ෂකතුමා විසින් වාර්තාව සකස් කරන්න කියලා මට උපදෙස් දෙන අවස්ථාව වන විට මගේ මතකයේ හැටියට අපිට විමර්ශන වාර්තාවක් ලැබිලා තිබුණේ නැහැ ස්වාමිනි

ප්‍ර: ඒ අනුව ඔබ වෙත ඔබ කියා සිටියේ රාජ්‍යය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතා විසින් ජාතික බුද්ධි ප්‍රධානී වෙත යොමු කිරීම සඳහා ලිපියක් dictate කර බවයි එහෙමද ?

පි: ලිපියක් dictate කරා ස්වාමිනි

ප්‍ර: ඒ අනුව එය ඔබ එසේ අධ්‍යක්ෂකවරයා විසින් ඔබ වෙත දන්වන්නට යෙදුණු කරුණු ඇතුලත්ව ලිපියක් ඔබ සකස් කරාද?

පි: මතකයේ හැටියට ලිපියක් ගොඩාක් කරුණු ඇතුලත් කරේ නැහැ. තොරතුර යොමු කිරීමක් පමණයි සිද්ධ වුණේ වැඩිදුර උපදෙස් පතලා.

ප්‍ර: එය යතුරු ලියනය කරේ ඔබද?

පි: මං ස්වාමිනි.

ප්‍ර: මේ අවස්ථාවේදී X 113 පෙන්වා සිටිනවා. ගරු සභාපතිතුමනි X 113 පරීක්ෂා කරලා බලලා ප්‍රකාශ කරන්න ඔබ මෙම X 113 A සම්බන්ධයෙන් ඔබ පිළියෙල කරන ලද ආවරණ ලිපිය ද කියලා?

පි: එහෙමයි ස්වාමිනි

ප්‍ර: මෙම X 113 කියන ලිපිය සමඟ X 113 A ජාතික බුද්ධි ප්‍රධානී වෙත යොමු කරාද?

පි: එහෙමයි ස්වාමිනි

ප්‍ර: ඒ යොමු කරපු දවස මතකද?

පි: මේ ලිපියේ තියෙන විදියට ස්වාමිනි 07 වෙනිදා තමයි අත්සන් කරලා තියෙන්නේ අපි ලිපියක් සකස් කරලා ලිපිය යොමු කිරීම සඳහා මාගේ කාර්යාල විසින් ලේඛනාගාරයට භාර දෙනවා ලේඛනාගාරය විසින් තමයි ලිපිය යොමු කිරීම සිදු වන්නේ අදාල පාර්ශවයන්ට මගේ කාර්ය වෙන්නේ මගේ කාර්ය වන්නේ ලියුම සකස් කරලා ලේඛනාගාරයට බාරදීම ස්වාමිනි.

ප්‍ර: දැන් මේ X 113 සහ X 113 A අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයෙන් යොමු කරන අවස්ථාවේදි එහි Top secret කියලා මෙහි දක්නට තිබෙන මුද්‍රාව තැබුවද?

පි: එහෙමයි ස්විමිනි.

ප්‍ර: කවුරු විසින් ද ඒ මුද්‍රාව තැබුවේ?

පි: ලිපිය අධ්‍යක්ෂකතුමා අත්සන් කරාට පස්සේ මාගේ කාර්යාලයේ සහයට තව නිලධාරින් පිරිසක් ඉන්නවා ඒ එක නිලධාරියෙක් විසින් තමයි ලිපිය සකස් කරන්නේ මට මේ අවස්ථාවේදී ඒ ලිපිය සකස් කරේ කවුද කියන එක හරියටම සීල් එක තිබ්බේ කවුද කියන එක හරියටම මතකයක් නැහැ ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: දැන් මේ Top secret කියලා මේ මුද්‍රාව තබන්න තැබිය යුතුයි කියන තීරණය කවුද ගත්තේ?

පි: අධ්‍යක්ෂකතුමාගේ නියෝගයක් ස්වාමිනි.

ප්‍ර: අධ්‍යක්ෂකවරයාගේ නියෝගයක් දැන් මේ Top secret කියන මුද්‍රාව යම් ලේඛනයකට ඇතුලත් කරාම ඒ අර ලේඛනාගාරයේ වෙත යැවීමට පෙර හෝ පසු පෙරද මෙය ලිපිකවරයකටද දමා ඒ කර්තවය කරන්නේ කවුරු විසින්ද?

පි: Top secret වර්ගීකරණය යටතේ යවන ලිපි ස්වාමිනි අධ්‍යක්ෂක කාර්යාලය තු ලින්ම තමයි ලිපිකරවයකට බහා සකස් කරන්නේ .

ප්‍ර: ලිපිකවර කීයක්ද එකක්ද දෙකක්ද

පි: ලිපි කවර දෙකකට top secret document හැම තිස්සේම කවර දෙකක තමයි බහලා තමයි යවන්නේ ස්වාමිනි.

ප්‍ර: ඒ ලිපි කවරයකටත් Top secret කියන මුද්‍රාව තබනවාද?

පි: උඩ කවරයට නෙමේ යට කවරයට Top secret මුද්‍රාව තබනවා.

ප්‍ර: ඒ අනුව ඔබට මතකයක් තියේද මේ X 113 සමඟ X 113 A 2019.04.07 වන අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයෙන් ජාතික බුද්ධි ප්‍රධානි වෙත යොමු කිරීම සඳහා බැහැර කරාද කියලා ?

පි: අධ්‍යක්ෂකතුමාගේ කාර්යාලයෙන් එදිනම ලේඛනාගාරය වෙත් බැහැර කරා.

ප්‍ර: ඒ සාමාන්‍යයෙන් කොයි වගේ වෙලාවකද මතකයක් තිබෙනවද?

පි: වෙලාව මතකයක් නැහැ ස්වාමිනි.

ප්‍ර: දැන් මෙම X 113 සහ X 113 A කියන ලේඛන දෙකේම අර Top secret මුද්‍රාව තිබෙනවා?

පි: එහෙමයි

ප්‍ර: X 113 ආමන්ත්‍රණය කරලා තිබෙන්නේ එවකට ජාතික බුද්ධි ප්‍රධානි වූ සිසිර මෙන්ඩිස් මහතාගේ නමින්ම ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: එම නම ලිපි කවරයේ සඳහන් කිරීමක් කරනවද?

පි: ලිපි කවරයේ අනිවාර්යෙන් සඳහන් කිරීමක් කරනවා ස්වාමිනි.

ප්‍ර: දැන් මෙම ලේඛනය මෙම X 113 සහ X 113 A ලේඛනාගාරයට යවන අවස්ථාවේදී ඒ යවන ලිපිකවරයේ ඔබට අනුව Top secret කියන මුද්‍රාව ඇතුලත් වන්නේ නැහැ?

පි: උඩකවරයේ ඇතුලත් වන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: එතකොට ලේඛනාගාරය කොහොමද දැනගන්නේ මෙය වහා වහා නොපමාව මෙම ලේඛනය කට්ටලය ඒ අදාල යොමු ගත පුද්ගලයා වෙත යැවිය යුතුයි කියලා ?

FAIR COMMENT BY JEZEEM

පි: අධ්‍යක්ෂක කාර්යාලයෙන් සකස් කරලා ලේඛනාගාරයට භාර දෙනවා නම් යම් ලේඛනයක් ස්වාමිනි කාටහරි පුද්ගලයකුට බැහැර කරන්න රෙජිස්ට්‍රය සහ අධ්‍යක්ෂක කාර්යාලය අතර අවබෝධයක් තිබෙනවා මේක Top secret classified document එකක් කියන එක අපි බොහෝ අවස්ථා වල රෙජිස්ට්‍රයට උපදෙස් දෙනවා එම Top secret Document එකක් එනවා ඒක හැකි ඉක්මනින් ඩිලිවර් කරන්න කියලා.

ප්‍ර: දැන් මෙම X 113 A හි සඳහන් තොරතුරට අදාලව වාර්ථා ඔබ කියා සිටියානේ මෙම X 113 පිළියෙල කරන අවස්ථාවේදී එම වාර්තාවක් ලැබී තිබුණේ නැහැ කියලා ?

පි: එම වාර්තාවක් ලැබී නොතිබුණු බවට අධ්‍යක්ෂකතුමා උපදෙස් දීම අනුව තමයි මං ඒක දැන ගත්තේ

ප්‍ර: යම් අවස්ථාවක දී එම වාර්තාවන් අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයට ලැබුණාද නැත්නම් අධ්‍යක්ෂකවරයා වෙත ලැබුණා ද කියන්න ඔබට දැනීමක් තියෙනවද ?

පි: යම් වාර්තාවක් අධ්‍යක්ෂක කාර්යාලය හරහා අධ්‍යක්ෂකතුමාට යොමු වුවා නම් අනිවාර්යෙන් මට දැනුමක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: එය ඔබට දැනුමක් තියෙනවද මේ X 113 A කියන ලේඛනයට අදාලව වාර්තාවන් නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාගෙන් සහ සහකාර අධ්‍යක්ෂකවරයාගෙන් ලැබුණද කියන්න?

පි: අනිවාර්යෙන් ලැබුණා ස්වාමිනි.

ප්‍ර: අනිවාර්යෙන් ලැබුණා?

පි: ලැබුණා.

ප්‍ර: කවද්ද කියලා මතකද ?

පි: දිනය මතයක් නැහැ.

සාක්ෂිකාරිය වෙත X 94 පෙන්වා සිටිනවා මේ අවස්ථාවේදී

ප්‍ර: මෙම X 94 ලේඛනය ඔබ මීට පෙර දැකලා තියෙනවද?

පි: දැකලා තියෙනවා ස්වාමිනි

ප්‍ර: මෙම X 94 එවකට පොලිස්පතිව සිටි පූජිත් ජයසුන්දර මහතාගේ නමින් යොමු කරලා තිබෙන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකව සිටි නිලන්ත ජයවර්ධන මහත්මයා?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: X 94 වාර්තාව කවුද පිළිවෙල කරේ ?

පි: වාර්තාව පිළිවෙල කරලා අධ්‍යක්ෂක කාර්යාලය වෙත එවනු ලබන්නේ අදාල අංශය විසින් අදාල අංශයේ ස්ථානාධිපති සහකාර නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු මාර්ගයෙන් තමයි අධ්‍යක්ෂකතුමා වෙත එවන්නේ.

ප්‍ර: මගේ ප්‍රශ්නය වුණේ මේ X 94 ලේඛනය කවුද පිළියෙල කරේ කියලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: අධ්‍යක්ෂක කාර්යාලයෙන් තමයි අවසන් වාර්තාව පිළියෙල වෙන්නේ නමුත් එතනදි පාදක කරගන්නේ අදාල අංශයෙන් එවනු ලබන වාර්තාව

ප්‍ර: මෙම X 94 තිබෙන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ ලිපි ශීර්ෂයක් මතනේ ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මේ ලිපි ශීර්ෂයට මෙම තොරතුර ඇතුලත් කරේ කුමන කාර්යාලයෙන් ද කියලා ඔබට දැනීමක් තියෙනවද?

පි: අධ්‍යක්ෂක කාර්යාලයෙන් ස්වාමිනි

ප්‍ර: මේ ඇතුලත් කිරීම සිදු කරේ ඔබද ?

පි: මේ කථා කරන්නේ අවුරු එක හමාරකටත් වැඩිය පරණ සිද්ධියක් ගැන මගේ මම සහ මගේ branch එකේ ඉන්නවා මට සහයවීමට නිලධාරින් පිරිසක් මේ වාර්තාව ලිපි ශීර්ෂයට හරියටම ඇතුලත් කරේ කවුද කියන එක මගේ මතකයේ නැහැ ස්වාමිනි.

ප්‍ර: මේ ලිපි ශීර්ෂයට මේ ඇතුලත් කරපු කරුණු ඔබ කියා සිටියා ඒ ඇතුලත් කිරිම කරන්නේ ඒ අදාල අංශයෙන් ලැබෙන වාර්තාවට අනුව කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

මෙතැන් සිට යමුනා මිය

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව ප.ව. 7.30
පෙර සටහන් ගැනීම ල/ලේ වන්දිමා.
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක .

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර ඔබලා මේ X 94 පිළියෙල කිරීමේදී අදාල අංශයෙන් ලැබුණු වාර්තා ඒ ආකාරයෙන්ම නැවත Re produce කිරීමක් එහෙම නැත්නම් ඒ ආකාරයෙන්ම ඇතුලත් කිරිමක්ද, සිදුකරනු ලබන්නේ නැත්නම් ඔබලා විසිනුත් යම්යම් කරුණු ඇතුලත් කරනවාද ?

උ මූලික වාර්තාවක් ස්වාමිනි අධ්‍යක්ෂකතුමා වෙත ලැබීමෙන් අනතුරුව සාමාන්‍යයෙන් සිදුවන ක්‍රමවේදය ඒ වාර්තාවේ තියෙන කරුණු මොනාහරි ගැන වැඩිදුර විශ්ලේෂණයක් කරන්න ඕනේනම් අදාළ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂක ස්ථානාධිපතිත් සමඟ අධ්‍යක්ෂතුමා කතා කරනවා ඒ වාර්තාවේ මොනවහරි වෙනසක් සිදු වෙනවා නම් ඒ නිළධාරින් එක්ක කතා කරලා ඒ නිළධාරිගෙන් නැවත කෙටුම්පතක් ගෙන්නාගෙන එහෙම නැත්නම් මෙන්න මේ දේවල් ඇතුලත් වෙන්න ඕනේ කියලා අධ්‍යක්ෂතුමා උපදෙස් ලබා දෙනවා ඒ අනුව තමයි ස්වාමීනි අධ්‍යක්ෂ කාර්යාලයේ අවසන් වාර්තාව පිළියෙල වන්නේ

ප්‍ර ඒ කියන්නේ X 94 අධ්‍යක්ෂතුමාගේ නියෝගයක් මත පිලියෙල කරනලද ලේඛණයක්ද?

උ අවසන් රාජ්‍ය බුද්ධි සේවාවෙන් බාහිර පාර්ශවයකට යැවෙන සියලුම වාර්තා අධ්‍යක්ෂතුමාගේ පරික්ෂාවකින් පසුව තමයි ස්වාමීනි යවන්නේ එතනදී අධ්‍යක්ෂතුමාට හැඟෙනවා නම යම්කිසි වෙනස්කමක් කරන්න කියලා ඒක නිරන්තරයෙන් කෙරෙනවා ස්වාමිනි.

ප්‍ර නෑ මං අහන්නේ මේ X94 අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයෙන් යොමු කිරීමේදී මේ පිළියෙල කරපු X 94 අධ්‍යක්ෂතුමාගේ නියෝගයක් යටතේ පිළියෙල කරන ලද්දක්ද?

උ උපදෙස් සහ නියෝග අනුව

ප්‍ර මේ X 94 අත්සන් කරලා තියෙන්නේ අධ්‍යක්ෂවරයා එවකට සිටි,

උ අධ්‍යක්ෂතුමා අත්සන් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර එතුමා එය කියවලා බලලාද අත්සන් කලේ කියලා මතකයක් තියෙනවාද?

උ අධ්‍යක්ෂතුමා අනිවාර්යයෙන් වාර්තා කියවලා තමයි ස්වාමීනි අත්සන් කරන්නේ

සාක්ෂිකාරිය වෙත X439 ලේඛනය පෙන්වා සිටියි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර සාක්ෂිකාරිය මෙම X.439 කියන ලේඛණයට සම්බන්ධිත ලේඛණ කිහිපයක් තිබෙනවා. පරීක්ෂා කරලා බලලා ඔබට කීමට හැකියාවක් තියෙනවාද, මෙම ලේඛණයන් එකක් හෝ කිහිපයක් ඔබගේ අවධානයට පැමිණියාද? නැද්ද? කියලා. නැත්නම් ඔබ එය පරීක්ෂාවට ලක්වුනාද කියලා?

උ මෙම වාර්තාව මගේ අවධානයට ලක්වෙලා නැහැ ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

X.439 සහ ඊට ඇති ඇමුණුම් සාක්ෂිකාරියගේ අවධානයට යොමුවී නැති බව සාක්ෂිකාරිය ප්‍රකාශ කරයි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර මා ඔබට කියා සිටියහොත්, අර ඔබ විසින් අධ්‍යක්ෂකතුමාගේ උපදෙස් මත නියෝජ්‍ය අධ්‍යක්ෂක සහ සහකාර අධ්‍යක්ෂකවරුන් වෙත යොමුකරානේ අර X.435 කියන whats App පණිවිඩ?

උ එහෙමයි ස්වාමීනී.

ප්‍ර ඒ whats App පණිවිඩ ඉන් අනතුරුව X.113 A කියන ලේඛණයත්, ඔබ කියා සිටියා සහකාර අධ්‍යක්ෂකවරයා වෙත යොමු කළ බව?

උ X.113 A ලේඛණය මට නැවත පරීක්ෂා කරන්න පුළුවන්ද? නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා වෙත යොමු කළේ ස්වාමීනී.

ප්‍ර ඔබ දැන් පරීක්ෂා කරපු X.439 සහ ඊට සම්බන්ධිත අනිකුත් ලේඛණ මෙම X.435 කියන whats App පණිවිඩය සහ X 113 A වලට අදාළව ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද වාර්තාවක්ද?

උ විමර්ශණ වාර්තාව මගේ පරිශීලනයට ලැබෙන්නෙ නැහැ ස්වාමීනී, ගොඩක් අවස්ථාවල

ප්‍ර ඒ විමර්ශණ වාර්තාවන් අධ්‍යක්ෂකවරයා වෙත ඉදිරිපත් වීමක් වෙනවාද නැද්ද කියන්න ඔබට දැනීමක් තියෙනවාද?

උ විමර්ශණ වාර්තාවන් අධ්‍යක්ෂකවරයා වෙත ඉදිරිපත් වෙනවා ස්වාමීනී, ඇතැම් අවස්ථාවල අධ්‍යක්ෂක කාර්යාලය හරහා එහෙම නැත්නම් ඒ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරු, සහකාර අධ්‍යක්ෂකවරු ස්ථානාධිපතිවරු ඇවිල්ලා අධ්‍යක්ෂකතුමාත් එක්ක සාකච්ඡා කරන අවස්ථාවන්හි යොමුවෙනවා ස්වාමීනී.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර ඔබ කියන හැටියට රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙන යම් තොරතුරක්, බුද්ධි තොරතුරක් වශයෙන් වර්ධනය කරලා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක

FAIR COMMENT BY JEZEEM

විසින් වෙනත් බාහිර පාර්ශවයකට යැවීමට පෙර ඒ සම්බන්ධයෙන් පවත්වාගෙන ගිය විමර්ශණ ගොනුව රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වෙත ලැබෙනවාද?

උ බෙහෝ අවස්ථාවල ලැබෙනවා ස්වාමීනි

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා</u>

සාක්ෂිකාරිය වෙත X.191 පෙන්වා සිටී.

ප්‍ර මෙම X.191 ලේඛණය රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වෙත, එකී බුද්ධි සේවාවේ කිසියම් කොට්ඨාශයක නියෝජ්‍ය අධ්‍යක්ෂක විසින් යොමුකර ඇති වාර්තාවක් කිව්වොත් නිවැරදිද?

උ යොමුකිරීමට සකස් කර ඇති වාර්තාවක් ස්වාමීනි, නමුත් මේකේ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමාගේ අත්සනක් නැහැ. මේ වාර්තාවේ සහ ඔවුන්ගේ අංකයක් සඳහන් වෙලා නැහැ. ඒක නිසා මේක නිවැරදිව අධ්‍යක්ෂක කාර්යාලයට යොමු වුවාද කියන එක මට කියන්න අමාරුයි ස්වාමීනි.

ප්‍ර සාක්ෂිකාරිය වෙත X. 192 පෙන්වා සිටී.
මෙම X.192 නියෝජ්‍ය අධ්‍යක්ෂක විසින්, රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා වෙත අත්සන් කර ඉදිරිපත් කර ඇති ලේඛණයක්ද?

උ නිවැරදියි ස්වාමීනි.

ප්‍ර මෙම ලේඛණය කිසියම් වූ අවස්ථාවක ඔබගේ අවධානයට හෝ ඔබගේ පරිශීලනයට හෝ පරීක්ෂාවට ලක්වුනාද?

උ ලේඛණයක් අධ්‍යක්ෂක කාර්යාලයට ලැබුණු අවස්ථාවල ස්වාමීනි directly අධ්‍යක්ෂකතුමාගේ අවධානයට එය යොමු කරනවා. මේ ලේඛණය අධ්‍යක්ෂකතුමා වෙත අධ්‍යක්ෂක කාර්යාලය හරහා ලැබී ඇති ලේඛණයක් වෙන්න ඕන. මට ඒක නිශ්චිතව කියන්න බැහැ ස්වාමීනි. ඒ කියන්නෙ කාලය වැඩි හින්දා සහ ඒ කියන්නෙ ගොඩක් පරණ document එකක් හින්දා.
X.94 පෙන්වා සිටී.

ප්‍ර ඔබට කීමට හැකියාවක් තිබේද X.94 සහ X.192 යන ලේඛණ දෙකෙන් ඔබගේ කාර්යාලයෙන්, අධ්‍යක්ෂකවරයාගේ කාර්යාලයෙන් පිළියෙල කරපු ලේඛණයක් තියෙනවාද කියලා?

උ ලිපි ශීර්ෂයට print out එක ලබාගන්නේ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ස්වාමීනි, ඒ හැරෙන්නට අපි content වෙනස් කරලා, යම් විෂයක් සම්බන්ධයෙන් තියෙන content එක වෙනස් කරලා, ලිපි පිළියෙල කිරීමක් සිදුවෙන්නේ නැහැ. පිළියෙල කිරීම කියන එකෙන් මා අදහස් කරන්නේ, ඒකේ තියෙන format කිරීම.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඔබට කීමට හැකියාවක් තිබේද? මේ X.192 අධ්‍යක්ෂකවරයා කාර්යාලය හරහා, අධ්‍යක්ෂතුමා වෙත යොමුවූ ලේඛණයක්ද නැද්ද කියලා?

උ අධ්‍යක්ෂක කාර්යාලය හරහා යොමුවන හැම ලිපියකම ස්වාමීනි, සීල් එකක් තියෙනවා අධ්‍යක්ෂක කාර්යාලයේ මෙතන තියෙන්නේ, මේකට අදාළව පිටු 2යි. ඒ පිටු දෙකේ අධ්‍යක්ෂක කාර්යාලයේ සිල් එකක් වැදිලා නැහැ. මම දන්නේ නැහැ ස්වාමීනි මේකට අඩංගුවෙලා තිබුණාද කියලා තව paper set ගොඩක්. නමුත් මේක අධ්‍යක්ෂකතුමාගේ අවධානයට යොමුවෙච්ච ලිපියක් කියන එක මට කියන්න පුළුවන් ස්වාමීනි. අධ්‍යක්ෂකතුමාගේ endorsement තියෙන හින්දා.

වෙනත් ප්‍රශ්ණ නොමැති බව දන්වයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර සාක්ෂිකාරිය මම ඔබගේ අවධානය මා මීට පෙර අර ඔබගෙන් අසන ලද ප්‍රශ්ණයට නැවත යොමුකරනවා. අප්‍රේල් මාසේ 4 වෙනිදා විදේශීය බුද්ධි ආයතනයකින් ලබාදුන්න තොරතුර සම්බන්ධයෙන්. ඔබ කීවා ආයතනය ඉල්ලා තිබෙනවා, ලිඛිතව යම්කිසි ප්‍රතිචාරයක් දක්වන්න කියලා.

උ එම ලිපියේ එහෙම සඳහනක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර එතකොට ඔබ ඊට පසුව කිවා එවැනි ප්‍රතිචාරයක් දැක්වීම සඳහා වෙනම විමර්ශන ගොනුවක් තියෙනවා කියලා.

උ ප්‍රතිචාරයක් දැක්වීම සඳහා පමණක්ම නොවේ ස්වාමීනි, ඒ තොරතුරේ තිබෙන කරුණු රහසිගත පරීක්ෂණ තුළින් අනාවරණය කරගැනීමට විමර්ශනයක් කෙරෙනවා.

ප්‍ර ඒකට වෙනම විමර්ශණ ගොනුවක් අරිනවාද? නැත්නම් තිබෙන විමර්ශණ ගොනුවකින්ද කරන්නේ?

උ ඒ අංශය විසින් තමයි ස්වාමීනි, විමර්ශණ ගොනුව ආරම්භ කරලා පවත්වාගෙන යන්නේ. එතකොට මේ සම්බන්ධයෙන් ඔවුන් වෙනම විමර්ශණ ගොනුවක් ආරම්භ කරාද කියන එක ගැන මට දැනිමක් නැහැ ස්වාමිනි, ඒ විමර්ශණ වලින් අනාවරණය කරගන්නා කරුණු මත තමයි අපි අදාළ පාර්ශවයට පිළිතුරක් යොමුකරන්නේ ස්වාමීනි.

මේ අවස්ථාවේදී සාක්ෂිකාරිය විසින් ලබා දුන්න සාක්ෂිය හේතුවෙන් කොමිෂන් සභා පනතේ 7වන වගන්තිය යටතේ, රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක සුරේෂ් සලේ මහතාට පහත සඳහන් නියෝගය කොමිෂන් සභාව කරනවා.

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් 4 වෙනි දින විදේශීය බුද්ධි ආයතනය විසින් ලබාදුන් ප්‍රහාරයක් විය හැකි බවට වූ, වාර්තාවෙන් ඉල්ලා ඇති පරිදි එම ආයතනයට, නැත්නම් එම තොරතුරුකරුට ප්‍රතිචාරයක් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අදාළව රාජ්‍ය බුද්ධි සේවයේ යම් අංශයකින් විමර්ශණයක් කිරීම සඳහා අළුතින් විවෘත කරන ලද, නැතහොත් පවත්වාගෙන ගිය විමර්ශණ ගොනුවක, කරන ලද විමර්ශණ සටහන්වලට අනුව එම විදේශීය බුද්ධි ආයතනයේ නියෝජිතයා වෙත, ලබාදෙන ලද තොරතුරු සම්බන්ධයෙන් ප්‍රතිචාරයක් දැක්වීම සඳහා උපකාර කරගන්නා ලද නැතහොත් අවසාන නිරීක්ෂණ සටහන්වල සහතික පිටපතක් , රහස්‍ය කවරයක යොදා, කොමිෂන් සභාවේ ලේකම්ට 2020 ඔක්තෝම්බර් මස 23 වෙනිදින සවස 3.00ට පෙර ලබාදෙන ලෙසට නියෝග කරමි. එම තොරතුරු ලබාදීමේදී සලකා බැලිය යුත්තේ, මෙම කොමිෂන් සභාවට අවශ්‍ය වන්නේ , 2019 අප්‍රේල් 04 ලැබුණ තොරතුර සම්බන්ධයෙන් විදේශීය බුද්ධි ආයතනයේ නියෝජිතයා වෙත, රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක විසින් කරන ලද ප්‍රතිචාරය කුමක්ද යන්න දැනගැනීම සඳහා වන බව සලකා බැලිය යුතුය.

ප සාක්ෂිකාරිය රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාගේ නිළ කාමරයේ hot line එකක් තියෙනවාද?

උ hot line එකක් තිබුණා ස්වාමීනි, ඒක කොයිතරම් දුරට පාවිච්චි කෙරුනාද කියන එක ගැන මට අවබෝධයක් නැහැ ස්වාමීනි.

ප ඒකට අංකයක් තියෙනවාද?

උ ඒකට ටෙලිකොම් සමාගමේ දුරකථන අංකයක් ලබාදීලා තිබුණා ස්වාමීනි.

ප ඔබ ඒ අංකය මේ කොමිෂන් සභාවේ විමර්ශණ ඒකකයට ලබා දුන්නානේ?

උ මගේ මතකයේ හැටියට ලබාදුන්නා ස්වාමීනි.

ප එවැනි hot line එකක දුරකථන අංකයක් මතක තියාගැනීමට ඔබට අවශ්‍යතාවයක් තිබෙනවාද, එම දුරකථන අංකය ක්‍රියාවිරහිතව තියනවානම්?

උ ස්වාමීනි මගේ මතකයේ ඇත්ත වශයෙන්ම තිබුණේ නැහැ, ඒ statement එක ගනිද්දී, මම ඒක අධ්‍යක්ෂක කාර්යාලයෙන් විමසීම් කරලා තමයි ලබාදුන්නේ.

ප එතකොට කාර්යාලයේ විමසීමක් කරද්දී, එම hot line එක සක්‍රීය පවතිනවාද, නැද්ද කියන එක සම්බන්ධයෙන් විමසීමක් කෙරුවාද?

උ මම ඒ ගැන විමසීමක් කෙරුවේ නැහැ.

ප ඔබ ඒ ගැන දන්නේ නැහැ?

උ විමසීමක් කරේ නැහැ ස්වාමීනි.

ප එය සක්‍රීයව පවතිනවාද, නැද්ද කියන එක ඔබට කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද?

Proceedings Secretary Copy
FAIR COMMENT BY JEZEEM

උ ඒ සම්බන්ධයෙන් මාගේ මතකයේ නැහැ ස්වාමීනි. අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ

ප්‍ර දැන් රාජ්‍ය බුද්ධි සේවයේ අධයක්ෂකවරයා විටින් විට, යම් යම් රැස්වීම්වල බහුවිධ මාධ්‍යය ඉදිරිපත් කිරීමේ කෙරුවානේ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඒ බහුවිධ මාධ්‍ය ඉදිරිපත් කිරීම් සඳහා එම බහුවිධ මාධ්‍ය සකස් කෙරුවේ කවුද?

උ මූලික වශයෙන් සකස් කරන්නේ අදාළ අංශවලින් ස්වාමීනි. අදාළ අංශවලින් සකස් කරලා hard copy එකක් අධ්‍යක්ෂක කාර්යාලයට එවුවාට පස්සේ, අධ්‍යක්ෂකතුමා වෙත ඉදිරිපත් කරනවා. ඒක පරීක්ෂා කරලා අවශ්‍ය slid මේවා කියලා අධ්‍යක්ෂකතුමා කිව්වාට පස්සේ, අධ්‍යක්ෂක කාර්යාලයෙන් ඒ ටික compile කරලා දෙනවා ස්වාමීනි.

ප්‍ර ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ ඒ ඒ අංශවල ඒ අදාළ විෂයන් සම්බන්ධයෙන් save කරලා තියෙන බහුවිධ මාධ්‍ය ඉදිරිපත් කිරීම් බොහොමයක් තියෙනවාද?

උ ඒ ගැන මට අදහසක් නැහැ ස්වාමීනි. ඒ අංශවල තියෙන දේවල් ගැන අදහසක් නැහැ.නමුත් අධ්‍යක්ෂකතුමා යම් මාතෘකාවක් සම්බන්ධයෙන් presentation එකක් ඉල්ලුවොත්, ඒ කට්ටිය ඒක සකස් කරලා එවනවා ස්වාමීනි.

ප්‍ර ඒක අධ්‍යක්ෂකවරයා වෙත ලැබෙන්නේ ඔබගේ කාර්යාලය හරහාද?

උ මගේ කාර්යාලයට hard copy එකක් එවනවා ස්වාමීනි ගොඩක් වෙලාවට.

ප්‍ර ඊට පස්සෙ ඔබගේ කාර්යාලයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

උ hard copy එක අධ්‍යක්ෂකතුමාගේ පරීක්ෂාවට ඉදිරිපත් කරනවා. ඊට පස්සේ අධ්‍යක්ෂකතුමා මාර්ක් කරලා දෙනවා. මෙන්න මේ ස්ලයිස් ටික තමයි මේ presentation එකට ඕන කියලා, ඊට පස්සේ අපි අදාළ අංශ අමතලා ඒ soft copy එක ගෙන්වා ගන්නවා ස්වාමීනි. ඒ අදාළ slides ටික පමණක් හදලා අධ්‍යක්ෂතුමා වෙත ඉදිරිපත් කරනවා.

ප්‍ර එතකොට ඒ ඔබගේ කාර්යාලය විසින් හදන, ඒ බහුවිධ මාධ්‍ය ඉදිරිපත් කිරීම් ඔබගේ කාර්යාලයේ ගබඩා කරලා තිබෙනවාද කොහේ හරි?

උ මාගේ කාර්යාලයේ අවසන් සකස් කිරීම වෙනකම් විතරයි ස්වාමීනි ගබඩාවෙන්නේ, finalize වුනහම අධ්‍යක්ෂකතුමාගේ custody එකේ තමයි තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර එතකොට ඔබගේ කාර්යාලයේ ඒ වෙනකම් තිබ්බ පිටපත්වලට මොකද වෙන්නේ?

උ අපි Delete කරනවා ස්වාමීනි. පිටපත් තබාගන්නේ නැහැ ස්වාමීනි.

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා යම්කිසි රැස්වීම්වල කරන ලද ඉදිරිපත් කිරීම් මොනවාද නැද්ද කියන එක සොයා ගැනීමට ක්‍රමවේදයක් නැහැ?

උ අධ්‍යක්ෂතුමාගෙන් විමසිම පමණයි ස්වාමීනි.

ප්‍ර එතකොට ඔබ විසින් අධ්‍යක්ෂකවරයාට ඉදිරිපත් කරනු ලබන එම බහුවිධ මාධ්‍ය ඉදිරිපත් කිරීම් ඔහු භාරයේද තිබෙන්නේ ඊටපස්සේ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔහු භාරයේ කොතනද තියෙන්නේ?

උ ඒ ගැන මට අදහසක් නැහැ ස්වාමීනි.

ප්‍ර මම මේ සියළු ප්‍රශ්ණ යොමු කරන්නේ 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදාට පෙර? එක ප්‍රශ්නයක්වත් ඊට පස්සේ අදාළ වෙන්නේ නැහැ හරි?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබ පිළිතුරු ලබාදුන්නේ ඒ පදනම මතද?

උ ඒ පදනම මත ස්වාමීනි.

ප්‍ර එතකොට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා යම් ඉදිරිපත් කිරීමක් කෙරුවාද? නැද්ද කියන එක පසුවිපරමක් කිරීමට හැකියාවක් තියෙන්නේ ඔහුගේ දැනුමෙන් සහ ඔහු යම්කිසි ස්ථානයක එය ගබඩා කිරීම පරීක්ෂා කිරීමෙන් පසුවද?

උ එහෙමයි ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා</u>.

ප්‍ර සමරකෝන් මහත්මිය දැන් ඔබ මේ රාජ්‍ය බුද්ධි සේවයට ඇතුලත් වෙන්න ඉස්සරවෙලා කලින් හිටියේ ජාතික රහස් තොරතුරු කාර්යාංශයත්, ජාතික බුද්ධි සේවයත්, දෙකේම එකතුවේ සම්පූර්ණ සේවා කාලය ඔබේ කොච්චරද?

උ වැඩිය වේ ගතකරපු මාස 4ට අමතරව ස්වාමීනි, 98 ජනවාරි මස සිට මම මේ වන තෙක් රාජ්‍ය බුද්ධි සේවාවේ රාජකාරි කරනවා.

ප්‍ර එතකොට ඔබට දීර්ඝ කාලීන අත්දැකීම් තියෙනවා, ඔබ අධ්‍යක්ෂකවරුන් කිහිපදෙනෙක් යටතේම සේවය කරලත් තියෙනවා නේ?

උ අධ්‍යක්ෂකවරුන් වර්තමාන අධ්‍යක්ෂකවරයාත් ඇතුළුව අධ්‍යක්ෂක කාර්යාලයේ ස්වාමීනි අධ්‍යක්ෂකවරු තුන්දෙනෙක් සමඟ වැඩකරලා තියෙනවා.

ප්‍ර දැන් ඔබේ ඔය සේවා පළපුරුද්ද සහ අත්දැකීම මත මේ ප්‍රශ්ණය මම අහන්නේ. අප්‍රේල් මාසේ 4 වෙනිදා විදේශ සේවාවකින් ලැබිච්ච තොරතුර ලැබෙනකොට ඔබ කාර්යාලයේ හිටියේ නැහැ නේද?

උ 4 වෙනිදා තොරතුරු whats App හරහා ලැබෙන කොට ස්වාමීනි, මම කාර්යාලයේ හිටියා.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර එතකොට ඒ තොරතුර ඔබට දැනගන්නට ලැබුනේ කොයි වෙලාවෙද?

උ අධ්‍යක්ෂකතුමා මට whats App හරහා පණිවිඩය එව්වේ උදේ වරුවේ කියන එක මතකයි ස්වාමීනි, මට වෙලාව හරියට මතකයක් නැහැ.

ප්‍ර දැන් ඒ whats App පණිවිඩය ඔබට එන්න පෙර ඒ පිළිබඳව අධ්‍යක්ෂකතුමා, ඒ කියන්නේ එතකොට හිටපු නිලන්ත ජයවර්ධන නියෝජ්‍ය පොලිස්පතිතුමා ඔබට ඒ පිළිබඳව දුරකථනයෙන් හෝ දැනුම්දීමක් කළාද? මෙහෙම දෙයක් ඇවිල්ලා තියෙනවා කියලා?

උ දුරකථන ඇමතුමක් ලබාගත්තෙ නැහැ ස්වාමීනි.

ප්‍ර එතකොට ඔබ පළමුවරට මෙම තොරතුර දැනගත්තේ, ඔබ ඇහුවේ ඒ මහත්මයා ඔබට whats App පණිවිඩය එව්වාට පස්සෙද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබට ඒ පණිවිඩය දැක්ක ගමන් මොකක්ද හිතුනේ?

උ මම කරේ ස්වාමිනි හැකි ඉක්මනින්,

ප්‍ර නැහැ මම කීවේ මොකක්ද හිතුනේ කියලා?

උ මෙතන තොරතුරක් තියෙනවා කියලා ස්වාමීනි.

ප්‍ර ඒ තොරතුරේ වටිනාකමක් ඔබට දැනුනාද?

උ අනිවාර්යෙන් ස්වාමීනි.

ප්‍ර එතකොට මොකද කළේ?

උ මම හැකි ඉක්මණින් නියෝජ්‍ය අධයක්ෂකවරයාට සහ සහකාර අධ්‍යක්ෂකවරයාට යොමුකළා ස්වාමීනි.

ප්‍ර ඒ සඳහා ඔබට උපදෙස් ලැබිලා තිබුණාද අධයක්ෂකවරයාගෙන්?

උ අධ්‍යක්ෂකතුමාගෙන් උපදෙස් ලැබිලා තිබුනා.

ප්‍ර ඒකයි මම අහන්නේ, අධ්‍යක්ෂකතුමාත් ඔබත් අතර කතාවුනේ මොකක්ද මේ තොරතුර පිළිබඳව?

උ උපදෙස් ලැබී තිබුණේ ස්වාමීනි වට්ස්ඇප් පණිවිඩයක් ලෙස ඒ අවස්ථාවේදී

ප්‍ර ඒකේ මොකක්ද කියලා තිබුණේ?

උ මේ පණිවිඩය සහකාර අධ්‍යක්ෂකවරයාට සහ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට යොමු කර වාර්තාවක් කැඳවන්න උපදෙසක් තමයි තිබුනේ ස්වාමීනි.

ප්‍ර ඔබ ඊට පස්සෙ ඒ පිළිබඳව නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට සහ සහකාර අධ්‍යක්ෂකවරයාට යවන්න ඉස්සෙල්ලා කතාකරලවත් කිව්වද මෙහෙම තොරතුරක් ගැන?

උ මම ඉස්සෙල්ලා කළේ පණිවිඩය යොමු කරපු එක ස්වාමීනි. ඉන් අනතුරුව දුරකථන ඇමතුමක් දීලා සහකාර අධ්‍යක්ෂකවරයා සම්බන්ධ කරගන්න හැකිවුනා. එතුමාට දැනුම් දුන්නා. නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා සම්බන්ධ කරගන්න හැකියාවක් ලැබුනේ නැහැ. නමුත් මගේ මතකයේ තියෙනවා මම සහකාර අධ්‍යක්ෂකවරයාට ඒ බවත් කිව්වා කියලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර මොකක්ද ඔබ කීවේ?

උ වට්ස්ඇප් හරහා තොරතුරක් යොමුකරලා තියෙනවා. අධ්‍යක්ෂකතුමා මට උපදෙස් දීලා තියෙනවා ඒ සම්බන්ධයෙන් ඔබතුමාට සහ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමාට යොමුකරන්න කියලා. මම ඒ විදියට ඒක එවලා තියෙනවා. සහ අධ්‍යක්ෂකතුමා වාර්තාවක් කැඳවනවා කියන එක ස්වාමිනි.

ප්‍ර දැන් මේ තොරතුර පිළිබඳව මීට වඩා ඔබ එදා ඒ මොහොතේ යමක් කළාද?

උ නැහැ ස්වාමීනි.

ප්‍ර කිසි දෙයක් කළේ නැහැ?

උ print out එකක් අරගෙන මම යොමුකරපු බවට note එකක් දාලා තියාගත්තා ස්වාමීනි.

ප්‍ර කොහේද තිබ්බේ?

උ මගේ සන්තකයේ.

ප්‍ර ඊට පස්සේ ඔබ වෙනත් රාජකාරීවල නිරත වුනාද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එතකොට ඔය තොරතුර සම්බන්ධයෙන් නැවත වරක් ඔබ අවධානය යොමු වුනේ කොයිවෙලාවේද?

උ ඒක මට හරියටම මතක නැහැ ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර මිසිස් සමරකෝන් දැන් ඔය නිලන්ත ජයවර්ධන මහතා ඔබට whats App එකක් දීලා කීවානේ, සහකාර අධ්‍යක්ෂකටයි, නියෝජ්‍ය අධ්‍යක්ෂකටයි යවන්න කියලා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබ සඳහන් කළා ඔබ whats App එකෙන් print out ටී එකක් අරගෙන සටහනක් දාලා ඔබගේ ගොනුවේ තබාගත්තා කියලා ?

උ මා ළඟ කැලැන්ඩර් file එකක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර දැන් එතකොට අර සහකාර අධ්‍යක්ෂක සහ නියෝජ්‍ය අධ්‍යක්ෂක ඔබ කරපු ආකාරයට ඒ whats App පනිවිඩයේ print out එකක් අරගෙන අධ්‍යක්ෂකතුමා සමඟ කටයුතු කිරීම සඳහා minutes sheet එහෙම දාපු file එකක් ඉහළට පහළට ගියාද?

උ minutes sheet එකක්.

ප්‍ර සටහන් දාපු?

උ සටහන් දාපු file එකක් අධ්‍යක්ෂකතුමාට යොමු කෙරෙනවා ස්වාමීනි විමර්ශනත් සමඟම.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර කොයි අංශයෙන්ද ඒ file එකක් එන්නේ, දෙන්නම එව්වාද සහකාර අධ්‍යක්ෂකයි, නියෝජ්‍ය අධ්‍යක්ෂකයි දෙන්නම?

උ වෙන වෙනම file එවීමක් සිදුවෙන්නේ නැහැ ස්වාමීනි. එකම අංශය නිසා. ස්ථානාධිපතිගේ වාර්තාව සහ සහකාර අධ්‍යක්ෂකතුමා, නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමාගේ මාර්ගයෙන් වාර්තාවක් අධ්‍යක්ෂකතුමාට ලැබෙන්න සලස්වනවා.

ප්‍ර ඒ කියන්නේ අවසාන සටහන අධ්‍යක්ෂකට දාන්නේ නියෝජ්‍ය අධ්‍යක්ෂක?

උ එහෙමයි ස්වාමීනි.
නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා නොමැති අවස්ථාවක් වුනොත්, සහකාර අධ්‍යක්ෂකතුමා යොමු කරනවා.

ප්‍ර ඒ file එක තියෙන්නේ කා ළඟද? එතකොට තියෙන්නේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ළඟ නේද?

උ ඒ ගැන මට අදහසක් නැහැ ස්වාමීනි. අදාළ අංශයේ තියෙනවා කියන එක පොදුවේ මම දන්නවා. හාරයේ තියෙන්නේ කාගෙද කියන එක විශේෂයෙන් දන්නේ නැහැ.

ප්‍ර ඔබ හරහාද ඒ file එක අධ්‍යක්ෂකතුමාට යන්නෙ?

උ අධ්‍යක්ෂකතුමාට file එක සාමාන්‍ය විදියට රෙජිස්ට්‍රරය හරහා එව්වොත්, මා හරහා යනවා ස්වාමීනි.

ප්‍ර එතකොට ඔබ ඒ file එක බලනවාද සාමාන්‍යයෙන්, අධ්‍යක්ෂකතුමාට යවනකොට?

උ අධ්‍යක්ෂකතුමාට යොමුකරලා තියෙනවාද කියන එක බලනවා ස්වාමීනි, ඒ හැරෙන්න මම ඒ අංශයෙන් විතරක් නෙවෙයි ස්වාමිනි වාර්තා එන්නේ, අංශ ගොඩක් තියෙනවා. ඒ හින්දා පෞද්ගලිකව හැම වාර්තාවකට කන්ටෙන්ට් එක මම අධ්‍යයනය කරන්නෙ නැහැ ස්වාමිනි.

ප්‍ර සටහනක් දාලා තියෙනවාද කියන එක දැන් අන්තිමටම අධ්‍යක්ෂකතුමා සටහනක් දානවානේ ආපහු file එක යවනකොට, එතකොට ඔබ බලනවාද ඒ ගැන?

උ එතුමාගේ සටහන මම අනිවාර්යෙන් බලනවා ස්වාමිනි. කාටද යොමුකරලා තියෙන්නේ කියන එක සහ මොනවද දිලා තියෙන උපදෙස් කියන එක ගැන මම අවධානයට ලක්කරනවා ස්වාමිනි.

ප්‍ර එතකොට එහෙම බලන අවස්ථාවකදී ඔබට නිරීක්ෂණය වුනාද ඔය අධ්‍යක්ෂතුමා ඔය විදේශීය බුද්ධි තොරතුරු ආයතනයට දෙන්න ඕන කියපු, feed back එකක් ලිඛිතව දැන්වුවේ නැති වුවත්, එතුමා එතුමාගේ නියෝජ්‍ය අධ්‍යක්ෂකට සටහනක් දාලා තියෙනවා, මම මේ පහත කරුණු මගේ counter part එක්ක කතා කලා කියලා. මේ තොරතුර පිළිබඳව.

උ මගේ මතකයේ නැහැ ස්වාමිනි. ඒක ගොනු පරීක්ෂා කරන්න වෙනවා එහෙම වුනොත්.

FAIR COMMENT — BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකාරියගෙන් ප්‍රශ්ණ ඇසීමට අවස්ථාවක් අවශ්‍ය නොවන බව අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපානන් වෙනුවෙන් පෙනි සිටින උගත් ජනාධිපති නීතීඥ වරයා දන්වයි. සාක්ෂිකාරියගෙන් ප්‍රශ්ණ ඇසිමට අවස්ථාවක් අවශ්‍ය නොවන බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතීඥවරිය දන්වයි.

සාක්ෂිකාරිය මුදාහරිමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.10.20 වේලාව: පෙ.ව.10.30

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා (පැමිණ නැත) සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා, රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මෙම සාක්ෂිකරුගෙන් සාක්ෂි ලබාගැනීම අප්‍රසිද්ධියේ ලබාගන්නා බව සටහන් කරනවා.

සාක්ෂිකරියගේ නම : **තිළිණා ප්‍රීති දෝන විජේසිංහ ජයවර්ධන.**
වයස : **අවුරුදු 54**
ජාතිය : **සිංහල**
ආගම : **බෞද්ධ**
තනතුර : **කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී.**
සේවා කරන ස්ථානය: **රාජ්‍ය බුද්ධි සේවාව.**
ප්‍රතිඥා දෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: ජයවර්ධන මහත්මිය ඔබ මෙයට පෙර ගරු අධිකරණයක හෝ කොමිෂමක හෝ සාක්ෂිදිලා තියෙනව ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: එහෙම නම් මම ඔබෙන් ප්‍රශ්න අහනවා?

උ: හොඳමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ එය තේරුම් අරගෙන එයට පිළිතුරු දෙනවා. ප්‍රථමයෙන්ම අහන ප්‍රශ්නයට ඔබ ඔව්ද නැද්ද එකහ ද නැද්ද කියන ආකාරයේ කෙටි පිළිතුරු දෙන්න පුළුවන් හැම අවස්ථාවකදිම එහෙම පිළිතුරු දෙන්න ඊට පසුව ඔබට එය යම් පැහැදිලි කිරීමක් කරන්න තියෙනව නම් එය කරන්නට පුළුවන්. යම් හෙයකින් මම ඔබෙන් අහන ප්‍රශ්න ඔබට තේරෙන්නේ නැත්නම් මට ඒ පිළිබඳව දැනුම් දෙන්න එතකොට මම පැහැදිලි කරලා ඔබෙන් අහන්නවා. ඒ වගේම ගරු කොමසාරිස්තුමන්ලා ඔබෙන් යම් යම් අවස්ථ වලදී ප්‍රශ්න විමසනු ලබයි. පැහැදිලි ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ පොලිස් දෙපාර්දමේන්තුවේ සේවයට බැඳුණේ කවදද?

උ: 1989 ජනවාරි මාසේ 02 වැනිදා.

ප්‍ර: මා කිවොත් නිවැරදි ද ඔබ පොලිස් දෙපාර්තමේන්තුවට ආධුනික උප පොලිස් පරීක්ෂකවරියක් ලෙසට බැඳුණා කියලා?

උ: නිවැරදි ස්වාමීනි.

ප්‍ර: එසේ බැඳීමෙන් පසුව ඔබ සෘජුව අනුයුක්ත කරනු ලැබුවේ රාජ්‍ය බුද්ධි සේවයට කිව්වොත් එය නිවැරදිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ 2019 අප්‍රේල් මාසේ 04 වැනිදා කුමන තනතුරක් ද දැරුවේ? පොලිස් දෙපාර්තමේන්තුව වශයෙන් ගත්තාම ?

උ: පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වර්තමාන තනතුරු දැරුවේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට දරමින් සිටියා?

උ: ඔව්.

ප්‍ර: එතකොට රාජ්‍ය බුද්ධි සේවාව ගත්තාම ඔබේ තියෙන ආයතනික ව්‍යුහය ගත්තාම ඔබ කුමන තනතුරක් ද දැරුවේ?

උ: ස්වාමීනි මම නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරයක් දරනවා.

ප්‍ර: ඔබ 2019. 04 වැනි මාසේ 04 වැනිදා වෙන කොට එහෙම නම් එම නියෝජ්‍ය අධ්‍යක්ෂක ධුරය දැරුවා කියලා මා කිව්වොත් නිවැරදිද?

උ: නිවැරදි ස්වාමීනි.

ප්‍ර: ඔබට ඒ වන විට පැවරිලා තිබුණු රාජකාරි කටයුතු එම ධුරයේ මොනවා ද කියලා කෙටියෙන් සඳහන් කරන්නට පුළුවන් ද?

උ: ස්වාමීනි මම නියෝජ්‍ය අධ්‍යක්ෂ කොට්ඨාශයක් වශයෙන් ආරක්ෂක නිෂ්කාශන කොට්ඨාශය භාරව කටයුතු කරනවා. ඊට අමතරව වයඹ පළාත අධීක්ෂණය සිදු කරනවා.

ප්‍ර: එතකොට ඔබ වයඹ පළාත අධීක්ෂණය කරනවාය කියලා කීමෙන් මොකද්ද අදහස් කරන්නේ පැහිදිලි කරන්න පුළුවන් ද?

උ: ස්වාමීනි අපේ රාජකාරි වපසරිය තුළ පළාතේ තිබෙන අපේ ආයතනය රාජ්‍ය බුද්ධි සේවාවේ අනුයුක්තව තියෙන දිසා බුද්ධි සේවා කාර්යාංශ පිහිටලා තියෙනවා. ඒවාහි අධීක්ෂණ කටයුතු පරිපාලනය ඒ වගේ අපට රාජකාරි පැවරිලා තියෙනවා. ඒ පළාත තුළ රාජකාරි ඉටු කරන්න.

ප්‍ර: එතකොට මාවනැල්ල ප්‍රදේශය එන්නේ ඔබේ ඔය වයඹ ප්‍රදේශයට ද ?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: ඔබට යම් අවස්ථාවකදී සහරාන් පිළිබඳව දැනගන්නට ලැබුණ ද?

උ: ස්වාමීනි අපිට උපදෙස් සාකච්ඡා තියෙනවා ඇතැම් අවස්ථාවලදී එවැනි අවස්ථාවලදී මම සහරාන් ගැන අහලා තියෙනවා.

ප්‍ර: මොන වගේ අවස්ථාවන්වලදී ද ඒ සාකච්ඡා පැවතිලා තියෙන්නේ ජයවර්ධන මහත්මිය ?

උ: සාමාන්‍යයෙන් අපිට අධ්‍යක්ෂතුමාගේ සාකච්ඡාවන් තියෙනවා. එවැනි අවස්ථාවන් වලදී ඔය එක එක විශේෂ අවස්ථාවන් ඔය සහරාන් පිළිබඳව ඒ කියන්නේ ඔවුන්ගේ IS සංවිධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධව එහෙම දැනුවත් වීම කරන අවස්ථාවලදී දැනගන්න ලැබිලා තියෙනවා.

ප්‍ර: ඒ වගේ තමයි ඔබට දැනගන්න ලැබිලා තියනේනේ?

උ: එහෙමයි.

ප්‍ර: ඔබ දැනගෙන හිටිය ද සහරාන් නැමැත්තා ආගමික අන්තවාදය සම්බන්ධයෙන් කටයුතු කරන තැනැත්තෙක් බව ඒ සාකච්ඡා වලදී?

උ: ඔව්. ඔහු ආගමික අන්තවාදයේ නිරත පුද්ගලයෙක් කියන එක අහලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එවැනි පුද්ගලයින් සම්බන්ධයෙන් ඔබේ සේවාවේ පරීක්ෂණ කරන්නේ කටයුතු කරන්නේ කුමන අංශයක් විසින් ද?

FAIR COMMENT — BY JEZEEM —

උ: අපේ සේවාවේ එම විෂය ආවරණය කරනු ලබන්නේ ඒ වෙනම කොට්ඨාශයක් තියෙනවා ස්වාමීනි. ඒක හඳුන්වන්නේ Q කොට්ඨාශය කියලා.

ප්‍ර: එතකොට ඔබේ අංශයෙන් ඒ සම්බන්ධව කටයුතු කරන්නේ නැද්ද?

උ: මගේ අංශයෙන් එම කටයුතු කරන්නේ ඒ කියන්නේ එම පරීක්ෂණ කටයුතු කෙරෙන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබට දැනගන්න ලැබුණද විදේශයකින් යම් තොරතුරක් ලැබිලා තිබුණය කියලා රාජ්‍ය බුද්ධි සේවාවට 2019 අප්‍රේල් මාසේ 04 වැනිදා ශ්‍රී ලංකාව තුළ යම් ප්‍රහාරයන් දියත් කිරීමට කණ්ඩායමක් විසින් සැලසුම් සිදු කරලා තිබෙන බවට?

උ: නැත ස්වාමීනි.

X 192 සාක්ෂිකාරියට පෙන්වා සිටී.

ප්‍ර: මා ඔබේ අවධානයට යොමු කරන X 192 ලේඛනය පෙන්වනවා. ඔබ පිළිගන්නව ද මා ඔබට කිව්වොත් මෙම X 192 ලේඛනය රාජ්‍ය බුද්ධි සේවාව තුළ පිළියළ කරන ලද ලේඛනයක් කියලා?

උ: මේක මට හැඟෙන විදියට අධ්‍යක්ෂකතුමා වෙත ආමන්ත්‍රණය කරලා නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙනුවට අත්සන් කරපු ලිව්මක්. මට මේක මගේ දැනීමේ හැටියට මට හිතෙනවා මේක රාජ්‍ය බුද්ධි සේවාවේ වාර්තාවක් කියලා.

ප්‍ර: ඔබ ඒ පිළිතුර දෙන ගමන් සඳහන් කෙරුවා ඔබේ දැනීමේ හැටියට හිතෙනවා කියලා මෙය රාජ්‍ය බුද්ධි සේවාවේ ලිපියක් කියලා. ඇයි ඔබ ඒ වගේ අදහසක් ප්‍රකාශ කරේ ඒ වගේ පිළිතුරක් දුන්නේ?

උ: මෙතැන අත්සනේ තියෙනවා සංකේත අංකයක් සහිතව යොමු වෙලා තියෙනවා. අධ්‍යක්ෂතුමාට යොමු කරලා තියෙන්නේ රාජ්‍ය බුද්ධි සේවාව කියන එකත් තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ ඔබේ අභ්‍යන්තර ලේඛන ඒ ආකාරයට අධ්‍යක්ෂකවරයාට යොමු කරන අවස්ථාවේ දී එය අත්සන් කරනු ලබන තැනැත්තා විසින් තමන්ගේ අදාළ අංශයේ ඒ රහස් කේත අංකය යොදනවද?

උ: එහස් කේත අංකය අපිට ලබාලා තියෙනවා. කේත අංක ලබාදීලා තියෙනවා. අපි සාමාන්‍යයෙන් අත්සන් කරන කොට ඒ කේත අංකය යොදනවා. ඉතිං මෙතැන එහෙම තියෙනවා. මං විශ්වාස කරනවා මේක රාජ්‍ය බුද්ධි සේවාව තුළ සංසරණය වෙච්ච ලිපියක් කියලා ස්වාමීනි.

ප්‍ර: ජයවර්ධන මහත්මිය ඒ අනුව යම් ලේඛයක් පරීක්ෂා කෙරුවාහම කෙනෙකුට නිගමනක් ඒ කියන්නේ ඔබේ ආයතනය කෙරෙහි කෙනෙකුට දැනගන්න පුළුවන් ද එම ලේඛනය අධ්‍යක්ෂකවරයා වෙත ඉදිරිපත් කරලා තියෙන්නේ කුමන නිලධාරියෙක් විසින් ද කියලා. ඒ කේත අංකය තිබෙන කොට?

FAIR COMMENT — BY JEZEEM

උ: මේකේ කේත අංකය මෙතැන තිබෙනවා. නිලධාරියා කවුද කියන එක පිළිබඳව මේ කේත අංකය නැවත කේත අංක සටහන් තියෙනවා. ඒ තැන්වලින් තමයි කවුද කියන එක බලන්න ඕන. නමුත් මෙතැන එම කොට්ඨාශය තුළින් තමයි ගිහින් තියෙන්නේ කියන එක මට කියන්න පුළුවන්. කවුද කියන එක මට කියන්න අපහසුයි ස්වාමීනි.

ප්‍ර: එතකොට මේ X 192 කියන ලේඛනය ඔබ මීට පෙර දැකලා තියෙනව ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: යම් අවස්ථාවකදී 2019 අප්‍රේල් මාසේ 04 වැනිදාත් 2019 අප්‍රේල් මාසේ 08 වැනිදාත් අතර කාලය තුළදී ඔබට උපදෙසක් ලැබුණ ද මෙම X 192 හි නම් සඳහන් තැනැත්තා කියවලා බලන්න ඒකේ දෙවැනි ඡේදයේ නම් කිහිපයක් තියෙනවා. සහරාන් හෂීම්, ජලාල් කිතාල් , රිල්වාන්, සජිත් මවුලවී, සහිඩ්, මිල්හාන් කියන තැනැත්තන්. ඒ අය පිළිබඳව තොරතුරු සොයන්නට කියලා උපදෙසක් ලැබුණ ද?

උ: ස්වාමීනි ඒ දින වකවානු නැවත මට කියනව නම්.

ප්‍ර: මා ඔබේ කලින් අවධානයට යොමු කරා විදේශයකින් රාජ්‍ය බුද්ධි සේවාවට 2019 අප්‍රේල් මාසේ 04 වැනිදා ලැබුණු තොරතුරක් පිළිබඳව?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ දින ඉදලා 2019 අප්‍රේල් මාසේ 08 වැනිදා වන තුරු ඒ කාලය තුළදී ඔබට X 192 හි සඳහන් 02 වැනි ඡේදයේ සඳහන් මේ නම් සඳහන් පුද්ගලයින් පිළිබඳව විමර්ශනය කරන්නට හෝ විමර්ශනය කරවන්නට හෝ සොයා බලන්න කියලා උපදෙස් ලැබුණ ද ඔබේ අධ්‍යක්ෂකවරයාගෙන් හෝ වෙනත් යම් නිලධාරියෙක්ගෙන්?

උ: නැත ස්වාමීනි. මට උපදෙස් ලැබුණේ නැහැ.

ප්‍ර: ඔබ ඔබේ පිළිතුරක සඳහන් කරනු ලැබුවා Q කියන desk එක සම්බන්ධව ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම desk එක මගින් කටයුතු කරන්නේ කුමන කරුණු වලට අදාළව ද?

උ: එම කොට්ඨාශය මඟින් ආවරණය කරන්නේ මුස්ලිම් අන්තවාදයට සම්බන්ධ කරුණු තමයි ඒ ගොල්ලන්ගේ විෂය පථය වෙලා තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර: එතකොට X 192 හි 02 වන ඡේදයේ සඳහන් නම් ඇති පුද්ගලයින් මුස්ලිම් අනත්වාදයට ආශ්‍රිතව ඔවුන්ගේ නම් ගම් හෙළිවෙලා තියෙනව නම් ඒ සම්බන්ධයෙන් විමර්ශන කරන්නට තිබෙනවා නම් ඒ විමර්ශන ඔබේ රාජ්‍ය බුද්ධි සේවාවේ කරනු ලබන්නේ කවරකු විසින් ද?

උ: මෙම පුද්ගලයන් සම්බන්ධව මම කලින් කිව්ව කොට්ඨාශය තමයි විමර්ශනය සිදු කරනු ලබන්නේ.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් විමර්ශනය කරන ඒ අංශයට ඔබ කිව්වේ Q අංශය කියලා?

උ: Q අංශය ස්වාමීනි.

ප්‍ර: එම අංශයේ නිලධාරින් රට පුරා ව්‍යාප්තව ඉන්නව ද?

උ: ස්වාමීනි එම කොට්ඨාශයේ නිලධාරින් රට පුරා ව්‍යාප්ත වෙනවා අවස්ථානුකූලව. ඒ ගොල්ලොන්ට අවශ්‍ය අවස්ථාවලදී.

ප්‍ර: නැහැ මං කියන්නේ සාමාන්‍යයෙන්?

උ: සාමාන්‍යයෙන් ස්වාමීනි මට දැනුමක් නැහැ ඒ අංශය විසින් කරන රාජකාරිවලට ඒ නිලධාරින් දිවයින පුරා විසුරුවලා තිබෙනව ද කියන එක ගැන මට අවබෝධයන් නැහැ ස්වාමීනි. ඒක ඒ කොට්ඨාශය විසින් කරන රාජකාරියක් ස්වාමීනි. ඉතිං විශේෂිත ඒ කියන්නේ එහෙම දෙයක් ඒ ගොල්ලො කරනව ඒ කියන්නේ තිබුණ ද කියන එක මටත් පැහැදිලි උත්තරයක් දෙන්න අපහසුයි ස්වාමීනි.

ප්‍ර: එහෙනම් කියන්න දැන් ඔබ මේ ධුරය දැරුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂක වයඹ පළාත භාරවනේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට පළාත් භාරව ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂකවරු ඉන්නවනේ රාජ්‍ය බුද්ධි සේවයේ?

උ: පළාත් භාරව ඉන්නවා. ඔව් ස්වාමීනි.

ප්‍ර: ඇයි එහෙම පළාත් භාරව එහෙම ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂකවරු පත් කරලා ඉන්නේ?

උ: ස්වාමීනි පළාත් භාරව ඉන්න අපේ වගකීම තියෙන්නේ එහෙ නිලධාරින්ගේ පරිපාලනය ඒ කටයුතු හොයා බැලීම සහ ජාතික ආරක්ෂාවට ප්‍රාදේශිය මට්ටමේ යම් තියෙන තර්ජන සම්බන්ධව මේ ඒ කියන්නේ නිලධාරින් ලව්වා ඒ බුද්ධි තොරතුරු එක්රැස් කිරීම මෙහෙයවීම ඒ වගේම විශේෂිත රාජකාරි අවස්ථාවලදී ඒ වගේ දේවල් වලට කටයුතු කිරීම තමයි අපේ වගකීම තියෙන්නේ.

ප්‍ර: එතකොට ඔබ පළාත භාරව ඉන්න පළාතේ නිලධාරින් සෘජුව ඔබ සමඟ ද ඉස්සෙල්ලා සම්බන්ධ වෙන්නේ?

උ: ස්වාමීනි මා සමඟත් සම්බන්ධ වෙනවා . දැන් ඔබ ඉස්සෙල්ලා අහපු ඒ විවිධ අපේ අංශ තියෙනවානේ ස්වාමීනි. අපේ ඉලක්ක කිහිපයක් ගොඩාක් ආවරණය කරනවානේ. එතකොට ඒ ඉලක්ක ආවරණය කරන නිලධාරින්ට අවස්ථාව තියෙනවා ඒ පළාත් වල සිටින අපේ යටතේ ඉන්න නිලධාරින් හරහා ඒ ගොල්ලොන්ගේ අවශ්‍ය පරීක්ෂණ කටයුතුවලට අවශ්‍ය දායකත්වය ඒ ගොල්ලොන්ට ලබාගන්න.

ප්‍ර: ඒ ක්‍රියාදාමයට ඔබව දැනුවත් කරන්න අවශ්‍ය නැද්ද?

උ: එහෙම නැතුව මේ කරන්න පුළුවන් ස්වාමීනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: සාමාන්‍යයෙන් දැනුවත් කරන්න ඕනද?

උ: සාමාන්‍යයෙන් එහෙම දැනුවත් කරන අවස්ථාත් එනවා ස්වාමීනි. නමුත් නොදැනුවත්ව එහෙම කරන අවස්ථාත් තියෙනවා ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකාරිය දැන් ඔබ වයඹ පළාත භාරව හිටියට ඔබ ඉන්නේ ප්‍රධාන කාර්යාලයේ කේම්බ්‍රිජ් ප්‍රදේශයේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට වයඹ පළාත තුල කාර්යාලයක් නැහැ නේද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් මේ ප්‍රාදේශීය වශයෙන් යම් යම් කටයුතු පිළිබඳව සොයා බලන්න නිරීක්ෂණය කරන්න කවුරු හරි යනව නම් යන්න ඕන Head office එකෙන්මයි ප්‍රධාන කාර්යාලයෙන්මයි එහෙම නේද වෙන්නේ?

උ: මට පැහැදිලි නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ප්‍රාදේශීය උදාහරණයක් හැටියට වනාතවිල්ලුවේ පරීක්ෂණ කටයුතු කරන්න වයඹ පලාතේ කවුරුත් ස්ථාපනය වෙලා නැහැ යන්න ඕන කොළඹින්මයි?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: එහෙනම්?

උ: වයඹ පළාත තුළ අපේ තියෙනවා ස්ථාන 09 ක් තියෙනවා ස්ථාපනය වෙලා තියෙනවා. අධීක්ෂණය කරනවා ස්ථාන 09 ක් තියෙනවා. එතකොට ඒ ස්ථානවල නිලධාරින් ස්ථානගත වෙලා ඉන්නවා. ඒ ගොල්ලො ඒ ගොල්ලොන්ගේ ප්‍රදේශවල තියෙන දේවල් ඒ ගොල්ලෝ තොරතුරු අපිට හොයලා දැනුම් දෙනවා. නමුත් අර වගේ කිව්වේ වනාතවිල්ලුව වගේ සිද්ධියක් ආවොත් ඒක විශේෂිත දෙයක් කියලා මං හිතනවා. ඒ අවස්ථාවේදී ඒ වගේ අවස්ථාවට කොළඹින් ගිහිල්ලා ඒ අදාළ විමර්ශනය සිදු කරනු ලබනවා.

ප්‍ර: දැන් සභාපතිතුමා ඔබෙන් ඇහුවේ ඉස්සෙල්ලා දැන් Q Desk එකේ අය වයඹ පළාතේ කොහේ හරි විසිරිලා ඉන්නව ද කියලනේ. ඔබ කිව්වා නැහැ කියලා?

උ: ස්වාමීනි විසිරිලා සිටීම පිළිබඳව මට අවබෝධයක් නැහැ ස්වාමීනි. මොකද ඒ ගොල්ලො විසිරිලා කියන්නේ ඒ ගොල්ලොන්ගේ යවන්නේ එහෙම. මම දන්නේ නැහැ. මම නොදැනුවත්ව ඒ ගොල්ලෝ එහෙ ඉන්න පුළුවන්. මම ඒක පිළිබඳව ඒ ගොල්ලො විසිරිලා ඉන්නව ද කියන එක මට එහෙම කියන්න දන්නේ නැහැ ස්වාමීනි.

****

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අශේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: කොමසාරිස්තුමන්ලා විසින් අසන ලද ප්‍රශ්නයකට දිගුවක් වශයෙන් මා ඔබෙන් දැනගන්නට කැමති ඔබේ පළාත්වල දිසා බුද්ධි කාර්යාංශ තිබෙනවානේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: අර ඔබ ඒ වගේම පැහැදිලි කිරීමේ දී කෙරුවා ලංකාවේ වයඹ පළාත තුළ ස්ථාන 09 ක ස්ථානගත. වෙලා තියෙනවාය කියලා රාජ්‍ය බුද්ධි සේවය ?

උ: නැහැ ස්වාමීනි. මම අදහස් කලේ වයඹ පළාත තුළ .

ප්‍ර: වයඹ පළාත තුළ ස්තාන 09 ක ස්ථානගත වෙලා ඉන්නවා ?

උ: ඔව. ඉන්නවා.

ප්‍ර: එතකොට ඔබට පැහැදිලි කරන්න පුළුවන් ද ඔබ දන්නව නම් රාජ්‍ය බුද්ධි සේවාවේ දිසා බුද්ධි කාර්යාංශය කොයි ආකාරයට ද ස්ථාපිත කරලා තියෙන්නේ කියලා ලංකාවේ?

උ: දිසා බුද්ධි කාර්යාංශය ලංකාව තුළ ආවරණය වන විදියට ස්ථාපිත කරලා තියෙනවා. නමුත් මං සංඛ්‍යාත්මකව මට මෙතැනදි කියන්න අපහසුයි. මට ඒ පිළිබඳව දැනුමක් නැහැ ස්වාමීනි. ලංකාවම ආවරණය වන පරිදි දිසා බුද්ධි කාර්යාංශය ස්ථාපනය කරලා තියෙනවා.

ප්‍ර: එතකොට ඔබට කියන්න පුළුවන් ද දිසා බුද්ධි කාර්යාංශයක සාමාන්‍යයෙන් අනුයුක්ත කරලා ඉන්නේ ඒ අංශයට මොන වගේ නිලධාරින් ද කියලා ස්ථානාධිපතිවරයෙක් සාමාන්‍යනේ ඉන්නව ද?

උ: ස්ථානාධිපතිවරයෙක් ඉන්නවා. පොලිස් පරීක්ෂක නිලයේ කෙනෙක් ඉන්නවා. සමහර පොලිස් පරීක්ෂක නිලයක් හොබවන්නේ නැති සැරයන්වරුන් ස්ථානාධිපති තනතුරු දරනවා. එතකොට ඒ ගොල්ලොන්ට ඒ තියෙන පොලිස් ස්ථාන වපසරිය අනුව ඒ නිලධාරින් ස්ථානගතවීම් සිදු කරලා තියෙනවා.

ප්‍ර: එතකොට ඒ ස්ථානාධිපතිවරයාට සහාය වීම සඳහා තවත් කාර්ය මණ්ඩලයක් ඔබේ සේවාවෙන් ඒ ස්ථානයේ අනුයුක්ත කරලා තියෙනවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඊළඟට මට දැනගන්නට පුළුවන් ද බිම් මට්ටමෙන් යම් තොරතුරු රැස්කිරීමක් සිදුවුවෝතින් එය කොයි ආකාරයට ද අධ්‍යක්ෂවරයා දක්වා ගමන් කරන්නේ කියලා?

උ: ස්වාමීනි බිම් මට්ටමෙන් තොරතුරු රැස්කිරීම් සිදු කරනවා එතකොට තොරතුරු සාමාන්‍යයෙන් රැස්කරන නිලධාරියා ඔහුගේ ඉස්සෙල්ලා අපි කතා කරා වගේ ස්ථානාධිපති මඟින් සහකාර අධ්‍යක්ෂකවරයෙක් ඉන්නවා. එ ගොල්ලොන්ව අධීක්ෂණය කරනවා. ඒ අධීක්ෂණය සහකාර අධයක්ෂකවරයා හරහා යොමු කරන අවස්ථාත් තියෙනවා. එතකොට ඒ වගේම දැන් අපි උදාහරණයකට ගත්තොත් අපි හැම විෂයම ආවරණය

FAIR COMMENT — BY JEZEEM —

කරනවනේ අපේ ඉලක්ක දීලා තියෙනවානේ කොට්ඨාශවලට. ඒ ගන්න තොරතුර යම් අංශයක ඉලක්කයක් වෙන කොට අනිවාර්යයෙන්ම ඒ ගොල්ලෝ අනිවාර්යෙන් කියන වචනය නෙවෙයි බොහෝ වෙලාවට ඒ ගොල්ලො ඒකේ පිටපතක් අදාළ අංශයටත් යොමු කතරනවා. අපට විෂය බෙදලා දීලා තිබෙනවා ඒ තොරතුර අනුව අපි දන්නවා ඒ තොරතුරේ මේ කොටස කරන්නේ මේ අංශය කියලා. එතකොට එහෙම ඒ යොමු කිරීම සෘජුව ඒ අංශයටත් යොමු වෙනවා. සහකාර අධ්‍යක්ෂකවරයා හරහාත් ඇවිල්ලා සමහර විට ඒකේ තියෙන වටිනාකම අනුව මා වෙතත් යොමු වෙනවා. ඉන් අනතුරුව මමත් ඒකේ තත්ත්වය බලලා ඒකේ තියෙන වැදගත්කම අනුව ඇතැම් දේවල් අධ්‍යක්ෂකතුමාගේ දක්වාම යන වෙලාවළුත් තියෙනවා. නැත්තන් අපේ මට්ටමෙන් ඊළඟ මගේ සම මට්ටමේ ඉන්න නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් හරහා යොමු කරන අවස්ථාවලුත් තියෙනවා.

ප්‍ර: දැන් ඔබ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරියනේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබට ඉහළින් තමයි අධ්‍යක්ෂකවරයා ඉන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: එහෙමනම් ඇයි ඔබ කියන්නේ ඔබට ලැබෙන තොරතුරු ඇතැම් අවස්ථාවලදී අනෙක් නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුවන් හරහා යොමු කරන්නේ කියලා?

උ: ස්වාමීනි තොරතුරක් ආව සැණින් ඒ තොරතුරේ තියෙන කරුණ සම්බන්ධව අපිට අවබෝධයක් නැහැ . ඒ අපේ පළාතෙන් එන තොරතුරක් පමණයි. නමුත් ඒක පිළිබඳව යම් වටිනාකමක් ගන්න ඒ අදාළ ඉලක්කය ආවරණය කරන නියෝජ්‍ය අධයක්ෂතුමාට යොමු කිරීම තුළින් එයා මේක බලනවා මේක යම් වැදගත්කමත් තියෙන දෙයක්ද ඒ ගොල්ලොන්ට මේක සම්බන්ධව ක්‍රියාකරන්න තව දේවල් ඒ ගොල්ලොන්ගේ අතේ තියෙනව ද කියන එක. ඒ හින්දා තමයි එහෙම ඒ ගොල්ලොන්ට යොමු කරන්නේ. මොකද අපිට තීරණයක් ගන්න තරමට අපේ දැනුමක් ඒ විෂයට අදාළව නැති හින්දා ස්වාමීනි.

ප්‍ර: එහෙම නම් ඔබ මීට ස්වල්ප වෙලාවකට දුන්න පිළිතුරු මම සංක්ෂිප්ත කරලා මෙහෙම කිව්වොත් නිවැරදිද? බිම් මට්ටමෙන් සොයාගනු ලබන තොරතුරු එම නිලධාරියාගේ දිසා බුද්ධි කාර්යාංශයේ ස්ථානාධිපතිවරයා හරහා අදාළ සහකාර අධ්‍යක්ෂවරයා වෙත යොමු වෙනවා. සහකාර අධ්‍යක්ෂකවරයා ඒක පරීක්ෂා කරලා එය ඔහුගේ විෂයට හෝ ඇයගේ විෂයට අදාළ කරුණක් නෙවෙයි නම් එතකොට අදාළ අංශය වෙත යොමු කරනවා. ඒ කියන්නේ ඒ අදාළ විෂය භාරව ඉන්න නිලධාරියා වෙත යොමු කරනවා. එහෙම ද සිදුවන්නේ ?

FAIR COMMENT BY JEZEEM

උ: නැත ස්වාමීනි. මා පොඩි නිවැරදි කිරීමක් කරන්නම්. මං කිව්වේ බිම් මට්ටමේම ස්ථානාධිපතිවරු විසින්ම ඒ ඉලක්කය ආවරණය කරන ස්ථානාධිපතිවරු ඉන්නවනේ ඒ ගොල්ලොන්ගේ මට්ටමට. ඒ ගොල්ලෝ ඉහළට යොමු කරන ගමන්ම පිටපතක් අදාළ ඒ අංශයේ ඉන්න ස්ථානාධිපතිටත් යොමු කරනවා. මොකද කඩිනමින් ඒ තොරතුරු දැනුවත් කිරීමේ අවශ්‍යතාවය මත.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඒ කියන්නේ ඔබගේ අංශයේ ඔබට භාර පළාතේ තිබෙන බිම් මට්ටමෙන් ලැබෙන ඕනෑම තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවයේ අදාළ අංශයට යොමු කිරීමේ දී එම තොරතුර ඔබටත් ලැබෙනවා මෙන්න මේ විදියේ තොරතුරක් ලැබුණා මේ අංශයට යොමු කෙරුවා කියලා?

උ: නැත ස්වාමීනි. මට හැම තොරතුරක්ම ඒ විදියට එන්නේ නැහැ. බිම් මට්ටමේ ඒ විදියට බෙදාහැරෙනවා. ස්ථානාධිපතිවරයා විසින් සහකාර අධ්‍යක්ෂකවරයාටත් යොමු වෙනවා සහකාර අධ්‍යක්ෂවරයාටත් හැම දෙයක්ම යොමු වෙනවද කියන්නම තරමට මට ඒක කියන්න අපහසුයි. මොකද අවස්ථානුකූලව ඒ තියෙන ඒකේ තියෙන වටිනාකමත් එක්ක සහකාර අධ්‍යක්ෂකවරයා අවධානය යොමු කරන්න පුළුවන් වැදත් කරුණක් නම් ඒක අනිවාර්යයෙන්ම මටත් යොමු කරනවා.

ප්‍ර: ඒ අපි බලන්නේ බිම් මට්මේ ඉදලා එන තොරතුරු නේ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: දැන් යම් අවස්ථාවක මුළු රටේම ඕනෑම තැනක සිදුවිය හැකි රටේ ආරක්ෂාවට අනතුරක් වන විදියේ තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙනවා. නැත්නම් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවය අවධානයෙන් සිටිය යුතු වෙනවා. එතකොට ඒ අවස්ථාවේ දී රාජය බුද්ධි සේවයේ ඉන්න සියළුම නිලධාරින් ඒ සම්බන්ධයෙන් අවධානයෙන් දැනුවත්ව ඉන්න ඕනම ඔබගේ පළාත ඇතුළේ ඉන්න රාජ්‍ය බුද්ධි සේවයේ සියළු නිලධාරි දැනුවත් වෙන්නේ ඔබ හරහා නේ ද?

උ: ඔව් ස්වාමීනි. මං හරහාත් දැනුවත් වෙන්න මුළු පළාතම ආවරණය වන විදියට දැනුවත්වීමක් වෙනවනම් මා මඟින් ඒක දැනුවත් කිරීම තමයි ඒක කරන්න පුළුවන්.

ප්‍ර: මං දුන්න උදාහරණයේ ඒ අනතුර රටේ ඕන තැනක වෙන්න පුළුවන්?

පි: ඔව් ස්වාමීනි.

ප්‍ර: නිශ්චිත ස්ථානයක් කියලා නැහැ ඕනම තැනක වෙන්න පුළුවන්. එතකොට ඒ සම්බන්ධයෙන් යම් පළාතක ඇතුළේ ඉන්න රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරින් ඒ පිළිබඳ අවධානයෙන් දැනුවත්ව සිටීම සිදුවිය යුතු

FAIR COMMENT
BY JEZEEM

බවට ඉහළින් අධ්‍යක්ෂකවරයා විසින් නියෝගයක් කරනව නම් එය ඔබ හරහා නේද යන්න ඕන ඔබගේ පළාතට ඔබ හරහා නේද යන්න ඕන?

උ: අධ්‍යක්ෂවරයාගේ දැනුවත්වීමක් මා හරහා යන්න ඕන ස්වාමීනි. එහෙම වෙන්න ඕන ස්වාමීනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: ගරු සභාපතිතුමා විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් ඔබ සඳහන් කරනු ලැබුවා අධ්‍යක්ෂකවරයා හරහා නැත්නම් අධ්‍යක්ෂකවරයා විසින් ලබාදෙනු ලබන යම් තොරතුරක් ඔබ හරහා යන්නට ඕනෙයි කියලා. ඒකෙන් අදහස් කරන්නේ අධ්‍යක්ෂකවරයා විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා වෙත ඒ අදාළ තොරතුර ලබාදෙනවා. එවිට නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරිය විසින් තමන් යටතේ ඉන්න කණ්ඩායම්වලට අධීක්ෂණය කරනු ලබන කණ්ඩායම් වලට ඒ තොරතුරු ලබාදෙනවා කියල ද?

උ: ඔව් ස්වාමීනි. මේ අධියක්ෂතුමා සෘජුවම අපිට දැනුවත් කිරීමක් කරන්නත් පුළුවන් නැත්නම් ඉලක්කය ආවරණය කරන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් අපිට දැනුවත් කිරීම තුළිනුත් මුළු ලංකාවටම ඒක අපි පළාත් ආවරණය කරන අයට දැනුම් දෙන්නට පුළුවන් ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඒ කුමන ක්‍රමවේදයෙන් ආවත් ඒ පළාතම ආවරන වෙන්න ඕන නම් පළාත භාරව ඉන්න ඔබ හරහා නේද?

උ: පළාත භර ඉන්න පළාතම දැනුවත් කිරීමක් පළාත භාරව ඉන්න නිලධාරියා හරහා තමයි ඒක සිදුවෙන්න ඕන ස්වාමීනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ස්වාමීනි C 04 B ලේඛනය සාක්ෂිකාරියගේ අවධානයට යොමු කරනවා.

ප්‍ර: ඔබ C 04 B ලේඛනයේ තිබෙන තොරතුරු ජයවර්ධන මහත්මිය 2019 අප්‍රේල් මාසේ 08 වැනිදට පෙර දැක්ක ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: ඔබ C 04 B ලේඛනයේ තිබෙන තොරතුරු 2019 අප්‍රේල් මාසේ 21 ට පෙර දැක්කද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කියවලා බැලුවනේ මේ තොරතුර කියෙව්වා නේද?

උ: ඔව් ස්වාමීනි.

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: යම් හෙයකින් ඔබට මේ C 04 B ලේඛනයේ තියෙන තොරතුරු පිළිබඳව ඔබේ රාජකාරි කටයුතු තුළදී 2019 අප්‍රේල් මාසේ 21 වැනිදාට පෙර දැනගන්න ලැබුණ නම් ජයවර්ධන මහත්මිය ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරියක් විදියට යම් පියවර ගනු ලබනව ද?

උ: ස්වාමීනි මේ තොරතුර ලැබුණ නම් මම මගේ පළාත ආවරණය කරන නිලධාරින් දැනුවත් කිරීමට කටයුතු කරනවා.

ප්‍ර: එය තමයි ඔබට කරන්නට පුළුවන් රජාකාරිය?

උ: දැනුවත් කරලා යම් තොරතුරු තිබෙනව නම් ඒ සම්බන්ධ සොයා බලන්න කියන එක තමයි .

ප්‍ර: ඒ උපදෙස තමයි ඔබට ඔබේ නිලධාරින්ට දෙන්න පුළුවන් කියලා කියන්නේ?

උ: දෙන්න පුළුවන් කම තියෙනවා ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඒ ඔබ ලබාදුන් පිළිතුරුවලට අමතරව මම නැවත යම් සාමාන්‍ය වශයෙන් අහන්නේ. 2019 අප්‍රේල් මාසේ 21 වැනිදා සිදුවුණු ප්‍රහාර සම්බන්ධයෙන් යම්කිසි හෝ ක්‍රියාමාර්ගයක් ඔබගේ අංශය විසින් ගතයුතු බවට එවකට රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් 2019 අප්‍රේල් මාසේ 21 වැනි දිනට පෙර ඔබට වාචිකව හෝ ලිඛිතව දැනුවත් කෙරුවද?

උ: ස්වාමීනි නැවත ඒ ප්‍රශ්නය මට අහන්න පුළුවන් ද ස්වාමීනි.

ප්‍ර: 2019 අප්‍රේල් මාසේ 21 වැනි දින රටේ සිද වූ පාස්කු දින බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් යම්කිසි රාජකාරි කටයුක්තක් කිරීමට එවකට රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා විසින් ඔබට 2019 අප්‍රේල් මාසේ 21 වැනි දිනට පෙර යම්කිසි අවස්ථාවක වාචිකව හෝ ලිඛිතව නියෝගයක් දුන්නද?

උ: මෙම තොරතුර අදාළව ද විමසීම කරන්නේ ස්වාමීනි.

ප්‍ර: ඔව්.

උ: නැත ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ ප්‍රහාරයක් සිදුවෙන්න පුළුවන් කියලා විදේශීය ආයතනයෙන් ලැබුණා බුද්ධි තොරතුර සම්බන්ධයෙන්?

උ: නැත ස්වාමීනි. මේ තොරතුරට අදාළව එහෙම දෙයක් මට ලැබුණේ නැහැ ස්වාමීනි.

****

FAIR COMMENT — BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකාරිය ඔබ වයඹ පළාත භාරව ප්‍රධානියා හැටියට පත් වුණේ කවදද?

උ: ස්වාමීනි මම වයඹ පළාත භාරව පත් වුණේ 2017 ජූලි මාසයේ 10 වැනිදා මට මතකයේ හැටියට.

ප්‍ර: ඊට පෙර ඔබ මොන අංශයේද සේවය කරේ?

උ: ඊට පෙර ස්වාමීනි මම කොළඹ උතුරු ප්‍රදේශය තමයි අධීක්ෂණය කරේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා මීට පෙර සාක්ෂි දෙමින් මොහොතකට පෙර තොරතුරු ඔබව දැනුවත් කරලා තිබුණා නම් නිලධාරින් යමක් මීට වැඩිය කරන්න තිබුණාය කියලා නේද අප්‍රේල් මාසේ 21 ප්‍රහාරය සම්බන්ධව නේද?

උ: තොරතුරු තිබුණා නම් දැනුවත් කරලා යම් තොරතුරක් ඒ සම්බන්ධව සොයා බලලා අධ්‍යක්ෂතුමා දැනුවත් කිරීම කරන්න තිබුණා. නැත්නම් ඒ අංශය දැනුවත් කිරීමට තිබුණා.

ප්‍ර: ඔබට තේරෙන විදියට හෝ ඔබට හැහෙන විදියට මේ තොරතුරු දැනුවත් කිරීමේ වගකීම කා සතුව පවතිනවද?

උ: මේ තොරතුරු ස්වාමීනි දැනුවත් කිරීම මෙම තොරතුරු අධ්‍යක්ෂතුමා වෙත ලැබෙනවා. ඊට පස්සේ අධ්‍යක්ෂතුමා විසින් විෂය ආවරණය කරනු ලබන අංශය නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වෙත දැනුවත් වීම් කරනවා මං දන්න විදියට එහෙම තමයි වෙන්නේ. ඉතිං එතකොට ඒ තොරතුරු ඒ පාර්ශවයන් විසින් තමයි ස්වාමීනි ඒ තොරතුරු අවශ්‍ය අයට දැනුවත් කිරීම් සිද්ධ කරන්න ඕන.

ප්‍ර: ඒකම තමයි මමත් අහන්නේ ඕක ඇවිල්ලා කොතනින් ඕක බෙදිලා යන්නේ? කවුද එහෙට මෙහෙට බෙදිලා යන එක තීරණය කරන්නේ. කවුද දැනුවත්වීම කළ යුත්තේ?

උ: ස්වාමීනි ඒ අභිමතය අධ්‍යක්ෂතුමාට සහ විෂය පථය ආවරණය කරන නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා විසින් තමයි ඒ තීරණ ගත යුත්තේ.

ප්‍ර: දැන් මේ හැමදෙනාම ඉන්නේ එකම වහල යට නේද?

උ: එකම වහල යට නෙවෙයි ස්වාමීනි. ස්ථාන කිහිපයක ඉන්නවා ස්වාමීනි.

ප්‍ර: නමුත් එකම පරිශ්‍රයකද?

උ: නැත ස්වාමීනි. වෙනත් ගොඩනැගිලි වෙනත් තැන්. මේ අංශයේ වෙනත් තැන්වල ඉන්නවා ස්වාමීනි.

ප්‍ර: ඔබ ඉන්නේ කේම්බ්‍රිජ් ප්‍රදේශයේ?

උ: මම ඉන්නේ කේම්බ්‍රිජ් පෙදෙසෙ ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔය තොරතුරු ලබාදිය යුතුයි කියන නියෝජය අධ්‍යක්ෂක ඉන්නේ කොහේද?

FAIR COMMENT BY JEZEEM

උ: ඒ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා ඉන්නේ මලලසේකර මාවතේ ඉන්නේ ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබට තේරෙනවද යම් ආකාරයක අතපසුවීමක් හෝ යම් දුර්වලතාවයක් සිද්ධ වෙලා තියෙනවා කියලා මේ තොරතුරු ඔබ වෙත නිසි වෙලාවට නොලැබී යාමෙන්. කා අතින් හෝ යම් අතපසුවීමක් දුර්වලතාවයක් සිද්ධ වෙලා තියෙනවා කියලා ඔබටත් වැටහෙනවද?

උ: එහෙම හිතන්න වෙන අවස්ථාවකුත් එනවා ස්වාමීනි.

****

<u>ගරු අදිකාරි මැතිනිය.</u>

ප්‍ර: Mrs. ජයවර්ධන දැන් ඔබ වයඹ පළාත සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ ඉඳලා අධික්ෂණය කරපු නිලධාරියා නේද?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඔබට කියන්නට පුළුවන් ද ඔබගේ අධ්‍යක්ෂවරයා කිව්වොත් I will deploy my surveillance teem මොකද්ද කරන්නේ කියලා ඒක කිව්වට පස්සේ?

උ: නැවත ඒ ප්‍රශ්නය මට පැහැදිලි වුණේ නැහැ ස්වාමීනි. අන්තිමට කොටස

ප්‍ර: ඔබගේ අධ්‍යක්ෂකවරයා කිව්වොත් I will deploy my surveillance team කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද ඒකේදී කරන්නේ ඊට පස්සේ?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: යම් අවස්ථාවක රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක විසින් යම් තැනැත්තෙකුට කියනවා I will deploy my surveillance teem කියනවා?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒකේ මොකද්ද අදහස් කරනවද කියලයි අහන්නේ?

****

<u>ගරු අදිකාරි මැතිනිය.</u>

ප්‍ර: ඒකෙන් පස්සේ මොකද්ද කරන ක්‍රියාකාරීත්වය? ඒකෙන් අදහස් කරන එකත් පැහැදිලි කරලා කරන ක්‍රියාව මොකද්ද කියලා පැහිදිලකරන්න?

උ: ස්වාමීනි එතැන අධ්‍යක්ෂතුමා විසින් ආවේක්ෂන රාජකාරියට නිලධාරීන් යෙදවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂතුමාගේ අභිමතය පරිදි එතුමා කණ්ඩායමක් ඒ වයඹ පළාතට දැන් ඔබතුමිය ස්වාමීනි වයඹ පළාත පිළිබඳවනේ ඇසුවේ. වයඹ පළාතට එතුමා විසින් යොමු කරනවා කණ්ඩායමක්. මේ ආවේෂණ නිලධාරි කණ්ඩායමක් යොමු කරනවා.

President Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

එතැනදි ඒක තමයි අදහස් කරන්නේ එතුමා විසින් ඒක උපදෙස් දීලා යවනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් ඔබගේ වයඹ පළාතට මේ බුද්ධි තොරතුර ලැබුණට පසුව මෙම අධ්‍යක්ෂකවරයා විසින් ඔබට නොදන්වා හෝ surveillance teem එකක් යැව්වද?

උ: මගේ දැනුමේ හැටියට මම දන්නේ නැහැ ස්වාමීනි. එතුමා යැව්වවද කියන එක. එතුමාට එහෙම යවන්න පුළුවන්කමක් තියෙනවා. මගේ නොදැනුවත්ව ඒක කරන්නත් පුළුවන් එතුමාට.

ප්‍ර: ඔබ නොදැනුවත්ව ඒක එතුමා කරත් වයඹ පළාත භාර අධීක්ෂණ නිලදාරියා ලෙස ඔබට එය පසුව හෝ දැන ගැනීමට ලැබෙන්නේ නැද්ද?

උ: එහෙම මට දැනගන්න ලැබෙන්නේ නැහැ ස්වාමීනි. එහෙම දේවල් සිද්ධ වෙනවා. මේ කියන අවස්ථාවක් පිළිබඳව මට අවබෝධයක් නැහැ ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකාරියගෙන් ප්‍රශ්න ඇසීමට අවශ්‍ය නොවන බව අතිඋතුම් මැල්කන් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරිය ප්‍රකාශ කරයි.

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවයේ ආවේක්ෂණ රාජකාරි සිදු කරන කණ්ඩායම් සෘජුව පාලනය වන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා යටතේ නේද?

උ: එහෙමයි ස්වාමීනි. අධ්‍යක්ෂතුමාගේ යටතේ තමයි එම කණ්ඩායම ඉන්නේ. එතුමාගේ අනුව අනිත් තැන්වලට අවශ්‍ය පරිදි ලබාගැනීමේ හැකියාව තියෙනවා.

ප්‍ර: ඒ අනුව රාජ්‍ය බුද්ධි සේවයේ යම් ආවේෂණයක් කරනව ද නැද්ද කියන එක තීරණය කිරීමේ සම්පූර්ණ බලය තියෙන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාට නේද?

උ: එතුමාගෙන් අවසර ගන්න ඕන මගේ දැනුමේ හැටියට එහෙම තමයි කරන්නේ ස්වාමීනි.

සාක්ෂිකාරියගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියට ලබාදෙමි.

****

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මධු ජයතිලක මහත්මිය.</u>

ප්‍ර: ජයවර්ධන මහත්මිය ඔබතුමිය මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් පැවසුවා අන්තවාදය පිළිබඳව රාජ්‍ය බුද්ධි සේවාවේ කරන්නේ Q කොට්ඨාශයෙන් කියලා?

උ: එහෙමයි ස්වාමීනි. වර්තමානයේ කරන්නේ Q කොට්ඨාශය මගින්.

ප්‍ර: ඔබතුමිය එම Q කොට්ඨාශයේ කිසියම් අවස්ථාවක සේවය කරලා තියෙනවද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: අන්තවාදය ගැන යම් තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙනව නම් එය ඔබතුමියගේ කොට්ඨාශයට ලැබෙනවද කිසිම අවස්ථාවක?

උ: අන්තවාදය සම්බන්ධ තොරතුරක් මගේ කොට්ඨාශයෙන් ආවරණය කරන්නේ නැහැ. ඒ හින්දා ලැබෙන තොරතුරු මගේ අංශයට යොමු වීමක් වෙන්නේ නැහැ ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධයෙන් දැක්වූ සහයෝගයට සාක්ෂිකාරියට කොමිෂන් සභාවේ ස්තූතිය පළ කරනවා.

සාක්ෂිකාරිය මුදාහරි.

වේලාව:පෙ.ව.11.15

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.10.20 වේලාව: පෙ.ව.11.15

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා (පැමිණ නැත) -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය
-සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

මෙම සාක්ෂිකරුගෙන් සාක්ෂි ලබාගැනීම අප්‍රසිද්ධියේ ලබාගන්නා බව සටහන් කරනවා.

සාක්ෂිකරුගේ නම : කැළුම් අබේසුන්දර දිසානායක.
වයස : අවුරුදු 55
ජාතිය : සිංහල
ආගම : බෞද්ධ
තනතුර : ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නියෝජ්‍ය අධ්‍යක්ෂක .
සේවා කරන ස්ථානය: රාජ්‍ය බුද්ධි සේවාව.
ප්‍රතිඥා දෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය.</u>

ප්‍ර: දිසානායක මහත්මයා මීට පෙර ගරු අධිකරණයක සාක්ෂිදීලා නැතුව ඇති නේද?

උ: දීලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එහෙනම් ඔබ සාක්ෂි විමසන ආකාරයට පිළිතුරු දෙන ආකාරය දන්නවනේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණේ ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙක් හැටියට කියලා මා කිව්වොත් නිවැරදිද?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඒ කවදද?

උ: 1986.02.10 වැනි දින.

ප්‍ර: ඔබ අනතුරුව රාජ්‍ය බුද්ධි සේවයට බැඳුණේ කවදාද?

උ: 2004.10. 15 වැනි දින.

ප්‍ර: ඔබ රාජ්‍ය බුද්ධි සේවයට බැඳෙන අවස්ථාව වන විට පොලිස් දෙපාර්තමේන්තුවේ දරණ ලද තනතුර මොකද්ද?

උ: ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලය.

ප්‍ර: 2019 අප්‍රේල් මාසයේ 04 වැනිදා වන කොට ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේ කුමන තනතුරක්ද දැරුවේ?

උ: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුර.

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවයේ දරණ ලද තනතුර මොකද්ද?

උ: නියෝජ්‍ය අධ්‍යක්ෂක පරිපාලන ධුරය ස්වාමීනි.

ප්‍ර: සාමාන්‍යයෙන් ඔබට එවකට පැවරිලා තිබුණ රාජකාරි කටයුතු මොන වගේද?

උ: ආයතනයේ පරිපාලන කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම. ආරක්ෂක අමාත්‍යාංශයේ අපිට වැය ශීර්ෂයන් වෙන් කරලා තියෙනවා ඒ හා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ මේ රාජ්‍ය බුද්ධි සේවාවේ පරිපාලන කටයුතුවලට අදාළව තමයි ඔබ මූලිකව කටයුතු කරන්නේ?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: ඊට අමතරව ඔබ දකුණු පළාතට අදාළව යම් රාජකාරියක් කරනව ද?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: මොකද්ද ඒ කරන රාජකාරිය?

උ: දකුණු පළාතට අනුයුක්තව තියෙන දිසා බුද්ධි සේවා කාර්යාංශවල අධීක්ෂණ කටයුතු කරනවා.

ප්‍ර: එතකොට යම් තොරතුරක් ඒ ඔබේ දකුණු පළාතේ දිසා බුද්ධි සේවා කාර්යංශයන්ට ලැබුණාම ඔබව ඒ පිළිබඳව දැනුවත් කෙරනව ද?

උ: ඒකේ ක්‍රම තියෙනවා ස්වාමීනි නිලධාරීන්ට ලැබුණම දිසා බුද්ධි සේවා කාර්යංශයේ ස්ථානාධිපති මඟින් සහකාර අධ්‍යක්ෂ මඟින් මට එනවා. එහෙම නැත්නම් ඒ ස්ථානාධිපතිතුමාට ගිහින් සහකාර අධ්‍යක්ෂක මඟින් ඒ තොරතුර අදාළ අංශය වෙත යනවා. එසේත් නැත්නම් ස්ථානාධිපතිවරු මඟින් ඒ අංශ වෙත සමහර අවස්ථාවල වැදගත්කම තියෙනව නම් එකපාරටම බැහැර කරනවා ස්වාමීනි.

ප්‍ර: යම් අවස්ථාවකදී ඔබ වෙත වාර්තා වුණා ද හම්බන්තොට සිප්පි කුලමේ පවත්වාගෙන යන ලද පුහුණු කිරීම් කඳවුරු පිළිබඳව?

උ: එහෙම වාර්තා වුණා මේ පාස්කු ප්‍රහාරයෙන් පසුව. ඊට පෙර වාර්තාවක් ලැබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දිසානායක මහත්මයා දැනගැනීම සඳහා අහන්නේ දකුණු පළාතේ දිසා බුද්ධි කාර්යාංශයේ ඔබේ නිලධාරීන් අනුයුක්ත කරලා ඉන්නව නම් ඒ වගේ තොරතුරක් ලබා ගැනීමේ යම් අපහසුතාවයක් තිබුණ ද ඔබේ නිලධාරීන්ට? එහෙම අපහසුතාවයක් තිබිලා තියෙනව නම් ඒවට හේතු විදියට ඔබට දකින්න පුළුවන් හේතු තියෙනව ද?

උ: ඒ හා සම්බන්ධයෙන් තොරතුරු නොලැබීම තමයි මං දකින්නේ හේතුව ස්වාමීනි.

ප්‍ර: එතකොට තොරතුරු ලැබෙන්නේ ඔබේ දිසා බුද්ධි කාර්යංශයන්ට කාගෙන්ද කොහොමද?

උ: ඒ රාජකාරි යොදලා ඉන්න නිලධාරීන්ගෙන් ඒ නිලධාරීන් මඟින් ඔවුන් ඇති කරගෙන ඉන්න තොරතුරු කරුවන් මාර්ගයෙන් තොරතුරු ලැබෙනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට එම සම්බන්ධතාවය යම් බිඳීමක් ඇති වුණොත් තොරතුරු ලැබීම කෙරෙහි ඒක සෘජු බලපෑමක් ඇති කරන්න පුළුවන් නේද?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: ඔබ 2019 අප්‍රේල් මාසේ 04 වැනිදා රාජ්‍ය බුද්ධි සේවයට විදේශයකින් ලැබුණු තොරතුරක් පිළිබඳව දැනගත්ත ද? ඒ තොරතුර ශ්‍රී ලංකාව තුළ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

යම් ආකාරයක ප්‍රහාරයක් යම් කණ්ඩායමක් විසින් සිදුකළ හැකිය යන තොරතුරයි?

උ: ඒ වෙන කොට ඒ තොරතුර මට ලැබිලා තිබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ වෙනකොට ඔබට ලැබිලා තිබුණේ නැහැ මං අහන්නේ ඔබට ඒ 04 වැනිදා රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණයි කියන ඒ තොරතුර පිළිබඳව ඔබට දැනගන්න ලැබුණ ද කියල?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබට එම තොරතුර ගැන 2019 අප්‍රේල් මාසේ 21 වැනිදා වන තුරුත් දැන ගන්න ලැබුණේ නැද්ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙක් විදියටනේ රාජකාරි කරන්නේ ?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: ඔබ භාරව ඉන්නවා කියලා කිව්වේ පරිපාලන අංශය?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඔබට පැහැදිලි කරන්නට පුළුවන්ද මා විසින් සඳහන් කරන ලද එම තොරතුරු ලැබුණු බවට කරුණු හෙළිවෙන්නේ රාජය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාට නම් ඇයි නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙක් වූ එසේම රාජ්‍ය බුද්ධි සේවාවේ පරිපාලන අංශය භාරව සිටි ඔබට එම තොරතුර පිළිබඳව දැනගන්නට නොලැබෙන්නේ කියලා?

උ: ඒ ලැබෙන තොරතුරු ඒ අදාල අංශයේ ඉන්න නියෝජය අධ්‍යක්ෂකවරයා වෙත තමයි ඒ තොරතුර ලැබෙන්නේ. එතකොට ගොඩක් වෙලාවට ඒ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා මඟින් තමයි ඒ හා සම්බන්ධයෙන් තොරතුර ලබාගැනීමට හැකියාව තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ සාමාන්‍ය ක්‍රමවේදය වන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ ලැබෙන තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවාවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වූ අධ්‍යක්ෂකවරයාට හෝ නැත්නම් බිම් මට්ටමේ ඉන්න යම් නිලධාරියෙක්ට හෝ ඒ තොරතුර ලැබුණාම ඔවුන් විසින් ඒවා යොමු වන්නේ ඒ අදාළ විෂය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන අංශයට කියලද ඔබ කියන්නේ?

උ: එසේය ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු යම් අවස්ථාවක රාජ්‍ය බුද්ධි සේවයට තොරතුරු ලැබෙනවා රටේ ඕනෑම තැනක යම් කිසි ත්‍රස්ත ප්‍රහාරයක් වෙන්න පුළුවන් කියන එක?

උ: එසේය.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: එතකොට ඔබ දැන් ඉන්නේ දකුණු පළාත භාර ස්ථානාධිපති වශයනේ. නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා දකුණු පළාත භාර. එතකොට ඒ වෙන්න යන ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවයේ සියළුම බුද්ධි නිලධාරින් අවධානයෙන් විමර්ශන කටයුතු සිදුකරමින් සිටීමට නම් දකුණු පළාත තුළ සිටින රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරින් දැනුවත් කිරීම සිදුවන්නේ ඔබ හරහා නේද?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: නැතුව කෙළින්ම ස්ථානගත නිලධාරින්ට රටටම පොදු වන අනතුරක් සම්බන්ධයෙන් වෙන තැනැත්තෙක් දැනුම්දීමක් කරන්නේ නැහැනේ?

උ: ගොඩක් වෙලාවට මා හරහා තමයි දැනුවත් විය යුත්තේ ස්වාමීනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

<u>C 04 B ලේඛනය සාක්ෂිකරුට පෙන්වා සිටි ස්වාමීනි.</u>

ප්‍ර: දිසානයක මහත්මයා ඔබට මා ඔබේ අවධානයට යොමු කරන ඔය C 04 B ලේඛනයේ තියෙන තොරතුර ඔබ මීට පෙර කොහේ හරි කියවලා තියෙනව ද? ඒ කියන්නේ 2019 අප්‍රේල් මාසේ 21 වැනිදට පෙර?

උ: අප්‍රේල් මාසේ 21 වැනිදට පෙර මේ තොරතුර මං දැක්කේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් මේ තොරතුර කියවලා බලන්නකෝ. ඔබට ඒ තොරතුරෙහි අඩංගු කරුණු පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලැබුණා නේද ඒ කියවීමෙන් පසුව?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: එහි තිබෙන තොරතුරු අනුව ඔබ හිතනවද මෙම තොරතුරෙහි නම් සඳහන් ප්‍රහාරයදියත් කිරීමට සම්බන්ධ විය හැකි බවට තොරතුර තියෙන පුද්ගලයින් පිළිබඳව තොරතුරු රැස්කරගැනීම වැදගත් කියලා?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: එතකොට යම් හෙයකින් ඔබට මේ තොරතුර 2019 අප්‍රේල් මාසේ 21 වැනිදට පෙර ලැබිලා තිබුණ නම් ඔබ භාරව ඉන්න දකුණු පළාත සම්බන්ධයෙන් ඔබට යම් පියවරක් ගත හැකිව තිබුණ ද ?

උ: ස්වාමීනි මේ හා සම්බන්ධයෙන් මේ තොරතුරු ලැබිලා තිබ්බ න්ම මම දකුණු පළාතේ ඉන්න නිලධාරින් දැනුවත් කරලා මේ කරුණු සනාථ කරගන්න මේ වගේ සිදුවීමක් වෙන්න තියෙනව ද කියන එක හැකියාව තියෙනවා. එහෙම තිබුණ නම් ඒ තොරතුර මට අධ්‍යක්ෂකතුමාට වාර්තා කිරීමේ හැකියාව තියෙනවා ස්වාමීනි.

****

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: 2019 අප්‍රේල් මාසේ 21 වැනි දිනට පෙර ඉස්ලාම් අන්තවාදීන්ගෙන් විය හැකි ප්‍රහාරයක් සම්බන්ධයෙන් යම්කිසි රාජකාරියක් හෝ ඔබට කිරීම සඳහා එවකට රාජ්‍ය බුද්ධි සේවයේ බුද්ධි අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන ඔබට යම්කිසි නියෝග වාචික හෝ ලිඛිතව ලබාදුන්නද?

උ: මේ ප්‍රහාරයට මේ තොරතුරු හා සම්බන්ධයෙන් කරුණු ගැන වාර්තාවක් ලබා දුන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ රටතුළ යම් ප්‍රහාරයක් වෙන්න පුළුවන් පල්ලි ගැන ආවේෂනය කරන්න රජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් ඒ පල්ලි හෝටල් විශේෂ ස්ථාන ආවරණය කරන්න කියලා යම්කිසි නියෝගයක් ඔබට රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා 2019 අප්‍රේල් මාසේ 21 දිනට පෙර ලබාදුන්නද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: රටේ විය හැකි එවැනි ප්‍රහාරයක් පිළිබඳ විදේශීය බුද්ධි තොරතුරක් රටේ රාජ්‍ය බුද්ධි සේවයට ලැබිලා ඒ සම්බන්ධයෙන් ඔබගේ පළාත තුළ යම්කිසි ක්‍රියාකාරකමක් සිදු නොකිරීම ඒ අනතුර සම්බන්ධයෙන් නිසි පරිදි ක්‍රියා නොකිරීමක් කියලා ඔබට කියන්න පුළුවන් ද නැත්නම් ඔබගේ ප්‍රතිචාරය?

උ: ස්වාමීනි මේ තොරතුරු අපිට ලැබුණ නම් දකුණු පළාතේ ඉන්න දිසා බුද්ධි සේවා නිලධාරීන් දැනුවත් කරන්න තිබ්බා. එහෙම තිබුණ නම් ඒ දැනුවත් කිරීම මත යම්කිසි තොරතුරු අපිට ලැබුණ නම් ඒ තොරතුරු ගැන අපිට වාර්තා කරන්න ඉඩ තිබුණා ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබට හිතෙන විදියට ඇයි මේ තොරතුර ඔබලා අතර මෙහෙම හුවමාරු වුණේ නැත්තේ? අයි බෙදී ගියේ නැත්තේ?

උ: ස්වාමීනි මේ තොරතුර මේ හා සම්බන්ධයෙන් ක්‍රියා කරන අංශයක් තිබෙනවා. ඒ අංශය එක්ක තමා ගොඩක් දුරට මේ ක්‍රියාකාරකම් සිදු වෙන්නේ . ඒ අංශයත් එක්ක සම්බන්ධ වුණා මිසක් අපිට ලැබුන්නේ නැති වෙන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: දැන් රාජ්‍ය බුද්ධි සේවයේ ක්‍රමවේදය වන්නේ එක අංශයකින් කරන කටයුතු සම්බන්ධයෙන් වෙන කවුරුත්ම දැනුවත් වෙන්නේ නැහැ කියන එකද?

උ: අවශ්‍ය දේ පමණක් දැනගන්නවා ස්වාමීනි. එහෙම අවශ්‍ය නොවන දේවල් සම්බන්ධයෙන් දැනුවත් වීම සිදුවෙන්නේ නැහැ.

Present Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: දැන් ඔබට දැන් හිතෙන විදියට මේ තොරතුර පිළිබඳව එදා තීරණය කරලා තිබුණ නම් ඔබ දකුණු පළාත භාරව සිටි ප්‍රධානියා හැටියට මේක ඔබ දැනගත යුතු නැහැ කියලා ඒක ඔබ හිතන්නේ හරිද?

උ: දැනගත යුතුව තිබුණා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ තීරණය ගන්නේ කවුද දැනගත්ත යුත්තේ කවුද නොදැනගත යුත්තේ කවුද කියලා තීරණය ගන්නේ කවුද?

උ: ස්වාමීනි අධ්‍යක්ෂකතුමාගේ තීරණ මත තමයි ඒවා සිදුවෙන්නේ.

ප්‍ර: දැන් ඔය ප්‍රහාරය සිදුවෙන කොට හිටපු අධ්‍යක්ෂකවරයා වුණේ නිලන්ත ජයවර්ධන නියෝජ්‍ය පොලිස්පතිවරයානේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මීට පෙර හිටපු අධ්‍යක්ෂකවරුන්ගෙත් කාර්ය භාර්යේ දී මෙවැනි දේවල් සිද්ධ වෙලා තිබුණු බවක් ඔබට මතක ද?

උ: ස්වාමීනි ගොඩක් දුරට අවශ්‍ය දේ ඒ දැනගන්න අවශ්‍ය පුද්ගලයට අවශ්‍ය දේ පමණයි ලබාදෙන්නේ. එහෙම නැති දේවල් ලබාදීමක් සිදුවෙන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ ක්‍රමවේදය ඒකයි කියලද ඔබ මේ කියන්න හදන්නේ ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඇතුළේ ඉන්න අයවත් දකුණු අතින් කරන දේ වම් අත දන්නේ නැහැ වගේ?

උ: ගොඩාක් වෙලාවට ස්වාමීනි.

****

<u>**ගරු අදිකාරි මැතිනිය.**</u>

ප්‍ර: Mr.දිසානායක ප්‍රධාන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා ලෙස දකුණු පළාතේ දිසා බුද්ධි කාර්යාලයේ කටයුතු අධීක්ෂණය කරනව නේද?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ අය දකුණු පළාතේ දිසා බුද්ධි කාර්යාලයේ නිලධාරීන්ගේ අධීක්ෂණ කටයුතු කියලා ඔබ මොනවද කරන්නේ?

උ: ස්වාමීනි පරිපාලන කටයුතු ඒ නිලධාරීන්ගේ නිවාඩු යන එකට leave papers එහෙම සම්බන්ධයෙන් සුභ සාධන කටයුතු සම්බන්ධයෙන් විමසා බලනවා පරිපාලන කටයුතු.

ප්‍ර: වෙනත්රාජ්‍ය බුද්ධි සේවාවට අයිති රාජකාරි කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය වෙන්නේ නැද්ද?

උ: රාජකාරි කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය වෙනවා ස්වාමීනි. ඒ අපේ පිහිටුවලා තියෙන අංශවල අවශ්‍යතාවයන් මත එ අංශ වලින් සෘජුව දැනුම්දීම් කරනවා ඒ අංශවල ඒ අයගේ අවශ්‍යතාවයන් ඉෂ්ඨ කර දෙන්න.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එහෙම නැතුව මගේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හරහා ගියොත් ඒ දේවල් මොනවද අවශ්‍ය කියන එක ලබාදෙනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් අංශකින් අපි කියමුකෝ Q අංශයෙන් දකුණු පළාතේ ඔබගේ බුද්ධි දිසා බුද්ධි කාර්යාංශයට මොකක් හරි රාජකාරියක් පැවරුණොත් ඒක ඔබට වාර්තා වෙන්නේ නැද්ද?

උ: සමහර අවස්ථාවලදී වාර්තා වෙන්නේ නැහැ ස්වාමීනි ඒක ඒ ගොල්ලොත් දැනුම් දෙන දේ ආපසු ඒ ගොල්ලෝම උත්තර ගන්නවා. අපිට දැනුම්දීම අවශ්‍යතාවයක් කියන එක කිව්වොත් විතරයි ඒ ගොල්ලො අපිට එවන්නේ ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් ඔය රාජකාරිය තුළ ඔබ කරන අධීක්ෂණ රාජකාරිය වැඩිපුරම තියෙන්නේ එහෙම ඔබ දන්නේ නැතුවම ද සිද්ධ වෙන දේවල් ද ඔය පළාත් කාර්යාලයේ?

උ: ස්වාමීනි දිසා බුද්ධි සේවා කාර්යාංශයේ ස්ථානාධිපතිවරුන් ගොඩක් වෙලාවට සෑම මසකම වගේ ගෙනැල්ලා උපදෙස් පන්ති පවත්වනවා. එතකොට ඒ ඒ කොට්ඨාශයන්ට අවශ්‍ය රජාකාරී මොනවද කියන ඒ නිලධාරින් ඇවිල්ලා දැනුම්දිලා ඒ දේවල් ඒ නිලධාරින් මාර්ගයෙන් සිදු කරගන්නවා.

ප්‍ර: එතකොට ඒ මාසික රැස්වීමට දැන් දිසා බුද්ධි කාර්යාලය අධීක්ෂණය කරන නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා ලෙස ඔබ සහභාගි වෙන්නේ නැද්ද?

උ: නැහැ මං අධීක්ෂණය කරන කොට්ඨාශයේ මොනව හරි අවශ්‍යතාවයක් තිබ්බොත් මං ගිහිල්ලා සාකච්ඡා කරනවා. කොළඹ ප්‍රධාන කාර්යාලයේ තියෙන කොට්ඨාශව ඉන්න නිලධාරින් තමා ඒකට ගිහිල්ලා සාකච්ඡා කරලා අවශ්‍ය කරුණු දැනුම් දෙන්නේ.

ප්‍ර: පැහැදිලි වුණේ නැහැ ඔබ දෙන උත්තරේ.

උ: ස්වාමීනි දිසා බුද්ධි කාර්යාලයේ ස්ථානාධිපතිවරුන්ට උපදෙස් පන්ති පවත්වනවා. එතකොට ඒ උපදෙස් පන්තිවල පැවැත්වීම කරන්නේ ප්‍රධාන කාර්යාලයේ කොට්ඨාශවල ඉන්න නිලධාරින්. එතකොට ඒ නිලධාරින්ගේ ඒ කොට්ඨාශයට අවශ්‍යතාවන් මොනවද කියන එක ඒ ගොල්ලො ගිහිල්ලා කියලා මෙන්න මේ මේ දේවල් මට සිද්ධ වෙන්න ඕන කියන එක ගැන මට දැනුම් දෙනවා.

ප්‍ර: උපදෙස් පන්ති නෙවෙයි දැන් ඒ ගොල්ලොන්ගේ ඒ ගොල්ලො ඉෂ්ඨ කරන රජකාරි කටයුතු පිළිබඳව ප්‍රගතිය වගේ දේවල් සාකච්ඡා කරන්නේ නැද්ද අධ්‍යක්ෂකතුමා ඒ ගොල්ලො ගෙනැල්ලා ප්‍රධාන කාර්යාලයේ?

උ: සාකච්ඡා කරන වෙලාවල් තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ සහභාගි වෙනවා ඇති නේද?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ අවස්ථාවේ දී ඔබ ඔබට හමුවුණාද අප්‍රේල් 04 වැනිදා මෙම තොරතුර ලැබුණාට පස්සේ විශේෂ Team එකක් කණ්ඩායමක්

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

ආවේශණය කිරීම සම්බන්ධයෙන් සඳහා දකුණු පළාතට යොමු කරලා තියෙනවා කියලා?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: එහෙම දාලා තිබුණේ නැහැ කියලද ඔබ කියන්නේ?

උ: එහෙම දලා තිබෙනවා කියලා තොරතුරක් ලැබුණෙත් නැහැ. නමුත් මගේ දැනීමේ හැටියට එහෙම දෙයක් සිදුවුණේ නැහැ ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ රාජ්‍ය බුද්ධි සේවය LTTE යුද්ධ කාලයෙත් හිටියා නේද?

උ: ස්වාමීනි මම 2004 රාජ්‍ය බුද්ධි සේවයට ආවේ . යුද්ධ අවසාන කාලවකවානුවේ දී.

ප්‍ර: එතකොට LTTE යුද්දේ තිබුණු කාලේ දී රටේඕනෑම තැනක යම් කිසි ප්‍රහාරයක් සිදුවීමට පුළුවන් කියලා වරින් වර තොරතුරු ලැබුණ ද රාජ්‍ය බුද්ධි සේවය?

උ: එසේ ලැබිලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: එලෙස රටේ ඕනෑම තැනක යම් ප්‍රහාරයක් සිදුවිය හැකි බවට රාජ්‍ය බුද්ධි සේවයට තොරතුරක් ලැබුණම ඒ තොරතුර පළාත් භාර නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් මාර්ගයෙන් පළාත දැනුවත් කිරීමක් සිදුවුණා ද සාමාන්‍ය ක්‍රමවේදයට අනුව?

උ: ඒ කාලවකවානුවේ ඒ විදියට සිදු වුණා ස්වාමීනි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවශ්‍යද යන්න අති උතුම් මැල්කන් කාදින්ල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයගෙන් අසමි. අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි.

සාක්ෂිකාරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයගෙන් අසමි. අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධයෙන් දැක්වූ සහයෝගයට සාක්ෂිකාරියට කොමිෂන් සභාවේ ස්තූතිය පළ කරනවා.

සාක්ෂිකරු මුදාහරි.

වේලාව:පෙ.ව.11.15

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය:2020.10.20 වෙලාව: පෙ.ව. 11.30
සටහන් කළේ - නිල්මිණි කුමාරි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා (පැමිණ නැත) -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය
-සාමාජික-

පෙනී සිටීම

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා,ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, රජයේ නීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා, රජයේ නීතිඥ චතුරංග බණ්ඩාර මහතා සමඟ රජයේ නීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මෙම සාක්ෂිකරුගෙන් සාක්ෂි ලබා ගැනීම අප්‍රසිද්ධියේ ලබා ගන්නා බව සටහන් කරනවා.

<u>සාක්ෂි කැඳවීම ආරම්භ කරමි.</u>

නම	**:**	**සේපාල මුදියන්සේලාගේ ජනක කැලුම් සෙනරත් බණ්ඩාර සෙනවිරත්න**
වයස	**:**	**අවු 57යි**
ජාතිය	**:**	**සිංහල**
ආගම	**:**	**බුද්ධාගම**
දැනට දරණ තනතුර	**:**	**ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී**
රැකියා ස්ථානය	**:**	**රාජ්‍ය බුද්ධි සේවාව**

ප්‍රතිඥා දී කැඳවයි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: සෙනවිරත්න මහත්මයා ඔබ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුනේ ආධුනික උප පොලිස් පරීක්ෂණකවරයෙක් විදියට කියලා මා කිව්වොත් නිවැරදියිද?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඒ කවදාද බැඳුණේ?

පි: 1986.02.10 වන දින.

ප්‍ර: ඔබ පොලිස් දෙපාර්තමේන්තුවට බැඳීමෙන් පස්සේ රාජ්‍ය බුද්ධි සේවාවට සම්බන්ධ වෙන්නේ කවදාද?

පි: 2003.12 මාසේ 03 වන දින ස්වාමිනි.

ප්‍ර: ඒ වන විට ඔබ පොලිස් දෙපර්තමේන්තුවේ දරණ ලද තනතුර මොකක්ද?

පි: පොලිස් පරීක්ෂක තනතුර ස්වාමිනි.

ප්‍ර: ඔබ 2019 අප්‍රේල් මාසේ 04 වෙනිදා රාජ්‍ය බුද්ධි සේවාවේ කටයුතු කරන කොට පොලිස් දෙපාර්තමේන්තුව වශයෙන් ගත්තොත් එවිට ඔබ දරණ ලද තනතුර මොකක්ද?

පි: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුර ස්වාමිනි.

ප්‍ර: ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ අභ්‍යන්තර ව්‍යුහය සම්බන්ධයෙන් සළකලා බැලුවාම දරණ ලද තනතුර මොකක්ද?

පි: නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුර ස්වාමිනි.

ප්‍ර: ඔබට නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙක් විදියට රාජකාරි කරන්නට පැවරිලා තිබුණේ කුමන අංශයන්ට අදාළවද?

පි: ස්වාමිනි වෘත්තිය සමිති, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇතුළු සංවේදී ඉලක්ක ආවරණය කරන කොට්ඨාශයක් භාරව ස්වාමිනි.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඊට අමතරව ඔබට ලංකාවේ යම් පළාතට අදාළව පරීක්ෂණ කටයුතු පැවරිලා තිබුණාද?

පි: මධ්‍යම පළාත ස්වාමිනි.

ප්‍ර: කොයි ආකාරයට මධ්‍යම පළාතය අදාලව ඔබ ඔබේ අධීක්ෂණ කටයුතු සිදු කරේ?

පි: ස්වාමිනි මා කොළඹ ප්‍රධාන කාර්යාලයේ තමයි ස්ථානගත වෙලා හිටියේ. මගේ සහකාර අධ්‍යක්ෂකවරයෙක් මහනුවර ප්‍රදේශයේ ස්ථානගත වෙලා හිටියා. මහනුවර මධ්‍යම පළාතේ තිබෙන ඒකකය සහ දිසා බුද්ධි සේවා කාර්යාංශ සහකාර අධ්‍යක්ෂක හරහා මා අධීක්ෂණ කරා ස්වාමිනි.

ප්‍ර: ඔබ ඔය සාමාන්‍ය රාජකාරිවලට අමතරව ඒවා සිදු කරන ගමන් යම් යම් අවස්ථාවන්වලදී ජනාධිපති ආරක්ෂක අංශය විසින් පවත්වන ලද යම් රැස්වීම්වලට සහභාගී වුණාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එසේ සහභාගී වුණේ රාජ්‍ය බුද්ධි සේවාවේ නියෝජිතයා විදියටද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එවැනි රැස්වීම් පවත්වනු ලැබුවේ කාගේ ප්‍රධානත්වයෙන්ද?

පි: ජනාධිපති ආරක්ෂක දිසාවේ නියෝජ්‍ය පොලිස්පති රොහාන් සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් ස්වාමිනි.

ප්‍ර: කොපමණ කාලයකට සැරයක් ඒ රැස්වීම් පවත්වනු ලැබුවද?

පි: සාමාන්‍යයෙන් මාසයකට වරක් වගේ පැවැත්වුවා ස්වාමිනි.

ප්‍ර: ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද කුමන අරමුණකින්ද රාජ්‍ය බුද්ධි සේවාවේ නියෝජිතයෙක් එම රැස්වීම්වලට සහභාගී වුණේ කියලා?

පි: මෙහිදී අතිගරු ජනාධිපතිතුමාට තියෙන තර්ජන සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් තමයි කරේ. ඒකේදී විශේෂයෙන්ම කොළඹ ප්‍රදේශයේ දී පැවැත්වෙන උද්ඝෝෂණ , විරෝධතා ඒ වගේම ජනාධිපතිතුමා සංචාරය කරන ප්‍රදේශවල තිබෙන තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම් කරා ස්වාමිනි.

ප්‍ර: එතකොට ප්‍රභූවරයාගේ ආරක්ෂාව වගේම රාජ්‍ය ආරක්ෂාව පිළිබඳවත් ඔය රැස්වීම්වලදී සාකච්ඡා කරුණු ලැබුවද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ කොයි ආකාරයටද එම රැස්වීමේදී රාජ්‍ය බුද්ධි සේවය වෙනුවෙන් කරුණු දැක්වුයේ වාචිකව කරුණු දැක්වුවද නැත්නම් බහු විධ ප්‍රක්ෂේපණ මාර්ගයෙන් කරුණු දැක්වුවද කොහොමද කළේ?

පි: වාචිකව අදහස් දැක්වීම් කළේ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ ඇරෙන්නට එම රැස්වීම්වලට සාමාන්‍යයෙන් සහභාගී වෙන තවත් අය හිටියද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කොයි වගේ නිලධාරින්ද?

FAIR COMMENT
BY JEZEEM

පි: සමහර අවස්ථාවල කොළඹ ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පතිතුමා, ඒ වගේම කොළඹ මධ්‍ය , දකුණ , උතුර කොට්ඨාශ භාර නිලධාරින් , විශේෂ කාර්යාංශය, ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය, කොළඹ බස්නාහිර බුද්ධි අංශය, විශේෂ කාර්ය බලකායේ නිලධාරින් , ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ සියලුම රාජ්‍ය නිවේදිත නිලධාරින් සහභාගී වුණා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ කිව්වා ඔබ විසින් යම් කරුණු ඉදිරිපත් කිරීම් මෙම රැස්වීම්වලදී සිදු කරනවා කියලා ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ හැරෙන්නට ඔය නම් කරන ලද අනිකුත් නිලධාරිනුත් ඒ ආකාරයට මෙම රැස්වීම්වලදී යම් යම් කරුණු ඉදිරිපත් කරනවද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එසේ ඉදිරිපත් කරන කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමක් කෙරෙනවද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එහෙමනම් යම් දෙන ලද දිනයකදී එකී රැස්වීමේදී සිදුවුනේ මොකක්ද කියන එක පිළිබඳව සටහන් තැබීමක් ඒ කියන්නේ Minute තැබීමක් සිද්ධ වෙනවද?

පි: ඒක ජනාධිපති ආරක්ෂක දිසාව මඟින් සටහන් ලබා ගැනීමක් කරා ස්වාමිනි.

ප්‍ර: එම සටහන් එම රැස්වීම්වලට සහභාගී වෙන අයට ලැබෙනවද?

පි: නැත ස්වාමිනි.

ප්‍ර: නමුත් ඔබ කියන්නේ ජනාධිපති ආරක්ෂක සේවය විසින් ඒ අදාළ සටහන් පවත්වාගෙන යනු ලබනවා කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබේ අවධානය මා යොමු කරන්න කැමැතියි 2019 ජනවාරි මාසේ 23 වෙනිදාට. එදිනට ඔබ මෙම ජනාධිපති ආරක්ෂක සේවය විසින් පවත්වනු ලබන රැස්වීමකට සහභාගී වුණා කියලා මා කිව්වොතින් එය නිවැරදිද?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: එහිදී ඔබ රාජ්‍ය බුද්ධි සේවය වෙනුවෙන් යම් කරුණු දැක්වීමක් කරාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කරුණු දැක්වීමේදී ඔබ යම් වෙලාවක සඳහන් කෙරුවද උද්ඝෝෂණ සම්බන්ධයෙන් කතා කරමින් ජනාධිපති කාර්යාලය වෙත හෝ පැමිණෙන තැනැතන්ට ඒ කියන්නේ උද්ඝෝෂකයන්ට කඳුළු ගෑස් ප්‍රහාර එල්ල කිරීම වගේ දේවල් සිදු වෙනවානම් අතිගරු ජනාධිපතිතුමාගෙන් විමසිමක් කරලා උපදෙස් ලබා ගන්නා ලෙසට එතුමා විසින් දන්වා තිබෙනවායි කියලා? එහෙම එකක් ඔබ කිව්වද?

පි: නැත ස්වාමිනි. මේක නියෝජ්‍ය පොලිස්පති රොහොන්ද සිල්වා මහත්මයා කියපු දෙයක්.

ප්‍ර: එතුමා විසින් තමයි එය කිව්වේ?

FAIR COMMENT — BY JEZEEM

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන අවස්ථාවේ දී ඔබ හිටියද?

පි: එහෙමයි ස්වාමිනි.

ස්වාමිනි 2019 ජනවාරි මස 23 වෙනි දින ජනාධිපති ආරක්ෂක දිසාව විසින් පවත්වා ඇති රැස්වීමට අදාළ නිලධාරින්ගේ ගමන් සටහන් පොතෙහි යොදා ඇති මෙම සටහන් X – 585 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්න අවසර පතනවා.

ප්‍ර: මගේ මූලික ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් ඔබ සඳහන් කරා මෙම රැස්වීම් ගරු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව පිළිබඳව ඊට ආශ්‍රිතව වූ කරුණු සාකච්ඡා කරණු ලබන රැස්වීම් බවත් එසේම රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් එම රැස්වීම්වලදී සාකච්ඡා කරනු ලබන බවත්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එහෙමනම් සෙනවිරත්න මහත්මයා මෙම රැස්වීම් තිබ්බේ 2019 ජනවාරි මාසේ 23 වෙනිදා නේද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට මට දැන ගන්නට පුළුවන්ද ඔබ විසින් රාජ්‍ය බුද්ධි සේවාවේ කරුණු ඉදිරිපත් කරනකොට එදින 2018 දෙසැම්බර් මාසේ 23,24,26 කියන දවස්වලදී මාවනැල්ල, පොතුහැර, නුවර, පේරාදෙණිය, වෙලම්බඩ යන මේ ස්ථානවල ආගමික ප්‍රතිමාවලට හානි කිරීම් පිළිබඳව වූ සිද්ධීන් මෙහිදි දැනුවත් කිරීමක් ලෙස ඉදිරිපත් නොකළේ ඇයි කියලා?

පි: දැනුවත් කිරීමක් කළේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඇයි කියලා මං අහන්නේ ?

පි: ඒ සම්බන්ධයෙන් සිද්ධීන් පමණක් වාර්තා වෙලා තිබ්බා. ඒක හරියටම එම කාල වකවානුවේ තුල අදහස් දැක්වීම මම කළේ කොළඹ ආශ්‍රිතව කරන සිදුවීම් සම්බන්ධයෙන් කරන මූලිකත්වයක් ලබා දුන්නේ. ඒ අංශවලින් ලැබෙන කරුණු අනුව තමයි මම දැනුවත් කිරීමක් කරන්නේ ස්වාමිනි.

ප්‍ර: එතකොට දැන් මේ වගේ රැස්වීමකට යන්නට ඉස්සර වෙලා ඒ රැස්වීමේදී ඉදිරිපත් කරන්නට ඕනි තොරතුරු ඔබ රැස් කර ගන්නේ කොහෙන්ද?

පි: අදාළ ක්‍රියාකාරී කොට්ඨාශවලින් ලබා ගන්නවා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ 2019 ජනවාරි මාසේ 16 වෙනිදා වනාතවිල්ලුවේ ලැක්ටෝස් වත්තෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යම් පුපුරණ ද්‍රව්‍ය ඇතුළු ආයුධ බොහොමයක් සොයා ගනු ලැබුවානේ යම් යම් නඩු භාණ්ඩ සොයා ගනු ලැබුවානේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඒ පිළිබඳවත් මේ දිනයේ වාර්තා කරලා නැහැනේද?

පි: නැත ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ පිළිබඳවත් ඔබ වාර්තා කළේ නැත්තේ එය කොළඹ ප්‍රදේශයේ ආශ්‍රිතව සිදු නොවුණු නිසාද ?

පි: ස්වාමිනි මට ලැබෙන තොරතුරු අදාළ කොට්ඨාශවලින් ලැබෙන විස්තර අනුව තමයි මා දැනුවත් කිරීම් කරන්නේ ස්වාමිනි.

ප්‍ර: ඊළඟට මා ඔබේ අවධානය යොමු කරනවා ඔබ 2019 පෙබරවාරි මාසේ 03 වෙනිදාට. එදින ඔබ ඒ රැස්වීමට සහභාගී වුණේ නැහැ නේද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ වෙනුවට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ලලිත් නානායක්කාර මහතා එයට සහභාගී වුණා කියලා මා කිව්වොත් නිවැරදිද?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඔබ කිව්වා මේ සටහන් ඒ කියන්නේ ජනාධිපති ආරක්ෂක දිසාව විසින් ලබාගනු ලබන සටහන් ඔබලාට ලැබෙන්නේ නැහැයි කියලා ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: හරි. මීළඟට මා ඔබේ අවධානය පෙබරවාරි මාසේ 15 වෙනිදා කෙරෙහි යොමු කරනවා. ජනාධිපති ආරක්ෂක දිසාව විසින් ලබාගනු ලබන සටහන් ඔබලාට ලැබෙන්නේ නැහැ කියලා ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මීලඟට මා ඔබේ අවධානය 2019 පෙබරවාරි මාසේ 15 වෙනිදා කෙරෙහි යොමු කරනවා. එදින ඔබ මේ රැස්වීමට සහභාගී වුණාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එදින ඔබ අර සුපුරුදු පරිදි කරුණු රාජ්‍ය බුද්ධි සේවාව වෙනුවෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කෙරුවද?

පි: කළා ස්වාමිනි.

ප්‍ර: එදා ඔබ ඒ කරුණු ඉදිරිපත් කරුණු ලැබුවේ රාජ්‍ය බුද්ධි සේවාවේ අනික් අංශවලින් ඔබට ලැබෙන තොරතුරු සුපුරුදු පරිදි පදනම් කරගෙනද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එදින ඔබ මේ සභාව දැනුවත් කරාද ශ්‍රී ලංකාව තුළ ISIS සංවිධානයේ ක්‍රියාකාරීන් වශයෙන් සිටි 28ක් සිරියාවට පිටව ගිහිල්ලා තියෙනවා. ඒකෙන් තුන් දෙනෙක් ගුවන් ප්‍රහාරයකින් මිය ගිහිල්ලා තියෙනවාකියලා?

පි: ඒක නිවැරදි කරන්න ඕනි ස්වාමිනි. ISIS කියන එක විතරක්. IS .IS සංවිධානය ලෙස නිවැරදි වෙන්න ඕනි.

ප්‍ර: නමුත් මේ සටහන යොදලා තිබුණේ ඔබ නෙවෙයිනේ ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ ජනාධිපති ආරක්ෂක දිසාව ඒ වරද සිදු කරලා තියෙන්නේ ඔවුන් විසින්ම නේද ඔබ නෙවෙයි?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ කියන්නේ එය IS වශයෙන් නිවැරදි වන්නට ඕනි කියලා?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව්. එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබට මේ තොරතුර ලැබුණේ මේ පෙබරවාරි මාසේ 15 වෙනිදා ඉදිරිපත් කරන්නට කොහේන්ද?

පි: ස්වාමිනි අදාළ අන්තවාදී කටයුතු කරන කොට්ඨාශය සහකාර පොලිස් අධිකාරි මල්ලවආරච්චි මහතා විසින් ලබාදුන් විස්තර අනුව තමයි.

ප්‍ර: ඔබ මේ කරුණු ඉදිරිපත් කරුණු ලැබුවේ මේ රැස්වීමේ දී?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඊළඟට ඔබ එදින තව දුරටත් දැනුම් දුන්නද කී දෙනෙක් විතර ලංකාවේ IS මතවාදයට නැඹුරුව ඉන්නවද කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ එදින ඒ මතවාදයට නැඹුරුව ඉන්න පුද්ගලයින් ඔවුන් ලංකාවේ විසිරිලා ඉන්න ආකාරය පිළිබඳව දක්වන ලද අදහස පිළිබඳව කෙටියෙන් මේ ගරු කොමිෂන් සභාව දැනුවත් කරන්න පුළුවන්ද?

පි: එහෙමයි ස්වාමිනි. කොළඹ, මහනුවර, මඩකලපුව, යන ප්‍රදේශවල වෙසෙන බවට.

ප්‍ර: කවුද වෙසෙන්නේ?

පි: IS මතවාද දරණ 100කට වැඩි පිරිසක්.

ප්‍ර: 100කට වැඩි පිරිසක් ඉන්නවා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට National Thowheed Jamath සංවිධානය ගැන ඔබ යමක් කිව්වද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔවුන් සම්බන්ධයෙන් ඔබ මේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් රැස්වෙලා ඉන්න මේ රැස්වීමේදී සඳහන් කරන්නට ඕනි කියලා හිතුව යම් විශේෂ කරුණක් තිබ්බද?

පි: ස්වාමිනි ඒ අදාළ අංශයෙන් ලබා දෙන .. මඩකලපු ප්‍රදේශයේ ක්‍රියාත්මක National Thowheed Jamath සංවිධානය විසින් එම සාමාජියක් දැනුවත් කිරීමේ වැඩමුළුවකදී අන්‍යාගමිකයන් විනාශ කිරීමේ මෙරට ඉස්ලාම් රාජ්‍යයක් ස්ථාපනය කළ හැකි බව අදහස් දක්වා ඇති බව.

ප්‍ර: එතකොට ඒක එහෙනම් ජාතික ආරක්ෂාවට කෙළින්ම සෘජුව බලනවා නේද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ නිසාද ඔබ එය දැනුම් දුන්නේ ?

පි: ඒක කතා කරන්න කියන මේක ලබා දුන් නිසා අදහස් දැක්වීමක් කරා.

ප්‍ර: එතකොට ඔබ කිව්වානේ දැන් ජනවාරි මාසේ 23 වෙනිදා තවත් පවත්වන ලද රැස්වීමේදී ඔබ අර ආගමික ප්‍රතිමාවලට හානි කිරීම පිළිබඳව කරුණු දැක්වීමක් කෙරුවේ නැහැ කියලා?

පි: නැහැ ස්වාමිනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නමුත් මේ පෙබරවාරි මාසේ 15 වෙනිදා පැවැති රැස්වීමේදී ඔබ ඒ පිළිබඳව මේ නිලධාරින්ව දැනුවත් කරාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඔබ ඒ පිළිබඳව ඔවුන් දැනුවත් කරමින් කිව්වේ ?

පි: මහනුවර , මාවනැල්ල ප්‍රදේශවල බුද්ධ ප්‍රතිමාවලට ප්‍රහාර සිදු කරලා හදුනා ගත් කණ්ඩායම් සමාජ ජාලා වෙබ් අඩවි තුළින් IS මතවාදය හඳුනාගෙන ක්‍රියාත්මක කර ඇති බවට තොරතුරු ලැබී ඇති බව.

ප්‍ර: ඒ පිළිබඳව ඔබ දැනුම් දුන්නා.

පි: ඔව්.

ප්‍ර: මේ අක්කරයපත්තු බස්හිමියෙක් කරලා තියෙන දැනුම් දීමක් පිළිබඳව ඔබද ඒ රැස්වීමේදී කතා කළේ නැත්නම් වෙනත් නිලධාරියෙක්ද?

පි: ඒක ස්වාමිනි දැනුම් දුන්නේ ..

ප්‍ර: ඒක රාජ්‍ය බුද්ධි සේවාවෙන් ඉදිරිපත්කරන ලද

පි: නැහැ ස්වාමිනි නැත.

ස්වාමිනි 2019 පෙබරවාරි මස 15වන දින සාක්ෂිකරු විසින් සහභාගී වී ඇති එම රැස්වීමට අදාළව ස්වාමිනි නිලධාරින්ගේ ගමන් සටහන් පොතෙහි යොදා ඇති මෙම සටහන X – 586 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: මීළඟට මා ඔබේ අවධානය 2019 අප්‍රේල් මාසේ 18 වෙනිදා ජනාධිපති ආරක්ෂක දිසාව විසින් පවත්වලා තිබෙන රැස්වීම පිළිබඳව යොමු කරනවා. එදින රැස්වීමටත් ඔබ සහභාගී වුණා කියලා මා කිව්වොතින් නිවැරදියිද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එම රැස්වීමේදීත් ඔබ රාජ්‍ය බුද්ධි සේවය වෙනුවෙන් යම් යම් කරුණු දැක්වීම් සිදු කරා කියලා මා කිව්වොත් නිවැරදියිද?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: එසේ ඔබ විසින් කරුණු ඉදිරිපත් කිරීම් සිදු කළේ ඔබ විසින් කළින් සඳහන් කරන ලද ආකාරයට රාජ්‍ය බුද්ධි සේවාවේ අනිත් අංශයන් වෙතින් ඔබට ලැබුණු තොරතුරු පදනම් කරගෙනද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එදින ඔබ කාත්තන්කුඩි ප්‍රදේශය පිළිබඳවත් සහ මොහොමඩ් සහරාන් පිළිබඳවත් යම්කරුණු දැක්වීමක් මේ රැස්වීමේදී කරාද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ 2019 අප්‍රේල්මාසේ 18 වෙනිදා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මොකක්ද ඔබ කරපු කරුණු දැක්වීම කෙටියෙන් කියන්න?

පි: කාත්තන්කුඩිය ප්‍රදේශය කේන්ද්‍රකර ගනිමින් IS සංවිධානයට සම්බන්ධ National Thowheed Jamath සංවිධානයේ නායක මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් නැමැත්තා විසින් මෙරට

FAIR COMMENT BY JEZEEM

අන්‍යාගමිකයන් ඝාතනය කළ යුතු බවට තම අනුගාමිකයන් දැනුවත් කර ඇති බව.

ප්‍ර: පිළිබඳව ඔබ දැනුම් දුන්නා?

පි: එහෙමයි ස්වාමිනි.

ස්වාමිනි 2019 අප්‍රේල් මස 18 වන දින සාක්ෂිකරු විසින් සහභාගී වී ඇති ජනාධිපති ආරක්ෂක දිසාව විසින් පවත්වන ලද එම රැස්වීමට අදාළව නිලධාරින්ගේ ගමන් සටහන් පොතෙහි යොදා ඇති සටහන X – 587 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: ඒ X – 587 අවසානයේ තියෙන කරුණු දෙක ඔබ දැනුම් දුන්න එකක් නෙවෙයිද විශේෂයෙන්ම අවසාන එක?

පි: ස්වාමිනි පැහැදිලි නැහැ ඒක.

ප්‍ර: X – 587හි අවසාන පිටුවේ තිබෙනවා සටහන් 2ක්. ඒ සටහන් දෙකේ අවසාන එක, ඒ කියන්නේ IS සංවිධානයට සම්බන්ධ පුද්ගලයින්තම අතට හසුවන කුමක් හෝ යමකින් මිනිස් ඝාතන සිදු කිරීමේ අරමුණින් සිටින බැවින් බුද්ධි තොරතුරු ඉතා වැදගත් බව මා දන්වන ලදී. එහෙම සඳහන් කිරීමක් එදින රොහොන් සිල්වා මහතා නියෝජ්‍ය පොලිස්පතිවරයා සිදු කෙරුවද?

පි: එහෙම ප්‍රකාශයක් සිදු කරලා තියෙනවා.

ප්‍ර: ඔබ සහභාගී වුණ රැස්වීම ගැන මම මේ අහන්නේ ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ ඉන්න අවස්ථාවේදී එතුමා එහෙම දෙයක් කිව්වද?

පි: ප්‍රකාශ කරලා තියෙනවා.

ස්වාමිනි අවසර පතනවා තව දුරටත් X – 586 ලේඛනයේ සාක්ෂිකරු විසින් IS සංවිධානයට අදාළව කරුණු 2ක් සඳහන් කරලා තියෙනවා. එම කරුණු 2 X – 586 (A) වශයෙනුත්, ආගමික ප්‍රතිමාවලට අදාළව සිදු කරලා තියෙන ප්‍රහාර සම්බන්ධයෙන් සාක්ෂිකරු කර ඇති ඉදිරිපත් කිරීම දැක්වෙන කොටස X – 586 (B)වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කිරීමට.

එසේම ස්වාමිනි සාක්ෂිකරු විසින් X – 587 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන ලද එම නිලධාරින්ගේ ගමන් සටහන් පොතෙහි යොදා ඇති සටහනෙහි ඔහු ඉදිරිපත් කර ඇති බවට සඳහන් වෙන කාත්තන්කුඩි ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් IS සංවිධානයට සම්බන්ධ National Thowheedjamath සංවිධානයේ නායක මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් යන නැමැත්තා විසින් මෙරටට අන්‍යාගමිකයන් ඝාතනය කළ යුතු බවට තම අනුගාමිකයන් දැනුවත් කර ඇතිබව යනුවෙන් සඳහන් එම කොටස X – 587(A) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා මගේ මූලික ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් ඔබ විසින් වෘත්තිය සමිති ඒ වගේම ශිෂ්‍ය ක්‍රියාකාරකම් වගේ සංවේදී කරුණු සම්බන්ධයෙන් තමයි කටයුතු කරන්නේ කියලා.

පි: ඇතුළු සංවේදී ඉලක්ක.

ප්‍ර: ඒ වගේම ඔබ මධ්‍යම පළාත භාරවත් කටයුතු කරනවා කියලා කිව්වා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට අපිට දැන ගන්නට පුළුවන්ද ඔබට ඔබ මේ X – 587 සහ X – 586 යන ලේඛනවල සඳහන් කරන ලද මේ IS සංවිධානයේ ක්‍රියාකාරකම් පිළිබඳව ඒවගේම සහරාන් හෂීම් පිළිබඳව එහෙම ඔය රාජකාරි කටයුතු වලදී ඔබට දැන ගන්නට ලැබිලා තියෙනවද ඔබ යම් විමර්ශනයන් සිදු කරලා තියෙනවද කියලා?

පි: ස්වාමිනි විමර්ශනයක් කරලා නැහැ ස්වාමිනි. නමුත් පැවැත්වෙන සාකච්ඡාවලදී අධ්‍යක්ෂකතුමාගේ සාකච්ඡාවලදී , උසස් නිලධාරීන්ගේ සාකච්ඡාවලදී දැනුවත් කිරීම් කරනවා.

ප්‍ර: දැන් ඔබට පෙර අද දින මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන ලද තවත් සාක්ෂිකරුවන් ඔබ ඔය කියන ලද කරුණ කිව්වා. ඒ කියන්නේ අධ්‍යක්ෂකවරයා සමඟ පවත්වන ලද සාකච්ඡාවලදී මෙවැනි කරුණු පිළිබඳව දැනුවත් කිරීම් කරනවා කියලා. එතකොට මට දැනගන්න පුළුවන්ද එය සාමාන්‍යයෙන් අධ්‍යක්ෂකවරයා විසින් තමන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ව එවැනි කරුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කරනු ලබනවද කියලා?

පි: එහෙමයි ස්වාමිනි මේ කරුණු ඇතුළු තවත් කරුණු ගැන දැනුවත් කිරීම් කරනවා ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබට යම් අවස්ථාවක දී මේ මා ඔබේ අවධානයට දැන් යොමු කරන C – 4 (B) ලේඛනයේ තිබෙන තොරතුර 2019 අප්‍රේල් 21 වෙනිදාට පෙර දැන ගන්නට ලැබුණුද?

පි: නැත ස්වාමිනි.

ප්‍ර: දැන ගන්නට ලැබුණේ නැහැ?

පි: නැත ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ 2019 අප්‍රේල් මාසේ 18 වෙනිදා මේ සහරාන් හෂීම් පිළිබඳව කරුණු ඉදිරිපත් කෙරුවනේ මේ ජනාධිපති ආරක්ෂක දිසාව විසින් පවත්වන ලද රැස්වීමේදී?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ වෙලාව වෙනකොටවත් ඔබට මේ තොරතුර පිළිබඳව හෝ ඊට ආශ්‍රිතව වූ යම් කරුණක් පිළිබඳව හෝ දැන ගන්නට ලැබිලා තිබුණේ නැද්ද?

පි: මේ තොරතුරු සම්බන්ධයෙන් මා දැනුවත් නැහැ ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: එතකොට සාමාන්‍යයෙන් ඒ වගේ තොරතුරු ගැන ඒ C – 4 (B) ලේඛනයේ තියෙන තොරතුර සම්බන්ධයෙන් විමර්ශන කරන්නේ කුමන අංශද නැත්නම් අංශයක්ද?

පි: අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් එවකට නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් සිටි සම්පත් කුමාර මහතා විසින් අධීක්ෂණ කළ අංශයක් මඟින් කළේ ස්වාමිනි.

ප්‍ර: ඔබට මතකද X – 587 (A)කියන එම තොරතුර , ඔබ දැන් ලකුණු කරලා ඉදිරිපත් කළ තොරතුර ඒ කියන්නේ කාත්තන්කුඩියේ ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ISසංවිධානයට සම්බන්ධ National Thowheedjamath සංවිධානයේ නායක මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් නැමැත්තා විසින් මෙරටට අන්‍යාගමිකයන් ඝාතනය කළ යුතු බවට තම අනුගාමිකයින් දැනුවත් කර ඇති බව. ඒ කියන තොරතුර ඔබට ලබා දුන්නේ කවුද කියලා?

පි: ස්වාමිනි මේක කරේ ලබා දුන්නේ අන්තවාදී කොට්ඨාශයේ ඉන්න සහකාර පොලිස් අධිකාරි මල්ලවආරච්චි මහතා විසින්.

ප්‍ර: හැබැයි මල්ලවආරච්චි මහත්මයා ඒ තොරතුර ලබා දෙනකොටවත් ඔබට කිව්වේ නැද්ද විදේශයකින් තොරතුරක් ලැබිලා තියෙනවා. ප්‍රහාරයක් කොයි වෙලාවක හෝ මේ සහරාන් ඇතුළු ඔහුගේ කණ්ඩායම විසින් දියත් කරන්නට පුළුවන් කියලා?

පි: එම අවස්ථාවේදී මා දැනුවත් කරේ නැහැ ස්වාමිනි.

එපමණයි ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ රාජ්‍ය බුද්ධි සේවයට ස්ථිර පත්වීම් ලබන්නේ 2003 දෙසැම්බර් මාසේ 03 වෙනිදින ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එලෙස පත්වුණාම පස්සේ ඔබ විවිධ දිසා බුද්ධි කාර්යාංශවල සේවය කෙරුවා?

පි: මහනුවර දිසා බුද්ධි සේවා කාර්යාංශයේ සේවය කෙරුවා ස්වාමිනි.

ප්‍ර: ඊට පස්සේ අවස්ථාවක නුවරඑළිය වැඩබලන සහකාර අධ්‍යක්ෂක වශයෙනුත් සේවය කෙරුවා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ සේවය කරපු කාලය LTTE සංවිධානය සමඟ යුද්ධය පැවැති කාලය?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒක 2009 මැයි 18 වෙනකම් ගියානේ?

පි: එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: ඒ කාලය අතුරතුර විටින් විටLTTE සංවිධානයෙන් රට පුරා යම් ප්‍රහාර එල්ල කරන්න ඇති හැකියාවක් පිළිබඳව තොරතුරු රාජ්‍ය බුද්ධි සේවයට විටින් විට ලැබුණා කිව්වොත් එය නිවැරදිද?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: එම ප්‍රහාරය නැත්නම් ප්‍රහාර රටේ ඕනෑම ස්ථානයක සිදු විය හැකි බවටත් තොරතුරු ලැබුණු බව කිව්වොත් නිවැරදියිද?

පි: සමහර අවස්ථාවල එහෙම ලැබිලා තියෙනවා.

ප්‍ර: සමහර අවස්ථාවල රටේ ඕනෑම තැනක LTTE ප්‍රහාරයක් සිදු විය හැකි බවට තොරතුරු ලැබිලා තිබ්බා?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: එලෙස LTTE සංවිධානය විසින් රටේ ඕනෑම ස්ථානයක යම් ප්‍රහාරයක් එල්ල විය හැකි බවට ලැබුණු තොරතුර රාජ්‍ය බුද්ධි සේවය විසින් ඒ දිසා බුද්ධි කාර්යාංශවලට යැව්වා කියලා කිව්වොත් පිළිගන්වද?

පි: එහෙම එකක් නම් දැනුම් දෙන්නේ ස්වාමිනි අධ්‍යක්ෂකතුමා විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා හරහා දැනුම් දීමක් කරනවා.

ප්‍ර: ඒ කියන්නේ රටටම යම්කිසි අනතුරුක් සිදුවිය හැකි බවට රාජ්‍ය බුද්ධි සේවාවෙන් ලැබුණම ඒ සම්බන්ධයෙන් අවධානයෙන් සිටීම සඳහා රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින් සීරුවෙන් තබා ගැනීම සඳහා එම තොරතුර රාජ්‍ය සේවයේ බුද්ධි අධ්‍යක්ෂක මඟින් නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් හරහා ඔවුන් අධික්ෂණය කරන පළාත්වලට ලැබෙන්න සැලැස්වුවා කියලා කිව්වොත් නිවැරදියිද?

පි: සමහර අවස්ථාවල ලැබිලා තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: නමුත් ඒ ලැබුණු අවස්ථා ලැබුණේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හරහානේ ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් 2019 අප්‍රේල් මාසේ 21 වෙනි දිනට පෙර ඔබ ඒ කාලේ ඔබගේ අනිත් රාජකාරිවලට අමතරව මධ්‍යම පළාත භාර නියෝජ්‍ය අධ්‍යක්ෂක හැටියට හිටියානේ ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: 2019 අප්‍රේල් 21 වෙනි දින ප්‍රහාරයට පෙර එවැනි ප්‍රහාරයක් සිදු වෙන්න පුළුවන් ඒ නිසා රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින් මේ C – 4 (B) දරණ ලේඛනයේ අඩංගු තොරතුර සම්බන්ධයෙන් සහ එම ලේඛනයේ අඩංගු තැනැත්තන් සම්බන්ධයෙන් අවධානයෙන් සිටිය යුතු බවට ඔබ හරහා ඔබගේ පළාතේ සිටින රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින්ට වාර්තා වීමක් සිදු වුණාද?

පි: මේ ලේඛනය සම්බන්ධයෙන් වාර්තා වීමක් වුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ලේඛනය විතරක් නෙවෙයි. ඒ කියන්නේ විදේශීය බුද්ධි අංශයකින් එලෙස ප්‍රහාරයක් විය හැකිබවට ලැබුණු තොරතුර සම්බන්ධයෙන් අප්‍රේල් 21 වෙනිදා දිනට පෙර ඔබ හරහා ඔබ යටතේ සිටපු

FAIR COMMENT BY JEZEEM

මධ්‍යම පළාතේ රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින්ට යම් දැනුම්දීමක් සිදු වුණාද?

පි: මීට අදාළව දැනුම්දීමක් වුණේ නැහැ ස්වාමිනි.

ප්‍ර: 2019 අප්‍රේල් 04 වෙනිදා විදේශිය බුද්ධි ආයතනය විසින් ලැබුණු තොරතුර සම්බන්ධයෙන් එනම් රට තුළ ඉස්ලාම් අන්තවාදීන් විසින් ප්‍රහාරයක් සිදු විය හැකියි කිසියම් හෝ තොරතුර 2019 අප්‍රේල් 21 වෙනිදාට පෙර ඔබව දැනුවත් වුණාද?

පි: නැත ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ දැන් පිළිතුරු දුන්න ආකාරයට ඔබව ඒ තොරතුර පිළිබඳව දැනුවත් වුනේ නැහැ කිව්වානේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබේ දැනීමේ හැටියට රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියෙක් වෙලා ඉඳලාත් ඇයි ඔබ වැනි පුද්ගලයෙක්ට ඒ ගැන දැනගන්නට නොලැබුණේ?

පි: ස්වාමිනි රාජ්‍ය බුද්ධි සේවය පැවැත්වෙන්නේ අදාළ අංශ මඟින් ස්වාමිනි. ඒ අංශවලින් ආවරණය කරන විෂයන් තියෙනවා. ඒ විෂයට අදාළ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙක් ඉන්නවා. අධ්‍යක්ෂකතුමා ඒ වගේ වැදගත් තොරතුරු තියෙනවානම් අදාළ විෂය භාර නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට දැනුම් දීමක් කරනවා.

ප්‍ර: ඒ කියන්නේ විෂයෙන් පිට කාටවත් කිසි තොරුතුරක් ලැබෙන්නේ නැහැ කියන එකද ඔබ කියන්නේ ?

පි: ඒක අධ්‍යක්ෂකතුමාතමයි තීරණය කරන්නේ ස්වාමිනි.

ප්‍ර: දැන් මේ ක්‍රමවේදය රාජ්‍ය බුද්ධි සේවයේ මීට අවුරුදු 10කට විතර ඉස්සරා ඉඳලාම පැවතුණාද නැත්නම් ඕක මෑත කාලයේ විතර පැවතිච්ච එකක්ද?

පි: ඉතිහාසයේම එවැනි තත්ත්වයක් තිබ්ලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ ඔබ සේවය කරන ඒ අංශයේ තොරතුරු පමණයි ඔබ දන්නේ අනිත් කිසි දෙයක් වාර්තා වෙන්නේ නැහැ ඔබලාට ?

පි: ස්වාමිනි දැනුවත් කිරීම් කරනවා. සාකච්ඡා වලදී ඒවගේම ඒ අංශවල ඉන්න නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන්ට ලිඛිතව හරි වාචිකව හරි දැනුවත් කරනවා. ඒ වගේ දැනුවත් කිරීම්වලදී දැන ගන්නවා ස්වාමිනි.

ප්‍ර: ඒ වුණාට දැන් ඔබ සඳහන් කරා නේද 2019 අප්‍රේල් 18 වෙනිදින පවත්වන ලද සාකච්ඡාවේදීත් ඔබව මෙම අදාළ තොරතුර සම්බන්ධයෙන් දැනුවත් වීමක් සිද්ධ වුණේ නැහැ කියලා?

පි: මා ඉදිරිපිට තිබෙන ලේඛනයට අදාළ තොරතුරු දැනුවත් වීමක් වුනේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබ ඉදිරියේ තියෙන්නේ C – 4 (B) ලේඛනයනේ?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව් C – 4 (B) ලේඛනය.

ප්‍ර: එතකොට C – 4 (B) ලේඛනය ලැබිලා තිබුවිව තොරතුර අප්‍රේල් 21 ප්‍රහාරයට අදාළ වූ තොරතුර නේද?

පි: තොරතුරක් ස්වාමිනි ඒකේ දිනයක් සඳහන් වෙන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ ඔබ කිසිම දෙයක් දන්නේ නැහැ කියන එක?

පි: මේ තොරතුර සම්බන්ධයෙන් දැනුවත් වීමක් වුණේ නැහැ. සිද්ධියෙන්පසුව දැනුවත් වීමක් වුණා මේ වගේ තොරතුරක් තියෙනවා කියන එක.

ප්‍ර: එතකොට අප්‍රේල් 18 පැවති සාකච්ඡාවේදීත් ඒ අන්තවාදය සම්බන්ධ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක සම්පත් කුමාර මහත්මයා හෝ සහකාර අධ්‍යක්ෂක මල්ලවආරච්චි මහත්මයා හෝ ඔබව මේ පිළිබඳව දැනුවත් කළේ නැහැ කියන එකයි ඔබ කියන්නේ ?

පි: එහෙමයි ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: Mr. බණ්ඩාර ඔබතුමාගේ යන්නේ ජනාධිපති ආරක්ෂක අංශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා සමඟ නියෝජ්‍ය පොලිස්පතිතුමා සමඟ සාකච්ඡාවන්වලට බුද්ධි සේවාවේ ප්‍රධානියා වෙනුවට?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට අප්‍රේල් මාසේ 18 වෙනිදාත් රැස්වීමකට සහභාගී වුණා නේද එතුමාත් සමඟ?

පි: 2019 අප්‍රේල් 18 ස්වාමිනි.

ප්‍ර: ඔබ සාමාන්‍යයෙන් එම රැස්වීම්වලට සතිපතා යනවද?

පි: ස්වාමිනි මේක සාමාන්‍යයෙන් මාසයකට සැරයක් වගේ පවත්වන සාකච්ඡාවක් ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයෙන් ලිඛිතව දැනුම් දීමක් කරනවා.

ප්‍ර: දැන් ජනාධිපතිතුමාගේ ආරක්ෂාව වෙනුවෙන්ම තියෙන කොට්ඨාසයක්නේ මේ කොට්ඨාසය එතකොට. එම අංශයේදී සාකච්ඡා වුණාද එහෙම නැත්නම් රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානියා නියෝජනය කරමින් එම රැස්වීම්වලට සහභාගී වන ඔබගෙන් ඇහුවද IS සංවිධානයේ ක්‍රියාකාරිත්වය හෝ IS සංවිධානයේ විසින් කිසියම් අවස්ථාවකදී ප්‍රහාරයක් එල්ල කිරීම පිළිබඳව තොරතුරු තිබෙනවද කියා රාජ්‍ය බුද්ධි සේවාවට?

පි: එහෙම කිසිම අවස්ථාවක මගෙන් විමසීමක් කරලා නැහැ ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ ඒ රැස්වීම්වලට ගිහිල්ලා එවැනි තොරතුරු කියලා තියෙනවද මෙම IS සංවිධානයේ තර්ජනයක් තියෙනවා අපේ රටට

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජනාධිපතිතුමාගේ ආරක්ෂාව පිළිබඳව සැළකිලිමත් වීම අවශ්‍යයි. එවැනි දේවල් ඔබ කියලා තියෙනවද රාජ්‍ය බුද්ධි සේවාවේ ?

පි: ස්වාමිනි දැනුවත් කිරීම මට ලබා දෙන විස්තර අනුව මම දැනුවත් කිරීම් කරනවා.

ප්‍ර: ඔබට එතකොට දැනුවත් කිරීම් ඔබගේ ආයතනයෙන් ලබාදීලා තියෙනවද දැන් ජනාධිපතිතුමාගේ ආරක්ෂාව වෙනුවෙන් අංශයේ ප්‍රධානියා සමඟ රැස්වීම්වලට යනකොට මේ IS සංවිධානයෙන් තිබෙන්නා වූ තර්ජනය පිළිබඳව ජනාධිපතිතුමාව දැනුවත් කිරීම සඳහා හෝ එහෙම නැත්නම් ජනාධිපතිතුමාගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීම සඳහා හෝ ඔබ එවැනි තොරතුරු දීලා තියෙනවද?

පි: ලංකාව තුල ප්‍රහාරයක් වෙනවා කියන එක තොරතුරක් ලබා දීලා නැහැ ස්වාමිනි. නමුත් 3.19 වෙනි දින පැවැති සාකච්ඡාවක් තිබ්බා ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ. 2019.03.19 ඒකේදී IS සංවිධානයට සම්බන්ධවීමට පුද්ගලයින් 28ක් සිරියාවට ගොස් සිටින බවත්, මේ වන විට ඉන් පුද්ගලයින් තුන්දෙනක් ගුවන් ප්‍රහාර හේතුවෙන් මරණයට පත්වී සිටින බවත්, මෙරටට ISමතවාදය දරණ පුද්ගලයින් 125කට ආසන්න පිරිසක් සිටින බවත්,National ThauhithJamathනායක මොහොමඩ් කාසීම් මොහොමඩ් සහරාන් ප්‍රජාතන්තවාදී අන්‍යාගමිකයින් කෙරෙහි දැඩි වෛරයකින් සමාජ ජාලා මාධ්‍ය හරහා ප්‍රචාරය කරන බවත් 2018.09.25 වන දින ඩෙන්මාර්ක් ආරක්ෂක අංශය විසින් ඩ්‍රෝන යානා මිලදී ගැනීමට කටයුතු කළ IS සටන්කාමීන් දෙදෙනෙක් අත්අඩංගුවට ගැනීම නිසා ඒ පිළිබඳව මෙරටදීත් විශේෂ අවධානය යොමු කළ යුතු බවත්, ඒ එක්කම 2019.03.23 වෙනිදින මහනුවර දළදා මාළිගාව අභියසදී ත්‍රිපිටකය ලෝක උරුමයක් කරන ලෙසට ඉල්ලා අතිගරු ජනාධිපතිතුමා විසින් යුනුස්කෝ සංවිධානයට ලිපියක් භාර දීමේ වැඩ සටහන පැවැත්වෙනවා. මෙම වැඩසටහනට භික්ෂූන් වහන්සේලා 5000ක් විතර වැඩම කිරීමට නියමිතබවත් ඒ නිසා ආරක්ෂාව පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු බවත් මෑත යුගයේදී නවසීලන්තයේදී මුස්ලිම් පල්ලි 2ට එල්ල කරන ලද ප්‍රහාරයෙන් පුද්ගලයින් 49ක් මරණයට පත්වී තවත් පුද්ගලයින් තුවාල සිදුවීම 2019.03.18 වැනි දින නෙදර්ලන්තයේ යුට්රේච්වල tram car එකකදී තුර්කි ජාතිකයෝ විසින් කරන ලද වෙඩි තැබීමකින් පුද්ගලයින් 3 දෙනෙක් මරණයට පත්වී තවත් අයට තුවාල සිදුවීම වැනි සිද්ධින් නිසා ISයන අන්තවාදය මත දරණ පුද්ගලයින් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු බවට සඳහන් කරලා තියෙනවා.

ප්‍ර: Mr. බණ්ඩාර දැන් ඔබට C – 4 (B) ලේඛනය පෙන්නුවානේ. එම ලේඛනය ඔබගේ රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානියා විසින් ඔබ සමඟ සාකච්ඡා කර තිබුණා නම් ඔබ මේ 2019 අප්‍රේල් 18 වෙනිදින

FAIR COMMENT BY JEZEEM

ජනාධිපතිතුමාගේ ආරක්ෂක අංශයේ ප්‍රධානියා සමඟ පවත්වන ලද සාකච්ඡාවේදී එම තොරතුරු සඳහන් කරුණු පිළිබඳව සහ ඔබ මේ 2019 අප්‍රේල් 18 වෙනි දින ජනාධිපතිතුමාගේ ආරක්ෂක අංශයේ ප්‍රධානියා සමඟ පවත්වන ලද සාකච්ඡාවේදී එම තොරතුරේ සඳහන් කරුණු පිළිබඳව සහ ඇතිවිය හැකි ආරක්ෂක අවධානම පිළිබඳව එතුමාට පවසනවද?

පි: ස්වාමිනි මට ලැබෙන උපදෙස් අනුව තමයි. ඒ අංශවලින් ලැබෙන උපදෙස් අනුව සාකච්ඡා කරලා දැනුම් දෙන්න ඕනි කියන පණිවිඩය මට කියනවා. සාකච්ඡා කරන්න කියලා. එහෙම මට දැනුවත් කරොත් පමණක් මම දැනුවත් කිරීම් කරනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදාට පසුව ඔබට මධ්‍යම පළාතේ ඔබ යටතේ ඉන්න රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින්ගෙන් යම්කිසි දැනුවත් කිරීමක් වුණාද මේ ඉස්ලාම් අන්තවාදීන්ගෙන් විය හැකි ප්‍රහාරයක් පිළිබඳව ඔවුන්ට අවධානයෙන් නැත්නම් ආවේක්ශණ රාජකාරි කරන්න කියලා රාජ්‍ය බුද්ධි සේවයේ වෙනත් යම් අංශයකින් නැත්නම් වෙනයම් නිලධාරියෙක්ගෙන් උපදෙස් ලැබිලා තිබුණා කියලා?

පි: ස්වාමිනි ආවේක්ශණ අංශයෙන් කෙරෙන රාජකාරි සම්බන්ධයෙන් මා දැනුවත් කරන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ආවේක්ශණ නෙවෙයි. මධ්‍යම පළාත තුල සිටින රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින්ට ඉස්ලාම් අන්තවාදීගෙන් ප්‍රහාරයක් සිදුවිය හැකි බවට මේ විදේශයෙන් ලැබුණ තොරතුර සම්බන්ධයෙන් අවධානයෙන් ඉන්න කියන එක රාජ්‍ය බුද්ධි සේවයේ වෙනත් අංශයක් නැත්නම් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් විසින් සෘජුව ඔබ හරහා යන්නේ නැතුව සෘජුව මධ්‍ය පළාත තුල සිටින රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින්ට දැනුවත්කිරීමක් කරලා තිබ්බද කියලා අප්‍රේල් 21 පස්සේ ඔබ දැනුවත් වුණාද?

පි: මා දැනුවත් වෙලා නැහැ ස්වාමිනි.

ප්‍ර: දැනුවත් වෙලා නැහැ ?

පි: නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබ ඔහුන්ගෙන් විමසා බැලුවද එහෙම දැනුවත්කිරීමක් කරලා තිබ්බාද කියලා?

පි: තොරතුරු ගැන මම විමසීමක් කරලා තියෙනවා ස්වාමිනි. මේ ප්‍රහාරයන් සම්බන්ධයෙන් තොරතුරු සහ සම්බන්ධ පුද්ගලයින් ගැන. එහෙම අවස්ථාවක මාව දැනුවත් කළේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබ ඒ විමසීම කෙරුවේ අප්‍රේල් 21 වෙනිදාට පස්සේ ?

FAIR COMMENT
BY JEZEEM

පි: 21 වෙනිදාත් ස්වාමිනි කරා. අදාළ සහකාර අධ්‍යක්ෂක මා අධීක්ෂණය කරනවා, සහකාර අධ්‍යක්ෂක කෙනෙක් මධ්‍යම පළාතේ. එයාගෙන් මම විමසීම් කරලා තියෙනවා.

ප්‍ර: ඒ විමසීම් කලේ ප්‍රහාරයෙන් පසුවද පෙරද?

පි: පසුව ස්වාමිනි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍ය ද නැද්ද අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසමි. අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි. සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියට ලබා දෙනවා.

****

<u>හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මධු ජයතිලක මහත්මිය.</u>

ප්‍ර: සෙනවිරත්න මහත්මයා ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ 2009 අප්‍රේල් 21 වෙනි දින වන විට q කොට්ඨාශයේ එහෙම නැත්නම් අන්තවාදය සම්බන්ධයෙන් කොට්ඨාශයේ සේවය කරලා තියෙනවද?

පි: නැත ස්වාමිනි.

ප්‍ර: කිසියම් අවස්ථාවක ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ අන්තවාදය සම්බන්ධයෙන් කොට්ඨාශයේ සේවය කරලා තියෙනවද?

පි: නැත ස්වාමිනි.

ප්‍ර: යම් තොරතුරක් විදේශිය හෝ දේශිය රාජ්‍ය බුද්ධි සේවය වෙත ලැබුණ විට එම තොරතුරු එම ආකාරයෙන්ම රාජ්‍ය බුද්ධි සේවයේ අනිකුත් අංශයන් වෙත ලබා දීමේ ක්‍රමවේදයක් රාජ්‍ය බුද්ධි සේවයේ අනුගමනය කරලා තියෙනවද මින් පෙර? තොරතුරක් ලැබූ විට එම තොරතුරු එම ආකාරයෙන්ම අනිත් අයත් එක්ක share කිරීමක් වෙනවද අනිත් කොට්ඨාශත් සමඟ?

පි: ස්වාමිනි රාජ්‍ය බුද්ධි සේවයට විදේශ

ප්‍ර: හෝ දේශිය?

පි: හෝ දේශිය තොරතුරක් එනවානම් ස්වාමිනි අධ්‍යක්ෂකතුමාට ආපු තොරතුරක් එතුමා තීරණය කරනවා ස්වාමිනි. කොයි අංශයට, අදාළ අංශයට යවනවද අනිකුත් නියෝජ්‍ය අධ්‍යක්ෂක දැනුවත් කරනවද කියන එක. මට තොරතුරක් ලැබුණොත් ස්වාමිනි ඒ තොරතුර අනුව අධ්‍යක්ෂකතුමා දැනුවත් කරනවා. මට අදාළ අංශයට අදාළනම් පහළ නිලධාරින්ගෙන් ලැබෙන තොරතුරුක් නම් ඒක තොරතුරේ තක්සේරු කරලා ඒක අධ්‍යක්ෂකතුමා දැනුවත්කරන්න ඕනිනම් දැනුවත් කරනවා. වෙනත් කොට්ඨාශයකට අදාළනම් වෙනත් කොට්ඨාශයේ අදාළ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා වෙත යොමු කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: සෙනවිරත්න මහත්මයා අන්තවාදය පිළිබඳව තොරතුරක් ලැබුණු විට එම තොරතුර වෙනත් අංශයකට යොමු කරන අවස්ථාවන් තියෙනවද ?

පි: නැත ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ දැක්වූ කාර්යාන් සම්බන්ධයෙන් සහයෝගයට කොමිෂන් සභාවේ ස්තුතිය සාක්ෂිකරුට පළ කරනවා. සාක්ෂිකරු මුදා හරිනවා.

දැන් වෙලාව: ප.ව. 12.25

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය:2020.10.20 වේලාව: ප.ව.12.25

සටහන් කළේ - නිල්මිණි කුමාරි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා (පැමිණ නැත) -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය
-සාමාජික-

පෙනී සිටීම

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා,ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, රජයේ නීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා, රජයේ නීතිඥ චතුරංග බණ්ඩාර මහතා සමඟ රජයේ නීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මෙම සාක්ෂිකරුගෙන් සාක්ෂි ලබා ගැනීම අප්‍රසිද්ධියේ ලබා ගන්නා බව සටහන් කරනවා.

<u>සාක්ෂි කැඳවීම ආරම්භ කරමි.</u>

නම : හර්ෂප්‍රිය කමලනාත් අමරසිංහ.
වයස : අවු 52යි
ජාතිය : සිංහල
ආගම : බුද්ධාගම
දැනට දරණ තනතුර : සහකාර පොලිස් අධිකාරි
රැකියා ස්ථානය : රාජ්‍ය බුද්ධි සේවාව
ප්‍රතිඥා දී කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: අමරසිංහ මහත්මයා පොලිස් දෙපාර්තමේන්තුවට 1988 මාර්තු මාසේ 15 වෙනිදා බැඳුනා කියලා මා කිව්වොත් ඒක නිවැරදියිද?

පි: නිවැදියි ස්වාමිනි.

ප්‍ර: මොන තනතුරට ඔබ බැඳුනේ?

පි: ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙක් ලෙස පොලිස් සේවයට බැඳුනා ස්වාමිනි.

ප්‍ර: ඔබ රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්ත වුණේ කවදා ඉඳලාද?

පි: 2003 මැයි මාසේ 23 වන දින ස්වාමිනි.

ප්‍ර: ඒ අවස්ථාව වන විට ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේ දරණ ලද තනතුර කුමක්ද?

පි: පොලිස් පරීක්ෂණ තනතුර ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔබ රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්ත වෙනකොට ඔබට ඒ ව්‍යුහය තුල ලැබෙන තනතුර මොකක්ද?

පි: ස්වාමිනි යම් අංශයක ස්ථානාධිපතිවරයෙක් ලෙස.

ප්‍ර: සේවය කරන්න ලැබුණ අවස්ථා?

පි: සේවය කරන්න ලැබුණා අවස්ථා.

ප්‍ර: ඔබ 2019 අප්‍රේල් මාසේ 4 වෙනිදා වෙනකොට රාජ්‍ය බුද්ධි සේවයේ දරණ ලද තනතුර මොකක්ද?

පි: ස්වාමිනි සහකාර අධ්‍යක්ෂකවරයෙක් ලෙස මා සේවය කරේ ස්වාමිනි.

ප්‍ර: ඔබට පැවරිලා තිබුණේ මොනවගේ රාජකාරිද?

පි: ස්වාමිනි සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම, මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් තොරතුරු සැපයීම. ඊට අමතරව රාජ්‍ය බුද්ධි සේවයේ මරදාන , කිරුළුපන සහ මෝදර යන දිසා යන බුද්ධි කාර්යාංශ අධීක්ෂණය කිරීම.

Project Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: එතකොට ඔය රාජකාරි සිද්ධ කරනකොට ඔබේ දැනුම තුළ තියෙනවද කොළඹ නගරයේ තියෙන හෝටල්වලින් ඔවුන්ගේ අමුත්තන්ගේ නාම ලේඛනය රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙනවද කියන කරුණ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: සාමාන්‍යයෙන් ඒක දින චර්යාවක් විදියට සිදු වෙන දෙයක්ද?

පි: ස්වාමිනි මුලදී 2019 ..

ප්‍ර: නැහැ මං අහන්නේ දෛනිකව සිද්ධ වෙනවද කියලා?

පි: ස්වාමිනි හෝටල් කිහිපයකින් අමුත්තන්ගේ විස්තර රාජ්‍ය බුද්ධි සේවාව වෙත එවනවා ස්වාමිනි. දෛනික එවනවා ස්වාමිනි. සමහර අවස්ථාවලදී හැම එකකින්ම දිනපතාම එවන්නේ නැහැ. සමහර විට එහෙම අතහැරෙන දින තිබෙනවා. සාමාන්‍යයෙන් එවනවා හෝටල් කිහිපයකින්.

ප්‍ර: එතකොට ඇයි ඔබ ඒ ආකාරයේ පිළිතුරක් ලබා දුන්නේ. ඒ එසේ කැඳවීම යම් අවශ්‍යතාවයක් මත පදනම් කරගෙන නේද සිදු කරන්නේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එහෙමනම් යම් හෝටලයක යම් දෙන ලද දිනයකදී නැවතිලා හිටියේ කවුද කියන එක දැන ගන්නේ ඔහු හෝ ඇයගේ පෞද්ගලික්තවය පිළිබඳව සොයා බලනවට වැඩියේ මේ රටේ රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් ඇති වුණොත් ඒ සම්බන්ධයෙන් එය උපයෝගි කර ගන්නටනේ?

පි: එහෙමයි ස්වාමිනි. මෙම රාජකාරිය පටන් අරගෙන තිබුණේ ප්‍රභූ ආරක්ෂාව සම්බන්ධයෙන්. ආරක්ෂක තර්ජන වාර්තා සකස් කරනවා. ඒ ආරක්ෂක තර්ජන වාර්තාවල යම් තොරතුරු ලබා ගැනීම සඳහා තමයි මේ ක්‍රියාවලිය ආරම්භ කරලා තියෙන්නේ.

ප්‍ර: මොන වකවානුවේ වගේද ආරම්භ කරලා තියෙන්නේ?

පි: ස්වාමිනි 2017.05 මාසේ 03 වෙනිදා ඉඳලා තමයි ස්වාමිනි පටන් අරන්ගෙන තිබෙන්නේ.

ප්‍ර: ඔබ කිව්වා දෛනිකව මෙය සිදු කළ යුතු වුවත් හෝටල් විසින් හැම අවස්ථාවකදීම එය එලෙසම සිදුවුණේ නැහැ කියලා?

පි: එහෙමයි ස්වාමිනි. සමහර හෝටල්වලින් දිනපතාම එවන්නේ නැහැ ස්වාමිනි. වැඩි වශයෙන් එවනවා ස්වාමිනි. සමහර දිනවල ඒ ඉන්න මං හිතන්නේ එතන ඉන්න නිලධාරින්ගේ මොනවාහරි කටයුත්තක් හේතුවෙන් වෙන්න ඇති මේ දිනපතාම එවන්නේ නැහැ ස්වාමිනි. නමුත් වැඩි වශයෙන් එවනවා ස්වාමිනි.

ප්‍ර: දැන් එසේ රාජ්‍ය බුද්ධි සේවය වෙත එවනු ලබන තොරතුරුවලින් ඔබ මොන මොන කරුණුද දැන ගන්නනට අපේක්ෂා කරන්නේ? එවන ලැයිස්තුවේ මොනවද ඔබ බලාපොරොත්තු වෙන දේවල් තියෙන්න ඕනි දේවල් කියලා?

FAIR COMMENT — BY JEZEEM —

පි: ස්වාමිනි එම පුද්ගලයාගේ ඉන්න අයගේ නවාතැන් ගෙන සිටින පුද්ගයින්ගේ සම්පූර්ණ නම්, ප්‍රධාන වශයෙන්ම ඔවුන්ගේ Identity Card Numbers , විදේශ ගමන් බලපත්‍ර අංක, ලිපිනයන් ආදිය ස්වාමිනි.

ප්‍ර: ඔබ ඒ සඳහන් කරන්නට යෙදුණු කරුණු කෙනෙකුගේ පෞද්ගලික තොරතුරු හා බැඳෙනවානේ අමසිංහර මහත්මයා නේද?

පි: එහෙමයි ස්වාමිනි.

****

දැන් වේලාව : ප.ව. 12.30
මෙතැන් සිට ල/ලේ : සවිනි මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව. 12.30
පෙර සටහන් : නිල්මිණි මෙනවිය.
මෙතැන් සිට : සචිනි මෙනවිය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: එතකොට ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ඇයි රාජ්‍ය බුද්ධි සේවාව ඒ වගේ හෝටල්වල නවතින අයගේ පෞද්ගලික තොරතුරු මේ ආකාරයට ලබා ගන්නේ කියලා? මොකක්ද හේතුව ?

උ : ස්වාමීනි එම .

ප්‍ර: ඔබ කිව්වා ප්‍රභූ ආරක්ෂාවට කියලා. හැබැයි ඉතින් ප්‍රභූ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන්නට ඒ ලැබෙන තොරතුරුවලින් යමක් කරනවා ඇතිනේ ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර: අන්න ඒකයි මං බලාපොරොත්තු වුණ පිළිතුර ?

උ ස්වාමීනි එම ඒ තොරුතුරු අපේ තියෙන රාජ්‍ය බුද්ධි සේවාවේ තියෙන තොරතුරු සමඟ සංසන්දනය කරලා බලලා අයහපත් වාර්තා තියනවා නම් ස්වාමීනි ඒ සම්බන්ධයෙන් අපි ජනාධිපති ආරක්ෂක අංශයට හෝ ඒ threat assessment හදන අවස්ථාවේදී අගමැති ආරක්ෂක අංශයට හෝ දැනුම් දෙනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ මේ ගරු කොමිෂන් සභාවට කියන්නේ හෝටල් මඟින් ඔබලා වෙත සපයනු ලබන දත්ත භාවිතා කරලා එය යම් ආකාරයකට සංසන්දනය කිරීමක් ඔබගේ දත්ත ගබඩාවේ තියෙන තොරතුරු සමඟ සිදුකරනවා කියලා ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අවස්ථාවේදී යම් ප්‍රශ්න සහගත තැනැත්තෙක් පිළිබඳව කරුණු අනාවරණය වෙනවා නම් එතකොට ඒ පිළිබඳව අවශ්‍ය පියවර ගැනීමට මෙසේ ලැබෙන තොරතුරු ආධාර වෙනවා කියලද ඔබ කියන්නේ?

පි: එහෙමයි ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවයේ ඔබ ඔය කරන ක්‍රියාකාරම සඳහා යම් කිසි ලැයිස්තුවක් තියෙනවද ඒ කියන්නේ black listed persons වගේ ලැයිස්තුවක් තියෙනවද නැත්නම් ඔය හෝටල්වලට ඇවිල්ලා කාමරවල ඉන්න තැනැත්තන් ප්‍රශ්න සහගත පුද්ගලයින්ද කියන එක සෙවීම කරන්නේ රාජ්‍ය බුද්ධි සේවයට වාර්තා වෙලා තියෙන සියලුම වාර්තාවලින් එක් වාර්තවක හෝ එම තැනැත්තාගේ සඳහන්වීමක් තියෙනවද කියන එක පරීක්ෂා කිරීමෙන් පසුව ?

FAIR COMMENT BY JEZEEM

උ: ස්වාමීනි තියෙන දත්ත ගබඩාවේ තියෙන දත්තත් එක්ක සංසන්දනය කිරීමක් තමයි ස්වාමීනි කරන්නේ.

ප්‍ර: දැන් ඔය ආකාරයට හෝටල් මඟින් ඉදිරිපත් කරන තොරතුරු ඔබේ අත්දැකීම අනුව හැමවිටම සම්පූර්ණව රාජ්‍ය බුද්ධි සේවාව අපේක්ෂා කරන ආකාරයෙන්ම ලැබෙනවද ?

පි: සමහර අවස්ථාවලදී ලැබෙන් නැහැ ස්වාමීනි.

ප්‍ර: මොනවද තියෙන අඩුපාඩු දකින්න ලැබෙන අඩුපාඩු?

උ: සමහර අවස්ථාවලදී ස්වාමීනි Identity card අංක ඒ එක්කම විදේශ ගමන් බලපත්‍ර අංක සමහර වෙලාවට එවන්නේ නැහැ ස්වාමීනි. සමහර වේලාවට හෝටල්වලින් එවනවා සමහර හෝටල්වලින් එවන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: එතකොට නම් ගම් සටහන් කර ගැනීමේදී ඔබේ අත්දැකීම අනුව එහිත් යම් අඩුපාඩු එහෙම නිරීක්ෂණය කරන්නට අවස්ථාව ලැබිලා තියෙනවද ?

පි: තියෙනවා ස්වාමීනි. සම්පූර්ණ නම් එවන්නේ නැහැ ස්වාමීනි නම් වල කොටස් එවන අවස්ථාවලුත් තියෙනවා සම්පූර්ණ එවන අවස්ථාවලුත් තියෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ එහෙම නම් ඔය තොරතුරු ලබාගැනීමේ පරමාර්ථය එයින් ඉෂ්ඨ වෙන්නේ නැහැනේ මේසේ අසම්පූර්ණ තොරතුරු එවනවා නම් දෙනිකව ඒ තොරතුරු එවන්නේ නැත්නම් නේද එතකොට රාජ්‍ය බුද්ධි සේවය මේ අදාළ හෝටල් පවත්වාගෙන යන කළමණාකාරිත්වයට ඒ පිළිබඳව දැනුම්දීලා ඔබලා අපේක්ෂා කරන ඒ තොරතුරු දෛනිකව ලබාදෙන්නට කියලා උපදෙස් දීලා නැද්ද?

උ: දැනුම්දීලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබ කියන්නේ එසේ දැනුම්දී තිබිය දී වුවද ඒ පෙර පරිදිම දෛනිකව එවීම සිදුවීමේ ප්‍රශ්නයක් තවදුරටත් ක්‍රියාත්මක වෙනවා තොරතුරු අසම්පූර්ණවීමේ තත්ත්වයක් තවදුරටත් ක්‍රියාත්මක වෙනවා කියලද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහෙනම් ඔබට කියන්න පුළුවන්ද 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා ටාජ් සමුද්‍රා හෝටලයේ ඔබලාට රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණද කියලා එදින ඒ කියන්නේ ඊට පෙර දා ඒ හෝටලයේ නැවතිලා හිටපු ඒ අයගේ අමුත්තන්ගේ ලැයිස්තුවක්?

උ: ස්වාමීනි මෙම නම් සංසන්දනය කිරීමේ කාර්යය කරන්නේ ස්වාමීනි පරිගණක අංශයෙන් කරන්නේ ඒ අදාළ හෝටල්වලින් කෙලින්ම පරිගණක අංශයට Email හරහා තමයි ස්වාමීනි එවන්නේ. එතකොට පරිගණක අංශයෙන් ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කරලා බලලා අයහපත් වාර්තාවක් තියෙනවා නම් දැනුම් දෙනවා ස්වාමීනි ඒ අදාළ අංශයට ඒක තමයි ස්වාමීනි ක්‍රමවේදය.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: එතකොට දැන් මා ඔබෙන් අහන්නේ ඔබට 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදායින් පස්සේ කොයිවෙලාවක හරි දැන ගන්න ලැබුණද ටාජ් සමුද්‍රා හෝටලය විසින් 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා ඒ ගොල්ලන්ගේ අමුත්තන්ගේ ලැයිස්තුව රාජ්‍ය බුද්ධි සේවාව වෙත එවලා තිබුණද කියලා?

උ: එවලා තිබුණා කියලා දැනගන්න ලැබුණා ස්වාමීනි එයින් පසුව .

ප්‍ර: එම ලැයිස්තුවේ මොහොම්ඩ් අබ්දුල් ලතිෆ් ජෙමිල් කියන තැනැත්තාගේ යන තැනැත්තාගේ නම අන්තර්ගතව තිබුණාද නැද්ද කියන කරුණ පිළිබඳවත් එහෙම නම් ඔබට දැනගන්න ලැබෙන්නට ඇතිනේ?

උ: ස්වාමීනි පසුව දැනගන්න ලැබුණා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට ඔය තොරතුරු ලැබුණේ කොහෙන්ද ?

උ: ස්වාමීනි පරිගණක අංශයෙන් ස්වාමීනි .

ප්‍ර: ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ පරිගණක අංශයෙන් ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකක්ද ඔබට ජෙමිල්ගේ නම පිළිබඳව දැන ගන්න ලැබුණේ?

උ: ස්වාමීනි එම ඒ පසුව සොයා බැලීමේදී ස්වාමීනි එම පුද්ගලයාගේ නම මොහමඩ් ජමීල් යනුවෙන් නමේ මොහමඩ් ජමීල් යනුවෙන් එම නාමලේඛනයේ තිබෙන බවට දැනගන්න ලැබුණා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ නමේ වෙනසක් තිබුණා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ වගේ අවස්ථාවකදී ඔබේ දත්ත පද්ධතියේ තියෙන දත්ත සමඟ සංසන්දනය කර කොට නිවැරදි සංසන්දනයක් සිදු වෙනවද?

උ: ස්වාමීනි එහෙම සිදුවෙන්නේ නැහැ ස්වාමීනි. නමේ අකුරු වැරදුණාම දත්ත පද්ධතිය අනුව මගේ දැනීමේ හැටියට මං කරන කාර්යක් නෙමේ පරිගණක අංශයෙන් කෙරෙන්නේ මම තියෙන්නේ මට තියෙන්නේ සමාන්‍ය දැනුමක් .

ප්‍ර: සමාන්‍ය දැනුමෙන් තමයි දැන් මේ අහන්නේ?

උ: ඒ අනුව ස්වාමීනි නමේ ඉංග්‍රීසි අකුරුවල වෙනසක් තියෙනවා නම් ස්වාමීනි එහෙම අපිට ඒ දත්ත සම්බන්ධයෙන් දැනගැනීමට ලැබෙන්නේ නැහැ ස්වාමීනි. සංසන්දනය වීමක් සිදුවෙන්නේ නැහැ ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු හැඳුනම්පත් අංකය පාස්පෝට් අංකය සඳහන්වෙලා තිබුණද?

උ: සඳහන් වෙලා නැහැ ස්වාමීනි. ස්වාමිනි මගේ දැනුමේ හැටියට ප්‍රධාන වශයෙන්ම අපේ දත්ත ගබඩාවේ සංසන්දනය කිරීම් සිදුවෙන්නේ හැඳුනම්පත් අංකය සහ විදේශ ගමන් බලපත්‍රය අංකය. ඒ අනුව ඒ නමත් එක්ක සංසන්දනය වෙන්න නැත්තේ ස්වාමීනි ඉංග්‍රීසි අකුරුවල පරස්පරතාවයක් තිබුණොතින් වෙන්නේ නැහැ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එසේ හැඳුනම්පත් අංකය මේ ගුවන් ගමන් බලපත්‍රයේ සඳහන් නොවීම සම්න්ධව යම් කිසි විමර්ශනයක් කවුරුහරි ඒ සම්බන්ධයෙන් කරාද?

උ: මම කරේ නැහැ ස්වාමීනි. ඒ සම්බන්ධයෙන් CID එකෙන් තමයි ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන්නේ අපි කරේ නැහැ ස්වාමීනි. ඒ සම්බන්ධයෙන් ඒ ලේඛනය ස්වාමීනි ගොඩාක් එහෙම අංක සඳහන් වෙලා නැහැ ස්වාමීනි අන්තිම අංක දෙක පමණයි ස්වාමීනි සඳහන් වෙලා එවන්නේ .

ප්‍ර: අප්‍රේල් 21 වෙනිදා පමණද ඊට?

උ: නෑ ස්වාමීනි දිගටම එහෙම වෙනවා ස්වාමීනි. ඒ ඔය මේ සම්බන්ධයෙන් අඩු පාඩු සම්බන්ධයෙන් ඒ ආරක්ෂක කලමණාකරුවන්ව කලමණාකාරිත්වයට දැනුම් දුන්නාම දින කීපයක් එවනවා ස්වාමීනි හරියට. ඊට පස්සේ ආයෙත් ඒ එතන එදිනෙදා ඉන් ඒ කලමණාකරුවන්ගේ සහ ඒ සේවය කරන අය අනුව සමහරදාට එවන්නේ නැහැ ස්වාමීනි. ඒ අනුව ස්වාමීනි අපි හෝටල්වලට දැනුම්දීලා තියෙනවා එවන්න කියලා නමුත් ඒ අඩු පාඩුව ඇතිව තමයි ස්වාමීනි එවන්නේ .

ප්‍ර: දැන් එදින ටාජ් හෝටලයට හෝ අනිත් හෝටල්වලට ප්‍රභූවරුන් සම්බන්ධව වෙනම ලේඛනයක් පවත්වාගෙන යනවද ඔවුන්ගේ නම් ඇතුලත් කරනවද පරිගණකයෙන් ?

උ: ස්වාමිනි පැහැදිලි නැහැ ප්‍රශ්නය.

ප්‍ර: විදේශීය ප්‍රභූවරුන් හෝ වෙනත් ප්‍රභූවරු පැමිණියාම VIP ලා එයත් නාම ලේඛනයට ඇතුලත් කරනවද නැත්නම් හෝටල්වලින් ඒ වෙනම නාම ලේඛනයක් පවත්වාගෙන යනවද?

උ: හෝටල්වලද ස්වාමිනි.

ප්‍ර: හෝටල්වල ? විදේශ ඇමතිවරු ශ්‍රී ලංකාවේ ප්‍රභූවරු වගේ ?

උ: එත් ආවාම ස්වාමීනි සාමාන්‍යයෙන් ක්‍රියාපටිපාටිය තමයි අනුගමනය කරන්නේ. ඒ නම් ඇතුලත් වෙනවා හෝටල්වල එන ඒ නාමලේඛනය ඇතුලත් වෙනවා ස්වාමීනි. වෙනම ලිස්ට් එකක් නෙමේ ස්වාමීනි.

ප්‍ර: ඒ සෑම දෙනාම ඇතුලත් වෙනවා?

උ: සෑම දෙනාම ඒ තියෙන System එකේ හෝටලයට ඇතුලු වෙන කොට ඒ ගොල්ලන්ගේ නම් ඒ ගොල්ලන්ගේ විස්තර ගන්නවා ස්වාමිනි. හෝටලයෙන් අරගෙන ඇතුලත් කරනවා ස්වාමිනි. ඒ ලිස්ට් එකට

ප්‍ර: ආරක්ෂක හේතූන් මත ඇතුලත් නොකරන කට්ටය ඉන්නවද ?

උ: ඒක කියන්න දන්නේ නැහැ මම ඒ සම්බන්ධයෙන්.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ කියන විදියට ඔය අප්‍රේල් 21 විතරක් නෙමේ ඊට පෙර පවා මේ නම් සම්පූර්ණ නැති List ඇවිල්ලා තියෙනවා නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඉතිං මේ පිළිබඳව වගකිව යුතු අය දැනුවත් කරලා ඇයි මෙහෙම කරන්නේ කියලා ඒ හෝටල්වල ආරක්ෂක කළමණාකරුවන්ට එරෙහිව කිසිම ක්‍රියාමර්ගයක් ගන්න ඔබලා නිර්දේශ කරේ නැද්ද?

පි: එහෙම නිර්දේශ කිරීමක් කරේ නැහැ ස්වාමීනි අපි ගිහිල්ලා දැනුම් දෙනවා ස්වාමීනි. ඒ සම්බන්ධයෙන් ඔවුන්ට පුද්ගලිකවත් දැනුම්දීලා තියෙනවා.

ප්‍ර: හොඳයි දැන් අප්‍රේල් 21 ප්‍රහාරය සිදුවුණාට පස්සේවත් අඩු ගානේ ඔය List හරියට?

උ: දැන් එවනවා ස්වාමීනි.

ප්‍ර: අඩුපාඩු නැතිව දැන් එවනවා?

උ: අඩුපාඩු නැතිව දැන් එවනවා ස්වාමීනි.

ප්‍ර: යම්කිසි හෝටලයකින් අඩුපාඩු සහිතව දැන් එවේවාත් අඩුගානේ ඔබලා දැන් හෝ ඒ කළමණාකරුවන්ට විරුද්ධව කිසියම් ක්‍රියාමාර්ගයක් ගන්නවද ?

උ: ඉදියේදී ගන්න ඕන.

ප්‍ර: මේ වෙනකම් ?

උ: මේ වෙනකම් අරගෙන නැහැ ස්වාමීනි. දැනට ගොඩාක් ස්වාමිනි ඒවනවා ඒ විස්තර

ප්‍ර: හරියට එවනවා?

උ: එවනවා .

ප්‍ර: බැරිවෙලාවක්වත් නිසි පරිදි සම්පූර්ණ නොකර තොරතුරු එවලා තිබුණොත් ඔබලට කිසියම් නීමය ක්‍රියාමාර්ගයක් ගන්න කටයුතු කරන්න හැකියාවක් තියෙනවද?

උ: ස්වාමීනි අපිට වාර්තා කිරීමක් කරන්න පුළුවන් ස්වාමීනි පොලිස්පතිතුමාට වාර්තා කරලා ඒ අනුව පියවරක් ගන්න හැකිවේවි ස්වාමීනි.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: Mr. අමරසිංහ පාර්ලිමේන්තු තේරීම් කාරක සභා වාර්තාවේ volume එකේ සඳහන් වෙනවා සාක්ෂියක් හැටියට 2019 අප්‍රේල් 20 වන දින රාත්‍රියේ ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස්තුමා ටාජ් සමුද්‍රා හෝටලයේ රැඳී සිටිය කියලා ඔබට එවන ලද නාම ලේඛනයක එතුමාගේ නම තිබුණද ඔබලාගේ ආයතනයට එවපු නාමලේඛනයකට ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ස්වාමීනි ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමක් කරේ නැහැ ස්වාමීනි. මං දැනුවත් වුණේ නැහැ මේ අවස්ථාව වෙනකම්.

ප්‍ර: දැන් ඔය කොමසාරිස්තුමා ඇහුවානේ අර VVIP ලා VIP ගේ නම් එහෙම නම් තිබුණද කියලා?

උ: ස්වාමීනි මට එහෙම පරිසනක අංශයෙන් මට එහෙම දැනුම් දීමක් කරේ නැහැ ඒ සම්බන්ධයෙන් .

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබ ළඟ මේ අවස්ථාවේදී ජමීල් ගේ නම සඳහන් ඒ තොරතුරු තියෙනවද

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: කොයි ආකාරයට ද අමරසිංහ මහත්මයා ඔය ටාජ් සමුද්‍රා හෝටලයෙන් ඔබලාට 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා ලැබුණු තොරතුර ලැබුණේ . අමුත්තන් පිළිබඳ නාම ලේඛනය ?

උ: Email මාර්ගයෙන් ලැබුණේ ස්වාමීනි.

ප්‍ර: ඔබ සඳහන් කරා ජෙමීල් සම්බන්ධයෙන් ඇතුලත් කරලා තියෙන සටහනට අදාළ ලේඛනය ඔබට මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න පුළුවන් කියලා ගරු කොමිෂන් සභාවට ?

උ: එහෙමයි.

ස්වාමීනි අවසර පතනවා මේ අවස්ථාවේදී ටාජ් සමුද්‍රා හෝටලය විසින් රාජ්‍ය බුද්ධි සේවය වෙත Email පණිවිඩයක් ලෙස ඒවා ඇති එම තොරතුරේ Email පණිවිඩය X 588 ලෙසත් ජෙමීල් සම්බන්ධයෙන් තොරතුරු සඳහන් එම පිටුව පමණක් එම පිටුව ස්වාමීනි X 588 A වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර: ස්වාමීනි සාක්ෂිකරුගේ අවධානය C4 B ලේඛනය කෙරෙහි යොමු කරනවා. අමරසිංහ මහත්මයා ඔබට මා ඔබේ අවධානය යොමුකරන ඔය තොරතුර මීට පෙර කියවන්නට අවස්ථාවක් ලැබුණද කියල ඉසස්රවෙලා කියන්න ?

උ: ස්වාමීනි මගේ සාක්ෂිය.

ප්‍ර: මගේ ප්‍රශ්නය ඇවිල්ලා ඔය මම පෙන්වන C 04 B ලේඛනය මීට පෙර කියවන්නට were you able to read එම තොරතුර කියවන්නට ලැබුණද?

උ: ලැබුණා ස්වාමිනි.

ප්‍ර: කොයි වෙලාවේද?

උ: ස්වාමීනි මගේ ප්‍රකාශය සටහන් කරන අවස්ථාවේදී මෙම ගරු කොමිෂන් සභාවෙන් ප්‍රකාශ සටහන් කරන අවස්ථාවේදී මට පෙන්නුවා ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදාට පෙර ඔබට මේ C 4 B ලේඛනයේ තිබුණ තොරතුර කියවන්නට ලැබුණේ නැහැ කියලනේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබට C 4 Bලේඛනයේ අඩංගු ඒ තොරතුරු පිළිබඳව 2019 අප්‍රේල් 21 ට පෙර දැන ගන්නට ලැබුණ ද?

උ: නැත ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: පැහැදිලි කර ගැනීමක් වශයෙන් නැවත අහන්නේ 2019 අප්‍රේල් 21 වෙනිදාට පෙර රාජ්‍ය බුද්ධි සේවයේ යෙදී සිටි ඔබට යම් තොරතුරක් ලැබුණද විදේශිය බුද්ධි ආයතනයකින් රාජ්‍ය බුද්ධි සේවයට තොරතුරක් ලබාදීලා තිබෙනවා කියලා මේ ඉස්ලාම් අන්තවාදීන් විසින් යම් කිසි ප්‍රහාරයක් එල්ල කරන්න එල්ල කරයි කියන එක?

උ: ලැබුණේ නැහැ ස්වාමීනි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍ය නොවන බව අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් විසින් පෙනී සිටින උගත් නීතිඥවරයා ප්‍රකාශ කරයි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍ය නොවන බව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරිය දන්වයි.

කොමිෂන් සභාවට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධයෙන් දැක්වූ සහයෝගයට කොමිෂන් සභාවේ ස්තූතිය පිරිනමනවා.

සාක්ෂිකරු මුදාහරිනවා.
වේලාව: ප.ව.12.50

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.10.20 වේලාව: ප.ව.02.15

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා (පැමිණ නැත) -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය
-සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය,රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

<u>නියෝගය.</u>

මීට පෙර කොමිෂන් සභාව විසින් කරන ලද නියෝගයකට අනුව කොමිෂන් සභාව විමර්ශන නිලධාරීන් විසින් වෝහාරික පරීක්ෂණයක් සඳහා කොමිෂන් සභාව භාරයට ලබාගත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතාගේ ජංගම දුරකථනය ඔහුට නැවත නිදහස් කරන ලෙසට කොමිෂන් සභාව නියෝග කරමි. මෙම නියෝගය කරනු ලබන්නේ අදාළ වෝහාරික පරීක්ෂණය කර ඇති බව දැනුවත් කර නිසයි.

මෙම සාක්ෂිකරුගෙන් සාක්ෂි ලබාගැනීම අප්‍රසිද්ධියේ ලබාගන්නා බව සටහන් කරනවා.

සාක්ෂිකරුගේ නම	:	**නානායක්කාර සෙනරත් අප්පුහාමිලාගේ නයනානන්ද ලලිත් කුමාර නානායක්කාර .**
වයස	:	**අවුරුදු 60**
ජාතිය	:	**සිංහල**
ආගම	:	**බෞද්ධ**
තනතුර	:	**විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති.**
පුද්ගලික ලිපිනය	:	**211 B පට්ටියවත්ත පාර , කොතලාවල කඩුවෙල.**

ප්‍රතිඥා දෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබ පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණේ මොන අවුරුද්දෙ ද?

උ: 1980 වර්ෂයේ දී .

ප්‍ර: ඔබ 2020 විශ්‍රාම ගනු ලැබුවා නේද?

උ: එසේය.

ප්‍ර: එතකොට ඔය කාල පරිච්ඡේදය තුළදී ඔබ රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්තව සේවය කෙරුවනේ?

උ: එහෙමයි.

ප්‍ර: ඒ කොයි කාලෙ ඉඳන් කොයි කාලය දක්වාද?

උ: 2004 වර්ෂයේ අග භාගයේ සිට 2020 මුල මාසය දක්වා. ජනවාරි මාසය දක්වා.

ප්‍ර: ජනවාරි 25 මා කිව්වොත් හරිද?

උ: හරි .

ප්‍ර: ඔබ 2019 අප්‍රේල් මාසයේ 04 වැනිදා වන කොට පොලිස් දෙපාර්තමේන්තුවේ දැරුවේ කුමන තනතුරක්ද?

උ: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුර.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවාවේ ආයතනික ව්‍යුහය තුළ ඔබ දැරුව තනතුර මොකද්ද ඒ වන විට?

උ: මම නියෝජ්‍ය අධ්‍යක්ෂක සම්බන්ධ තනතුරක් දැරුවා. සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍යය සම්බන්ධයෙන් ස්ථාපිත කරලා තියෙන කොට්ඨාශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුර දැරුවා.

ප්‍ර: මොන වගේ රාජකාරිද ඔබට පැවරිලා තිබුණේ?

උ: එහෙම කියනව නම් ජාතික ආරක්ෂාවට සම්බන්ධ තොරතුරු සම්බන්ධයෙනුත් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් මුළු දිවයින තුළමත් සංවිධානාත්මක අපරාධ සම්බන්ධ අපරාධකරුවන් මේ දිවයින තුළ සිටින අය සම්බන්ධයෙනුත් තොරතුරු එක්ර රැස් කර අදාළ ස්ථානවලට බෙදාහැරීම තමයි.

ප්‍ර: දැන් ඔබේ ඔය සේවා කාලය තුළ දී ඔබ යම් අවස්ථාවකදී රාජ්‍ය බුද්ධි සේවයට අනුයුකත්ත වෙලා විදේශයක සේවය කරාද?

උ: ඔව් මම ඉන්දියාවේ සේවය කරා.

ප්‍ර: ඒ කුමන කාලයේ ද කියලා කියන්න පුළුවන් ද?

උ: මම 2017 වර්ෂයේ ජූලි මතක විදියට 02 වැනිදා සිට 2018 වර්ෂයේ ඔක්තෝම්බර් 02 වැනිදා දක්වා ආරක්ෂක උපදේශක වශයෙන් චෙන්නායි නුවර පිහිටි නියෝජ්‍ය මහා කොමසාරිස් කාර්යාලයේ සේවය කරා.

ප්‍ර: එතකොට එය පිහිටා තියෙන්නේ මහා කොමසාරිස් කාර්යාලයේම ද ?

උ: එහෙමයි.

ප්‍ර: මොන වගේ රාජකාරි ද ඔබට තිබ්බේ ?

උ: රාජකාරි වශයෙන් කියනව නම් ශ්‍රී ලංකාවට අහිතකරව එන සියළුම තොරතුරු සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමත් එතකොට අනවසරයෙන් ශ්‍රී ලංකාවට එන්නන් පිළිබඳවත් ශ්‍රී ලංකාවෙන් අනවසරයෙන් ඉන්දියාවට ඇතුල් වෙන්නන් පිළිබඳවත් ප්‍රභූවරුන් ඉන්දියාවට පැමිණෙන වෙලාවේදී threat assessment පිළියල කිරීම සහ එම ආරක්ෂක අංශ සමඟ සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමත්.

ප්‍ර: ඉන්දියාවේ ඔබ රාජකාරි කරන කාලය තුළ දී ඔබට ජමාතේ ඉස්ලාමී සංවිධානය ගැන අහන්න එහෙම ලැබුණ ද ඉන්දියාවෙන් ?

උ: නැහැ කිසිම අවස්ථාවක හම්බ වුණේ නැහැ.

ප්‍ර: කිසියම් හෝ ආගමික මතවාදයන්ට අදාළව කටයුතු කරන ලද මුස්ලිම් ආගමික මතවාදයන්ට අදාළව කටයුතු කරන ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානය පිළිබඳව ඔබට අහන්නට ලැබුණ ද?

උ: ශ්‍රී ලංකාවට අහිතකරව කරන තවුහිද් ජමාත් සංවිධානයක් පිළිබඳව නෙවෙයි සාමාන්‍යයෙන් ඉන්දියාවේ තියෙනවා ඉන්දියන් තවුහිද් ජමාත් කියලා. ඒ සංවිධානය ගැන දැනගෙන හිටියා ඒක ශ්‍රී ලංකාවට අහිතකරව තිබ්බේ නැහැ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ ඔබ සේවය කෙරුවේ 2017 ඉඳන් 2018 වෙනකන්නේ?

උ: 2018 වෙනකන්.

ප්‍ර: මම කිව්වොත් නිවැරදිද 2018 ඔක්තෝම්බර් මාසේ පළවැනිදා වෙනකන් තමයි ඔබ සේවය කෙරුවේ ඔය වෙන්නායි නුවරට අනුයුක්තව කියලා?

උ: එහෙමයි.

ප්‍ර: එතකොට ඔබ කියන්නේ ඒ කාලයේ දී ඔබට මේ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානය පිළිබඳව ඉන්දියාවේ තිබුණ සෘණාත්මක ආකාරයේ තොරතුරක් ලැබෙන අවස්ථාවක් තිබුණේ නැහැ කියලා ?

උ: තිබුණේ නැහැ.

ප්‍ර: ඔබ ලංකාවේ රාජකාරි කරන කොට කිව්වා මත්ද්‍රව්‍ය ගැන පිළිබඳව වගේම සංවිධානාත්මක අපරාධ පිළිබඳවත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවා කියලා?

උ: එහෙමයි.

ප්‍ර: ඔබ ඒ හැරෙන්නට බස්නාහිර පළාතට අදාළව සහ උෆව පළාත්වලට අදාළව කටයුතු කෙරුවද 2019 අප්‍රේල් මාසේ 04 වැනිදා වෙන කොට?

උ: බස්නාහිර පළාත සම්බන්ධයෙන් කටයුතු කරා නියෝජ්‍ය අධ්‍යක්ෂක වශයෙන් දිසා බුද්ධි සේවා කාර්යාංශ ටික Supervise කරා.

ප්‍ර: එතකොට ඔබ කොයි ආකාරයට ද ඔබේ රාජකාරි කරේ දිසා බුද්ධි කාර්යාංශ සම්බන්ධයෙන් බස්නාහිර සහ උෆව ?

උ: බස්නාහිර සහ උෆව .

ප්‍ර: කියන්න කොයි ආකාරයට ද දිසා බුද්ධි කාර්යාංශවල කටයුතු ඔබ අධීක්ෂණය කරේ කියලා?

උ: ඔව් අධීක්ෂණය කරා දිසා බුද්ධි කාර්යාංශවලට අදාළව පොලිස් වසම් බෙදලා තිබුණා. ඒ අනුව ඒ වසම්වලට එන සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු රැස්කිරීම එතකොට නිෂ්කාශණ වාර්තා සම්බන්ධයෙන් කටයුතු කිරීම විමර්ශන කටයුතු කිරීම වැනි සියළුම දිසා බුද්ධි කාර්යාංශවල කටයුතු අධීක්ෂණය කරනවා.

ප්‍ර: ඒ කියන්නේ සාමාන්‍යයෙන් දිසා බුද්ධි කාර්යාංශයක සිදුවන කටයුතු සියල්ලම ඔබ විසින් අධීක්ෂණය කරා?

උ: මම අධීක්ෂණය කරා. මම යටතේ සහකාර අධ්‍යක්ෂකවරුන් සිටියා. එයාගේ ඒ ගොල්ලො තමයි පරිපාලනය සම්බන්ධයෙන් බැලුවේ. ඊට ඉහතින් තමයි හිටියේ. ඒගොල්ලන්ව බලන්නේ. අරගොල්ලන්ව Close Supervision එක කරේ සහකාර අධ්‍යක්ෂකවරුන් ASP ලා හිටියා.

ප්‍ර: එතකොට ඒ කියන්නේ උෆව සහ බස්නාහිර කියන පළාත් ගත්තාහම ඔබ තමයි අධ්‍යක්ෂකවරයාට පල්ලෙහා මේ පළාත් භාරව හිටියේ ? ඔබ යටතේ තමයි සහකාර අධ්‍යක්ෂකවරු හිටියේ? ඔවුන් යටතේ තමයි ස්ථානිධිපතිවරුන් බුද්ධි කාර්යාංශවල හිටියේ?

උ: එහෙමයි.

Registered Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: දැන් ඔබට ඔබේ සේවා කාලය තුළ දී මුස්ලිම් අන්තවාදයට අදාළව ලංකාවේ වාර්තා වෙලා තියෙන යම් යම් සිද්ධීන් සහ පුද්ගලයින් පිළිබඳව දැනගන්නට ලැබිලා තියෙනව ද?

උ: ලැබිලා තියෙනවා.

ප්‍ර: මොන අවස්ථානුගත යටතේද ඔබට එහෙම දැනගන්න ලැබිලා තියෙන්නේ ?

උ: සමහර අවස්ථාවලදී මට සිද්ධ වෙනවා ජනාධිපතිතුමාගේ ආරක්ෂක මණ්ඩල රැස්වීමේ දී සහභාගි වෙන්න . එම අවස්ථාවේ දී මට ඒ අදාළ මුස්ලිම් සංවිධාන සහ මේ LTTE සංවිධාන සම්බන්ධයෙන් වෙනම අපිට ස්ථාපිත කරපු අංශයක් තියෙනවා. ඒ අංශයත් සමඟ සම්බන්ධ වෙලා මේ ඒකට අදාළ විස්තර ලබා ගැනීමේ දී මාව දැනුවත් වෙලා තිබෙනවා.

ප්‍ර: ඔබ ඔය සඳහන් කරේ ජනාධිපති ආරක්ෂක දිසාව විසින් පවත්වනු ලබන රැස්වීම් පිළිබඳව ද?

උ: එහෙමයි.

ප්‍ර: දැන් ඔය රැස්වීම් වලට ඔබ ගියේ රාජ්‍ය බුද්ධි සේවාව නියෝජනය කරමින්ද?

උ: එහෙමයි.

ප්‍ර: ඔබ හැරෙන්නට මා කිව්වොත් නිවැරදිද පොලිස් අධිකාරි ජනක සෙනවිරත්න මහතාත් මේ රැස්වීම්වලට ගිහිල්ලා තියෙනවා කියලා?

උ: එහෙමයි.

ප්‍ර: දැන් ඔය රැස්වීමට යන්නට පෙර ඔබට තොරතුරු ලැබෙන ආකාරයක් කිව්ව ද?

උ: එහෙමයි .

ප්‍ර: ඒ ආකාරයට තමයි ඔබට සහරාන් පිළිබඳව ඔය තොරතුරු ලැබුණා කියලා කිව්වේ. ඔබේ ඒ අදාළ අංශයෙන්?

උ: සහරාන් පිළිබඳ නෙවෙයි තොරතුරු ලැබිලා තියෙන්නේ IS සංවිධානය සම්බන්ධයෙන් තමයි තොරතුරු ලැබිලා තියෙන්නේ.

ප්‍ර: එතකොට ඒ IS සංවිධානය සම්බන්ධයෙන් ඔබට ලැබුණු තොරතුරු ලැබුණේ එම ආගමික අන්තවාදය සම්බන්ධයෙන් විමර්ශන කරන රාජ්‍ය බුද්ධි සේවාවේ අදාළ අංශයෙන්ද?

උ: එහෙමයි .

ප්‍ර: සාමාන්‍යයෙන් සිරිතක් විදියට ජනාධිපති ආරක්ෂක දිසාව විසින් පවත්වනු ලබන රැස්වීම්වලට යන්නට පෙර රටේ තියෙන තත්ත්වය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා එතැනට එන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ඔබ සිරිතක් විදියටම රාජ්‍ය බුද්ධි සේවාවේ විවිධ අංශ වලින් මේ වගේ තොරතුරු ලබාගන්නව ද?

උ: මෙම රැස්වීමට සාමාන්‍යයෙන් යන්නේ එම අපේ ඒ අදාළ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා ඒ විෂය පථයට අදාළ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා නමුත්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එදා ඔහුට යන්න විදියක් නැති නිසා මම ගියා එක් වතාවක් පමණක් . ඒ අස්ථාවේ දී යෑමට පෙර තමයි ම ඔය විස්තර ඔවුන්ගෙන් ලබාගත්තේ .

ප්‍ර: ඔබ ගියේ එක සැරයයි ඔබ කියන විදියට?

උ: එක සැරයයි.

ප්‍ර: ඔබ ඒ ගියේ ඒ රැස්වීමට සහභාගි වෙන්න 2019 පෙබරවාරි මාසේ 03 වැනිදා කියලා මා කිව්වොත් නිවැරදි ද?

උ: නිවැරදි .

ප්‍ර: ඒ අවස්ථාවේදී ඔබ එම රැස්වීමේ හිටි අය දැනුවත් කරනු ලැබුවද IS සංවිධානය සම්බන්ධයෙන්.

උ: එහෙමයි.

ප්‍ර: ඒ ඔබේ රජය බුද්ධි සේවාව විසින් ලබා දුන් තොරතුරු අනුව බව ඔබ ගරු කොමිෂන් සභාවට කිව්වා ?

උ: එහෙමයි .

ප්‍ර: එහෙම නම් දැන් දැනුවත් කරන්න ගරු කොමිෂන් සභාව කුමන කරුණද ඔබ IS සංවිධානය සම්බන්ධයෙන් මේ රැස්වීමේ දී ඉදිරිපත් කරේ කියලා?

උ: IS සංවිධානය ඉරාකය සහ සිරියාව තුළ දැඩි පසුබෑමකට ලක්වී තිබෙන බවත් ඒ නිසා ඔවුන්ට උපදෙස් ලැබිලා තියෙනවා තමන්ගේ මවු රටවල් වලට ආපසු ගොස් හැකිතාක් දුරට ගොස් අන්‍යාගමිකයන් ඝාතනය කිරීමට උත්සාහ කරන ලෙසටත් කියලා තමයි මම දැනුවත් කරේ ඒ ගොල්ලොන්ව. ඒ නිසා ඒ ගැන සැලකිල්ලෙන් සිටින ලෙසට.

ප්‍ර: එතකොට එම කරුණු ඉදිරිපත් කිරීමේ දී ඔබ එම නිලධාරින්ව තවදුරටත් දැනුවත් කරාද මෙම සංවිධානයේ මතවාද වලට නැඹුරු වූ පුද්ගලයෝ කී දෙනෙක් විතර ලංකාවේ ඉන්නව ද ඒ අයගෙන් යම් යම් පුද්ගලයින් රටේ යම් යම් ප්‍රදේශවල ව්‍යාප්තව ඉන්නව ද කියලා?

උ: එහෙමයි.

ප්‍ර: මොනවද කිව්වේ?

උ: පුද්ගලයින් 125 දෙනෙකු පමණ දැනට මේ මතවාදයට නැඹුරු වෙලා ඉන්නවා මේ රට තුළ. ඒ වගේම දෙහිවල වැල්ලම්පිටිය ප්‍රදේශවලට මොවුන් දෙදෙනෙක් පැමිණි බවට තොරතුරු තියෙනවා කියලා.

ප්‍ර: දැන් ඔබ කිව්වා ඔබ මන්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ ගැන හැරෙන්නට බස්නාහිර පළාත භාරවත් කටයුතු කරනවයි කියලා දිසා බුද්ධි කාර්යාංශ සම්බන්ධව ?

උ: එහෙමයි.

ප්‍ර: එතකොට ඔබ ඔය සඳහන් කරපු ස්ථාන දෙක වැල්ලම්පිටිය සහ දෙහිවල ඔබේ බස්නාහිර පළාතේ නේද පිහිටලා තියෙන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: එතකොට ඔබ තවදුරටත් මේ ඒ අවස්ථාවේ දී ඩ්‍රෝන කැමරා භාවිතා කිරීමක් සම්බන්ධයෙන් මේ රැස්වීමේදී කරුණු දැක්වීමක් කරාද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: එහෙමයි.

ප්‍ර: මොකද්ද කිව්වේ?

උ: පකිස්ථානය සහ ඉරාකයේ අන් රටවල සමාජ ජාල ඔස්සේ මෙම මතවාදය සම්බන්ධතා පවත්වන සාමාජිකයන් ශ්‍රී ලංකාවේ සිටින නිසා ඔවුන් විශේෂයෙන් ඩ්‍රෝන කැමරා භාවිතයෙන් මෙවැනි රසායනික අවි පහරවල් එල්ල කරන්න පුළුවන් වෙයි කියලා ඉවර වෙලා දැනුවත් කරා.

ප්‍ර: පුළුවන් ද එහෙම නැත්නම් ඔවුන්ට උපදෙස් ලාදීලා තියෙනවා බවක් ද ඔබ ඒ අවස්ථාවේ දී සඳහන් කෙරුවද ? පුළුවන්කම එකක්. ඒ පුළුවන්කම ක්‍රියාත්මක කරනවා නේද වැඩිපුර උපදෙසුත් දීලා තියෙනවා නේද?

උ: දීලා තියෙනවා. උපදෙස් හැටියට තමයි දුන්නේ. එහෙම කිරීමට හැකියාවක් ඇති කියලා.

ප්‍ර: පැහැදිලිව කියන්න ඒ වාක්‍යය?

උ: ඩ්‍රෝන කැමරා මඟින් ප්‍රහාරයක් එල්ල කිරීමට රසායනික අවි මඟින් ප්‍රහාරයක් එල්ල කිරීමට හැකියාවක් ඇති බවට ඔවුන්ට දැනුවත් කරා. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට උපදෙස් ලබාදුන්නා.

ස්වාමීනි සාක්ෂිකරු විසින් 2019 පෙබරවාරි මස 03 වැනි දින ජනාධිපති ආරක්ෂක දිසාව විසින් පවත්වන ලද රැස්වීමට සහභාගිවීමේ දී එයට අදාළව නිලධාරින්ගේ ගමන් සටහන් පොතේ යොදා ඇති සටහන X 589 ලෙසත් සාක්ෂිකරු විසින් එදින අද දින දෙන ලද සාක්ෂිය ප්‍රකාරව සඳහන් කරන ලද කරුණු අඩංගු ඡේද තුනම X 589A වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ස්වාමීනි සාක්ෂිකරුගේ අවධානයට C 04 B ලේඛනය යොමු කරනවා.

ප්‍ර: ඔබට 2019අප්‍රේල් මාසේ 21 වැනිදට පෙර මා ඔබේ අවධානයට යොමු කරපු C 04 B ඔය තොරතුර කියවන්නට ලැබිලා තියෙනව ද?

උ: නැත.

ප්‍ර: 2019 අප්‍රේල් 21 ට පෙර ඔබට C 04 B ලේඛනයේ තිබෙන තොරතුර පිළිබඳව දැනගන්නට ලැබිලා තියෙනව ද?

උ: නැහැ. දැනගැනීමට ලැබුණේ නැහැ.

ප්‍ර: බස්නාහිර පළාතේ දිසා බුද්ධි කාර්යාංශය භාරව සිටි ඔබ ඔය තොරතුර දැනගත්ත නම් 2019 අප්‍රේල් මාසේ 21 වැනිදට පෙර යම් පියවර ගැනීමට ඉඩ තිබුන ද?

උ: යම්කිසි ක්‍රියාමාර්ගයක් ගැනීමට ඉඩ තිබුණා.

ප්‍ර: එහෙම නම් ඒ මොන වගේ ක්‍රියාමාර්ගයක් ද කියලා ගරු කොමිෂන් සභාව දැනුවත් කරන්න පුළුවන්ද?

උ: පුළුවන්. ස්වාමීනි මෙම තොරතුර කලින් දැනගන්න ලැබුණ නම් මට දිසා බුද්ධි කාර්යාංශවල මගේ ස්ථානාධිපතිවරුන්ට දැනුවත් කිරීමට හැකියාව තිබුණා මේ සම්බන්ධයෙන් අදාල තොරතුරුකරුවන්ට දැනුවත් කරලා

FAIR COMMENT BY JEZEEM

බුද්ධි තොරතුරු එක්රැස් කරන ලෙසටත්. මෙම ස්ථාන සඳහනක් තියෙනවා. එම ස්ථාන අවට විශේෂ අවධානයෙන් සිටින ලෙසටත් තොරතුරුකරුවන් දැනුවත් කරලා තොරතුරු ලබාගන්නා ලෙසටත් . ඒ වගේම මාගේ සහකාර අධ්‍යක්ෂකවරුන්ටත් ඒ හා සමානව උපදෙස් දීලා ක්‍රියාවේ යොදවන්න තිබුණා.

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවාවේ යම් යම් අංශ ක්‍රියාත්මක වෙන කොට ඒ පිළිබඳව අනිත් අංශ දැනුවත් කරල ද ක්‍රියාත්මක වෙන්නේ ?

උ: බොහෝ විට ඒ විෂය පථය අනුව ඒ අංශ දැනුවත් කිරීමක් සිද්ධ වෙන්නේ අවශ්‍ය නම් පමණයි. නැත්නම් ඒ අනිත් විෂය සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සිද්ධ කරන්නේ නැහැ.

ප්‍ර: සාමන්‍යයෙන් රාජ්‍ය බුද්ධි සේවයේ ක්‍රියාත්මක කරන ලද ක්‍රමවේදය ද ඒ?

උ: සාමාන්‍යයෙන් ඒ වගේ ක්‍රමවේදයක් තමයි ක්‍රියාත්මක වන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ.

ප්‍ර: C 04 B ලේඛනයේ තියෙන තොරතුරු පිළිබඳව එහි ස්ථානයක් සඳහන් කරලා නැහැනේ නේද?

උ: එහෙමයි.

ප්‍ර: එතකොට ඒ නියමිත අංශය ක්‍රියාත්මක වීම හැරෙන්නට බස්නාහිර පළාතේ දිසා බුද්ධි කාර්යාංශය සම්බන්ධයෙන් අධීක්ෂණය කරනු ලබන ඔබවත් දැනුවත් කරානම් ඔබට කලින් සඳහන් කරන ලද ආකාරයට ඔබේ නිලධාරින් දැනුවත් කිරීමේ හැකියාව තිබුණ කියලද ඔබ කියන්නේ?

උ: එසේයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ වසර 16 කට ආසන්න කාලයක් රාජ්‍ය බුද්ධි සේවයේ නිරතව සිටියා කියලා කිව්වොත් නිවැරදිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම වසර 16 ක කාලය තුළ ඔබ රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙන තොරතුරු බුද්ධි තොරතුරක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාදාමයට සම්බන්ධ වෙලා තිබෙනව ද?

උ: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙන තොරතුරුවල විශ්වාසවන්තභාවය ඇගයීමක් සඳහා කරන ක්‍රමවේදයට යොමුවෙලා තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් රාජ්‍ය බුද්ධි සේවයට ලැබෙන තොරතුරක විශ්වාසවන්ත භාවය පිළිබඳ තීරණය කිරීම සඳහා යම් කිසි ක්‍රමවේදයක් නැත්නම් යම්කිසි ප්‍රශ්න කිහිපයක් ඇසීම රාජ්‍ය බුද්ධි සේවය විසින් ඒ ඔබගේ සේවා කාලය 16 වසර කාලය තුළ භාවිතා කෙරුවද?

FAIR COMMENT — BY JEZEEM —

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එය Who, when, where, why , how කරන ආකාරයට භාවිතා කරනවා කිව්වොත් නිවැරදිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම ක්‍රමවේදය Business intelligence වලට සීමාවුණ ක්‍රමවේදයක් ද නැත්නම් රාජ්‍ය බුද්ධි සේවයේ කාර්යයන් සඳහා භාවිතා කරපු ක්‍රමවේදයක් ද?

උ: රාජ්‍යය බුද්ධි සේවයේ භාවිතා කරන ක්‍රමවේදයක්.

ප්‍ර: ඔබ රාජ්‍ය බුද්ධි සේවයට පැමිණි දවසේ සිට ඔබට මතකයක හැටියට එම ක්‍රමවේදය භාවිතා කෙරුවද එම තොරතුරු විශ්වාසවන්තභාවය තීරණය කිරීම සඳහා ?

උ: එපමණකින් සෑහීමට පත්වෙන්නේ නැහැ ස්වාමීනි. මෙවැනි තොරතුරක් සම්බන්ධයෙන් පෙර සිදුවීම් හා සසඳලා තමයි තොරතුර සම්බන්ධයෙන් ක්‍රමවේදයකට එන්නේ. විශ්වාසභාවය සම්බන්ධයෙන් ගන්නේ.

ප්‍ර: පෙර තොරතුරු කියන්නේ?

උ: දැන් මෙම සිද්ධිය ගැන කතා කරාට කමක් නැද්ද මේ ගොල්ලොන්ගේ නමුත් සඳහන් කරලා මේකේ තියෙනවා. එතකොට මේ ගොල්ලන්ගේ පෙර සිදුවීම් තියෙන ඒවත් අලලා අරගෙන තමයි ඒAnalysis එකක් කරන්න වෙන්නේ. මේ වගේ තොරතුරක සත්‍යභාවය දැනගැනීම තවදුරටත් අපේ පැත්තෙන්.

ප්‍ර: ඒ කියන්නේ විදේශීය බුද්ධි ආයතනයකින් ඒ තොරතුර රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණයින් පස්සේ එහි විශ්වාසවන්ත භවාය පිළිබඳ තීරණය කිරීම සඳහා අර W 05 යි එක H එකයි කියන යොදනවා කිව්වොත් නැවරදිද?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: ඊට අමතරව රාජ්‍ය බුද්ධි සේවයේ ඒ වන විට එම පුද්ගලයින් සහ සංවිධානය සම්බන්ධයෙන් ලැබී තිබුණු පෙර තොරතුරුත් භාවිතා කිරීමක් කරනවා කිව්වොත් නිවැරදි ද?

උ: එසේය ස්වාමීනි. ඊට අමතරව අපි ළග තියෙන රෙකෝඩ් වාර්තා සසඳලා බලනවා මේ නමුත් එක්ක මේ ගොල්ලොන්ගේ පසුබිම් දැනගැනිම සඳහා.

ප්‍ර: දැන් ඔබ ශ්‍රී ලංකාවේ රාජ්‍ය බුද්ධි සේවයේ නියෝජිතයෙකු වශයෙන් විදේශීය රටකත් සේවය කෙරුවනේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ විදේශීය රටවල බුද්ධි තොරතුරුකරුවන් සමඟත් යම් කිසි සම්බන්ධතාවයක් පැවැත්තුවාණේ?

උ: එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: සාමාන්‍යයෙන් රාජ්‍ය බුද්ධි සේවයේ ක්‍රමවේදයේදී විදේශීය බුද්ධි ආයතනයක් විසින් යම් තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවයට සැපයුවොත් ඔබ කියපු අනෙක් මේ Test නැත්නම් පරීක්ෂණ ගැන නෙවෙයි මං කතා කරන්නේ. 5 W and 1 H එකයි කලින් ලැබුණු තොරතුරු ගැන නෙවෙයි මං කතා කරන්නේ. ඒ තොරතුරේ විදේශීය බුද්ධි ආයතනයකින් ලබාදුන් පමණින්ම ඒකට යම් කිසි අගයක් දෙනවද?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒකට දෙන අගය කොහොමද තීරණය කරන්නේ?

උ: ඒ අගය ඒ තොරතුරේ වලංගු භාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අපේ අර පසුබිම් පරීක්ෂණ ටික හැකි ඉක්මනින් කරන්නට ඕන. ඊට පෙර සිදුවීම් සම්බන්ධයෙන් අලලා Analysis report එකක් හදන්න ඕන. ඒක තමයි එතැනින් තමයි තොරතුර සත්‍යයක්ද අසත්‍යයක් ද කියලා හරියටම තේරුම්ගන්න පුළුවන්.

ප්‍ර: එතකොට ඒ විදේශීය බුද්ධි ආයතනය එම අවස්ථාවට පෙර අවස්ථාවලදී රාජ්‍ය බුද්ධි සේවයට යම් තොරතුරු සපයලා දීලා තියෙනවා එම තොරතුරුත් අවස්ථා කියකදී නිවැරදි වුණාද කියන එකත් එම ලබාදෙන තොරතුරේ විශ්වාසවන්තභාවය සම්බන්ධයෙන් බලපානව ද?

උ: එහෙමයි ස්වාමීනි. බලපානවා ස්වාමීනි.

ප්‍ර: ඒක කොයි අවස්ථාවේ දී ද පාවිච්චියට ගන්නේ. ඒ කියන්නේ ඔබ කියපු අනිත් පරීක්ෂණත් ඒකටත් එක කාරණාවක් විතර ද?

උ: එක කාරණාවක් විතරයි.

ප්‍ර: එතකොට ඒ සියළු කාරණා සලකලා බලලා තමයි ?

උ: සලකලා බලලා තමයි මේ විශ්වාසවන්තභාවය සම්බන්ධයෙන් තොරතුරු ගැන තීරණ ගැනීමට සිද්ධි වෙනවා.

ප්‍ර: දැන් ඔබ බස්නාහිර පළාත සහ ඌව පළාත භාරව හිටපු අධීක්ෂණ නිලධාරියා කිව්වොත් හරිද? 2019 අප්‍රේල් මාසය වන විට?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: බස්නාහිර පළාත තුළ රාජ්‍ය බුද්ධි සේවය ඔබේ අධීක්ෂණය යටතේ නිලධාරින් කී දෙනෙක් විතර හිටිය ද සාමාන්‍යයෙන්?

උ: දිසා බුද්ධි කාර්යාංශ නිලධාරින් 120 ක් පමණ සිටියා ස්වාමීනි.

ප්‍ර: එතකොට දැන් රාජ්‍ය බුද්ධි සේවයේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් කටයුතු කරපු වෙනම අංශයක් තිබ්බනේ ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම අංශයේ නිලධාරින් කී දෙනෙක් හිටිය ද?

උ: ඒක එම අංශයට මේ නිලධාරින් අතරට එන්නේ නැහැ ඒ නිලධාරින්.

ප්‍ර: ඔබව දැනුවත්ව එම අංශයට අයත් නිලධාරින් කී දෙනෙක් විතර හිටිය ද?

උ: 500 කට වැඩි ප්‍රමාණයක් හිටියා.

ප්‍ර: එම 500 කට වැඩි ප්‍රමාණය මුළු රට පුරා විසිරිලා හිටිය ද?

FAIR COMMENT — BY JEZEEM

උ: විසිරිලා හිටියා සම්පූර්ණයෙන්.

ප්‍ර: එතකොට එම නිලධාරින් බස්නාහිර පළාතෙත් සිටියද?

උ: බස්නාහිර පළාතේ එම අංශයට අනුයුක්තව සිටියා. නමුත් රාජකාරී සම්බන්ධයෙන් ඒ ගොල්ලො ඒ අදාළ ස්ථානවලට යනවා. ඒ හැරෙන්න මේ මගේ දිසා බුද්ධි කාර්යාංශවලට අනුයුක්තව සිටියේ නැහැ.

ප්‍ර: ඔබගේ දිසා බුද්ධි කාර්යාංශවලට අනුයුක්තව සිටියේ නැහැ?

උ: නැහැ.

ප්‍ර: ඒ නිලධාරින් කොළඹ ඉඳලා ස්ථානගත වෙනව ද නැත්නම් ඒ එක එක ප්‍රදේශවලම ස්ථානගත වෙලාද?

උ: ප්‍රදේශවලම ස්ථානගත වෙලා සිටින්නේ.

ප්‍ර: ඔබ LTTE සංවිධානයේ යුධ පැවති කාලයේත් රාජ්‍ය බුද්ධි සේවයේ සේවය කෙරුවනේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වකවානුව තුළ රටේ යම් යම් ස්ථානවල රටේ කොයියම්ම හෝ ස්ථානයක යම් කිසි අවස්ථාවක LTTE සංවිධානයෙන් ප්‍රහාරයක් එල්ල විය හැකි බවට විටින් විට තොරතුරු ලැබුණ කිව්වොත් හරිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අවස්ථාවලදී නිශ්චිත ස්ථානයක් සඳහන් වෙලා නැතුව රටේ යම් කිසි ස්ථානයකට ප්‍රහාරයක් එල්ලවීම හැකියාවක් තිබුණු බවත් තොරතුරු ලැබුණ කිව්වොක් නිවැරදිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එවැනි අවස්ථාවලදී ඒ තර්ජනයන්ට මුහුණදීම සඳහා රාජ්‍ය බුද්ධි සේවයේ සිටින රටපුරා සිටින නිලධාරින් සීරුවෙන් තබමින් ඒ සඳහා ඔවුන්ගේ අවධානය යොමු කරමින් ඔවුන්ගෙන් ප්‍රයෝජනය ලබාගැනීම සඳහා එවැනි අනතුරුදායක තත්ත්වයන් ඒ ඔබ වැනි පළාත් භාර නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් සඳහා ඒ සියළු පළාත්වල නිලධාරින්ට දැනුම්දීමක් සිදුකෙරුවද?

උ: එහෙමයි ඒ දිනවල ඒක කරා.

ප්‍ර: එතකොට ඒ දිනවල LTTE සංවිධාන සම්බන්ධයෙන් ක්‍රියාකරන වෙනම සංවිධානයකුත් තිබ්බා නේද?

උ: තිබුණා එහෙම වෙනම අංශයක් තිබුණා.

ප්‍ර: ඒ LTTE සංවිධානය සමඟ ක්‍රියාකරන වෙනම අංශයේ නිලධාරිනුත් රටපුරා සිටිය කිව්වොතින් නිවැරදිද?

උ: එහෙමයි.

ප්‍ර: දැන් එතකොට ඔබ මේ කොමිෂන් සභාවට විස්තර කරපු ඉස්ලාම් අන්තාවදය සමඟ තිබුණු අංශයේ සිටින නිලධාරින් රටපුරාම ඉන්නවා

FAIR COMMENT
BY JEZEEM

වගේම LTTE සංවිධානය සම්බන්ධයනේ කටයුතු කරපු නිලධාරිනුත් ඒ කාලේ රටපුරාම සිටියා?

උ: රට පුරාම සිටියා.

ප්‍ර: නමුත් LTTE සංවිධානයෙන් රටට යම් තර්ජනයක් ඇති විය හැකි බවට යම් තොරතුරක් ලැබුණු විට ඒ කාලයේ දී රාජ්‍ය බුද්ධි සේවය කරපු ක්‍රියාදාමය වුණේ ඒ LTTE සංවිධානය සම්බන්ධව ක්‍රියාකරන අංශය පමණක් නෙවේ. රටපුරා ඉන්න සියළුම රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරින් LTTE සම්බන්ධයෙන් ක්‍රියාකරන අංශය තුළින්ම මෙන්ම නියෝජ්‍ය අධ්‍යක්ෂකවරුන් හරහා දැනුවත් කිරීමක් කරා කිව්වොත් හරිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ විදියට මුළු රාජ්‍ය බුද්ධි සේවයේ සියළුම නිලධාරින්ව දැනුවත් කරලා ඔවුන්ව සීරුවෙන් තැබුවේ රාජ්‍ය බුද්ධි සේවයේ තිබෙන මේ සියළුම මානව සම්පත් උපරිමයෙන් රටේ ආරක්ෂාවට භාවිතා කිරීම සඳහා කිව්වොත් හරිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: 2019 අප්‍රේල් මාසේ 21 වැනි දිනට පෙර විදේශීය බුද්ධි ආයතනයකින් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකට ලැබුණු ප්‍රහාරයක් එල්ලවිය හැකි බවට තර්ජනයක් බව ඔබට අප්‍රේල් 21 වැනි දිනට පෙර දැනුම් දුන්නේ නැහැ කියලා ඔබ කිව්ව නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට පාස්කු දින ප්‍රහාරය සිදුවෙන තෙක් ඔබ එවැනි තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණු බව දැනුවත්ව සිටියේ නැහැ?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: ප්‍රහාරයෙන් පසුව ඔබ යටතේ සිටිපු දිසා බුද්ධි කාර්යාලවල ඔබගේ නිලධාරින්ගෙන් ඔබට යම් කිසි අවස්ථාවක් දැනගැනීමට ලැබුණ ද රාජ්‍ය බුද්ධි සේවයේ ඉස්ලාම් අන්තවාදී කොටියාශය තුළින් ඔබ යටතේ සිටපු නිලධාරින්ටත් දැනුම්දීමක් කරලා තිබ්බා මෙන්න මෙහෙමයි ප්‍රහාරයක් එල්ල වෙන්න පුළුවන් ඒ පිළිබඳ අවධානයෙන් ඉන්න කියලා දැනුම් දුන්නා කියලා ඔබට දැනගැනීමට ලැබුණ ද?

උ: නැහැ මට දැනුම් දීමක් කරලා තිබ්බේ නැහැ.

ප්‍ර: ඔබගේ යටතේ සිටපු නිලධාරින්ට දැනුම්දීමක් කරලා තිබුණ ද?

උ: කරලා තිබුණේ නැහැ ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: Mr. නානායක්කාර දැන් ඔබ ඉන්දියාවේ ශ්‍රී ලංකා තනාපති කාර්යාලයට අනුබද්ධිව එහි කාලයක් සේවය කරා නේද?

උ: එහෙමයි ස්වාමීනි.

Presidential Secretariat Copy
FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: කොපමණ කාලයක් ද චෙන්නායිවල හිටියේ?

උ: අවුරුද්දක් වැනි කාලයක්.

ප්‍ර: ඒ කාලය තුළ ඔබට මේ ඉන්දියන් රෝ ආයතනයට සම්බන්ධ නිලධාරින් සමඟ ගනුදෙනු කරන්න සාකච්ඡා කරන්න හමුවෙන්න ඉඩකඩ ලැබුණ ද?

උ: ලැබුණා ස්වාමීනි.

ප්‍ර: ඔබට හැඟී ගියාද ඔවුන් සමඟ කතා කරන කොට ඔවුන් ඒ අයට ලැබෙන තොරතුරු තව කෙනෙක්ට යොමු කරන්න හෝ එහෙම නැත්නම් හුවමාරු කරන්න පෙර ඒ තොරතුරු යම් ආකාරයක Develop කිරීමක් ඒක ඊට වැඩිය යම් වඩා හොඳ තත්ත්වයකට පත්කරගැනීමක් සිදු කරනවද නැද්ද කියලා?

උ: මට තේරුම් ගියා ස්වාමීනි. එහෙම කරනවා.

ප්‍ර: එතකොට ඔබට ඒ අය සමඟ ගනුදෙනු කරන අවස්ථාවල්වල ඔබට වැටහුණාද නැත්නම් හැඟී ගියාද සෑම විටම ඒ විදේශීය බුද්ධි සේවාවල ඉන්න නිලධාරින් තමන්ට ලැබෙන තොරතුරක් නිකන්ම තොරතුරක් හැටියට පිට කරන්නේ නැති බව?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අය ඒක Develop කරලා තමයි තව කොහේට හරි හුවමාරු කරන්න යන්නේ කියන එක ඔබට වැටහීමක් ආවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට මේ බුද්ධි සේවාවල්වල නිලධාරින්ට තොරතුරක් ලැබුණාම ඒ ලැබෙන තොරතුරේ විශ්වසනීයත්වය රඳා පවතින්නේ තොරතුර දෙන පුද්ගලයා මත කිව්වොත් ඒක හරිද?

උ: තොරතුර දෙන පුද්ගලයා මතම රඳා පවතිනවා කියලා කියන්නත් බැහැ ස්වාමීනි. නමුත් තමුන්ගේ හැකියාව තියෙන්න ඕන ඒක ඒ තොරතුර සම්බන්ධයෙන් තවදුරටත් හොයලා බලලා ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්න.

ප්‍ර: එතකොට අපි හිතමු බුද්ධි නිලධාරියෙකු වෙනත් අංශයක වෙන රටක හෝ වෙනත් බුද්ධි සේවයක බුද්ධි නිලධාරියකු තමන්ට ලබාදෙන්නා වූ තොරතුරක් දීපු පලියටම තමන් විශ්වාස කරන්නේ නැහැ කියන එකනේ ඔබ කියන්නේ?

උ: එහෙමයි ස්වාමීනි .

ප්‍ර: තමන් ඒක Develop කරන්න බලනවා තමන්ට ඒක Develop කරගන්න පුළුවන්කමක් තියෙනව නම් තමන් ඒක තවත් ආයතනයක් සමඟ හුවමාරු කරගැනීම වඩා යෝග්‍යයි කියලා තමා හිතනවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: හැමවිටම බුද්ධි අංශ ඒ ආකාරයෙක් ක්‍රියා කරනවද?

උ: බොහෝ අවස්ථාවල කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එහෙම නොකරන අයත් ඉන්නව ද?

උ: ඒ ගැන නම් මං කියන්න දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබ එහෙම අහලා තියෙනව ද?

උ: අහලා නැහැ.

ප්‍ර: එතකොට බුද්ධි තොරතුරක් හුවමාරු කරගැනීම තුළින් එම බුද්ධි තොරතුරේ වටිනාකම වැඩිවීමක් වෙනවා කිව්වොත් ඒක හරිද?

උ: අනිවාර්යයෙන් ස්වාමීනි එහෙම වෙනවා.

ප්‍ර: ලංකාවට බුද්ධි තොරතුරක් ලැබිලා තිබුණ නම් අප්‍රේල් 04 වැනිදා ඒ බුද්ධි තොරතුර නිවැරදිද එහෙම නැත්නම් ඒ බුද්ධි තොරතුරේ තිබෙන නිවැරදි භාවය පිළිබඳව තක්සේරු කරන්නේ ඔබගේ අත්දැකීම් අනුව පැය 24 ක කාලයක් ඇත්ද?

උ: පැය 24 ක කාලයක් නම් සාමාන්‍යයෙන් මදි ස්වාමීනි.

ප්‍ර: ඔබේ තක්සේරුව අනුව සාමාන්‍යයෙන් කොච්චර විතර කාලයක් ද?

උ: අපි ළඟ තියෙන දත්ත අනුව තමයි ඒක තීරණය කරන්න වෙන්නේ ස්වාමීනි අපි ළඟ ඒ සිද්ධියට අදාළ දත්ත කිසිවක් නොමැති නම් තමයි කාලය ගතවන්නේ. නමුත් මේක මෙම සිද්ධිය ගැන කතා කරනව නම් මේ සම්බන්ධයන් නම් අපි සතුව දත්ත තිබිලා තිබෙනවා. එතකොට ඒකට පැය 24 ක් නම් මදි කොහොමත්ම. නමුත් ඊට වැඩිය බොහෝම අඩුකාලයක් දවස් දෙක තුනකින් වගේ කරන්න හැකියාවක් තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ අපේ දත්ත ගබඩාවේ තොරතුරු තිබුණොත් දවස් දෙකක් හෝ තුනක් යන කොට එහි නිවැරදිතාවය පිළිබඳ තොරතුරු දැනගෙන එය Develop කරගැනීමේ හැකියාවක් තියෙනවා ?

උ: එහෙමයි.

ප්‍ර: දැන් යම් ආකාරයකින් මේ අප්‍රේල් 04 ඒ තොරතුර ලැබෙන කොට ලංකාවට විදේශ බුද්ධි සේවයකින් ලැබෙනවා කියලනේ දැනගන්න ලැබෙන්නේ. එහෙම ලැබෙන කොට ඊට පිටුපස්සෙන් ඒ කියන්නේ තොරතුරු ලැබෙන දිනට පිටුපස්සෙන් මාස තුනක හතරක කාලයක් තිස්සේ විවිධ අවස්ථාවන්වල සිදුවෙලා තියෙන සිදුවීම් එක්ක ගලපලා බලන කොට අප්‍රේල් 04 තොරතුර Develop කරගන්නවා කියන එක තමන්ට පහසුවෙන් කරගන්න පුළුවන් දෙයක් කියලා ඔබ හිතනවද?

උ: එහෙමයි ස්වාමීනි .

ප්‍ර: දැන් උදාහරණයක් ගත්තොත් වනාතවිල්ලු සිද්ධිය ඊළඟට බුදුපිළිම කැඩීමේ සිද්ධිය වනාතවිල්ලු සිද්ධිය, බයිසිකල් පිපිරීමේ සිද්ධිය මේ පිළිවෙළට ඇවිල්ලා තියෙන කොට එතකොට මේ හැම එකකම ගැළපීම බුද්ධි නිලධාරියෙකුට අවබෝධ කරගන්නට හැකියාවක් පවතිනවා කියන එක ඔබ දැන් පැහැදිලිවම කියනව නේ?

උ: එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඒ හැරෙන්න බුද්ධි නිලධාරියෙකු නොවන සාමාන්‍යය පොලිස් සේවයේ ඉනන් නිලධාරියෙකුටත් ඒ අවබෝධය තමන්ගේ අත්දැකීම තුළින් ලැබෙන්න පුළුවන් කියන එක ඔබ මොකද කියන්නේ?

උ: එම සිදුවීම් තුනම එකම කණ්ඩායමකට අයත්ව කරනවා කියලා අපි විසින් දැනුම්දීමක් කරලා තිබුණොත් ඒ පිටස්තර පුද්ගලයෙකුටත් ඒක තේරුම් ගැනීමේ හැකියාවක් තියෙනවා.

වේලාව: ප.ව.02.45
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වෙලාව : ප.ව.2.45
පෙර සටහන් ල/ලේ : සචිනි මෙනවිය
පසු සටහන් ල/ලේ : නිල්මිණි මෙනවිය

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරියට ලබා දෙයි.

****

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය.

සාක්ෂිකරු X -435 ලේඛනය බලන්න.

ප්‍ර: මේ පණිවිඩය WhatsApp මාර්ගයෙන් එවකට සිටිය රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක මහත්මයාට ලැබුණු පණිවිඩයක්. මෙම පණිවිඩය ඔබට ලැබුණේ නැහැ කියලානේ ඔබ කිව්වේ අප්‍රේල් 21 වෙනිදා ඔබ දැනන් හිටියේ නැහැ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබට මෙම පණිවිඩය නැතහොත් එයට අදාළ තොරතුරු ඔබට ලබා දීලා තිබුණා නම් ඔබ විසින් යම් කිසි ක්‍රියාමාර්ගයක් යම් කිසි දෙයක් ඔබ කරන්නේ මොනවද? මේ පණිවිඩය ඔබට ලැබුණානම් ඔබ කරන්නේ මොනවද?

පි: මේ සම්බන්ධයෙන් මා වෙත ලැබුණානම් මගේ දිසා බුද්ධි කාර්යාංශවලට මේකට අනුව කටයුතු කිරීම උපදෙස් දෙනවා. මේ සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීමටත්.

ප්‍ර: කොයි ආකාරයේද බුද්ධි තොරතුරු තව දුරටත් ඕක මේ පණිවිඩය වර්ධනය කරන්න මොනවද ඔබට කරන්න පුළුවන්?

පි: මේකේ කියලා තියන විදියට shortly කියලා තියෙන්නේ. දිනයක් වකවානුවක් හරියට සඳහනක් නැහැ. නමුත් අපේ තොරතුරුකරුවන් මාර්ගයෙන් අපිට හොයා ගන්න පුළුවන් ආසන්නතම දිනයක් කියලා මම හිතනවා. 4 Ws and 1 H complete වෙලා තිබ්බට අනික් ඒවා සම්පූර්ණ වුණත් දිනේ හරියට නැහැ.

ප්‍ර: ඔබ මොනවද ගන්නේ මම අහන්නේ practicalityGround level එකේ ඔබ මොනවද ගන්න පියවරයන් මේ සම්බන්ධයෙන්?

පි: මේ සම්බන්ධයෙන් අදාළ ස්ථානවලට අපගේ ආවේක්ෂණ රාජකාරි යෙදවීමට කටයුතු කරනවා. ඊට අමතරව මා පෙර කීවා සේම තොරතුරුකරුවන් දැනුවත් කරලා මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට කටයුතු කරනවා. අධ්‍යක්ෂකතුමාගේ අනුමැතිය ඇතිව පොලිස්

President Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ස්ථාන සහ අදාළ පූජකවරු විශේෂයෙන්ම churchesගැන කියලා තියෙන හින්දා අදාළ සිද්ධස්ථානවල කට්ටිය දැනුවත් කිරීමටත් කටයුතු කරනවා.

ප්‍ර: ඒ අදාළ සිද්ධස්ථානවල ඉන්න පියතුමන්ලා දැනුවත් කරන්න කවුද ඒ කටයුතු කරන්නේ කවුද?

පි: ඒක විශේෂයෙන්ම පොලිස් ස්ථාන මඟිනුත් කරන්න හැකියාව තියෙනවා. නමුත් අපේ දිසා බුද්ධි කාර්යාංශවලිනුත් කරන්න හැකියාවක් තිබෙනවා.

ප්‍ර: දැන් ඔය පණිවිඩයේ තියෙනවා popular Important churches බස්නාහිර පළාතනේ නේද ඔබ යටතේ එන්නේ ?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට popularchurches කියලා කිව්වා ඔබ ඒ මතකයට නැත්නම් ඔබට හැඟෙන්නේ කුමන පල්ලිද?

පි: නැහැ Important churches

ප්‍ර: Important churches ?

පි: විශේෂයෙන්ම කොච්චි කඩේ පල්ලිය ගැන සඳහන් කිරීමට කැමැතියි. එම මීගමුව කටුවාපිටිය දැන් ඔය සිද්ධිය සිදුවුණ ස්ථාන ප්‍රසිද්ධි පල්ලිවලට අවධානය යොමු කරන්න සිද්ධ වෙනවා.

ප්‍ර: මීගමුව කටුවාපිටිය දේවස්ථානය ප්‍රස්ධ වුණේ ඇත්තටම ප්‍රහාරයෙන් පසුව නේද. ඒකට කළින් First in consider the Important churches

පි: ඔව්. කළින් ඉඳන්ම අපි දැනුවත් වෙලා හිටියා මේක ප්‍රසිද්ධ පල්ලියක් කියලා.

ප්‍ර: මට ඒක තව දුරටත් පැහැදිලි කරන්න පුළුවන්ද ඒ දේවස්ථානය හඳුනාගෙන තිබුණේ Important charges එකක් හැටියට?

පි: ඒ area වලට ප්‍රදේශවලට අනුව තමයි අපි ඒවා categorize කරලා තිබ්බේ. ඒ අනුව ඒ ප්‍රදේශවල බලන දිසා බුද්ධි කාර්යාංශවල වෙනම ලැයිස්තු හදලා තිබ්බා. පන්සල් සහ පල්ලි ඒවාට ප්‍රමුඛස්ථානය දෙන ඒවා ඒ ලැයිස්තුවල තිබුණා.

ප්‍ර: දැන් ඒ කොමිෂම සාක්ෂි දුන් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහත්මයා කියලා තිබුණා. 4 වෙනිදා මේ ලැබුණු පණිවිඩය වැදගත් තොරතුරක් පමණයි. ඒක බුද්ධි තොරතුරක් හැටියට convert වෙලා ස්ථිර වුණේ අප්‍රේල් මාසේ 8 වෙනිදාට පසුව කියලා. එදිනට පසුවවත් ඔබට මේ දේ ගැන දැනුවත් කරාද?

පි: දැනුවත් වීමක් සිද්ධි වුණේ නැහැ මා වෙත.

ප්‍ර: මේ තොරතුර ලැබුණාට පසුව නිලන්ත ජයවර්ධන මහත්මයා ඔහුගේ assistant සහකාර අධ්‍යක්ෂකවරුන් කැඳවලා මේ පිළිබඳව මේ තොරතුර වර්ධනය කරන්නට කියලා රැස්වීමක් පැවැත්වුවා කියලා සාක්ෂි දීලා තිබෙනවා. ඔබට ඒ රැස්වීමට කැඳෙව්වාද ඒ ගැන ඔබට යම් කිසි දෙයක් කිව්වද?

FAIR COMMENT BY JEZEEM

පි: මම හිතන්නේ ඒ අදාළවලට ඒ විෂය පථයට අදාළ අධ්‍යක්ෂකවරුන් සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න ඇති. මා එක්ක සාකච්ඡා කරේ නැහැ.

ප්‍ර: හරි ඒ වුණාට ඔබ බස්නාහිර පළාතට භාරව හිටියේ ඔබනේ?

පි: එහෙමයි.

ප්‍ර: එතකොට Indian High Commission එක Important churches ඒවා අදාළ වෙනවා ඔබටත්?

පි: ඔව් ඇත්තෙන්ම අදාළ වෙනවා මට.

ප්‍ර: එතකොට ඒ ව්‍යුහයෙන් බැලුවොත් ඔබත් එතන සිටිය යුතු නිලධාරියෙක්?

පි: එහෙමයි.

ප්‍ර: ඒ දේ ඔබ පිළිගන්නවද?

පි: පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර: සාක්ෂිකරු ඉන්දියානු ආරක්ෂක ලේකම් සංචාරයක් සඳහා 2019 අප්‍රේල් 07 වන දින ලංකාවට පැමිණ තිබුණා. ඔබ ඒ ගැන දන්නවද?

පි: මට මතක විදියට මං රාජකාරි යොදවන්න ඇති නිලධාරින් මට මතකයක් නැහැ දැන් ආවාද කියලා.

ප්‍ර: ඒ වගේ Important VIP visit එකක් මතක නැද්ද?

පි: දැන් මතක නැහැ මේ වෙලාවේ හැටියට.

ප්‍ර: ඒ වගේ ආවානම් ඔහුට ඔහුගේ පැමිණීම පිළිබඳව ඔබට දැනුම් දෙනවද?

පි: අනිවාර්යයෙන් දැනුම් දෙනවා.

ප්‍ර: එතකොට ඔබ ගන්න ක්‍රියාමාර්ගය කුමක්ද ඒ සම්බන්ධයෙන්?

පි: ඒ සම්බන්ධයෙන් අදාල දිසා බුද්ධි කාර්යාංශය ඒ Indian High Commission area එකට අහුවෙන දිසා බුද්ධි කාර්යාංශයේස්ථානාධිපති සහ ඒ බලන සහකාර අධ්‍යක්ෂකවරුන්ගෙන් ගෙන්වලා ඒ සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් තියලා ඒකට අදාළ ආවේක්ෂණ රාජකාරි නිලධාරින් යොදවනවා. ඊට අමතරව අධ්‍යක්ෂකතුමා මාර්ගයෙන් පොලිස්පතිට දැනුම් දීලා පොලිසියේ ආරක්ෂාව යොදවන්න කටයුතු කරනවා.

ප්‍ර: සාමාන්‍යයෙන් ඒ වගේ VIP කෙනෙක් ප්‍රභූවරයෙක් එන විට Threat assessment එකක් කරනවා කියලා ඔබ දන්නවද?

පි: දන්නවා.

ප්‍ර: ඒ Threat assessment එක කරන්නේ කා විසින්ද?

පි: ඒක කරන්නේ වෙනම අංශයක් තියෙනවා ඒකට. Threat assessment prepare කරන අපෙන් date අරගෙන ඒගොල්ලෝ තමයි ඒක prepare කරන්නේ. අනිත් අංශත් සමඟ සම්බන්ධීකරණය වෙලා.

ප්‍ර: හැබැයි ඔබ ඒ පිළිබඳව දැනුමක් තියෙනවා?

පි: මට දැනුමක් තියෙනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ පිටරට ගිහිල්ලා සේවා කරපු නිසා?

පි: එහෙමයි.

ප්‍ර: මේ වගේ තෙරතුරුක් ආව නම් ප්‍රහාරයක් සම්බන්ධයෙන් තොරතුරක් අප්‍රේල් මාසේ 4 වෙනිදා ඒ තොරතුරු ලැබුණාට පස්සෙත් ප්‍රභූවරයෙක් ලංකාවට පැමිණීම සාමාන්‍ය සිරිතක්ද?

පි: අනිවාර්යෙන් නැහැ. ඒ සම්බන්ධයෙන් අපි දැනුවත් කිරීමක් කරානම් එවැනි සංචාරයක් සිදු වන්නේ නැහැ කියලයි මගේ හැඟීම.

ප්‍ර: කවුද කාට ද දැනුවත් කරන්නේ?

පි: අපි අධ්‍යක්ෂකතුමා විසින් නිතරම Indian High Commission එකත් එක්ක සම්බන්ධ විදේශ බුද්ධි අංශත් එක්ක සම්බන්ධ වෙන නිස එවැනි දැනුවත් කිරීම් සිද්ධ වෙන්න පුළුවන්.

ප්‍ර: ඔබ කියන්නේ Threat assessment එක කරන team එක දැනුවත් වෙලා තිබුණානම් මේ වගේ attack එකට ප්‍රහාරයක් සම්බන්ධයන් තොරතුරක් තිබෙනවා කියලා ඒ කරන කණ්ඩායම දැනුවත් කරනවා.ඒ එන ප්‍රභූවරයාගේ ආරක්ෂක නිලධාරින් එහෙමද?

පි: නැහැ නැහැ අධ්‍යක්ෂකතුමා විසින් තමයි ඒක දැනුවත් කිරීම කරන්නේ. අධ්‍යක්ෂතුමාගෙන් තමයි Threat assessment එක යන්නේ කොහොමත්.

ප්‍ර: එතකොට අධ්‍යක්ෂකතුමා තමයි ඒ නිලධාරින්ට දැනුවත් කරන්නේ?

පි: එහෙමයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරුගෙන් ඇසීමට අවශ්‍ය ප්‍රශ්නය උගත් නීතිඥවරිය ඉංග්‍රීසි භාෂාවෙන් කොමිෂමට විස්තර කරයි. ඇය විසින් සාක්ෂිකරුගෙන් ඇසීමට අවශ්‍ය වන්නේ චෙන්නායි නුවර තිබෙන ශ්‍රී ලංකා මහා කොමසාරිස් කාර්යාලයේ සේවයේ නියුතුව සිටින රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරිවරයෙකු හෝ වරුන් මාර්ගයෙන් මේ විදේශිය බුද්ධි අංශය විසින් ලංකාවට ලබා දුන්න තොරතුරු සම්බන්ධයෙන් වැඩිදුරටත් වර්ධනය කර ගැනීමක් සිදු කරනවාද යන්නයි?

පි: ස්වාමිනි එම තොරතුර ලංකාවට සම්පූර්ණයෙන් ලංකාවට බලපාන එකක් නිසා එය වර්ධනය කිරීම මෙහෙන් සිද්ධ වෙන්න ඕනි. කොහොමත්ම එවැනි තොරතුරක් එහේ චෙන්නායි නුවර සිටින ආරක්ෂක උපදේශක සමඟ ඒගොල්ලෝ share කරන්නේ නැහැ. ඒක තමයි ඒගොල්ලන්ගේ ..

****

FAIR COMMENT
BY JEZEEM

<u>අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය.</u>

ප්‍ර: 2019 අප්‍රේල් මාසේ 18 වෙනිදා ඔබ දන්නවා කාත්තන්කුඩිවල dry run explosion එකක් වුණා? ඔබ දැන ගෙන සිටියද ඒ පිළිබඳව ඒ කාලයේ?

පි: නැහැ පසුව ආරංචි වුණා.

ප්‍ර: ඒ සිදුවීමට පසුව STF, DMI එක TID එක අංශ 3ටම ඒ සම්බන්ධයෙන් දැනුවත් කරලා ඒ ගැන තව දුරටත් විපරම් කරන්නට එවකට සිටියා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂතුමා යෙදුණා. ඒ දිනවලදීවත් ඔබට මේ ගැන දැනුවත් කරාද? මේ පණිවිඩය හෝ ඒ ප්‍රහාරය ගැන?

පි: දැනුවත් කරේ නැහැ . නමුත් ඒ ප්‍රහාරය සම්බන්ධයෙන් සාමාන්‍යය වශයෙන් අපි දැන ගත්තා රාජ්‍ය බුද්ධි සේවායේ සේවය කරන නිසා. මං හිතන්නේ කලවංචිකුඩි මෝටර් සයිකල් එක explosion එක වෙන්න ඇති විස්තර කරන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඒ කියන්නේ ඔබ දැනුවත් වුණේ මෝටර් බයිසිකලය පිපිරීම සම්බන්ධයෙන්?

පි: එහෙමයි ස්වාමිනි.

****

<u>අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය.</u>

ප්‍ර: සාක්ෂිකරුට X – 459 පෙන්වයි. 2019 අප්‍රේල් මාසේ 20 වෙනිදා වැදගත් තොරතුරක් තමන්ගේ පිටරට සිටින ඒ තොරතුරුකරුගෙන් ලැබුණා කියලා පසු දින ඊළඟ දින 21 වෙනිදා ප්‍රහාරය සම්බන්ධයෙන්. ඔබට එදිනවත් 20 වෙනිදාවත් ඒ තොරතුර සම්බන්ධයෙන් ඔබට නිලන්ත ජයවර්ධන මහත්මයා දන්වලා සිටියද?

පි: නැහැ. කිසිම අවස්ථාවක දැනුම් දීමක් කරේ නැහැ ඒ සම්බන්ධයෙන්.

ප්‍ර: දැන් සාමාන්‍යයෙන් ඔබ කිව්වානේ මේ ගැන ඒsubject එක භාර directorලාට දැන්වුයේ කියලා?

පි: එහෙමයි.

ප්‍ර: ඔබේ දැනීම අනුව මේ වගේ දෙයක් මේ පණිවිඩය ගැන දන්වලා ඒක තව develop කරන්න ගන්න ඕන ක්‍රියාකාරකම් නැත්නම් ගන්න ඇවැසි කටයුතු මොනවද? Steps ought to be taken in order to develop this message. Develop this information that was received on the 4th of April

FAIR COMMENT — BY JEZEEM —

පි: ස්වාමිනි අර පෙර කිව්ව පරිදි මෙම තොරතුරට අදාළව පෙර වාර්තා සැසඳීමක් කරන්න ඕනි ඒ සම්බන්ධයෙන් යම්කිසි Analysis report යවලා තියෙනවා නම් ඒවායේ කරුණුත් අරගෙන ඒ අදාළ දිසා බුද්ධි කාර්යාංශයවල මෙම සඳහන් ප්‍රදේශවලට දිසා බුද්ධි කාර්යාංශවල බුද්ධි තොරතුරුත් එක්රැස් කරලා වාර්තාවක් සකස් කරලා අපේ තොරතුරුකාරයොන්ගෙන් ගන්න තොරතුරුත් සමඟ සංසන්දනය කරලා තමයි මේකේ සත්‍ය තව දුරටත් වර්ධනය කරන්න වෙන්නේ මේ තොරතුර.

ප්‍ර: ඔබ හිතනවද රාජ්‍ය බුද්ධි සේවයේ අධක්ෂක නිලන්ත ජයවර්ධන මහත්මයා මේ තොරතුර සම්බන්ධයෙන් ඒ කියන්නේ 4 වෙනිදා නැවතත් 8 වෙනිදා, නැවතත් 20 වෙනිදා ආපු මේ තොරතුරු බුද්ධි තොරතුරු හැටියට පරිවර්තනය තොරතුරු සම්බන්ධයෙන් ඔබට කියපු නැති එක ඔහුගේ රාජකාරි වගකීම පැහැර හැරියා කියලා?

පි: ඒක හරියටම කියන්න පුළුවන් ස්වාමිනි මේක දැනුවත් කරපු අදාළ කොට්ඨාශයේ මේ විෂය පථය ආදාළ කොට්ඨාශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා දැනුවත් කරලා තියෙනවානම් ඔහු විසිනුත් මේක අපිට දැනුවත් කිරීමට කටයුතු කරන්න තිබුණා. එතකොට මේක මම නිලන්ත ජයවර්ධන මහත්මයා පැහැර හැරියා කියලා කියන්නම බැහැ. නමුත්..

ප්‍ර: නමුත් ඔහුටත් තිබුණා නේද ඔබට මේ ගැන කියන්න?

පි: ඔව් ඔහුටත් තිබුණා මේ සම්බන්ධයෙන් කියන්න. නමුත් ඒ විෂය පථයට අදාළ නිලධාරියාටත් මේ ගැන කියන්න තිබුණා.

ප්‍ර: ඔබට එසේ කියලා තිබුණානම් ඔබ ඒ නිලධාරින් ඔබේ පල්ලිවලට ඔබ කළින් කියපු අදාළ පල්ලිවලට ඒ නිලධාරින් යවලා තිබුනානම් මේ ප්‍රහාරය වළක්වා ගන්න තිබුණා නේද?

පි: අනිවාර්යෙන් ඔව්. බොහෝ දුරට ක්‍රියාත්මක කරන්න තිබුණා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කිව්වා ඉන්දියාවේ ඉඳලා ප්‍රභූවරයෙක් ලංකාවට එන්න පෙර මේ Threat assessment එකක් ගන්නවා කියලා?

පි: ලංකාවේ ප්‍රභූවරයෙක් ඉන්දියාවට එද්දී අපි පිළියෙළ කරන්නේ.

ප්‍ර: ලංකාවේ කෙනෙක් ?

පි: ලංකාවේ සාමාන්‍යයෙන් prime minister හෝ president ඒ ඉන්දියාවේ සංචාරයක් යෙදෙනවා නම් අපි සම්බන්ධීරණය කරලා ඔහුට විරුද්ධව මොනවා හරි agitations, Protests ඒවා මෙවා තියෙනවද කියලා බලලා threat assessment එකක් prepare කරලා මෙහාට එවනවා මෙන්න මේ වගේ තොරතුරු තියෙනවා කියලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ threat assessment එක සකස් කරන්න ඔබ දැන් ඔබ කියන්නේ ඔබ චෙන්නායි නුවර ඉන්නවා කියන හැටියට සළකලා බලලා කියන්නේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ චෙන්නායි නුවර ඉන්නකොටඒthreat assessment එකක් හදන්න ඔබ එහේ ඉන්දියාවේ බුද්ධි සේවා සමඟත් සම්බන්ධවීමක් සිදු වෙනවද?

පි: සිද්ධ වෙනවා.

ප්‍ර: ඒ සඳහා ඔවුන්ගෙන් දත්තයන්ගෙන් දත්තයන් ලබා ගන්නවද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ ඔහුන්ගෙන් ලබාගන්නා දත්තයන් උපයෝගී කරගෙනද ඔබ ලංකාවට එවැනි threat assessment එකක් එවන්නේ?

පි: තොරතුරු හිටියා. ඊට අමතරව තොරතුරුකාරයෝ ඉන්නවා අපේ වෙනම රාජ්‍ය බුද්ධි සේවයෙන් අපි පවත්වාගෙන යන ඉන්දියාවේ. ඒ සියලු

ප්‍ර: සියලු ආයතන අරගෙන?

පි: සියලු ආයතන අරගෙන තමයි.

ප්‍ර: එතකොට දැන් ඒකේ අනික් පැත්ත මං අහන්නේ. ඉන්දියාවේ ප්‍රභූවරයෙක් ලංකාවට එන්න ඉස්සරවෙලා ඉන්දියාවේ බුද්ධි අංශ රාජ්‍ය බුද්ධි සේවයත් එක්ක සම්බන්ධ වීමක් සිදු වෙනවද ඔවුන්ට threat assessment report එකක් හදන්න?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: කාත් එක්කද සම්බන්ධ වෙන්නේ?

පි: ඍජුවම අධ්‍යක්ෂකතුමා එක්ක සම්බන්ධ වෙනවා. අධ්‍යක්ෂකතුමා තමයි යොමු කරන්නේ ආදළ අංශවලට.

ප්‍ර: එතකොට ඉන්දියාවේ ඒ අදාළ නිලධාරියා කොහේද කියන්න අපිට අවශ්‍ය නැහැ. රාජ්‍යය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක සම්බන්ධ කර ගන්නවා. රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක ඒක අදාළ නිලධාරියාට යොමු කරනවා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ ඇතුලේ ඉන්න නිලධාරියා?

පි: ඇතුලේ ඉන්න නිලධාරියා.

ප්‍ර: එතකොට ඒ ලැබෙන තොරතුරු රාජ්‍ය බුද්ධි සේවායේ අධ්‍යක්ෂක ඒ ඉන්දියානු බුද්ධි සේවයේ නිලධාරියාට ලබා දෙනවද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඉන් පස්සේද ඔබගේ දැනීමේ හැටියට ඔවුන් threat assessment report එකක් හදන්නේ?

පි: එහෙමයි ස්වාමිනි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියට ලබා දෙයි.

FAIR COMMENT
BY JEZEEM

****

<u>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මධු ජයතිලක මහත්මිය</u>

ප්‍ර: ලලිත් නානායක්කාර මහත්මයා ඔබතුමා දැන් මෙතන සාක්ෂි දීමේදී දැන ගන්න පුළුවනිද රාජ්‍ය බුද්ධි සේවයේ තොරතුරුකරුවන් පවත්වාගෙන යනවා නේද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔවුන් සමහර වෙලාවට ඔවුන්ට ගෙවීමුත් කරනවා රාජ්‍ය බුද්ධි සේවය?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මට කියන්න පුළුවන්ද ඔබතුමා රාජකාරි මෙන්න මේ පාස්කු ප්‍රහාර කාලවකවානුවේදී ඔබතුමා යටතේ National Thawuhith Jamath සංවිධානය පිළිබඳව හෝ සහරාන් පිළිබඳව ඔබ යටතේ ගෙවීම් කරන එක් හෝ තොරතුරුකාරයෙක් සිටියද ඔබ යටතේ?

පි: නැහැ සියලුම තොරතුරුකරුවන් අපි ඒ සම්බන්ධයෙන් පවත්වාගෙන ගියේ අදාළ විෂය පථයට අදාළ කොට්ඨාශයෙන් පමණයි.

ප්‍ර: ඔබ ඒ කියන්නේ ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක්වත් කරන්න තොරතුරුකාරයෙක්ට අවශ්‍යතාවයක් තිබුණේ නැහැ. ඔබගේ විෂය පරිපථයේ නෙවෙයි ඒක නේද?

පි: නැහැ සාමාන්‍යය වශයෙන් එන තොරතුරු සාමාන්‍ය තොරතුරු ඔය සංවිධාන සම්බන්ධයෙන් අපේ නිලධාරින් පවත්වාගෙන ගියා තොරතුරුකාරයෝ. ඒ තොරතුරුකරුවන්වත් අධික්ෂණය කළේ අංශයෙන් තමයි.

ප්‍ර: ඒ කියන්නේ permanent හිටියේ නැහැ කියන එකයි ඔබ කියන්නේ තවුහිද් ජමාත් සංවිධානය පිළිබඳව හෝ සහරාන් පිළිබඳව?

පි: නැහැ හිටියේ නැහැ.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: නානායක්කාර ඔබ ඉන්දියාවේ චෙන්නායි නුවර තියෙන ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සේවය කරන කාලයේදී ඔබ සම්බන්ධ වුණානේ ඉන්දීය බුද්ධි සේවාවන්වල නිලධාරින් සමඟ රාජකාරිමය කටයුතුවලදී ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එම අවස්ථාවේදී ඔවුන් ඔබට පැවසුවද ශ්‍රී ලංකාවේ මේ සහරාන් හෂීම් කියන පුද්ගලයා ද්‍රවිඩ භාෂාවෙන් ඔහුගේ ආගමික අන්තවාදී මතවාදයන් ප්‍රචාරණය කිරීම පිළිබඳව ඉන්දියාවට විශේෂ අවධානයක් යොමු වෙලා තියෙනවා විශේෂයෙන්ම තමිල්නාඩුවේ සහ කේළර ප්‍රාන්තයේ සිටින

FAIR COMMENT BY JEZEEM

ද්‍රවිඩ භාෂාව කතාකරන මුස්ලිම්වරුන් සීඝ්‍ර ලෙස මොහුගේ දේශනාවලට ඇහුම්කන් දීලා ඉස්ලාම් ආගමික අන්තවාදීන් බවට පත්වීමේ හැකියාවක් තිබීමෙන් එරටට සිදුවීය හැකි අවධානම ගැන?

පි: ඇත්තෙන්ම මෙය අනාවරණය වෙලා තියෙන්නේ NIA එකෙන් කොයින්බතූර්වල සිද්ධියක් අල්ලාගෙන තමයි මේක මම 2018 සැප්තැම්බර් මාසයේදී පමණ තමයි මෙම කොයින්බතූර්වල සිද්ධිය සිද්ධ වෙලා තියෙන්නේ ස්වාමිනි. එතකොටNIA එකෙන් ඒ අවස්ථාවේදී මම හිටියේ ඔක්තෝබර් 2 වෙනිදා වෙනකම් විතරයි. ඒ අවස්ථාවේදී දැනගෙන හිටියේ නැහැ ශ්‍රී ලාංකික සම්බන්ධතාවයක්. NIA එක සාමාන්‍යයෙන් අපිත් එක්ක තොරතුරු හුවමාරු කර ගැනීමක් කරන්නේ නැහැ. ඒක සාමාන්‍යයෙන් විශේෂිත වූ National Intelligence Agency ඒක සාමාන්‍යයෙන් ඒ රටට central government එක යටතේ තියෙන එකක් ඒගොල්ලෝ කවදාවත් තොරතුරු හුවමාරු කරගන්නේ නැහැ. නමුත් පස්සේ කාලයකදී මට ආරංචි වුණා මං ආවට පස්සේ ජනවාරි පමණ තමයි මෙම සහරාන් හෂීම්ගේ වීඩියෝස් ඒගොල්ලන්ට හම්බ වෙලා මේගොල්ලෝ ඒ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයට රෝ සංවිධානයට දුන්නේ කියලා. එතැනින් පස්සේ තමයි එතකන් අපිට කිසි දැනුවත් කිරීමක් කරලා තිබ්බේ නැහැ.

ප්‍ර: ජනවාරි 8 කියන්නේ මොන අවුරුද්දේද?

පි: ජනවාරි මස කියන්නේ 2019. නමුත් අර සිද්ධිය සිද්ධ වුණේ 2018 සැප්තැම්බර් මස වගේ තමයි මට.

ප්‍ර: මගේ අනික් ප්‍රශ්නය මෙම කොමිෂම හමුවේ ඉදිරිපත් වෙලා තියෙන කරුණක් මත තමයි මම ඔබගෙන් මේ ප්‍රශ්නය යොමු කරන්නේ. Intelligence Cycle එක පිළිබඳව කරුණු ඉදිරිපත් වුණා ඒ අනුව ඒ Cycle එකplanning and directioncollection of information ,Processing and analyzing information and dissemination of information එතකොට ඔබ දැන් C – 4(B) කියන ලේඛනය දැක්කානේ. ඔබ උපකල්පනය කරන්න මේ C – 4(B) කියන ලේඛනය ශ්‍රී ලංකාවේ බුද්ධි සේවාවක් විසින් තමන්ගේ විදේශ රටක counter part කෙනෙක්ට යවන එකක් කියලා. එහෙමනම් ඔබට කියන්නට පුළුවන්ද මේ යවන්නේ බුද්ධි තොරතුරක්ද කියලා? මේ යවන්නේ අර Cycle එකක් ගැන මතකයේ තබාගෙන ඔය C – 4(B) බලලා මේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය බුද්ධි සේවා ආයතනය විසින් තමන්ගේ විදේශිය counter part කෙනෙකුට යවන එකක් කියලා හිතුවොත් ඔය යවන්නේ බුද්ධි තොරතුරක්ද?

පි: සාමාන්‍යයෙන් මේක බුද්ධි තොරතුරක් හැටියට ගැනීමට හැකියාව තිබෙනවා.

FAIR COMMENT
BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් උගත් කොමසාරිස්වරිය අසපු ප්‍රශ්නයෙන් පැන නඟින කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇසීමට අවශ්‍යද යන්න ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසමි. අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි.

ප්‍ර: දැන් ඔබ කොමිෂන් සභාවේ අසපු ප්‍රශ්නයට කිව්වා threat assessment සෑදීම සඳහා ඉන්දියාවෙන් උදව් ඉල්ලුවොත් අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවයෙන් ඒ සම්බන්ධයෙන් ඔහුට තොරතුරක් ලබාදීමක් සිදු වෙනවා කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ ඉන්දියාවේ ප්‍රභූවරයෙක් ලංකාවට එනවානම්?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: එලෙස ලබාදුන්නු threat assessment reportඑකක්. නැත්නම් ඒකට පාදක වන කරුණු රාජ්‍ය බුද්ධි සේවයේ යම් අංශයක වාර්තා ගත වෙලා තියෙනවද?

පි: එහෙමයි.

ප්‍ර: මොන අංශයේද?

පි: ඒ threat assessment සම්බන්ධයෙන් කටයුතු කරන අංශයේ වාර්තාවක් තියෙනවා. ඊට අමතරව රාජ්‍ය බුද්ධි සේවාවේ තියෙනවා ලේඛනාගාරයක්. ඒ ලේඛනාගාරයේ තියෙනවා සියලුම දේවල්.

ප්‍ර: මං මේ දැන් අහන්නේ 2019 අප්‍රේල් මාසේ 07 වෙනිදා ලංකාවට ඉන්දියානු ආරක්ෂක ලේකම් එන්න ඉස්සරවෙලා ඉන්දියානු රාජ්‍ය බුද්ධි සේවය සමඟ සම්බන්ධවීමෙන් threat assessment එකක් සෑදීම සඳහා ලබා ගත්තු තොරතුරු කොතනද වාර්තා ගත වෙලා තියෙන්නේ කියන එකයි?

පි: එහෙමයි.

ප්‍ර: ඔබගේ පිළිතුර ඒකටද අදාළ වෙන්නේ?

පි: ඒකයි ලේඛනාගාරයේ තියෙන්න ඕනි.

****

මා විසින් අසන ලද ප්‍රශ්නයෙන් පසුව නැවතත් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියට අවශ්‍ය දැයි විමසමි. අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරයි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කාර්යන් සම්බන්ධයෙන් දැක්වූ සහයෝගයට කොමිෂන් සභාවේ ස්තුතිය සාක්ෂිකරුට පල කරනවා.
සාක්ෂිකරු මුදා හරිනවා.

කොමිෂන් සභාව නැවත ඔක්තෝබර් මස 02 වන බදාදා දින පෙරවරු 10.00ට රැස්වේ.

දැන් වෙලාව: ප.ව.3.00

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 20.2010.21 වේලාව :- පෙ.ව. 10.40

සටහන් කළේ එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා- සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, දිලන්ත එස් කළුදුරුවගේ මහතා, චතුරංග බණ්ඩාර මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පළමුවෙන් සාක්ෂි ගනු ලබන සාක්ෂිකරුගේ සාක්ෂිය අප්‍රසිද්ධියේ මාධ්‍යය නොමැතිව ලබා ගන්නා බව සටහන් කර තබමි.

01. සම්පූර්ණ නම : මාදම්පේ පරාක්‍රම ද සිල්වා
02. ජාතිය : සිංහල
03. ආගම : බෞද්ධ
04. තනතුර : ප්‍රධාන පොලිස් පරීක්ෂක
05. ආයතනය : රාජ්‍ය බුද්ධි සේවාව

(සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි)

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා

ප්‍ර : ඔබ ශ්‍රී ලංකා පොලිස් සේවයට 1988 වර්ෂයේදී ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් සම්බන්ධ වුණා කිව්වොත් නිවැරදිද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එසේ සම්බන්ධ වෙලා ඔබ 2003.01.01 වන දින පොලිස් පරීක්ෂක තනතුරට උසස් වුණා කිව්වොත් නිවැරදිද?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට ඔබගේ උසස්වීම ලැබුණේ 2014 මාර්තු 17 කියලා කිව්වොත් හරිද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ පළමුවෙන්ම දිවයින පුරා පිහිටි නොයෙක් පොලිස් ස්ථානවල සේවය කරලා 1998 වර්ෂයේදී රාජ්‍ය බුද්ධි සේවයට සම්බන්ධ වුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ රාජ්‍ය බුද්ධි සේවයට සම්බන්ධ වුණු වර්ෂය මොකක්ද නැවත කියන්න?

පි : 1998 ස්වාමීනි.

ප්‍ර : ඔබ රාජ්‍ය බුද්ධි සේවයට සම්බන්ධ වනවිටත් ඔබ ශ්‍රී ලංකා පොලිසියේ දැරූ තනතුර වූයේ උප පොලිස් පරීක්ෂක?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවයේ තියෙනවද ආවේක්ෂණ අංශය කියලා අංශයක්?

පි : තිබෙනවා ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ වර්තමානයේ මේ අද වනවිට සේවය කරන්නේ කුමන අංශයේද?

පි : ආවේක්ෂණ අංශයේ රාජකාරී අධීක්ෂණය කරනු ලබනවා ස්වාමීනි.

ප්‍ර : ඔබ ආවේක්ෂණ අංශයේ රාජකාරී කිරීම සඳහා සම්බන්ධ වුණේ කවද්ද?

පි : 2004 ඔක්තෝම්බර් මාසයේ තමයි මම මුලින්ම සම්බන්ධ වුණේ. ඊට පසුව වසරක් විතර සේවය කරලා ඉන්පසුව මාව රාජ්‍ය බුද්ධි සේවාවේ විශේෂ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා හැටියට පත් කරනු ලැබුවා. ඉන්පසුව මාව ආවේක්ෂණ අංශයට සම්බන්ධ කරනු ලැබුවේ 2012 වසරේ පෙබරවාරී මාසේ 17 වෙනිදා ඉඳලා.

ප්‍ර : 2012ද, 2011ද?

පි : 2012.

ප්‍ර : 2012 ඔබ ආවේක්ෂණ අංශයට සම්බන්ධ වුණාට පසුව දිගටම ඒ කියන්නේ අද වනතුරු එම අංශයේද සේවය කරන්නේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබ ආවේක්ෂණ අංශයේ අධීක්ෂණය කරන නිලධාරිවරයා ලෙස ඒ කාර්යය ආරම්භ කළේ කවද්ද?

පි : 2019 අප්‍රේල් මාසේ 12 වෙනිදා.

ප්‍ර : අධීක්ෂණ නිලධාරියා කියන්නේ ඒ කියන්නේ එකී අංශයේ ස්ථානාධිපතිවරයාද?

පි : නැහැ ස්වාමීනි. ඒ අංශයේම පරීක්ෂා කරන්න වෙනම ස්ථානාධිපතිවරයෙක් පත් කරලා තියෙනවා. එම අංශයේ කටයුතු අධීක්ෂණය කරන්න තමයි මාව පත් කළේ. නමුත් මම ඊට පෙර ඒ අංශයේ ස්ථානාධිපතිවරයා හැටියට කටයුතු කළා.

ප්‍ර : කවදද ඒ ඔබ ආවේක්ෂණ අංශයේ ස්ථානාධිපතිවරයා වශයෙන් පත් වුණේ?

පි : 2014 වර්ෂයේ.

ප්‍ර : 2014 ඔබ ආවේක්ෂණ අංශයේ ස්ථානාධිපති වශයෙන් පත් වුණා?

පි : පත් වුණා.

ප්‍ර : ඉන් අනතුරුව ඔබ පත් වූයේ ආවේක්ෂණ අංශයේ අධීක්ෂණ නිලධාරිවරයා වශයෙන් 2019.04.12?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ ආවේක්ෂණ අංශයේ අධීක්ෂණ නිලධාරීවරයා එකී අංශයේ ස්ථානාධිපතිවරයාට වඩා ඉහළින් ඉන්න නිලධාරියෙක්ද රාජ්‍ය බුද්ධි සේවයේදී?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : මෙවැනි අධීක්ෂණ නිලධාරීන් කී දෙනෙක් ආවේක්ෂණ අංශය සම්බන්ධයෙන් සිටිනවද?

පි : ආවේක්ෂණ අංශය අධීක්ෂණය කිරීමට සිටියේ මා පමණයි ස්වාමීනි.

ප්‍ර : ඔබ පමණයි?

පි : එහෙමයි.

ප්‍ර : ආවේක්ෂණ අංශයේ ස්ථානාධිපතිවරුන් කී දෙනෙක් ඉන්නවද?

පි : එක් නිලධාරියෙක් ස්වාමීනි උප පොලිස් පරීක්ෂකවරයෙක්. ඔහු වර්තමානයේදී පොලිස් පරීක්ෂක තනතුරට පත් වුණා.

ප්‍ර : අධීක්ෂණ නිලධාරියාගේ කාර්යය ස්ථානාධිපතිවරයාගේ කාර්යයෙන් වෙනස් වන්නේ කොහොමද?

පි : වෙනස් වෙන්නේ එයාට නිසි උපදෙස් ලබා දීම. ඒ වගේම ලැබෙන අධ්‍යක්ෂතුමාගෙන් ලැබෙන තොරතුරු ඒ අවශ්‍ය තැන්වලට අවශ්‍ය උපදෙස් ලබා දීම, අවශ්‍ය ආයතන ඒ කියන්නේ ඇතුළේ තියෙන ආයතන සම්බන්ධීකරණ ක්‍රියාවලිය ඒ වගේ දේවල්. ඒ වගේම ස්වාමීනි එතනදී මම සඳහන් කරන්න අවශ්‍යයි ඉදිරියේදී ඒ තනතුරුවලට නිලධාරීන් නායකත්වය වෙනුවෙන් පත් කිරීම සඳහා රාජ්‍ය බුද්ධි සේවාව ගන්නා ලද එක් ප්‍රතිඵලයක්, එක තීරණයක් තමයි ඒ වගේ ක්‍රියාදාමයක් සිදු කෙරෙන්නේ.

ප්‍ර : ඒ කියන්නේ නායකත්වයට නිලධාරීන් පුහුණු කිරීම?

පි : පුහුණු කිරීම.

ප්‍ර : දැන් මේ අධීක්ෂණ නිලධාරිවරයා ඊළඟට පත්වන තනතුර කුමක්ද?

පි : සහකාර පොලිස් අධිකාරී තනතුරට පත් වෙනවා. එතකොට රාජ්‍ය බුද්ධි සේවාවේ හැටියට තනතුරක් ලබා දෙනවා සහකාර අධ්‍යක්ෂ ධූරය.

ප්‍ර : දැන් ඔබට මේ ආවේක්ෂණ අංශය දැන් අඛණ්ඩව වසර අටක් පමණ දැනට සේවය කරලා තියෙනවා ඔබ. ඒ සඳහා ඔබට දේශීය වශයෙන් හෝ විදේශීය වශයෙන් හෝ එහෙම නැත්නම් දේශීයව සහ විදේශීයව වශයෙන් පුහුණුවීම් ලැබිලා තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි. මම දේශීය වශයෙන් සහ විදේශීයවත් පුහුණුවක් ලබා තියෙනවා.

ප්‍ර : ඒ කුමන කාර්යයන් සම්බන්ධයෙන්ද?

පි : විශේෂයෙන්ම ආවේක්ෂණ රාජකාරී සිදු කිරීම සහ සතුරු ආවේක්ෂකයන් හඳුනා ගැනීමේ පාඨමාලාව හදාරලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මේ ආවේක්ෂණය මොකද්ද මේ ආවේක්ෂණය කියලා කියන්නේ?

පි : ආවේක්ෂණය කියන එක විග්‍රහ කරනවානම් යම්කිසි පුද්ගලයෙක්, ස්ථානයක්, ද්‍රව්‍යයක් පිළිබඳව තොරතුරු වර්ධනය කර ගැනීම සඳහා සිදු කරනු ලබන ක්‍රමානුකූල රහසිගත නිරීක්ෂණය යනු ආවේක්ෂණයයි.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : එතකොට ආවේක්ෂණ වර්ග කියක් තියෙනවද?

පි : දෙකක් තියෙනවා. එකක් භෞතික වශයෙන් සිදු කරනු ලබන ආවේක්ෂණය. අනිත් එක තාක්ෂණික වශයෙන් සිදු කරනු ලබන ආවේක්ෂණය.

ප්‍ර : දැන් මෙම ආවේක්ෂණයක් පුද්ගලයෙකු, ස්ථානයක් හෝ ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් ආවේක්ෂණය කළයුතුයි කියලා කොහොමද තීරණය කරන්නේ? කවුරු විසින්ද ඒ තීරණය ගන්නේ?

පි : රාජ්‍ය බුද්ධි සේවාවේ ස්ථාවරය සාමාන්‍යයෙන් ආවේක්ෂණය සිදු කිරීමට උපදෙස් දෙන්නේ ආයතනයේ අධ්‍යක්ෂතුමා.

ප්‍ර : ඒ අනුවයි ඔබලා ආවේක්ෂණයන් සිදු කරන්නේ?

පි : ඔව්.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප්‍ර : දැන් මෙසේ ආවේක්ෂණය කිරීමට අධ්‍යක්ෂවරයා නියෝග කළහම එම නියෝගය ප්‍රථමයෙන්ම ලැබෙන්නේ කාටද?

පි : හුඟක් අවස්ථාවලදී ඒ කියන්නේ මට තමයි ලබා දෙන්නේ.

ප්‍ර : ඔබ කියන්නේ ස්ථානාධිපති ආවේක්ෂණද, අධීක්ෂණ නිලධාරී?

පි : නැහැ අධීක්ෂණ නිලධාරියාට. අධීක්ෂණ නිලධාරියා හැටියට පත්වීමට පෙර මමනේ ඒ අංශයේ ස්ථානාධිපතිවරයා හැටියට කටයුතු කළේ. එතකොට ස්වාමීනි මට තමයි ලබා දෙන්නේ.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඒ කියන්නේ ඔබ ස්ථානාධිපතිවරයා වශයෙන් ඉන්නකොට ආවේක්ෂණ අංශයේ ඔබට ඉහළින් අධීක්ෂණ නිලධාරියෙක් හිටියේ නැහැ?

පි : හිටියා ස්වාමීනි එක් නිලධාරියෙක් හිටියා. එතුමා හිටියේ අපේ අංශයේ පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා.

ප්‍ර : සඳහා පමණයි?

පි : පමණයි.

ප්‍ර : ආවේක්ෂණ රාජකාරී අධීක්ෂණයක් කෙරුවේ නැහැ?

FAIR COMMENT — BY JEZEEM —

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබ ස්ථානාධිපති, ආවේක්ෂණ අංශයේ ඉන්නකොට ආවේක්ෂණය කිරීම සඳහා තීරණයක් ගනු ලබනවානම් අධ්‍යක්ෂවරයා විසින් සෘජුව ඔබ ස්ථානාධිපතිවරයා වශයෙන් දැනුවත් කිරීමක්ද සිදු වුණේ?

පි : එහෙම තමයි ස්වාමීනි සිදු වුණේ. නමුත් විශේෂ අවස්ථාවන්හිදී සමහර අවස්ථාවන්හිදී එක එක අංශ භාර නියෝජ්‍ය අධ්‍යක්ෂතුමන්ලා මා වෙත දැනුවත් කිරීම් සිදු කරලා තියෙනවා. ඒ වෙලාවට අධ්‍යක්ෂතුමාගේ අනුමැතිය ඇතුව කියන එක මට ප්‍රකාශ කරලා තියෙනවා. ඉතිං එතනින් එහාට මම සාමාන්‍යයෙන් හොයන්න යන්නේ නැහැ.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : තව පැහැදිලි කිරීමට වස් මම අහන්නේ දැන් අධ්‍යක්ෂතුමාගෙන් එම ලැබෙන නියෝගය නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර අධ්‍යක්ෂ මාර්ගයෙන් නෙමෙයිද ඔබ වෙත ලැබෙන්නේ?

පි : බොහොමයක් අවස්ථාවලදී කෙළින්ම මට ලැබෙන්නේ. නමුත් සමහර අවස්ථාවලදී එසේ වක්‍රව ලැබෙන අවස්ථාවන් තියෙනවා.

ප්‍ර : දැන් එහෙම නියෝගයක් ලැබිලා ඒ සිදු කරනු ලබන ආවේක්ෂණයට අදාළව වාර්තා කිරීමක් සිදු කරනු ලබනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ සඳහා සැකසූ පෝරමයක් තියෙනවා කිව්වොත් හරිද?

පි : ඒ කියන්නේ ආවේක්ෂණයේ තියෙනවා ආවේක්ෂණ වාර්තාව සකස් කළයුතු Format එකක් තියෙනවා. ඒ Format එකට අනුව තමයි අපි වාර්තාව සකස් කරලා ඉදිරිපත් කරන්නේ.

ප්‍ර : ඒ වාර්තාව සකස් කරලා ඉදිරිපත් කරන්නේ කාටද?

පි : අධ්‍යක්ෂතුමාට.

ප්‍ර : අධ්‍යක්ෂතුමාට?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ අතරතුර ඔබත් අධ්‍යක්ෂතුමාත් අතර සිටින ඉහළ නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමක් සිදු වන්නේ නැහැ කියලද ඒ කියන්නේ?

පි : බොහෝ දුරට සිදු වන්නේ නැහැ.

(මේ අවස්ථාවේදී C-4(b) සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා)

ප්‍ර : මෙම ලේඛනය 2019 අප්‍රේල් මාසේදී ඔබගේ අවධානයට නැත්නම් ඔබගේ පරීක්ෂාවට ලක් වුණු ලේඛනයක්ද?

****

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

ප : එම පිළිතුරට එකතු කිරීමක් 2019 අප්‍රේල් 21 වෙනිදාට පෙර?

පි : නැහැ ස්වාමීනි. මම මේ ලේඛනය දැක්කේ නැහැ. නමුත් මගේ ප්‍රකාශ සටහන් අවස්ථාවේදී මට මේක ඉදිරිපත් කළා.

ප : ප්‍රකාශ සටහන් කරනවා කිව්වේ මේ කොමිසමේ පොලිස් ඒකකය?

පි : එහෙමයි ස්වාමීනි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප : දැන් 2019.04.21 වන දින ඔබ දන්නවා, අපි කවුරුත් දන්නවා මේ බෝම්බ පිපිරීම් කිහිපයක් මේ දිවයිනේ සිදු වුණා?

පි : එහෙමයි ස්වාමවීනි.

ප : එම කරුණට සම්බන්ධිත පුද්ගලයන් සම්බන්ධයෙන් 2019.04.20 වෙනිදා, 04.20 ට පෙර ඔබ කිසියම් හෝ ආවේක්ෂණ රාජකාරියක් හෝ රාජකාරීන් සිදු කරලා තියෙනවද?

පි : 04.20 ට පෙර කාලය ස්වාමීනි.

ප : ඕනෑම අවස්ථාවක. හැබැයි 2019.04.20 ට පෙර?

පි : ස්වාමීනි සමහර අවස්ථාවන්වලදී එක එක පුද්ගලයන් සම්බන්ධයෙන් රහසිගතව ආවේක්ෂණයන් සිදු කරලා වාර්තා කරන්න කියලා බාර දෙනවා. ඒ වගේ වාර්තා එහෙම ඉල්ලීම් සිදු කරපුවාම අපි ඒ ආවේක්ෂණ වාර්තාව සකස් කරලා ඉදිරිපත් කරලා තියෙනවා ස්වාමීනි. ඒවල අපි පිටපතක් තියා ගන්නේ නැහැ ස්වාමීනි.

ප : දැන් මට අතපසු වෙච්ච ප්‍රශ්නයක්. දැන් ආවේක්ෂණ අංශය මගින් ප්‍රධාන වශයෙන් ආවේක්ෂණ රාජකාරී සිදු කරන්නේ කොහේද?

පි : විශේෂයෙන්ම අපි කොළඹ ප්‍රදේශය මූලික කරගෙන තමයි සිදු කරන්නේ ස්වාමීනි.

ප : ඒ කියන්නේ කොළඹ ප්‍රදේශය කියලා ගතහොත් ඒක වැඩි දියුණු කළොත් බස්නාහිර පළාතද නැත්නම් කොළඹ දිස්ත්‍රික්කයද නැත්නම් කොළඹ මහ නගර සභා සීමාවද?

පි : අපේ කාර්යාලය පිහිටලා තියෙන්නේ කොළඹ ප්‍රදේශය ආවරණය වෙන්න. එතකොට බස්නාහිර පළාතත් වෙන්න පුළුවන්.

ප : කොළඹින් බැහැරව ආවේක්ෂණ රාජකාරීන් ඒ කියන්නේ ඔබ සිදු කරන්නේ නැහැ කියලද?

පි : ඔව්. විශේෂ අවස්ථාවලදී ඉල්ලීමක් කළහොත් අපි ඒ වගේ ඒ කියන්නේ විශේෂ ජනාධිපතිතුමා සහභාගී වෙන උත්සව, සංවත්සර ඒ වගේ ඒවාට අපි කණ්ඩායම් යොදවලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප : දැන් ඔබගේ අංශයේ මා කියන්නේ ආවේක්ෂණ අංශයේ ඒ සිටින නිලධාරීන්, සේවය කරන සියළුම නිලධාරීන් මේ ආවේක්ෂණය කිරීම, පුද්ගල, ස්ථාන සහ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ආවේක්ෂණය කිරීම සම්බන්ධව පුහුණුවක් සහ නිපුණත්වයක් ලබලා තියෙන අයද?

පි : මේ සිද්ධියට අදාළව ප්‍රකාශ කරනවානම් ස්වාමීනි එම කාලය වකවානුවේදී මාත් එක්ක සේවය කළේ නිලධාරීන් 24 දෙනෙක් පමණයි. ඒ 24 දෙනාට දේශීය වශයෙන් පුහුණුව ලබලා තියෙනවා. අපිත් පුහුණුව ලබා දීලා තියෙනවා.

ප : ඊට අමතරව වෙනත් පුහුණුවීමුත් ලබලා තියෙනවා?

පි : ඔව්.

ප : ඔබේ අංශයෙන් ඒ ආවේක්ෂණ රාජකාරී ප්‍රධාන වශයෙන් සිදු කරන්නේ කොළඹ කියලා ඔබ කිව්වනේ.

පි : ඔව්.

ප : ඒ කොළඹ ගතහොත් ඔබට සීමාවන් මොන මොන ප්‍රදේශයන් ඇතුළත් වෙනවාද කියලා ඔබට පැහැදිලි කිරීමේ හැකියාවක් තියෙනවද?

පි : තියෙනවා ස්වාමීනි. විශේෂයෙන් කොළඹ, ගල්කිස්ස, වැල්ලවත්ත, එතකොට හෝමාගම ඒ අපි ඒ අවශ්‍යතාවය අනුව තමයි ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

ප : කොළඹ කිව්වොත් පරිපාලනමය වශයෙන් කොළඹ දිස්ත්‍රික්කය කියලා කිව්වොත් නිවැරදිද?

පි : කියන්න පුළුවන් ස්වාමීනි.

ප : බස්නාහිර පළාතද ඇතුළත් වෙන්නේ නැත්නම් කොළඹ දිස්ත්‍රික්කයද?

පි : කොළඹ දිස්ත්‍රික්කය බොහෝවිට අපි ඉලක්ක කර ගන්නේ.

ප : ඒ කියන්නේ පරිපාලනමය වශයෙන් පාවිච්චි කරන කොළඹ දිස්ත්‍රික්කය යන අර්ථ කථනය ඇතුළේ?

පි : විශේෂයෙන්ම මේ කොළඹ දිස්ත්‍රික්කය කිව්වට මේ විශේෂ හේතුවක් අනුව මූලික වුණොත් විතරයි ස්වාමීනි අපි නිලධාරීන්ව යොමු කරන්නේ ඒ ප්‍රදේශවලට.

ප : ඒ ප්‍රදේශ කියන්නේ?

පි : කොළඹින් පිට.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : එතකොට ඔබ දැන් කොළඹ කියලා අදහස් කරන්නේ කොළඹ 1 ඉඳලා 15ටද?

පි : කොළඹ 1 ඉඳලා 15ට. හැබැයි අවශ්‍යතාවය සමහර වෙලාවට කටුනායකත් විදේශීයව එන පුද්ගලයන් සම්බන්ධයෙන්

ප : ප්‍රධාන වශයෙන් කොළඹ 1 සිට 15ට?

පි : ඔව්. ප්‍රධාන වශයෙන්.

ප : නමුත් ඊට පිටිනුත් අවශ්‍යතාවය අනුව යොදවනවා.

පි : ඔව්. කටුනායක තියෙන්නේ ස්වාමීනි කොළඹට පහළින්.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප : 2019.04.21 සිදු වූ පිපිරීම්වලට ප්‍රථමයෙන් මේ සහරාන් කියන තැනැත්තා ගැන ඔබ අංශය මගින් හෝ ඔබ විසින් හෝ ආවේක්ෂණ රාජකාරීන් සිදු කරලා තියෙනවද?

පි : සහරාන් පිළිබඳව මම හොඳාකාරවම දැනුවත්ව සිටිනවා ස්වාමීනි අපේ වැඩමුළුවලදී. වැඩමුළු කියන්නේ මාසිකව පවත්වන දේශනවලදී, පන්තිවලදී. ස්ථානාධිපතිවරුන් සඳහා වෙන් කරන ඒ සාකච්ඡාවලදී ඒ පිළිබඳව දැනුවත් කරලා තියෙනවා. නමුත් සහරාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් කිසිදු ආවේක්ෂණයක් සිදු කළේ නැහැ. මොකද සහරාන්ගේ ක්‍රියාකාරකම් ඒ විදියට හඳුනාගෙන තිබ්බේ විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ නිසා.

ප : එතකොට ඔබලා විසින් ජාතික තවුහිද් ජමාත් සංවිධානය සම්බන්ධයෙන් ඔබලා ඒ කියන්නේ ආවේක්ෂණ අංශය මගින් ජාතික තවුහිද් ජමාත් සංවිධානය ගැන ආවේක්ෂණයන් කරලා තියෙනවද?

පි : නැහැ ස්වාමීනි. ඒ පුද්ගලයන් සම්බන්ධයෙන් තමයි.

ප : එතකොට මොහොමඩ් ඊබ්‍රාහිම් ඉල්හාම් අහමඩ් කියන තැනැත්තා සම්බන්ධයෙන්?

පි : ඇත්තටම ඒ පුද්ගලයා ගැන මම ප්‍රහාරයෙන් පසුව තමයි දැන ගත්තේ.

ප : මොහොමඩ් ඊබ්‍රාහිම් ඉම්සාෆ් අහමඩ් කියන පුද්ගලයා සම්බන්ධයෙන්?

පි : එයත් එසේමයි ස්වාමීනි.

ප : අලවුඩීන් මොහොමඩ් මුවාත් කියන පුද්ගලයා සම්බන්ධයෙන්?

පි : නැහැ ස්වාමීනි.

ප : හස්තූන් සම්බන්ධයෙන්?

පි : මගේ අංශයෙන්නම් එහෙම දැනුවත්කමක් තිබ්බේ නැහැ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එවිට මොහොමඩ් අසාත් කියන පුද්ගලයා සම්බන්ධයෙන්?

පි : තව නම් තියෙනවද ස්වාමීනි.

ප්‍ර : මොහොමඩ් නසාර් මොහොමඩ් අසාත්?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : ජමීල් මොහොමඩ් අබ්දුල් ලතීෆ් එහෙම නැත්නම් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් සම්බන්ධයෙන් ආවේක්ෂණයන් සිදු කරලා තියෙනවද?

පි : ආවේක්ෂණයක් කියන්නේ අපෙන් ඉල්ලීමක් කරලා තිබ්බා.

ප්‍ර : කොයි කාලයේද?

පි : මම හිතන්නේ මේ අබ්දුල් ලතීෆ් කියන්නේ ඕස්ට්‍රේලියාවේ ඉගෙන ගෙන සිරියාවට ගියපු පුද්ගලයා.

ප්‍ර : ඔව්?

පි : එයා ගැන ආවේක්ෂණයක් සිදු කරන්න අපෙන් ඒ අංශය මගින් ඉල්ලීමක් කරලා තිබ්බා. අපි 2018 විතර වර්ෂයේ ඉඳන් ඊට පස්සේ අපි හොයලා බැලුවා. හොයලා බැලුවම පස්සේ අපිට නිරීක්ෂණය වුණේ නැහැ. අපි ඒ සම්බන්ධයෙන් වාර්තා කරලා තියෙනවා ඒ අංශයට අපිට නිරීක්ෂණය වුණේ නැහැ කියලා ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : නිරීක්ෂණය වුණේ නැහැ කියන එකෙන් අදහස් කරන්නේ මොකද්ද?

පි : ස්වාමීනි දැන් මෙවැනි කටයුතුවලදී රහසිගත ....,

ප්‍ර : නැහැ මම ප්‍රශ්නය ඉස්සරලම මෙහෙම අහන්නම්. ලතීෆ් මොහොමඩ් නැත්නම් ජමීල් මොහොමඩ් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් සම්බන්ධයෙන් කුමක් අරඹයා ආවේක්ෂණය කිරීමක්ද ඔබලාගේ අංශයට ලැබුණේ?

පි : ඒ ලැබුණේ ස්වාමීනි NTJ සංවිධානයේ සාමාජිකයෙක් හැටියට නෙමෙයි ස්වාමීනි IS මතවාදය දරන IS එකට රටින් බැහැරව හිටපු පුද්ගලයන් සමඟ සම්බන්ධතා තිබුණ පුද්ගලයන් පිළිබඳ ඉදිරිපත් කරන ලද එක නමක් තමයි ඔය අබ්දුල් ලතීෆ් කියන්නේ ජමීල් කියන්නේ.

ප්‍ර : එතකොට ඔබලාගේ ආවේක්ෂණ රාජකාරීවලදී 2018 ඉදලා ජමීල් සම්බන්ධයෙන් කරපු ආවේක්ෂණවලදී ඔහු IS සංවිධානයේ පුද්ගලයින් සමඟ සම්බන්ධවීමක් නිරීක්ෂණය වුණේ නැද්ද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමීනි මගේ අංශයෙන් එච්චර දුරට විමර්ශනය කිරීම් කරන්නේ නැහැ. මට පැවරෙන රාජකාරිය තියෙන්නේ එයාගේ ක්‍රියාකාරකම් පිළිබඳ රහසිගතව නිරීක්ෂණය කරලා වාර්තා කරන්න. මොකද ඒ පිළිබඳව පිහිටවන ලද ඒ අංශය මඟින් කිනම් ක්‍රියාමාර්ග ගන්නවද කියලා මම හරියටම දන්නේ නැහැ. ඒ නිසා අපි ඒවාට බාධාවන් කිරීම් කරන්න යන්නේ නැහැ. අපිට ලබා දෙන ස්ථානය පිළිබඳ බලලා, එහෙම මොකක් හරි නිරීක්ෂණය වුණොත් ඒ සම්බන්ධයෙන් වාර්තා කරනවා.

ප්‍ර : එතකොට ලතීෆ් සම්බන්ධයෙන් ඔබලාට ලැබුණ අණ වුණේ ඔහුගේ සාමාන්‍ය හැසිරීම, කවුද ආශ්‍රය කරන්නේ ආදී කරුණු ගැන බලන්නද නැත්නම් එක් ස්ථානයක් සම්බන්ධයෙන් බලන්නද?

පි : ඒ පුද්ගලයාගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය වුණොත් වාර්තා කරන්න.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : දැන් මෙම ජමීල්ගේ සහෝදරයෙකු සම්බන්ධයෙන් ඔබලාට අනාවරණය වුණාද? ඔහුට සහෝදරයෙකු සිටිනවද, ඔහු එම ස්ථානයට යනවද යන්න?

පි : සහෝදරයෙක් සිටින බවට අනාවරණය වුණා. තේ කොළ ව්‍යාපාරය සිදු කරන පුද්ගලයෙක්.

ප්‍ර : අබ්දුල් ලතීෆ් මොහොමඩ් හකීම් කියලා කිව්වොත් නිවැරදිද ඔහුගේ නම?

පි : එහෙම මතකයක් නැහැ ස්වාමීනි. නමුත් සහෝදරයෙක් ඉන්නවා කියලා දන්නවා.

ප්‍ර : ඔහු මොන ප්‍රදේශයේ වාසය කරනවද එවැනි කාරණා අනාවරණය වුණාද?

පි : මහවිල ප්‍රදේශයේ.

ප්‍ර : ඒ කියන්නේ මහවිල උද්‍යානය කිව්වොත්?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ මහවිල ඔහුගේ නිවස ඉදිරිපිට ඒ තියෙන නිවස සම්බන්ධයෙන් ඔබලා නිරීක්ෂණයක් සිදු වුණේ නැද්ද ඒ අවස්ථාවේ?

පි : නැහැ ස්වාමීනි එතන ඒ පිහිටීම අනුව අපේ නිලධාරීන්ව ස්ථානගත කිරීමේ අපහසුතාවයක් තියෙනවා.

ප්‍ර : ඇයි ඒ?

President's Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

පි : ඒක Housing Scheme එකක්. අපි වෙනත් උපක්‍රමයක් තමයි භාවිතා කළේ. එතකොට අපට දැන ගන්න ලැබුණා එතන්ට එන්නේ නැහැ කියලා. මොකද අපි ඒකේදී කිසිදු ඒවාට කිසිම බාධාවක් කරන්න යන්නේ නැහැ. මොකද අපි දන්නේ නැහැ මේ බුද්ධි මෙහෙයුම්වල තියෙන ඒ පාර්ශවකරුවන් ඇතුළාන්තය කුමක්ද කියන එක දන්නේ නැති නිසා අපි දැකපු දේ විතරයි ගිහිල්ලා කියන්නේ.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබලාගේ ජමීල්ගේ ආවේක්ෂණවලින් අනාවරණය වුණේ නැද්ද ඔහු සහ ඉන්ෂාෆ් අහමඩ් සහ ඉල්හාම් අහමඩ් සමග සම්බන්ධතාවයක් හමුවීම් තිබෙනවා කියලා?

පි : ස්වාමීනි අපි ඇත්තටම ලතීෆ්ව නිරීක්ෂණය වුණේ නැහැ. ඉතිං ඒක හින්දා එයාගේ ක්‍රියාකාරකම් කිසි දෙයක් දැන ගන්න ලැබුණේ නැහැ.

ප්‍ර : ඇයි ඔහු නිරීක්ෂණය වුණේ නැත්තේ?

පි : අපි ඒ නිරීක්ෂණය වුණේ නැහැ කියලා අපි අදාළ අංශවලට වාර්තා කළා ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ ඔබලාට ලතීෆ්ව ආවේක්ෂණය කිරීම කරන්න කියලා නියෝගය ලැබුණාම පස්සේ ඔබලාගේ නිලධාරීන්ට ඔහුව කවදාවත් දැක්කේ නැද්ද?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : ඔබගේ නිලධාරීන් ඔහුගේ නිවස හොයා ගත්තද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කොහේද ඔහුගේ නිවස තියෙන්නේ?

පි : මහවිල Garden එකේ එකක් තියෙනවා. වැල්ලම්පිටියේ ඉන්න අනිත් නිවසක් තියෙනවා.

ප්‍ර : ඒ නිවස ආවේක්ෂණ රාජකාරී කළාද?

පි : කළා. නමුත් අපි කරපු කාලය තුළදී අපිට නිරීක්ෂණය වුණේ නැහැ. ඒ සම්බන්ධයෙන් අපි වාර්තා කළා.

ප්‍ර : කොපමණ කාලයක් ඔබලා නිරීක්ෂණය කෙරුවාද ආවේක්ෂණය කෙරුවාද?

පි : මාස කිහිපයක් නිරීක්ෂණය කළා ස්වාමීනි.

ප්‍ර : එතකොට මාස කිහිපයක් කෙරුවාම ඔහුගේ පදිංචි නිවසට ආවේ නැද්ද?

FAIR COMMENT — BY JEZEEM —

පි : නැහැ අපි බලපු කාලය තුළදී පැමිණියේ නැහැ. අපි එහෙම වාර්තා කරන්නේ එතකොට ඒ අංශය විසින් වෙනත් මොකක් හරි ක්‍රියාදාමයක් සිදු කිරීමට අපිට උපදෙස් දෙනවා ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබගේ ආවේක්ෂණවලින් ඔබලාට තේරුණාද ජමිල්ගේ පවුලේ අය, ළමයි එහෙම ඉන්නේ වැල්ලම්පිටියේ කියලා?

පි : බිරිඳ ඉන්නවා කියලා දැන ගන්න ලැබුණා.

ප්‍ර : බිරිඳ වැල්ලම්පිටියේ ඉන්නවා කියලා දැන ගන්න ලැබුණා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට එලෙස බිරිඳ ඉන්න ගෙදරට යම්කිසි පුද්ගලයෙකු මාස ගාණක් එන්නේ නැහැ කියන එකෙන් යම් සැකයක් මතු වෙනවා නේද?

පි : අපි ඒ නිසා තමයි ස්වාමීනි ඒ අංශවලට දැනුවත් කිරීම් කළේ.

ප්‍ර : එතකොට ඔබ මොන අංශයටද දැනුවත් කිරීම් කෙරුවේ?

පි : ඒ අදාළ ඒ ...,

ප්‍ර : ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන්?

පි : ඔව්. මොකද අපිට තියෙන සීමාවන් තමයි එතනින් එහාට අපි ගියොත් සමහරවිට මේක අනාවරණය වෙන්න තියෙන අවස්ථා නිසා එච්චරයි අපි කරන්නේ.

ප්‍ර : හරි. එතකොට ඒ කියන්නේ 2018 වර්ෂය වනවිට ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් වූ අංශය දැනුවත් කිරීමක් කෙරුවා කියලා කිව්වොත් නිවැරදිද මේ ජමීල් මොහොමඩ්ගේ ගෙදර තියෙන්නේ වැල්ලම්පිටියේ, ඔහු මාස ගාණක් ගෙදරට ආවේ නැහැ කියන එක?

පි : අපිට ස්ථාන කිහිපයක් දුන්නා සැරිසරන. ඉතිං ඒ තැන්වලදී අපි නිරීක්ෂණය නොවුණු බව වාර්තා කළා ස්වාමීනි.

ප්‍ර : හරි. ඔහු සැරිසරන ස්ථාන වශයෙන් ලබා දුන්නේ කුමන ස්ථානද?

පි : මහවිල Garden එකයි, වැල්ලම්පිටියයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබලා නිරීක්ෂණය කෙරුවා මොවුන් මාස ගාණකට මොවුන් මේ ස්ථානවලට ආවේ නැහැ කියන එක?

පි : ඔව් අපි බලපු රාජකාරී යොදවපු කාලය තුළදී පැමිණියේ නැහැ කියලා වාර්තා කළා.

ප්‍ර : දැන් ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ බොහෝ කාලයක් සේවය කෙරුවනේ?

පි : ඔව්.

ප්‍ර : ඔය තොරතුරු යම්කිසි අංශයකට ලැබුණොත් පුද්ගලයෙක් ගැන එතනින් යම්කිසි සැකයක් මතු වෙනවද නැද්ද ඔහුගේ

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ක්‍රියාකලාපය සම්බන්ධයෙන්. මාස ගාණක් පවුල ඉන්න ගෙදරටවත් යන්නේ නැහැ කියන එක?

පි : ස්වාමීනි ඒක එම අංශයේ තීරණයක්.

ප්‍ර : නැහැ නැහැ හරි. ඒ අංශය ගැන නෙමෙයි මම අහන්නේ. ඔබ රාජ්‍ය බුද්ධි අංශයේ බොහෝ කාලයක් සේවය කරපු නිලධාරියෙක් වශයෙන් එවැනි තොරතුරක් ඔබට සාමාන්‍යයෙන් ලැබුරෙණාත් සැකයක් මතු වෙන්නේ නැද්ද?

පි : සැකයක් මතු වෙනවා ස්වාමීනි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : දැන් ඔබලාට අංශයට ලැබුණේ Specific Instructions ඒ කියන්නේ ජමීල් කියන පුද්ගලයා සම්බන්ධයෙන් කුමන ආකාරයේ ආවේක්ෂණයක් කිරීමටද?

පි : ජමීල් කියලා නෙමෙයි ස්වාමීනි. ඒක IS මතවාදය දරන පුද්ගලයන් කිහිප දෙනෙක්ගේම විස්තර ලබා දුන්නේ. ඒ පුද්ගලයන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව දෙන්න කියලා. ඒකේ හුඟක් හිටියේ මේ කොළඹ ප්‍රදේශයෙන් බැහැරව. ඉතිං අපි ඒ කොළඹ ප්‍රදේශයේ ඒ පුද්ගලයන් බලලා අපි කිව්වා, මොකද එතනින් එහාට ලැබෙන උපදෙස් අනුව තමයි අපි ක්‍රියාත්මක වෙන්නේ.

ප්‍ර : ඔය ඔබලාගේ ආවේක්ෂණයන් සිදු කිරීමේදී අනාවරණය වුණාද, එහෙම නැත්නම් සොයා ගන්නට පුළුවන් වුණාද වෙනත් බුද්ධි අංශයක් මගින් මේ ජමීල් සම්බන්ධයෙන් ආවේක්ෂණයක් හෝ සම්බන්ධතාවයක් තියෙනවද නැද්ද කියලා?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : මෙම ආවේක්ෂණයන්වලදී ඉමාඩ් කියන පුද්ගලයා ගැන ඔබලාට ආවේක්ෂණය කරන්න දැනුම් දීමක් ලැබුණාද?

පි : සම්පූර්ණ නම මොකක්ද ස්වාමීනි.

ප්‍ර : ඉමාඩ් ඉම්තියාස්?

පි : Address එක තියෙනවද ස්වාමීනි.

ප්‍ර : ෆකීර් මොහොමඩ් ඉමාඩ් ඉම්තිසාම්. ලිපිනයන් දෙකක් තියෙනවා. 45/1, කොලින්විඩ් පෙදෙස, වැල්ලවත්ත, කොළඹ 06 සහ අංක 14/1, තිස්ස මාවත, දෙහිවල?

පි : මතකයි ස්වාමීනි. පයිලට්, Aircraft Technician. මගේ මතකයෙන් කිව්වේ. නිරීක්ෂණය කළා ස්වාමීනි.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : ඔබලාගේ මේ ආවේක්ෂණයන්වලදී JMI ජමාතේ මිල්ලතු ඊබ්‍රාහිම් කියන සංවිධානය සම්බන්ධයෙන් අනාවරණය වුණාද?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : එම සංවිධානය සහ ජමීල් අතර සම්බන්ධතාවයක් තියෙනවාද නැද්ද යන කාරණය ...?

පි : නැහැ ස්වාමීනි. මම දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : උමෙයිර් මොහොමඩ් ඉක්බාල් කියන තැනැත්තා?

පි : ස්වාමීනි ලිපිනය කොහේද තියෙන්නේ.

ප්‍ර : මාතලේ?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : 2018 ජනවාරී මාසයේදී හෝ ඒ ආසන්න කාලයකදී ජමීල් මොහොමඩ් නැමැත්තා සවායි කියන පුද්ගලයාගේ විවාහ මංගල්‍යයට සහභාගීවීමක් ගැන අනාවරණය වුණාද?

පි : එහෙම නැහැ ස්වාමීනි. මම ඒ සම්බන්ධයෙන් කිසිම දැනුවත්භාවයක් නැහැ ස්වාමීනි.

ප්‍ර : මා ඔබගෙන් අර 2019.04.21 ස්වයංඝාතක බෝම්බකරුවන් සම්බන්ධයෙන් නම් කිහිපයක් දීලා ඔබගෙන් අසා සිටියා?

පි : එහෙමයි ස්වාමීනි

ප්‍ර : ඊට අමතරව මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් මෙන්න මේ කියන පුද්ගලයා සම්බන්ධයෙන් හෝ ඔහු විසින් පාවිච්චි කරන්නට යෙදුණු ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් හෝ යම් ආවේක්ෂණයක් සිදු කිරීමක් ඔබ කළාද?

පි : ස්වාමීනි මෙම ප්‍රහාරය සිදු වෙච්ච අවස්ථාවේදී මම කොච්චිකඩේ ප්‍රදේශයේ සිටින විටදී මට අධ්‍යක්ෂතුමාට මම දුරකථන ඇමතුමක් ලබා ගත්තහම සවස් කාලයේදී මට කිව්වා කිංස්බරි එකෙයි, ෂැන්ග්‍රිලා එකෙයි ආපු කාර් එකක් පිළිබඳ හඳුනා ගැනීමක් තියෙනවා. ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරලා උපරිමව හොයා ගන්න උත්සාහ කරන්න කියලා. ඊට පස්සේ මම ඒ තියෙන තොරතුරුත් එක්ක මම ඒ අදාළ ඒ අංශවලට කථා කරලා ඒ සම්බන්ධව විස්තරාත්මක විස්තර ඉල්ලුවා ස්වාමීනි. ඒ ඉල්ලුවම පස්සේ මට දැන ගන්න ලැබුණා කෙසෙල්වත්ත ප්‍රදේශයේ ඒ ෂරීඩ් කියන මාවතේ නිවසක් කුලියට අරගෙන තියෙනවා කියලා ඒ පුද්ගලයා හොයා ගන්න ලැබුණා කියලා. පස්සේ මම කෙසෙල්වත්ත ප්‍රදේශයට එදිනම 21 වෙනිදා එදිනම යන්න උත්සාහ කරනකොට මට දැන ගන්න ලැබුණා වැල්ලවත්ත පොලිස් නිලධාරීන් විසින් ඒ පුද්ගලයාව දැන් පොලිස් ස්ථානයට රැගෙන එනවා කියලා. ඊට පස්සේ මම එතන හිටපු ඒ නිලධාරීන්ට

Prosecutor's Copy
FAIR COMMENT BY JEZEEM

කථා කරලා මම කිව්වා සාමාන්‍යයෙන් නිවසක් කුලියට ගත්තහම ඒ වැලිගම ප්‍රදේශයේ පුද්ගලයෙක් සතාර් කියලා, ඒ පුද්ගලයත් එතන ඒ පුද්ගලයාගේ ගිවිසුමක් මොකක් හරි තියෙනවද කියලා. එතකොට ස්වාමීනි කිව්වා ඔව් ගිවිසුමක් තියෙනවා. එතකොට මේ ගිවිසුම අත්සන් කරලා තියෙන්නේ මේ මොහොමඩ් මුබාරක් කියන පුද්ගලයා කියලා. එතකොට මම ඇහුවා ඒක අත්සන් කරන්න කලින් දුරකථන මොකක් හරි දීලා තියෙනවද සම්බන්ධතාවයක්. එතකොට මට ඩයලොග් දුරකථනයක අංකයක් ලබා දුන්නා. මට මතක 7730 ඒ Number එක. පස්සේ මම ඒවත් කිව්වට කමක් නැහැනේ.

ප : ඔබ එම තොරතුරු මත වාහන අංකයක්, වාහනයක අංකයක් සොයා ගන්නට යෙදුණාද?

පි : යෙදුණා ස්වාමීනි. ඒකත් ඒ පුද්ගලයාගේ විශ්ලේෂණය කරලා බැලුවහම තනිකරම කාර් සේල්වලට තමයි සම්බන්ධතා දක්වලා තිබ්බේ.

ප : ඒ මුබාරක්?

පි : මුබාරක්. ඊට පස්සේ බැලුවා මොන ප්‍රදේශයේ කාර් සේල්ද කියලා. ඊට පස්සේ හොයා ගත්තා. ඊට පස්සේ ඒ කාර් සේල් එකේ පෙබරවාරී මාසයේ දිනය මතක නැහැ.

ප : 2019 පෙබරවාරී මාසේ තමයි වාහනයක් මිලදී ගෙන තිබ්බේ?

පි : මිලදී ගෙන තිබ්බේ. පස්සේ සේල් කිහිපයකටම කථා කරපුවාම කිව්වා අරගෙන ගියපු එක්කෙනා Photo එක දැක්කොත් හඳුනා ගන්න පුළුවන්. එතකොට අපි ළඟ Photo එකක් තිබ්බේ නැහැ. නමුත් මම ඒ ලක්ෂ විසි හතරකට ඒ විකුණපු වාහනයේ Engine Number දෙන්නම් කිව්වා. පස්සේ මම ඒ Engine Number අරගෙන මගේ නිලධාරීන් යොදවලා RMV එකෙන් ගත්තා වාහනයේ නොම්බරය. ඒ නොම්බරය අරගෙන 2019 අප්‍රේල් 22 වෙනිදා උදේ මට මතක හැටියට 10.30 ට නැත්නම් 11.00 ට විතර වගේ අධ්‍යක්ෂතුමාට කථා කරලා කිව්වා PJ-4080 දරන වෑන් රථය මරාගෙන මැරෙන මෙතනදී කියපු පුද්ගලයාගේ, මුබාරක්ගේ නමට අරන් තියෙන්නේ. මේකෙන් අනිවාර්යයෙන්ම මොකක් හරි පිපිරීමක් සිදු කරන්න ඉඩ තියෙනවා. ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න කියලා ඉල්ලීමක් කළා.

ප : එම වාහනයද ශාන්ත අන්තෝනි දේවස්ථානය අසළදී 2019.04.22 වෙනි දින සවස් කාලයේදී පිපිරීමට ලක් වුණේ?

FAIR COMMENT — BY JEZEEM

පි : ඒ කියන්නේ විශේෂ කාර්ය බලකාය විසින්, මට දැන ගන්න ලැබුණේ විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් ගිහිල්ලා ආරක්ෂිතව පිපිරුවයි කියලා.

ප්‍ර : ඔබට මේ සම්බන්ධව සිදු කිරීමට නියෝගය ලැබුණේ අධ්‍යක්ෂවරයාගෙන්?

පි : අධ්‍යක්ෂතුමා කිව්වේ අර සිද්ධියේ වාහනය හොයා ගන්න කියලා. ඒ කියන්නේ ෂැන්ග්‍රිලා එකට ආපු වාහනය.

ප්‍ර : එසේ සොයා ගැනීමේදී තමයි PJ-4080 සම්බන්ධව?

පි : ඔව්. නමුත් අර වාහනය නෙමෙයි.

ප්‍ර : මෙයට අමතරව 2019.04.20 වෙනිදා ඔය බෝම්බ පිපිරිච්ච දවසට පෙර දින ඔබ වෙත ඔබගේ කිසියම් උසස් නිලධාරීවරයෙකු හෝ නිලධාරීන් ආවේක්ෂණයන් හෝ යම් නිරීක්ෂණයන් සිදු කිරීමට නියෝග ලබා දුන්නාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කවද්ද දිනය?

පි : 2019 අප්‍රේල් මාසේ 20 වෙනිදා සවස් කාලයේ මම හිතන්නේ 4 ත් 5 ත් අතර කාලය තුළදී නියෝජ්‍ය අධ්‍යක්ෂ එවකට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සම්පත් කුමාර මැතිතුමා මට දුරකථනයෙන් වාචිකව දුන්නා හෙට දිනයේ ප්‍රහාරයක් එල්ල වෙන්න තියෙනවා කියලා මේ ඉන්දියන් Embassy එකට හරි වැදගත් දේවස්ථානයකට.

ප්‍ර : කොයි ප්‍රදේශයක් දන්වා හිටියද?

පි : එහෙම නිශ්චිත ප්‍රදේශයක් දන්වා හිටියේ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඔබට ඒ තොරතුර ඔබගේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා.

පි : නැහැ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා.

ප්‍ර : සමාවෙන්න. නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් දැනුම් දුන්නහම 2019.04.20 කියන සෙනසුරාදා දවසේ සවස් කාලයේදී ඔබ යම් පියවරක් ගත්තාද? ගත්තානම් මොකද්ද ගත් පියවර?

පි : ඒ වෙලාවේ විස්තර කියලා මට කිව්වා හෙට දිනයේ තමයි මේක සැළසුම් කරලා තියෙන්නේ. මම කිව්වා ඒ වෙලාවේ සර් මගේ ඉන්න නිලධාරීන් කණ්ඩායම යොදවන්නම් කියලා.

ප්‍ර : කුමක් සඳහාද යොදවන්නේ?

පි : ඒ කියන්නේ දැන් අපිට නිශ්චිත ස්ථානයක් නැහැ ස්වාමීනි. නිශ්චිත ස්ථානයක් හැටියට තියෙන්නේ ඉන්දියන් මහ කොමසාරිස් කාර්යාලය විතරයි. එතකොට ඊට පස්සේ දැන් අපිටත් ස්ථානයක් තෝරා ගන්න තීරණය කරන්න බැහැ. ඉතිං

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

නමුත් මම කල්පනා කළා තියෙන තොරතුරු රැස් කරන්න අපේ හිටපු නිලධාරීන් කණ්ඩායමම ඒ වෙලාවේ රාජකාරී බෙදලා දුන්නා ඒ ඒ ප්‍රදේශවල ගිහිල්ලා විස්තර මොනවා හරි තොරතුරු තියෙනවානම් මාව දැනුවත් කරන්න කියලා.

ප්‍ර : මොන ප්‍රදේශද කියලා ඔබට මතකයක් තියෙනවද?

පි : මොකද ස්වාමීනි ඒ අවස්ථාව මට මතකයි ඒක සෙනසුරාදා දිනයක් විශේෂයෙන්ම අවුරුදු සමය කාලයේ. ඒ හිටපු නිලධාරීන් 24 දෙනාගෙන් කිහිප දෙනෙක්ම නිවාඩු ගිහිල්ලා තිබ්බා. එතකොට අපේ බැරක්කයේ අපි ඉන්න ඒ රාජකාරී කාර්යාලයේ ඉන්නේ නිලධාරීන් හය දෙනෙක් විතරයි අවිවාහක නිලධාරීන්. ඒ අවිවාහක නිලධාරීන් හය දෙනාගෙනුත් දෙන්නෙක් නිවාඩු ගිහිල්ලා. එතකොට හිටියේ සුළු පිරිසක්.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : එලෙස ඔබගේ අංශයේ සිටින නිලධාරීන් නිවාඩු යාම සඳහා අනුමත කරනු ලබන්නේ කවුරු විසින්ද?

පි : මම විසින් අනුමත කරන්නේ.

ප්‍ර : ඔබගේ අනුමත කිරීම ප්‍රමාණවත්ද?

පි : ප්‍රමාණවත් ස්වාමීනි. ප්‍රමාණවත් පුද්ගලික නිවාඩු ගන්නවානම් නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය නිවේදිත නිලධාරියෙකුගෙන් අවසරය ලබාගත යුතුයි මොකද මා රාජ්‍ය නිවේදිත නිලධාරියෙක් නොවන නිසා. දින විවේක වැනි නිවාඩු මට ලබා දෙන්න පුළුවන්. ඉතිං ඒ හිටපු කණ්ඩායම් ටික යෙදෙව්වා.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : ඔබට ප්‍රදේශයක් මතක තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි. මම වෙන්කරලා දුන්නා කට්ටියක්ට කොල්ලුපිටිය, බම්බලපිටිය, වැල්ලවත්ත, රාජගිරිය පැත්ත බලන්න කියලා. අනිත් කට්ටියට මෝදර, කොච්චිකඩේ, කොටහේන, මට්ටක්කුලිය වැනි ප්‍රදේශ.

ප්‍ර : හරි. දැන් මෙම නිලධාරීන් ඒ කාර්යයට යොමු කරනවිට දළ වශයෙන් වේලාව කීයට විතර වගේ ඇද්ද?

පි : ස්වාමීනි ඒ වෙලාවෙත් හිටපු නිලධාරීන් ප්‍රමාණය මම කිව්වේ සුළු පිරිසක් හිටියේ. මොකද සෙනසුරාදා කියන්නේ සාමාන්‍යයෙන් 12.30ට නිවෙස් වල ඉඳලා එන නිලධාරීන් පිටව යනවා. මේක

FAIR COMMENT BY JEZEEM

ලැබුණේ සවස් කාලයේ. එතකොට අර ඉන්න ප්‍රමාණය තමයි උපයෝගී කර ගත්තේ. නමුත් මම එවකට ඒ වැඩ බලපු ස්ථානාධිපතිත් නිවාඩු ගිහිල්ලා හිටියේ කතරගම චාරිකාවකට.

ප්‍ර : ඒ කියන්නේ මේ ආවේක්ෂණ අංශයේ ස්ථානාධිපති?

පි : ඔව්. ඒ නිලධාරියාත් නිවාඩු ගිහිල්ලා හිටියේ. එතකොට මම අනිත් හිටපු නිලධාරීන්ට යොමු කළා.

ප්‍ර : ඒ යොමු කරලා ඔබ මොකද කළේ?

පි : මම මේ සම්බන්ධයෙන් තොරතුරු තව තියෙනවද කියලා හොයා බැලුවා මොකද්ද තව තියෙන්නේ කියලා. ඉතිං මට වෙනත් විශේෂ තැනකින් තොරතුරු කිව්වේ නැහැ. නමුත් අර සහකාර පොලිස් අධිකාරී මල්ලවආරච්චි එයා මාව මුණ ගැහුණා. මුණ ගැහිලා මම එතකොට දන්නේ මෙහෙම තොරතුරක්, මෙහෙම දෙයක් තියෙනවා කියලා දැන ගත්තේ. ඊට පස්සේ කිව්වා ...,

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : මල්ලවආරච්චි මහතා කොහේදිද හම්බ වුණේ?

පි : කොම්පඤ්ඤවීදියේදී.

ප්‍ර : කවද්ද, කොයි වෙලාවටද?

පි : 2019 අප්‍රේල් මාසේ 20 වෙනිදා මම හිතන්නේ රාත්‍රී 8ට 9ට විතර වගේ ආවේ. මම හිතන්නේ කොහේ හරි, මොකක් හරි මම අහන්න ගියේ නැහැ මොකද්ද ස්වාමීනි මේ යන මේක කියලා. මොකක් හරි විමර්ශන මොකක් හරි තොරතුරු සොයා බැලීමක් වෙන්න පුළුවන්.

ප්‍ර : හමුවීමක් වුණේ ඔබට දුරකථනයෙන් ඇමතීමක් දීලද?

පි : ඔව්. දුරකථනයෙන් ඇමතීමක් දීලා මගෙන් ඇහුවා ඔයාට මොකක් හරි උපදේසයක් ලැබුණාද කියලා. මම කිව්වා ඔව් නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා මට කිව්වා කියලා මම කිව්වා.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : ඒ දිනය 04.21ද, 04.20 ද?

පි : 20.

ප්‍ර : ඔබ ඒ අවස්ථාවේ සිටියේ කොහේද?

පි : කවුද.

ප්‍ර : ඔබ?

පි : ඒ Call එක එනකොටද?

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නැහැ මෙම නිලධාරීන් රාජකාරිය සඳහා යොමු කරන අවස්ථාවේදී ඔබ කොහේද හිටියේ?

පි : මම කාර්යාලයේ හිටියේ. කාර්යාලයේ ඉඳලා තමයි ඊට පස්සේ කට්ටිය අදාළ නිලධාරීන්ව එක් එක් ස්ථානවලට මේවා කරලා මොනවා හරි තියෙනවානම් මම ඒගොල්ලන්ට Telephone එකෙන් උපදෙස් දෙන්නම් කියලා අර කුඩා කණ්ඩායමක් නිසා.

ප්‍ර : දැන් එසේ ඔබ විසින් යොමු කරන ලද නිලධාරීන් ඔබ වෙත Update, යම් වාර්තාවක් ලබා දුන්නාද?

පි : දුරකථනයෙන් තමයි ලබා දුන්නේ.

ප්‍ර : මොනවද ඒ ලැබුණු වාර්තාව?

පි : කිව්වා කොච්චිකඩේ පැත්තට ගියපු කට්ටිය කිව්වා මේ පැතිවල පල්ලි මොකද විශේෂයෙන්ම කතෝලික ජනතාව බහුලව වාසය කරන ප්‍රදේශයක් තමයි කොටහේන, කොච්චිකඩේ, මෝදර, මුතුවැල්ල, මට්ටක්කුලිය. ඉතිං ඒ කිව්වා සමහර පල්ලිවල ඒ උත්සවය තියෙනවා කිව්වා රාත්‍රියේ. විශේෂයෙන් මම කිව්වා මට්ටක්කුලියේ බලන්න කියලා මොකද කාදිනල්තුමාගේ ආසන දෙව් මැදුරත් පිහිටලා තියෙන්නේ කොටහේන සෙන්ට් බෙනඩික් එක ගාව. මොකද අපිට නිශ්චිත ස්ථානයක් කිසිම කෙනෙක් පැවසුවේ නැහැ ස්වාමීනි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : දැන් ඔබ කිව්වනේ අර අප්‍රේල් මාසේ 20 වෙනිදා ඔබට කථා කරලා මේ ආවේක්ෂණ රාජකාරී කරන්න කියලා කිව්වා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ ඔබට කථා කරලා එහෙම උපදෙස් දුන්නේ සම්පත් කුමාර මහතාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : සම්පත් කුමාර මහතා කීයටද කථා කළේ.

පි : ස්වාමීනි සවස් කාලයේ. අප්‍රේල් මාසේ 20 වෙනිදා.

ප්‍ර : සවස් කාලයේ?

පි : සවස් කාලයේ.

ප්‍ර : එතකොට ඒ අවස්ථාවේදී සම්පත් කුමාර මහතාට අමතරව මල්ලවආරච්චි මහතාත් ඔබට දුරකථන ඇමතුමක් ලබා දුන්නාද ඒ අවස්ථාවේ?

පි : ඒ අවස්ථාවේ දුන්නේ නැහැ. රාත්‍රියේ තමයි දුන්නේ.

ප්‍ර : රාත්‍රියේ කියන්නේ අප්‍රේල් මාසේ 20 වෙනිදා?

FAIR COMMENT — BY JEZEEM

පි : 20 වෙනිදා ඔව්.

ප්‍ර : එතකොට තමයි කොම්පඤ්ඤවීදියේ ඔබ හමු වුණේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබට මල්ලවආරච්චි මහතා දුරකථන ඇමතුමක් ලබා දුන්නේ රාත්‍රී 8.00 විතර කියලා කිව්වොත් නිවැරදිද?

පි : කොහොම හරි 6.30 න් විතර පස්සේ ස්වාමීනි.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : ඒ අවස්ථාවේ ඔබ සිටියේ කොහේද?

පි : නිලධාරීන් යොදවනකොට මම හිටියේ කාර්යාලයේ. එතකොට ඒ නිලධාරිනුත් වෙන කටයුත්තකට ගිහිල්ලා හිටියේ. ඒගොල්ලන් කැඳවලා මම එතකොට ඒ අවස්ථාවේ හිටපු ජ්‍යෙෂ්ඨම නිලධාරියා අපි හිටියේ Reserve එකේ ඉන්න In charge. එයාට තමයි කිව්වේ, අරගොල්ලන්ටත් කිව්වා. පස්සේ කොච්චිකඩේ යන කට්ටියට කිව්වා ඇවිල්ලා හම්බ වෙන්න කියලත් කිව්වා.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබට හොඳට මතක් කරලා කියන්න පුළුවන්ද අප්‍රේල් 20 සම්පත් කුමාර මහත්මයා ඔබට ජංගම දුරකථනයෙන් කථා කරලද ඒ උපදෙස් ලබා දුන්නේ?

පි : ඔව් එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කීයට විතරද ලබා දුන්නේ?

පි : ඒක වෙලාවට මට හරියට මතකයක් නැහැ ස්වාමීනි. කොහොමත් හවස 5 න් විතර 4.30 න් පස්සේ කියලා වගේ කියලා මතකයි. දුරකථනය මම හිතන්නේ බැලුවොත්.

****

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : මල්ලවආරච්චි මහත්මයා මොකද්ද ඔබ වෙත ලබා දුන්න උපදෙස?

පි : මට උපදෙස් ලබා දුන්නේ නැහැ. මගෙන් ඇහුවා ඔයාට මොකක් හරි Duty සම්බන්ධව උපදේශයක් ආවද කියලා. මම කිව්වා ඔව් ආවා. මම අපේ නිලධාරීන්ව යොමු කරනවා කියලා.

ප්‍ර : දැන් ඔබ කියා සිටියා මේ කොච්චිකඩේ ඒ ප්‍රදේශයට යොමු කරපු නිලධාරීන් ඔබට වාර්තා කිරීම් සිදු කළා කියලා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : මොකද්ද ඔවුන් කළ වාර්තා කිරීම වූයේ?

පි : කිව්වේ එහෙම සැක සහිත මොනවත් එහෙම රහසිගත සැක කටයුතු දෙයක් නිරීක්ෂණය වුණේ නැහැ කියලා.

ප්‍ර : දැන් එම ප්‍රදේශයට අමතරව වෙන කොයි වගේ ප්‍රදේශවලටද ඔබ කොළඹ දකුණු කොළඹට?

පි : මම නුගේගොඩ, රාජගිරිය, වැල්ලවත්ත ඒ ප්‍රදේශවලටත් යොමු කළා.

ප්‍ර : එම නිලධාරීන්වරුන්ගෙනුත් වාර්තා කිරීම් ලැබුණාද?

පි : කිව්වා මේ පල්ලිවල උත්සව සමහර පල්ලිවල තිබ්බා. එහෙම විශේෂ මොකක්වත් එහෙම මොකක්වත් සැක කටයුතු දෙයක් නිරීක්ෂණය වුණේ නැහැ කියලා ස්වාමීනි.

ප්‍ර : දැන් මේ අවස්ථාවේදී එම නිලධාරීන් හෝ එම නිලධාරී කණ්ඩායම් ඔබ වෙත වාර්තා කළාද කොළඹ ප්‍රදේශයේ කිසියම් ස්ථානයක හෝ ස්ථානවල මාර්ග බාධක යොදා ඇති බව?

පි : කොච්චිකඩේ ප්‍රදේශයට ගියපු නිලධාරියා කිව්වා අපිව කොච්චිකඩේට පල්ලිය ගාව නෙමෙයි, පල්ලියට මෙහා තිබ්බ මාර්ග බාධකයකින් Check කළා කියලා.

ප්‍ර : හේතුවක් ප්‍රකාශ කර සිටියද?

පි : හේතුව අපේ කට්ටිය ස්වාමීනි සිවිල් ඇඳුමින් යන්නේ. ඉතිං වෙනත් විදිහට උපයෝගී කර ගන්නවා. ඒ නිසා ඒ නිලධාරීන්ට සැක හිතුණාද දන්නේ නැහැ.

ප්‍ර : කොච්චිකඩේ පමණද එහෙම?

පි : ඒගොල්ලන් මට කිව්වේ එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබට 2019.04.16 වෙනි දින පුපුරුවා ගිය මෝටර් සයිකල් බෝම්බය සම්බන්ධයෙන් ඔබට අවබෝධයක් තියෙනවද?

පි : 20 වෙනිදා වෙනකොට, 20 වෙනිදා රෑ වෙනකොට මම දැන ගත්තා.

ප්‍ර : කොහොමද ඒ දැන ගත්තේ?

පි : දැන ගත්තේ ඒ සහකාර පොලිස් අධිකාරී මලලවආරච්චි මහත්මයා තමයි කිව්වේ.

ප්‍ර : මොකද්ද ඒ ඔබට කියපු දේ?

පි : කිව්වේ හම්බ වුණහම කිව්වා මේ දැන් බයිසිකල් නොම්බරයක් එවනවා කිව්වා. දැන් Message එකක් ඒ වෙලාවේ හද හද සිටියේ Message එකක්. බයිසිකල් නොම්බරයක් තියෙනවා අපි Inquiryයක් කරලා හොයා ගත්තා මේ පුපුරපු බයිසිකලයත් එක්ක

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගත්තු, මම මේ කියපු දේවල් කියන්නේ ස්වාමීනි මේ. පුපුරපු බයිසිකලයත් එක්ක ගත්තු තව බයිසිකලයක් තියෙනවා ඒක ගැන දැන් Message එකක් යවනවා කියලා කිව්වා.

ප්‍ර : ඒ අනුව Message එකක් ඔබට ලැබුණාද?

පි : මට මතක විදියට ලැබුණා.

ප්‍ර : මොකද්ද එහි සඳහන් වෙලා තිබ්බේ ඔබට මතකයක් තියෙනවද?

පි : තිබ්බේ මේ යතුරුපැදිය උපයෝගී කරගෙන යම්කිසි කඩා කප්පල්කාරී ක්‍රියාවක් කරන්න ඉඩ තියෙනවා කියලා.

ප්‍ර : ඔබ වෙත එම යතුරු පැදියේ අංකයක් එහෙම ලබා දීලා තිබුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මෙම යතුරු පැදිය කවුරු විසින් පාවිච්චි කරපු එකක් කියලද වාර්තා කළේ? මොකද්ද ඒ ..?

පි : එහෙම විස්තරාත්මකව තිබ්බේ නැහැ. අර පුපුරපු යතුරු පැදියත් එක්ක මිලදී ගත්තු තවත් මොකක් හරි කියන එක තමයි කියැවුණේ.

දැන් වේලාව පෙ.ව. 11.40 යි
මෙතැන් සිට සටහන් කළේ මුතුමාලි මෙය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : පෙ.ව.11.40 යි.
පෙර සටහන් ල/ලේ : ඉන්ද්‍රාණි මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු 2019 අප්‍රේල් මාසේ 20 ට පෙර ඉස්ලාම් අන්තවාදීන් විසින් මෙරට තුළ ඉස්ලාම් අන්තවාදීන් නැත්නම් සහරාන් හෂීම් සහ ඔහුගේ කණ්ඩායම විසින් මෙරට තුළ යම් ප්‍රහාරයක් එල්ල විය හැකි බවත් ඒ සම්බන්ධයෙන් ආවේක්ෂණ රාජකාරී ඔබගේ අංශය විසින් කිරීම සඳහා ඔබට 2019 අප්‍රේල් මාසේ 20 ට පෙර යම් කිසි නියෝගයක් නැත්නම් උපදෙසක් ලැබුණද?

පි : නෑ ස්වාමිනි. ඒ හැබැයි බුද්ධි තොරතුරු හොයන්න කියලා අපි උපදෙස් පංතිවලදී දැනුවත් කරලා තිබ්බා. එක දවසක් අධ්‍යක්ෂකතුමා පවත්වපු උපදෙස් පංතියකදීත් දැනුවත් කරලා තිබ්බා බුද්ධි තොරතුර. මෙහෙම ප්‍රහාරයක් එල්ල කරනවා කියලා එහෙම කිව්වේ නෑ ස්වාමිනි.

ප්‍ර : එහෙම කිව්වේ නෑ. ඒ බුද්ධි තොරතුර මොන බුද්ධි තොරතුරුවලට ගන්න කියලද කිව්වේ?

පි : ඒ කියන්නේ මෙහෙම දැන් අපේ general class වලම ඇවිල්ලා මේ සංවිධානය ගැන තොරතුරු කියන කොට ඒක එක් රැස් කරන්න කියලා මට විතරක් නෙවෙයි ස්වාමිනි සියලුම නිලධාරීන් දැනුවත් කරපු එකක්.

ප්‍ර : නෑ මං අහන්නේ 2019 අප්‍රේල් මාසේ 04 වෙනිදට පස්සේ?

පි : ඔව්.

ප්‍ර : අප්‍රේල් 04 වෙනිදට පස්සේ සහ 20 ට ඉස්සෙල්ලා සහරාන් හෂීම් සහ ඔහුගේ කණ්ඩායම් සම්බන්ධයෙන් විශේෂ බුද්ධි මෙහෙයුමක් කරන්න කියලා ඔබගේ අංශයට නියෝගයක් ආවාද?

පි : නෑ මේ ප්‍රහාරය සම්බන්ධයෙන් ආවේ නෑ ස්වාමිනි.

ප්‍ර : ප්‍රහාරය සම්බන්යෙන් ආවේ නෑ නමුත් ඒ සහරාන් හෂීම් සහ ඔහුගේ කණ්ඩායම සම්බන්ධයෙන්වත් ඒ අප්‍රේල් 04 වෙනිදා ඉඳලා අප්‍රේල් 20 අතර කාල සීමාව තුළදී යම් කිසි නියෝගයක් ලැබුණද?

පි : අප්‍රේල් 04 යි අප්‍රේල් 20 යි අතර මේ සහරාන්ගේ කණ්ඩායම හොයන්න කියලා එහෙම නියෝගයක් ලැබුණේ නෑ ස්වාමිනි. වෙනත් පවත්වපු උපදෙස් පංතිවලදී.

ප්‍ර : ඒ ඊට කලින් නේ?

පි : ඊට කලින්.

ප්‍ර : ඒ අප්‍රේල් මාසේ 04 වෙනිදට කලින්?

Presidential Secretariat Copy
FAIR COMMENT — BY JEZEEM —

පි : කලින් එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබගේ මේ ආවේක්ෂණ අංශයේ සාමාන්‍යයෙන් නිලධාරීන් කී දෙනෙක් ඉන්නවද ඒ කියන්නේ ඔබ කියන්නේ කොළඹ ප්‍රදේශය ආවරණය කරන?

පි : ස්වාමිනි ඒ ඔය සිද්ධිය කාලේ නම් නිලධාරීන් හිටියේ 24 දෙනයි.

ප්‍ර : නිලධාරීන් 24 දෙනයි. නමුත් ඒ නිලධාරීන් ඔය ඔබ කියපු විදිහට කොළඹට විශේෂ වූ නිලධාරීන්?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ නිලධාරීන්ට ඒ කොළඹ ප්‍රදේශයේ ස්ථාන සම්බන්ධයෙන් විශේෂ දැනුමක් තිබ්බා කියලා කිව්වොත් නිවැරදිද?

පි : එහෙමයි ස්වාමිනි. ඒ මොකද කොළඹ මුළු සම්පූර්ණ සේවා කාලයම කොළඹ ප්‍රදේශයේ ආශ්‍රිතව ගිහිල්ලා මේ කොළඹ තියෙන සෑහේන අවබෝධයක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබගේ අංශයට යම් කිසි උපදෙසක් ලැබුණද 2019 අප්‍රේල් මාසයේදී මේ අප්‍රේල් මාසය තුළ ලැබෙන නිවාඩු සීමා කිරීම් කරන්න නැත්නම් නිවාඩු ලබා දෙන්නේ නැතුව මේ නිලධාරීන් රාජකාරියේ යොදවා තියා ගන්න කියලා උපදෙසක් ලැබුණද?

පි : නෑ ස්වාමිනි මමත් නිවාඩු ගියා.

ප්‍ර : ඔබත් නිවාඩු ගියා. ඔබත් නිවාඩු ඉන්න කොට තමයි අර අප්‍රේල් 20 නියෝගය ආවේ?

පි : නෑ මම නිවාඩු හමාර කරලා වාර්තා කළේ 20 වෙනිදා.

ප්‍ර : නිවාඩු ගියේ කවද්ද?

පි : මම 17 හවස ගිහින් ගිහිල්ලා දවස් 02 යි.

ප්‍ර : ඔබගේ නිවාඩු ඉල්ලීම අනුමත කරන්නේ කවුද?

පි : මගේ පරිපාලන නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා. එතකොට මං සාමාන්‍යයෙන් කොළඹින් බැහැරව යන කොට මං අධ්‍යක්ෂකතුමාව දැනුවත් කරලා යන්නේ. මං එතුමාවත් දැනුවත් කළා මං යනවා කියලා.

ප්‍ර : එතකොට ඔබගේ නිවාඩු ඉල්ලුම් පත අනුමත කරපු නිලධාරියාගේ නම මොකක්ද?

පි : නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා කැළුම් දිසානායක.

ප්‍ර : කැළුම් දිසානායක. දැන් ඔබ දන්නා පරිදි ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් විමර්ශනය කරන වෙනම කොට්ඨාශයක් තියෙනවනේ අංශයක් තියෙනවනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවයේ?

FAIR COMMENT — BY JEZEEM —

පි : ඔව්.

ප්‍ර : එම අංශයේ නිලධාරීන්වත් ආවේක්ෂණ රාජකාරීවල පුහුණු කිරීමක් කරලා තියෙනවද?

පි : මමද ස්වාමිනි.

ප්‍ර : නෑ නෑ සාමාන්‍යයෙන්?

පි : මම ස්වාමිනි මම අපේ රාජ්‍ය බුද්ධි සේවාවට විතරක් නෙවෙයි වෙනත් ආයතන විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය නාශක අංශය, විශේෂ කාර්ය බලකාය, යුධ හමුදා කොමාන්ඩෝ රෙජිමේන්තුව, එතකොට.

ප්‍ර : මං අහන්නේ ඔබ ගැන නෙවෙයි මං අහන්නේ සාමාන්‍යයෙන්?

පි : ඒක සාමාන්‍යයෙන් සමස්තයක් වශයෙන් ආවේක්ෂණ පාඨමාලා පවත්වනවා කාලෙන් කාලේට පත්වනවා.

ප්‍ර : එතකොට ඒ ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් විමර්ශනය කරන අංශයේ සාමාන්‍යයෙන් නිලධාරීන් කී දෙනෙක් විතර ඉන්නවද?

පි : ස්වාමිනි ඒකට මට උත්තරයක් දෙන්න බෑ.

ප්‍ර : උත්තරයක් දෙන්න බෑ?

පි : බෑ ස්වාමිනි.

ප්‍ර : දැනුවත් වීමක් නෑ?

පි : නෑ.

ප්‍ර : කොළඹ ප්‍රදේශයේ කී දෙනෙක් විතර ඉන්නවද?

පි : ඒ කියන්නේ ඒ අංශයේද?

ප්‍ර : ඔව්.

පි : එහෙමත් හරියාකාරවම කියන්න මං දන්නේ නෑ කොච්චර නිලධාරීන් Filed එකට දාලා තියෙනවද කියලා ස්වාමිනි.

ප්‍ර : ඔබට ඒ සම්බන්ධයෙන් දැනුවත් වීමක් නෑ?

පි : දන්නේ නෑ.

ප්‍ර : දැන් ඔබ දීර්ඝ කාලයක් රාජ්‍ය බුද්ධි සේවයේ 94 ඉඳලා නේද?

පි : 98 ඉඳලා ස්වාමිනි.

ප්‍ර : 98 ඉඳලා ඉඳලා තියෙනවනේ?

පි : ඔව්.

ප්‍ර : LTTE යුද්ධයේ බොහෝ කාලයක් ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ සේවය කරලා තිබ්බා නේද?

පි : ඒ කාලේ මං තමයි විශේෂ විමර්ශන අංශය භාරව හිටියේ ස්වාමිනි.

ජ්‍ර : දැන් LTTE යුධ සමයේදී විටින් විට LTTE සංවිධානය රටේ යම් ස්ථානයක ප්‍රහාරයක් දියත් කරන්න පුළුවන් කියන තොරතුර විටින් විට රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණද?

පි : ලැබුණා ස්වාමිනි.

Presidents Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සමහරක් බුද්ධි තොරතුරු ලැබුණද එක් නිශ්චිත ස්ථානයක් ඉලක්ක ගත කරනවා කියලත්?

පි : මගේ මතකේ හැටියට ස්වාමිනි අහවල් තැනම කියලා එහෙම

ප්‍ර : ලැබුණ එක වැඩිය ලැබුණේ නෑ?

පි : එහෙම ලැබුණේ නෑ. නමුත් බොහෝ විට ලැබුණා.

ප්‍ර : බොහෝ විට ලැබුණේ රටේ ඕනෑම තැනක එසේ ප්‍රහාරයක් සිදු විය හැකි බව කියලා?

පි : සිදු විය හැකි කියලා.

ප්‍ර : එහෙමද ?

පි : ඔව් එහෙමයි.

ප්‍ර : එතකොට එවැනි බුද්ධි තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවයට ඒ වකවානුවේ ලැබුණාම ඒ සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් මේ සීරුවෙන් නැත්නම් අවධානයෙන් යොමු කිරීම සඳහා එම තොරතුර ලබා දුන්නේ එවකට රාජ්‍ය බුද්ධි අංශයේ LTTE ය සම්බන්ධයෙන් ක්‍රියාකරන්න පවත්වලා තිබ්බ අංශයට විතරද නැත්නම් රාජ්‍ය බුද්ධි සේවයේ සියලුම අංශවලට එම තොරතුර දැනුවත් කිරීමක් සිදු වුණාද?

පි : ඒ තොරතුර අනුවත් ඒක වෙනස් වෙනවා කියලා තමා මගේ දැනුමේ හැටියට තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර : ඔබ LTTE අංශයට අනුයුක්තවද සේවය කෙරුවේ?

පි : නෑ LTTE අංශය භාරව හිටියේ නෑ ස්වාමිනි. නමුත් LTTE එකේ ක්‍රියාකාරකම් සම්බන්ධව විශේෂ විමර්ශන අත්අඩංගුවට ගැනීමට තොරතුරු ලබා දීමේ කර්තව්‍යයන් වල නියැලි හිටියා ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ අර LTTE සංවිධානයෙන් රටේ යම්කිසි ස්ථානයක ප්‍රහාරයක් වෙන්න පුළුවන් කියන තොරතුරක් ඒ කාලයේ ලැබුණාම ඒ සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවයේ සියලුම අංශ ඒ කියන්නේ පළාත් භාරව නිලධාරීන් මාර්ගයෙන් දිසා බුද්ධි කාර්යාලයේ ඒ සියලුම අංශ දැනුවත් කිරීමක් සිදු වෙලා තිබ්බා කියලා ඔබට මතකයක් තියෙනවද?

පි : ඔව් එහෙම මතකයි. ඒ විතරක් නෙවෙයි සාමාන්‍ය ප්‍රාදේශීය පොලිසි ඔක්කොම හමුදා අනුකණ්ඩ ඒ සියලුම ඒවා දැනුවත් කිරීම් සිදු වෙනවා ස්වාමිනි.

ප්‍ර : දැන් එවැනි තොරතුරක් රාජ්‍ය බුද්ධි සේවයේ සියලුම අංශවලට දැනුවත් කිරීම කෙරුවේ ඇයි ඒ කාලේ?

පි : ඒක ස්වාමිනි මට ඒක ගැන උත්තරයක් මගෙන් අධ්‍යක්ෂකතුමාගේ අභිමතය පරිදි තමයි ඒක ක්‍රියා කෙරෙන්නේ.

ප්‍ර : ඔබ 2019 අප්‍රේල් 20 ට පෙර ඉස්ලාම් අන්තවාදීන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔබගේ අංශය විසින් ආවේක්ෂණ

FAIR COMMENT — BY JEZEEM —

කෙරුවේ ඔබ මේ කොමිෂන් සභාවට අද දින විස්තර කරපු අවස්ථාවන්හිදී පමණද?

පි : ඊට අමතරව ස්වාමිනි වෙනත් විදේශීය පැමිණෙන පුද්ගලයන් සම්බන්ධව ආවේක්ෂණ සිදු කිරීම් බොහෝ කළා.

ප්‍ර : ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන්?

පි : ශ්‍රී ලාංකිකයින් මේ අන්තවාදය විතරක් නෙවෙයි ස්වාමිනි වෙන විශේෂ

ප්‍ර : නෑ අන්තවාදය ගැන විතරයි අහන්නේ. අන්තවාදය ගැන විතරයි අහන්නේ වෙන මොකුත් අහන්නේ නෑ. ඉස්ලාම් අන්තවාදය ගැන විතරයි අහන්නේ?

පි : ඔව්.

ප්‍ර : ඔබ මේ කොමිෂන් සභාවට විස්තර කරපු අවස්ථා?

පි : ඔව් එච්චරයි මට මතක හැටියට ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබගේ මතකේ හැටියට මේ පාස්කු දින ප්‍රහාරයෙන් ස්වයං ඝාතකයින් සහ සයින්දමර්දු වල මැරුණ අය සම්බන්ධයෙන් එම දිනවලට ප්‍රථම ඔබගේ අංශය විසින් යම් ආවේක්ෂණයක් කරලා තියෙනවද ඔබ කොමිෂන් සභාවට දැන් වෙන කොට විස්තර කරපු අවස්ථා හැරෙන්න?

පි : මං ඒ ගරු කොමිෂන් සභාවට කියපු ප්‍රමාණය විතරයි ස්වාමිනි.

ප්‍ර : දැන් අපිට පොඩ්ඩක් ආයිත් හොඳට මතක් කරලා කියන්න 2019 අප්‍රේල් 20 භවස සම්පත් කුමාර මහත්මයා ඔබට කතා කරලා හරියටම කිව්වේ මොකක්ද උපදෙස?

පි : කිව්වේ හෙට දිනයේ සහරාන්ගේ Team එකක් ප්‍රහාරයක් කරන්න සැලසුම් කරලා තියෙනවා ඉන්දියන් එම්බසියට හෝ වැදගත් ඒ අවට දේවස්ථානයකට කියලා එච්චරයි කිව්වේ ස්වාමිනි.

ප්‍ර : හෝටල් ගැන කිව්වේ නැද්ද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : හෝටල් ගැන ඔබට කිව්වේ නෑ?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඉන්දියන් මහ කොමසාරිස් කාර්යාලය හෝ ඒ අවට දේවස්ථාන?

පි : නෑ ඒ අවට වැදගත් දේවස්ථාන කියන වචනේ කිව්වා.

ප්‍ර : ඉන්දියන් මහ කොමසාරිස් කාර්යාලය හෝ ඒ අවට වැදගත් දේවස්ථානය?

පි : වැදගත් දේවස්ථානය.

ප්‍ර : එතකොට ඒ වැදගත් දේවස්ථාන සම්බන්ධ කෙරුවේ ඉන්දියන් මහ කොමසාරිස් කාර්යාලය අවට කියලා කියන විදිහට?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නෑ ඒකේදී අර වැදගත් දේවස්ථාන කියන එක ගැබ් වුණා ස්වාමිනි. මං ඇහුවා කොල්ලුපිටිය විතරද නෑ වැදගත් දේවස්ථාන කියලා කියලා තියෙනවා කිව්වා.

ප්‍ර : එහෙම කිව්වා?

පි : එහෙම කිව්වා. ඒ නිසානේ ස්වාමිනි මං අර පැත්තටත් කට්ටිය යෙදෙව්වේ.

ප්‍ර : නමුත් හෝටල් ගැන කිසි අවස්ථාවක ඔබව දැනුවත් කිරීමක් කෙරුවේ නෑ?

පි : නෑ ස්වාමිනි නෑ.

ප්‍ර : අර රාත්‍රී 08.00 ට විතර ඔබ මල්ලවආරච්චි මහතාව හම්බ වෙනවනේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ අවස්ථාවේදී හෝටල් සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සිදු කෙරුවද?

පි : මට එතුමා කිව්වේ නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට 2019 අප්‍රේල් 20 වෙනිදා ඔබගේ නිලධාරීන් හිටපු නිලධාරීන් කොළඹ හෝටල් සම්බන්ධයෙන් ආවේක්ෂණයක් කෙරුවේ නෑ කියලා කිව්වොත් ඒක නිවැරදිද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මොකද ඒ සම්බන්ධයෙන් ඔබට උපදෙසක් ලැබුණේ නෑ?

පි : නෑ ලැබුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : 2019 අප්‍රේල් 20 වන විට ඔබට සිටපු සේවක සංඛ්‍යාව කීයද?

පි : සේවක සංඛ්‍යාව 24 යි.

ප්‍ර : නමුත් 20 වෙනිදා වෙනකොට ඇත්තටම මේ රාජකාරිය කරන්න කී දෙනෙක් හිටියද?

පි : ඒ වෙලාවේ ඒ අවස්ථාවේ මේ පණිවිඩය ලැබෙන කොට ස්වාමිනි හිටියේ නිලධාරීන් 06 දෙනෙක් පමණ. මොකද මගේ අංශයේ ඉන්න හුඟක් විවාහක නිලධාරීන් ඉතා දුර බැහැර ප්‍රදේශයේ උදාහරණයක් හැටියට කියනවා නම් රත්නපුර, බලංගොඩ, අවිස්සාවෙල්ල, නෙළුම්දෙණිය ඒ වගේ දුර බැහැර කට්ටිය. නමුත් මම මේ මේක කියපු එක නිසා මං මට නිකම් තේරුණා මොකක් හරි වෙන්න ඉඩ තියෙනවා කියලා මොකද බයිසිකලේ කතාවත් කිව්වනේ. ඊට පස්සේ මං කිව්වා ඔක්කොම නිලධාරීන්ව ගෙන්වන්න කියලා.

ප්‍ර : බයිසිකලේ කතාව කොයි වෙලාවේද කිව්වේ?

පි : බයිසිකලේ කතාව කිව්වනේ රෑ ස්වාමිනි.

ප්‍ර : රෑ කියන්නේ කවද්ද?

පි : එදා 20 වෙනිදා රෑ.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කවුද කිව්වේ ඔබට?

පි : මල්ලවආරච්චි මහත්මයා කිව්වනේ.

ප්‍ර : කොම්පඤ්ඤ වීදියේ ?

පි : ඔව්.

ප්‍ර : ඊට ඉස්සෙල්ලා ඔබට බයිසිකලේ කතාව කිව්වේ නෑ?

පි : නෑ ස්වාමිනි. එතකොට කිව්වා Message එකකුත් එවනවා කියලා ඒ Message එක තමයි හද හද හිටියේ කියලා කිව්වා. එතකොටත් මං එතකොටත් කිව්වා අපේ ළඟ ඉන්න කට්ටිය ඔක්කොම නිවාඩු cancel කරලා ඔක්කොම එන්න කියන්න කියලා. ඒ අනුව පහුවදා නිවාඩු හිටපු නිලධාරීන් ඔක්කොම උදේ පාන්දර වෙන කොට ඇවිල්ලා තිබ්බා ස්වාමිනි. මොකද ඒගොල්ලන් අර ටිකක් දුර බැහැර නිසා තමයි නැත්නම් ඒ වෙලාවේම ගෙන්න ගන්න තිබ්බා නමුත් මේ අපේ විවාහක නිල නිවාසවල ඉන්න කට්ටිය මං ඉක්මනින්ම ගෙන්න ගත්තා.

ප්‍ර : දැන් ඔබට ඒ විදිහට 20 වෙනිදා ක්‍රියා කරන්න වුණාම ඔබ දැනුවත්ව හිටියද අප්‍රේල් 04 වෙනිදා ඒ සම්බන්ධයෙන් ඊට කලින් එවැනි තොරතුරක් ලැබිලා තිබ්බා කියලා රාජ්‍ය බුද්ධි සේවයට?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : අප්‍රේල් 04 වෙනිදා ලැබුණු ඔය C 04 (B) ඔබ දැක්කනේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එම තොරතුර ඔබට ඒ අප්‍රේල් 04 වෙනිදා අවස්ථාවේදී ලැබුණා නම් ඔබ අප්‍රේල් 20 වෙනිදට කරන ලද කාර්යයට වඩා වැඩි කාර්යයක් කරන්න තිබ්බද නැද්ද?

පි : තිබුණා කියලා පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ තොරතුර අප්‍රේල් 04 ඔබගේ අංශයට ලබා දුන්නා නම් ඔබගේ අංශයෙන් ඔබගේ සම්පූර්ණ ශක්තිය යොදලා ආවේක්ෂණ රාජකාරී කිරීමේ හැකියාවක් තිබ්බද?

පි : තිබුණා ස්වාමිනි.

ප්‍ර : එතකොට එවැනි තොරතුරු ඔබට ලැබුණා නම් අප්‍රේල් 04 වෙනිදා ඒ තොරතුර ලැබුණා නම් නිවාඩු සම්බන්ධයෙන් ඔබ යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්නවද?

පි : නිවාඩු එහෙනම් යන්න දෙන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : නිවාඩු යන්න දෙන්නේ නෑ?

පි : ඔව්.

ප්‍ර : යන්න දෙන්නේ නෑ?

පි : ඔව්.

Presidential Secretariat Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර : එතකොට දැන් LTTE යුධ සමයේ ඔය විදිහට එවැනි තොරතුරු විටින් විට රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණාම එවැනිම ක්‍රියාමාර්ගයක් අනුගමනය කෙරුවද ඒ කාලේ ඒ කියන්නේ නිවාඩු ලබා දීම සම්බන්ධයෙන් විශේෂයෙන්?

පි : නෑ ස්වාමිනි ඒකේදී මොකද නිලධාරීන්ට නිවාඩු නොදීම ඉන්න බැහැ. නමුත් නිවාඩු දෙන්න ඕනී. ඒ අවශ්‍යතාවය අනුව තමයි ඒක වෙනස් වෙන්නේ. එතකොට මගේ ඉන්නේ ප්‍රමාණය ඉතා කුඩා ප්‍රමාණයක් නිසා මට අනිවාර්යෙන්ම රඳව ගන්න සිද්ධ වෙනවා. නමුත් විශාල ප්‍රමාණයක් හිටියා නම් එයින් යම් කිසි අනුපාතයක් නිවාඩු දෙන්න පුළුවන් ස්වාමිනි.

ප්‍ර : නමුත් ඔබට සිටින සංඛ්‍යාවට අනුව අප්‍රේල් 04 වෙනිදා ඒ තොරතුර ඔබට ලැබුණා නම් ඔබ කියන්නේ ඔබගේ අංශයේ නිලධාරීන්ට නිවාඩු දීමක් ඔබ අනුමත කරන්නේ නෑ කියලද?

පි : ඒ මගේ මතය ස්වාමිනි.

ප්‍ර : ඔබේ අංශයේ සිටින නිලධාරීන්ට?

පි : නෑ මගේ මතය කියලා කියන්නේ.

ප්‍ර : නෑ නෑ හරි නමුත් ඔබගේ අංශයේ සිටින නිලධාරීන්ට නිවාඩු ලබා දෙනවද නැද්ද තීරණය කරන්නේ ඔබනේ?

පි : ඔව් එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් අප්‍රේල් 20 මල්ලවආරච්චි මහත්මයා ඔබට ඒ සම්බන්ධ වුණායින් පස්සේ මොනවද වුණේ ඊට පස්සේ ඔබ මොනවද කෙරුවේ ඊට පස්සේ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඔබ සමඟ සම්බන්ධ වීමක් සිදු වුණාද?

පි : මට මතක විදිහට සම්පත් කුමාර මහත්මයා දුරකථන ඇමතුමක් ගත්තා වගේ මතකයි ඒක මොකක් හරි මට මතකයි නමුත් පහුවදා උදේ මට සම්පත් කුමාර මහත්මයා වෙන කවුරුත් උසස් නිලධාරීන් මට කතා කළේ නැහැ ස්වාමිනි. නමුත් සම්පත් කුමාර මහත්මයා උදේ මට කතා කළා මට මතක විදිහට උදේ හතට විතර වගේ කියලා හතත් හත හමාරත් විතර වගේ කතා කරලා කිව්වා දැන් මේක තොරතුර තව මේ වෙනස් වෙලා තියෙනවා දැන් අනිවාර්යයෙන්ම කියනවා මෙතෝදිස්ත පල්ලියකට තමයි ප්‍රහාර එල්ල කරන්නේ ඒ ඉන්න කණ්ඩායම් ටික මෙතෝදිස්ත පල්ලිවලට යොමු කරවන්න කියලා.

ප්‍ර : ඒ කවදද කීයට විතරද?

පි : ඒ අප්‍රේල් 21 වෙනිදා උදෑසන මට මතක විදිහට හය හමාරත් හත හමාරත් අතර වගේ කිව්වේ කියලා හිතෙනවා මට අනිවාර්යයෙන්ම කිව්වා ස්වාමිනි.

ප්‍ර : උදෑසන හය හමාරත්?

FAIR COMMENT BY JEZEEM

පි : නෑ මතකයෙන් කියන්නේ වේලාව ස්වාමිනි

ප්‍ර : හය හමාරත් ?

පි : හත හමාරත් අතර කොහොම හරි. නෑ මට ඒ වේලාව ස්වාමිනි මට මතකයක් නැහැ.

ප්‍ර : නෑ සාමාන්‍යයෙන්?

පි : සාමාන්‍යයෙන් මං කියන්නේ මගේ මතකේ හැටියට බෝම්බය ප්‍රහාරය සිදු වීමට පෙර තමයි දැනුම් දුන්නේ.

ප්‍ර : ඔබගේ මතකය හැටියට හය හමාරයි හත හමාරයි අතර?

පි : මං හිතන්නේ මට මතක විදිහට.

ප්‍ර : Telephone call එකෙන්ද ඔබට ඒක?

පි : ඔව් Telephone call එකෙන්.

ප්‍ර : Telephone records නැද්ද ඔබ ගාව?

පි : නෑ ස්වාමිනි මගේ ළඟ නෑ.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර : පරාක්‍රම සිල්වා මහත්මයා

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ අප්‍රේල් 20 වෙනිදා සවස මේ තොරතුර මුලින්ම ඔබට දැන ගන්න ලැබෙන කොට ඔබ හිටියේ කාර්යාලයනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට මේ පණිවිඩය මුලින්ම දුන්නේ සම්පත් කුමාර නියෝජ්‍ය අධ්‍යක්ෂක නේද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒක කිව්වේ Telephone එකෙන්ද නැත්නම් ළඟට ගෙන්නලාද?

පි : Telephone එකෙන් කිව්වේ ස්වාමිනි. ලිඛිතව දුන්නේ නෑ මොකක්වත්.

ප්‍ර : දැන් ඒ පණිවිඩය ඔබට ලැබුණ ගමන් දැන් හෙට ප්‍රහාරයක් එල්ල වෙනවා කියලා ඒ පණිවිඩය ලැබුණ ගමන් ඔබට මොකක්ද හිතුණේ ඒ වෙලාවේ? දැන් මේ අවුරුදු 10 ක් බෝම්බ පුපුරපු නැති රටක්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට මෙහෙම ප්‍රහාරයක් එල්ල වෙනවා කිව්වාම ඒ මොහොතට ඔබට හිතුණේ මොකක්ද ඇත්තටම?

පි : ස්වාමිනි මගේ සේවා කාලයේ යම් යම් සිද්ධීන්වලට මට අතීත මතකයන් තියෙනවා ඒ නිසා මම හිතුවා සමහර විට මොකක් හරි වෙන්න පුළුවන් කියලා.

Registrar Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සීරියස් දෙයක් වෙන්න පුළුවන් කියලා ඔබට හිතුණද ඒ වෙලාවේ?

පි : හිතුණා ස්වාමිනි.

ප්‍ර : හරි එතකොට ඔබ පෙරලා ප්‍රශ්න කළේ නැද්ද සම්පත් කුමාර මහත්මයාගෙන් මේක ගැන තව විස්තර ටිකක් ගන්න උත්සාහ කළේ නැද්ද?

පි : මං ඇහුවා ස්වාමිනි එතකොට මට කිව්වා අපිට අපි තව මේ Investigation එකක් මේක කොහෙන්ද ආවේ කියන එකත් එහෙම කිව්වේ නෑ. මේක ගැන තව කර ගෙන යනවා මොනවා හරි දැන ගත්තොත් ඔයාව දැනුවත් කරන්නම් කියලා කිව්වා. මං කිව්වා ස්වාමිනි ඒ වෙලාවේ යම් කිසි නිශ්චිත ස්ථානයක් තියෙනවා නම් කියන්න එතකොට මට එතෙන්ටම Focus කරන්න පුළුවන් අපේ නිලධාරීන්.

ප්‍ර : ඒ වෙලාවේ ඔබ යමක් යෝජනා කළේ නැද්ද නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමාට අපි මෙහෙම කරමුද සර් කියලවත් එහෙම කළේ නෑ?

පි : නෑ එහෙම කළේ නෑ ස්වාමිනි.

ප්‍ර : සාමාන්‍යයෙන් රාජ්‍ය බුද්ධි සේවය එහෙම කරන සිරිතක් නැද්ද තමන්ට හිතෙන දේ ඉහළ නිලධාරියාත් සමඟ Discus කරන්න?

පි : නෑ එහෙම කරන්න අවස්ථා තියෙනවා නමුත් ඒක එහෙනම් ඊට වැඩිය ලොකු සාකච්ඡාවකට බඳුන් වෙලා එහෙම එන්න ඕන. නැතුව එක පාරට අර තිබ්බ කාල ප්‍රමාණය එතුමාත් හදිස්සියෙන් හදිස්සියෙන් වගේ කියා ගෙන ගියේ.

ප්‍ර : දැන් එතුමටත් ඒ තොරතුරේ තිබිච්ච මේ සීරියස්කම දැනිච්ච බව ඔබට වැටහුණාද ඒ වෙලාවේ හෙට ප්‍රහාරයක් එල්ල වෙනවා?

පි : ඔව්.

ප්‍ර : කියලා නිශ්චිත වශයෙන්ම කියන කොට

පි : ඔව්.

ප්‍ර : එතුමත් ඒක කියන්නේ ඉතාමත්ම මේ

පි : විශ්වාසයෙන් කියනවා

ප්‍ර : විශ්වාසයෙන් කියලා ඔබට හැඟුණද ඒ වෙලාවේ?

පි : හැඟුණා ස්වාමිනි.

ප්‍ර : දැන් එවැනි වෙලාවක ප්‍රහාරයක් එල්ල වෙනවා කිව්වාම විවිධාකාරයේ ප්‍රහාර එල්ල වෙන්න පුළුවන්නේ. නමුත් ඔබට අදහසක් දුන්නේ නැද්ද කොයි විදිහේ ප්‍රහාරයක් එල්ල වෙයිද කියලා?

පි : නෑ එහෙම කිව්වේ නෑ ස්වාමිනි.

ප්‍ර : එහෙම කිව්වේ නෑ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙම කිව්වේ නෑ ස්වාමිනි. නමුත් අර දැන් රාත්‍රියේ අර බයිසිකලේ ගැන කිව්වනේ එතකොට මේ බයිසිකලේකින් යම් කිසි එකක් වෙන්න පුළුවන් කියන එකත් අපේ නිලධාරීන් ඔක්කොම දැනුවත් කළා මං.

ප්‍ර : ඒ කියන්නේ ඇත්තටම හදවතට එකඟව ඇත්ත තත්ත්වේ කියන්න මොකද මාධ්‍යය නෑ කවුරුත්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ සහ ඔබේ ඔය ඉහළ නිලධාරීන් සහ ඔබත් එක්ක හිටපු නිලධාරීන් හිතුවේ අර පිපිරුව බයිසිකලේ වගේ තව බයිසිකලයක් පුපුරයි කියලද?

පි : නෑ මට එහෙම කියන්න බෑ ස්වාමිනි. යම්කිසි ප්‍රහාරයක් සිදු වෙනවා කියන පණිවිඩේ තමයි ඉස්සෙල්ලම දුන්නේ. නමුත් ඔය බයිසිකලේ කතාව කිව්වේ ඊට පස්සෙනේ ස්වාමිනි. ඉස්සෙල්ලා කිව්වේ ප්‍රහාරයක් සිදු වෙනවා කියලා. පස්සේ තමයි කිව්වේ ඔය බයිසිකලේ කතාව කිව්වෙත් මේ මල්ලවආරච්චි මහත්මයා.

ප්‍ර : ඒ කියන්නේ හත හමාර අටට විතර කියමුකෝ?

පි : ඔව් ඒ වෙලාවේ වගේ.

ප්‍ර : ඒ වේලාවට හිතුණේ ඔබටත් කලින් බයිසිකලයක් පිපිරුවා දවස් කීපයකට ඉස්සෙල්ලා එහෙනම් මේ පාරත් බයිසිකලයක් පුපුරයි කියලද ඔබටත් හිතුණේ?

පි : නෑ නෑ මට හිතුණා මොකක් හරි ප්‍රහාරයක් සිදු වෙන්න ඉඩ තියෙනවා. මොකද ඉතින් ඒ නිසා අනිවාර්යයෙන්ම මේක ඒක නිසා තමයි මං සියලුම අපේ ලේඛන පරීක්ෂා කළා නම් ස්වාමිනි දැන ගන්න පුළුවන් මොකද ඒගොල්ලන් හිටපු ප්‍රදේශ මං හිතන්නේ දුරකථන විශ්ලේෂණවලින් දැන ගන්න පුළුවන්. ඒ මං මගේ හිටපු මුළු Strength එකම විශේෂයෙන්ම කතරගම ගියපු එක්කෙනයි, සුරියවැව ගියපු එක්කෙනයි ඇරෙන්න අනිත් ඔක්කොම මං ගෙන්නුවා ස්වාමිනි.

ප්‍ර : දැන් මේ රාත්‍රියේ දැන් මේ තොරතුර ඔබට වඩාත් තහවුරු වුණාට පස්සේ ඔබට හිතුණේ නැද්ද අඩුම ගාණේ පල්ලිවලට මේ පිළිබඳව දැනුවත් වීමක් කළොත් හොඳයි කියලා?

පි : ස්වාමිනි ඒක මගේ රාමුවෙන් ඔබ්බට ගියපු කාර්යයක්.

ප්‍ර : නෑ නෑ පණිවිඩේ දෙන්න පුළුවන් ඉහළ නිලධාරියෙක්ට. නමුත් ඔබට හිතුණ් නැද්ද පල්ලිවලට දැනුවත් කරලා තිබ්බොත් හොඳයි නේද කියලා ඔබට හිතුණ් නැද්ද?

පි : මට හිතුණා ඉතින් සමහර වෙලාවට මොකක් හරි වෙන ක්‍රමයක් ක්‍රියාමාර්ගයක් අරගෙනද දන්නේ නැනේ.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : දැන් ඔබගේ මේ අත්දැකීම් අනුව දැන් රාජ්‍ය බුද්ධි සේවයේ ඔබ කාලයක් වැඩ කරලා තියෙන අත්දැකීම් සහ පළපුරුද්ද අනුව මෙවැනි වැදගත් තොරතුරක් ඇවිල්ලා මේක අනිත් අය එක්ක හුවමාරු කර නොගත්තේ කලින් හුවමාරු කර නොගත්තේ ඔබට හිතෙන විදිහට ඇයි මේ රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානීන් මෙහෙම කළේ අවංකවම ඔබට තියෙන උත්තරේ අපිට දෙන්න බලන්න?

පි : ස්වාමිනි මම මට ඒකට ප්‍රකාශයක් කරනවට වැඩිය මං හිතන්නේ අධ්‍යක්ෂකතුමා.

ප්‍ර : අධ්‍යක්ෂකතුමාගෙන් අපි දවස් 23 ක් අහලා තියෙනවා. එහෙම නෙවෙයි මං අහන්නේ ඔබගෙන්?

පි : ඔව්.

ප්‍ර : ඔබ හිතන විදිහට අවංකව උත්තරයක් දෙන්න මොකද අපි මේ උත්තරේ මාධ්‍යයට එළි වෙලා නැනේ. එතකොට ඔබයි අපයි විතරයි දන්නේ ලියවෙනවා එච්චරයි. එතකොට ඔබ හිතන විදිහට මෙච්චර වැදගත් තොරතුර හුවමාරු කර නොගත්තේ රාජ්‍ය බුද්ධි සේවයේ මුල ඉඳලා පැවැතිච්ච ප්‍රතිපත්තියද නැත්නම් සම්ප්‍රදායද මේක. එහෙම නැත්නම් එතන පොඩි මොකක් හරි mistake එකක් වුණාද ඔබට හිතෙන්නේ මොකක්ද?

පි : ඉතින් මම හිතුවෙත් ඉතින් ඔක්කොටම දැනුවත් කරලා කියන එක තමයි මට හිතුණේ.

ප්‍ර : හරි ඒක තමයි දැන් අපි ඔක්කොටම ඒක තේරෙනවා අපිව දැනුවත් කරලා තිබ්බා නම් හොඳටම හොඳයි යමක් කරන්න තිබුණා?

පි : ඔව්.

ප්‍ර : ඇයි දැනුවත් නොකළේ කියන එක ගැන ඔබට හිතෙන්නේ මොකක්ද?

පි : ඒක ඒ තීරණ ගත යුතු පුද්ගලයා විසින් ගත යුතු තීරණයක් කියලා තමයි මට හිතෙන්නේ ස්වාමිනි.

ප්‍ර : ඔව් දැන් ඔබට වැටහෙන විදිහට තීරණ ගත යුතු පුද්ගලයා ඇයි ඒ තීරණය නොගත්තේ ඒකයි මං අහන්නේ?

පි : ඒක ස්වාමිනි ඉතින්

ප්‍ර : කිසිම හේතුවක් ඔබට දෙන්න පුළුවන්ද අපිට නිකම් සැකේ වාසියටවත් තියන්න මොකක් හරි හේතුවක් දෙන්න පුළුවන්ද ඔබට?

පි : සමහර විට මේ තොරතුරු ගැන විශ්ලේෂණය කරලා එහෙම මොකක් හරි තීරණාත්මක ඒ නිසා එහෙම දෙයක් වුණාද. මම හරියටම දන්නේ නෑ තාම ඒක බැහැර කළාද නැද්ද කියන එකත් දන්නේ නැනේ ස්වාමිනි.

FAIR COMMENT — BY JEZEEM

ප : හොඳයි දැන් රෑ එළිවෙනකම් 20 වෙනිදා රෑ එළිවෙනකම් ඔබ සහ ඔබගේ අනිකුත් කණ්ඩායම ආවේක්ෂණ රාජකාරිය කළා?

පි : ඔව්.

ප : 21 වෙනිදා උදේ පාන්දර තවත් ස්ථිර කරලා තොරතුරක් ලැබුණනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප : දැන් එතකොට තවත් තහවුරු වෙච්ච තොරතුරක් ඔබට තියෙද්දී?

පි : එහෙමයි.

ප : ඒ වෙලාවේදී ඔබ මොනවද කරන්න කියලා නිගමනය කළේ දැන් මේක අපි කරමු කියලා හිතුවේ මොකක්ද?

පි : මම ඒ වෙලාවේ කළේ ස්වාමිනි දැන් කොළඹ ප්‍රදේශය ගත්තාම ඇත්තටම අපිට දැන් මේ පල්ලි තියෙනවා සාමාන්‍යයෙන් 150 ක් විතර මගේ දැනුවත්කමේ හැටියට කියන්නේ. එතකොට විශේෂයෙන්ම දැන් මෙතෝදිස්ත කියන සභාවට අයිති පල්ලි කියලා බැලුවාම විශේෂ ඒවා 10 කට වැඩි ප්‍රමාණයක් තියෙනවා. ඊට පස්සේ මං නිලධාරීන්ට කිව්වා ඉක්මනට මෙන්න මේ ස්ථාන හොයා ගෙන යන්න කියන පණිවිඩේ තමයි දුන්නේ මරදානට, එතකොට කොල්ලුපිටිය තමයි ප්‍රධාන කොල්ලුපිටියේ තමයි ප්‍රධානම මෙතෝදිස්ත පල්ලිය තියෙන්නේ ඒකට ඒ නිලධාරීන් යොමු කළා. එතකොට කොටහේනේ තියෙනවා ෂෙන් ක්ලේයාස් පාරේ මෙතෝදිස්ත ඒ කියන්නේ අපිටත් ඒ වෙලාවේ ඒ හරියට මෙතෝදිස්ත පල්ලි කොහේද තියෙන්නේ කියලා එහෙම අවබෝධයක් තිබුණේ නෑ. නමුත් අපේ තියෙන දැනුවත්කමේ හැටියට යොමු කළා ස්වාමිනි ඒ කට්ටිය.

ප : හරි දැන් මං තව ප්‍රශ්නයක් අහන්නම් ඔබගෙන් අර ජමිල් කියන පුද්ගලයා පිළිබඳව. ඒ ජමිල් ගැන ඔබ ආවේක්ෂණ කටයුතු කළා කිව්වනේ කාලයක් ඉස්සෙල්ලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඇයි ජමිල් ගැන නිවැරදි තොරතුරු සොයා ගන්න බැරි වුණේ?

පි : ස්වාමිනි දැන් මේක ඒ කටයුත්ත අපිටම භාර දීපු ක්‍රියාවලියක් නෙවෙයි. අපිට තියෙන්නේ මෙයාගේ ඒ දීපු තැන්වලට යනවද එනවද කියලා නීරික්ෂණය කරලා වාර්තා කරන්න විතරයි. අපි එතනින් එහාට බුද්ධිමය විමර්ශනයක් සිදු කරන්නේ නැහැ. අපි කරන්නේ ආවේක්ෂණය විතරයි. මොකද මෙතනදී මං කියන්න අවශ්‍යයි ස්වාමිනි මේ ආවේක්ෂණය වෙනයි. බුද්ධි විමර්ශනය කියන එක වෙනයි. මොකද අරකේදී කරන්නේ ඒ අපිට ලබා දෙන ස්ථානය හරි පුද්ගලයා සම්බන්ධයෙන් ගිහිල්ලා තොරතුරු වාර්තා කරනවා. එතකොට බුද්ධි විමර්ශනය කරන්නේ ඒකට Involve

FAIR COMMENT BY JEZEEM

වෙලා ඉන්න party එක. ඉතින් ඒ නිසා අපි ඒවා කරන්න යන්නේ නැහැ.

ප්‍ර : දැන් ජමිල් පිළිබඳව ආවේක්ෂණ කටයුතු කරන කොට ජමිල් සමඟ ළඟින්ම ඇසුරු කරන ලද පුද්ගලයන් පිළිබඳව වාර්තා වුණාද?

පි : ඔව් එහෙම තිබ්බා ස්වාමිනි.

ප්‍ර : කී දෙනෙක් ගැන විතර විස්තර තිබුණද එහෙම?

පි : ඒ කියන්නේ අර IS මතවාදය සම්බන්ධයෙන් ඉන්න කණ්ඩායම කියන එක.

ප්‍ර : ඒක තමයි කී දෙනෙක් විතර මතකද?

පි : කොළඹ ප්‍රදේශයේ හතර පස් දෙනෙක්.

ප්‍ර : ඒ පිළිබඳව ලිඛිතව වාර්තා සැපයුවද එතකොට?

පි : නෑ අපි දැක්කේ නැනේ අපි එයාගේ ඒ පුද්ගලයාගේ ක්‍රියාකාරකම දැක්කේ නැනේ. අනිත් දැකපු කට්ටිය ගැන වාර්තා කළා. මේකත් අපි නිරීක්ෂණය නොවුණා කියලා වාර්තා කළා ස්වාමිනි.

ප්‍ර : කොපමණ කාලයක් ඔය ආවේක්ෂණ කටයුතු ඔබ විසින් කර ගෙන ගියාද ජමිල් පිළිබඳව?

පි : අපි මාස කීපයක් කළා ඊට පස්සේ අපිට වෙන task එකක් ආවා. ඊට පස්සේ ඒක ගැන තමයි අපි තනිකරම කළේ.

ප්‍ර : නමුත් මේ ජමිල් පිළිබඳව සොයා බලන එක දැන් ඇති කියලා කවුරුවත් නැවැත්තුවේ නෑ?

පි : නෑ ඒකට විශේෂිත

ප්‍ර : නෑ නෑ මං කියන්නේ ආවේක්ෂණය කරන එක ආ.. දැන් ජමිල් ගැන හෙව්වා ඇති කියලා ඒක නැවැත්තුවේ නෑ කවුරුත්?

පි : නෑ අපිට ඒ වාර්තා කරපුවාම එහෙන් අපිට උපදෙස් දෙනවා ස්වාමිනි ඊට වැඩිය continue කරන්න ඕනේ නම් අපිට එනවා ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ කියන්නේ ජමිල් පිළිබඳ ආවේක්ෂණ කටයුතු කරන කොට ඊට වැඩිය වෙනස් පුද්ගලයන් පිළිබඳ ආවේක්ෂණය කරන්න උපදෙස් ලැබුණාම එතකොට ජමිල් ගැන හොයන්නේ නැතුව අනිත් අය ගැන හොයන්න පටන් ගත්තා?

පි : ඔව් මොකද හේතුව අපි ඉන්න සුළු නිලධාරීන් ප්‍රමාණය cover කරන්න එපැයි ස්වාමිනි. ඒ මේ විතරක් නෙවෙයි ස්වාමිනි වෙනත් රාජකාරී විශාල ප්‍රමාණයක් අපිට එනවා ඉතින් ඒවාත් .

ප්‍ර : දැන් ඔබ කියන විදිහට කට්ටිය මදි නම් අධ්‍යක්ෂකතුමාට කියලා වැඩිපුර කට්ටිය ඉල්ල ගන්න බැලුවේ නැද්ද ඒ දවස්වල?

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

පි : නෑ අපිට දෙනවා කියලා තිබ්බේ ස්වාමිනි විශේෂයෙන්ම අවිවාහක නිලධාරීන් දෙනවා කියලා තිබ්බේ.

ප්‍ර : කොපමණ කාලයක් ඔය කට්ටිය අඩුවෙන් වැඩ කළාද ඔබ?

පි : ඒ සමහරක් මේ වෙන්නේ අර හුහක් වෙලාවට අනුයුක්ත කරලා ඉන්නවා. ඒගොල්ලො විවාහක නිලධාරීන් වුණාම අර ඒ වෙලාවට ප්‍රයෝජනයට ගන්න බැරි හැකියාව තියෙනවා ස්වාමිනි එන්නේ දුර බැහැර ප්‍රදේශයේ ඉඳලනේ.

ප්‍ර : හොඳයි මගේ අවසාන ප්‍රශ්නය. දැන් ඔබ තාමත් ආවේක්ෂණ කටයුතු කරනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට දැනෙන විදිහට ඔබේ මතය අනුව මේ ඉස්ලාම් අන්තවාදීන්ගේ තර්ජනය හෝ අවධානම තාමත් තියෙනවද?

පි : මගේ දැනුමේ හැටියට ඒ මතය ඒගොල්ලන්ගේ හිත්වලින් බැහැර කරනකම් පැවැත්වි කියන එක විශ්වාස කරනවා.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මහතා</u>

ප්‍ර : පරාක්‍රම සිල්වා මහත්මයා දැන් ඔබතුමාට හිතුණ් නැද්ද මේ දැන් අප්‍රේල් 20 වෙනිදනේ ඔබට ඔය තොරතුර ලැබුණා කිව්වේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : අප්‍රේල් 21 වෙනිදා දිනේ කවදද කියලා ඔබට නිකමටවත් මේ පාස්කු ඉරිදා දවසක් කියලා එහෙම?

පි : මම දැන ගෙන හිටියා ස්වාමිනි ඒක කිව්වයින් පස්සේ මේ පහුවෙනිදා පාස්කු කියන එක දැන ගෙන හිටියා. මොකද විශාල ප්‍රමාණයක් දේවමෙහෙයන් එදා රාත්‍රියේ කොළඹ ප්‍රදේශයේ දේවස්ථාවල තිබුණා කියලා නිලධාරීන් වාර්තා කරපු නිසා.

ප්‍ර : ඒක නිසා මේ මෙහෙම බෝම්බ පිපිරීමක් හෝ මොකක් හරි විනාශකාරී සිද්ධියක් වෙයි කියලා ඔබට නිකමටවත් හිතුණේ නැද්ද දැනුණේ නැද්ද?

පි : සිතුණා ඒ කියන්නේ ප්‍රහාරයක් එල්ල කරයි කියන හැඟීමත් තිබ්බා ස්වාමිනි.

ප්‍ර : ඔව් ඔබ කල්පනා කළේ මෙතෝදිස්ත දේවස්ථාන සම්බන්ධයෙන් විතරයි?

පි : නෑ නෑ ස්වාමිනි අනිත් දේවස්ථානවලට යොමු කරලා තිබ්බේ අර උදේ ආපු දුරකථන ඇමතුමෙන් පස්සේ තමයි ඒ මෙතෝදිස්ත පල්ලිවලට මං යොමු කළේ නිලධාරීන්. ඉස්සෙල්ලා ඔක්කොම දේවස්ථාන ආවරණය වෙන පරිදි තමයි නිලධාරීන් යොදවලා

FAIR COMMENT — BY JEZEEM —

තිබ්බේ ස්වාමිනි. අර උදේ ආපු දුරකථන ඇමතුමෙන් පස්සේ තමයි මං අර තීරණයට ගියේ ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ කලින් දවස්වල ගිහිල්ලා මේ ඒ පල්ලි සෝදිසි කිරීමක් හරි මොකක් හරි එහෙම ක්‍රියාමාර්ගයක් ගන්න තත්ත්වයක් ඇති කරන්න ඔබට කල්පනා වුණේ නැද්ද?

පි : ස්වාමිනි පල්ලි මට හම්බ වුණේ 20 වෙනිදා හවස් කාලයනේ.

ප්‍ර : එතකොට ඔබ නිවාඩු ගිහින්ද හිටියේ?

පි : මම 20 වෙනිදා තමයි සේවයට වාර්තා කළේ.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : මිස්ටර් පරාක්‍රම ඔබ දැන් ආවේක්ෂණයකට නිලධාරීන් යෙදුවනේ ඔය අප්‍රේල් 20 වෙනි දින ඔබට රාත්‍රියේ ලැබුණු තොරතුරෙන් පසුව?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මොනවද කියලා ඔබට කියන්න පුළුවන්ද මේ කොමිෂමට ඒ ආවේක්ෂණය කියලා ඒ නිලධාරීන්ට පැවරිච්චි රාජකාරී මොනවද?

පි : අපි ආවේක්ෂණය කිරීමේදී අපි අර ඉස්සෙල්ලා සඳහන් කළා වගේ අර පුද්ගලයෙක්, ස්ථානයක් පිළිබඳව අපිට මේකේ

ප්‍ර : නෑ ඒක තමයි ඒක පැහැදිලියි. නමුත් ඔබට කියන්න පුළුවන්ද පැහැදිලිව දැන් ඔබ X කියන පුද්ගලයාව A කියන පල්ලියට යැව්වා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ මොනවද ඔහුට එක්කොා ඔහුගෙන් බලාපොරොත්තු වෙන්නේ ගිහිල්ලා ආවේක්ෂණය කරනවා කියලා මේ තොරතුර මත?

පි : තොරතුර මත ඉතින් ප්‍රහාරයක් එල්ල කරන්න මොකක් හරි එක්කෝ වාහනයකින් නැත්නම් සැක කටයුතු වාහනයක් නැත්නම් මොකක් හරි බෑග් එකක් හරි මොනවා හරි එකකට පුරවගෙන එහෙම මොකක් හරිනේ ප්‍රහාරයක් එල්ල කරනවා කිව්වාම. නැත්නම් එතෙන්ට ඇවිල්ලා වෙඩි තියලා යන්නත් ඉඩ තියෙනවා. ඉතින් ඒ නිසා ඒ නිලධාරීන්ව දැනුවත් කරලා තියෙනවා මේ වගේ සැක කටයුතු හැසිරීම් තියෙන මොකක් හරි පුද්ගලයෙක් හරි, වාහනයක් හරි, යතුරු පැදියක් හරි එහෙම දැන ගත්තොත් කියන්න කියලා. ඒ වගේම ඒ හිටපු මගේ හිටපු නිලධාරීන් එහෙම සැක කටයුතු යතුරු පැදි දෙකකුත් 21 වෙනිදා උදෑසන අපේ තියෙනවා වෙනම ක්‍රමයක් ඒ පරීක්ෂා කරන ඒ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අනුව පරීක්ෂා කරලා තියෙනවා. නමුත් ඒක සැකකටයුතු නැති නිසා අපි ඒක බැහැර කළා.

ප : එතකොට අර කොච්චිකඩේ දේවස්ථානයට ඔබ ආවේක්ෂණ නිලධාරීන් ඇරියද?

පි : යෙදෙව්වා ස්වාමිනි.

ප : එතකොට ඒ ගොල්ලන්ට ආවේක්ෂණය කරන අයට ඔය බෝම්බයක් බැඳගත්ත පුද්ගලයාගේ ගමන ඒවා මේවා පිළිබඳව දැනුණේ නැද්ද දැනිලා නැද්ද?

පි : ස්වාමිනි මං කිව්වේ උදේ ස්ථාන වෙනස් කරන්න සිද්ධ වුණා කියලා.

ප : ඒ කියන්නේ 21 වෙනිදා උදේ?

පි : 21 වෙනිදා උදේ ආවානේ මෙතෝදිස්ත පල්ලි කියලා.

ප : ඔව්.

පි : ඉතින් ඒ නිසා ඒ පල්ලිවලට එතන හිටපු කණ්ඩායම් දැන් මගේ කණ්ඩායමේ ඉන්නේ ඒ පිරිස ටිකයිනේ.

ප : ටිකයිනේ 24 යි නේ ඔබට ඉන්නේ?

පි : ඔව්.

ප : එතකොට?

පි : ඒ කට්ටියගෙනුත් කීප දෙනෙක් දාලා ඒ හිටපු කට්ටිය තමයි යොමු කළේ මෙතෝදිස්ත පල්ලිවලට යන්න කියලා.

ප : එතකොට කොච්චිකඩේ පල්ලියට දාපු එක්කෙනාව 21 වෙනිදා උදේ ඇරියේ නෑ කොච්චිකඩේ දේවස්ථානයට?

පි : නෑ නෑ ස්වාමිනි 21 වෙනිදා ගිහිල්ලා හිටියේ. නමුත් අර දුරකථන ඇමතුම ආවායින් පස්සේ.

ප : ඒ කියන්නේ උදේ ආවා ඔබට හත හමාරෙන් ඉස්සෙල්ලා?

පි : ඔව්.

ප : එතකොට ඔබ කළේ කොච්චිකඩේ එක්කෙනාව කෝහාටද ඇරියේ?

පි : මං කිව්වා ඒ මෙතෝදිස්ත කෝටහේනේම තියෙන මෙතෝදිස්ත පල්ලිය බලන්න යන්න කියලා. ඒ කියන්නේ ඒ විතරක් නෙවෙයි ඒ මුළු කණ්ඩායම්වලටම දැනුම් දුන්නා ස්වාමිනි මේ ඒ මෙතෝදිස්ත පල්ලිය ආවරණය වෙන විදිහට රාජකාරියේ යෙදෙන්න කියලා.

ප : එතකොට ඔබට අර 20 වෙනිදා පණිවිඩයේදී ලැබුණද අර ඉන්දියානු හෝටලයක් ඉන්දියානුවන් විශාල වශයෙන් යන හෝටලයක් පිළිබඳව ඔබට ලැබුණද තොරතුර 21 වෙනිදා උදේ?

පි : එහෙම එකක් කිව්වේ නෑ.

ප : ලැබුණේ නෑ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ දැන් කිව්වා ඔබතේ ආවේක්ෂණ කටයුතු පිළිබඳව ප්‍රධානීයා හැටියට ඉන්නේ ප්‍රධාන කාර්යාලයේ ඒ ආවේක්ෂණ අංශයේ?

පි : ඔව් එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට නිලධාරීන් 24 ක් ඉන්නවා කිව්වා?

පි : ඔව්.

ප්‍ර : ඔබ කිව්වා කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය තමයි ඕගොල්ලන් රාජකාරී ප්‍රධානම වපසරිය?

පි : ඔව්.

ප්‍ර : කටුනායකත් කරනවා කියලා?

පි : කටුනායක නෙවෙයි දිවයිනේ අවට

ප්‍ර : විශේෂ තැනක් නිසා?

පි : විශේෂ මොකක් හරි.

ප්‍ර : එතකොට ඔබට කියන්න පුළුවන්ද දැන් එතකොට දිවයින පුරාම වෙනත් අපි හිතමුකෝ වෙනත් දිස්ත්‍රික්කයක හරි පළාතක ආවේක්ෂණ කාර්යයක් කරන්න ඕනී නම් ඒක කළ යුත්තේ ඔබගේ අංශයෙන්ද ආවේක්ෂණ කටයුතු?

පි : ඒක අධ්‍යක්ෂකතුමාගේ අභිමතය පරිදි තමයි සිදු වෙන්නේ ස්වාමිනි.

ප්‍ර : නෑ හරි හරි ඒක හරි නමුත් ඔබගේ අංශය හරහාද කරන්නේ ඒක. දැන් ඔබතේ ආවේක්ෂණය පිළිබඳව?

පි : නමුත් මුළු දිවයිනේම මහින් ආවරණය වෙන්නේ නෑ ස්වාමිනි. එහෙනම් වෙනම ඒකක පිහිටුවන්න ඕන.

ප්‍ර : නෑ නෑ ඒක තමයි දැන් අපි හිතමුකෝ වෙන තැනක කරන්න ඕනී කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට කවුද ආවේක්ෂණය කරන්නේ ඔබගේ ආයතනයේ. අපි හිතමු දැන් උදාහරණයක් මේ 20 වෙනිදා රෑ ඔබට ලැබුණු පණිවිඩයෙන් කිව්වා මඩකලපුව දිස්ත්‍රික්කයෙත් පල්ලියකට ප්‍රහාරයක් සිද්ධ වෙනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට කවුද ආවේක්ෂණය කරන්නේ ඒක දැන් ඔබගේ නිලධාරීන්ද?

පි : නෑ මට කියන්නේ නෑ ස්වාමිනි. ඒක ඒ පළාත භාර ඉන්න එක්කෙනා

ප්‍ර : ඒ කියන්නේ අර දිසා බුද්ධි කාර්යාලයට?

President's Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

පි : ඔව් එහේ ඉන්න නියෝජ්‍ය අධ්‍යක්ෂ. ඒ කියන්නේ මම නෙවේ ඒ තීරණේ ගන්නේ අධ්‍යක්ෂකතුමා හරි ඒ අදාළ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා හරි ඒක එයට බැහැර කරනවා මෙහෙම මෙහෙම කරන්න කියලා.

ප්‍ර : ඒ කියන්නේ දිසා බුද්ධි කාර්යාලයේ ඉන්නවද ආවේක්ෂණ නිලධාරීන්?

පි : ඒක ඒ පුරුදු පුහුණු වෙච්චි කට්ටිය ඉන්නවා ඉතින්.

ප්‍ර : ඉන්නවා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ කියන්නේ දැන් කොළඹින් බාහිරව සිද්ධ වෙනවා නම් ආවේක්ෂණයක් ඒක ඔබගේ අංශය දන්නේ නෑ. ඔබගේ ආයතනයේ ප්‍රධානීයා විසින් අර දිසා බුද්ධි කාර්යාලයට කියනවා කියලා?

පි : දිසා බුද්ධි කාර්යාලයට නෙවෙයි ස්වාමිනි මේ ඒ ඉන්න නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා හරි කාට හරි කියනවා ඇති. අපෙන් එහෙම ගිහිල්ලා මඩකලපුවේ එහෙම සිදුවීමක් කළේ නෑ ස්වාමිනි.

ප්‍ර : ආවේක්ෂණය කරන්නේම නැද්ද දැන් ඔබගේ අංශයෙන් කොළඹින්?

පි : විශේෂ ඒ කියන්නේ විශේෂ ඉල්ලීමක් කළොත් දැන් එහෙම ජනාධිපතිතුමා සහභාගි වෙන සංචාර ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරලා එහෙම කළොත් එහෙම අපේ මුළු කණ්ඩායම ඒක ඉතින් දවසක් දෙකක් වගේ ඒ.

ප්‍ර : දැන් ඉස්ලාම් ආගමික අන්තවාදය ගැන සහරාන් ගැන ආවේක්ෂණයක් කරන්න කියලා

පි : අපි සහරාන් ගැන ආවේක්ෂණයක් කළේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබට කියලත් නැද්ද?

පි : නෑ නෑ.

ප්‍ර : 2017 වසරේ ඉඳලවත් කිව්වේ නෑ සහරාන් ගැන ආවේක්ෂණයක් කරන්න කියලා ඔබගේ අංශයට?

පි : සහරාන් නෙවෙයි අපිට කොළඹ ඉන්න කට්ටිය තමයි ඒ අර IS මතවාදය සහරාන්ගේ කට්ටිය නෙවෙයි IS මතවාදය දරණ කට්ටිය සම්බන්ධයෙන්.

ප්‍ර : සහරාන් ගැන ඔබගේ අංශයෙන් කළේ නෑ ආවේක්ෂණයක් නේද?

පි : සහරාන් ගැන ඔව් සහරාන් ගැන කළේ නෑ. සහරාන් ගැන කළේ නෑ නමුත් ඒ සහරාන්ගේ කණ්ඩායමේ හිටපු සමහර අය ගැන අපි කරලා තියෙනවා.

ප්‍ර : ඔබ දැන් රාජ්‍ය බුද්ධි සේවා ආයතනයේ ආවේක්ෂණ අංශයේ ප්‍රධානීයා ලෙස ඔබ දන්නවාද මේ සහරාන් පිළිබඳව තොරතුරු

FAIR COMMENT — BY JEZEEM —

ගොඩක් ඔබවත් දැනුවත් වෙලා තියෙනවද සහරාන්ගේ කටයුතු ගැන?

පි : ඔව් සහරාන් මම දන්නවා NTJ එකේ නායකයා එහෙම අර අලියාර් ගැටුම ඒ කියන්නේ අපි මම දන්නේ ඒ අදාළ නිලධාරීන් ඒ සම්බන්ධව ඇවිල්ලා දැනුවත් කිරීම් වැඩ සටහන් වලදී දැනුවත් කරලා තියෙනවා. අධ්‍යක්ෂකතුමාත් දැනුවත් කරලා තියෙනවා උපදෙස් පංතිවලදී.

සාක්ෂිකරුට C 4 (C) ලේඛනය පෙන්වයි.

ප : දැන් රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධාන කාර්යාලයේ ආවේක්ෂණ රාජකාරී අංශයේ ප්‍රධානියා ලෙස ඔබ ඔය C 4 (C) කියන ලේඛනය කියවන්න. කියවලා කියන්න බලන්න ඔබ ඔය තොරතුරු දන්නවද කියලා ආවේක්ෂණ අංශයේ ප්‍රධානියා ලෙස?

පි : නෑ ස්වාමිනි.

ප : ඔබ කවදාවත් මෙම තොරතුරු දැකලා නැනේ?

පි : නෑ මේ වගේ ලිඛිත තොරතුරක් මං දැකලා නෑ.

ප : දැන් ඔය අර ඉස්ලාම් අන්තවාදය කියන අංශයක් තියෙනවනේ ඔය රාජ්‍ය බුද්ධි සේවාවේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ අංශයේ ප්‍රධානියා ඔබගේ සමාන මට්ටමේ කෙනෙක්ද නියෝජ්‍ය අධ්‍යක්ෂක වගේ කෙනෙක්ද?

පි : නෑ තනතුරෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් තමයි නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා වෙන්නේ.

ප : ඔබ ඉන්නේ මොන තනතුරේද?

පි : ප්‍රධාන පොලිස් පරීක්ෂක ධුරයේ.

ප : සහකාර අධ්‍යක්ෂකද එතකොට?

පි : නෑ.

ප : එහෙම නෑ?

පි : නෑ සහකාර අධ්‍යක්ෂක වෙන්නේ සහකාර පොලිස් අධිකාරි තනතුර දරණ.

ප : එතකොට දැන් ඔය රැස්වීම්වලට දැන් ඔබ ඔය අංශයේ ප්‍රධානියා නේද ඔය ආවේක්ෂණ අංශයේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප : එතකොට ඉස්ලාම් ආගමික අන්තවාදී අංශයේ රැස්වීම් පවත්වන කොට ඔය මේ ආයතනයේ ප්‍රධානියා විසින් ඔබ ඒ රැස්වීම්වලට කැඳවන්නේ නැද්ද?

පි : එක දවසක් ගිහිල්ලා තියෙනවා ස්වාමිනි.

ප : මොකද ඔබ නේද දැන් ඔය ආවේක්ෂණය කරන අයව පුහුණු කරන්නෙත් ඔබ නේද?

FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔය ආයතනය තුළ දෙන පුහුණුවලදී ආවේක්ෂණය කරන්න ඕන නිලධාරීන්ට පුහුණුව දෙන්නෙත් ඔබ නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබට ඒ පුහුණුවේදී වැදගත් වෙන්නේ නැද්ද ආවේක්ෂණය කරන්නට අපේක්ෂා කරන ප්‍රදේශ ගැන ඔවුන්ව දැනුවත් කිරීම අවශ්‍ය නැද්ද?

පි : වැදගත් වෙනවා ස්වාමිනි.

ප්‍ර : ඒක තමයි දැන් මම ඔබට මේ බලන්න කියපු C 4 (C) ලේඛනය තොරතුරු ඔබට කියලා තිබෙනවා නම් සහ ඔබ අප්‍රේල් 21 ප්‍රහාරය පිළිබඳව 04 වෙනිදා ලැබුණ තොරතුර ඔබ ආවේක්ෂණ අංශයේ ප්‍රධානියා ලෙස ඔබට දැනුම් දීලා තිබුණා නම් ඔබ යවනවද ඔබගේ ප්‍රධාන කාර්යාලය ආවේක්ෂණ කණ්ඩායමක් නැගෙනහිර පළාතට ඔය පිළිබඳව තොරතුරු හොයන්න කියලා?

පි : අධ්‍යක්ෂකතුමා එහෙම යවන්න කිව්වොත් යවනවා ස්වාමිනි. නැත්නම් අපි සමස්තයක් හැටියට අපි මෙච්චරකල් කළේ අපි කොළඹ ප්‍රදේශයේ තමයි ආවරණය කළේ. ඉතින් එහෙම විශේෂම ඉල්ලීමක් කළා නම් එහෙනම් උපදෙස් දෙනවා කණ්ඩායමක් යවන්න කියලා. එහෙම යවලා බුද්ධි තොරතුරු රැස් කළා අපි මේ මාවනැල්ල ප්‍රදේශයේ එහෙම.

ප්‍ර : ඒ අධ්‍යක්ෂක කියන්නේ නැතුව ඔබට යෝජනා කරලා ඔබ එහෙම අනුමැතියක් ගන්න බැරිද ඔය ආයතනය තුළ දැන් ඔබට අධ්‍යක්ෂක කියන්නේ නැතුව ?

පි : නෑ පුළුවන් ස්වාමිනි එහෙනම් මට කියන්න ඕනි ඉස්සෙල්ලා මාව දැනුවත් කළොත් තමයි මට කියන්න වෙන්නේ මෙහෙම එකක් කරන්න කියලා ඉතින් ඒක මට දැනුවත් කරන්න ඕන.

ප්‍ර : දැනුවත් වුණේ නැති නිසා තමයි ප්‍රශ්නේ තියෙන්නේ?

පි : ඔව්. නමුත් අපි එහෙම විශේෂයෙන්ම ඉල්ලලා දීපු අවස්ථාවලදී අපි නිලධාරීන් යවලා ඒ ප්‍රදේශයේ ආශ්‍රිතව දැනුම තියෙන නිලධාරීන් යවලා ඒ තොරතුරු එක් රැස් කරලා තියෙනවා.

ප්‍ර : දැන් ඔය රාජ්‍ය බුද්ධි සේවාව කියන ආයතනයේ ආවේක්ෂණ කාර්යභාරය කොයි තරම් වැදගත් රාජකාරියක්ද ඔය ආයතනයේ කාර්යභාරයන් වල වැදගත්කම් අනුව පෙළගැස්සුවොත්?

පි : ඔව්.

ප්‍ර : ආවේක්ෂණය කියන කාර්යභාරයට කොයි තරම් වැදගත්කමක් දිය යුතුද කියලා කියන්න ඔබට පුළුවන්ද?

පි : අපේ අංශය ස්වාමිනි ඉතාමත්ම වැදගත් අංශයක්. මොකද හේතුව මේක මුස්ලිම් අන්තවාදීන් ගැන විතරක් නෙවෙයි සංවිධානාත්මක

FAIR COMMENT BY JEZEEM

අපරාධද ඒ විදේශ වලින් ඇවිල්ලා මෙහේ ක්‍රියාකරන කණ්ඩායම් පිළිබඳ ඒ පිළිබඳ සෑහේන හොයනවා.

ප්‍ර : වෙනත් අන්තවාදීන් ගැන ඕගොල්ලොන්ගේ අංශයෙන් බැලුවද ඒ කියන්නේ ඉස්ලාම් ආගමික අන්තවාදය විතරක් නෙවෙයි වෙනත් සිංහල?

පි : නෑ එහෙම ඉල්ලීමක් කළේ නෑ ස්වාමිනි මගේ සේවා කාලය තුළදී එහෙම ඉල්ලීමක් කළේ නෑ.

ප්‍ර : එතකොට දැන් ඔබ කොමසාරිස්තුමාගේ ප්‍රශ්නෙකටත් පිළිතුරක් දුන්නා නමුත් මමත් කැමැති අහන්න ඔය තරම් වැදගත් අංශයකට ඔය 24 ක කාර්ය මණ්ඩලයක් ඇතිද?

පි : දැන් ඉන්නවා ස්වාමිනි 53 ක්.

ප්‍ර : ඒ කියන්නේ ප්‍රහාරයෙන් පස්සේ වැඩි කළාද?

පි : ඔව් වැඩි කළා දැන් ඉඳලා අපේ ඒකකත් ස්ථාපිත කර ගෙන යනවා දිවයිනේ වෙනත් ප්‍රදේශවල.

ප්‍ර : දැන් ඔබ ගිහිල්ලා තියෙනවා නේද විදේශ පුහුණුවලට ඔය?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට තියෙනවද දැනුමක් දැන් වෙනත් රටවල්වල කොහොමද ඔය ආවේක්ෂණ අංශයක තියෙන ශක්තිය මොකක්ද කියන එක පිළිබඳව බුද්ධි සේවාවක ආවේක්ෂණ අංශයක තියෙන ඔබ කිව්වා තාක්ෂණික කතාන්දරයක් සහ ඒවා වල තියෙන ශක්තිය කොහොමද තියෙන්නේ අපේ රට ඉන්නේ කොහේද කියලා දැන ගන්න තමයි මම ඔබගෙන් මේ ප්‍රශ්නය අහන්නේ?

පි : මං හිතන්නේ ඒ නම් ඒ ශක්තිය ටිකක් ඒගොල්ලන්ට හුඟක් equipment ඒ සම්බන්ධ තියෙන නිසා.

ප්‍ර : ඒ කියන්නේ ලංකාවේ රාජ්‍ය බුද්ධි සේවාවට නැහැ එහෙම පහසුකම්?

පි : ඔව් සම්පත් තියෙනවා නමුත් අපි තවත් ඉතින් අනාගතයේ වර්තමාන තියෙන අභියෝගත් එක්ක සහ ඒ කට්ටිය ක්‍රියාකාරකම් අනුව තවත් අපි වැඩි දියුණු කර ගත්තොත් හොඳයි.

ප්‍ර : හොඳයි බොහොම ස්තූතියි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරිය ලබා දෙමි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබගේ සාක්ෂියේදී ඔබ කිව්වා නිශ්චිත ස්ථානයක් හැටියට තිබ්බේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය පමණයි කියලා ඔබ එහෙම පැවසුවා නේද?

පි : ඔව් එහෙමයි ස්වාමිනි.

සාක්ෂිකරුට X 439 පෙන්වයි X 439 (B) (1) සහ (2)

ප්‍ර : ඒ අදාළ අංශ භාර නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා විසින් කොළඹ ප්‍රදේශයේ කතෝලික පල්ලි පිහිටි ස්ථාන කිහිපයක සිතියමක් තමයි ඔබ බලන්නේ. ඔබට මේ සිතියම නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමා ඔබට පෙන්නුවාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඒ සිතියමේ ඔබට පේනවා saint Anthony's කියලා Mark කරලා තියෙනවා Number 4?

පි : ඔව් එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහෙම Mark කරලා තියෙනවා Methodist Church කියලත් Mark කරලා තියෙනවා?

පි : ඔව් ඊට ඉදිරිපිට ඒක ස්වාමිනි.

ප්‍ර : Indian High Commission එකක් Mark කරලා තියෙනවා?

පි : වම් පැත්තේ ඒක.

ප්‍ර : Next page X 439 (B) (3) එකේත් සිතියම් තියෙන්නේ. Churches in Gallface aria and Indian High Commission කියලා Printed map එකක්?

පි : ඔව් එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඊළඟ පිටුව X 439 (B) (4) Churches in Bambalapitiya?

පි : එහෙමයි.

ප්‍ර : Churches in Thimbirigasyaya

පි : Thimbirigasyaya.

ප්‍ර : X 439 (B) (5) next page Churches in Borella and Punchi Borella මේ එක සිතියමක්වත් ඔබට පෙන්නුවේ නැහැ?

පි : නැහැ.

ප්‍ර : නැහැ?

පි : නැහැ ස්වාමිනි.

ප්‍ර : මේවාට අදාළව ආවේක්ෂණ කටයුතු කරන්න කියලවත් ඔබට නියෝගයක් දුන්නේ නැහැ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නෑ එහෙම නිශ්චිත ස්ථානයක් ගැන සඳහනක් කළේ නෑ ඉන්දියන් මහ කොමසාරිස් කාර්යාලය ඇරෙන්න. නමුත් 21 වෙනිදා උදේ කිව්වා මෙතෝදිස්ත පල්ලිවලට තමයි ප්‍රහාර එල්ල කරන්නේ.

ප්‍ර : ඔබගේ සාක්ෂියේදී ඔබ කිව්වා මොන ස්ථානයටද ඔබ විසින් යොමු කරපු නිලධාරීන් යැව්වේ කියන ප්‍රශ්නයට ඔබ කිව්වා කොල්ලුපිටිය, බම්බලපිටිය, වැල්ලවත්ත, රාජගිරිය, මෝදර, කොච්චිකඩේ මට්ටක්කුලිය ආදී ප්‍රදේශවල්වලට කියලා. මීගමුව ප්‍රදේශයට යවන්න කියලවත් ඔබ යැව්වේවත් නැද්ද?

පි : යවන්න මේ යවන්න ප්‍රමාණවතුත් නැහැ යැව්වෙත් නෑ.

ප්‍ර : ඔබට ඒක මනසට ආවාද මීගමුව ප්‍රදේශයටත් යවන්න වුවමනාවක් තිබෙනවා කියලා නැත්නම්?

පි : නෑ වැදගත් දේවස්ථාන කියලා කිව්වාම ස්වාමිනි සඳහන් වුණා දැන් වැඩිපුර කතෝලික ජනතාව වාසය කරන ප්‍රදේශ කියන අවබෝධය.

ප්‍ර : ඔබ විසින් යොමු කරන ලද නිලධාරීන් ඔබට වාර්තා කළා 20 වෙනිදා රෑ රාත්‍රියේදී ආවේක්ෂණ කටයුතු ඉවර වුණාම. ඒගොල්ලන් වාර්තා කිරීමේදී කිව්වා සැක කටයුතු කිසිම දෙයක් පෙනුනේ නැහැ කියලා?

පි : ඔව් නිරීක්ෂණය වුණේ නෑ.

ප්‍ර : නිරීක්ෂණය වුණේ නෑ. ඔබ ඒ දේ නියෝජ්‍ය අධ්‍යක්ෂකතුමාට කිව්වද?

පි : මට කිව්වේ මොනවා හරි development එකක් තියෙනවා නම් කියන්න කියලා.

ප්‍ර : ok.

පි : ඉතින් මං කිව්වා තියෙනවා නම් කියන්න කියලා.

ප්‍ර : සෙනඟ ගොඩක් ඒ දේවස්ථානවලට පැමිණෙනවා කියන දේත් ඒකවත් කිව්වේ නැද්ද?

පි : මං හිතන්නේ මට මතක විදිහට මං සහකාර අධ්‍යක්ෂකවරයාට පැවසුවා මෙහෙම එනවා කියලා මොකද අරගොල්ලන්ගෙන් ගත්තු ඒවා. මොකද එදා රාත්‍රියේ දේව මෙහෙයන් තිබ්බා ස්වාමිනි.

ප්‍ර : ඒ දේ ඔබ පැවසුවායින් පස්සේ වැඩිපුර යම් කිසි දෙයක් මොනවා හරි කිව්වද සෙනඟ ගොඩක් එනවා කියලා ඔබ කිව්වයින් පස්සේ?

පි : මට මතක විදිහට කිව්වේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබ කිව්වා 21 වෙනිදා උදෑසන ඔබගේ නිලධාරීන්ව ස්ථාන මාරු කරන්නට අවශ්‍ය වුණා. මොකද ඔබට වැඩිදුර තොරතුරක් ලැබුණා. මෙතෝදිස්ත පල්ලි තමයි target එක කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට දැන් කියන්න පුළුවන්ද ඒ ලැබුණ තොරතුර diversion එකක් වෙන්න තිබුණා කියලා. මෙතෝදිස්ත පල්ලි ඇත්තටම attack එකට target එකක් වුණේ නැහැ Version attack ?

පි : ස්වාමිනි මම මේ තොරතුරු ලබා දුන්න පාර්ශවයත් සමඟ කිසිම ගනුදෙනුවක් කළේ නෑ ස්වාමිනි. ඒ නිසා මට ඒ සම්බන්ධයෙන් විශ්ලේෂණයක් කරන්නත් බැහැ. මම මගේ ඉහළ නිලධාරියා ලබා දුන්නු උපදේශය තමයි මං ක්‍රියාත්මක කළේ ස්වාමිනි.

ප්‍ර : මං කොහෙත්ම suggest කරන්නේ නැහැ ඔබගේ ඉහළ නිලධාරියා ඔබව Divert කළා කියලා. මම අහන්නේ ඔබගේ Experience එක්ක මෙහෙම ප්‍රහාරයක් වෙන්න තියෙද්දී එදා උදෑසන වෙන ස්ථානයකට මාරු වුණ සිද්ධිය සම්බන්ධයෙන් ඒක diversion එකක් වෙන්න පුවළුන්ද Based on your experience?

පි : ඒකට මං ප්‍රකාශයක් දීමෙන් වැළකි සිටිනවා ස්වාමිනි ඒක ගැන මට.

ප්‍ර : අවසාන ප්‍රශ්නය ඔබගේ ආවේක්ෂණ කටයුතුවල කවදා හරි දවසක් ආරක්ෂිත නිවාස safe houses ආවේක්ෂණය කරන්න කියලා ඔබට නියෝගයක් ලැබිලා තියෙනවද ඔබ ආවේක්ෂණ කටයුතු කරලා තියෙනවද?

පි : safe houses කියලා අදහස් කළේ කුමක්ද ස්වාමිනි මට ඒක දැන ගන්න පුළුවන්ද.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ආරක්ෂිත නිවාස මේ ඒ කියන්නේ ප්‍රහාරකයන් විසින් මේ

පි : ලැඟුම්ගෙන සිටි

ප්‍ර : ලැඟුම් ගැනීම සඳහා?

පි : නෑ ස්වාමිනි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරිය සිය අනෙකුත් අධිකරණ කටයුතු නිම කර කොමිෂන් සභාව තුළට පැමිණියේ පස්වරු 12.00 පසු වී විනාඩි 25 ට බව සටහන් කරමි. සාක්ෂිකරු විසින් දෙන ලද සාක්ෂියේ පටිගත කිරීම උගත් නීතිඥවරියට ඇසීමට සලස්වන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරනවා. එසේ ඇසීමෙන් පසු සවන් දීමෙන් පසු මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවශ්‍ය බව ඇය විසින් සේවාදායකගෙන් උපදෙස් ලබා ගෙන කොමිෂන් සභාවට

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

දැන්නුවොත් ඒ කාර්ය සඳහා පමණක් පසු දිනකදී ඇයට අවස්ථාව ලබා දෙන බව කොමිෂන් සභාව සටහන් කර තබනවා.

උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයා තවත් ප්‍රශ්නයක් ඇසීමට අවසර ඉල්ලයි. අවසර ලබා දෙමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : පානදුර ආරක්ෂිත නිවාසය සොයා ගත්තේ කවුද?

පි : ඒක සොයා ගත්තේ මං හිතන්නේ පොලිස් නිලධාරීන්.

ප්‍ර : පොලිස් නිලධාරීන්?

පි : ඔව්.

ප්‍ර : ඔබලා විසින් නෙවෙයි?

පි : නෑ මම ඒක ගැන ස්වාමිනි මම හරියටම කියන්න දන්නේ නෑ නමුත් එතන පොලිස් නිලධාරීන් ගිහින් ඉන්නවා කියන එක තමයි මට පණිවිඩේ දැන ගන්න ලැබුණේ.

ප්‍ර : ඔබ කොළඹ ප්‍රදේශයේ වෙනත් හෝ ආරක්ෂිත නිවාසයන් හෝ නිවාසයක් සොයා ගැනීමට ඔබලාට හැකි වුණාද?

පි : මගේ අංශයට ලැබුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබේ අංශයට ලැබුණේ නෑ?

පි : ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරු කොමිෂන් සභාවට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධයෙන් දැක්වූ සහයෝගයට කොමිෂන් සභාවේ ස්තූතිය සාක්ෂිකරුට පිරිනමනවා.

එසේම අවශ්‍ය වුනොත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් ප්‍රශ්න ඇසීම සඳහා පමණක් නැවත කැඳවන බව සාක්ෂිකරුට දන්වනවා.

අද දින සාක්ෂිකරු මුදා හරිනවා.

කොමිෂන් සභාවේ කටයුතු දිවා ආහාරය සඳහා පස්වරු 01.00 තෙක් කල් තබනවා.

දැන් වේලාව : ප.ව.12.30 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන් තබන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020. 10.22 වේලාව :- ප.ව. 12.30

(සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි)

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, රජයේ අධි නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතීඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් කෞෂි සෙල්වනාගම් මෙනවිය ,සමඟ ජනාධිපති නීතීඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා වෙනුවෙන් නීතිඥ මධු ජයතිලක මහත්මිය

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී කොමිෂන් සභා පනතේ 2008 අංක 16 දරණ සංශෝධන පනතේ 26 වගන්තිය ප්‍රකාරව නීතිපතිතුමා වෙනුවෙන් උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල් සරත් ජයමාන්න මහතා කොමිෂන් සභාව ඇමතීමට අවසර ඉල්ලයි. අවසර ලබා දෙමි.

****

<u>උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>

ගරු සභාපතිතුමනි, ගරු කොමසාරිතුමනි, කොමසාරිස්තුමියනි, බොහෝම ස්තූතියි මට නීතිපතිතුමා වෙනුවෙන් එතුමා වෙනුවෙන් මෙම පනතේ 26 වන වගන්තිය ප්‍රකාරව සැලකිරීමක් කිරීමට අද අවස්ථාව ලබා දීම ගැන. මම මේ අවස්ථාව නීතිපතුමාගේ උපදෙස් පිට යෙදා ගනු ලබන්නේ වැදගත් නීතිමය සහ සිද්ධිමය කාරණයක් සම්බන්ධයෙන්. විශේෂයෙන්ම අද දිනයේ සහ මින් ඉදිරියට මට දැන ගන්න ලැබෙනවා මේ වනතෙක් සැකකරුවන් ලෙස හෝ සැකකාරියන් ලෙස විමර්ශකයන් විසින් අත්අඩංගුවේ තබා ගෙන සිටි යම් සැකකරුවන් ඔබ ගරුතුමන්ලාගේ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිකරුවන් ලෙස කැඳවීමට යම් සුදානමක් තිබෙන විත්තිය ගරු නීතිපතිතුමාට දැන ගන්නට ලැබී තිබෙනවා. ඉතින් ගරු නීතිපතිතුමා වෙනුවෙන් ඔබතුමාලා ඉදිරියේ මා කරන දේශනයේ මුඛ්‍ය පරමාර්ථය මුලින්ම කෙටියෙන් සඳහන් කරනවා නම් සියලුම නීතිමය සහ අනෙකුත් කාරණා සලකා බලන විට සාක්ෂිකරුවන් ලෙස හෝ වෙනත් ආකාරයකින් මෙම සැකකරුවන් කැඳවීම අනාගතයේ දවසක නීතිපතිතුමා වෙතට විතරක්ම පැවරෙන නඩු පැවරීමේ බලයත් පැමිණිල්ල මෙහෙයවීමේ බලයටත් ප්‍රබල අගතියක් සිද්ධ වෙනවා. ඒ නිසා මගේ අවසාන ඉල්ලීම වන්නේ ඒ ඉල්ලීම ප්‍රකාරව මේ ආකාරයෙන් විමර්ශකයන් භාරයේ පොලිසිය භාරයේ රඳවා නියෝග ගැනීම මත රඳවා සිටින යම් යම් සැකකරුවන් මේ කොමිෂන් සභාව ඉදිරියේ දී සාක්ෂිය සඳහා කවර ආකාරයෙන් හෝ කැඳ නොවන ලෙස. ගරු සභාපතිතුමනි ඔබතුමන්ලාගේ කොමිෂමට ජීවය දෙන්න ලැබෙන්නේ කොමිෂන් සභාව පනත යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරන ලද අධිකාරි බලපත්‍රය මත. ඒ අධිකාරි බලපත්‍රයේ පැහැදිලිව සඳහන් වෙනවා May I read that particular portion in English, to be my Commissioners to Investigate and Inquire in to take necessary action, to enable future legal action. ඔබතුමන්ලා මොන කර්තව්‍යය ගෞරවාන්විත කර්තව්‍යය මේ කොමිෂන් සභාවේ පියස යට සිද්ධ කලත් අවසාන පරමාර්ථය සිද්ධවෙන්නේ නඩු කටයුතු අනාගතයේදී පැවරීම. ඒ වගේම එම අධිකාරි පත්‍රයේ 11 වන ඡේදයේ තවදුරටත් සඳහන් වෙනවා ඔබතුමන්ලා විසින් එකතු

FAIR COMMENT BY JEZEEM

කරනු ලබන සාක්ෂි.May I read that "To transmit the Attorney General such material on Investigation and Inquiry enabling the Attorney General to consider the Institution of Criminal Proceedings against persons alleged to have committed such offences."

ඒ මේ ඔක්කෝම මුකාෘ පරමාර්ථය අවසානයේදී ඔබතුමන්ලා බෙහෝම අමාරුවෙන් එකතු කර ගන්නා සාක්ෂි හරියට එක පක්ෂියෙක් බොහෝම අමාරුවෙන් රත්‍රන් බිත්තර එකතු කර ගන්නා වගේ සියුම් ලෙස එකතුකරගන්නා මෙම සාක්ෂිය නීතිපතිතුමා තමන්ගේ දක්ෂතාවය සහ තමන්ගේ වෘත්තිමයභාවය සලකලා අධිකරණයක් ඉදිරියේ නඩු මෙහෙයවන්න කරන තීරණයක්. ඊට අමතරව අපරාධ නඩු විධාන සංග්‍රහයේ ප්‍රකාර නීතිපතිතුමාට විතරයි මේ ලංකාවේ අධිකරණයක් ඉදිරියේ විශේෂයෙන් මහාධිකරණයක් ඉදිරියේ නඩු පැවරීමේ බලය තිබෙන්නේ අපරාධ නඩු විධාන සංග්‍රයේ 393 (7) වන වගන්තිය ප්‍රකාර. ඒ වගේම අපරාධ නඩු විධාන සංග්‍රහයේ 12 වන වගන්තිය ප්‍රකාර නීතිපතිතුමාගේ අවසරය නැතිව මහාධිකරණයේ කිසිම නඩු පැවරීමක් කරන්න බැහැ. ඒ නිසා මේ සිද්ධිය කොච්චර බරපතළ වුණත් ඔබතුමන්ලා කෙතරම් දිවා රෑ මහන්සි වෙලා ඔබතුමන්ලා මේ ගෞරවනීය සේවය කලත් අවසාන පරමාර්ථය මොකක්ද නීතිපතිතුමා නඩු පවරන එක. ඒ නිසා නීතිපතිතුමා නඩු පවරන්නේ කවුරු කාරණා මතද මේ වන විටත් ගරු සභාපතිතුමනි අපාරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් යම් යම් විමර්ශන කරලා තියෙනවා. ඒ විමර්ශන කරන අතරතුරවාරයේදී ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ 7 වන වගන්තිය යටතේ යම් යම් පුද්ගලයන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන තියෙනවා. ඒ පුද්ගලයෝ කවදා හරි දවසක සැකකාරයෝ වෙලා මහාධිකරණයක් ඉදිරියේ නඩු පැවරුවහොත් අනිවාර්යය වශයෙන් පැමිණිල්ලට තියෙන අභියෝගය තමයි මෙන්න මේ ප්‍රකාශ ස්වේච්ඡාවෙන් ලබා ගත්ත බවට ඔප්පු කිරීමේ වගකීම. ඒක එක. ඒ වගේම යම් යම් අවස්ථාවලදි මොවුන් විශේෂයෙන්ම ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතේ රැඳවීම් නියෝග යටතේ සිටින කාලය අතරතුරේදී ගරු මහේස්ත්‍රාත්තුමා විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ පුද්ගලයන්ගෙන් ප්‍රකාශ ලියලා තියෙනවා. එතකොට මේ වන විට මේ රටේ අධිකරණ ක්‍රියාදාමය මේකට සම්බන්ධ වෙලා තියෙනවා. ඒ වගේම මේ අධිකරණ ක්‍රියාදාමය සම්බන්ධ වෙලා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වන වගන්තිය යටතේ යම් යම් ආකාරයකින් විමර්ශනවලට සහාය දැක්වීමකුත් කරනවා. ඒ වගේම අද දිනයේ සිට යම් යම් සැකකරුවන් රක්ෂිත බන්ධනාගාරගත වෙනවා. ඒ අවස්ථාවේදී අනිවාර්යය වශයෙන්ම බලය ලැබෙනවා මහේස්ත්‍රාත් අධිකරණයට මේ අධිකරණ කටයුතුවලට සහයෝගය දක්වන්න. ඒ නිසා දැනටමත් විර්ශන කටයුතු සිද්ධ වෙලා අධිකරණය මේ සම්බන්ධයෙන් සම්බන්ධ වෙලා අවසානයේදී සිද්ධ වෙනවා මොවුන්ට විරුද්ධව නීතිපතිතුමා විතරයි සැල කර බලන්නේ. ඉතාමත්ම ගෞරවයෙන් කියන්නේ ඔබතුමන්ලා කවර නිර්දේශය කරත් ඉතාමත්

FAIR COMMENT BY JEZEEM

ගෞරවයෙන් කියන්නේ ඔබතුමන්ලා කවර නිර්දේශය කරත් ඒ නයින්ම ස්වායක්තව නඩු පැවරෙන්නේ නැහැ. ඒ නඩු පැවරීමේ තනි සහ අනන්‍ය බලය නීතිපතිතුමා සතු විතරක් තියෙනවා. මේක නීතිපතිතුමාගේ බලයවත් ඔබතුමන්ලාගේ බලය පිළිබඳ ප්‍රශ්නයක් නෙමේ. මට කිසිම බලය පිළිබඳ ප්‍රශ්නයක් නෑ. අපි මේ ආයතන දෙකම ඉතාමත්ම සුභද ව හා සමාන්තරව අපේ අවසාන ඉලක්කය මොකක්ද අපේ අවසාන ඉලක්කය විශේෂයෙන් එදා අප්‍රේල් මාසේ 21 වෙනිදා වෙච්ච ඒ ප්‍රහාරය ඇතුලු ඊට සම්බන්ධ අනෙකුත් සිද්ධින් සමුදායක් තියෙනවා නම් ඒ කුමන්ත්‍රණයේ සුල මුල හොයගෙන නඩු පවරන එක. ඒ නඩු පවරන්න වෙන්නේ සාක්ෂි ආඥා පනතට අනුව. ඒ විතරක් නෙමේ ඒ නඩු පවරද්දි නීතිපතිතුමාට සිද්ධ වෙන්නේ සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කරන්න. ඔබතුමන්ලාට කිසිසේත්ම භාරයක් නැහැ සාධාරණ සැකයෙන් ඔබ්බට තමන් ඔබතුමන්ලාගේ ගෞරවණීය නිර්දේශ කරන්න. ඔබතුමන්ලාට තිබෙන්නේ කවුරුහරි හදුනා ගන්නවානම් මේ අපරාධයට සම්බන්ධයි කියලා ඒ සම්බන්ධව නිර්දේශයක් කරන එක පමණයි. ඒ නිසා නීතිපතිතුමාට තියෙන්නේ එතුමාගේ දෙව්ර මත තියෙන්නේ මහා වගකීමක්. හරියට ස්නායු ශල්‍ය වෛද්‍යවරයෙක් මොකක් හරි සැත්කමක් කරන කොට වැරදිලාවත් එක ස්නායුවක් බේරන්න ගිහිල්ලා තව ස්නායුවක් කැපුනොත් එහෙම ඒ ලේඩාගෙන් වැඩක් වෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා කන්දක් විදදරා මොනවාහරි කරලා යම් අත් වැරැද්දක් මේ ක්‍රියාමාර්ගය තුළ සිද්ධ වුණොත් අවාසන හානිය වෙන්නේ මේ රටේ යුක්තිය සාධාරණත්වය අපේක්ෂාවෙන් සිටින සමස්ථ සමාජයට. සමස්ථ සමාජයේ කැඩපත තමයි නීතිපතිතුමා කියන්නේ. ඒක නිසා මේක කිසිසේත් ම නීතිපතිතුමාගේ බලය පෙන්වන අවස්ථාවක් නෙමේ. මා ගෞරවයෙන් කියන්නේ ඔබතුමන්ලා ඉතාමත්ම ගෞරවනිය රාජකාරියක් මේ අවස්ථාව වන විටත් කරලා තියෙනවා ඒවා ගැන අපි කිසිම බාධාවක් නැහැ. ඒ නිසා තමයි නීතිපතිතුමා වෙනුවෙන් ඔබතුමන්ලාගේ කොමිෂන් සභාවට සහය දෙන්න නිලධාරීන් කණ්ඩායමකුත් පත්කරලා තියෙන්නේ. මගේ ඉල්ලීම දැනටමත් සැකකරුවන් ලෙස හඳුනාගෙන තිබෙන අය සාක්ෂිකරුවන් ලෙසට කැඳවීම මූලික වශයෙන්ම මූලික සිද්ධාන්තය බිඳ දැමීමක්. කවර ආකාරයකින් ද ඔබතුමන්ලා තීරණය ගත්තේ මොවුන් සාක්ෂිකරුවන් හැටියට කැඳවන්න. මොවුන්ට විරුද්ධව ඔබතුමන්ලා ඉදිරියේ අමුද්‍රව්‍ය තිබුණා මදීද ඔවුන්ට විරුද්ධව 16 වන වගන්තිය යටතේ සැකකරුවන් ලෙස සලකන්න. ඔවුන්ට සාක්ෂිකරුවන් ලෙස මෙතෙන්ට කැදෙව්වාට පස්සේ ඔවුන්ට හම්බෙනවා හොඳ වේදිකාවක්. මොකක්ද හම්බෙන වේදිකාව හොඳ තෝතැන්න මොකක්ද අනාගතයේ දවසක මේ නඩු විභාගයක් ගියොත් එහෙම ඒ නඩු විභාගයේදී ඒ පැමිණිල්ලේ නඩුව කෙරෙහි සාධාරණ සැකයක් ඇති කරන්න පුළුවන් ඒ සාක්ෂි සලිත කරන්න පුළුවන් වේදිකාවක් ඔබතුමන්ලා නොදැනුවත්වම සමහර විටක සලස්වා දෙනවා වෙන්න පුළුවන්. මම අපරාධ නඩු ගැන මේ රටේ ගොඩාක් නඩු කරලා තියෙන එක්කෙනෙක්. නීතිපතිතුමාගේ මතය මොකක් වුණත් නැතත්

FAIR COMMENT
BY JEZEEM

මම දන්නවා පැමිණිල්ලක් මෙහෙය වන්න යද්දි මගේ ඔලුවේ කැකෑරෙන ප්‍රශ්න ගණනාවක්. මොකද එකම සාක්ෂිකාරයා විවිධ අවස්ථාවලදී විවිධ තැන්වලදී දාහක් දේවල් කියලා තිබුණා සාක්ෂිකරුවෙක් හැටියට ප්‍රශ්න ගණනාවක් මතුවෙනවා පැමිණිල්ලට. ඒ වගේම උසාවියේ මහාධිකරණයේ ඉන්න සැකකරු ඔහු විසින් මහේස්ත්‍රාත්තුමාට හරි වෙනත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීයෙක්ට පාපොච්චාරණයක් කරලා තියෙනවානම් ඒකේ ස්වේච්ඡා භාවය පිළිබඳව අධිකරණයේ පරීක්ෂණයක් කරද්දි Vior dire inquiry එකක් කරද්දි ඒකට අවශ්‍ය අමුද්‍රව්‍ය මේ කොමිෂන් සභාවට ඇවිල්ලා ප්‍රසිද්ධ වේදිකාවක් හදලා හදා ගන්න පුළුවන්. එතකොට ඔවුන්ට කියන්න පුළුවන් මහාධිකරණය ඉදිරියේදී අප්‍රමාදිත්‍ය පරීක්ෂණය දාද්දි මම මෙහේ විතරක් නෙමේ කොමිෂන් සභාව ඉදිරියේදීත් කිව්වා මගෙන් ස්වෙච්ඡාවෙන් නෙමේ අදාල නිලධාරීන් මගේ ප්‍රකාශ සටහන් කරේ. මේවා ගැන මම කියන්නේ අපි ඉතාමත්ම සංවේදී වෙන්න ඕනේ. ඔබතුමන්ලාට බලය ගැන ප්‍රශ්නයක් නෙමේ කිසිසේත්ම ඔබතුමන්ලාගේ අඩුපාඩුවක් කවුරුත් දකින්නේ නැහැ. මෙන්න මේ මං කිව්ව නීතිමය කාරණා ඔබතුමන්ලා සඳහන් කරලා ඒක සාධාරණීකරණය කරනවානම් නීතිය පිළිබඳ අල්ප මාත්‍රයක්වත් දන්නේ නැති බාහිර අය කිසිසේත්ම ඔබතුමන්ලාට දෝෂාරෝපණයක් එල්ල කරන එකක් නෑ මේ සාක්ෂිකරුවන් මේ සැකරුවන් කැදෙව්වේ නැහැයි කියලා මොකද මේක නීතිමය කර්තව්‍යයක්. ඇත්ත මේ රටේ ජනතාවට දැන ගන්න අයිතියක් තියෙනවා ඇත්ත මේ රටේ මාධ්‍යයට දැන ගන්න අයිතියක් තියෙනවා ඒ මොන කොහොම අයිතියක් තිබුණත් අවසානයේදී අපිට මහාධිකරණයේ සාර්ථක ලෙස නඩුවක් මෙහෙයවන්න පුළුවන්නම් මේ ඔක්කෝම සුන්නත් දූවිලි වෙලා යන අපරාධ යුක්ති ක්‍රමයේ වැඩක් නැති බවට වැඩක් බවට පත්වෙලා යනවා. ඒ නිසා ගෞරවයෙන් සඳහන් කරන්නේ මෙන්න මේ පුද්ගලයෝ මේ අවස්ථාවේදී කැඳවන්න එපා. අනෙක් කාරණය ගරු ස්වාමිනි මේ සමහර පුද්ගලයන්ට විරුද්ධව දැනටමත් මහාධිකරණවල නඩු පවරලා තියෙනවා. ඒ නඩු පවරලා තියෙන්නේත් විශේෂයෙන්ම ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ සඳහන් කරන ලද යම් පාපොච්චාරණ මත රැඳී එතකොට යම් යම් පුද්ගලයෝ ඒ මහාධිකරණය ඉදිරියේ විත්තිවාචකය ගන්න බලාපොරොත්තු වෙනවා නම් ස්වේච්ඡාභාවය පිළිබඳව ඔවුන්ට මෙතනදී හොඳ තෝතැන්නක් හම්බෙනවා සැකකරුවන් හැටියට වෙන නඩුවල නැති සැකකරුවන්ට නැති ඉතාමත්ම අසාධාරණ අවස්ථාවක් ඔවුන්ට ලැබෙනවා මේ වේදිකාවක් හැදුවොත් එහෙම ඔවුන්ගේ නඩු විභාගය සුනුවිසුනු කරන්න. අනිත් එක මේ නඩුව ගරු ස්වාමිනි නිකම්ම හුදකලා සිද්ධියක් නෙමේ. මේ නඩුව වටා තියෙනවා තවත් සිද්ධි ගණනාවක්, වනාතවිල්ලුව වෙන්න පුළුවන්, එහෙම නැත්නම් මාවනැල්ල වෙන්න පුළුවන් ඒ වගේම තවත් සිද්ධි ගණනාවක් තියෙනවා. මේ තුළ මහ කුමන්ත්‍රණය තුළ තවත් කුමන්ත්‍රණ ගණනාවක් තියෙනවා. ඒ නිසා මේක අපිට ආවාට ගියාට මේ වැඩේ කරන්න බැහැ අවසානයේදී නීතීපතිතුමා තමයි තීරණය කරන්නේ කවුද මගේ සාක්ෂිකරුවෝ

FAIR COMMENT BY JEZEEM

වෙන්නේ කවුද මගේ සැකකරුවෝ වෙන්නේ. සමහර විට ඉන්න සැකකාරයෙක් නීතිපතිතුමා හිතන්න පුළුවන් මේ රටේ පවතින යුක්තිය පසිඳලිමේ සිද්ධාන්ත සහ දර්ශනය දිහා කල්පනා කරලා මට වෙන සාක්ෂි නැහැ මට හොඳම දේ තමයි මේ පුද්ගලයා හෝ මේ තැනැත්තියට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 256 වන වගන්තිය යටතේ සමාවක් දීලා පැමිණිල්ලේ සාක්ෂිකාරයෙක් කරනවා කියලා. එහෙම කරනවා නම් අපිට ලොකු පීඩනයක් අපිට තෙරපුමක් ඇයි ඒ සාක්ෂිකාරයාගේ සාක්ෂිය ස්වාධීන සාක්ෂිවලින් තහවුරු කරන්න ඕන. ඊට අමතරව ඒ සාක්ෂිකාරයා අපි අධිකරණය වෙත දාන්නේ හරි ප්‍රවේශමෙන්. හැබැයි අධිකරණයට දාන්න කලින් ඒ සාක්ෂිකාරයා මෙම කොමිෂන් සභාව ඉදිරියේ හරි ඇවිල්ලා ඒ සැකකාරයා අපාරධයට සම්බන්ධ එක්කෙනෙක් මේ කොමිෂන් සභාව ඉදිරියට හරි ඇවිල්ලා නානාප්‍රකාරයේ හරස් ප්‍රශ්නවලට ලක් කරොත් එහෙම මොකද වෙන්නේ ඒ සාක්ෂිකාරයා අපිට දාන්න බැරි වෙනවා. ඒ නිසා ඇත්ත සත්‍ය හොයන්න ඕන බව ඇත්ත. නමුත් සත්‍ය හොයන්න ගිහිල්ලා මේ සාක්ෂියේ වියවුලක් බවට පත්වුණොත් එහෙම වියවුල් සහගත සාක්ෂි තුලින් නීතිපතිතුමා තමයි අමාරුවේ වැටෙන්නේ. නීතිපතිතුමා කියන්නේ මේ රටේ යුක්තිය පසිඳලීමේ ක්‍රමය. ඒ නිසා මං ගෞරවයෙන් සඳහන් කරන්නේ මෙන්න මේ වැදගත් විශේෂයෙන්ම තීරණාත්මක සාක්ෂිකරුවන් දැනටමත් ප්‍රකාශ දීලා තියෙනවා. ඒ ප්‍රකාශ දුන්න සාක්ෂිකරුවන් හෝ සැකකරුවන් ඔවුන්ට රදවා ගැනීමේ නියෝග මත දීලා තියෙන්නේ. ඔවුන් අද දිනයේ සිට රක්ෂිත බන්ධනාගාරයට පත්වෙනවා. ඒ නිසා ලොකු අවදානමක් තිබෙනවා ඔවුන් අනාගතයේ ඔවුන් ගන්න යන චිත්තිවාචික සම්බන්ධයෙන් යම් යම් ස්ථාවර මේ අධිකරණය ඉදිරියේ ගන්න. ඒක නිසා මං නීතිපතිතුමා වෙනුවෙන් ගෞරවයෙන් සැලකර සිටින්නේ මේ පුද්ගලයන් මේ අවස්ථාවේදී කිසිසේත්ම සාක්ෂිකරුවන් හෝ එහෙම නැත්නම් 16 වන වගන්තියේ සැකකරුවන් හැටියට නොකැඳවන ලෙසට. එහෙම කළොත් සිද්ධ වෙන්නේ කවදා හරි දවසක අපිට අතීතයට හැරීලා බලලා කියන්න සිද්ධ වෙයි මට නඩු පවරන්න තිබුණු හොඳම අවස්ථාවන් ටික මගෙන් ගිලිහි ගියා කියලා. ඒ නිසා මා ගෞරවයෙන් කියන්නේ විශේෂයෙන්ම මේ පනතේ 23 වන 24 වන වගන්තියේ කියනවා නීතිපතිතුමාට 2008 ගෙනාව සංශෝධනය නිසා බලය ලැබෙනවා ඔබතුමන්ලා ඉදිරියේ මෙහෙයවපු සාක්ෂි දිහා බලලත් නඩු දාන්න. හැබැයි ඒ සාක්ෂි දිහා විතරක් බලලා නඩු දාන්න කලින් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ නීතිපතිතුමාට ආයේ සැරයක් කියන්න වෙනවා යම් යම් සැකකරුවන්ට දෝෂාරෝපණය කියලා දීලා ඒ සැකකරුවන්ගේ දෝෂාරෝපණය කියලා දීලා ඔවුන්ගෙන් නැවතත් ප්‍රකාශයක් සටහන් කරන්න කියලා. ඒනිසා ඒ වැඩ පිළිවෙල ඉදිරියට යා යුතු වෙනවා. ඒක නිසා මා ගෞරවයෙන් සඳහන් කරන්නේ විශේෂයෙන්ම රක්ෂිත බන්ධනාගාරය හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ යම් සැකකරුවන් හිටියා නම් ඔවුන් මේ අධිකරණය

FAIR COMMENT
BY JEZEEM

ඉදිරියේදී සාක්ෂිකරුවන් හෝ එහෙම නැත්නම් සැකකරුවන් ලෙස සාක්ෂියට නොකැඳවන ලෙස. බොහෝම ස්තූතියි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා ලබා දුන් කරුණු දැක්වීමෙන් පැන නඟින කාරණාවක් කොමිෂන් සභාව ඔහුගෙන් විමසයි. එනම් හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා සම්බන්ධයෙන් මෙම ස්ථාවරය නීතිපතිවරයා නොගත්තේ කුමන හේතූන් මත ද යන්න පැහැදිලි කරන ලෙසට ඉල්ලන්නේ ?

****

<u>උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>

ගරු සභාපතිතුමනි මං මේ සඳහන් කරේ විශේෂයෙන්ම අපරාධයක සෘජුවම එක එල්ලේම සම්බන්ධ බවට ඒ කියන්නේ සිද්ධියට සම්බන්ධ බවට රක්ෂිත බන්ධනාගාරය හරි එහෙම නැත්නම් රැඳවුම් නියෝග මත තිබෙන පුද්ගලයන් ගැන මම මේ සඳහන් කරේ. ඒ ඇරෙන්න ඔබතුමන්ලා කර කරුණු සවිශේෂනය කරලා හොයාගන්න කරුණුත් මේ කොමිෂන් සභාවෙත් තිබුණා. ඒකට බාධා කරන්න අපිට කිසිම අරමුණක් තිබ්බේ නැහැ. හිටපු පොලිස්පතිතුමා හරි ඔවුන් හරි සැකකරුවෝ ලෙස රඳවා ගැනීමේ නියෝග මත අපරාධයට සෘජුවම සම්බන්ධ පුද්ගලයන් හැටියට නම් වෙලා තිබුණ් නැහැ. මං මේ කථා කරේ ඒ පුද්ගලයන් නෙමේ අපරාධයට වෙන ආකාරයකින් අන්‍යාකාරයකින් සහයෝගය දුන්න ඒ පුද්ගලයෝ ගැන නෙමේ මං සඳහන් කරේ. කෙලින්ම අපේ අනාගත නඩුවට එක එල්ලේ බලපෑමක් වෙනවා මෙන්න මේ රඳවා ගැනීමේ නියෝග මත ඒ ඇතුලත චක්‍රය මත ඇතුලත චක්‍රය මත හිටි පුද්ගලයන්. මොකද හැම පුද්ගලයන් සම්බන්ධයෙන්ම මම එහෙම දේශනයක් කරන එක සාධාරණ නෑ. අපිට බලන්න ඕනේ ඒකේ ප්‍රමාණය සහ ඒකේ තියෙන ගතික ස්වභාවය සහ ගුණාත්මක භාවය. එහෙම බලලා තමයි මේ ඉල්ලීම කරේ. එහෙම නැත්නම් ඔබතුමන්ලාගේ කොමිෂන් සභාව අකර්මන්‍ය කිරීමේ බලාපොරොත්තුවක් අපේ නීතිපතිතුමාට කිසිසේත්ම තිබුණ් නැහැ. ඒ නිසා ගෞරවයෙන් සඳහන් කරන්නේ මගේ ඉල්ලීම සීමා වෙන්නේ මේ අපරාධයට සැලසුම් කරලා කාලයක් තිස්සේ එකට ඉදලා ඔවුන් මාස ගණනාවක් තිස්සේ සැලසුම් කරලා ඒ සම්බන්ධයෙන් ඒ සැලසුම් කිරීම පිටිපස්සේ හිටපු පුද්ගලයන් ගැන මෙතන සඳහන් කරලා තියෙන්නේ. අනෙක් පුද්ගලයෝ ස්වාමිනි ඔබතුමන්ලාගේ කොමිෂමේ දක්ෂතාවය නිසා තමයි මා පිළිගන්නවා ඒ සාක්ෂි හෙළිදරව් වුණේ. ඒ ගැන මගේ කිසිම විවාදයක් නැහැ ස්වාමිනි.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල් තුමනි හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා මෙම කොමිෂම ඉදිරියේ සාක්ෂිකරුවන් වශයෙන් කැඳවන විට ඔවුන් සැකරුවන් වශයෙන් අධිකරණයක් ඉදිරියේ නම් කරලාද තිබ්බේ ?

****

<u>උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>

ගරු සභාපතිතුමනි මා ගෞරවයෙන් සඳහන් කරන්නේ ඔවුන් අපරාධයට විවිධාකාරයෙන් සම්බන්ධ බවට මේ කොමිෂන් සභාව ඉදිරියේ හෙළිදරව් වෙලා ඇති. නමුත් මේ ඉල්ලීම මෙම අපරාධයට ගැඹුරින්ම සම්බන්ධ අභ්‍යන්තරයේ සිටි ඒ පුද්ගලයන් අති විශේෂයි මේ නඩුවේ කවදා හරි නඩුවක පැමිණිල්ල මෙහෙයවන දවසට

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ඒක අපි අවබෝධ කෙරුවා. ඔබ කරපු මේ කරුණු දැක්වීම සලකා බැලීම සඳහා තමයි මේ ප්‍රශ්නය අහන්නේ. හේමසිරි ප්‍රනාන්දු මහතා සහ පූජිත් ජයසුන්දර මහතා කොමිෂම ඉදිරියේ 16 වන වගන්තිය යටතේ නොතිස් ලත් තැනැත්තන් වශයෙන් සාක්ෂියට කැඳවන විට අධිකරණමය කටයුත්තක ඔවුන් සැකකරුවන් වශයෙන් නම් කරලාද තිබ්බේ ?

පි: එසේය.

ප්‍ර: දැනට අත්අඩංගුවේ සිටින තැනැත්තන් ඔබතුමා ඔබගේ කරුණු දැක්වීමේ දී සඳහන් කරපු තැනැත්තන් අධිකරණයක් ඉදිරියේ තිබෙන කටයුත්තක සැකකරුවන් වශයෙන් නම් කරලා තියෙනවද ?

පි: මගේ මතකය නිවැරදිනම් මම හිතන්නේ දැනටමත් සමහර සැකකරුවෝ මීට කලින් අධිකරණයට ඉදිරිපත් කරලා රක්ෂිත බන්ධනාගාර කරලා තියෙනවා. එය ස්ථිර කර ගතයුතුයි විමර්ශකයන්ගෙන් විමසලා. ගරු සභාපතිතුමනි අද දිනට යෝජිත හාදියා නැමැති සැකකාරිය අද දිනයේ සැකකාරියක් හැටියට නම් කිරීමට අධිකරණය ඉදිරියේදී යෝජිතයි. ලැබෙන උපදෙස් පරිදි අනෙක් සැකකරුවන් සම්බන්ධයෙන් අද දින පැමිණ සිටින විමර්ශන නිලධාරියාට අවබෝධයක් නැහැ මොකද ඔහුගේ අවධානය යොමු වෙලා තිබෙන්නේ හාදියා නමැති සැකකාරිය සම්බන්ධයෙන් පමණයි ස්වාමිනි. ඒ හාදියා අද දිනයේ අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී නිල වශයෙන් සැකකාරියක් විදියට නම් වෙනවා.

****

FAIR COMMENT — BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

එම සැකකාරිය අද දිනයේ අධිකරණයට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් තිබෙනවද?

****

<u>උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>

එසේය ගරු සභාපතිතුමනි. අද දිනය වෙනකොට එම සැකකාරිය සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ විටින් විට නිකුත් කරන ලද රඳවා ගැනීමේ නියෝගවල අවසන් දිනය. ඒ නිසා අද දිනය අනිවාර්යය වශයෙන්ම එම සැකකාරිය අධිකරණයට ඉදිරිපත් කළ යුතු වෙනවා. අද දිනයෙන් පසුව ඇයව රක්ෂිත බන්ධනාගාරගත වෙනවා. විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ සඳහන් වෙන්නේ 7 වගන්තියේ ගරු සභාපතිතුමනි මේ ආකාරයට. Any person arrested under sub section 1 of section 6 may be kept in custody for a period not exceeding 72 hours and shall unless the detention order under section 9 has been made in respect of such person be produced before a Magistrate before the expiry of such period and then the Magistrate shall on an application made in writing in that behalf by the police officer not below the rank of Superintendent of Police make order that such person be remanded until the conclusion of the trial. Provided that where the Attorney General consents to release of such person from custody before the conclusion of trial the Magistrate shall release such person from custody. ඒ නිසා ඔබතුමාට පෙනී යනවා ඇති ඒ තීන්දුව ගන්නේ මුදවා හරිනවද කියන තීන්දුව ගන්නත් නීතිපතිතුමාගේ අනුමැතිය අවශ්‍ය වෙනවා. ඒ නිසා ඔබතුමාලා කරන අති ගෞරවනීය කාර්යය අගය කරන ගමන්ම නීතිපතිතුමාට ඉන්පසුව මේ යෂ්ටිය ඔබතුමන්ලා දෙනවා. ඒ යෂ්ටිය දෙද්දී බොහොම සවිමත් යෂ්ටියක් අපිට අවශ්‍යයි. කැඩුණු බිඳුණු යෂ්ටියක් නෙවෙයි. ඒ නිසා මම ගෞරවයෙන් කියන්නේ අපිට ඉදිරියේ සමස්ථ සමාජයම බලාගෙන ඉන්නවා. හැම කවුරුහරි වරදක් කරපු එක්කෙනෙක් ඉන්නවානම් ඔහුට විරුද්ධව නඩු පවරන්න. ඒ නිසයි මම මේ ඉල්ලීම කරේ ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්තුමනි ඔබතුමන් කොමිෂන් සභාවේ ප්‍රශ්නයට ලබාදුන් පිළිතුර එනම්, හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා සහ හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු මහතා සහ ඔබ විසින් සඳහන් කරන්නට යෙදුණු අනිත් පුද්ගලයින්ගේ අවස්ථානුකූලභාවය ඇති

FAIR COMMENT BY JEZEEM

වෙනස ඔබතුමා කොමිෂන් සභාවට විස්තර කෙරුවා. එය පැහැදිලි කර ගැනීමක් වශයෙන් ඔබතුමා කිව්වා කොමිෂන් සභාවට දැන් ඉදිරියට ගේන්න තියෙන සාක්ෂිකරුවන් ප්‍රධාන කාරණාව හා සම්බන්ධයි. හිටපු පොලිස්පති සහ හිටපු ආරක්ෂක ලේකම් ඒකට සම්බන්ධ නොවන වෙනත් වරදක් සම්බන්ධයෙන් කියලා. එම සිද්ධිමය කරුණුවලට හැරෙන්නට එම සිද්ධිමය කරුණුවලට හැරෙන්නට නීතිමය තත්ත්වය යටතේ එම සියලු පුද්ගලයෝ සමානද නැද්ද?

****

<u>උගත් ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>

ස්වාමිනි ගරු සභාපතිතුමනි තවමත් විමර්ශනය පවතින්නේ කළල අවදියේ. මේ ඔක්කෝම ගත්තාට පස්සේ තමයි අපරාධ නඩු විධාන සංග්‍රහයේ 173, 174, 175, 176 වගන්ති අනුව නීතිපතිතුමාට තීරණය කළ යුතු වන්නේ මේ ඔක්කෝම එකම නඩුවක් යටතේ දානවද, නඩු 2ක් දානවද, නඩු 3ක්. ඉතින් මම මේ මේ සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී ගෞරවාන්විතව සඳහන් කරන්නේ මේ අවස්ථාවේදී නිගමනයක් නීතිපතිතුමා අනාගතයේ මොකක් කරයිද කියලා ඇත්තට මම පොහොසත් නැහැ ඒක කරන්න. ඒ සාක්ෂි දිහා බලලා සමහර විට එකට වෙන්නත් පුළුවන්. වෙනම යන්නත් පුළුවන්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

උගත් ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්තුමා මම ඇහුවේ ඒ එකම නඩුවකද වෙනත් නඩුවකද මේ නඩු ගොනු කරන එක ගැන නෙවෙයි මම ඇහුවේ. ඔබතුමා කොමිසමේ අවධානයට යොමු කරපු ඒ නීතිමය සිද්ධාන්තය එනම් යම් අවස්ථාවකදී එකම තැනැත්තෙකු විවිධ ස්ථානවලදී කරන ප්‍රකාශවලින් පැණ නඟින තත්ත්වය. එම තත්ත්වය සිද්ධිමය කරුණු නෙවෙයි. එම තත්ත්වය හිටපු ආරක්ෂක ලේකම් සහ හිටපු පොලිස්පතිවරයා සමඟ සංසන්දනය කරන විට ඔබතුමා කොමිෂන් සභාවේ අවධානයට යොමු කරපු අනිත් තැනැත්තන් සම්බන්ධයෙන් ද සමාන වෙනවද නැද්ද කියන එකයි?

****

<u>උගත් ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>

ස්වාමිනි අනිත් තැනැත්තන් සම්බන්ධයෙන් විශේෂයෙන්ම රඳවා ගැනීමේ නියෝග යටතේ ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කරලා තියෙනවා. මහේස්ත්‍රාත්තුමාගේ අපරාධ නඩු විධාන සංග්‍රයේ 127 වගන්තිය යටතේ. ඒක සම්පූර්ණයෙන්ම සුවිශේෂී තත්ත්වයක්. මොකද එතකොට ස්වෙච්ඡාභාවය පිළිබඳ තත්ත්වයක් ප්‍රශ්නයක් මතුවෙන නිසා.

****

FAIR COMMENT
BY JEZEEM

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

මෙම ඉස්සර හේමසිරි ප්‍රනාන්දු සහ පූජිත් ජයසුන්දර යන පුද්ගලයින් ත්‍රස්තවාදී වැළැක්වීමේ පනත යටතේ ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කරලා තියෙනවද?

****

උගත් ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා

ස්වාමිනි මට උපදෙස් ලැබෙන පරිද්දට ඔවුන්ට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ කටයුතු කරලා නැහැ.

****

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

එතකොට මේ සැකකරුවන් සහ ඒ සැකකරුවන් අතර වෙනසක් තිබෙනවද?

****

උගත් ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා

බැලූ බැල්මට වෙනසක් තිබෙනවා. ඔවුන්ට අපරාධ නඩු විධාන සංග්‍රහයේ යටතේ පමණයි මේ වනතෙක් කටයුතු කරලා තියෙන්නේ.

****

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

අනික් එක ත්‍රස්තවාදී වැළැක්වීමේ පනත?

****

උගත් ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා

මේක විශේෂ පනතක් ස්වාමිනි.

****

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

එතකොට පාපොච්චාරණය කරලා තිබෙනවා සමහර සැකකරුවන් දැනට රිමාන්ඩ්..?

****

උගත් ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඔවුන් පාපොච්චාරණය කරලා තියෙනවා. ඒ වගේම වරද පිළිගැනීම වෙන ආකාරයේ දේවල් කරලා තියෙනවා.

****

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

දැන් පූජිත් ජයසුන්දර, හේමසිරි ප්‍රනාන්දු වැනි පුද්ගලයින්ගෙන් එහෙම පාපොච්චාරණ ගැනීමක් සිදු කරලා තිබෙනවද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>උගත් ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා</u>
අපි දන්න තරමින් නැහැ ස්වාමිනි. අපි දන්න තරමට නැහැ ස්වාමිනි.

****

<u>නියෝගය</u>

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>
උගත් ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් මෙම කොමිෂන් සභාවට දැක්වූ කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අවධානය යොමු කිරීමෙන් පසුව නියෝගය හෙට දින පෙරවරු 10.00ට සිදු කරන බව සටහන් කරමි. අද දින කොමිෂන් සභාවේ නියෝග මත කොමිෂන් සභාවට ගෙන ආ පුද්ගලයින් දෙදෙනා නැවත හෙට උදෑසන කොමිෂන් සභාවට පෙරවරු 10ට ඉදිරිපත් කළ යුතු බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරියා හට දන්වමි. එය අදාල තැනැත්තිය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී උගත් මහේස්ත්‍රාත්වරියට දැනුම් දිය යුතු බවට ඔහුට නියෝග කරමි. ඒ අනුව උගත් මහේස්ත්‍රාත්වරියගෙන් ඒ අදාල නියෝගයක් ලබා ගන්නා ලෙසටද ඔහුට නියෝග කරමි.
ඉන් පසුව අද දින සාක්ෂියට කැඳවා ඇති අනිත් තැනැත්තා රිමාන්ඩ් භාරයෙන් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති බව කියා සිටි හෙයින් අදාල බන්ධනාගාර අධිකාරීවරයාට හෙට පෙරවරු 10 ට කොමිෂන් සභාවට එම පුද්ගලයාද ඉදිරිපත් කරන ලෙසට නියෝග කරමි.

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020. 10.23 වේලාව :- පෙ.ව. 10.40

(සටහන් කළේ :- නිල්මිණි කුමාරි)

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, රජයේ අධි නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතීඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් කෞෂි සෙල්වනාගම් මෙනවිය ,සමඟ ජනාධිපති නීතීඥ ශ්‍රමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වෙලාව: පෙ.ව. 10.40

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

අද දින ප්‍රථමයෙන් සිදු කිරීමට තිබෙන්නේ ඊයේ දිනයේදී කොමිෂන් සභාව ඉදිරියේ ගරු නීතිපතිතුමා වෙනුවෙන් පෙනී සිටි උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් කොමිෂන් සභාවට කරන ලද කරුණු දැක්වීම සම්බන්ධයෙන් නියෝගය ප්‍රකාශයට පත් කිරීමයි. එම කරුණු දැක්වීම් මාධ්‍යය නොමැතිව ඊයේ දිනයේදී ලබා ගත් හෙයින් නියෝගය ප්‍රකාශ කිරීමද ඒ අනුව මාධ්‍යය නොමැතිව කරන බව සටහන් කරමි. මාධ්‍යය මේ අවස්ථාවේදී කොමිෂන් සභාවෙන් පිටත් කරමි. එසේම නීතිඥවරුන් හැර අනිත් සියලු තැනැත්තන් කොමිෂන් සභාවෙන් පිටත් කරන්න.

අදාල නියෝගය කොමිෂන් සභාවේ බහුතරයකින් ප්‍රකාශයට පත් කිරීම සිදු කරන අතර පළමුව සුළුතරයේ තීන්දුව හිටපු අභියාචනාධිකරණ විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා විසින් කරනු ඇත.

****

ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා

මෙම කොමිෂන් සභාවේ, ගරු සභාපති කොමසාරිස්වරයා සහ අනිකුත් විනිසුරුතුමන්ලා විසින් දීමට බලපොරොත්තු වන නියෝගයට මා එකඟ නොවන බැවින් ඒ සම්බන්ධව මාගේ නියෝගය වෙන්ව ප්‍රකාශයට පත් කරමි. නීතිපතිවරයා වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්තුමා මෙම කොමිෂන් සභාව ඉදිරියේදී ප්‍රකාශ කර සිටිනු ලැබුවේ මෙම කැඳවීමට නියමිත සැකකරුවන් මෙම කොමිෂන් සභාවේ සාක්ෂිය සඳහා කැඳවීමෙන් ඉදිරියේදී අධිකරණයක් ඉදිරියේ පවත්වනු ලබන නඩු කටයුත්තකදී එම ක්‍රියාවලියට යම් අගතියක් සිදුවිය හැකි බවයි. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් නීතිපතිතුමා වෙනුවෙන් සැල කර ඇත්තේ මෙම දැනට අද දින කැඳවීමට නියමිත සහරාන් නැමැති පුද්ගලයාගේ බිරිඳ දැනට මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේද පාපොච්චාරණයක් කර ඇති බවයි. මේ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරියේ ද ඇය ප්‍රකාශයක් කර ඇති බව මා දැනුවත් වී ඇත . මෙබැවින් මෙම ප්‍රකාශ මෙම කොමිෂන් සභාවට දෙන ලද ප්‍රකාශවල ඇතුලත් වන කරුණුද ඇතුලත් වී ඇති බව මා දැනුවත් වී ඇත. කෙසේ වුවද මෙම කොමිෂන් සභාවේදී ඇය සාක්ෂියට කැඳෙව්වොත් එම ප්‍රකාශවල සඳහන් වන කරුණුවලට අමතරව යම් කරුණු ඉදිරිපත් කළ හැකි බව මා හටද පෙනී යයි. කෙසේ වුවද මෙවැනි අවස්ථාවකදී අප සලකා බැලිය යුත්තේ රටේ පවතින නීතිමය පසුබිම තුළ මෙම සාක්ෂිකරුවන් කැඳවිය යුතුද යන්නයි. මෙවැනි අවස්ථාවක විනිසුරුතුමෙකු වශයෙන් මාගේ හැඟීම්වලට වහල් වෙලා කටයුතු කළ නොහැක. විනිශ්චයකාරතුමෙක් වශයෙන් මාගේ ප්‍රධානම කාර්යය වනුයේ නීතිමය තත්ත්වය පරීක්ෂා කර බැලීමයි. අපරාධ නඩු විධාන

FAIR COMMENT BY JEZEEM

සංග්‍රහය අනුව නීතිපතිවරයාට අපරාධ නඩුවක් පැවරීමේ පූර්ණ බලතල ඇත. නීතිපතිතුමා විසින් යම් අතිචෝදනාවක් ඉදිරිපත් කිරීමේදී යම් සැකකරුවෙකුට එරෙහිව ඉදිරිපත් කළ යුතු චෝදනා කුමක්ද, සාක්ෂිකරුවන් කවුරුද ,ලේඛන කුමක්ද, සාක්ෂි මෙහෙය වන්නේ කුමන ආකාරයෙන්ද යන්න සම්බන්ධයෙන් තමාට තීරණයක් ගැනීමේ නීතිපතිවරයාට බලයක් ඇත. නීතිපතිවරයා එය තම අනිකුත් නිලධාරීන් මඟින් මහාධිකරණයේදී එම කටයුතු සිදු කරනු ලබයි. එයට අමතරව ඕනෑම අවස්ථාවක යම් සාක්ෂිකරුවෙකු අපරාධ නඩුවක රජයේ සාක්ෂිකරුවෙකු ලෙස නම් කිරීමේ බලයද නීතිපතිතුමාට ඇත. එම බලය ඇත්තේ නීතිපතිතුමාට පමණි වෙනත් කෙනෙකුට නෙවේ. ඒ අනුව අසීමිත බලයක් නඩු පැවරීමේදී නීතිපතිතුමාට ඇත. නීතිපතිතුමා වෙනුවෙන් මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත්තේ මෙම සැකකරුවන් සාක්ෂිකරුවන් වශයෙන් කැඳවීමෙන් තම නීතිමය කටයුතු ඉදිරියේදී ගෙන යෑමේදී යම් අවහිරතාවයක් ඇතිවිය හැකි බවයි. අප රටේ නීතිපතුමා අපරාධ නඩු මෙහෙයවීමේදී පූර්ණ බලධාරියා වේ. ඒ අනුව නීතිපතිතුමා සද්භාවයෙන් යම් කරුණක් සම්බන්ධව තමාට මෙම සාක්ෂි මෙහෙයවීම හේතු කොටගෙන මහාධිකරණ නඩුවලදී චෝදනා ඉදිරිපත් කිරීමටත් අනෙක් සැකකරුවන් සම්බන්ධව අපරාධ නඩු කටයුත්තකට යෑමටත් යම් අවහිරතාවයක් සිදුවන බව ප්‍රකාශ කළ විට ඒ සම්බන්ධයෙන් අප දැඩිව අවධානය යොමු කළ යුතුය. මා විසින් මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් සලකා බැලීමේදී සඳහන් කරනුයේ මෙම සැකකරුවන්ගෙන් සමහරක් පාපොච්චාරණ ද ලබා දී ඇති බැවින් එම පාපෝච්ඡාරණ සම්බන්ධයෙන් මහාධිකරණයේ Voir dire පරීක්ෂණද පැවැත්විය යුතු බවයි. Voir dire පරීක්ෂණ පැවැත්වීමේ දී එම සාක්ෂි මෙහෙයවීම් ඉතා සුපරීක්ෂාව කළ යුතුය. යම් සැකකරුවෙකු මෙම කොමිෂන් සභාවේදී සාක්ෂි දෙමින් එම තමන්ගේ නිර්දෝෂිභාවය සඳහා සහ පාපෝච්ඡාරණය ස්වේච්ඡාවෙන් නොකල බවට ඒත්තු ගැන්වීම සඳහා කරුණු ඉදිරිපත් කරනු ලබුවොත් එයින් එම Voir dire පරීක්ෂණයේ කටයුතුවලට බාධා සිදුවෙනවා ඇත. එයින් නීතිපතිවරයාට Voir dire පරීක්ෂණය නිසි ආකාරව පවත්වාගෙන යාමට නොහැකි වන අතර බොහෝ අවස්ථාවල සැකකරුවෙකු සාක්ෂි වශයෙන් මෙම කොමිෂන් සභාවේ එයට විරුද්ධව Voir dire පරීක්ෂණයට අදාලව යම් ප්‍රකාශයක් කරනු ලැබුවොත් එම සැකකරුට සමහරවිට යම් අගතියක් සිදුවිය හැකියි. මේ සම්බන්ධයෙන් ද කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් මා සලකා බලන ලදි. මේ හැරුණු විට මෙම යම් සැකකරුවෙකු සාක්ෂිකරුවෙකු වශයෙන් සාක්ෂි දෙන අවස්ථාවේදී වෙනත් සැකකරුවෙකු සම්බන්ධව කරුණු ඉදිරිපත් කළහොත් එයින් ද එම සැකකරුවන් සම්බන්ධව චෝදනා ඉදිරිපත් කිරීමේදී කුමන ආකාරයකින් චෝදනා ඉදිරිපත් කිරීම ද යන්න සම්බන්ධයෙන් නීතිපතිතුමාට ගැටලුවක් ඇතිවෙනු ඇත. එසේම යම් සැකකාර සාක්ෂිකරුවෙක් මෙම සාක්ෂි විමසීමේදී යම් වෙනත් සැකකරුවෙකු සම්බන්ධව

FAIR COMMENT
BY JEZEEM

ප්‍රකාශයක් කළහොත් එම සැකකරුට ජනාධිපති කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ නීතිඥවරයෙකු මාර්ගයෙන් ඔහුගෙන් ඇයගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දියු යුතුය. එසේ නීතිඥවරයකු මාර්ගයෙන් ඇයගේ නීතිමය අයිතීන් අනුව ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා දුනනහොත් එයින් මතු වන කරුණු මත නීතිපතිතුමාට මහාධිකරණයේදී නඩු පැවරීමේදී යම් ගැටලුසහගත අවස්ථාවන් උදාවිය හැකිය. එවැනි ආකාරයෙන් කටයුතු කිරීම මත අපරාධ නඩුවක් පැවරීමේ යම් ගැටලුසහගත තත්ත්වයක් උද්ගත වුවහොත් එයින් ඇතිවන අවදානම් තත්ත්වය ගැන නීතිපතිතුමා මෙම අවස්ථාවේදීම දැනුවත් වී ඒ ගැන කොමිෂන් සභාව දැනුවත් කිරීම සම්බන්ධයෙන් මා ස්තූතිවන්ත වෙමි. තවද විශේෂයෙන් මා මෙහිදි අවධානය යොමු කරනු ලැබුවේ ජනාධිපති කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ දියයුතු යම් චෝදනාවට ඇය ලක්වීමට හෝ හැකියාවක් ඇත්නම් ඇයට එම සැකකාරියට හෝ සැකකරුට නීතිඥවරයකු මඟින් පෙනී සිටීමට ඇති අයිතියයි. නීතිමය මූලධර්ම අනුව එම නීතිඥයකු මාර්ගයෙන් සාක්ෂි ලබා දීමට හෝ එම සාක්ෂිකරුවකුගේ සාක්ෂි නිසා අගතියට පත් පාර්ශවයට නීතිඥ මාර්ගයෙන් ප්‍රශ්න ඇසීමට ලබා දීම මඟින් මෙම සැකකරුවන් දෙන සාක්ෂිවල යම් ගැටලුසහගත තත්ත්වයන් ඇති විය හැකි බව මාගේ නිගමනයයි. එවැනි පරස්පර ගැටලුසහගත තත්ත්වයන් ඇතිවීම මත ක්‍රමාණුකූලව අපරාධ නඩුවක් පැවරීමේ හැකියාව නීතිපතිතුමාට නැතිවිය හැකි බවද මාගේ මතයයි. මෙම සැකකරුවන් සාක්ෂිකරුවන් ලෙස කොමිෂන් සභාවට නොකැඳවීමෙන් විශාල අගතියක් සිදු නොවන බව මාගේ හැඟීමයි. ජනාධිපති කොමිෂන් සභා පනත අනුව සත්‍ය තොරතුරු හැකිතාක් දුරට උපරිම මට්ටමෙන් ලබා ගත යුතු වුවද එම උපරිම මට්ටමින් ලබා ගැනීමට කටයුතු කිරීම මත ඉදිරියේදී සැකකරුවන්ට නඩු පැවරීමේදී යම් ගැටලුසහගත තත්ත්වයන් උදාවිය හැකිනම් ඒ පිළිබඳව සලකා බලා එම සැකකරුවන් සාක්ෂියට නොකැඳවීම කොමිෂන් සභාව විසින් කල යුතු බව මාගේ පෞද්ගලික මතයයි. මෙම කොමිෂන් සභාව විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජෙනරාල්තුමා ප්‍රකාශ කරනු ලැබුවේ දැනට නඩු පවරනු ලැබු හේමසිරි ප්‍රනාන්දු සහ පූජිත් ජයසුන්දර යන අය සම්බන්ධයෙන් මෙවැනි නියෝගයක් බලාපොරොත්තු නොවුන බවත් නමුත් ඔවුන්ට එරෙහිව ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ නඩු පැවරීම සඳහා වාර්තා ඉදිරිපත් කර නැති බවත්, ඔවුන් රඳවා තබා ගැනීමේ නියෝග මත තබා නොසිටින බවත්ය. මේ සම්බන්ධයෙන්ද මා අවධානය යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ මෙම කොමිෂන් සභාවට කැඳවීමට කටයුතු කරන ලද සැකකරුවන් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රඳවා තබාගන්නා ලද සැකකරුවන් බවයි. මෙබැවින් එවැනි සැකකරුවන් එබැවින් අනිකුත් චෝදනාවන් ඉදිරිපත් කරන සැකකරුවන්ට වඩා වෙනස් ආකාරයෙන් මෙම සැකරුවන් පිළිබඳ මෙම ඉල්ලීම කිරීමෙන් නීතිපතිතුමා වරදක් කර ඇති බවක් මා හට පෙනී නොයයි. විශේෂයෙන් කොමිෂන් සභාවේ කටයුතු කිරීමේදී

FAIR COMMENT
BY JEZEEM

කොමිෂන් සභාවේ වගකීම වනුයේ ඉදිරි නීති කටයුතුවලට බාධා නොවන අයුරින් පරීක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු හා සාක්ෂි මෙහෙය වීමයි. විශේෂයෙන් මා මෙහිදි වැඩිදුරටත් ප්‍රකාශ කරනු ලබනුයේ මෙම කොමිෂන් සභාවේ සියලුම බලතල සහ කාර්ය භාරයන් 2020 දෙසැම්බර් මස 20 වෙනිදායින් අවසන් වන බවයි. 2020 දෙසැම්බර් 20 වෙනිදායින් පසුව මෙම කොමිෂන් සභාවේ තිබෙන බලතල අහිමි වනු ඇත. එයට පසු කොමිෂන් සභාව වෙනුවෙනුත් කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙනුත් අධිකරණයකදී කරුණු කියාපෑමට සිදුවන්නේ නීතිපතිතුමාටයි. එසේ කරුණු කියාපෑමට නීතිපතිතුමාට සුදුසු වාතාවරණයක් අප විසින් සකස් කළ යුතුය. නීතිපතිතුමාට සුදුසු වාතාවරණයක් ඉදිරි අධිකරණ කටයුතු කරගෙන යෑමට සකස් නොකර යම් අවහිරතා ඇතිවුණොත් ඉදිරියේදී මෙම සැකකරුවන්ට එරෙහිව නීතිමය කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට හැකිවේද යන්න පිළිබඳව මා මාගේ අවධානය යොමු කරන ලදී. මෙබැවින් මම අනිකුත් කොමසාරිස්තුමාලාගේ තවද මා වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ මෙම සැකකරුවන්ගෙන් සාක්ෂි ලබා ගැනිමෙන් යම් වැඩිදුර කරුණු හෙලිදරව් වීමට හැකී වුවත් ඉදිරියේදී මෙම ප්‍රහාරය සම්බන්ධව සැකකරුවන්ට එරෙහිව සාර්ථකව නීතිමය කටයුතු කරගෙන යෑම සම්බන්ධයෙන් එයට වඩා ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු බවයි. සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුවන්ගෙන් නව කරුණු හෙලි වී ඇත්නම් ඒවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශවලද පාපොච්චාරණවලද සටහන්ව ඇත. එසේනම් ඒ අනුවද තවදුරටත් පරීක්ෂණ කිරීමට නීතීමය අංශවලට හැකියාවක් ඇත. මෙම ජනාධිපති කොමිෂන් සභාවටද යම් යම් කරුණු සම්බන්ධව ඇයගේ ප්‍රකාශ පිළිබඳව දැනුවත් වී ඇති බැවින් තවදුරටත් ඒ පිළිබඳ පරීක්ෂණ කරමින් ඉදිරි කටයුතු කර ගෙන යාමට හැකියාවක් ඇත. එබැවින් මා අවසාන වශයෙන් තීරණය කරනුයේ මෙම සැකකරුවන් හා සැකකාරියන් සාක්ෂියට කැඳවීමෙන් ඉදිරි අධිකරණ කටයුතුවලදී යම් බාධාවක් ඇතිවීමට අවස්ථාවක් ඇති බවයි. අධිකරණයේ නඩු පවරනු ලබන නීතිපතිතුමා විසින්ම මෙය කොමිෂන් සභාවේ අවධානයට යොමු කර ඇති බැවින් අප ඒ ගැන වඩාත් සැලකිලිමත් විය යුතුය. එබැවින් නීතිපතිතුමාගේ ඉදිරි කටයුතු මෙම සැක කටයුතු පුද්ගලයින් වෙනුවෙන් කරගෙන යාමට අවස්ථාවක් ලබාදීම සඳහා ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්තුමා විසින් කරන ලද ඉල්ලීමට අවසර දීම සුදුසු බව මා තීරණය කරමි. ඒ අනුව අනෙකුත් උගත් කොමසාරිස්වරයන්ගේ තීරණයට වෙනස්ව මාගේ තීරණය ප්‍රකාශ කරමි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ස්තූතියි රාජපක්ෂ මැතිතුමා

බහුතරයේ තීන්දුව එනම් අභියාචනාධිකරණ විනිශ්චයකාර ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා, හිටපු මහාධිකරණ විනිශ්චයකාර ගරු බන්දුල අතපත්තු මැතිතුමා සහ හිටපු අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ගරු මංගලිකා අදිකාරි මහත්මිය මා සමඟ එකඟ වන නියෝගය මේ අවස්ථාවේදී ප්‍රකාශයට පත් කරමි.

****

<u>බහුතර නියෝගය</u>

2020.10.22 වෙනි දින වරින් වර සංශෝධිත කොමිෂන් සභා පනතේ 26 වැනි වගන්තිය යටතේ ගරු නීතිපතිතුමාගේ උපදෙස් අනුව කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා කරුණු සැළ කිරීමෙන් දන්වා සිටියේ සැකකරුවන් ලෙස හෝ සැකකාරියක් ලෙස විමර්ශකයන් විසින් අත්අඩංගුවේ තබාගෙන සිටින යම් සැකකරුවන් මෙම කොමිෂන් සභාව ඉදිරියේ දී සාක්ෂිය සඳහා කවර ආකාරයකින් හෝ නොකැඳවන ලෙසයි. ඔහු විසින් වැඩිදුරටත් දන්වා සිටියේ එලෙස කැඳවීම අනාගතයේ දවසක ගරු නීතිපතිතුමා වෙතට විතරක්ම පැවරෙන නඩු පැවරීමේ බලයත්, පැමිණිල්ල මෙහෙයවීමේ බලයටත් ප්‍රබල අගතියක් සිදු වෙන නිසා බවයි.

එසේම ගරු නීතිපතුමා වෙනුවෙන් සැළ කරන ලද්දේ මෙම කොමිසම කවර නිර්දේශය කරත් එනයින්ම, ස්වායක්තව නඩු පැවරෙන්නේ නැති බවත්, ඒ නඩු පැවරීමේ තනි සහ අනන්‍ය බලය ගරු නීතිපතිතුමා සතුව විතරක් පවතින බවයි. එනමුත් වික්ටර් අයිවන් එරෙහිව සරත් එන් සිල්වා නීතිපති සහ තවත් පුද්ගලයෙකු 1998 (1) ශ්‍රී ලංකා නීති වාර්තා 340 පිටුවේ සටහන්ව ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ මාර්ක් ප්‍රනාන්දු විනිසුරුතුමා ප්‍රකාශ කරන ලද්දේ "... The Attorney General's power, to file or not to file an indictment... is a discretionary power which is neither absolute nor unfettered. It is similar to other powers vested by law in public functionaries. They are held in trust for the public to be exercised for the purpose for which they have been conferred and not otherwise."

ඒ නිසා නඩු පැවරීමට හෝ නොපැවරීමට ගරු නීතිපතිවරයාට ඇති අභිමතය යම් යම් සීමාවන්ට යටත් අතර එම තීරණය නිවැරදිව ගැනීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද මෙවන් කොමිෂන් සභාවක්, සිය සම්පූර්ණ බලය තුල ක්‍රියාකරමින් ගරු ජනාධිපතිවරයා විසින් මෙම කොමිෂන් සභාවට නියම කර ඇති සියලුම කරුණු පිළිබඳව විමර්ශනය කොට, පරීක්ෂා කොට ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවනු පිණිස වාර්තා කිරීම සිදු කළ යුතුයි.

FAIR COMMENT
BY JEZEEM

මෙහිදී පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 7 (1) (ඇ) වගන්තිය කෙරෙහි අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ මෙම කොමිසමට ශ්‍රී ලංකාව තුල පදිංචි ඕනෑම පුද්ගලයෙකු සාක්ෂිකරුවෙකු වශයෙන් කැඳවිය හැකි බවයි. එම බලයට සීමා පැනවීමට ගරු නීතිපතිතුමාට නෛතික බලයක් නැත.

මෙම කොමිෂන් සභාවට බලය පැවරෙන අධිකාරි බලපත්‍රයේ 3 වෙනි කරුණ යටතේ පැවරී ඇති ප්‍රධාන කාර්යයක් වන්නේ 2019 අප්‍රේල් මස 21 වෙනි දින සිදුවූ ත්‍රස්තවාදී ක්‍රියාවට සෘජුව හෝ වක්‍රව සම්බන්ධතාවයක් ඇති පුද්ගලයින් හා සංවිධාන හා ඒවායේ ක්‍රියා කලාපයන් හඳුනා ගැනීමයි. ඒ සඳහා එම ත්‍රස්තවාදී ක්‍රියාවට සම්බන්ධ වූ පුද්ගලයින් සමඟ සමීප ඇසුරක් පවත්වාගෙන ගිය තැනැත්තන්ගෙන් සාක්ෂි ලබා ගැනීමට හැකියාවක් ඇති විට එම අවස්ථාව හිතාමතාම මඟ හැරියහොත් එය මෙම කොමිසම විසින් කරනු ලබන බලවත් අතපසු කිරීමක් වියහැකි බව අපගේ මතයයි.

දැනට මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වී ඇති සාක්ෂිවලට අනුව එම ත්‍රස්ත ප්‍රහාර එල්ල කළ එක් පුද්ගලයෙකු වන මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් යන අයගේ බිරිඳ වන අබ්දුල් කාදර් ෆාතිමා හාදියා පමණයි ස්වයං ඝාතකයන් සමඟ සිටි පුද්ගලයන් අතරින් දැනට ජීවතුන් අතර සිටින සහ සොයා ගත හැකි එකම තැනැත්තිය වන්නේ එම තැනැත්තිය විසින් මෙම කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට කර ඇති ප්‍රකාශය පරිශීලනය කිරීමේදී ඉහත කී ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් මෙම කොමිසම ඉදිරියේ දැනට නොමැති වැදගත් කරුණු බොහොමයක් ප්‍රකාශ කර ඇති බව පෙනී යන අතර එම කරුණු පිළිබඳව දැනුවත්ව සිටින මෙම කොමිසම ඇයගේ සාක්ෂිය ලබා නොගතහොත් එය අප වෙත පවරා ඇති අධිකාරි බලපත්‍රය නොසලකා හැරීමක් සිදු වන බව අපගේ මතයයි.

නීතියට අනුව අධිචෝදනා ගොනු කිරීමේදී ගරු නීතිපතිතුමාට යම් බලයක් පැවරී ඇත්තා සේම නීතියට අනුව මෙම කොමිසමට ද යම් බලතල ලබා දී ඇත.

එකී බලතල යටතේ පැවරී ඇති වැදගත් කර්තව්‍යයක් වනුයේ පාස්කු ත්‍රස්ත ප්‍රහාරයට සම්බන්ධව සියලු කරුණු අනාවරණය කර ගැනීමයි. ඉහත කී ගරු නීතිපතිවරයාගේ බලතලත් මේ කොමිසමේ බලතලත් තුලනාත්මකව සංසන්දනය කර බැලුවද ඉහත කී අබ්දුල් කාදර් ෆාතිමා හාදියා යන තැනැත්තිය මෙම කොමිසම ඉදිරියේ සාක්ෂිකාරියක් වශයෙන් කැඳවීම සාධාරණ සහ යුක්ති සහගත බව අපගේ මතයයි. අවසානයේ මෙම කොමිසමේ ප්‍රධාන කාර්යයක් වන්නේ මෙම ත්‍රස්ත ප්‍රහාරයෙන් මිය ගිය සහ තුවාල ලැබූ තැනැත්තන් සහ ඔවුන්ගේ පවුල්වල අයට යුක්තිය සහ සාධාරණය ඉටු කිරීමයි. එකී අරමුණ මුදුන්පත් කර ගැනීම උදෙසා මෙම කොමිසම සම්පූර්ණ විමර්ශනයක් හා පරීක්ෂණයක් සිදු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

ඉහත කී කරුණු හේතුවෙන් අබ්දුල් කාදර් ෆාතිමා හාදියා යන තැනැත්තිය සාක්ෂිකාරියක් වශයෙන් මෙම කොමිසම ඉදිරියේ කැඳවීමට අප තීරණය කරමු.

FAIR COMMENT
BY JEZEEM

මෙම නියෝගය මඟින් දැනට අත්අඩංගුවේ හෝ රක්ෂිත බන්ධනාගාරය භාරයේ සිටින සියලුම තැනැත්තන් මෙම කොමිසම ඉදිරියේ සාක්ෂිකරුවන් වශයෙන් කැඳවන බව ගම්‍ය නොවේ. කැඳවනු ලැබිය යුත්තේ කවුරුන්ද යන්න සියලු අදාළ කරුණු සළකා බලා අවස්ථානුකූලව මෙම කොමිසම විසින් තීරණය කරනු ලබන බව සටහන් කර තබමි.
මේ අවස්ථාවේදී අබ්දුල් කාදර් ෆාතිමා හාදියා යන තැනැත්තියගේ සාක්ෂිය නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහ අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරිය ඉදිරියේ ලබා ගන්නා බව පමණක් සටහන් කරමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>
ස්වාමිනි ඔබතුමන්ලා විසින් අද දින උදෑසන කරන ලද නියෝගය ප්‍රකාරව ඇයගේ සාක්ෂිය ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාවට සහාය වෙමින් මෙහෙයවන්නට මේ අවස්ථාවේදී අපේක්ෂා කරනවා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>
කොමිෂන් සභාවේ කටයුතු මධ්‍යන 12.00 තෙක් කල් දමනවා.

****

කොමිෂන් සභාව නැවත රැස්වේ.
වෙලාව: ප.ව.12.10

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>
ස්වාමිනි එසේ කටයුතු කිරීමට පෙර ඔබතුමන්ලාගේ ගරු අවධානයට පහත කරුණු කෙසේ වුවත් යොමු කිරීමටත් බලාපොරොත්තු වෙනවා. මන්ද මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ පවත්වනු ලබන මෙම විමසීමෙහි නෛතික භාවයට එය සෘජුව බලපැවැත්මක් තිබෙන බව පෙනී යන හෙයින්. අද දින ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාවේ බහුතරයේ නියෝගය ප්‍රකාරව මෙම අබ්දුල් කාදර් ෆාතිමා හාදියා නැමැත්තිය සාක්ෂිකාරියක ලෙස කැඳවීම යුක්ති සහගත බවට ප්‍රකාශ කෙරුණා. ස්වාමිනි ඊයේ දින ගරු නීතිපතිතුමා වෙනුවෙන් පෙනී සිටින ලද ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් සරත් ජයමාන්න මහතා විසින් කරුණු සැලකිරීමේදී අනාවරණය වුණා ස්වාමිනි මෙම තැනැත්තිය සැකකාරියක ලෙසට ඊයේ දින ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඇයගේ රැඳවුම් නියෝග අවසන් නිසා ඉදිරිපත් කිරීම සිදු කිරීමට නියමිතව තිබුණු බව. ඒ අනුව මා විසින් අද දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් ඔවුන් ඊයේ දින ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කරන ලද වැඩිදුර වාර්තාවේ

FAIR COMMENT — BY JEZEEM —

පිටපතක් ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාවට සහාය වීමේ අභිලාෂයෙන් මේ අවස්ථාව වන විට Fax මාර්ගයෙන් ලබා ගෙන තිබෙනවා. ඒ අනුව මෙම තැනැත්තියගේ නම සැකකරුවන් ලැයිස්තුවේ තුන්වන සැකකාරිය ලෙසට ලැයිස්තු ගත කොට තිබෙනවා. ඒ වගේම එම වාර්තාවේ 09 වන ඡේදය යටතේ සඳහන් කොට තිබෙනවා ස්වාමිනි මෙම තැනැත්තිය 2019/04 වන මස 29 වන දින අම්පාර මූලස්ථාන පොලිස් පරීක්ෂක ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්ත දඩැල්ලගේ යන නිලධාරියා විසින් අත්අඩංගුවට ගෙන තිබෙන බව. අනතුරුව ඇයව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ වගන්ති ප්‍රකාරව දින 90 ක රැඳවුම් නියෝග මත රඳවා තබා 2019/05 වන මස 07 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දීමෙන් පසුව රඳවා තබා ගෙන වැඩිදුර විමර්ශන සිදු කොට තිබෙනවා. ස්වාමිනි තවදුරටත් ඊයේ දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර කරුණු වාර්තා කරමින් ගරු මහේස්ත්‍රාත්තුමාගේ අවධානය වෙත යොමු කොට තිබෙනවා මෙම සැකකාරිය විෂයෙහි 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධි විධාන පනතේ 2 (1)(ඒ), (ඌ) සහ 05 (අ) , (ආ) , දණ්ඩ නීති සංග්‍රහයේ 32 ,100, 113 සහ 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනතේ 03 (1) වගන්තිය යටතේ වන වැරදි සහ 2011 අංක 40 දරණ පනතින් සංශෝධිත 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ වැරදි සහ 2011 අංක 41 හා 2013 අංක 3 දරණ පනත්වලින් සංශෝධිත 2005 අංක 25 දරණ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ වැරදි සිදු කර ඇති බවට ගරු අධිකරණය වෙත වාර්තා කොට තිබෙන බවට. මෙහිදී මෙම ගරු කොමිෂන් සභාවේ විමර්ශන අංශය විසින් සිදු කොට ඇති විමර්ශනයන් සලකා බලනු ලබන අවස්ථාවේදීත් ඇයගේ ස්වාමියා වූ ෂැංග්‍රිලා හෝටලයේ පළමුවන මරාගෙන මැරීමේ ප්‍රහාරය දියත් කරන ලද සහරාන් හෂීම් විසින් සිදු කරනු ලබන රටේ පවතින නෛතික ප්‍රතිපාදනවලට එරෙහිව සිදු කරනු ලැබූ කටයුතු සම්බන්ධයෙනුත් ඔහුගේ සමීපතමයින් විසින් සිදු කරනු ලැබූ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අණපනත්වලට විරුද්ධව සිදු කරන ලබන වැරදි සම්බන්ධයෙනුත් ඇය දැනුවත්ව සිටි බව අනාවරණය වෙනවා ස්වාමිනි. මා කලින් සඳහන් කරන ලද ආකාරයට මෙම තැනැත්තිය එනම් ඊයේ දින වැඩිදුර වාර්තාවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තුන්වන සැකකාරිය වශයෙන් නම් කොට ඇති අබ්දුල් කාදර් ෆාතිමා හාදියා යන අය සම්බන්ධයෙන් කරන ලද විමර්ශන කටයුතු අවසන්ව ඇති හෙයින් ඇයව ඊයේ දින ගරු අධිකරණය වෙත ඉදිරිපත් කොට තිබෙනවා. ස්වාමිනි මෙම කරුණු සමස්ථයක් ලෙස සලකා බැලීමේදී ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාවට සහාය වන අප විසින් අපගේ වගකීම සහ යුතුකම වනවා ඔබතුමන්ලාගේ අවධානය කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය කෙරෙහි යොමු කරන්නට. එහි සඳහන් වන්නේ ස්වාමිනි “Every person who’s conduct is the subject of inquiry under this Act or who is in any way implicated or concerned in

FAIR COMMENT BY JEZEEM

the matter under inquiry shall be entitled to be represented by one or more Attorneys – at – Law at the whole of the inquiry…" ස්වාමිනි මා විසින් ඉහත දක්වන ලද කරුණු මෙම 16 වෙනි වගන්තියේ පළමු කොටසේ තිබෙන සැකැස්ම සමඟ සංසන්දනය කොට බලන විට මෙම තැනැත්තිය දැනටමත් සැකකාරියක ලෙස ගරු අධිකරණයට ඉදිරිපත් කොට ඇති හෙයිනුත් ඇය විෂයෙහි නඟනු ලබන චෝදනා සම්බන්ධයෙන් පැහැදිලිව ඇය සම්බන්ධයෙන් විමර්ශනය සිදු කරන ලද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මෙම කරුණු ගරු අධිකරණයට වාර්තා කොට ඇති හෙයිනුත් ඇයට වරින් වර සංශෝධිත කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය යටතේ තිබෙන නෛතික අයිතිවාසිකම් හිමි විය යුතු වෙනවා. එම නිසා ස්වාමිනි ඇයව සාක්ෂිකාරියක ලෙස කැඳවීමට සැබවින්ම මේ අවස්ථානුගත කරුණු යටතේ හැකියාවක් ගරු කොමිෂන් සභාවට නොමැති බව මා ඉතා ගෞරවයෙන් ඔබතුමන්ලාගේ අවධානය වෙත යොමු කොට සිටිනවා. ඇයව කැඳවනු ලබන්නේ නම් 16 වන වගන්තිය යටතේ ඇයට හිමිවන එම නෛතික අයිතිවාසිකම ස්වාමිනි ලබා දීලා ඕනේ කැඳවන්නට. කෙසේ වුවත් මා අවසාන වශයෙනුත් ඊයේ දින ජ්‍යෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්තුමා මෙවැනි සැකකාරියක් ගරු කොමිෂන් සභාව ඉදිරියේ කැඳවා සාක්ෂි මෙහෙයවීමෙන් ඇති වන්නට පුළුවන් විවාදාත්මක සහ අනිටු ප්‍රතිඵල කෙරෙහි ගෞරවයෙන් නැවතත් යොමු කරන්නට කැමැතියි ස්වාමිනි. ස්තූතියි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

දැන් අතිරේක සොලිසිටර් ජනරාල් දැන් සුළුතර නියෝගය දීලා නිසා මා විසින් ඒ ගැන නියෝගයක් ප්‍රකාශයට පත් කරන්නේ නෑ. 16 වෙනි වගන්තිය යටතේ කටයුතු කිරීම අවශ්‍ය නිසා ඒ අවශ්‍යයි කියලා නියෝගයක් දීලා තියෙන නිසා මා විසින් ඒ ගැන නියෝගයක් ප්‍රකාශ කරන්නේ නෑ. බහුතරය නියෝගයක් ප්‍රකාශයට පත් කරාවි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අර්ෂා ජීනසේන මෙනෙවිය</u>

හොඳමයි ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

දැන් පැහැදිලි කරන්න පුළුවන්ද නීතිමය අයිතිවාසිකම් නැති වුණොත් මොකද වෙන්නේ?

****

FAIR COMMENT
BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ස්වාමිනි දැන් මේ අවස්ථාව වන විටත් ගරු අධිකරණය ඉදිරියේ නඩුවකට සහභාගි වන සැකකරුවන් ලෙස නම් කරන ලද දෙදෙනෙක් මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දීම සඳහා කැඳවා තියෙනවා. ඔවුන්ගේ සාක්ෂි ඇත්තටම දැන් අවසාන අදියරේ තියෙන්නේ. ඔවුන්ට 16 වන වගන්තිය යටතේ නොනීසි නිකුත් කරලා ඔවුන් වෙනුවෙන් නීති නියෝජනයක් කිරීමේ ඒ අයිතිය ලබා දීලා තියෙනවා. එතකොට ස්වාමිනි විවිධ පනත් යටතේ ඔවුන් සාමාන්‍ය නීතිය යටතේ ඉදිරිපත් කරලා තිබුණා වුණත් මෙම තැනැත්තිය විශේෂිත පනත් වගේම සාමාන්‍ය නීතිය යටතේ වූ වැරදි සිදු කරනු ලබන බවට සඳහන් කරලා ඒ වගේ ඉදිරිපත් කරලා තිබුණා වුණත් ස්වාමිනි අයිතිවාසිකම් සැකකරුවන් සම්බන්ධයෙන් ගත්තාම එය සමාන වෙනවා. ඒ නිසා ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාවට නෛතික ප්‍රශ්නයකට වගේම ස්වාමිනි සමානාත්මතාවයෙන් සැලකීම පිළිබඳ ප්‍රශ්නයකටත් ඉදිරියේදී මුහුණ දෙන්නට වෙයි එහෙම වුණොත් ඇයි පුජීත ජයසුන්දර මහතාටත්, හේමසිරි ප්‍රනාන්දු මහතාටත් නීති නියෝජනයක් කිරීමට අවසර දුන්නේ. එහෙම නම් ඇයි මේ තැනැත්තියට ඒ සඳහා අවසර නොදෙන්නේ කියලා.

****

<u>බහුතරයේ තීන්දුව</u>

ඊයේ දිනයේදී උගත් ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා මෙම කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් ප්‍රකාශ කරන ලද්දේ " අද දිනය වෙන කොට එම සැකකාරිය සම්බන්ධයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ විටින් විට නිකුත් කරන ලද රඳවා ගැනීමේ නියෝගවල අවසන් දිනය වේ. ඒ නිසා අද දිනයේ අනිවාර්යය වශයෙන්ම එම සැකකාරිය අධිකරණයට ඉදිරිපත් කළ යුතු වෙනවා" යන්නයි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය නැවතත් බහුතරයේ නියෝගය ලබා දීමට බාධා කරමින් යළිත් කරුණු දක්වමින් කියා සිටින්නේ;</u>

ස්වාමිනි මේ අවස්ථාවේදී ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාවට සහාය වෙමින් මෙම ඊයේ දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කොට ඇති වැඩිදුර වාර්තාවේ ඊයේ දින ඇයව ඉදිරිපත් කිරීමට හේතුවන කරුණු පිළිබඳව සඳහන් වී ඇති ඡේදය වාර්තාගත කර ගැනීම සඳහා කියවා සිටීමට අවසර පතනවා.

ස්වාමිනි අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රථමයෙන් ගොනු කරන ලද බී වාර්තාවට පසුව විමර්ශකයින් විසින් විමර්ශනයේ ප්‍රගතිය පිළිබඳව වාර්තා කරමින් වරින් වර ගරු මහේස්ත්‍රාත්තුමා දැනුවත් කරනු ලබනවා. එහිදී ඔවුන්

FAIR COMMENT BY JEZEEM

විසින් එතෙක් අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන්, ඉදිරිපත් වී ඇති සාක්ෂි, විමර්ශනය කිරීමට අපේක්ෂා කරනු ලබන තවත් විමර්ශන කටයුතු ඇත්නම් ඒ පිළිබඳව, යම් නඩු භාණ්ඩ ඇත්නම් ඒ පිළිබඳව, ගරු මහේස්ත්‍රාත්තුමාගේ සහාය 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 124 වන වගන්තිය යටතේ ලබා ගැනීමට අවශ්‍ය නම් ඒ පිළිබඳව යනාදී කරුණු අන්තර්ගත කරමින් ගොනු කරනු ලබනවා ස්වාමිනි. ඒ අනුව ඊයේ දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B 13099/19 දරණ නඩුවේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගොනු කරන ලද වැඩිදුර වාර්තාවේ කරුණු අනුව තමයි ස්වාමිනි මා ඔබතුමන්ලාගේ ගරු අවධානයට ඉහතින් දක්වන ලද කරුණු මීට පෙර ප්‍රකාශ කරන ලද කරුණු සඳහන් කරනු ලැබුවේ. ඊයේ දින ඔවුන් ගොනු කරන ලද වැඩිදුර වාර්තාව පිටු 26 කින් සමන්විත වෙනවා ස්වාමිනි. එහි මෙම ප්‍රස්තුත තැනැත්තිය වන අබ්දුල් කාදර් ෆාතිමා හාදියා පිළිබඳව සඳහන් කරමින් මෙන්න මේ ආකාරයට 05 වෙනි පිටුවේ එක් ඡේදයක මේ ආකාරයට සඳහන් වෙනවා ස්වාමිනි. “මේ අනුව නඩුවේ තුන්වෙනි සැකකරු වශයෙන් නම් කර ඇති සැකකාරිය අබ්දුල් කාදර් ෆාතිමා හාදියා යන අය සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන කටයුතු අවසන්ව ඇති බැවින් අද දින ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන අතර මෙම සැකකරු වෙත ලබා ගෙන ඇති රැඳවුම් නියෝග කාලය 2020/10/22 වන දිනෙන් අවසන් වීමට නියමිත ඇති බවට වාර්තා කරමි” යනුවෙන් සඳහන් වෙනවා ස්වාමිනි. ඒ බව ගෞරවයෙන් ගරු කොමිෂන් සභාවේ අවධානය වෙත යොමු කරනවා ස්වාමිනි.

ඒ වගේම ස්වාමිනි මෙම වාර්තාව අනුව පැහැදිලි වෙනවා ස්වාමීනි අංක 17 යටතේ සඳහන් කරලා තියෙන කරුණුවලින් අනාවරණය වෙනවා ඇයව කොළඹ කාන්තා බන්ධනාගාරය වෙත භාර දීලා තිබෙන බවත්, ඇය එම බන්ධනාගාරය භාරයේ සිටින බවත්. ඒ අනුව ස්වාමිනි රඳවා තබා ගැනීමේ ස්ථානය සහ ඒවා සම්බන්ධයෙන් වූ බලාධිකාරිය වෙනස් වෙලා තිබෙන බව ගෞරවයෙන් ඔබතුමන්ලාගේ අවධානයට යොමුකර සිටිනවා. ස්තූතියි.

****

<u>නියෝගය</u>

බහුතර නියෝගය වැඩිදුරටත් සටහන් කරමි.

වරින්වර සංශෝධිත කොමිෂන් සභා පනතේ 02(1)(c) වගන්තියෙන් දැක්වෙන්නේ ”Whenever it appears to the President to be necessary that an inquiry should be held and information obtained as to any matter in respect of which an inquiry will in his opinion be in the interest of the public’s safety or welfare the President may by warrant appoint a Commission of Inquiry. ”

FAIR COMMENT
BY JEZEEM

ඒ අනුව වරින් වර සංශෝධිත කොමිෂන් සභා පනත යටතේ පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීමේ එකම අරමුණ වන්නේ අපරාධ නඩුවක් පැවරීමක් පමණක් නොවේ. මහජන ආරක්ෂාව සහ සුබ සාධනය සඳහා අවශ්‍යනම් පරීක්ෂණ කොමිෂන් සභාවක්ද පත් කිරීමට ද එම පනත යටතේ ගරු ජනාධිපතිවරයාට බලය දී ඇත. මෙය වඩාත් පැහැදිලි වෙනවා පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 14 (b) වගන්තිය අනුව වේ. එහි සඳහන් වන්නේ " Subject as hereinafter provided no evidence of any statement made or given by any person to or before the Commission for the purposes of the Commission shall be admissible against that person in any action, prosecution or other proceedings in any civil or criminal court."

එසේම මෙම කොමිෂන් සභාව පත් කරන ලද 2019 සැප්තැම්බර් මස 21 වෙනි දින දරණ අංක 2141/88 දරණ ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති පරිදි ඉහත කී 14 වෙනි වගන්තිය මෙම කොමිෂන් සභාවට අදාළ විය යුතු බව ගරු ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කර ඇත. එසේ හෙයින් මෙම අබ්දුල් කාදර් ෆාතිමා හාදියාගෙන් මෙම කොමිෂම ඉදිරියේ ලබා ගන්නා යම් ප්‍රකාශයක් ඇයට විරුද්ධව අපරාධ හෝ සිවිල් අධිකරණයක භාවිතා කළ නොහැක. ඒ නිසා ඇයගෙන් මෙම කොමිෂන් සභාව සාක්ෂි ලබා ගැනීමෙන්, ඇගේ සාක්ෂියෙන් ඇයගේ අයිතිවාසිකම්වලට අගතියක් නොවේ. එනමුත් ඇගෙන් ලබා ගන්නා සාක්ෂිය අනුසාරයෙන් අන් තැනැත්තන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගය තීරණය කිරීමට කිසිම නෛතික බාධාවක් නොමැත. මෙම සාක්ෂිකාරිය මෙම කොමිෂන් සභාවට කැඳවීමේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ අද දින උදෑසන කරන ලද නියෝගයට අනුව අදාළ ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව ඉදිරියේ නොමැති, නමුත් ඇය විසින් මෙම කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ලබා දී ඇති ප්‍රකාශයේ සඳහන් වන ඉතා වැදගත් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි ලබා ගැනීමයි. කොමිෂන් සභා වාර්තාව ඉදිරිපත් කිරීමේදී මෙම සාක්ෂිකාරියගෙන් ලබා ගන්නා සාක්ෂි මත ඇය සම්බන්ධයෙන් කිසියම්ම හෝ නිර්දේශයක් කිරීම මෙම කොමිෂන් සභාව අදහස් නොකරයි. මෙකී තැනැත්තිය සම්බන්ධයෙන් නෛතිකව ගත යුතු ක්‍රියාමාර්ග ගරු නීතිපතිවරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් විමර්ශන අංශ විසින් කරන ලද විමර්ශනවලින් මතුවන කරුණුවලින් ලබා ගැනීමේ හැකියාව ඇත. මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය ලබා ගැනීම මඟින් පාස්කු දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයේ පසුපස තිබෙන සම්පූර්ණ විස්තරය හෙළිදරව් කර ගෙන ගරු ජනාධිපතිවරයාට ඉදිරිපත් කිරීම අපගේ ප්‍රධාන යුතුකමක් සහ වගකීමක් බව කොමිෂන් සභාවේ මතයයි. මෙහිදී විශේෂයෙන්ම කොමිෂන් සභාවේ අවධානය කොමිෂන් සභා පනතේ 07 (d) යන කාරණාව කෙරෙහි යොමු කරයි. එහි සඳහන් වන්නේ "This Commission shall have the power notwithstanding any of the provisions of the Evidence Ordinance to

FAIR COMMENT BY JEZEEM

admit any evidence whether written or oral which might be inadmissible in civil or criminal proceedings." යනුවෙනි. මෙම නෛතික ප්‍රතිපාදන තුළිනුත් මෙවැනි කොමිෂන් සභාවක එකම අරමුණ අධිකරණයක් ඉදිරියේ නඩු පැවරීමක් පමණක්ම නොවන බව පැහැදිලි වන බව අපගේ මතයයි. ඒ අනුව අබ්දුල් කාදර් ෆාතිමා හාදියා යන තැනැත්තිය සාක්ෂිකාරියක් වශයෙන් මේ අවස්ථාවේදී කැඳවීමට කොමිෂන් සභාවේ බහුතරය තීරණය කරයි.
ඒ අනුව, ඇය සාක්ෂියට කැඳවමු.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.10.23 වේලාව: ප.ව.01.15

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා, රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරුගේ නම : අබ්දුල් කාදර් ෆාතිමා හාදියා.
වයස : අවුරුදු 25
ජාතිය : මුස්ලිම්
ආගම : ඉස්ලාම්
ස්වාමිපුරුෂයාගේ නම : මොහොමඩ් කාසීම් මොහොමඩ් ජහරාන්.
ප්‍රතිඥා දෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

ප : හාදියා සිංහල කතා කරන්න පුළුවන්ද?
පි : ටිකක් තේරෙනවා.
ප : මම හාදියාගෙන් ප්‍රශ්න අහනවා. එතකොට මම කතා කරන දේ හාදියාට තේරෙන්නේ නැත්නම් මට කියන්න මං එතකොට පැහැදිලි කරලා අහන්නම්.
පි : හා
ප : ඒ වගේම අපේ උගත් කොමසාරිස්වරුනුත් හාදියාගෙන් ප්‍රශ්න අහයි.
පි : හරි
ප : හාදියාට මතකද 2019 අප්‍රේල් මාසේ 27 වෙනිදා හාදියාව ඉස්පිරිතාලේ අරන් ගියා?
පි : ඔව්.
ප : ඒ ඉස්පිරිතාලේ අරන් ගියාට පස්සේ හාදියාව අම්පාර පොලිසියෙන් හාදියාට යම් යම් චෝදනා කියලා දුන්නා මතකයිද?
පි : ඔව්.
ප : ඊට පස්සේ හාදියාගේ Statement එක, කටඋත්තරයෙන් ලිව්වා මතකයිනේ?
පි : ඔව්.
ප : ඊට පස්සේ හාදියාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට CID එකට භාර දුන්නා මතකයිනේ?
පි : ඔව්.
ප : එතකොට ඊයේ ගරු මහේස්ත්‍රාත් අධිකරණයට හාදියාව ඉදිරිපත් කරාත් මතකයිනේ?
පි : ඔව්.
ප : දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදීත් හාදියාගේ Statements ලිව්වා නේද?
පි : ඔව්.
ප : ඒ වෙලාවේත් ලියන කොට හාදියාට මෙන්න මේ චෝදනා තියෙනවා කියලා කියලා දුන්නා නේද?
පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : භාදියා අද දින දිවුරුම් දෙනකොට, Oath එක ගන්නකොට කිව්වා නේද භාදියාගේ මහත්තයාගේ නම ?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද සම්පූර්ණ නම?

පි : මොහොමඩ් කාසිම් මොහොමඩ් ජහරාන්.

ප්‍ර : ජහරාන්, භාදියා දන්නවද ෂැංග්‍රිලා හෝටලයේ සිදුකරන ලද බෝම්බ පිපිරීමෙන් මිය ගියා කියාල?

පි : ඔව් පස්සේ 21 , 11.30න් පස්සේ තමා දැන ගත්තේ.

ප්‍ර: : ඊට පස්සේ තමයි භාදියා දන්නේ ?

පි : ඔව්.

ප්‍ර : එතකොට භාදියා කොයි වෙලාවක හරි ඒ සහරාන්ව අඳුන ගන්න මොනවාහරි අවස්ථාවක් ලැබුණද?

පි : ඒ කිව්වේ miss අන්තිමට ද?

ප්‍ර : ඒ මැරුණට පස්සේ මොනවත් එහෙම අඳුන ගන්න සහරාන්ව?

පි : JMO Office එකට එක්ක ගියා.

ප්‍ර : JMO Office එකට ගෙනිච්චා නේද?

පි : ඔව්.

ප්‍ර : ඒ වෙලාවේ භාදියාට පුළුවන් වුණාද හඳුන ගන්න?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන්නේ ඒ දැක්ක මෘත ශරීරය body එක

පි : බෙල්ලයි ඔළුව.

ප්‍ර : ඒ ඔළුව සහරාන්ගේ කියලා හඳුනා ගත්තා නේද?

පි : ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේ දි සාක්ෂිකාරියව කොමිෂන් සභාවෙන් පිටත් කරයි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

ස්වාමිනි මේ අවස්ථාවේදී මා විසින් ඉතා කෙටියෙන් වුවද මෙම සාක්ෂිකාරිය වෙතින් විමසන ලද කරුණු අනුව ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් වී තිබෙනවා සාක්ෂිමය වශයෙන් සහ දිවුරුම් මත ඇයට මෙම සාක්ෂිකාරිය එරෙහිව තිබෙන චෝදනා සම්බන්ධයෙන් දැනුවත්ව සිටින බවත්, ඒවා විමර්ශකයින් විසින් සිය විමර්ශන අවස්ථාවලදී ඇයට කියවා පැහැදිලි කොට දී ඇති බවත්. ඒ වෙගේම ඇය තවදුරටත් සාක්ෂියේදී සඳහන් කරනු ලැබුවා ස්වාමිනි ෂැංග්‍රිලා හෝටලයේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මරාගෙන මැරෙන පළමු ප්‍රහාරකයා ලෙසට දැනට ගරු කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් වී තිබෙන මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් නැමැත්තාගේ හිස ඇය විසින් එම සිද්ධියට පසුව අධිකරණ නිලධාරී කාර්යාලයේ මෘත ශරීරාගාරයේදී හඳුනා ගන්නා ලද බව ඒ අනුව මෙකී කරුණු ගරු කොමිෂන් සභාව සලකා බැලීමේදී ස්වාමිනි ඇය සැකකාරියක් බවට තිබෙන කරුණු තවදුරටත් සනාථ වෙනවා. මා අද දින ඔබතුමන්ලාගේ ගරු අවධානයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඇයට එරෙහිව තිබෙන සාක්ෂි සංක්ෂිප්තව ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කොට ඇති ආකාරය පිළිබඳවත්, අදාළ චෝදනා සම්බන්ධයෙන් ඔවුන් එහි සිදු කොට ඇති සඳහන පිළිබඳවත් අවධානයට යොමු කරනු ලැබුවා. ඒ අනුව ස්වාමීනි නැවතත් මා ඔබතුමන්ලාගේ ගරු අවධානය වරින් වර සංශෝධිත කොමිෂන් සභා පනතේ 16 වන වගන්තියට යොමු කරමින් ඇය සම්බන්ධයෙන් යම් පියවරක් ඉදිරියට ගරු කොමිෂන් සභාව ගනු ලබන්නේ නම් ඇයගේ අයිතිවාසිකම් ඇයට එම වගන්තිය යටතේ ලබාදිය යුතු වන බව ඉතා ගෞරවයෙන් යොමු කොට සිටිනවා. ස්තුතියි ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : අතිරේක සොලිසිටර් ජෙනරාල්වරිය කොමිෂන් සභාව දැන ගන්න කැමතියි මාගේ නියෝගය කරලා ඉවරයි නමුත් මෙම ඉල්ලීම සම්බන්ධයෙන් මා දැන ගැනීම පිණිසයි අසන්නේ?

පි : එසේය ස්වාමිනි.

ප්‍ර : යම් කිසි සැකකරුවෙකු සම්බන්ධයෙන් ඇයට නීතිය අනුව නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීම සම්බන්ධව මෙම පනත් අනුව නෙවේ නීතිමය සංකල්පයක් අනුව යම් කිසි අයිතිවාසිකම් ලැබෙනවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව හෝ? යම් කිසි නීතිමය අයිතිවාසිකමක් යම් කිසි නීතිය අනුව දැන් ජනාධිපති කොමිෂන් සභා පනත හෝ අපරාධ නඩු විධාන සංග්‍රහය ඇරුණු විට වෙනත් නීතිමය සංකල්ප මත යම් පුද්ගලයකුගේ තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නීතිය ඉදිරියේ නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීමට අයිතිවාසිකම් ලැබිලා තිබෙනවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව හෝ..?

****

FAIR COMMENT — BY JEZEEM —

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

පි : Sir in terms of sub article 3 of article 13 relates to a situation where a person has been taken into custody where the liberty has been deprived of and then brought before the judge and where the person is charged with an offence…. This is how it is worded. "Any person charged with an offence shall be entitled to be heard in person or by an Attorney – at – Law at a fair trial by a competent court." That is how it is worded. But as per the CPC once a person is arrested the liberty is curtailed. So that arrest should be lawful. Otherwise you are violating a fundamental right. Once the person's liberty is curtailed in that manner it is now evident as per the Constitution that he has an audience, forget about the trial he should have an audience either where he himself would make submissions or through an Attorney – at – Law. So it's your choice whether to retain a lawyer or not. The ICCPR Act 56 of 2007 sub section b of section 4 reads as follows: "A person charged of a criminal offence under any written law shall be entitled to defend himself in person or through legal assistance of his own choosing and where he does not have any such assistance to be informed of that right." Now if we try to interpret the term and restrict its interpretation of being charged sir to a formal charge in a court of law then does it mean that until such stage although stages that he would pass that he cannot retain a lawyer. It is not so. So here the charge would be when you arrest a person, when you curtail the liberty of a person the arresting officer should inform that person of the charge, why am I arresting you, the reason. That is where he will be charged initially. Because if there is going to be a section 27(1) recovery that can only be done and will be admissible in a court of law if he knew what the charge against him was. So it is in that sense that I feel the word charged has to be interpreted.
ඒක නිසා මට හිතෙන්නේ ....

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

Q : Can you answer a direct question?

A : Sir?

Q : Does the Attorney General want this evidence to be led before the Commission or not? You give me a direct answer. I want a direct answer. I will tell you the reason. I have not gone on record but I am now going to go on record. No I want to go on record. From the time the statement of these people were sought to be recorded it was delayed as much as possible. The CID people did not bring the suspects to the Commission on the days specified.

A : This witness of course had certain health issues sir. She had some health issues.

Q : It so happened that on every day that we wanted the witness to come, I have being at that institution, every day that the witness was summoned, on one day she was produced before the hospital, on another date she had to be produced before the court.

A : Five days. Five days she had made statements sir.

Q : No that is from July

A : This is July, September, October

Q : Yes. But then prior to July several dates were given and many excuses were put forward to not bring the person to record a statement. It so happens that the period of the detention under the Prevention of Terrorism Act has lapsed and the person had to be produced before the court which then make the person a suspect. Up till that point of time she was not named as a suspect.

A : As I submitted in the morning sir she became a suspect on the 29th of August

Q : Yes that is the point that I am making. Up till that point of time she was not a suspect.

A : No no she was a suspect sir from that date. Now this is what I learnt today noh sir.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

Q : Additional Solicitor General from August she was a suspect. But I am talking about from January.

A : No she has been… no sir she had been arrested on the 29th of April 2019. You cannot arrest a person unless the charges are being read over. You cannot simply arrest because then it is illegal arrest. You have a right to know the reasons for your arrest. And also sir a D/O for 90 days had been obtained by the officers. Now if you do not set out those grounds you cannot obtain a D/O under the PTA for 90 days in that manner. So it is transparent. She had been arrested…

Q : My question is much more simple. If this person was a suspect at a very early stage then we record a statement in order to lead that person's evidence before the Commission. Why did the Attorney General wait until we recorded the statements and then take up the position?

A : Now Section 7 notice had been sent noh sir and if they don't come then she can be dealt with by the Commission. Now there is a legal issue that is there sir. Sir that is why the Attorney General had made representations and brought it to the kind attention of the Honorable Commissioners that if this evidence is led and if there is going to be any deviation from that because it is going to go on record and then the test of consistency once in a criminal trial is considered because when a witness's evidence is ascertained the test of credibility will be checked, evaluated. So the test of consistency will be a problem when there are several statements and specially when evidence has been given under oath.

කොමිෂන් සභාවේ කටයුතු පස්වරු 2.30 තෙක්, දිවා ආහාරය සඳහා කල් තබනවා.

දැන් වෙලාව: ප.ව.01.10

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

විවේකයෙන් පසු කොමිෂන් සභාව නැවත රැස්වේ.

වේලාව :ප.ව. 02.45

පෙර සටහන් : සවිනි මෙනවිය

මෙතැන් සිට :සවිනි මෙනවිය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ස්වාමීනි දිවා විවේකයට පෙර මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීම සඳහා කැඳවනු ලැබූ අබ්දුල් කාදර් ෆාතිමා හාදියා නැමැති තැනැත්තියගෙන් ඇය දිවුරුම් ලබාදුන්නාට පසු ඇයගෙන් මා විසින් ප්‍රශ්න කිහිපයක් අසනු ලැබුවා. ඒ අසනු ලැබූ ප්‍රශ්න අනුව ඇය පිළිගනු ලැබුවා ස්වාමීනි ඇයව 2019 අප්‍රේල් මාසේ 27 වැනිදාට පසුව අම්පාර පොලිසිය විසින් ඇයට චෝදනා කියවලා දීලා අත්අඩංගුවට ගනු ලැබූ බවත්, ඒ වගේම අනතුරුව ඇයව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද බවත් පසු අවස්ථාවකදී. එහි දී ද ඇයගේ ප්‍රකාශයන් වාර්තා කිරීමට පෙර ඇයට අදාළ චෝදනා කියවා දුන් බවත් ඇය දිවුරුම් මත සාක්ෂි දෙමින් සඳහන් කරනු ලැබුවා. ඒ වගේම මා විසින් ඇයගෙන් අසන ලද තවත් ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් ස්වාමීනි ඇය සඳහන් කරනු ලැබුවා ෂැංගිලා හෝටලයේ ප්‍රහාරය සිදුකරන ලද සහරාන් නැමැත්තා එම සිද්ධියට අනතුරුව ඇය විසින් අධිකරණ වෛද්‍ය නිලධාරී කාර්යාලයේ දී ඔහුගේ හිස හඳුනාගැනීම සිදුකරනු ලද බව. මේ අනුව ස්වාමීනි පෙනී යනවා ඇය මෙම 2019 අප්‍රේල් මස 21 වන දින සිදු කරන ලද ප්‍රහාරයන්හි එක් ප්‍රහාරයක් වූ ෂැංගිලා හෝටලයේ වූ ප්‍රහාරයෙහි ප්‍රහාරකයෙකු වූ සහරාන් හෂීම් ඇයගේ ස්වාමීපුරුෂයා වන බවත්, එසේම ඇය ඇයට එරෙහිව චෝදනා කියවලා දීලා අත්අඩංගුවේ සිටින බව ඇය දන්නා බවත්. ස්වාමීනි ඒ අනුව ඇය සැකකාරියක්ය යන කරුණ ඉතා මැනවින් ප්‍රත්‍යක්ෂ වෙනවා. මේ අනුව ස්වාමීනි මා නැවතත් ඔබතුමන්ලාගේ ගරු අවධාණය වෙත යොමු කරනවා මෙම කරුණු පදනම් කරගෙන විටින් විට සංශෝධිත කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව ඇයට නීති නියෝජනයක් ලබාගැනීම සඳහා හිමිකමක් තිබෙන බව අවධාරනය කරමින් එය ඉතා ගෞරවයෙන් ඔබතුමන්ලාගේ ගරු අවධානය වෙත මේ අවස්ථාවේ දී යොමු කර සිටිනවා ස්වාමීනි. එක් නීතිඥවරයෙක් හෝ කිහිපදෙනෙක් මඟින් මෙම විමසීමේ දී නීති නියෝජයක් ලබාගැනීමට. ස්තූතියි ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරිය විසින් කරන ලද කරුණු සම්බන්ධයෙන් මීට ප්‍රථම කොමිෂන් සභාව දැනටමත් නියෝගයක් කර

FAIR COMMENT BY JEZEEM

ඇති හෙයින් අදාළ සාක්ෂිකාරියගේ සාක්ෂිය කොමිෂන් සභාව ඉදිරියේ මෙහෙයවන ලෙසට උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරියට නියෝග කරමි. එසේම මේ අවස්ථාවේ දී වරින් වර සංශෝධිත කොමිෂන් සභා පනතේ 23 වන වගන්තිය යටතේ උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරිය ඇතුළු නීතිපති දෙපාර්තමේන්තුවේ අනෙක් නිලධාරින් මෙම කොමිෂමට පත් කර තිබෙන්නේ කොමිෂමේ සහායවීම සඳහා බව ප්‍රකාශිතව දක්වා ඇති හෙයින් කොමිෂන් සභාවේ නියෝගයට අනුව ක්‍රියා කරමින් සාක්ෂිකාරිය විසින් දැනටමත් කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට 2020.06.10 සහ 2020.06.12 වැනි දින ලබා දී ඇති ප්‍රකාශ උපයෝගී කරගෙන සාක්ෂිකාරියගෙන් සාක්ෂි මෙහෙයවන ලෙසට නියෝග කරයි.

නම : අබ්දුල් කාදර් ෆාතිමා හාදියා.
නැවත ප්‍රතිඥා දෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර: හාදියා අද දිවුරුම් දෙන කොට කිව්වා ලිපිනය address එක කියන කොට කැකුණගොල්ලේ කියලා?

උ: ඔව්.

ප්‍ර: කැකුණගොල්ලේ ඉන්නේ අම්මලා ගාවද?

උ: ඔව්.

ප්‍ර: හාදියාගේ පවුලේ කවුද ඉන්නේ?

උ: අයියලා 03 යි , නංගි, මල්ලියි.

ප්‍ර: මම අහන ඒවට ගරු කොමසාරිස්තුමන්ලා දිහා බලාගෙන උත්තර දෙන්න. එතකොට හාදියා ඉගෙන ගත්තේ මිශ්‍ර පාසලක කියලා මං කිව්වොත් ඒක හරිද Mix School එකක?

උ: ඔව්.

ප්‍ර: කොහේද ඉස්කෝලේ තිබ්බේ ?

උ: කැකුණගොල්ල Nation School එක.

ප්‍ර: කියට යනකන් ඒකේ ඉගෙනගත්ත ද?

උ: 09 වසර වෙනකන් ඉගෙන ගත්තා.

ප්‍ර: හාදියාට ඉන්නවද නැන්දලා ,මාමාලා , පුංචි අම්මලා, බාප්පලා?

උ: ඔව්.

ප්‍ර: අම්මට නංගිලා ඉන්නව ද ? අම්මට සහෝදර සහෝදරියෝ ඉන්නව ද?

උ: ඉන්නවා.

ප්‍ර: ඒ ගොල්ලොන්ගේ නම් මොනවද?

Presidential Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

උ: ඒ පළවෙනියා අම්මා. ඊට පස්සේ සිත්ති කුරෙයිසියා. අනිත් කෙනා අස්ලම්, මිස්වර් ,සිත්ති හාජරා, නිහාරා.

ප්‍ර: අම්මගේ නම මොකද්ද?

උ: සිත්ති සහිලා.

ප්‍ර: මොහොමඩ් ඊබ්‍රාහීම් නවුෆර් කියලා කියන්නේ ඔය කිව්ව සහෝදරියන්ගෙන් කොයි එක්කෙනාගේ මහත්මයද?

උ: සිත්ති හාජරාගේ.

ප්‍ර: දැන් කැකුණගොල්ලේ හාදියා ජීවත් වුණ අම්මලගේ ගෙදරට කොච්චර කිට්ටුවෙන් වගේද සිත්ති හාජරාලා හිටියේ?

උ: විනාඩි 05 ක්.

ප්‍ර: ඇවිදින දුර නේද?

උ: ඔව්.

ප්‍ර: ඒ නවුෆර් පිටරට රස්සාව කරලා තියෙනවද?

උ: ඔව්.

ප්‍ර: මොන රටේද?

උ: කටාර්.

ප්‍ර: මොනවද කළේ කියලා කියන්න හාදියා දන්නව ද?

උ: එයා අර lawyer ඒ ගොල්ලොන්ට Translation කරපු එක. ඒ විතරයි දන්නවා.

ප්‍ර: එතකොට එයා සැරින් සැරේ ලංකාවට ඇවිල්ලා ගියපු අවස්ථා තිබුණා නේද?

උ: ඔව්. අවුරුද්දට මාසයක් විතර එනවා. Vacation එකට.

ප්‍ර: කොච්චර කාලක ඉඳන් නවුෆර් කටාර් රාජ්‍යයේ හිටියද?

උ: මට මතකයි 2006 හරි ඒ කාලේ ගියා වගේ.

ප්‍ර: හාදියා ඉස්කෝලේ මිශ්‍ර පාසලකටනේ ගියා කියලා කිව්වේ?

උ: ඔව්.

ප්‍ර: ඒ වගේම 09 වැනි පන්තියට යනකන් තමයි ඉගනගත්තා කිව්වේ නේද?

උ: ඔව්.

ප්‍ර: හාදියා ඉගන ගන්න ආසයිද?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඇයි එහෙනම් 09 වැනි පන්තියට විතරක් ගියේ හාදියා ඊට වැඩිය දුරට ඉගෙන ගත්තේ නැත්තේ ඇයි?

උ: මං කැමති තිබුණා. ඒ කියන්නේ නවුෆර් බාප්පා එයා. එයාගේ යාළුවා තමයි සහරාන්. ඊට පස්සේ සහරාන් 2005 තමයි මාව දැක්කේ.

ප්‍ර: එතකොට හාදියට වයස කීයද?

උ: 2005 වෙන කොට මට අවුරුදු 10 යි.

ප්‍ර: දැන් ඔය සහරාන් දැක්කයි කියලා කිව්වනේ හාදියාව?

උ: ඔව්.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඔය සහරාන්ගේ සම්පූර්ණ නම අපිට කියනවද?

උ: මොහොමඩ් කාසීම් මොහොමඩ් ජහරාන්.

ප්‍ර: එයාට ජහරාන් කියලත් කියනව ද?

උ: ජහරාන් කියලා තමයි තිබුණේ. ඊට පස්සේ එයා ඒකට තේරුම් ජහරාන් කියන කොට වෙනස් කියලා සහරාන් කියනවා.

ප්‍ර: ඒ කොයි කාලෙ ඉඳලද සහරාන් කියන නම පාවිච්චි කරන්න ගත්තේ ?

උ: ඒ මං හරියට දන්නේ නැහැ. මං 2009 බැන්දට පස්සේ ඉඳලා මං සහරාන් කියලා කියනවා.

ප්‍ර: එතකොට දැන් භාදියාට අවුරුදු 10 දී තමයි සහරාන් භාදියාව දැක්කේ?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ මොකද වුණේ?

උ: ඊට පස්සේ මාව දැක්ක අනිත් දවසේ බාප්පලාට එයා කවුද කියලා ඇහුවේ. ඊට පස්සේ බාප්පා කියලා තියෙනවා මගේ පළවෙනි නෑනගේ දුව කියලා. ඊට පස්සේ එයා කිව්වලු එයාව මං proposal කරලා දෙන්න කියලා එයාව බඳින්න කියලා.

ප්‍ර: දැන් මේ අවුරුදු 10 යේ භාදියාව තමයි සහරාන් කසාද බඳින්න හදන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට සහරාන්ට වයස කියක් විතර ඇති ද?

උ: එතකොට එයාට 19 හෝ 18 ක් විතර.

ප්‍ර: එතකොට කොහේදිද භාදියාව සහරාන් දැකලා තියෙන්නේ?

උ: මං අර කුරාන් ඉගෙන ගන්න ගියාම.

ප්‍ර: ඒ කියන්නේ කැකුණගොල්ලෙද?

උ: කැකුණගොල්ලේ.

ප්‍ර: ඒ වෙලාවේ දැකලා?

උ: ඒ පල්ලියට තමයි සහරාන් ඇවිල්ලා හිටියේ. ඒකේ නිතර 2004 ඉඳලා නවුෆර් එයාව හම්බු වෙන්න එනවා.

ප්‍ර: නවුෆර්ව හම්බු වෙන්න සහරාන් 2004 විතර ඉඳන් එනවා?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔය භාදියා ගිය පල්ලියේ කුරාන් ඉගෙන ගන්න ගිය පල්ලියට තමයි මේ සහරාන් ඇවිල්ලා තිබුණේ?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ භාදියාව විවාහ කරගන්න කැමතියි කියලා බාප්පට කියලා තිබුණට පස්සේ සහරාන් මොකද වුණේ?

උ: ඊට පස්සේ බාප්පා අපේ අම්මගේ තාත්තට කියලා තිබුණා. සීයට. සීයා අම්මට කිව්වා. ඊට පස්සේ අම්මා අපේ තාත්තට කැමතිද කියලා. තාත්තා කිව්වා දැන් දුව 06 වසරේ එක්කෝ A/L ඉවරවුණාට පස්සේ හරි බැඳලා දෙන්න කියලා. ඒ කතාව අම්මා එයාගේ තාත්තටත් කිව්වා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ අවුරුදු 10 දී හාදියාට ඒ සහරාන් කැමති වුණාට හාදියාව බැනේඳ නැහැ නේද?

උ: නැහැ.

ප්‍ර: එතකොට A/L ඉවර වෙනකන් එහෙමනම් දැන් අද කිව්ව විදියට හාදියාට ඉගෙනගන්න බැරිවෙලා තියෙනවනේ?

උ: ඔව්.

ප්‍ර: ඒකට හේතුව මොකද්ද? A/L ඉවර වෙනකන් ඇයි ඉගෙනගන්න බැරි වුණේ?

උ: ඊට පස්සේ එයා 2009 ජපන් ගියා. ජනවාරි මාසේ.

ප්‍ර: දැන් හාදියානේ ඔය කියන දේ දන්නේ. එතකොට එයා මෙයා කියන්නේ නැතුව ඒ හැමෝටම නම කියලා කියන්න. හොඳද හාදියා?

උ: හරි. සහරාන් 2009 ජපන් යන්න ඕන කියලා නවුෆර්ට කියලා තිබුණා.

ප්‍ර: මොකටද යන්න හැදුවේ?

උ: ජපානයේ එකේ හෙරකෙයියා එකේ හයිදරිලි කියලා යාළුවෙක් ඉන්නවා. මෙයාට දේශනාවකට එන්න කියලා තිබුණා කියලා මාස 03 කට සහරාන් ගියා.

ප්‍ර: මොන වගේ දේශනාවකට ද?

උ: ඒක ඉස්ලාම් ඒ කියන්නේ ෂරියා, අකීදා කියලා තිබෙනවා. එහෙ ඒ කට්ටියත් ඉන්නවාලු ඒ ගොල්ලොන්ට Class වගේ කරන්න කියලා. සහරාන් ඒකට ගියා.

ප්‍ර: මේ 2009?

උ: 2009 ජනවාරි ගියේ.

ප්‍ර: ඊට පස්සේ?

උ: ඊට පස්සේ එයා ඇවිල්ලා තමා ලංකාවට ආවේ.

ප්‍ර: කොයි කාලෙද ආවේ?

උ: ඒ මාස 03 ඉවර වුණාම ලංකාවට ආවේ.

ප්‍ර: ඒ කියන්නේ 2009 ?

උ: 2009 මාර්තු මාසයේ 04 වැනි මුල වගේ.

ප්‍ර: ආවා?

උ: ඔව්.

ප්‍ර: ඒ ආවාට පස්සේ මොකද වුණේ?

උ: ඊට පස්සේ ඇවිල්ලා තමයි. බාප්පට. බාප්පා එතකොට කටාර් හිටියේ. එයාට කතා කරලා කිව්වා මෙහෙම තමයි මේ අවුරුද්දෙ බඳින්න ඕන. මං ආයි රට යන්න ඕන කියලා එයාව එක්ක යන්නම් කියලා තමයි එයා කිව්වේ. ඊට පස්සේ තමයි ආපහු සීයා ඉගෙන ගත්තා ඇති කියලා එයත් කිව්වේ.

ප්‍ර: දැන් රට යන්න තියෙනව කියලත් කිව්වා. එතකොට හාදියාව බන්දලා දෙන්න සීයලා පවුලේ අය ඔක්කොම කතා කෙරුවද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ මොකද වුණේ?

උ: ඊට පස්සේ 04 වැනි මාසේ අන්තිමේ මැයි මාසේ වගේ ඒ ගොල්ලොන්ගේ අම්මයි, තාත්තයි, සහරාන්, එයාගේ මල්ලියි ආවා කැකුණගොල්ලට. සීයලාගේ ගෙදර තමා ඇවිල්ලා හිටියේ. සෙනසුරාදා අපේ ගෙදරට ආවේ බලන්න. බලලා තමා තීරණය කරේ 10 වැනි මාසේ 16 බඳිනවා කියලා.

ප්‍ර: හාදියාව බඳිනවා කියලා තීරණය කරා 2009/10 වැනි මාසේ 16 වැනිදා?

උ: ඔව්.

ප්‍ර: ඉතින් දැන් ඒ අනුව විවාහ වුණා ද සහරාන් එක්ක?

උ: ඔව්.

ප්‍ර: කොහේදිද විවාහ වුණේ?

උ: කාත්තන්කුඩිවල.

ප්‍ර: කාගේ ගෙදරද?

උ: එයාගේ ලොකු අම්මාගේ දුවගේ ගෙදර. හවුමියා කියලා එක්කෙනෙක්.

ප්‍ර: හාදියා කැකුණගොල්ලේ කියලා කිව්වනේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට හාදියාගේ කවුරුත් කාත්තන්කුඩියේ ඉන්නවද?

උ: ඒකෙ ඉන්නේ පුංචි බැඳලා ඉන්නේ එහෙ කාත්තන්කුඩියේ.

ප්‍ර: දැන් ඔය විවාහයක් සිදු කරන කොට මුස්ලිම් ජන කොටියාශයේ සාමාන්‍යයෙන් මුස්ලිම් නීතිය යටතේ ඒ චාරිත්‍ර අනුවනේ කරන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට හාදියාගේ විවාහය වුණේ ඒ සාමාන්‍යයෙන් මුස්ලිම් චාරිත්‍ර අනුව කරන විවාහයක් විදියට ද?

උ: ඔව් මුස්ලිම් කරන විදියට තමයි.

ප්‍ර: නැත්නම් මොනව හරි යම් විශේෂ ඒ මුස්ලිම් ආගමේ යම් කොටියාශයක් විසින් කරන විදියකට ද ඒක වුණේ නැත්නම් සාමාන්‍ය මුස්ලිම් චාරිත්‍ර අනුවද?

උ: ඒ ඉස්ලාම් ආගමේ ඒ කියන්නේ ලොකු වුණාම අවුරුදු 12 ක් හරි 14 ක ඒ විදියට බඳින්න පුළුවන්. ඒ නිසා තමයි මං බැනේඳ.

ප්‍ර: එතකොට දැන් ඔය මේ දෑවැදි දෙන එක තියෙනවා නේද?

උ: ඔව්.

ප්‍ර: සාමාන්‍යයෙන් දෑවැද්දක් දෙන්න ඕනද කාන්තාව සැමියට Husband ට දෙන්න ඕනද?

උ: Husband තමා ගෑනු අයට දෙන්න ඕනේ.

ප්‍ර: ඒක මම කිව්වොත් හරිද තවුහිද් ජමාත් අනුව තමයි ඒ විදියට සිද්ධ වෙන්නේ කියලා?

FAIR COMMENT BY JEZEEM

උ: ඒ කියන්නේ තවුහිද් ජමාත් කියන්නේ ඒ අපේ නබිතුමා කියලා තියෙනවා වගේ කුරානය හදිසයේ හරියට අදහන කට්ටිය තමා තවුහිද් කියන්නේ. ඒ කියන්නේ වදින්න විදියක් වදින්න ඒ ඔක්කොම තියෙනවා. ඒ කියලා තියෙන්නේ නබිතුමාගේ කාලයේ ඒ ගොල්ලෝ බඳින කොට පිරිමි අය තමා ගෑනු අයට දීලා ඔක්කොම කරන්න ඕන කියලා.

ප්‍ර: ඒ කියන්නේ Husband තමයි Wife ට දෙන්නේ dowry එක ?

උ: ඔව්.

ප්‍ර: දැන් එතකොට දැන් හාදියා විවාහ වෙනකොට හාදියාද දුන්නේ සහරාන්ට dowry එක නැත්තම් සහරාන්ද හාදියාට දුන්නේ?

උ: සහරාන් දුන්නා.

ප්‍ර: සහරාන් දුන්නා එතකොට දැන් කීදෙනෙක් විතර ආවද ඔය විවාහ උත්සවයට?

උ: ඒ engage එකට සිකුරාදා දවසක ඒකට එයාගේ යාළුවෝ ඔක්කොම 420 ක වගේ කට්ටිය ඇවිල්ලා හිටියා.

ප්‍ර: කට්ටිය ආවා ඒ කියන්නේ ලොකු Wedding එකක් නේද?

උ: ඔව්.

ප්‍ර: දැන් එතකොට ඕකට වියදම් කරේ කවුද?

උ: ඒත් සහරාන් තමයි.

ප්‍ර: සහරාන් තමයි වියදම් කරේ හොඳයි. විවාහ වුණාට පස්සේ කොහේද පදිංචි වෙන්න ගියේ හාදියා? කැකුණගොල්ලට ගියාද නැත්නම් ඔය කාත්තන්කුඩියට ගියාද?

උ: ඒ කාත්තන්කුඩියේ තමා හිටියේ .

ප්‍ර: සහරාන්ගේ අම්මාලා තාත්තලා මොන ප්‍රදේශයක පදිංචි අයද?

උ: ඒ ගොල්ලෝ කාත්තන්තුඩියේ නව කාත්තන්කුඩියේ.

ප්‍ර: නව කාත්තන්කුඩියේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඒ ගෙදරද පදිංචියට ගියේ?

උ: ඔව්.

ප්‍ර: ඒ ගෙදර වෙන කවුද හිටියේ හාදියා?

උ: ඒ ගෙදර එයාගේ මල්ලි රිල්වාන්, සෙයිනි, මදනියා, හිදායා.

ප්‍ර: නංගිලා දෙන්නයි මල්ලිලා දෙන්නයි. ඒ ගොල්ලනුත් එක්ක තමයි දැන් මේ හාදියාත් ගිහිල්ලා පදිංචි වුණේ?

උ: ඔව්.

ප්‍ර: හරි. කොච්චර කාලයක් ඔහොම හිටියද?

උ: එහේ මාස 03 ක් විතර හිටියා අම්මලත් එක්ක ඊට පස්සේ සහරාන් වෙන කුලියට ගෙයක් ගත්තා.

ප්‍ර: කොහෙද ඒ ගත්තේ?

FAIR COMMENT — BY JEZEEM —

උ: ඒ ගත්තේ නව කාත්තන්කුඩි Fisheries Road එකේ.

ප්‍ර: ඒ කියන්නේ අම්මලාගේ ගෙදරින් ගිහිල්ලා දැන් වෙනත් ගෙදරක කුලියට ගත්තා Rent එකට ගත්තා?

උ: ඔව්.

ප්‍ර: එතන කොච්චර දවස් හිටියද?

උ: ඒ ගෙදර මාස 07 ක් 08 ක් විතර ඒ ගෙදර හිටියේ.

ප්‍ර: එතකොට හාදියයි සහරානුයි තමයි ඒ ගෙදර හිටියේ?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ හාදියා ඔය ගෙදර මාස 07 ක් විතරනේ හිටියා කිව්වේ?

උ: ඒ දිගටම මාස 07 කිව්වේ මාස 07 කට ඒ ගෙදර හිටියා.

ප්‍ර: ඔව්. ඊට පස්සේ?

උ: මාසේ එක මාසයක් එහේ හිටිය නම් සති 02 ක් 03 ක් අම්මලයි ගෙදර යනවා.

ප්‍ර: හාදියා යනවා කැකුණගොල්ලේ?

උ: ඔව්.

ප්‍ර: ආයි එනවා?

උ: කාත්තන්කුඩි.

ප්‍ර: සහරාන්ගේ කාත්තන්කුඩි ගෙදරට. ඊට පස්සේ?

උ: ඊට පස්සේ ඇවිල්ලා තමා මාවනැල්ලට ගියේ.

ප්‍ර: මාවනැල්ලේ කොහෙද හිටියේ?

උ: මාවනැල්ල ගනේතැන්න.

ප්‍ර: ගනේතැන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔය කැකුණගොල්ලේ ඉඳන් ගනේතැන්නට කොච්චර දුරද?

උ: පැය දෙකක් විතර.

ප්‍ර: ගනේතැන්නේ කොහෙද හිටියේ?

උ: ඒ සහරාන්ගේ යාළුවගේ ගෙදර තිබුණා කියලා එහේ ඇවිල්ලා ඉන්න කියලා කිව්වේ. ඒ පල්ලියෙන් දේශනාව O/L,A/L ලියන කට්ටියට Class එකක් දේශනා කරන්න කියලා තමා එහෙට ගියේ.

ප්‍ර: ඒ නිසා තමයි මාවනැල්ලට ගියේ? හරි දැන් ඔය කරපු යම් දෙයක් ගැන කිව්වනේ හාදියා. ඒ නිසා මම කැමතියි දැනගන්න අර විවාහ වෙලා කාත්තන්කුඩියේ ඉන්න කාලේදී සහරාන්ට ගෙදරට සල්ලි ගේන්න එයා සල්ලි හම්බකරේ කොහොමද?

උ: එහේ පල්ලියේ හිටියා KTJ කියලා මාසයක විතර එතන තිබ්බා. ඒකේ ඉන්න කට්ටිය තමා සල්ලි එකතු කරලා එයාට දුන්නේ.

ප්‍ර: ඔව්. එයා මවුලවී කෙනෙක් විදියට හිටියද සහරාන්?

උ: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මවුලවී විභාගේ එහෙම Pass වෙලාද?

උ: ඔව්.

ප්‍ර: එතකොට දැන් හාදියාව විවාහ කරගන්න කොටත් සහරාන් මවුලවී කෙනෙක්ද?

උ: ඔව්.

ප්‍ර: එතකොට දැන් පල්ලියේ අය සල්ලි එකතු කරලා සහරාන්ට දුන්නයි කිව්වා?

උ: ඔව්.

ප්‍ර: ඒ මොනවටද?

උ: එයාට වියදම් කරන්න එයාගේ

ප්‍ර: ඒ කියන්නේ ඒ පල්ලියට එන අයද සල්ලි එකතු කරලා දෙන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔය කාත්තන්කුඩියේ හිටිය මුළු කාලයේදීම ඒ වගේද සල්ලි හම්බකර ගත්තේ?

උ: එයයි ඊට කලින් අර දාරුල් අදර් කියන පල්ලියේ තමයි වැඩ කරේ.

ප්‍ර: ඔව් දාරුල් අදර් පල්ලියේ කොච්චර කාලයක් සහරාන් වැඩ කළාද?

උ: ඒකේ 2006 ඉදලා මට හරියට මතක නෑ 2006 ඉඳන් 2009 වෙනකම් එයා වැඩ කළේ.

ප්‍ර: ඔව්. ඒ කියන්නේ හාදියාව බැන්දට පස්සේ දාරුල් අදර් පල්ලියේ තමයි සහරාන් වැඩ කළේ?

උ: ඔව්.

ප්‍ර: මවුලවී කෙනෙක් විදියට. ඊට පස්සේ සාෆි මවුලවීගේ ගෙදර කිට්ටුව පල්ලියකට එහෙම ගියාද?

උ: ඔව්. එයාගේ පල්ලිය නෙමෙයි Rent එකේ හිටියේ එයා එයාගේ ගේ ඉස්සරහා පොඩියට ඉඩමක් තිබ්බා. ඒ ඉඩමේ තමයි කට්ටිය ගිහින් වඳින්නේ එහෙම කරන්නේ දේශනාව. ඒකට ඒ පොඩි ඉඩමේ අතනම ඇවිල්ලා කට්ටිය ඇවිල්ලා වැඳලා යනවා ඊට පස්සේ ඒ ගොල්ලන් කතා කරේ කට්ටිය වෙන ඉඩම් ගන්න ඕනේ කියලා ඊට පස්සේ තමා කට්ටිය ඔක්කොම එකතුවෙලා සල්ලි දීලා ඉඩම් ගන්න ඕන කියලා තීරණය කළේ.

ප්‍ර: ඊට පස්සේ ඒ ඉඩම ගත්තද?

උ: ඔව්.

ප්‍ර: කාගේ නමටද ගත්තේ ඒ ඉඩම?

උ: ඒ ඉස්සෙල්ලා ගත්තේ ගෆූර් මාමා කියලා එයාගේ නමට ගත්තේ.

ප්‍ර: කවුද මේ ගෆූර් මාමා කියන්නේ හාදියා?

උ: එයා කාත්තන්කුඩියේ ඒ සෙයිනිගේ මාමා.

ප්‍ර: සෙයිනිගේ මාමා වෙනවනම් එතකොට

උ: ඒ එයාගේ දුව අෆ්රින් එයා බැඳලා ඉන්නේ සෙයිනි

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: සෙයිනි බැඳපු නෝනගේ තාත්තා තමයි මේ ගපූර් මාමා කියන්නේ? එයාගේ නමට තමයි මේ ඉඩම ගත්තේ?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ඒ ඉඩමේ තමයි පල්ලිය හැදුවේ?

උ: ඔව්.

ප්‍ර: ඒ පල්ලිය හදන්න සල්ලි කොහෙන්ද?

උ: ඒ හදන්න ඉඩමක් ගත්තා ඉස්සෙල්ලා ඊට පස්සේ

ප්‍ර: ඉඩම ගන්න සල්ලි?

උ: ඒ පල්ලියට ආව කට්ටිය තමා ටිකෙන් ටික දාලා ඒ ගොල්ලෝ ගත්තේ. ඊට පස්සේ ඒ ගොල්ලෝ එළිය, අකුරණ, මාවනැල්ල, ගනේතැන්න ඒ වගේ ගොඩක් ඉඩම් තවුහිද් කට්ටිය හිටියා. ඒ ගොල්ලෝ තමයි මෙහෙම පල්ලියට ඉඩම් ගන්න ඕන කියලා අර ගොල්ලන් සල්ලි ඒ සහරාන්ට දීලා තිබුණේ. ඒ සල්ලි ඔක්කොම එකතු කරලා තමයි අර ඉඩම ගත්තේ.

ප්‍ර: දැන් ඉඩම අරගත්තා. එතකොට දැන් ඕකේ පල්ලිය හදන්න ඕනනේ. එතකොට ඒ පල්ලිය හදන්න සල්ලි කොහෙන් හරි හම්බුණාද?

උ: ඊට පස්සේ 2015 සිංගප්පුරුවේ ඉඳලා භාජා නජීමුදීන් කියලා එක්කෙනෙක් ආවේ

ප්‍ර: භාජා නජීමුදීන් ?

උ: ඔව්. එයා ඇවිල්ලා ඉස්සෙල්ලා පල්ලිය බලලා ගියා. දවස් 03 ක් ලංකාවේ හිටියේ ඊට පස්සේ ගිහිල්ලා ආපහු 2016 ආවේ. ඇවිල්ලා තමා සල්ලි ලක්ෂ 50 ක් දෙන්නම් කියලා කිව්වේ. ඒ ලක්ෂ 50 ට තමා ඒ ගොල්ලෝ ලොකුවට හදන්නේ.

ප්‍ර: එතකොට මේ හදන්නේ තවුහිද් ජමාත් පල්ලියක් ද තබ්ලික් ජමාත් පල්ලියක්ද?

උ: ඒ හදන්නේ තවුහිද් ජමාත් පල්ලියක්.

ප්‍ර: එහෙනම් අපි තව ඉස්සරහට යන්න ඉස්සර වෙලා භාදියාට පැහැදිලි කරන්න පුළුවන්ද තවුහිද් ජමාත් පල්ලියක තියෙන වෙනසයි තබ්ලික් ජමාත් පල්ලියේ තියෙන වෙනසයි?

උ: ඔව් පුළුවන්.

ප්‍ර: කියන්නකෝ?

උ: ඒ කියන්නේ ආගම් ඉස්සෙල්ලා හදන්න විදියක් තියෙනවා ඒ කියන්නේ වඳින්න විදිය.

ප්‍ර: කොහොමද වදින්නේ?

උ: ඒ කියන්නේ වදින කොට ඒ ඉස්සෙල්ලා අපි Wash කරන්න ඕන අපි. ඒ Wash කරන විදිය තියෙනවා.

ප්‍ර: Wash කරන්නේ මොනවද?

උ: ඒ කියන්නේ අත තුන්පාරක් විතර හොඳට හෝදන්න ඕන. ඊට පස්සේ නහය ඇතුළට වතුර දාලා කටත් එක්ක එහෙම Wash කරනවා. ඊට

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පස්සේ මුහුණ හොඳට Wash කරාට පස්සේ ඊට පස්සේ තුන්වැනි පාර අතත් හෝදන්න මේවා කරන්න. ඊට පස්සේ ඔළුව සමහර අය තබලික් අය ඔහොම කරනවා. සමහර අය තවත් කට්ටියත් ඉන්නවා. ඒ ගොල්ලො ඒ විදියට කරනවා. තවුහිද් එකේ හොඳට ඔහොම පිටිපස්ස වෙනකන් අත ගිහිල්ලා ආපහු තමා කනේ සෝදන්නේ.

ප්‍ර: හාදියා මට තේරුණේ නැහැ අන්තිමටම කියපු එක. තවුහිද් අය කරනවා කියලා?

උ: තවුහිද් අය කරන්නේ සම්පූර්ණ ඔළුව ඔහොම Wash කරනවා.

ප්‍ර: එතකොට ගැහැණු අයත් එහෙම කරනවද?

උ: ඔව්. ගැහැණු පිරිමි ඔක්කොමලා එක වගේ තමයි.

ප්‍ර: ඔක්කොමල්ලා කරනවා?

උ: ඔව්.

ප්‍ර: එතකොට තවුහිද් එකේ ගියා වුණත් තබලික් පල්ලියට ගියා වුණත් ගැහැණු අය එහෙම කරනවා ?

උ: ඔව්.

ප්‍ර: පිරිමි අයත් එහෙම කරනවා?

උ: ඔව්.

ප්‍ර: එතකොට දැන් එතකොට වතුර පාවිච්චි කරන්නේ කොහොමද ඔය පල්ලි දෙකේ?

උ: ඒ පල්ලි දෙකේ අපි පයිප්ප වලින් තමයි පාවිච්චි කරන්නේ. තවුහිද් කට්ටිය.

ප්‍ර: ඒ කියන්නේ තවුහිද් කට්ටිය පල්ලිවල මොකෙන්ද පාවිච්චි කරන්නේ?

උ: ටැප් එකෙන්.

ප්‍ර: ටැප් එකෙන් තමයි පාවිච්චි කරන්නේ?

උ: ඔව්. අනිත් තබලික් ජමාත් පල්ලිවල තියෙන්නේ හවුල් වගේ අර කියන්නේ ටැංකි වගේ. ඒ ගොල්ලො ඔක්කොම ඒකේ ඇතුළේ තමා Wash කරගන්නේ.

ප්‍ර: ඇයි එතකොට තබලික් අයට පල්ලියකුයි තවුහිද් ඒ ගොල්ලොන්ට ටැප් එකකුයි තියෙන්නේ?

උ: ඒ කියන්නේ ආයේ අපි Wash කරන වතුර ඒකට කොහොම හරි ඒකට ඇතුලට යනවා. ඒ වතුර ආයේ එහෙම කරොත් අර වඳින්න එක හරි කියනවා.

ප්‍ර: ඒ නිසා මේ පිරිසිදුව ඉන්න තමයි මේ එක එක්කෙනාට වෙන වෙනම වතුර තියෙන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ටැප් එකෙන් ගන්න පුළුවන්?

උ: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: එතකොට පල්ලිය ඇතුළට ගියාම ගැහැණු අය ගියාම ඒ ගොල්ලොන්ට මේ හැමදාම යන්න පුළුවන් ද තවුහිද් පල්ලියකට?

උ: ඔව් හැමදාම යන්න පුළුවන්.

ප්‍ර: එතකොට තබ්ලික් එකේ පල්ලිවලට යන ගැහැණු අයට හැමදාම යන්න පුළුවන් ද ඔය තවුහිද් අය යන විදියට පල්ලිවලට?

උ: ඒ ගොල්ලො එහෙම යන්නේ නැහැ.

ප්‍ර: ඇයි ඒ?

උ: ඒ හේතුව මං හරියට දන්නේ නැහැ.

ප්‍ර: ඒ ගොල්ලො කොච්චර කාලයකට සැරයක් ද යන්නේ?

උ: ඒ ගොල්ලො යන්නේ අවුරුද්දට නෝම්බි මාසේ ඒ කාලෙට වඳින්න යනවා.

ප්‍ර: ඒ කාලෙට ඒ ගොල්ලො විශේෂයෙන් යනවා?

උ: ඔව්.

ප්‍ර: දැන් පල්ලිය ඇතුළට ගියාට පස්සේ තවුහිද් ගැහැණු අය පිරිමි ඒ ගොල්ලොත් එක්ක එකට ඉන්නව ද නැත්නම් පැත්තකින් ඉන්නව ද පිටිපස්සෙන් ඉන්නව ද කොහොමද ඉන්නේ?

උ: ඒ කියන්නේ ඉස්සෙල්ලා පිරිමි අය වාඩි වුණාට පස්සේ තමා ටිකක් දුරකින් ගැහැණු අය ඉන්නේ.

ප්‍ර: එතකොට තබ්ලික් ඒ ගොල්ලොන්ගේ පල්ලියේ?

උ: අර ටෙන්ට් එක වහනවා ගැහැණු අයට වෙනමයි පිරිමි අයට වෙනමයි.

ප්‍ර: ටෙන්ට් එකක් දානවද?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඉස්සරහා ඉන්නේ ගැහැණු අයද පිරිමි අයද?

උ: පිරිමි අය.

ප්‍ර: ගැහැණුඅය ඉන්නේ ඒ ටෙන්ට් එකට පිටුපස්සෙන්?

උ: ඔව්.

ප්‍ර: ටෙන්ට් එක කියලා කියන්නේ මේ ලොකු කර්ටන් එකක් වගේ එකක්ද?

උ: ඔව්.

ප්‍ර: එතකොට හාදියා කිව්වා එක අවස්ථාවකදී ගනේතැන්නට ගියා කියලා පදිංචියට යාළුවෙක්ගේ ගෙදරට?

උ: ඔව්.

ප්‍ර: ඒ වගේම පල්ලියට ගිහිල්ලා ළමයින්ට ඉගැන්නුවා කියලා කිව්වා සහරාන්?

උ: ඔව්.

ප්‍ර: මොන වයස්වල ළමයින්ටද ඉගැන්නුවේ? මොනවද ඉගැන්නුවේ?

උ: ඒ O/L ලියලා අර මාස 03 ක් ඉන්න කට්ටියටයි.

ප්‍ර: ඒ කියන්නේ ඉස්කෝලේ යන්නෙ නැතුව ඉන්න කට්ටිය?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔව්. ඒ වගේ A/L ලියලා ඉවර වෙච්ච කට්ටියටයි. සෙනසුරාදා ඉරිදා දවස්වල උදේ ඉඳලා 05.00 , 05.30 වෙනකන් Class එක තියෙනවා.

ප්‍ර: මොනවද Class එකේ ඉගැන්නුවේ සහරාන් හාදියා?

උ: ඒ කියන්නේ අපේ ආගම ෂරියා, අකිදා කියලා තියෙනවා. ඒ පාඩම තමයි ඒ ගොල්ලන්ට ඉගැන්නුවේ.

ප්‍ර: මොකද්ද මේ අකිදා කියන්නේ?

උ: ඒකේ ඉස්සෙල්ලා වදින විදිය. ඊට පස්සේ වදිනව නම් කොහොමද ඒ වදින්න ඕන කියලා. කවුද ඒකට වියදම් කරන්නේ එහෙම කියලා . ඒ වගේ තව ගොඩක් තියෙනවා දේවල්.

ප්‍ර: එතකොට ඔය වදිනවා කියලා කිව්වාහම හාදියාට කියන්න පුළුවන් ද දැන් ඔය අත් දෙක තියා ගන්න විදියක් තියෙනවා නේද?

උ: ඔව්.

ප්‍ර: තවුහිද් ඒ ගොල්ලො කොහොමද අත් දෙක තියා ගන්නේ?

උ: ඒගොල්ලො අර කියන්නේ අන්තිමට වැඳලා ඉවරවෙලා ඉස්සෙල්ලා කියන්නේ අත් දෙක ඔහොම කරගෙන ඔහොම තමා කරන්නේ තවුහිද් අය.

ප්‍ර: ඒ කියන්නේ ඇඟිල්ල?

උ: ඇඟිල්ල දික් කරගෙන ඔහොම කරනවා. තබ්ලික් ඒ ගොල්ලො නිකන් ඔහොම කරන්නේ. ඔහොම උස්සනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකාරිය විසින් එම වැදුම් පිළිවෙත සිදුකරන ආකාරය කොමිෂන් සභාවට පෙනෙන ලෙස ඇඟිලි සොලවා පෙන්නු බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර: ඒ වගේම හාදියා අපි දැකලා තියෙනවා සමහර වෙලාවට අර අත් දෙක එකතු කරලත් තියෙනවා නේද?

උ: ඒ ඉස්සෙල්ලාම වදින කොට අත් දෙකම ඔහොම කරගෙන තමයි වදින්න ඕන. ඒ කියන්නේ පපුවේ. තවුහිද් කට්ටිය පපුව උඩින් තමයි ඔහොම වදින්නේ.

ප්‍ර: තවුහිද් ඒ ගොල්ලො පපුව උඩින් තමයි අත් දෙක තියෙන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට තබ්ලික් ඒ ගොල්ලො?

උ: තබ්ලික් අය බඩේ එතැන්ට තමයි තියෙන්නේ.

ප්‍ර: දැන් ඔය සහරාන් අර O/L කරලා ඉවර අයටයි A/L කරලා ඉවර අයටයි ඉගැන්නුවේ මේ ආගම විතරම ද හාදියා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔව්.

ප්‍ර: ඒ ආගමේ මොන මොනවද ඉගැන්නුවේ? අකිදා ඉගැන්නුවා කියලා කිව්වා.

උ: ඔව් අකිදා කියලා තියෙනවා. ඒ වගේ තරුපියා කියලා තියෙනවා.

ප්‍ර: මොකද්ද තරුපියා කියන්නේ?

උ: තරුපියා කියන්නේ අර ගැහැණු අය ඒ ගොල්ලොන්ටම අර පිරියඩිස් හදන විදිය. ඊට පස්සේ කොහොමද ඒ ගොල්ලො වඳින්න ඕන. අර බබා හම්බ වුණාට පස්සේ ඒ ගොල්ලොන්ට කොහොමද කියලා ඒවා තමා තරුපියා කියන්නේ.

ප්‍ර: එතකොට එහෙනම් මේ O/L සහ A/L කරපු ළමයි ගැහැණු අයයි පිරිමි අයයි දෙගොල්ලොම ඔය පන්තිවලට ආවද?

උ: නැහැ.

ප්‍ර: එහෙනම්?

උ: පිරිමි අයට රෑට ගැහැණු අයට උදේ ඉඳලා හවසට සෙනසුරාදායි ඉරිදායි විතරයි.

ප්‍ර: ඒ කියන්නේ මේ දෙකොට්ඨාශයටම ඔය Groups දෙකටම ඉගැන්නුවා නමුත් ඒ ගොල්ලොන්ගේ පන්ති ගත්ත වෙලාවල් වෙනස් ඒකයි මේ කියන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔය ගනේතැන්නෙදි සහරාන් ඉගැන්නුවේ ගනේතැන්න පල්ලියේ විතරද නැත්නම් ඒ අවට පල්ලිවලටත් ගියාද?

උ: ඒ පල්ලියට තමා එයා එන්න කියලා තිබුණේ.

ප්‍ර: ඒක තවුහිද් පල්ලියක් ද?

උ: තවුහිද් පල්ලියක්.

ප්‍ර: තවුහිද් පල්ලිවලට යන අය තබ්ලික් පල්ලිවලට යන්නේ නැද්ද හාදියා?

උ: ඒ දැන් කොහේහරි යන ගමන් අර තබ්ලික් පල්ලියේ ගිහිල්ලා වඳිනවා. නමුත් ඒ ගොල්ලෝ වඳින වෙලාව ගිහිල්ලා ඒ ගොල්ලොන්ගේ පිටුපස්සේ ගිහිල්ලා වඳින්නේ නැහැ. ඒ ගොල්ලො තනිවම වඳිනවා.

ප්‍ර: මං ඇහුවේ සහරාන් ඔය ගනේතැන්නේ පල්ලිය ඇරෙන්න ඒ ප්‍රදේශයේ තියෙන වෙනත් පල්ලිවලට ගියාද උගන්වන්න කියලා?

උ: ඔව්.

ප්‍ර: ඒ ඉගැන්නුවෙත් ඔය අකීදායි ?

උ: ඒ අකිදායි තරපියායි තමයි ඉගැන්නුවේ.

ප්‍ර: එතකොට ඔය පිට ප්‍රදේශවල නුවරඑළිය, නාවලපිටිය ඒ වගේ පළාත්වලට ගියාද?

උ: ඔව් ගියා.

ප්‍ර: ඒ ගියෙත් ඔය ගනේතැන්නේ පදිංචිවෙලා ඉන්න ගමන්?

උ: ඔව්.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒවයි ඉගැන්නුවේ මොනවද ?

උ: ඒ ගිහිල්ලාත් ඒවා තමා ඉගැන්නුවේ. අකීදායි තරබියායි.

ප්‍ර: දැන් ඒ කියන්නේ ආරධානා එනවද සහරාන්ට ඒ වගේ තැන්වලට එන්න කියලා?

උ: ඔව්.

ප්‍ර: ඒ යන හැම පල්ලියක්ම තවුහිද් පල්ලියක්ද?

උ: ඔව්.

ප්‍ර: ඒ හැම තැනකින්ම සහරාන්ට මුදල් ලැබුණ ද මෙහෙම උගන්වනවට ?

උ: ඒ කියන්නේ යන්න එන්න වියදම් දෙනවා.

ප්‍ර: එතකොට කොහොමද ජීවත් වුණේ හාදියාලා?

උ: මාවනැල්ල පදිංචි එහෙ ඉන්න කොට ඒ පල්ලියෙන් තමයි එයාට දුන්නේ.

ප්‍ර: අනිත් තැන්වල යන්න එන්න වියදම් විතරයි දෙන්නේ? නමුත් මේ මාවනැල්ල පල්ලියෙන් තමයි එයාට සල්ලි දෙන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔය හැම තැනකම මවුලවී කෙනෙක් විදියට ද වැඩ කරේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔය කාලය තුළදී සහරාන් අකුරණ, බලන්ගොඩ, ගෙලිඔය වගේ තැන්වලටත් ගියාද?

උ: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ ලංකාවේ ගොඩාක් පළාත්වලට ගිහිල්ලා තියෙනවා?

උ: ඔව්.

ප්‍ර: ඒ ගියාම සති අන්තයට එන්නේ නැද්ද ගෙදර?

උ: එහෙ සමහර දවස්වලට සිකුරාදා ගියොත් සඳුදා එනවා. සෙනසුරාදා ගියොත් ඉරිදා රෑට ඔහොම එනවා.

ප්‍ර: එතකොට හාදියා මොකද කරන්නේ ?

උ: කාත්තන්කුඩි ඉන්න කොට එයාගේ අම්මලාගේ ගෙදර ඉන්නවා. නැත්නම් එයා මාව අම්මලාගේ ගෙදර ගිහින් දාලා එයත් යනවා.

ප්‍ර: කැකුණගොල්ලේ දාලා යනවා සහරාන්?

උ: ඔව්.

ප්‍ර: ඔය ගනේතැන්නේ ඉඳලා කොහාටද ගියේ ඊට පස්සේ ?

උ: ඒ ගෙදර ඉඳන් අකුරණට යනවා.

ප්‍ර: අකුරණ ගෙදරක පදිංචි වෙන්න ගියාද?

උ: නැහැ නැහැ. එහෙ සහරාන් විතරයි ගිහිල්ලා එන්නේ දේශනාවලට.

ප්‍ර: දැන් අපි ආයිමත් හාදියායි සහරානුයි පදිංචි වෙලා හිටපු තැන් බැලුවොත් කාත්තන්කුඩියේ ඉඳලා දැන් එනවා කාත්තන්කුඩියේ තැන්තැන්වල පදිංචිවෙලා ඉඳලා ඊට පස්සේ එනවා ගනේතැන්නට?

උ: ඔව්.

ප්‍ර: ගනේතැන්නේ කොච්චර කල් හිටිය ද?

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

උ: ඒකේ මාස 06 ක 07 ක විතර හිටියේ.

ප්‍ර: ඊට පස්සේ ?

උ: මං බබා හම්බු වෙන්න හිටියේ පළවෙනි පුතා.

ප්‍ර: පුතාව හම්බු වෙන්න හිටියා?

උ: ඔව්. ඊට පස්සේ මං අම්මලාගේ ගෙදර ගියා.

ප්‍ර: පුතාව හම්බවුණේ කවද්ද?

උ: 2011/10/30

ප්‍ර: බබා හම්බවුණාට පස්සේ කොහාටද ගියේ?

උ: කාත්තන්කුඩියට.

ප්‍ර: කාත්තන්කුඩියට ආපහු ගියා?

උ: ඔව්.

ප්‍ර: කාත්තන්කුඩියට ගිහිල්ලා කොහේද පදිංචි වුණේ?

උ: ඒ කියන්නේ නව කාත්තන්කුඩියේ Fisheries Road එකේ තමා.

ප්‍ර: සාෆි මවුලවීගේ ගෙදර කිට්ටුවද?

උ: ඔව්.

ප්‍ර: සාෆි මවුලවී මොනව කරන කෙනෙක් ද?

උ: එයා ඉලෙක්ට්‍රෝනිකල් හදනවා .

ප්‍ර: දැන් එතකොට මේ වෙනකල් හාදියා කියලා තියෙනවා සහරාන් හම්බ කෙරුවේ පල්ලිවල වැඩ කරලා දේශනා කරලා කියලා?

උ: ඔව්.

ප්‍ර: එතකොට නැවත කාත්තන්කුඩියට ගියාට පස්සේ පල්ලිවල වැඩ කරාද සහරාන් ?

උ: වැඩ කරා.

ප්‍ර: මොන පල්ලියේද?

උ: ඊට පස්සේ NTJ නැෂනල් තවුහිද් ජමාත් ඒකේ.

ප්‍ර: කොහේද කාත්තන්කුඩියේ?

උ: ඔව්. කාත්තන්කුඩියේ.

ප්‍ර: ඒකට ගෙවීමක් ලැබුණ ද සහරාන්ට?

උ: එයා ඒකෙත් කරා. ඊට පස්සේ ත්‍රීවීල් එකක් ගත්තා.

ප්‍ර: ඒ ත්‍රීවිල් එක ගන්න කාගෙන් හරි සල්ලි හම්බවුණාද?

උ: ඒයා සිට්ටුවක් දාලා තිබ්බා. ඊට පස්සේ ඒවත් එකතු කරලා එයාගේ යාළුවන්ගෙන් ටික ටික දීලා තමයි ඒ ත්‍රීවිල් එක ගත්තේ.

ප්‍ර: ඒකට පිටරටින් සල්ලි එහෙම ආවේ නැද්ද?

උ: එයාට භාජා නජීමුදීන් කියලා සිංගප්පූරුවේ කෙනෙක් හිටියා. එයා එයාට සල්ලි දීලා තිබ්බා.

ප්‍ර: අර ඉස්සෙල්ලා ලක්ෂ 50 ක් දුන්නයි කිව්ව එක්කෙනා?

උ: ඒ පස්සේ තමා ලක්ෂ 50 දුන්නේ. ඊට ඉස්සෙල්ලා ලක්ෂ 05 ක් දුන්නේ.

ප්‍ර: එතකොට ඔය ත්‍රීවිල් එක ගත්තේ ඒ සිංගප්පූරුවේ ඉන්නවා නේද නිජීබ්?

Presidential Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

උ: ඔව්.
ප්‍ර: එයා එවපු සල්ලිවලින් නෙවෙයිද?
උ: ඒකෙන් තමයි ගත්තේ.
ප්‍ර: ඉඩම් එහෙම ගත්ත ද ඔය කාලෙදිය සහරාන්?
උ: ඔව්.
ප්‍ර: කොහේද ගත්තේ ඉඩම්?
උ: ඒ කාත්තන්කුඩි පාලමුනෙයි.
ප්‍ර: පාලමුනෙයි?
උ: ඔව්.
ප්‍ර: කොච්චර විතර ඉඩම් ප්‍රමාණයක් ගත්තද?
උ: එහෙ ඉඩම් මතක නැහැ කියද කියලා. ඒ ලක්ෂ විසිපන්දාහක් විතර දීලා ගත්තේ.
ප්‍ර: එක් ලක්ෂ විසිපන්දාහක් විතර දීලා තමයි ගත්තේ?
උ: ඔව්.
ප්‍ර: ඉතිං දැන් මේ වෙනකන් හාදියා කියලා තියෙන සාක්ෂිය අනුව විවාහ වුණාට පස්සේ හාදියයි සහරානුයි තැන් තැන්වල එක එක ගෙවල්වල තමයි පදිංචි වෙලා ඉඳලා තියෙන්නේ නේද?
උ: ඔව්.
ප්‍ර: එතකොට හාදියටයි සහරාන්ටයි වෙනම ගෙයක් හදන්න කල්පනා කරගත්තේ නැද්ද?
උ: ඒ කාලේ එහෙම ඉඩමක් විතරයි ගත්තේ.
ප්‍ර: ඉඩම විතරයි ගත්තේ?
උ: ඔව්.
ප්‍ර: ඉතිං හැමදාම කුලියට ද හිටියේ?
උ: ඔව්.
ප්‍ර: හැබැයි ගොඩාක් කාලයක් කිසිම තැනක නැවතිලා හිටියේ නැහැ නේද?
උ: නැහැ. අවුරුද්දයි ඔහොම තමයි එක එක කුලියට හිටියේ.
ප්‍ර: ඇයි ඒ?
උ: එහෙම අවුරුදු දෙකක් තුනක් ලියන්නේ නැහැ කට්ටිය. අවුරුද්දකට විතර ලියලා දෙනවා. ඒ අවුරුද්දෙන් පස්සේ වෙන ගෙයක් මාරු කරනවා.
ප්‍ර: කුලියට ලියලා දෙන්නේ ඒ වගේ කෙටි කාලයකට ඒ නිසා ඒ කාලේ ඉවර වුණාම තව ගෙදරකට යනවා. ඒකයි මේ කරේ ?
උ: ඔව්.
ප්‍ර: සහරාන් කොයි වෙලාවක හරි අර ත්‍රීවීල් එකේ ළමයි ඉස්කෝලේ එහෙම ගෙනිච්ච ද?
උ: ඔව්.
ප්‍ර: ඒ ගෙනිච්චේ සල්ලිවලට ද?
උ: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නිකන් transport එකක් වගේ කෙරුවේ?

උ: ඔව්.

ප්‍ර: ත්‍රීවිල් එකේ ළමයි ඉස්කෝලෙට ගෙනිහිල්ලා ඒ හම්බ කරපු සල්ලි ඒ වගේම පල්ලිවල දේශනා කරලා ඒ හම්බ කරපු සල්ලි ඇරෙන්න වෙන මුකුත් ව්‍යාපාරයක් business එකක් කාරද?

උ: එයාගේ තාත්තත් එක්ක සල්ලි දීලා වැඩ කරේ.

ප්‍ර: එයාගේ තාත්තගේ නම මොකද්ද?

උ: මොහොමඩ් හුසේන් මොහොමඩ් කාසීම්.

ප්‍ර: තාත්තගේ නම මොකද්ද සහරාන්ගේ?

උ: අච්චි මොහොමදු මොහොමදු කාසීම්.

ප්‍ර: එතකොට අම්මගේ නම මොකද්ද?

උ: අබ්දුල් කාදර් සිත්ති සමීමා.

ප්‍ර: කොයි වෙලාවක හරි හාදියාගේ බාප්පා නවුෆර්යි සහරානුයි තරහ වුණ අවස්ථාවක් තිබ්බද?

උ: ඔව්.

ප්‍ර: ඒ මොන අවුරුද්දේ වගේද?

උ: ඒ 2009.

ප්‍ර: මොන හේතුවකට ද තරහ වුණේ කියලා මතකයිද හාදියාට?

උ: ඔව් මතකයි.

ප්‍ර: මොකටද තරහ වුණේ?

උ: 2009 සහරාන් දාරුල් අදර් පල්ලියේ හිටියා. ඒ ඉන්න කාලේ තමයි සහරාන් ජපාන් ගියේ.

ප්‍ර: ඒ කියන්නේ 2009 ජනවාරිනේ ගියා කියලා කිව්වේ?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ 2009 මාර්තුවල ආපහු ආවා කිව්වා?

උ: ඔව්.

ප්‍ර: ඒ වගේම හාදියාව 2009 ඔක්තෝම්බර් මාසේ 16 වැනිදා බැන්දා කියලා කිව්වා?

උ: ඔව්.

ප්‍ර: එතකොට කොයි කාලෙද එහෙනම් ඔය නවුෆර් එක්ක තරහ වුණේ?

උ: ඒ කියන්නේ සැප්තැම්බර් මාසේ තමයි ඒ දෙන්න තරහා වුණේ.

ප්‍ර: ඒ කියන්නේ හාදියාව විවාහ කරගන්න ඉස්සරවෙලාද?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඒ විවාහයට ආවේ නැද්ද නවුෆර්?

උ: එයා ආවේ නැහැ. එයාගේ නෝනා ආවා.

ප්‍ර: නෝනා ආවා නවුෆර් ආවේ නැහැ?

උ: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ තරහ හින්ද ද ආවේ නැත්තේ නැත්නම් ලංකාවේ නැති නිසාද ? තරහා හින්දා ආවේ නැහැ?

උ: තරහා හින්දා තමා. ඊට කලින් එනවා කියලා තමයි කියලා තිබුණේ. ඊට පස්සේ එයා ආවේ නැහැ තරහා වුණාට පස්සේ.

ප්‍ර: ඉතිං දැන් ඔය තරහා දෙන්නා කොයි වෙලාවක හරි යාළු වුණා ද හාදියා?

උ: ඔව්.

ප්‍ර: ඒ කොයි කාලෙද?

උ: 2016.

ප්‍ර: ඒ කියන්නේ 2009 ඉඳන් 2016 වෙනකන් නවුෆර්යි සහරානුයි තරහා වෙලා හිටියා කියලද හාදියා කියන්නේ?

උ: ඔව්.

ප්‍ර: 2016 යාළු වෙන්න හේතු වුණේ මොකද්ද?

උ: 2016/07 වැනි මාසේ ඊට පස්සේ නවුෆර් ලංකාවට ආවේ. නෝම්බි කාලයේ.

ප්‍ර: නෝම්බි අරින්න ආවා නවුෆර් ලංකාවට?

උ: ඔව්. ඊට පස්සේ අයියගේ wedding එක තිබුණා. ඒ ගෙදරට එයාගේ නෝනයි එයාගේ පුතයි අපේ ගෙදරට ඇවිල්ලා කිව්වා අද හවසට නෝම්බි අරින්න එයාගේ ගෙදරට එන්න කියලා.

ප්‍ර: එහෙම චාරිත්‍රයක් තියෙනව ද නෝම්බි අරින කොට දැන් අවුරුද්දකට සැරයයිනේ නෝම්බි අල්ලන්නේ නේද?

උ: ඔව්.

ප්‍ර: එතකොට නෝම්බි දවසේ අරින කොට නෝම්බි කාලය ඉවරවෙලා අත අරින කොටද නෝම්බි ?

උ: ඒ කියන්නේ පාන්දර 04.30 ඉඳලා ඒ වෙලාවට තමයි කාල අල්ලන්නේ නෝම්බි.

ප්‍ර: මම අහන්නේ හාදියා දැන් සාමාන්‍යයෙන් මාසයක් විතර තියෙනවා නේද ඔය නෝම්බි කාලේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඔය නෝම්බි ඉවර වුණාට පස්සෙත් festival එකක් තියෙනව නේ?

උ: ඔව්.

ප්‍ර: දැන් ඔය ඒ වගේම පාන්දර ඕක අතහැරලා කෑම කාලා ඔයගොල්ලන් නැවත නෝම්බි අල්ලනව නේ?

උ: ඔව්.

ප්‍ර: ඒ සාමාන්‍යයෙන් දවස ගතවන විදිය?

උ: ඒ මාසෙට දිගටම අල්ලනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඔය දිගටම අල්ලමින් ඉන්න අවස්ථාවේ ද නවුෆර් එන්න කියලා කිව්වේ සහරාන්ටයි හාදියාටයි ඒ ගොල්ලන්ගේ ගෙදර නෝම්බි අරින්න එහෙම නැත්නම් මේ නෝම්බි කාලය ඉවර වුණාට පස්සේ ද?

උ: නැහැ ඒ නෝම්බි කාලයේ තමා.

ප්‍ර: ඒ නෝම්බි කාලයේමයි එන්නේ කිව්වේ?

උ: ඔව්.

ප්‍ර: ඒ අනුව ගියාද හාදියායි සහරානුයි?

උ: ඔව් ගියා.

ප්‍ර: ඉතිං මොකද වුණේ ඊට පස්සේ?

උ: ඊට පස්සේ තමා ඒ ගොල්ලො ආයි යාළු වුණේ.

ප්‍ර: මේ 2016?

උ: 2016.

ප්‍ර: 2016 ජූලි මාසේ 07?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ඒ වන කොට කොහේද පදිංචි වෙලා හිටියේ හාදියලා?

උ: මම කාත්තන්කුඩියේ තමයි හිටියේ.

ප්‍ර: කාත්තන්කුඩියේ ඉඳලා එතකොට ?

උ: අම්මලාගේ ගෙදරට ආවා මේ කැකුණගොල්ල.

ප්‍ර: මේ නෝම්බි අරින්න ආවේ?

උ: නැහැ නිකන් අම්මලාගේ ගෙදර ඇවිල්ලා හිටියා.

ප්‍ර: ඒ ඇවිල්ලා ඉන්න කොට තමයි මේ ආරාධනාව හම්බ වුණේ?

උ: ඔව්.

ප්‍ර: ඒ අනුව තමයි ගියේ නවුෆර්ගේ ගෙදරට?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ කොයි වගේද නවුෆර්යි සහරානුයි අතර තිබුණු සම්බන්ධය ?

උ: ඊට පස්සේ ඒ ගොල්ලො නිකන් කතා බහ කරගෙන හිටියා. ඊට පස්සේ තමා 10 වැනි මාසේ හෝ 08 වැනි මාසේ හරියට ඒ මාසේ මතක නැහැ. ඒ මාසෙක හරි තමයි නවුෆර් කාත්තන්කුඩි ඇවිල්ලා හිටියේ. ඇවිල්ලා සහරාන්ට කතා කරලා pen drive එකක් දීලා තිබුණේ.

ප්‍ර: නවුෆර් දීලා තිබුණා සහරාන්ට pen drive එකක්?

උ: ඔව්.

ප්‍ර: ඒ දෙදාස් ?

උ: 2016.

ප්‍ර: කොහොමද දන්නේ හාදියා නවුෆර් දීලා තිබුණා කියලා pen drive එකක් සහරාන්ට?

උ: ඒ pen drive Lap එකේ තිබුණේ සහරාන්ගේ NTJ පල්ලියේ Office එකේ. ඒ Lap එක අරගෙන ගෙදරට ඇවිල්ලා හිටියා.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කවුද එහෙම ගෙනාවේ ?

උ: සහරාන් තමා ගෙනාවේ.

ප්‍ර: එතකොට හාදියා කොහොමද ඒක ගැන දැනගත්තේ?

උ: ඒ ගෙදරින් ඉන්න කොට තමා. සහරාන් අර pen drive එක අරගෙන Lap එකෙන් videos බලමින් සිටියේ.

ප්‍ර: මොන වගේ විඩියෝද සහරාන් බැලුවේ?

උ: පිටරටවලින් බෙල්ල කපන විඩියෝ තියෙනවා. Firing විඩියෝස් තිබුණේ. ඒ වෙලාවේ තමයි මම බැලුවේ. ඒ වෙලාවේ එයාට කවුද දුන්නේ කියලාත් මං ඇහුවේ.

ප්‍ර: දැන් ඒක ඒ කියන්නේ හාදියා ඒ විඩියෝ එක දැක්ක ද?

උ: ඔව් මං ඒ විඩියෝ එක දැක්කා.

ප්‍ර: ඒක දැක්කාම හාදියාට මොකද්ද හිතුණේ?

උ: මං එයාට ඉස්සෙල්ලා ඇහුවා මේ මොනවද කියලා. එයා කිව්වා පිටරටවලින් යුද්ධ විඩියෝ කියලා. ඊට පස්සේ කවුද ඔයාට දුන්නේ කියලා. නවුෆර් මවුලවී දුන්න කියලා එයත් කිව්වා නිකන් බලන්න කියලා.

ප්‍ර: දැන් එතකොට ඔය 2016 නේ?

උ: ඔව්.

ප්‍ර: 2016 වෙන කොට පුතාට අවුරුදු 05 ක් වෙනව නේද? 2011 ඔක්තෝම්බර් මාසේනේ පුතා ඉපදුණේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට මේ 2016 වෙන කොට වයස කියක් වෙනවද පුතාට?

උ: අවුරුදු 05 ක්.

ප්‍ර: එතකොට දැන් ඔය වගේ දෙයක් සහරාන් ඒ කියන්නේ තාත්තා ගෙදර බලනවා පුතා දැක්කොත් එහෙම ?

උ: මං එයාට කිව්වා ඒ වේලාවේම.

ප්‍ර: මොකද්ද කිව්වේ?

උ: ඇයි එහෙම විඩියෝ බලන්නේ කියලා. පුතාලා එහෙම බැලුවොත් ඒ ගොල්ලො එහෙම කරයි දන්නෙත් නැහැ පොඩි ළමයි ඒ ගොල්ලො. එහෙම කිව්වට පස්සේ එයා මම නිකන් තමයි ඒක බැලුවේ ආයි බලන්නේ නැහැ කියලා එයා Lap එක අරගෙන එයා හවස පල්ලියට ගියා.

ප්‍ර: ඊට පස්සේ හාදියා දැකලා තිබුණ ද සහරාන් ඒ වගේ විඩියෝ ඒ කියන්නේ බෙල්ල කපන පින්තූර තියෙන ඒ වගේ විඩියෝ ගෙදර බලනවා?

උ: ඊට පස්සේ ඒ ගෙදර බලන්නේ නැහැ.

ප්‍ර: ගෙදරදි බලන්නේ නැහැ?

උ: නැහැ.

Presidential Secretariat Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: කොච්චර කාලයක් ඔය වගේ කාත්තන්කුඩියේ පදිංචි වෙලා හිටිය ද? ඒ අවස්ථාවේ ගියාට පස්සේ?

උ: එහෙ 2017. මාර්තු මාසේ 10 වැනිදා වෙනකන් මං කාත්තන්කුඩියේ හිටියේ.

ප්‍ර: මොකද්ද මේ 2017 මාර්තු 10 කියෙන වැදගත්කම? ඇයි හාදියා එහෙම දිනයක් ගැන කිව්වේ එදා වෙනකන් හිටියා කියලා කාත්තන්කුඩියේ ඔය අවස්ථාවේ ගියාට පස්සේ?

උ: ඒ කියන්නේ 2017 මාර්තු 10 වැනිදා එයාගේ දේශනාවක් තිබුණා.

ප්‍ර: කොහේද තිබුණේ?

උ: ඒ තිබුණේ කාත්තන්කුඩියේ අලියාර් හන්දියේ.

ප්‍ර: ඒ කියන්නේ සහරාන්ගේ දේශනයක් තිබුණේ?

උ: ඔව්. සහරාන්ගේ දේශනාවක් තිබුණේ. ඒ දේශනාවට ඒ කියන්නේ ඒ පැත්තෙන් අර හෙරොයින් ඒවා පාවිච්චි කරන කට්ටිය තමයි ඒ හිටියේ.

ප්‍ර: මොනවා පාවිච්චි කරන ?

උ: හෙරොයින් ඒ වගේ දේවල් තමයි ඒ ගොල්ලො පාවිච්චි කරේ. ඒ නිසා එතන්ට තමයි දේශනාව කරන්න ඕන කියලා ඒ කියන්නේ වහාබි කට්ටිය තමයි අතන්ට හිටියේ.

ප්‍ර: වහාබිස්ලා කොහේද හිටියේ?

උ: ඒ ගොල්ලො ඒ පැත්තේ තමා අලියාර් සන්ධියේ අර පැත්තේ තියෙන්නේ. ඊට පස්සේ අතන්ට තමා සහරාන් දේශනාවට ගිහිල්ලා තිබුණේ. ඒ යන්න කලින් සහරාන් කාත්තන්කුඩි පොලිසියේ ඒ ඉඩමක් බලන්න කියලා ඒ ගොල්ලොන්ට permission එකක් ඔක්කොම ගත්තා.

ප්‍ර: ඒ කියන්නේ කලින් පොලීසියට දැනුම් දීලා තිබ්බා සහරාන් ඒ වගේ දේශනයක් කරන්න යනවා කියලා?

උ: ඔව්.

ප්‍ර: ඒකට permission ගත්තා?

උ: ඔව්. සතියට කලින් පොලිසියට ගිහිල්ලා ඒ ගොල්ලො පෙන්නලා තමා ඔක්කොම permission ගත්තේ.

වේලාව:ප.ව.03.45
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දැන් වේලාව : ප.ව.3.45
පෙර සටහන් ල/ලේ : සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ : නිල්මිණි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: සහරාන් ඔය වගේ තැන් තැන්වල දේශනා කරනවාට කාත්තන්කුඩියේ හැමෝම කැමැත්තක් තිබ්බද නැත්නම් කවුරුහරි විරුද්ධ වුණාද ඔය වැඩේට ?

පි: ඒ කියන්නේ ගොඩක් අය අනිත් අය එයාට උදව් කරනවා. ඒ කියන්නේ හොඳ දේවල් කියන ඒවට උදව් කරනවා කියලා තමයි අර පැත්තේ කට්ටිය කියනවා.

ප්‍ර: කොයි පැත්තේද?

පි: කාත්තන්කුඩියේ. අනිත් කට්ටිය ඒගොල්ලන් ඒකට සමහර කට්ටිය

ප්‍ර: කවුද මේ අනිත් පැත්ත කියලා කියන්නේ?

පි: ඒ වහාබිසම් කට්ටියයි තබ්ලික් ජමාත් අයයි

ප්‍ර: තබ්ලික් ජමාත්ලා මේ සහරාන් මේ කරන දේශනා ඒ කියන්නේ තවුහිද් ජමාත් එකේ එකට විරුද්ධයි. ඒකයි මේ කියන්නේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන්. මේ නිසා ඒ දෙපාර්ශ්වය අතර ඒ පැති 2 අතර ගැටුම් තිබුණද Fight තිබුණද?

පි: ඔව්.

ප්‍ර: ඒ Fights කරන කොට ඒගොල්ලෝ අතින් පයින්ද ගහගත්තේ නැත්නම් ආයුධවලින්ද කොහොමද වුණේ ඒක?

පි: මං ආයුධවලින් දැක්කේ නැහැ. දෙපැත්තම රණ්ඩු වුණා ඉස්සරලා වහාබිසම් කියලා ඒ පැත්තේ ඉඳලා තමයි ගල් ගහලා විසික් කරේ කියලා කිව්වේ. ඊට පස්සේ රතිඤ්ඤා දාලාලු. ඊට පස්සේ මේගොල්ලොන්ට යන්න කියලා කිව්වාලු. ඊට පස්සේ ඒ වෙනකම් පොලිසිය ඇවිල්ලා හිටියේ නැහැ. ඊට කළින් සහරාන්ගේ දේශනා තිබුණොත් 4.30, 5.00 වෙනකොට පොලිසියෙන් ආරක්ෂාව දෙනවා එයාට. පොලිස් 4ක් හරි 5ක් හරි දෙනවා. එදා එයාට පොලිසියෙන් ඇවිල්ලා හිටියේ නැහැ. ඊට පස්සේ දෙපැත්තටම රණ්ඩු වෙනකොට තමයි 6.30 වෙද්දි තමයි පොලිසියෙන් ඇවිල්ලා හිටියේ. එතකොට දෙපැත්තේම තුවාල තිබුණා.

ප්‍ර: දැන් ඔය දේශනාව තිබුණ තැන අලීයාර් හන්දිය කියලා කිව්වානේ?

පි: ඔව්.

ප්‍ර: ඒ තැන දැක්කොත් හඳුනා ගන්න පුළුවන් වෙයිද හාදියාට අපි පින්තූරයක් පෙන්නුවොත් හඳුනා ගන්න පුළුවන්ද?

පි: පුළුවන්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: අපි එහෙනම් පස්සේ ඒක බලමු හාදියා. එතකොට 2017 තමයි ඔය මාර්තු මාසේ 10වෙනිදා ඔය දේශනාවට ගියා කියලා කිව්වේ සහරාන්?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ඔය දෙපාර්ශවය අතර එදා ගැටීමක් මොකක්හරි ඇති වුණාද Fight එකක් ගියාද ?

පි: ඒ Fight එක ගියා.

ප්‍ර: දැන් එහා පැත්තේ ඒගොල්ලෝන් වහාබිස්ලා කියලා කවුද කියන්නේ?

පි: ඒ කියන්නේ අතුරොෆ් කියලා ඒගොල්ලෝන් කට්ටිය එක්ක Fight

ප්‍ර: ඒ කියන්නේ සහරාන්ලාද කියන්නේ ඒගොල්ලන් වහාබිස්ලා කියලා?

පි: ඒගොල්ලන්ට අත්වයිබ වහබිස් කියලා කියනවා.

ප්‍ර: දැන් ඔය Fight එකෙන් පස්සේ මොකද වුණේ?

පි: ඊට පස්සේ කට්ටිය hospital දෙපැත්තේම තුවාල වනු කට්ටිය hospital ගෙනිච්චා.

ප්‍ර: ඒගොල්ලන් තුවාල වෙච්ච අයව hospital ගෙනිච්චා?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ සහරාන් ගෙදර ආවාද?

පි: ඊට පස්සේ සහරාන් ගෙදර ආවේ නැහැ.

ප්‍ර: කාත්තන්කුඩියේ ගෙදර ආවේ නැහැ මේ හාදියා ඉන්න ගෙදරට?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ හාදියා මොකද කළේ?

පි: ඊට පස්සේ මම call එකක් ගත්තා එයාට. එයා කිව්වා මං පස්සේ ගන්නම් කියලා ඉස්සෙල්ලා කිව්වේ. ඊට පස්සේ ටික වෙලාවක් ගියාට පස්සේ එයා කිව්වා ප්‍රශ්නයක් මං මෙහේ ඉඳලා යනවා කියලා.

ප්‍ර: කොහේද යනවා කියලා කිව්වේ?

පි: ඒ තැනක් කිව්වේ නැහැ. ඊට පස්සේ මම ආයෙත් call එකක් ගත්තා රෑ වෙනකොට. මං කිව්වා මම තනියම මේ ගෙදර ඉන්න මට බයයි. ළමයි දෙන්නත් එක්ක. ඊට පස්සේ මම කිව්වා මං අපේ අම්මලා, අයියාට කියලා මං ගෙදරට යන්නම් කියලා.

ප්‍ර: ඒ කියන්නේ කැකුණගොල්ල ගෙදරට යන්නම් කියලා මේ අහන්නේ සහරාන්ගෙන් ?

පි: ඔව්.

ප්‍ර: එතකොට සහරාන් මොකද කිව්වේ?

පි: මොකක් හරි කරන්න කියලා එයා කිව්වා.

ප්‍ර: ඉතින් මොකද හාදියා කළේ?

පි: ඊට පස්සේ මං අයියාට call එක ගත්තා.

ප්‍ර: මොන අයියටද දැන් අයියාලා දෙන්නෙක් ඉන්නවානේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්. අබ්දුල් කාදර් මොහොමඩ් හසීම්. ඒ අයියාට තමයි මම call එක ගත්තේ. ඊට පස්සේ අයියාට මම කිව්වා මේ ප්‍රශ්නේ මස්සිනා එන්නේ නැහැ කියලා කියනවා. මාව ඇවිල්ලා ගෙදරට එක්ක යන්න කියලා. ඒවෙලේම අයියා රෑ බස් එකේ නැඟලා ආවේ කාත්තුන්කුඩියට.

ප්‍ර: ඒ කියන්නේ මේ 10 වෙනිදාම රෑ 2017 මාර්තු 10 වෙනිදාම දැන් අයියා කැකුණගොල්ලේ ඉඳලා බස් එකේ ආවා?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ?

පි: ඇවිල්ලා එයා එනවා කියලා කිව්වා ඊට පස්සේ. සහරාන් එයාගේ phone එකේ charge ඉවරයි කියලා. ඊට පස්සේ කිව්වා phone එක ගන්න එක්කෙනෙක් එයි කියලා කිව්වේ. Phone එක දෙන්න කියලා. මං අයියාට කිව්වා phone එක මං එයාට දෙනවා. ඔයා එන්න ඉන්න කියලා කිව්වේ එයාව මං අර ගෙදරට. ඊට පස්සේ phone එක ගන්න 10.30 විතර එක්කෙනෙක් මුහුණ වහගෙන හෙල්මට් එකකින් තමයි බයික් එක ආවේ. ඇවිල්ලා දොරට තට්ටු කළා. ඊට පස්සේ මම phone එක එයාට දුන්නා.

ප්‍ර: ඒ කියන්නේ ගෙදරට ආපු එක්කෙනාට phone එක දුන්නා?

පි: ඔව්.

ප්‍ර: ඒ ආවේ කවුද?

පි: ඒ කවුද කියලා අදුරන්න බැහැ.

ප්‍ර: නමුත් දැන් හාදියාගේ අර phone එක දුන්නා ඒ කෙනාට?

පි: ඔව්.

ප්‍ර: ඒ දුන්නේ ඔය කියන විදියට සහරාන් කිව්ව විදියටද?

පි: ඔව්.

ප්‍ර: දැන් අයියා ආවාද ගෙදරට?

පි: ඔව්. ඊට පස්සේ පාන්දර අයියා 6 වෙනකොට ආවා. ඇවිල්ලා එයා වාඩි වෙලා හිටියේ නැහැ. ඒවෙලාවෙම ආපහු බස් එකේ ගියා.

ප්‍ර: ඊට පස්සේ හාදියා අයියා එක්ක කැකුණගොල්ලේ ගෙදරට ගියාද?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ හාදියා පදිංචි වෙලා හිටියේ කැකුණගොල්ලේ ගෙදරද?

පි: ඊට පස්සේ අම්මලා ගෙදර තමයි හිටියේ.

ප්‍ර: ඔය වෙනකොට හාදියාට හිටියේ අර 2011 ඔක්තෝබර් මාසේ ඉපදුණ පුතා විතරද?

පි: දුවත් හිටියා.

ප්‍ර: දුවව කොයි කාලේද හම්බවුණේ?

පි: 2015.07.07

ප්‍ර: 2015?

පි: 2015.07.07 වෙනිදා.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී සාක්ෂිකාරිය සංවේදි වූ බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: හාදියා දැන් හාදියා විවාහ වෙලා කාත්තන්කුඩියට ආවාට පස්සේ මතකද සහරාන් කවුරුහරි දේශපාලඥයෙක්ට ඒ කියන්නේ political party එකකට උදව් කරනවා?

පි: ඔය දේශපාලන පැත්තේ ඉඳලා උදව් ඕනිද කියලා.

ප්‍ර: කවුද ඇහුවේ?

පි: හිස්බුල්ලා.

ප්‍ර: හිස්බුල්ලා කාගෙන්ද ඇහුවේ? නැත්නම් සහරාන් හිස්බුල්ලාගෙන් ඇහුවාද හිස්බුල්ලා සහරාන්ගෙන් ඇහුවද?

පි: හිස්බුල්ලා සහරාන්ට ඇහුවේ.

ප්‍ර: මොනවද ඇහුවේ?

පි: ඔයගොල්ලන් පල්ලි හදන්න උදව් කරන්නද නැත්නම් මොකක් හරි බඩු අරන් දෙන්නද කියලා.

ප්‍ර: කියලා සහරාන්ගෙන් ඇහුවා?

පි: ඔව්.

ප්‍ර: සහරාන් මොකද කිව්වේ?

පි: සහරාන් කිව්වා උදව් ඕනි නැහැ මට එහෙම කියලා ඉස්සෙල්ලා කිව්වේ.

ප්‍ර: දැන් ඔය මොන අවුරුද්දේ වගේද?

පි: ඒ කියන්නේ 2015 , 2014 වගේ.

ප්‍ර: හරි. ඔය හරියේ නේද ශිබ්ලි ෆාරුක් එහෙමත් හිටියේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට ශිබ්ලි ෆාරුක් සහරාන්ව දැනගෙන හිටියද ශිබ්ලි ෆාරුගෙන් සහරාන්ට උදව් තිබ්බද කොහොමද වුණේ?

පි: ඒ කියන්නේ ශිබ්ලි ෆාරුක් 2013,2014 ඒ වගේ තමා සහරාන් එක්ක සම්බන්ධය තිබුණේ.

ප්‍ර: සම්බන්ධය තිබුණා?

පි: ඔව්.

ප්‍ර: එතකොට සහරාන් ශිබ්ලි ෆාරුක්ට උදව් කෙරුවද?

පි: ඒකේ සහරාන් අර එක තැනකට දේශනාවල් ඒත් අර ප්‍රශ්නය කියලා ශිබ්ලි ෆාරුක්ට කියලා තමයි පොලිසියෙන් permission එක ගත්තේ.

ප්‍ර: මොකක්ද ප්‍රශ්නය?

පි: ඒ තැනකට අර කට්ටිය කාත්තන්කුඩි පූනිච්චමුනි කිලා ඒ ප්‍රදේශයේ. කට්ටිය පොඩ්ඩක් රණ්ඩුයි කියලා ඒ තැනකට දෙන්න බැහැ කියලත්

FAIR COMMENT BY JEZEEM

කිව්වේ. ඒකට ආරක්ෂාව දාන්න ඕනේ කියලා. ඉන් පස්සේ ඒකේ ශිබ්ලි ෆාරුක්ට තමයි කියලා සහරාන් උදව් ඉල්ලුවේ.

ප්‍ර: ඊට පස්සේ ශිබ්ලි ෆාරුක් සහ සහරාන් අතර හොඳ සම්බන්ධතාවයක් තිබුණද?

පි: ඊට පස්සේ 2015,2016 වෙනකම් තිබුණා ඒගොල්ලන්. ඊට පස්සේ ශිබ්ලි ෆාරුක්ටයි හිස්බුල්ලාටයි ඒගොල්ලන් දෙන්නා තරහා වෙලා ප්‍රශ්න තිබුණා.

ප්‍ර: කාත් එක්කද තරහා වුණේ?

පි: ශිබ්ලි ෆාරුකුයි හිස්බුල්ලායි.

ප්‍ර: ඒ දෙන්නා දෙන්නා තරහා වුණා?

පි: ඔව්.

ප්‍ර: ඒ අනුව දැන් ඒගොල්ලන්ගේ තරහා වීම සහරාන්ට සම්බන්ධතාවක් තියෙනවද නැත්නම් යම් බලපෑමක් තිබුණද? සහරාන් ඒකට සම්බන්ධ වුණාද?

පි: නැහැ.

ප්‍ර: තරහා වෙන එකට සහරාන් සම්බන්ධ නැහැ?

පි: තරහා වෙලා පස්සේ තමයි ආපහු ආවේ. හිස්බුල්ලායි ශිබ්ලි ෆාරුකුයි.

ප්‍ර: කොහේද ආවේ?

පි: NTJ පල්ලියට

ප්‍ර: දෙන්නාම ආවේ NTJ පල්ලියට ?

පි: ඔව්.

ප්‍ර: මොකටද ආවේ?

පි: ඒ ඇවිල්ලා සහරාන්ට කියලා තිබුණා මේ තමයි අපිට ප්‍රශ්නය තියෙන්නේ දෙන්නාට. ඔයා මේක තීරණය කරන්න කියලා.

ප්‍ර: සහරාන්ට ඇවිල්ලා මේ දෙන්නාම කිව්වා?

පි: ඔව්.

ප්‍ර: අද හාදියා කිව්වානේ කාත්තන්කුඩියේ තබ්ලික් පල්ලි තියෙනවා තවුහිද් පල්ලි තියෙනවා කියලා?

පි: ඔව්.

ප්‍ර: එතකොට හාදියා දන්නවද හිස්බුල්ලා මහත්මයා යන්නේ තබ්ලික් පල්ලියටද තවුහිද් පල්ලියටද කියලා?

පි: ඒ තවුහිද් පල්ලියට යනවාද කියලා මම දැකලා නැහැ. වැඩිපුර වහාබිසම් පල්ලිය තබ්ලික් පල්ලියට යනවා.

ප්‍ර: එතකොට ශිබ්ලි ෆාරුක් මහත්මයා යන්නේ තබ්ලික් පල්ලියට ද තවුහිද් පල්ලියටද?

පි: එයා තබ්ලික් පල්ලි තවුහිද් පල්ලිවලට යනවා.

ප්‍ර: දෙකටම යනවා?

පි: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට දැන් හාදියා කිව්වා මේ දෙන්නාම ගිහිල්ලා සහරාන්ට කිව්වා කියලා මේ ඒගොල්ලන් අතර ප්‍රශ්නයක් තියෙනවා ඒක විසඳලා දෙන්න කියලා?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන් ඔය අවස්ථාව වෙනකොට හාදියා කියලා තිබුණානේ හිස්බුල්ලා මහත්මයා සහරාන්ගේ පල්ලියට උදව් ඕනේද කියලා අහලා සහරාන් ඒ වෙලාවේ එහෙම උදව් අවශ්‍ය නැහැ කියලා තිබුණා කියලා?

පි: ඔව්.

ප්‍ර: නමුත් ඒ සිද්ධියට පස්සේත් හිස්බුල්ලා දිගටම සහරාන් එක්ක කතාබස් කරලා සම්බන්ධතාවයක් තියාගෙන තිබුණද?

පි: ඒකේ එහෙම උදව් ඉල්ලුවේ නැහැ ටික කාලයක් සහරාන් එක්ක කතා කරනවා. ඒ කතා කරන කොට ආපහු එයා උදව් ඕනෑද කියලා ඒ කියන්නේ අර ඡන්ද එකේ ..

ප්‍ර: දෙමළින් කියන්න කැමැතියිද?

පි: ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

එම පිළිතුරෙන් කොටසක් දෙමළ භාෂාවෙන් සාක්ෂිකාරිය විසින් ලබාදුන් අතර එය කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක විසින් සිංහලයට පරිවර්තනය කරන ලද බව සටහන් කර තබමි.

පි: සහරාන්ගේ පැත්තේ හිටපු කට්ටියගේ ඡන්ද ලබා ගැනීමට අවශ්‍ය නිසා තමයි මේ සහරාන්ගෙන් උදව් අවශ්‍යද කියලා ඇහුවේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: එහෙම ඇහුවේ හිස්බුල්ලාද?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන් ඒ ශිබ්ලි ෆාරුක් මහත්මයා සහ හිස්බුල්ලා මහත්මයා අතර ඒ ඇතිවෙලා තිබුණ ඒ ප්‍රශ්නය විසඳලා දෙන්න සහරාන්ට පුළුවන් වුණාද?

පි: ඔව්.

ප්‍ර: ඒකට දවස් කීයක් විතර ගියාද?

පි: ඒ දවස් 3ක් විතර ඒ දෙපැත්තේ ඉස්සර වෙලා හිස්බුල්ලාගේ පැත්තේ මොනවද ප්‍රශ්නේ කියලා සහරාන් ඇහුවේ. ඒවත් අරගෙන ඊට පස්සේ ශිබ්ලි ෆාරුක්ගේ පැත්තෙන් එන්න කියලා ඒ දෙන්නාම අරගෙන තමයි ඒක අනික් දවස දෙන්නාම NTJ පල්ලියට අරගෙන තමයි එයා තීරණය කළේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කොහේදී ද ඕක තිබ්බෙ?

පි: NTJ පල්ලිය. National Thouheed Jamath පල්ලියේ.

ප්‍ර: දැන් ඔය විසඳන තැනට එතකොට සහරාන් අනිවාර්යයෙන්ම ඉන්න ඇතිනේ?

පි: ඔව් හිටියා.

ප්‍ර: වෙන කවුද ඔතන හිටියේ කියලා කියන්න දන්නවද හාදියා?

පි: ඔව් පුළුවන්.

ප්‍ර: කවුද ඒ?

පි: හිස්බුල්ලාගේ පැත්තෙන් 5 දෙනෙක්, ශිබ්ලි ෆාරුක්ගේ පැත්තෙන් 5 දෙනෙක්. සහරාන්ගේ කට්ටිය මවුලවිලා 4 දෙනයි වීඩියෝ කරන ඒ පල්ලියේ ඉන්න එක් කෙනායි. ඒගොල්ලන් හිටියා.

ප්‍ර: ඒක වීඩියොත් කරා නේද?

පි: වීඩියොත් කරා.

ප්‍ර: ඒ වීඩියෝ එක දැක්කොත් එතකොට හාදියාට හඳුනන්න පුළුවන් වෙයිනේ?

පි: ඔව් පුළුවන්.

ප්‍ර: එතකොට ඔය දෙපැත්තෙන්ම කට්ටිය ගෙන්නලා සහරාන් කතා කරාද?

පි: ඔව් කතා කරා.

ප්‍ර: ඒ ඔක්කෝම ඔය කතා කරන ඒවා, ප්‍රශ්න අහන ඒවා, එහෙනම් ඔක්කෝම වීඩියෝ කරන්න ඇති නේද?

පි: ඔක්කෝම වීඩියෝ කරා.

ප්‍ර: කොහොමද හාදියා දන්නේ ඔය සිද්ධ වෙච්ච දේවල්?

පි: ඒ සහරාන් ඇවිල්ලා කිව්වා ඒවා.

ප්‍ර: සහරාන් ඇවිල්ලා කිව්වා?

පි: ඔව්.

ප්‍ර: ඉතින් විසඳ ගත්තාද විසඳලා දුන්නාද මේ දෙන්නාගේ ප්‍රශ්නය සහරාන්?

පි: ඔව්.

ප්‍ර: මොකක්ද ඇතිවෙලා තිබ්බ ප්‍රශ්නය කියලා කියන්න හරියටම දන්නවද හාදියා?

පි: ඒ කියන්නේ ගොඩාක් ඒගොල්ලන්ගේ ප්‍රශ්න තිබුණා. සල්ලිවල තිබුණා.

ප්‍ර: මොන සල්ලිවලද තිබුණේ?

පි: ඒ කියන්නේ දැන් හිස්බුල්ලා කියනවා මෙහෙම වෙල්ක් හදන්න ඕනි. එහෙම කරන්න ඕනි කියලා.

ප්‍ර: මොනවද හදන්න ඕනි කියලද කියන්නේ ?

පි: පල්ලිවලට උදව් කරන්නම් කියලා. ඒවගේ දුප්පත් මිනිස්සුන්ට එහෙම උදව් කරන්න ඕනි කියලා. ශිබ්ලි ෆාරුක් ඒ කට්ටියත් කිව්වා කරනවානම් හරියට කරන්න මිනිස්සුන්ට. ඊට පස්සේ තමයි සහරාන් ඒකට සල්ලි අපිට ඕනි නැහැ. දුප්පත් මිනිස්සුන් ඉන්නවා. ඒ මිනිස්සුන්ට තමා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඔයගොල්ලෝ උදව් කරන්න ඕනේ කියලා එහෙම තිබුණා කියලා එයත් කිව්වා.

ප්‍ර: ඔය සහරාන් කියපු දේ තමයි හාදියා දන්නේ කියන්න නේද?

පි: ඔව්.

ප්‍ර: දැන් හාදියා සීයා ගැන කිව්වානේ නේද?

පි: ඔව්.

ප්‍ර: සීයා අම්මාගේ තාත්තාද තාත්තාගේ තාත්තාද?

පි: අම්මාගේ තාත්තා.

ප්‍ර: සීයා කොයි වෙලාවක හරි පල්ලියක් හැදුවද?

පි: ඔව් හැදුවා.

ප්‍ර: ඒ තබ්ලික් පල්ලියක්ද තවුහිද් පල්ලියක්ද?

පි: තවුහිද් පල්ලියක්.

ප්‍ර: හැබැයි සීයා ඉස්සරවෙලා හිටියේ තබ්ලික් පැත්තේ නේද?

පි: ඉස්සරවෙලා හිටියේ තබ්ලික් එකේ. 2002 ඒ අවුරුදුවල සීයා වෙනස් වුණා තවුහිද් එකට.

ප්‍ර: ඊට පස්සේ තමයි ඔය තවුහිද් එකට පල්ලිය හැදුවේ?

පි: ඔව්.

ප්‍ර: ඔය මේ කාත්තන්කුඩියේ විවාහ වෙලා ගියාට පස්සේ සහරාන්ගේ මහ ගෙදරනේ පදිංචි වෙලා හිටියා කියලා කිව්වේ හාදියා?

පි: ඔව්.

ප්‍ර: එතකොට රිල්වාන් , සෙයිනි , ඒ නංගීලා දෙන්නා ඔතන හිටියා කියලා කිව්වානේ ඔය ගෙදර?

පි: ඔව්.

ප්‍ර: රිල්වාන් කොයි වගේ කෙනෙක්ද?

පි: එයා කෙට්ටු ඊට පස්සේ එයා නිතරම අර ගෙදර ඉන්නේ.

ප්‍ර: කොයි ගෙදරද?

පි: එයාගේ අම්මලා ගෙදර. එයා රත්තරං බඩු හදනවා.

ප්‍ර: එයා රත්තරං බඩු හදනවා?

පි: ඔව්.

ප්‍ර: එහෙමද රස්සාවක් විදියට කළේ රත්තරං බඩු හදන එක?

පි: ඔව්.

ප්‍ර: කොහේද එයා රත්තරං බඩු හැදුවේ ?

පි: එහේ කාත්තන්කුඩි, නව කාත්තන්කුඩි Beach Road. එකේ.

ප්‍ර: එයාට වෙනම shop එකක් තියෙනවද?

පි: එයාගේ shop නෙවෙයි.

ප්‍ර: එහෙනම්?

පි: කුලියට වැඩ කරා. තස්ලීම් කියලා එයා තමයි බොස් ඒකේ.

ප්‍ර: තස්ලීම් ගාව රිල්වාන් වැඩ කරා?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්.

ප්‍ර: එතකොට සෙයිනි?

පි: සෙයිනි ඒ කාලේ කොළඹ ඉන්නුමර් කියලා මද්‍රසා එකේ ඉගෙන ගන්නවා.

ප්‍ර: සෙයිනිත් මවුලවි කෙනෙක්ද?

පි: ඔව්.

ප්‍ර: කොයි කාලේ වගේද ආපහු සෙයිනි ආවේ කාත්තන්කුඩියට?

පි: ඊට පස්සේ ඉවර වෙලා 2011 , 2012 වෙනකොට එයාගේ ඉවරයි.

ප්‍ර: දැන් රිල්වාන් විවාහ වෙනකොට කාත්තන්කුඩියේද හාදියා හිටියේ?

පි: ඔව්.

ප්‍ර: හාදියාට මතකද මොන අවුරුද්දේ වගේද විවාහ වුණේ කියලා?

පි: එයා විවාහ වුණේ 2014.

ප්‍ර: රිල්වාන්ගේ නෝනාගේ නම මොකක්ද?

පි: මොහොමඩ් නසාර් ෆාතිමා නෆ්නා.

ප්‍ර: ෆාතිමා නෆ්නාටයි රිල්වාන්ටයි දරුවෝ හිටියද?

පි: ඔව් හිටියා.

ප්‍ර: පුතාලාද දුවලාද?

පි: පළවෙනියා දුව. දෙවැනි පුතා.

ප්‍ර: එතකොට සෙයිනිට, සෙයිනි බැන්දාද?

පි: ඔව් බැන්දා.

ප්‍ර: කාවද විවාහ කර ගත්තේ?

පි: එයා ගපූර් මාමාගේ දුව.

ප්‍ර: එයා ගපූර් මාමාගේ දුවව බැන්දා කියලා කිව්වානේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට මේ ගපූර් මාමාගේ දුවටයි සෙයිනිටයි දරුවෝ හිටියද?

පි: ඔව් හිටියා.

ප්‍ර: ගෑණු ළමයිද පිරිමි ළමයිද?

පි: පළවෙනි පුතායි දුවයි හිටියා.

ප්‍ර: ගපූර් මාමා නිතර ඔය කාත්තන්කුඩියේ සහරාන්ගේ ගෙදරට ආවා ගියාද?

පි: තේරුණේ නැහැ.

ප්‍ර: ගපූර් මාමා කොහේද පදිංචි වෙලා හිටියේ?

පි: එයා කාත්තන්කුඩියේ.

ප්‍ර: එතකොට මං ඇහුවේ ගපූර් මාමා නිතර සහරානුයි ඔබයි හිටපු ඔය රිල්වාන් හිටපු ගෙදරට ආවා ගියාද?

පි: ඒ කියන්නේ ඥාති බැන්දාට පස්සේ ඇවිල්ලා යනවා එයායි නෝනායි.

ප්‍ර: ඇවිල්ලා යනවා?

පි: ඔව්.

Prajodaya Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඒගොල්ලන් අතර ඒ කියන්නේ සහරානුයි ගෆූර් මාමායි අතර ළඟ ආශ්‍රයක් තිබ්බද?

පි: ඥාති නිසා වැඩිය එහෙම නෙවෙයි එහෙම කතා කරනවා යනවා එනවා.

ප්‍ර: යනවා එනවා ඒ සම්බන්ධකම් තිබුණා නේද?

පි: ඔව්.

ප්‍ර: සහරාන් කොයි වෙලාවක හරි පල්ලියක් හදන්න පටන් ගත්තාද?

පි: ඔව්.

ප්‍ර: ඒ කොහේද?

පි: 2017

ප්‍ර: 2017 මොන කාලේද?

පි: 2016.10 වෙනි මාසේ විතර ඒ වගේ තමයි NTJ පල්ලිය හදන්න නව කාත්තන්කුඩි.

ප්‍ර: නව කාත්තන්කුඩියේ NTJ පල්ලිය හදන්න පටන් ගත්තා?

පි: ඔව්

ප්‍ර: අර ගෆූර් මාමා ඉඩමක් ගත්තා කියලා කිව්වේ ලක්ෂ 1යි 25ක් දීලා?

පි: ලක්ෂ 1යි25 ගත්තේ ගෆූර් මාමාගේ නෙවෙයි.

ප්‍ර: එහෙනම්?

පි: ඒක ගත්තේ සහරාන්ට.

ප්‍ර: සහරාන්ගේ ඉඩමට තමයි ලක්ෂ 1යි 25ක් දුන්නේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට ගෆූර් මාමාත් ඉඩමක් ගත්තා කිව්වානේ?

පි: ඔව් එයා ඒ ඉඩම් ගත්තේ පල්ලි හදන්න.

ප්‍ර: එතකොට සහරාන් පල්ලිය හැදුවේ ඒ ඉඩමේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට සහරාන්ට ඒ පල්ලිය හදන්න සල්ලි දුන්නද නජීම්?

පි: ඔව්.

ප්‍ර: අර සිංගප්පූරුවේ නජීම්?

පි: ඔව් දුන්නා.

ප්‍ර: එයා සල්ලි දුන්නා?

පි: ඔව්.

ප්‍ර: කොහොමද එයා සල්ලි දුන්නේ?

පි: එයා සහරාන්ට කියලා තිබ්බා ටික ටික එයාගේ යාළුවෝ එක්කෙනෙක් කොළඹ ඉන්නවා කියලා. එයා දෙමළ එක්කෙනා. කුමාර් කියලා තමා සහරාන් කතා කරනකොට කිව්වේ. ඒ කියන්නේ හාජා එක්ක කතා කරනවා. එහෙමනම් මං කුමාර් contact කරලා අර සල්ලි ටිකක් ටිකක් ගන්නම් කියලා. ඊට පස්සේ හාජා නජීම් ලක්ෂ 50ක් එයා කුමාර්ට දාලා තිබුණේ. ඊට පස්සේ තමයි සහරාන් ටික ටික ගිහින් ගත්තා. අනිත් ඉතුරු

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ටිකේ ඒ පල්ලිය හදන්න කම්බි සිමෙන්ති අරවා ගත්තේ කොළඹ ඉඳලා තමයි.

ප්‍ර: එතකොට ඔය පල්ලිය ටික ටික හැදුවානේ සහරාන්?

පි: ඔව් හැදුවා.

ප්‍ර: හැබැයි දැන් හාදියා කිව්වා 2017 මාර්තු මාසේ 10 වෙනිදා අලියාර් හන්දියේ අර සිදුවුණ ගැටුම හින්දා එදා රෑ සහරාන් ආවේ නැහැ. ඊට පස්සේ හාදියාට පස්සේ වෙලාවක කතා කරලා කිව්වා telephone එක දැන් battery නැතිවේගෙන යනවා කියලා පස්සේ කෙනෙක් එවලා හාදියා ගාව තිබ්බ telephone එකක් අරගෙන ගියා කියලා?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ තමයි හාදියා කියන විදියට අයියා ඇවිල්ලා හාදියායි බාබාලා දෙන්නායි අරගෙන කැකුණගොල්ලට ගියේ?

පි: ඔව්.

ප්‍ර: ඔය සිද්ධියෙන් පස්සේ සහරාන් හාදියාට කතා කරාද?

පි: මං අම්මලාගේ ගෙදර ගිහිල්ලා එයාගේ නම්බරයට contact කරා. ඒ number වැඩ කරන්නේ නැහැ. ඊට පස්සේ මාස 1 ½ යි මාසයට පස්සේ තමයි සහරාන් අම්මලාගේ ගෙදරට කැකුණගොල්ලට ආවේ.

ප්‍ර: කැකුණගොල්ලට ආවා?

පි: ඔව්.

ප්‍ර: හාදියා බලන්න ආවාද?

පි: ඔව්.

ප්‍ර: ඉතින් හාදියා ඇහුවේ නැද්ද ඔයා කොහේද හිටියේ මොකක්ද වුණේ කියලා?

පි: එයා එදා රෑ ආවේ.

ප්‍ර: ඒ ආපු දවසේ රෑ ආවේ?

පි: ඔව්. ඇවිල්ලා කිව්වා මං හෙට උදේ වෙනකොට යන්න ඕනි කියලා. ඉන් පස්සේ මං කිව්වා මෙහෙම ප්‍රශ්නේ කියලා..

ප්‍ර: මොකක්ද ප්‍රශ්නේ?

පි: එයා අලියාර් හන්දියේ ප්‍රශ්නේ කියලා තිබුණානේ. ඔයාව හොයනවා කියලා.

ප්‍ර: කවුද හොයන්නේ මේ පොලිසිය හොයන්නේ ?

පි: පොලිසියෙන් හොයනවා. ඊට පස්සේ එයාට මං කිව්වා ඔයා ගිහිල්ලා හාර වෙන්න කියලා පොලිසියට. බලමු කියලා කිව්වේ. ඉන් පස්සේ මං කිව්වා ඔයාගේ phone වැඩ කළේ නැත්තේ ඇයි කියලා. මං වෙන phone ඒකේ sim එක මාරු කරලා තියෙනවා කියලා. මං ඔයාට පස්සේ telephone එක හදලා දෙන්නම් කියලාත් එයා කිව්වේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ හාදියට phone එක හදලා දෙන්නම් කියලා සහරාන් කිව්වා?

පි: ඔව්

ප්‍ර: ඊට පස්සේ මොකද වුණේ?

පි: ඊට පස්සේ අනිද්දා එයා ගියා.

ප්‍ර: ඊට පස්සේ පහුවදා උදේ යන්න ඕනි කිව්වා ඒ වගේ ගියා?

පි: ඔව්.

ප්‍ර: යන්නේ කොහේද කියලා කිව්වද?

පි: තැනක් මොකුත් කිව්වේ නැහැ එයා.

ප්‍ර: එතකොට දැන් හාදියා ඇවිල්ලා අම්මාලාගේ ගෙදර ඉන්නවා දරුවෝ දෙන්නත් එක්ක?

පි: ඔව්.

ප්‍ර: එතකොට හාදියාට බාබාලා බලා ගන්න, ජීවත් වෙන්න සල්ලි කොහෙන්ද?

පි: ඉන් පස්සේ එයා ආපු වෙලාවේ 10000ක් විතරයි දුන්නේ.

ප්‍ර: දැන් එයා කියන්නේ නැතිව අපි නම කියමු. සහරාන් නේද?

පි: සහරාන්.

ප්‍ර: සහරාන් 10000ක් විතර දුන්නා?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ?

පි: ඊට පස්සේ එයා ගියා. ඊට පස්සේ Phone එකෙන් සහරාන් call එකක් එහෙම මොකුත් ගන්නේ නැහැ. ඊට පස්සේ අපේ අයියාලායි ඒගොල්ලන් තමා බාබාලා බලන්න මටත් වියදම් කළේ.

ප්‍ර: දැන් ඔහොම කොච්චර කාලයක් හාදියා ඒ ගෙදර හිටියද අම්මාලත් එක්ක බාබාලා දෙන්නව තියාගෙන?

පි: 2017 මාර්තු 11 ඉඳලා 2019 පෙබරවාරි 19 වෙනකම් හිටියා.

ප්‍ර: එතකොට දැන් සෑහෙන කාලයක් ඉඳලා තියෙනවානේ අම්මලාගේ ගෙදර?

පි: ඔව්.

ප්‍ර: අපි දැන් ගණන් හදලා බැලුවොත් 2017 මාර්තු 10 තමයි සහරාන් හාදියා ඉන්න ගෙදරින් මේ වගේ පිට වෙලා ගියේ?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ දැන් හාදියා කිව්වා කැකුණගොල්ලේ හිටියා කියලා 2019 පෙබරවාරි මාසේ 19 වෙනකම්?

පි: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඔය අතර කාලය තුලදී ඔය පළවෙනි වතාවට ඇවිල්ලා රුපියල් 10000ක් දුන්නාට පස්සේ සහරාන් හාදියාව බලන්න ආවාද? හාදියාවයි දරුවෝයි බලන්න ආවාද?

පි: ඔව්.

ප්‍ර: ඒ කොහාටද ආවේ ?

පි: ඒ නවුෆර්ලාගේ ගෙදරට ආවේ. ඒ කියන්නේ බාප්පා.

ප්‍ර: විනාඩි 5යි කියලා කිව්වානේ හාදියාගේ ගෙදර ඉඳලා නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔය වගේ අවස්ථා කීයකදී විතර ඔය කැකුණගොල්ලේ ගෙදරට ඇවිල්ලා තියෙනවද සහරාන් හාදියාවයි දරුවන්වයි බලන්න?

පි: ඇවිල්ලා තියෙනවා.

ප්‍ර: how many times කී සැරයක් විතර ඇවිල්ලා තියෙනවද?

පි: 5 වෙනි පාරක් හරි ගෙදර ඇවිල්ලා තියෙනවා.

ප්‍ර: ඔය ආවාම කොච්චර විතර වෙලා ඉන්නවද?

පි: දවස් 2ක් විතර ඉන්නවා.

ප්‍ර: ඊට පස්සේ යනවා?

පි: ඔව්.

ප්‍ර: යන්නේ කොහේද කියලා කියනවද හාදියාට?

පි: ඒවා කියන්නේ නැහැ. ඇහුවත් කියන්නේ නැහැ.

ප්‍ර: එතකොට මේ හිටපු ගමන් එනවා ඇවිල්ලා හාදියාව බලලා , බාබාලා බලලා දවස් 2ක් විතර ඉඳලා යනවා. ඒකයි මේ හාදියා කියන්නේ?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔය හාදියාත් එක්ක ජීවත් වෙන්නත් එන්නේ නැත්නම් නිතරම ගෙදර එන්නෙත් නැත්නම් මොකක්ද ඔය සහරාන් කෙරේ ඉඳගෙන?

පි: ඒගොල්ලෝ ඒ කාලේ මං දන්නේ දැන් 2017.10 මාසේ 11 මාසේ විතර. එයා FB වලින් Telegram වැනල් එකක් තිබුණා. ඒ වැනල්වලින් එයා දේශනා කරලා තිබුණා.

ප්‍ර: මොනවා ගැනද දේශනා කරලා තිබුණේ?

පි: ඒ දේශනාව IS සම්බන්ධව තමයි.

ප්‍ර: IS සම්බන්ධයෙන්?

පි: ඔව්.

ප්‍ර: IS කියලා කියන්නේ මේ සිරියාවේ තියෙන අර ත්‍රස්තවාදී සංවිධානයක් නේද?

පි: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ සහරාන් ඒ ත්‍රස්තවාදී සංවිධානය ගැන තමයි මේ FB එකේ දාන්නේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්.

ප්‍ර: එතකොට Telegram පාවිච්චි කරලා සහරාන් කතා කරලා තියෙනවද හාදියාට?

පි: ඔව්.

ප්‍ර: දැන් සහරාන්ට කතා කරනවානම් හාදියාත් කතා කරේ Telegram appliction එකෙන්ද?

පි: Telegram app එකෙන්.

ප්‍ර: එතකොට ඔය සහරාන් upload කරන දේශනා ඒ කියන්නේ අර Internet එකට දාන්නේ ඒ දේශනා හාදියාත් බලලා තියෙනවද?

පි: ඒ කියන්නේ FB වලින් දාලා ඒ කාලේ මට FB දාලා දුන්නේ නැහැ. Telegram එකේ group එකෙත් තියෙනවා. අන්සාර් කිලාෆත් කියලා. ඒ වැනල් ඒ group එකෙන් තමයි ඒ වීඩියෝ දාන්නේ.

ප්‍ර: ඒ අන්සාර් කිලාෆත් කියන්නේ group එකේ නමද?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒ group එකට අන්සාර් කිලාෆත් කියන group එකට හාදියාවත් add කරලා තිබ්බා?

පි: ඒ සහරාන් add කරලා තිබ්බා.

ප්‍ර: ඒ group එකේ හාදියා ඇරෙන්න තව කී දෙනෙක් විතර හිටියද?

පි: ඒකේ members ලා දෙසීය ගාණට වැඩිය හිටියා.

ප්‍ර: එතකොට ඔය group එකේ මොනවා හරි බලන්න ඕනිනම් ඒකට එන්න pass word එකක් තියෙනවද?

පි: ඒක Telegram app එකේ ඒ වෙනම හදලා තියෙන්නේ. ඒක එනවා. Online ඒවායේ තමයි whatsapp එකට වැඩිය ඒක safety කියලා කියනවා.

ප්‍ර: කවුද කියන්නේ මෙහෙම?

පි: සහරාන්.

ප්‍ර: සහරාන් කියනවා ඒක safe කියලා Telegram එක?

පි: ඔව්.

ප්‍ර: කොහොමද ඔය telegram එක operate වෙන්නේ කියලා කියන්න පුළුවන්ද අපිට?

පි: මං ඒක operate කරන එක හස්තූන් තමයි හදලා දෙන්නේ.

ප්‍ර: කවුද මේ හස්තූන් කියන්නේ ?

පි: ඒ සහරාන්ගේ යාළුවා.

ප්‍ර: එයා කාත්තන්කුඩියේ එක්කෙනෙක්ද?

පි: එයා වාලච්චේන ඔට්ටමාවඩි.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට සහරානුයි හස්තූනුයි කොහොමද සම්බන්ධ වෙලා තියෙන්නේ?

පි: ඒ 2016 April මාසවලින් තමයි කස්තූන් NTJ පල්ලියට ආවේ සහරාන් හම්බ වෙන්න.

ප්‍ර: 2018?

පි: 2016

ප්‍ර: 2016 හස්තූන් ආවා NTJ පල්ලියට?

පි: හස්තූන් ආවා NTJ පල්ලියට.

ප්‍ර: එතකොට එහෙම තමයි මේ සම්බන්ධ වුණේ?

පි: ඔව්.

ප්‍ර: දැන් කොයි වෙලාවෙදී හස්තූන්ව හාදියාට හම්බ වුණේ?

පි: කස්තූන්ව දැක්කේ කාත්තන්කුඩියට එයා ඇවිල්ලා දවස් දෙකකට පස්සේ.

ප්‍ර: ඒත් 2016මයි?

පි: 2016.

ප්‍ර: එතකොට සාරාව එහෙම හම්බුණේ කොයි කාලේද හාදියාට ?

පි: ඒ 2016.

ප්‍ර: කොහේදීද?

පි: කාත්තන්කුඩි NTJ පල්ලියට පිටිපස්සෙන් තවුෆික් මුලි කියලා එයාගේ ගෙදරින් තමයි සාරාව මං දැක්කේ.

ප්‍ර: සාරාව ඉස්සෙල්ලාම දැක්කේ?

පි: ඔව්.

ප්‍ර: සාරා මේ ඉස්සර ද්‍රවිඩ ඒ කියන්නේ Tamil එක්කෙනෙක් නේද?

පි: ඔව්.

ප්‍ර: පස්සේ එයා ආගමට convert වෙලා තිබුණද ඉස්ලාම් ආගමට?

පි: එයා කළින් අවුරුදු 2 ½ කට කළින් එයා ඉස්ලාම් ආගමට ඇවිල්ලා හිටියා.

ප්‍ර: එතකොට සාරායි හාදියායි හොඳ යාළුවෝ කියලා මං කිව්වොත් පිළිගන්නවා නේද?

පි: හොඳම යාළුවෝ.

ප්‍ර: නැහැ හොඳම යාළුවෝ නෙවෙයි. සාමාන්‍යයෙන් එකට කතාබහා කරනවා එහේ මෙහේ යනවා.

පි: ඔව්.

ප්‍ර: දැන් හාදියාගේ මතකය පොඩ්ඩක් ගෙනියන්න කැමැතියි අර හිස්බුල්ලා මහත්මයායි, ශිබ්ලි ෆාරුක් මහත්මයායි කරපු දේශපාලන වැඩ ගැන?

පි: ඔව්.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මතකද යම් වෙලාවකදී සහරාන්ගේ මල්ලි රිල්වාන්ට ඔය දේශපාලන ප්‍රශ්නයක් නිසා තුවාල සිද්ධ වුණා?

පි: ඔව්.

ප්‍ර: ඒක ගැන පොඩ්ඩක් විස්තර කරන්න පුළුවන්ද හාදියාට?

පි: පුළුවන්.

ප්‍ර: මොකක්ද වුණේ?

පි: දෙමළින් කියන්නද?

ප්‍ර: හාදියාට පහසු විදියට කියන්න.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී සාක්ෂිකාරිය දමිළ භාෂාවෙන් පිළිතුරු සපයන අතර එය කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක විසින් සිංහල භාෂාවට පරිවර්තනය කරන බව සටහන් කර තබමි.

පි: 2016 වසරේදී හිස්බුල්ලා ඡන්දය ඉල්ලුවා. ඒකේදී ශිබ්ලි ෆාරුක් එයත් ඡන්දය ඉල්ලුවා. ඒ ඡන්දයේදී ශිබ්ලි ෆාරුක් ඡන්දය පැරදුණා. හිස්බුල්ලා ඒ ඡන්දය දිනුවා. එහිදී හිස්බුල්ලාගේ පාක්ෂිකයින් ඇවිල්ලා සහරාන්ගේ පල්ලිය ළඟට ඇවිල්ලා රතිඤ්ඤා දමමින් ඒ ස්ථානයේ හැසිරුණා. ඒ අවස්ථාව වුණේ එයාලා පල්ලියේ යාඥා කරමින් සිටි අවස්ථාවක තමයි ඒ දේ සිද්ධ වුණේ. ඊට පස්සේ ඒ අතරතුර එයාලා ඒ පල්ලිය ඇතුළටත් ඇවිල්ලා රතිඤ්ඤා දාන්න පටන් ගත්තා. ඒ අවස්ථාවේදී රිල්වාන්ට පිරිසක් ඇවිල්ලා එයාගේ ඔළුවටත් පහර දීලා තිබ්බා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: හාදියා දැන් ඔය සිද්ධිය වුණේ මොන අවුරුද්දේද?

පි: 2016 අවුරුද්දේ.

ප්‍ර: ඒ අවස්ථාවේදී තමයි හාදියා කියන්නේ රිල්වාන්ට තුවාල වුණා කියලා?

පි: ඔව් sorry 2016 නෙවෙයි 2015

ප්‍ර: එතකොට 2015 තමයි වුණේ නේද?

පි: ඔව්.

ප්‍ර: 2015 දී ඔය සිද්ධිය වෙනකොට ඒ තිබුණ election එකේ මොන පැත්තටද සහරාන් උදව් කළේ?

පි: එයා කාටද ඡන්දය දුන්නේ නැහැ එයා දන්නේ නැහැ.

ප්‍ර: එයා ඡන්දේ දාන්නේ නැහැ?

පි: නැහැ.

ප්‍ර: හාදියා දානවද?

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි: ඒ කාලේ මට දුන්නෙත් නැහැ ඒ කාලේ මට පදිංචි වෙලා හිටියේ නැහැ මං ඒ ගෙදර.

ප්‍ර: එතකොට දුන්නේ නැහැ මේ දාන්න?

පි: ඔව්.

ප්‍ර: ඒ නිසා දැන් හාදියා ඡන්දේ දැම්මේත් නැහැ?

පි: නැහැ.

ප්‍ර: නමුත් හාදියා කියන්නේ මේ 2015 තිබුණ මේ election එකෙන් පස්සේ හිස්බුල්ලාගේ පාර්ශවය සහරාන් හදපු පල්ලිය ගාවින් යනකොට එතන රතිඤ්ඤා පත්තු කරලා රිල්වාන්ට ඒකෙන් තුවාල සිද්ධ වුණා කියලා?

පි: ඔව්.

ප්‍ර: රිල්වාන් හිටියේ මොන ඉස්පිරිතාලේද තුවාල වෙලා?

පි: Batticaloa General Hospital එකේ.

ප්‍ර: රිල්වාන්ට කොහේ කොහේද තුවාල වෙලා තිබුණේ කියලා හාදියාට මතකද?

පි: ඔව්.

ප්‍ර: කොහේද තුවාල වෙලා තිබුණේ?

පි: වම්පැත්තේ නළල.

ප්‍ර: වම් පැත්තේ නළල?

පි: ඔව්.

ප්‍ර: කොච්චර දවසක් හිටියද Hospital එකේ රිල්වාන්?

පි: දවස් හරියට මතක නැහැ. 5 ,6ක් විතර එයා හිටියා.

ප්‍ර: ඔය ඉන්න කාලයේදී ඒ කියන්නේ Hospital එකට admit කරාට පස්සේ රිල්වාන් හාදියා දන්නවද Politiansලා කවුරුහරි රිල්වාන්ව බලන්න ගියාද කියලා?

පි: ඔව්.

ප්‍ර: කවුද ගිහිල්ලා තිබ්බේ?

පි: ඒකේ ශිබ්ලි ෆාරුක් ගිහිල්ලා හිටියා. ඒ වගේ රවුෆ් හකීම් , නසීර් අහමඩ් කියලා එයත් හිටියා.

ප්‍ර: අපි පින්තූරයක් පෙන්නුවොත් හඳුනා ගන්න පුළුවන් වෙයිද හාදියාට?

පි: ඔව්.

C – 689 සාක්ෂිකරුට පෙන්වයි.

ප්‍ර: හාදියා මං පින්තූරයක් පෙන්වනවා. දැන් මට පෙන්වන්න රිල්වාන් කොතනද ඉන්නේ කියලා?

C – 689 (C) ස්ථානයේ ඉන්නේ රිල්වාන් ඇඳ උඩ කියලා පෙන්වනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට මේ වම්පැත්තේ ඉන්න එක්කෙනා දන්නවද?

පි: ඔව්.

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

ප්‍ර: එයා කවුද?

පි: නජීමුඩීන්

ස්වාමිනි C – 689 (J) ස්ථානයේ සිටින්නේ නජීමුඩීන් මහත්මයා බව සාක්ෂිකාරිය හඳුනා ගන්නා ලදී.

ප්‍ර: නජීමුදීන් කියන්නේ කවුද හාදියා?

පි: එයා NTJ පල්ලියට අරාබි ඉගෙන ගන්න ඇවිල්ලා හිටියා කෙනෙක්. එයා ඔට්ටමාවඩි එක්කෙනා.

ප්‍ර: එයා හොඳට දන්නවද සහරාන්ව රිල්වාන්ව එහෙම?

පි: ඔව් දන්නවා.

ප්‍ර: නිතර ඔයගොල්ලන්ගේ ගෙවල්වලට එනවද?

පි: ඒ කියන්නේ එයා සහරාන්ගේ නංගීගේ Husbandගේ පැත්තේ ඥාති. ඒ හින්දා එනවා යනවා.

ප්‍ර: එතකොට අපි ඔයාට දකුණු පැත්තේ පේන එක්කෙනා?

පි: එයා ශිබ්ලි ෆාරුක්.

C – 689 (A) කියන ස්ථානයේ ශිබ්ලි ෆාරුක් ඉන්න බවට හඳුනා ගන්නවා ස්වාමිනි.

ප්‍ර: මේ ඊට පස්සේ ඉන්න දෙවැනි එක්කෙනා?

පි: රවුෆ් හකීම්.

ස්වාමිනි C – 689 (B) ස්ථානයේ සිටින්නේ රවුෆ් හකීම් මහතා බව හඳුනා ගනී.

ප්‍ර: මේ මැද්දේ ඉන්න එක්කෙනා කවුද? මෙන්න මෙයා හාදියා.

පි: එයා මතක නැහැ.

C – 689 (D) ස්ථානයේ ඉන්න තැනැත්තාව මතක නැති බව කියනවා ස්වාමිනි සාක්ෂිකාරිය.

ප්‍ර: 2010 අවුරුද්දේ ඒ කියන්නේ හාදියා විවාහ වුණාට පස්සේ සහරාන් එක්ක සහරාන්ව කොයි වෙලාවක හරි රිමාන්ඩ් කරාද?

පි: ඔව්.

ප්‍ර: ඒ මොනවටද හාදියා?

පි: ඒ අකුරණ පැත්තේ සහරාන් දේශනාවට ගිහිල්ලා තිබ්බා.

ප්‍ර: ඉතින් දේශනවලට ගියාට රිමාන්ඩ් කරන්නේ නැහැනේ හාදියා?

පි: නැහැ. ඒ පැත්තේ තබ්ලික් ජමාත් එක්ක තවුහිද් ජමාත් එක Debate වගේ ඒගොල්ලන් කරන්නේ. තීරණය කරන්න ගියා. ඒ ගිය වෙලාවේ තමයි දෙපැත්තම රණ්ඩු වෙලා සහරාන් රිමාන්ඩ් කරලා තියෙන්නේ.

ප්‍ර: කොච්චර දවසක් හිටියද රිමාන්ඩ් එකේ ?

පි: දවස් 14ක් රිමාඩ් ඒකේ.

ප්‍ර: මොකද වුණේ ඒ නඩුවට?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒ නඩුව මොකද වුණේ කියලා දන්නේ නැහැ. ඊට පස්සේ මාස 6 වෙනකොට ඉවරයි.

ප්‍ර: ඒ නඩුව ඉවර වුණා?

පි: ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවේ කටයුතු විනාඩි 5.00 කල් තබනවා.

දැන් වෙලාව: ප.ව. 4.45

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව. 05.05
පෙර සටහන් : නිල්මිණි මෙනවිය.
මෙතැන් සිට : සචිනි මෙනවිය.

විවේකයෙන් පසු කොමිෂන් සභාව නැවත රැස්වේ.
නම: අබ්දුල් කාදර් ෆාතිමා හාදියා.
නැවත ප්‍රතිඥා දෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: හාදියා අර අලියාර් හන්දියේ සිද්ධ වුණු සිද්ධියට අදාළව ඊට පස්සේ සහරාන් ගෙදර ආවේ නැහැ කියලා කිව්වනේ හාදියා?
උ: ඔව්.
ප්‍ර: හාදියා දන්නවද ඒ සිද්ධිය ගැන කොයි වෙලාවක හරි සහරාන්ගේ පවුලේ කවුරුහරි බන්ධනාගාරයේ හිටියද කියලා කියන්න?
උ: ඔව්.
ප්‍ර: කවුද ඒ?
උ: සෙයිනි.
ප්‍ර: සෙයිනි විතරද සහරාන්ගේ තාත්තා එහෙම හිටිය ද?
උ: තාත්තාත් හිටියා.
ප්‍ර: තාත්තාත් හිටියා සෙයිනිත් හිටියා?
උ: ඔව්.
ප්‍ර: හාදියා බලන්න ගියාද ඒ ගොල්ලොන්ව?
උ: ඔව්.
ප්‍ර: කොච්චර කාලයක් හිටිය ද හාදියා ඒ ගොල්ලන් රිමාන්ඩ් එකේ?
උ: ඒ ගොල්ලො මාස 08 ක් විතර හිටියා ඒකේ.
ප්‍ර: නමුත් දැන් හාදියා කිව්වා සහරාන්ට දැනුම් දුන්නා කියලා පොලීසිය සහරාන්ව හොයනවා කියලා?
උ: ඔව්.
ප්‍ර: එතකොට එහෙමනම් සහරාන් දැනුවත් වුණා හාදියා කිව්වාහම එයාව පොලීසියෙන් හොයන කෙනෙක් කියලා නේද?
උ: ඔව්.
ප්‍ර: නමුත් සහරාන් කොයි වෙලාවකවත් පොලීසියට ගියාද?
උ: නැහැ.
ප්‍ර: සහරාන්ව කොයි වෙලාවකවත් ඔය අලියාර් සිද්ධියට අදාළව පොලීසිය අත්අඩංගුවට ගත්තද කියලා කියන්න දන්නවද හාදියා, ගත්තේ නැහැ කියලා මං කිව්වොත් පිළිගන්නවද?
උ: ගත්තේ නැහැ එයා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: රිල්වාන් ඔය 2017 මාර්තු මාසේ 10 වැනිදට පස්සේ එයා කොහේද හිටියේ?

උ: එයා සහරානුත් එක්ක තමයි හැංගිලා හිටියේ.

ප්‍ර: එතකොට 2017 මාර්තු 10 වැනිදා අලියාර් හන්දියේ ගැටුමට පස්සේ සහරානුයි රිල්වානුයි දෙන්නම හැංගිලා හිටියා මිසක් පොලිසියට ගිහිල්ලා භාර වුණේවත් පොලිසිය ඒ ගොල්ලන්ව අත්අඩංගුවට ගත්තේවත් නැහැ නේද?

උ: නැහැ.

ප්‍ර: රිල්වාන් කොහේ කොහේද හිටියේ?

උ: රිල්වානුයි ඒ වෙලාවේම 2017 මාර්තු 10 වැනිදා ඊ සහරානුයි රිල්වාන් සෙයිනි සාෆි මවුලවී, තවුෆික් මවුලවී ඒ පස්දෙනා තමා හැංගිලා හිටියේ.

ප්‍ර: කොහේද හැංඟිලා හිටියේ ඒ ගොල්ලො?

උ: කොහේද ගියේ කියලා දන්නේ නැහැ. පස්සේ තමා මං දැනගත්තේ.

ප්‍ර: පස්සේ මොකද්ද දැනගත්තේ?

උ: ඒ ගොල්ලො ඉස්සරවෙලා හැංගිලා හිටියේ අම්පාර registrar කෙනෙක්ගේ ගෙදර දවස් 05 ක් හිටියා කියලා.

ප්‍ර: කාගෙන්ද මේවා දැනගත්තේ?

උ: ඒ සහරාන් කතා කරන කොට මට ඇහුණා.

ප්‍ර: ඉස්සෙල්ලා හිටියේ අම්පාර ගෙදරක?

උ: ඔව්.

ප්‍ර: registrar කියන්නේ මොනව කරන registrar කෙනෙක් ද?

උ: එයා කලියාර් කියන්නේ අපේ විවාහය මේව කර එයාගේ ගෙදරින්.

ප්‍ර: ඊට පස්සේ ?

උ: ඊට පස්සේ අනුරාධපුරේ සාෆි මවුලවී කියලා එයාගේ ගෙදර හිටියා.

ප්‍ර: කොච්චර කල් අනුරාධපුරයේ ඉඳලා තියෙනව ද?

උ: ඒ දවස් 10 ක් විතර එහෙ හිටියලු. ඊට පස්සේ කුලියාපිටිය පැත්තේ ආරියන් කියලා එයාගේ තව යාළුවෝ තුන්දෙනෙක් හිටියා ඒ පැත්තේ. ඒ ගොල්ලොන්ගේ ගෙදර හිටියා.

ප්‍ර: වෙන කොහේද හිටියේ?

උ: ඒ වගේ මාවනැල්ල ප්‍රදේශයේ එහෙත් කට්ටිය හිටියා එයාගේ. ඒ ගෙදර මාසයක් හිටියට පස්සේ 2017 මැයි මාසවල නෝම්බි කාලේ දවස් 40 ක් 42 ක් විතර එයාගේ අම්මලාගේ ගෙදර හිටියා එයා.

ප්‍ර: ඒ කියන්නේ කාත්තන්කුඩියේ?

උ: කාත්තන්කුඩියේ.

ප්‍ර: නමුත් පොලීසියෙන් එයාව අත්අඩංගුවට ගත්තේ නැහැ නේද?

උ: නැහැ.

ප්‍ර: ඒ කියන්නේ භාදියායි සහරානුයි විවාහ වුණාට පස්සේ ගිහිල්ලා පදිංචි වෙලා හිටිය ගෙදරනේ නව කාත්තන්කුඩිය තියෙන ගෙදරනේ ඔය?

FAIR COMMENT BY JEZEEM

උ: නව කාත්තන්කුඩියෙන් පස්සේ එයාගේ අම්මා කුලියට හිටියා.

ප්‍ර: ඒ කොහේද ?

උ: ඒ නව කාත්තන්කුඩි අග්‍රා area. සහරාන්ගේ දෙවැනි නංගි බදින්න ඉන්නවා කියලා අම්මා ළඟ ඉන්න ඕන කියලා . ඊට පස්සේ අම්මටයි නංගිටයි දෙකම set වුණා ළඟ ළඟ ගේ.

ප්‍ර: එතකොට ඒ ගෙදරට ගිහිල්ලා තමයි සහරාන් මෙහෙම දවස් 42 ක් ඉඳලා තියෙන්නේ?

උ: නංගිලාගේ ගෙදර තමයි දවස් 42 හිටියේ.

ප්‍ර: එතකොට රිල්වාන් කොහේ කොහේ ද හිටියේ ඔය වගේ?

උ: ඒ වගේ එයත් එක්කම තමයි හිටියේ. සහරාන් එක්කම.

ප්‍ර: සහරාන් එක්කම දිගටම හිටියා?

උ: ඔව්. ඊට පස්සේ සහරාන් අම්මලගේ ගෙදර ඉන්න කොට එයා එයාගේ ගෙදර හිටියා. ඊට පස්සේ එයාගේ නැන්දම්මලත් එක්ක හිටියා ගිහිල්ලා. ඊට පස්සේ මං දවස් 40 ක් 2017 නෝම්බි කාලයේ Festival ඔක්කොම ඉවර වුණාට පස්සේ පුත්තලම ප්‍රදේශයේ කුලියට පාලාවි එහෙ කුලියට ගෙයක් ගත්තා සාෆි මවුලවී කියලා එක්කෙනෙක් තමයි ඒ පැත්තේ හොයලා ගත්තේ. ඒ ගෙදරින් සහරානුයි, හස්තුන් , සාෆි මවුලවී, රිල්වානුයි, ොරා ඒ ගොල්ලො හිටියේ.

ප්‍ර: එතකොට දැන් හාදියා දන්නව ද කියන්න කොයි වෙලාවක හරි සහරාන් ලංකාවෙන් පිට ගියාද කියලා?

උ: නැහැ.

ප්‍ර: ගියේ නැහැ?

උ: නැහැ.

ප්‍ර: ලංකාවේමද හිටියේ?

උ: ඔව්.

ප්‍ර: හාදියට හොඳටම විශ්වාසද ඒක?

උ: ඔව්.

ප්‍ර: ඇයි එහෙම කියන්නේ කවදාවත් පිට ගියේ නැහැ ලංකාවෙමයි හිටියේ කියලා?

උ: එයා කතා කරන කොට තේරෙනවා පිට යන්න බැහැ කියලා.

ප්‍ර: ඒ කියන්නේ පිටරට යන්න බැහැ කියලා තේරෙනවා?

උ: ඔව්.

ප්‍ර: ඉතිං පිටරට යන්න පුළුවන්නේ එක එක විවිධ ක්‍රමවලට?

උ: එයා කිව්වා Airportවලින් එහෙම යන්න බැහැ කියලා. ඊට පස්සේ එයාට වරෙන්තු තිබ්බා කියලා. ඒ නිසා Airport වලින් යන්න බැහැ කියලා කිව්වා.

ප්‍ර: හාදියා හැබැයි බෝට්ටුවක නැඟලා යන්න පුළුවන්නේ?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඊට පස්සේ එයත් කිව්වා ඒ මාර්ගයෙන් යන්න බැහැ කියලා. ඊට පස්සේ මුහුදු ප්‍රදේශ ඒ මාර්ගයයෙත් යන්න බැහැ කියලා එයත් කිව්වේ.

ප්‍ර: ඇයි එහෙම බැරි යන්න?

උ: ඒවා මං දන්නේ නැහැ එයා කිව්ව විදියට තමයි මං දන්නේ.

ප්‍ර: සහරාන් කිව්ව එක තමයි හාදියා දන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් හාදියා කිව්වා සහරාන් යම් යම් අවස්ථාවල්වලදී Internet එකේ අර Telegram APP එක පාවිච්චි කරලා යම් යම් IS සංවිධානයට අදාළ දේවල් Upload කරා කියලා නේද?

උ: ඔව්.

ප්‍ර: දැන් ඒ IS සංවිධානයේ මොනව ගැනද සහරාන් ඒ වගේ Internet එකේ දැම්මේ? ඒක ෆේස්බුක් එකෙන් ද කරේ?

උ: ෆේස්බුක් එකෙන් එයාගේ දේශනා දාලා තිබ්බා.

ප්‍ර: වෙන මොනවද කරේ?

උ: ඊට පස්සේ අර Artical වගේ ඒවා ලියලා දාලා තිබුණා.

ප්‍ර: වෙන?

උ: වෙන පිටරටවලින් තියෙන්නේ ලින්ක් ඒවා තියෙනවා. ඒ ලින්ක් මං ගිහිල්ලා තමා විඩියෝ අරවා මේවා බලන්න පුළුවන් කියලා. ඒ ලින්ක් විතරයි දාලා තිබුණේ.

ප්‍ර: එතකොට මට කියන්න ඔය සහරාන් ඒ වගේ Internet එකට දේශනා දාලා තිබ්බේ මොනව ගැන දේශනා ද?

උ: ඒ ඉස්සෙල්ලම ඉස්ලාම් ආගම කොහොමද ඒක පිළිගන්න ඕන කියලා. ඊට පස්සේ කියලා තිබ්බේ පොලීසියේ කට්ටිය ඒ වගේ ඒවා පාර්ලිමේන්තුව Minister ලා ඒ ගොල්ලො කොහොම ද ඒ ගොල්ලො විශ්වාස කරන්නේ කොහොමද කවුද කට්ටිය කොහොමද පිළිගන්න ඕන කියලා ඒ වගේ. ඊට පස්සේ මේ ලංකාවට ඉස්ලාම් රාජ්‍ය වගේ ඒවත් කරන්න ඕන කියලා.

ප්‍ර: ඒ කියන්නේ ලංකාව ඉස්ලාම් රාජ්‍යයක් කියලා කරන්න ඕන කියල ද කිව්වේ සහරාන් ?

උ: ඔව්.

ප්‍ර: දැන් එතකොට ඒකට අකමැත්තක් නැහැනේ හාදියාගේ?

උ: නැහැ.

ප්‍ර: ඒ කියන්නේ ඉස්ලාම් රාජ්‍යයක් කෙරුවට අකමැත්තක් නැහැ ලංකාව?

උ: නැහැ.

ප්‍ර: දැන් ඔය දේශනා ගැන ඒ කියන්නේ IS එකට අදාළව තමයි එතකොට ඔය තොරතුරු පිළිබඳව කතා කරන්නේ හාදියා කිව්වා democracy වලට හාදියා සහරාන් කැමතිද නැද්ද? ඒ කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්නේ නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකාරිය දමිළ භාෂාවෙන් පිළිතුරු සැපයූ අතර එය කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක විසින් සිංහලයට පරිවර්තනය කරයි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: සහරාන් ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්නේ නැත්නම් හාදියා දන්නවද සහරාන්ට අවශ්‍ය කරේ මොකද්ද කියලා? දැන් හාදියා කිව්වා සහරාන් එක්ක ඉන්නකන් හාදියාට ඡන්දය දාන්න Vote කරන්න හම්බවුණේ නැහැ කියලා? Election එකට ගියේ නැහැනේ?

උ: නැහැ.

ප්‍ර: දැන් Vote කරනවද?

උ: නැහැ. දැන් බැහැ.

ප්‍ර: එතකොට සහරාන් එහෙම යන්න දුන්නේ නැත්තේ හාදියාට සහරාන් ප්‍රජාතන්ත්‍රවාදය අනුමත කරන්නෙ නැති නිසානේ?

උ: ඔව්.

ප්‍ර: එහෙමනම් සහරාන් කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට මොනව ඕනෙයි කියල ද කිව්වේ?

උ: එයා කියන්නේ මේකේ ඉස්ලාම් රාජ්‍යය වගේ තමයි මේකේ කරන්න ඕන කියලා.

ප්‍ර: හාදියා දැන් ඉස්ලාම් රාජ්‍යයක් තිබ්බාම මොකද වෙන්නේ?

උ: ඒ කියන්නේ එයා කියන විදිය ඉස්ලාම් ඒකේ ඉන්න නායකයා එයා කියන විදියට තමයි ඒවා කරන්න ඕන කියලා. මේ ලංකාවේ හොරකන් කරොත් අත කපන්න ඕන. ඒ වගේ හොරෙන් පැනලා ගියොත් ඒ වගේ ගල් විසි කරලා මරන්න ඕන. ඒ වගේ තමයි එයත් කියන්නේ.

ප්‍ර: ඒ කියන්නේ අර ෂරියා නීතිය ක්‍රියාත්මක කරන්න ඕන කියලද කියන්නේ?

උ: ඔව්.

ප්‍ර: සවුදි අරාබියාවේ වගේ නේද?

උ: ඔව්.

ප්‍ර: හාදියාත් කැමතිද ඒකට?

උ: නැහැ.

ප්‍ර: ඇයි අකමැති ?

President Secretariat Copy

FAIR COMMENT — BY JEZEEM —

උ: ඒ කියන්නේ මේ ලංකාවට බෞද්ධ , දෙමළ, මුස්ලිම්, හින්දු ඔක්කොම ඉන්න කට්ටියත් එක්ක ඒ කියන්නේ පරස්පර නැතුව ඔක්කොම එකතු වෙලා ඉන්න ඕන කියලා තමා මම කැමති.

ප්‍ර: දැන් හාදියා කිව්වා සහරාන් Articles ඔය Internet එකේ දැම්මා කියලා? ඒක හාදියා කියවලා තියෙනව ද ඒ Articles ?

උ: කියවලා තියෙනවා.

ප්‍ර: ඒවා දැන් ඔය සහරාන්ගේ දේශනා අහන්න ඒ Articles කියවන්න කියලා හාදියාට සහරාන් උපදෙස් දෙනවද?

උ: ඔව්. එයා ඒක Send කරනවා. ටෙලිග්‍රෑම් App වලින්. බලන්න කියලා. Articles එවලා තිබ්බා. පළවැනි අටිකල්ස් එයා ලියලා තිබ්බේ (දෙමළ බසින් එහි මාතෘකාව කියයි) පරීක්ෂාවට පසුව තමයි ජයග්‍රහණය.

ප්‍ර: ඒ තමයි පළවෙනියෙන්ම ලියපු එක?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඒකෙන් කියන්නේ මොකක්ද ඒ Articles එකෙන්?

උ: එයා කියන්නේ ඒ නබිතුමාගේ කාලයේ හරි දැන් මේ කාලේ වගේ නෙමේ. ඒ කාලේ නබිතුමාලා යුද්ධ කරලා ඒ ගොල්ලො මිනිස්සුත් එක්ක යන්නෙ එන්නේ නැතුව ඒ ගොල්ලො වෙන පැත්තකට ගිහිල්ලා යුද්ධ කරලා ඔහොම තමයි ඒ ගොල්ලො ජීවත් වුණේ. ඒ වගේ තමා මේ කාලයේ අපි කරන්න ඕන කියලා තමයි ඒකෙත් කියන්නේ.

ප්‍ර: ඒ කියන්නේ සහරාන් කියන්නේ මේ ඔය හාදියා කියනවට වැඩිය වෙනස් විදියට ද? අපි සාමයෙන් ඉන්නවා නෙවෙයි අපි යුද්ධ කරලා ඉන්න ඕන කියලද කියන්නේ ?

උ: ඔව්. ඒ කියන්නේ යුද්ධ කරලා ඒ නබිතුමාගේ කාලයේ වගේ යුද්ධ කරලා මේකේ දැන් ඉස්ලාම් මුස්ලිම් කට්ටිය තමයි ඉන්න ඕන.දෙමළ අනිත් කට්ටියට කියවන්න ඕන ආගම මෙහෙම තමයි කියලා. ඒ ගොල්ලන් කියලා අපේ ආගමට ගන්න ඕන.

ප්‍ර: ඒ කියන්නේ ඉස්ලාම් ආගමට අනිත් අයව ගන්න ඕන?

උ: ඔව්. ඒ ගොල්ලොන්ට ඉස්සෙල්ලා උපදෙස් දෙන්න ඕන. තුන්පාරක් විතර ඒ ගොල්ලොන්ට කියන්න ඕන. තුන්පාරක් ඇහුවේ නැත්නම් තමා ඒකට මොකක් හරි reaction ගන්න ඕන කියලා කිව්වේ.

ප්‍ර: එහෙම තුන්පාරක් ඒ ගොල්ලොන්ට කියනවා. ඒ කියන්නේ ඉස්ලාම් ආගමේ නැති අයට කියනවා මෙහෙම ඉස්ලාම් ආගම අදහන්න කියලා?

උ: ඔව්.

ප්‍ර: එක සැරයක් කියනවා දෙසැරයක් කියනවා, තුන් සැරයක් කියනවා ඒත් අහන්නේ නැහැ .එතකොට මොකද්ද කරන්න ඕන කියන්නේ?

උ: එතකොට ඒ ගොල්ලො ඒ ආගමේ ඉන්න පුළුවන්ලු. ඒ ආගම ඒ ගොල්ලො කරන්න ඕන. මේ ගොල්ලොන්ට ජිසියා කියලා ඒ කියන්නේ

FAIR COMMENT
BY JEZEEM

ඒ ගොල්ලන් කියන විදියට තමා අනිත් ආගමේ කට්ටියත් ඉන්න ඕන. ඒ ගොල්ලන් ඒ ගොල්ලොන්ගේ ආගම අදහන්න පුළුවන්.

ප්‍ර: එතකොට මොකක් හරි tax එකක් එහෙම ගෙවන්න තියෙනව ද ඒ වගේ දෙයක් කිව්වද?

උ: ඔව් . ජීසියා කියන්නේ වරියා කියලා කියන්නේ ඒකේ. ඒ ගොල්ලොන්ට සල්ලි වගේ බැඳලා මේ දැන් නායකයා කවුද ඒ ගොල්ලොන්ට තමයි එහෙම කරන්න ඕන.

ප්‍ර: ඒ කියන්නේ කැලිෆට් එකක් තියන්න ඕන එතකොට ඒ කලීෆාට ඒ සල්ලි ගෙවන්න ඕන එහෙම ද?

උ: ඔව්.

ප්‍ර: ඒ සල්ලි ගෙවන්න ඕන වෙන්නේ එතකොට අර ඉස්ලාම් ආගමට එන්නේ නැතුව තමන් අදහන ආගමේ ඉන්න අය?

උ: ඔව්.

ප්‍ර: එතකොට දැන් කොයි වෙලාවක හරි එහෙම ඉස්ලාම් ආගමේ නොවන අය මරන්න ඕන කියලා එහෙම කියලා තිබ්බ ද?

උ: ඒවත් ඒ ගොල්ලොන්ව අහන්නේ නැත්නම් ඒ ගොල්ලො මරන්න ඕන කියලා ඒකේ කියනවා.

ප්‍ර: එහෙම සහරාන් දේශනා කෙරුවද?

උ: ඒ Article එකේ ලියලා තිබ්බා.

ප්‍ර: එතකොට දැන් හාදියා ඔය වගේ දේවල්වලට එකඟයි ද?

උ: මං ඒවට එකතු වුණේ නැහැ.

ප්‍ර: එතකොට දැන් එහෙමනම් ඒක වැරැද්දක් කියලා හාදියාට තේරුණා ද?

උ: ඔව්.

ප්‍ර: ඉතිං එහෙම වැරැද්දක් කියලා තේරුණානම් හාදියා ඒක කිව්වේ නැද්ද සහරාන්ට ඔය කියන දේ වැරදි හැමෝම එකමුතුව ජීවත් වෙන්න ඕන කියලා?

උ: ඒවා මං කිව්වා එයාට.

ප්‍ර: එතකොට සහරාන් මොකද කිව්වේ?

උ: එතකොට සහරාන් කිව්වා ආගම් තියෙන විදියට තමයි ආගම අදහන්න ඕන. ගැහැණු අය කියන එක පිරිමි අහන්නේ නැහැ. එයා කිව්වේ වෙන පිරිමි අය ඇහුවට මං අහන් නෑ ඒක . එයා අහන්නේ යුද්ධ කරලා මේ ලංකාවේ ඉස්ලාම් රාජ්‍යය වගේ හදාගන්න ඕන කියලා තමා එයත් කිව්වේ.

ප්‍ර: ඉතිං ඒ මතය වැරදි නේද හාදියා?

උ: ඔව්.

ප්‍ර: එතකොට හාදියා ඔය ගැන සහරාන් මෙහෙම කියනවා Internet එකට දානවා මේ වගේ මතයක් ප්‍රචාරය කරනවා කියලා පොලීසියට එහෙම කිව්වේ නැද්ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: මං කිව්වේ නැහැ.

ප්‍ර: ඇයි ඒ?

උ: ඒ එයා 2017 ඉඳලා කියලා තිබ්බේ අර ප්‍රචාරය කරන්න කලින් මම කොහොම හරි ගිහිල්ලා බාර වෙන්න කියලා තමයි එයා කිව්වේ.

ප්‍ර: කවුද කිව්වේ ?

උ: සහරාන්. අන්තිමට එයා ගියේ නැහැ.

ප්‍ර: ඒ කියන්නේ හාදියා කිව්ව සහරාන්ට 2017 ඉඳලා ගිහිල්ලා බාර වෙන්න කියලා?

උ: ඔව් පොලිසියෙන් ගිහිල්ලා බාර වෙන්න ගියලා.

ප්‍ර: පොලිසියට ගිහිල්ලා භාර වෙන්න කියලා?

උ: ඔව්.

ප්‍ර: සහරාන් ගියේ නහැ?

උ: ගියේ නැහැ. ඊට පස්සේ තමා සහරාන් අර විඩියෝස් අරවා මේවා FB වලින්, ටෙලිග්‍රෑම් Channel වලින් දාලා තිබුණේ. ඊට පස්සේ මං මේක බලලා සහරාන්ට කිව්වා මොකද කරන්නේ කියලා මේකේ. එයත් කිව්වා මෙහෙම තමා ඉස්ලාමීය රාජ්‍ය කියලා . ඒක තමා මං හදන්නේ . ඊට ප්සසේ එයා කිව්වේ මං එයාටත් කිව්වා ඒකට මං කැමති වෙන්නේ නැහැ කියලා. ඊට පස්සේ මං එයාට පළමුවෙනි පාර ඩිවෝස් ඉල්ලුවේ.

ප්‍ර: කාගෙන්ද ඉල්ලුවේ ?

උ: සහරාන්ට.

ප්‍ර: කවදද ඉල්ලුවේ ?

ප්‍ර: 2017.

ප්‍ර: 2017 අලියාර් හන්දියේ ගැටුමට ඉස්සරවෙලාද පස්සේද?

උ: පස්සේ.

ප්‍ර: ඇයි එහෙම ඉල්ලුවේ ඩිවෝස් එක?

උ: එයා පොලිසියෙන් ගිහිල්ලා බාර වෙන්නෙත් නැහැ කියලා කිව්වා. ඊට පස්සේ තමයි IS එකේ එයත් කිව්වා මං IS එකේ තමා මං ඉන්නේ කියලා.

ප්‍ර: කවුද කියන්නේ මේ සහරාන් කියන්නේ?

උ: ඔව් සහරාන්. ඊට පස්සේ මං කිව්වා ඔයා ඒක හදාගෙන මං ඒකට එන්නේ නැහැ කියලා. මට ඩිවෝස් දෙන්න කියලා මං ඩිවෝස් ඉල්ලුවා එයාට.

ප්‍ර: සහරාන් මොකද කිව්වේ?

උ: එයා කිව්වා ඔයා ඩිවෝස් ඉල්ලන්න එපා මම ඩිවෝස් දෙන්නෙත් නැහැ කියලා එයත් කිව්වේ.

ප්‍ර: දැන් එතකොට ඔය වෙනකොට කැකුණගොල්ලේ තමයි පදිංචි වෙලා ඉන්නෙ හාදියා ළමයිනුත් එක්ක?

උ: ඔව්.

ප්‍ර: නමුත් සහරාන් දැන් හැංගිලා හැංගිලා ඉන්නවා ඇවිල්ලා හාදියත් එක්ක ජීවත් වෙන්නේ නැහැ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: නැහැ.

ප්‍ර: ඩිවෝස් එක ඉල්ලුවට ඒක දෙන්නෙත් නැහැ කියලා තමයි හාදියා කියන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට මොකද කළේ දැන් අම්මලා තාත්තලට කිව්වේ නැද්ද මේ බලන්න මේ වගේ දෙයක් කරනවා. මේ සහරාන් මේක හොඳ නෑනේ මේක වැරදිනේ කියලා කිව්වේ නැද්ද?

උ: අම්මලත් කිව්වා ඇයි හැංගිලා ඉන්නේ කියලා. එතකොට අම්මලා ෆේස්බුක් ඒවා දන්නේ නැහැ. ඒ ගොල්ලොන්ට ඒවා මං පෙන්නුවෙත් නැහැ. ඊට පස්සේ තමයි අම්මලා ඇහුවේ ඇයි එයා එන්නේ නැත්තේ කියලා. මං කිව්වා මෙහෙම තමයි ප්‍රශ්නය කියලා. ඊට පස්සේ තාත්තා තමයි කිව්වේ ඔයා ඩිවෝස් ඉල්ලන්න පුතේ කියලා. ඊට පස්සේත් මං 2018 ආයේ ඉල්ලුවේ එයාට. ඊට පස්සේ එයා කිව්වා ඔයාගේ කවුරු හරි කිව්වටත් මං දෙන්නේ නැහැ කියලා. එහෙම ඔය ගොල්ලො ඉල්ලුවොත් ඔයාව මං මරනවා කියලා කිව්වා. එයා මරණ තර්ජනය කරා. ඔයාගේ ගෙදර මං ඇවිල්ලා යනවා. ඔයා මේ ෆෝන් එකේ ටෙලිග්‍රෑම් App use කරනවා හරි ඔයා කියන්න එපා කියලා තමයි කිව්වේ. පොලීසියෙන් හරි කවුරුහරි හොයන් ආවොත් ඒ නිසා මං ඒවත් කිව්වේ නැහැ.

ප්‍ර: ඒ සහරාන් කිව්වා හින්දා හාදියා කිව්වේ නැහැ කියලද කියන්නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට දැන් ඔය විඩියෝස් එහෙමත් අප්ලෝඩ් කරනවා කියලා කිව්වනේ Internet එකට?

උ: ඔව් FB එකේ දානව.

ප්‍ර: මොන වගේ විඩියෝස් ද දැම්මේ සහරාන්?

උ: එයාගේ දේශනා විඩියෝ තමයි එකේ දාන්නේ .

ප්‍ර: මොනව ගැනද එයා දේශනා කරන්නේ?

උ: ඉස්සෙල්ලා ඉස්ලාම් ආගම කොහොම හදාගන්න ඕන කියලා තමයි එකේ කියලා තිබ්බේ. ඊට පස්සේ උදව් පොලීසියේ අයට හරි ගිහිල්ලා ඒ ගෝලලොන්ට දැන් මොකක් හරි ගැටළුවක් තිබුණොත් පොලිසියේ අයට ඒ වගේ උසාවිවලට ගිහිල්ලා ඒ ගොල්ලොන්ට තිරණය ගන්න එපා ඒ ගොල්ලෝ හරියට තිරණය දෙන්නේ නෑ. එහෙම කියලා තමයි ඒකේ කියවුණේ. ඊට පස්සේ අනිත් ආගම්වලට හෝ ඒ ගොල්ලො ඔහොම තමයි හදාගන්න ඒවා වැරදි එහෙම කියලා එහෙම තමයි එයා කියලා තිබුණේ.

ප්‍ර: එතකොට දැන් ඔය හාදියා ඉස්සෙල්ලා කිව්වා මේ ප්‍රජාතන්ත්‍රවාදය අනුමත කරන්නේ නැහැ කියලා සහරාන්?

උ: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔය මුස්ලිම් ජන කොටඨාශයේ මන්ත්‍රීවරු ඉන්නවා නේද පාර්ලිමේන්තුවේ? මුස්ලිම් MPSලා ඉන්නවනේ පාර්ලිමේන්තුවේ?

උ: ඔව් ඉන්නවා.

ප්‍ර: එතකොට ඒ පිලිබඳව සහරාන් දරපු මතය මොකද්ද?

උ: එයා කියන්නේ මුස්ලිම් වුණත් සිංහල දෙමළ කවුරුත් වුණත් එයා ඒවා පිළිගන්නේ නැහැ කියලා. ඒ ගොල්ලො හරියට ඒවා කරන්නේ නැහැ කියලා තමයි එයා කියන්නේ.

ප්‍ර: Coconut මුස්ලිම් කියන්නේ කවුද හාදියා දන්නවද?

උ: දන්නේ නැහැ.

ප්‍ර: දැන් ඔය හාදියා කියන විදියට Internet එකේ, ෆේස්බුක් එකේ, එතකොට ටෙලිග්‍රෑම් Application මඟින් දේශනා කරනවා ආටිකල්ස් දානවා විඩියෝස් එකතු කරනවා. ඒ වගේ විවිධ දේවල් කරනවා නේද?

උ: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ තාක්ෂණය IT පාවිච්චි කරන්න ඕනනේ?

උ: ඔව්.

ප්‍ර: ඔය සහරාන් එක්ක දැන් 2009 ඉඳලා හාදියා ජීවත් වුණානේ?

උ: ඔව්.

ප්‍ර: සහරාන්ට IT knowledge එකක් තිබ්බ ද?

උ: එයාට ඒවා තියෙනවා. වැඩිය Internet එකෙන් ඉගෙන ගන්නවා.

ප්‍ර: කොහොම ද ඉගෙන ගන්නේ කාගෙන්ද ඉගන ගන්නේ ?

උ: සමහරක් ඒවා ඉස්සෙල්ල නවුෆර් එක්ක සම්බන්ධවෙලා තිබුණාම එයාගෙන් අහගන්නවා. ඊට පස්සේ එයා Internet වලින් ගිහිල්ලා ඉගෙන ගන්නවා.

ප්‍ර: ඒ අනුව තමයි ඉගෙන ගන්නේ?

උ: ඔව්.

ප්‍ර: ඒ හැරෙන්න ඔය සාමාන්‍යයෙන් Internet එකේ වැඩ එයාට කරලා දෙන කවුරු හරි එහෙම හිටිය ද?

උ: ඔව් හිටියා.

ප්‍ර: කවුද ඒ?

උ: ඊට පස්සේ Internet ඒවා වැඩ කරලා දෙන්නේ එයාට කස්තුන්.

ප්‍ර: කස්තුන් තමයි කරලා දෙන්නේ?

උ: ඔව්.

ප්‍ර: කස්තුන් ඔට්ටමාවඩි කිව්වා නේද?

උ: ඔව්.

ප්‍ර: කස්තුන් රස්සාවක් විදියට මොකක්ද කරේ?

උ: එයා ඉලෙක්ට්‍රෝනික් Shop එකක වැඩ කරා.

ප්‍ර: කොහේද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: කාත්තන්කුඩියේ.

ප්‍ර: 2016 ඉඳලා කස්තුන් එක්ක සම්බන්ධ වුණා කියලා කිව්වනේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට සාරව හම්බවුණෙත් 2016 කියලා කිව්වා හාදියාට?

උ: ඔව්.

ප්‍ර: ඒ කාලේ කස්තුනුයි සාරායි පදිංචි වෙලා හිටියේ කාත්තන්කුඩිවල ද?

උ: ඔව්.

ප්‍ර: 2017 මාර්තු මාසේ 10 වැනිදා අලියාර් හන්දියේ වුණු ගැටුමට පස්සේ හාදියා ගියාට පස්සේ කැකුණුගොල්ලට කොයි වෙලාවක හරි කස්තුනුයි සාරායි කුකුණුගොල්ලේ ගෙදරට ආවද?

උ: ඔව් ආවා.

ප්‍ර: මොකටද ආවේ?

උ: ඒ ගෝලලෝ 2017 නෝම්බි ඉවර වෙලා Festival සති දෙකකින් පස්සේ ආවේ.

ප්‍ර: මොනවට ද ආවේ?

උ: ඇවිල්ලා කිව්වේ මං bio ඉගෙන ගන්න ඕන කියලා තමා කිව්වේ.

ප්‍ර: කාටද bio ඉගෙන ගන්න ඕන?

උ: එයයි දෙන්නම කරන්න ඕන කියලා තමයි ඉස්සෙල්ලා කිව්වේ.

ප්‍ර: ඒ කියන්නේ කස්තුන් සහ සාරා කියන දෙන්නටම bio ඉගෙන ගන්න ඕන කියලා කිව්වා?

උ: ඔව්.

ප්‍ර: ඉතිං ඇයි ඒ ගොල්ලො කැකුණුගොල්ලට ආවේ bio ඉගෙන ගන්න?

උ: මා ඒ 2016 වලින් ඒ ගොල්ලො ඉගෙන ගන්න ඕන කියලාත් කිව්වා. මං කිව්වා අපේ ගමේ පැත්තේ bio ඒ වගේ තියෙනවා කියලා. ඊට පස්සේ 2016 තමා මේ ප්‍රශ්නයෙන් පස්සේ තමයි ඒ ගොල්ලො එහෙම ආවේ. ඇවිල්ලා ඉස්සෙල්ලා කිව්වේ පොඩියට හරි කුලියට ගෙයක් අරන් දෙනවද කියලා ඇහුවේ.

ප්‍ර: කාගෙන්ද ඇහුවේ?

උ: මගෙන් ඇහුවේ.

ප්‍ර: කවුද ඇහුවේ?

උ: සාරා.

ප්‍ර: එතකොට මොකද හාදියා කිව්වේ?

උ: ඊට පස්සේ මං කිව්වා හා කියලා අපේ පුංචිගේ ගෙදර ඉඩත් තිබුණා. ඒවත් මං ගිහිල්ලා පෙන්නුවේ එයාට. ඊට පස්සේ එයා ඒක බලලා පාර අයිනේ කියලා එපා කියලා කිව්වේ . ඉන්න බැහැ කියලා.

ප්‍ර: පාර අයිනේ ගෙයක් එපා කිව්වා?

උ: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මොන පාර අයිනෙන් ද හෙව්වේ හාදියා ගෙදර? ගෙදරක් හෙව්වා කියලා කිව්වනේ පාරක් අයිනෙන්. මොන වගේ පාරක් අයිනෙන්ද ඔය හොයපු ගේ තිබ්බෙ?

උ: ඒකේ තිබුණේ main පාරක වගේ තිබුණේ ගේ.

ප්‍ර: ඒ කියන්නේ main road එකක්?

උ: ඔව්.

ප්‍ර: එතකොට main road එකක් ළඟ ගෙයක් එපා කියලද කිව්වේ කස්තුන්ලා?

උ: ඔව්.

ප්‍ර: ඒ අනුව මොකද්ද කරේ හාදියා?

උ: ඊට පස්සේ ගෙයක් බැලුවා හම්බ වුණේ නැහැ. ඊට පස්සේ අපේ ගෙදරින් බෝඩින්වලට කාමර දෙනවා කට්ටියට.

ප්‍ර: ඒ කියන්නේ මේ අම්මලගේ ගෙදර?

උ: අම්මාලගේ ගෙදරින්. ඒ අම්මලගේ ගෙදරින් කාමර එළියට දෙකක් හදල තිබ්බෙ. ඒ පළවැනි කාමරේ Hostel boysලා තමා දාලා තිබුණේ. අනිත් කාමරය නිකන් තිබුණේ. ඒ කාමරේ එයාට දුන්නා.

ප්‍ර: කාටද දුන්නේ?

උ: කස්තුන්ටයි සාරාටයි. ඒ දෙන්නම ඒකේ හිටියා.

ප්‍ර: ඒ කොයි කලෙද ඔය ?

උ: ඒ 2017.

ප්‍ර: 2017 මාර්තු 10 ට පස්සේ?

උ: ඒ කියන්නේ 07 වැනි මාසෙන් පස්සේ.

ප්‍ර: ඒ කියන්නේ ජූලි මාසේ?

උ: ජූලි මාසේ.

ප්‍ර: 2017 ජුලි මාසෙන් පස්සේද?

උ: ඒ කියන්නේ Festival ඔක්කොම ඉවරවුණාට පස්සේ.

ප්‍ර: එතකොට කොච්චර කාලයක් ඒ ගෙදර හිටිය ද සාරායි කස්තුනුයි?

උ: ඒ ගෙදර හිටියා දෙසැම්බර් වෙනකන්.

ප්‍ර: දෙසැම්බර් වෙනකන් හිටියා?

උ: 2017 දෙසැම්බර්.

ප්‍ර: ඊට පස්සේ?

උ: ඊට පස්සේ නවුෆර් මවුලවි එයා කස්තුන්ට කියලා තිබුණේ එයාගේ උඩ තට්ටුවේ වැඩ ඉවරයි කියලා. ඒ ගෙදරින් ඇවිල්ලා ඉන්න පුළුවන් කියලා ඒ ගොල්ලොන්ට කියලා තිබුණේ.

ප්‍ර: ඒ මොන කාලයේද ඔය දැන්?

උ: 2017 .

ප්‍ර: 2017 ද 2018 ද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: 2017 ඉඳලා ඊට පස්සේ ඒ ගොල්ලො දෙසැම්බර් ඉඳලා 18 මාර්තු ඒ මාසවල ඒ ගෙදර හිටියා.

ප්‍ර: දෙසැම්බර් වෙනකන් හිටියට පස්සේ 2017 සාරායි කස්තූනුයි වෙන කොහේ හරි පදිංචියට ගියාද?

උ: දෙදාස්

ප්‍ර: 2017 දෙසැම්බර් වෙනකන් දැන් හාදියාගේ ගෙදර හිටියා කියලා කිව්වනේ ඉස්සරහා කාමරේ?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ සාරයි කස්තූනුයි කොහේටද ගියේ?

උ: නවුෆර් එයාගේ ගෙදරට ගියා.

ප්‍ර: ඒ කියන්නේ හාදියාගේ බාප්පගේ ගෙදරට ගියා?

උ: ඔව්.

ප්‍ර: එහෙ නැවතිලා හිටිය ද?

උ: ඔව්.

ප්‍ර: කොච්චර කාලයක්?

උ: මාස 7 ක් වගේ ඒ ගෙදර හිටියේ.

ප්‍ර: දැන් හැබැයි හාදියාගේ ගෙදර ඉඳල ඇවිදින දුරනේ නවුෆර්ගේ ගෙදරට?

උ: ඔව්.

ප්‍ර: ඒ මාස 07 08 ක් එහේ හිටියට පස්සේ ඊළඟට ඒ ගොල්ලො එතැනින් කොහේට හරි ගියාද?

උ: මාස 07 ක් නෙමේ මාස 04 ක් 05 ක් වගේ.

ප්‍ර: ඊට පස්සේ ඒ ගොල්ලො මොකද කරේ?

උ: ඊට පස්සේ ඒ උඩ තට්ටුවේ නවුෆර් මවුලවී කියලා තිබ්බා කස්තූන්ට ඒකේ උඩ තට්ටුවේ ආරබි මද්‍රසා ඒවා කරන්න ඕන කියලා. ඊට පස්සේ සහරාන් නවුෆර්ලා එකතුවෙලා ආයි සාරට කියලා තිබ්බා මෙහෙම ඉඳලා අර ගෙදරින් අයින් වෙන්න ඕන කියාල.

ප්‍ර: ඒ කියන්නේ නවුෆර්ලගේ ගෙදරින් අයින් වෙන්න කියලා?

උ: ඔව්. ඊට පස්සේ ආපහු සාරා ආවේ අපේ ගෙදරට.

ප්‍ර: ආයිමත් ආවා එතකොට සාරා ඔය ගොල්ලොන්ගේ ගෙදරට?

උ: අම්මලගේ ගෙදරට ආවේ.

ප්‍ර: ඒ කියන්නේ හාදියාගේ අම්මලගේ ගෙදරට ආවා?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ නැවතිලා හිටිය ද ඒ ගෙදර?

උ: ඒ ගෙදර තමයි නැවතිලා හිටියේ.

ප්‍ර: එතකොට දැන් ඔය වෙනකන් කස්තූනුයි සාරායි එකටනේ හිටියේ?

උ: ඒ වෙනකන් එකට හිටියේ නැහැ දෙන්නම. සාරා ඉන්නවා මාසේ දවස් 05 ක් 06 ක් විතර කස්තූන් එනවා. නිවාඩු කියලා තමා එයා කිව්වේ මට මුලින්.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: අනිත් දවස්වල කස්තුන් කොහේද හිටියේ?

උ: ඊට පස්සේ එයත් කිව්වා එයාට කොළඹ ෆාමසි එකක් Set වුණා කියලා කස්තුන්. කස්තුන් එහෙම ඉන්නවා කියලා සාරා මටත් කිව්වේ. එයාට ෆාමසි එකක් Set වෙලා කියලා. එහෙන් තමා එයා නිවාඩු ආවේ කියලා කිව්වේ. පස්සේ තමා කස්තුනුයි සහරානුයි එකට ආවේ.

ප්‍ර: එතකොට ඒ රස්සාවට ගියේ නැද්ද ඊට පස්සේ කස්තුන්?

උ: ඒ කියන්නේ රස්සාවාට ආවේ නැහැ . පස්සේ තමා ඇහුවේ සහරාන්ට. කස්තුන් ඕගොල්ලොත් එක්ක ද ඉන්නේ කියලා. ඊට පස්සේ තමා ඔව් කාටවත් කියන්න එපා කියලා කිව්වේ.

ප්‍ර: ඒ කියන්නේ ඔය කොයි කාලෙ වගේද ඔය කතාව ආවේ?

උ: ඒ 2018.

ප්‍ර: 2018 මොන මාසේ වගේද?

උ: 2018 වගේ කියලා කිව්වේ.

ප්‍ර: දැන් ඔය සාරා ගෙදර ඉඳලා මොනවද කරන්නේ?

උ: ඒ ගෙදර ඉඳලා අර නවුෆර් එයාගේ ගෙදර ඉන්න කොට එයාගේ ගෙදර ඉන්න bio ඉගෙන ගන්න පොතක් ගෙනත් තිබ්බා. ඒ පොත බලනවා. ඊට පස්සේ මං කිව්වා ඒ Class එකට යන්නේ නැත්තේ කියලා. නැහැ යන්න ඕන මං Private ඉගනගන්නේ කියලා තමා කිව්වේ. මොකක් හරි ප්‍රශ්න වුණොත් මං ගිහිල්ලා ඒකෙන් Notes ඒක හරි ගන්නම් කියලා තමයි කිව්වේ. ඊට පස්සේ නවුෆර්ලගේ ගෙදර ඉන්න කොට තව කට්ටිය හිටියා bio ඉගෙන ගන්න ඇවිල්ලා ඉන්න කට්ටිය. ගාල්ලේ ඒ ගොල්ලන්.

ප්‍ර: ඒ මොකද ඔක්කොමලා bio ඉගෙන ගන්න කැකුණුගොල්ලට එන්නේ?

උ: ඒකේ ගොඩාක් අය ඇවිල්ලා ඉන්නේ bio ඉගෙන ගන්න ඒකෙන්.

ප්‍ර: කොහේන්ද ඉගන ගන්නේ?

උ: කැකුණුගොල්ල privet Class එකක් තියෙනවා එහෙ. ඒකේ ඇවිල්ලා ඉන්නවා ගොඩක් අය .

ප්‍ර: ඒ Class එක කරන්නේ කවුද?

උ: ඒ පැත්තේ ඉන්නවා සර්ලා ගොඩාක් අය .

ප්‍ර: ඒ Class එකේ උගන්වන්නේ bio ද?

උ: bio , physics ඒ ඔක්කොම උගන්වනවා.

ප්‍ර: ඒ Classes වලට තමයි මේ කට්ටිය එන්නේ?

උ: ඔව්.

ප්‍ර: දැන් සාරා ඉතින් ඒ Class එකට ගිහිල්ලා ඉගෙන ගත්තද කොයි වෙලාවක හරි?

උ: එයා ගියේ නැහැ. නවුෆර්ලගේ ගෙදර ඉන්න කොට තව කට්ටිය හිටියා. ඊට පස්සේ මං ඇහුවා එයාගෙන් ඇයි ඔයා යන්නේ නැත්තේ කියලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නැහැ මං ඒ සාමාගේ නෝට් එක අරගෙන තමයි ඉගෙන ගන්නේ කියලා කිව්වේ. පාඩම් කරනවා කියලා ඔහොම තමා එයත් කිව්වේ.

ප්‍ර: හාදියායි සාරායි කතා කරන්නේ මොන භාෂාවෙන් ද?

උ: දෙමළ භාෂාවෙන් තමයි.

ප්‍ර: එතකොට දැන් ඔය ඉස්සරවෙලා හාදියා සාක්ෂි දෙන කොට කිව්වා සහරාන්ට අර නජීම් දුන්න සල්ලිවලින් ත්‍රීවිලර් එකක් ගත්තා කියලා. ඊට පස්සේ කොයි වෙලාවක හරි සහරාන් වෙන වාහනයක් ගත්තද?

උ: ඒ බයික් එකක් ගත්තා.

ප්‍ර: මොන බයික් එකක්ද?

උ: ඩිස්කවරි බයික් එකක්.

ප්‍ර: කොයි කාලෙද?

උ: ඒ 2013.

ප්‍ර: කොච්චර කල් ඒක පාවිච්චි කරාද?

උ: ඒ 2017 වෙනකන් පාවිච්චි කරා.

ප්‍ර: කොයි වෙලාවක හරි සහරාන් වෑන් එකක් එහෙම ගත්තද?

උ: ඒ 2018.

ප්‍ර: මොන වගේ වෑන් එකක් ද ගත්තේ?

උ: වෙනට් නිසාන් වෙනට් කියලා එකක් ගත්තේ. සුදු පාට එකක්.

ප්‍ර: සහරාන්ට Driving පුළුවන් ද?

උ: බැහැ.

ප්‍ර: එතකොට කවුද එලවන්නේ?

උ: එයාට ඒවා පුළුවන්. ලයිසන් එකක් කියලා ලොකු වාහනයක එයා Driving කරන්නේ නැහැ.

ප්‍ර: එතකොට දැන් වෑන් එකක් කියන්නේ ලොකු වාහනයක් නේ. කවුද එතකොට වෑන් එක එලෙව්වේ?

උ: ඒ ඉස්සෙල්ලා සාහි මවුලවී තමා එලවේවේ.

ප්‍ර: කොයි වෙලාවක හරි ගෆූර් මාමා එලෙව්ව ද?

උ: ඊට පස්සේ ගෆූර් මාමා 2018/07 වැනි මාසේ හරි 06 වැනි මාසේ හරි එයා සහරාන් එක්ක තමයි හිටියේ.

ප්‍ර: කොයි වෙලාවක හරි ඔය ගත්ත වෑන් එක සහරාන් වික්කද?

උ: ඔව්.

ප්‍ර: ඒ කොයි කාලෙද?

උ: ඒ 2019 ජනවාරි තමයි ඒක විකුණුවේ.

ප්‍ර: ඒක විකුණන්න උදව් කෙරුවේ විකුණලා දුන්නේ ගෆූර් මාම ද?

උ: ඒකේ වාහනේ ගෆූර් මාමා තමා අපේ අයියට ගෙනත් දුන්නේ. අයියා වාහන බිස්නස් කරනවා.

ප්‍ර: අයියා වාහන බිස්නස් කරනවා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔව්. ඒ අයියට තමයි ඒ වාහනය විකුණලා දෙන්න කියලා ගහූර් මාමා ගෙනල්ලා දුන්නේ.

ප්‍ර: එතකොට සහරාන්ගේ වාහනේ විකුණලා දෙන්න කියලා ගෙනත් දුන්නේ ගහූර් මාමා?

උ: ඔව්.

ප්‍ර: ගෙනත් දුන්නේ හාදියගේ අයියට?

උ: ඔව්.

ප්‍ර: ඒක විකුණලා දුන්නද?

උ: ඔව්.

ප්‍ර: මොකද්ද අයියගේ නම?

උ: අන්සාර්.

ප්‍ර: අර කාත්තන්කුඩියේ ගෙදරින් 2017 මාර්තු මාසේ 11 වැනිදා උදේ හාදියාවයි බබාලා දෙන්නයි ගෙනාපු අයිය නෙවෙයි ඒ නේද?

උ: නැහැ.

ප්‍ර: කොයි වෙලාවක හරි ඔය කැකුණගොල්ලේ ගෙදර පදිංචි වෙලා ඉන්න කොට හදියා හාදියා දන්නවද කියන්න සහරාන් ඔළුවිල්වල එහෙම හිටියද කියලා?

උ: ඒ කියන්නේ අම්පාර පැත්තේ ඔළුවිල් register ගෙදර තමයි එයා හිටියේ.

ප්‍ර: කාගේ ගෙදරද?

උ: අර registrar කියන්නේ එයාගේ ගෙදර හිටියේ.

ප්‍ර: සහරාන් ගත්ත වැන් එක එලෙව්වා කියලා කිව්වනේ සාෆි මවුලවී ?

උ: ඔව්.

ප්‍ර: ඒ සාෆි මවුලවී ද අර එයාගේ ගෙදර ගාවද පල්ලියක් එහෙම හදලා කාත්තන්කුඩියේ සහරාන් මවුලවී කෙනෙක් විදියට වැඩ කරේ?

උ: ඔව්.

ප්‍ර: ඇත්තටම සාෆි මවුලවී කාත්තන්කුඩියේ ද නැත්නම් මැදවච්චියේ ද කොයි පැත්තේ ද?

උ: එයා මැදවච්චියේ.

ප්‍ර: කොච්චර කාලයක් සාෆි මවුලවී දැනගෙන හිටිය ද සහරාන්ව?

උ: ඒකේ සුනාමි එකට පස්සේ එයා කාත්තන්කුඩියට ගියාලු. ඒ ගිහිල්ලා අවුරුදු දෙකකට පස්සේ සහරාන්ව අඳුර ගත්තේ . එයත් එක්ක යාළු වුණා.

ප්‍ර: ඒ කියන්නේ සාෆි මවුලවී සුනාමියට අවුරුදු දෙකකට පස්සේ කාත්තන්කුඩියට ඇවිල්ලා තියෙනවා?

උ: ඔව්.

ප්‍ර: ඒ වෙලාවේ තමයි මේ සහරාන්ව හමුවෙලා යාළු වෙලා තියෙන්නේ?

උ: ඔව්.

ප්‍ර: දැන් ඔය NTJ එක ගැන කිව්ව නේද හාදියා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔව්

ප්‍ර: හාදියා NTJ කියලා කියන්නේ නැෂනල් තවුහිද් ජමාත් නේද?

උ: ඔව්.

ප්‍ර: ඒ නැෂනල් තවුහිද් ජමාත් සංවිධානයේ සභාපති විදියට කවුද කටයුතු කෙරුවේ? ඒක පිහිටෙවුවේ කවුද?

උ: ඒකේ මවුලවීලා 04 දෙනෙක් හිටියා.

ප්‍ර: ඒක පටන් ගත්තේ කවුද?

උ: සහරාන් තමා ඒකෙත් මුලින් හිටියේ.

ප්‍ර: මුලින්ම සහරාන් පටන් ගත්තේ?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ?

උ: ඊට පස්සේ එක එක්කෙනාට ඉස්සරවෙලා නායකයා සහරාන්. එයාට ආපහු උදව් එකේ තවුෆීක් මවුලවී හිටියා.

ප්‍ර: කවුද ඒ තවුෆීක් මවුලවී කියන්නේ?

උ: එයා ඒ පල්ලියේ මවුලවී එක්කෙනෙක්. කාත්තන්කුඩි පදිංචි එයා.

ප්‍ර: කාත්තන්කුඩි පදිංචි තවුහිද් පල්ලියේ මවුලවී?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ?

උ: ඊට පස්සේ සාෆි මවුලවී එයත් හිටියේ ඒකේ. ඊට පස්සේ අවුරුද්දෙන් අවුරුද්ද එකට ඒ ගොල්ලො මාරු කරනවා. සභාපති එක්කෙනයි ඔහොම ඔහොම ඒ ගොල්ලො මාරු කරනවා 04 දෙනා.

ප්‍ර: ඔය සාෆි මවුලවී කොහේ එක්කෙනෙක් ද හාදියා?

උ: එයා මැදවච්චියේ.

ප්‍ර: තවුෆීක් කොහේ එක්කෙනෙක්ද?

උ: එයා කාත්තන්කුඩි.

ප්‍ර: මුස්සකීන් NTJ එකේ හිටිය ද?

උ: ඔව්.

ප්‍ර: කවුරු විදියට ද මුස්සකීන් හිටියේ? භාණ්ඩාගාරික විදියට ද? Treasure?

උ: ඔව්.

ප්‍ර: ඔය තමයි ඉස්සරවෙලාම NTJ එක පිහිටුවා ගත්තම හිටිය අය?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ඒ අය සැරින් සැරේ මාරු වුණා කියලා තමයි හාදියා කියන්නේ?

උ: ඔව්.

ප්‍ර: දැන් ඔය ඒ NTJ එක සංවිධානයක් විදියට මං කිව්වොත් හරිද ලේ දන්දීමේ ව්‍යාපාර එහෙම කරා කියලා? Blood donation?

උ: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට වෙන මොනවද NTJ එකෙන් කරපු ඒවා?

උ: ඒ කියන්නේ School වල ගිහිල්ලා සුද්ද කරලා දෙනවා.

ප්‍ර: දැන් ගංවතුර එහෙම තියෙනව නම් මොකද කරන්නේ?

උ: ඒ වැස්ස ගොඩාක් වැස්සොත් කට්ටියට ඒ ගොල්ලොන්ට එළියට යන්නත් බැහැ. ඒ නිසා කෑම උයලා කට්ටියට එහෙම දෙනවා. නැත්නම් බඩු අරගෙන ඒ ගොල්ලොන්ගේ ගෙවල්වලට ගිහිල්ලා දෙනවා කට්ටියට.

ප්‍ර: ඒ කියන්නේ Social work කරනවා නේද?

උ: ඔව්.

ප්‍ර: සමාජ සත්කාර කරනවා?

උ: ඔව්.

ප්‍ර: දැන් හාදියා ඔය වගේ දේවල් කරන්න සල්ලි ඕනනේ?

උ: ඔව්.

ප්‍ර: කොහොමද NTJ එකට සල්ලි හම්බ වුණේ ඕව කරන්න?

උ: ඒක කරන්නේ ඒ ගොල්ලොන්ගේ කට්ටිය ඉන්නවා.

ප්‍ර: කවුද මේ ඒ ගොල්ලොන්ගේ කට්ටිය කියන්නේ?

උ: ඒ member ලා යෙනවා ඒ ගොල්ලොන්ට. ඒ member ලා තමයි.

ප්‍ර: ඒ NTJ එකට member ලා ඉන්නවා ?

උ: ඔව්.

ප්‍ර: කොච්චර විතර ඒ ගොල්ලොන්ගෙන් අය කරනවද?

උ: ඒ කැමති අය 5000 ක් හරි 10000 ක් හරි ඒ ගොල්ලොන්ට හම්බවෙච්ච මුදල ඒ ගොල්ලො දෙනවා පල්ලියට. ඒකෙන් තමයි ඒ ගොල්ලො අර කට්ටියට බඩු අරන් දෙන්නේ .

ප්‍ර: එතකොට අනිත් පල්ලිවලින් සල්ලි හම්බවුණා ද?

උ: වෙන පල්ලිවලින් හම්බු වුණේ නැහැ එයාට.

ප්‍ර: ඔය පල්ලිවලින් සකාත් එකතු කරනවා නේද?

උ: අනිත් පල්ලිවලින් සකාත් එකතු කරනවා. ඒ ගොල්ලොන්ගේ පල්ලියේ member ලා එකතු කරලා අනිත් මිනිස්සුන්ට දුප්පත් මිනිස්සුන්ට ඒ ගොල්ලො දෙනවා ඒකෙන්.

ප්‍ර: එතකොට අර අනිත් පල්ලිවලින් දැන් ඔය කොළඹින් ඒ වගේ පිටතැන්වලින් එකතු කරන සකාත් සල්ලි දුන්නද NTJ සංවිධානයට කියලා කියන්න දන්නවද හාදියා?

උ: ඒ ඉස්සෙල්ලා එහෙම තිබුණේ නැහැ. NTJ පල්ලියට එහෙම ගත්තේ නැහැ එයා.

ප්‍ර: පස්සේ එහෙම වෙනස් වුණාද?

උ: පස්සේ 2017 ඒ පල්ලිවල ඉඳලා අයින් වෙලා පස්සේ තමා ඒකේ 2018 නෝම්බි මාසේ තමා කොළඹ ඒ ගොල්ලොන්ගේ IS කියලා දිවුරුම් දෙන

FAIR COMMENT BY JEZEEM

කට්ටිය තමයි එකතුවෙලා අර සල්ලි අරගෙන බඩු එකතු වුණේ දිවුරුම් දුන්න අයට විතරයි.

ප්‍ර: මොනවටද දිවුරුම් දුන්න අයද මේ?

උ: ඒ කියන්නේ ඒගොල්ලො නායකයා කියන්නේ දැන් සහරාන් කිව්වා එයා නායකයා කියලා.

ප්‍ර: NTJ එකේ?

උ: NTJ නෙවෙයි. එයා NTJ ඉඳලා අයින් වුණා.

ප්‍ර: කොයි කාලෙද?

උ: 2017 .

ප්‍ර: ඊට පස්සේ තමයි මේ දිවුරුම් දෙන කතාව කියන්නේ හාදියා? මොනවටද දිවුරුම් දෙන්නේ?

උ: ඒ කියන්නේ නායකයා ලංකාවට නායකයා මෙයා කියලා. ඒ කියන්නේ එයාට වඩා ලොකුයි තමා සිරියාවල ඉන්නේ කියලා. අබුබකර් අල් බග්දාදි කියලා එයත් කිව්වේ.

ප්‍ර: කවුද මේ කියන්නේ?

උ: සහරාන්.

ප්‍ර: එතකොට ලංකාවට නායකයා සහරාන් එයාට වැඩිය ලොකු එක්කෙනා තමයි සිරියාවේ ඉන්න අබුබකර් අල් බග්දාදී?

උ: ඔව්. ඊට පස්සේ ඒ ගොල්ලොන්ට දිවුරුම් දෙන්න අය ඉන්නවා. දිවුරුම්දීලා කට්ටිය. ඒ ගොල්ලො දිවුරුම් දෙන්නේ මේ තමා ඉස්ලාම් රාජ්‍යයට එයා කැමති කියලා ඒ විදියට තමයි මං ඉන්නේ කියලා ඒ ගොල්ලො දිවුරුම් දෙනවා. ඒ දිවුරුමේ තමයි ඒ ගොල්ලො ඉන්නේ.

ප්‍ර: එතකොට ඔය දිවුරුම් දෙන කොට ඒ ගොල්ලොන්ගේ නමට මොකක් හරි කැල්ලක් එකතු කරනව ද?

උ: ඔව් වෙන නමක් දානවා අබු නමක් කියලා.

ප්‍ර: අබු කියලා නම දාන්නේ ගැහැණු අයට ද පිරිමි අයට ද?

උ: පිරිමි අයට.

ප්‍ර: ගැහැණු ළමයින්ටත් ඒ නම වෙනස් කරනවා නේද?

උ: ඒ කරනවා උම්ම කියලා ඒ ගොල්ලොන්ගේ මුල තියෙන්නේ.

ප්‍ර: හාදියා දැන් සහරාන්ගේ wife නේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට සහරාන් හාදියට කිව්වේ නැද්ද මේ IS විදියට අපි ඒ සංවිධානයට බැඳෙන්න ඕන හරි නැත්නම් ඒකේ කරන දේ හරි ඒ අනුව හාදියටත් ඒ අනුව ජීවත් වෙන්න මේවා ඉගෙන ගන්න, නම වෙනස් කරන්න, දිවුරුම දෙන්න එහෙම කිව්වේ නැද්ද?

උ: එයා 2018 එයත් කිව්වා.

ප්‍ර: මොකද්ද කිව්වේ?

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

උ: එයා ඉස්සෙල්ලා කිව්වේ මෙහෙම තමයි ඉස්ලාම් රාජ්‍යයක් කියලා මෙහෙම තියෙන්නේ. ඒ කියන්නේ පොලිසියටත් යන්න එපා උසාවිවල යන්න එපා.

ප්‍ර: ඇයි ඒ?

උ: ඒ ගොල්ලො හරියට නීතිය කරන්නේ නැහැ. නීතියට වැඩ කරන්නේ නැහැ.

ප්‍ර: කොයි කාලෙද එහෙම කරන්නේ දැන්?

උ: එයත් කිව්වේ 2018 මුලින් කිව්වේ.

ප්‍ර: එතකොට අර අලියාර් හන්දියේ incident එකට පස්සේ දැන් පොලිසියට බාර වෙන්නේ නැතුව මේ මඟ හරින කාලේ?

උ: ඔව්.

ප්‍ර: දැන් මෙහෙම හාදියට කිව්වා?

උ: ඔව්.

ප්‍ර: එතකොට ?

උ: ඊට පස්සේ එයා එක එක නීතියත් මට කිව්වා. මෙහෙම තමයි ඉන්න ඕන කියලා. මං කිව්වා ඒ විදියට ඉන්නේ ඇයි කියලා. ඊට පස්සේ එයා කිව්වා 2018 07 වැනි මාසේ Ladies ලාට දේශනාවක් තියෙනවා දවස් තුනකට.

ප්‍ර: කොහේද?

උ: කාත්තන්කුඩි පාලමුනෙයි පැත්තේ.

ප්‍ර: කවුද කරන්නේ දේශනාව?

උ: ඒ දේශනාව නවුෆර් එයයි සහරානුයි සෙයිනියි. ඒ තුන්දෙනා තමයි ඒ දේශනාව කරේ. ඒකට මම එන්න කියලා සහරාන් කිව්වේ. ඒකට මං කිව්වා ඒවාවලට මං එන්නේ නැහැ. මං ඒවට කැමති නැහැ කියලා කිව්වේ. ඊට පස්සේ එතකොට සාරා හිටියේ අපේ ගෙදර තම. එයත් ගියා ඒකට.

ප්‍ර: සාරා ගියා නමුත් හාදියා ගියේ නැහැ කියලා කියන්නේ?

උ: ඔව්.

ප්‍ර: ඔය කොයි කාලෙද හරියටම අපි කිව්වොත් ?

උ: 2018/07 වැනි මාසේ 25 වගේ.

ප්‍ර: එතකොට සාරා ඒ පුහුණුවීමට පස්සේ ආපහු ආවද ගෙදර?

උ: ඔව් එයා දවස් 04 කට පස්සේ ආවේ.

ප්‍ර: එතකොට සාරාගෙන් හාදියා ඇහුවද දැන් ඔයා training එකට ගිහිල්ලා මොනවද ඔයගොල්ලො train වුණේ කියලා?

උ: එයා මං ඒ දේශනාවට ගියේ නැහැ කියලා මාත් එක්ක වැඩිය කතා කරේ නැහැ.

ප්‍ර: අමනාප වුණාද?

President's Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

උ: ඔව්. ඊට පස්සේ මං එයාගෙන් ඇහුවා කවුද ආවේ කියලා. එයා ඒවත් කිවවේ නැහැ. කවුද ඔය ගොල්ලොන්ට දේශනා කරෙත් කියලා ඇහුවා. ඒවටත් එයා උත්තර දුන්නේ නැහැ.

ප්‍ර: එතකොට කොහොමද හාදියා දැනගත්තේ එහෙමනම් ඒ දේශනාවල් කරලා තිබ්බේ සහරානුයි සෙයිනියි නවුෆරුයි කියලා?

උ: 2019 කොළඹට ඇවිල්ලා ඉන්න කාලේ තමයි එයත් කිව්වේ.

ප්‍ර: එහෙම තමයි දැනගත්තේ?

උ: ඔව්.

ප්‍ර: දැන් ඔය හාදියා කියන විදියට සෑහෙන්න කාලයක් හාදියත් එක්ක සාරා හිටියනේ?

උ: ඔව්.

ප්‍ර: එක කාලයක් හාදියාගේ ගෙදර හිටියා ?

උ: ඔව්.

ප්‍ර: කාලයක් විනාඩි 05 හේ දුර නවුෆර්ගේ ගෙදර හිටියා?

උ: ඔව්.

ප්‍ර: නැවතත් ඇවිල්ලා තව හාදියාගේ ගෙදර හිටියා නේද?

උ: ඔව්.

ප්‍ර: එතකොට හාදියාට කියන්න පුළුවන්ද ඔය සාරා එයාගේ අම්මව එහෙම හම්බුවෙන්න ගියාද අම්මට කතා කෙරුවද ඒ ගැන කියන්න දන්නව ද හාදියා?

උ: ඔව් දන්නවා.

ප්‍ර: මොනවද දන්නේ ?

උ: එයා 2017 අපේ ගෙදරට ආවට පස්සේ අම්මත් එක්ක whatsapp වලින් කතා කරනවා.

ප්‍ර: අම්මගේ නම දන්නවද?

උ: කවිදා

ප්‍ර: කවිදා කියලා කිව්වොත් හරි?

උ: ඔව්. ඊට පස්සේ අම්මගේ ෆොටොත් පෙන්නුවා මට.

ප්‍ර: අම්මා කොහේද පදිංචිය කියලා දන්වද?

උ: එයා අබුදාබි තමයි වැඩ කරනවා කියලා කිව්වේ.

ප්‍ර: අම්මා අබුඩාබි වැඩ කරා?

උ: ඔව්.

ප්‍ර: එතකොට whatsapp වලින් සාරා කතා කරා අම්මත් එක්ක?

උ: ඔව්.

ප්‍ර: ඒ කතා කරන දේවල් ඇහිලා තියෙනව ද හාදියට ?

උ: ඒ කතා කරන කොට ළඟ ඉන්න කොට එයාගේ වැඩියේ මං ඉන්නේ නැහැ. ඒ නිසා එයා කතා කරනවා අම්මට . මම මෙහෙම තමා ඉන්නේ කියලා. ඊට පස්සේ අම්මා එයාටත් අහනවා ඔයා කොහේද ඉන්නේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියලා. මං මෙහෙ තමා එළියට ඇවිල්ලා ඉන්නේ වෙන ගෙදරකට යාළුවෙක්ගේ ගෙදරට. එහෙම තමා එයා කතා කළේ. මං ඉන්න වෙලාවට. එයාගේ පුංචි ඉන්නවා කලවන්චිකුඩි.

ප්‍ර: ඒ කියන්නේ සාරාගේ?

උ: ඔව්. ඒ පුංචිත් එක්ක එයා කතා කරනවා. ඊට වැඩිය එයාගේ මල්ලි කෝල් එක ගන්නවා. සාරගේ. ඒ මල්ලිත් එක්ක කතා කරනවා.

ප්‍ර: දැන් ඒ ඇරෙන්න සාරා වෙන කවුරු හරි එක්ක කතා කරනවා එහෙම හාදියට ඇහිලා තියෙනව ද?

උ: ඒ එයාගේ හොඳම යාළුවා කියලා කියන්නේ කාත්තන්කුඩියේ පදිංචි වෙලා සිටියා ෆෙරෝසා කියලා. එයත් එක්ක තමා හොඳටම එයා කතාබහ කරන්නේ.

ප්‍ර: දැන් සාරා පිටරට Calls එහෙම ගන්නවා හාදියා දැකලා තියෙනව ද නැත්නම් දන්නවද ඒ වගේ දෙයක්?

උ: ඒ කියන්නේ එයාට FB තිබුණා.FB වලින් ගොඩක් අය friend list එකෙත් ඉන්නවා. messenger එකේ තිබුණා. ඒ messenger වලින් ගොඩාක් අය එයත් එක්ක chat ඒවා ඔක්කොම කරනවා.

ප්‍ර: ඒ කියන්නේ පිටරට අය සාරාත් එක්ක ඒ messenger මාර්ගයෙන් වගේ කතා කරනවා?

උ: ඔව්. ඊට පස්සේ එයත් කිව්වා ඉන්දියාවලත් කට්ටිය ඉන්නවා. තව එක්කෙනෙක් එයාගේ අම්මගේ කට්ටිය කියලත් කිව්වා. ඒ ගොල්ලො කට්ටියත් එක්ක එයා chat එහෙම කරනවා.

ප්‍ර: ඒක දැකලා තියෙනවා හාදියා?

උ: ඔව්.

ප්‍ර: හැම වෙලාවටම එහෙම නෑයෝ වගේ අය දැන් ඕනම කෙනෙක් ඒ වගේ එයා කතා කරනව ද?

උ: ඔව් . යාළුවොයි ඔය විදියට තමා එයා කතා කරන්නේ.

ප්‍ර: හාදියා කොයි වෙලාවක හරි කලවන්චිකුඩි පොලිසියට එහෙම ගිහින් තියෙනවද?

උ: මං ගියේ 2020/04 වැනි මාසේ ගියා.

ප්‍ර: ඒ කියන්නේ මේ අවුරුද්දේ 04 වැනි මාසේ?

උ: ඔව්.

ප්‍ර: මොකටද ඒ ගියේ?

උ: ඒ ගියේ අම්පාරේ පොලීසියට යන්න ඕන කියලා. ඒකේ වාහන දෙකක් ඒ පොලිසිය ගත්තේ. ඒ වාහනය පෙන්නන්ත් කියල කිව්වේ. ගිහිල්ලා ඒවා පෙන්නුවේ. ඊට පස්සේ Blast කරපු අර ගෙදර පෙන්වන්න කියලත්.

ප්‍ර: ඒ කියන්නේ සයින්දමර්දුවල ?

උ: ඔව්. ඊට පස්සේ නිර්දවූර් වලත් කුලියට හිටපු තැනත් පෙන්වන්න කිව්වා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: හාදියා මේ පොලීසියේ අබුබකර් කියන මහත්මයාව හාදියා දන්නවද ?

උ: නැහැ.

ප්‍ර: අඳුරන්නේ නැද්ද?

උ: නැහැ.

වේලාව:ප.ව.06.05

මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

දැන් වෙලාව : ප.ව.6.05
පෙර සටහන් ල/ලේ : සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ : නිල්මිණි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔය කලවංචිකුඩි පොලිසියට ගිය අවස්ථාවේදී එහෙම හම්බුණේ නැද්ද?
පි: නැහැ.
ප්‍ර: ඊට ඉස්සෙල්ලා අවස්ථාවකදී එහෙම හම්බවෙලත් නැද්ද?
පි: නැහැ මං දැකලා නැහැ එයාව.
ප්‍ර: දැන් මං භාදියාගෙන් අහමින් හිටියේ අර NTJ එකට මුදල් හම්බ වෙන විදිහනේ?
පි: ඔව්.
ප්‍ර: එතකොට දැන් භාදියා කිව්වා එක කාලයක 2018 වගේ සකාත්වලින් මුදල් ලැබුණා කියලා?
පි: ඔව්.
ප්‍ර: ඒ ඇරෙන්න පිටරටවල්වලින් සල්ලි ආවාද?
පි: පිටරටවලින් කියන්නේ
ප්‍ර: ඒ කියන්නේ ලංකාවේ නොවෙන ඕනම තැනකින්?
පි: සිංගප්පූර් එක්කෙනෙක් ඉන්නවා භාජා නජිමුදීන් කියලා එයා විතරයි තමා එයාට සල්ලි දුන්නේ.
ප්‍ර: භාජා නජිමුදීන්?
පි: ඔව්.
ප්‍ර: එතකොට සෞදි අරාබියාවෙන් ආවාද ?
පි: ඒ නැහැ. ඒ කියන්නේ එයාගේ 2017න් පස්සේ ඒ එයාගේ ඉස්ලාම් රාජ්‍යය එකේ IS කට්ටිය දිවුරුම් දෙන අයත් ඉන්නවා. ඒගොල්ලන් එකතු වෙලා ඒගොල්ලන්ට සල්ලි දෙනවා. එහේ මෙහේ යවනවා.
ප්‍ර: එහෙන් මෙහාට එනවද? ඒ කියන්නේ සිරියාවලින් මෙහාට සල්ලි එනවද?
පි: සිරියාවලින් නැහැ.
ප්‍ර: මෙහෙන් සිරියාවට සල්ලි යවනවද?
පි: ඔව්.
ප්‍ර: කවුද යවන්නේ?
පි: ඒකත් එව්වේ 2018 සහරාන් එතකොට කැකුණගොල්ලේ ඇවිල්ලා හිටියා. අම්මලා ගෙදර.
ප්‍ර: සහරාන් ඇවිල්ලා හිටියා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්. ඊට පස්සේ සහරාන් phone එකෙන් කතා කරා අබු බරා කියලා එයාගේ නම තිබුණේ telegram එකේ. ඊට පස්සේ තමයි කෝටි 20ක් විතරක් විතරයි සිරියාවට යවන්න ඕනි කියලා.

ප්‍ර: අබු බරාත් එක්ක දැන් කතා කරනවා සහරාන්?

පි: ඔව්. යවන්නද ,කවදාද යවන්නේ කොහොමද කියලා කතා කළේ ඒගොල්ලන්. ඊට පස්සේ මෙහෙම තමා අර ගෑනුන්ට තමයි දීලා මුහුදේ ඒ පැත්තේ තමයි යවන්න ඕනි කියලාත් කිව්වේ කෝටි 20ක්.

ප්‍ර: ඒ යවන විදිහ ගැන ටිකක් මට තේරුණේ නැහැ?

පි: ඒ කියන්නේ බෝට්ටුවලින් ඒ වගේ තමයි ඒක යන්න ඕනි කියලා.

ප්‍ර: මුහුදෙන් සල්ලි යවන්න ඕනි කියලා තමයි කතා වුණේ. දැන් එහෙම යවන්න සල්ලි තියෙන්න ඕනිනේ හාදියා. කොහෙන්ද සල්ලි?

පි: ඒවා මං කොහේද කියලා දන්නේත් නැහැ. ඒ ඉල්හාම්ට තමයි සල්ලි set වුණාද කොහොමද කියලා ඒ දෙන්නාම තමයි කතාව කරේ. එතකොට කිව්වා එයා message එක එයාගේ phone එකේ තිබ්බා. සල්ලි set කරලා තියෙන්නේ කියලා.

ප්‍ර: එතකොට ඔය ඉල්හාම් කියන්නේ කවුද?

පි: එයා කොළඹ එක්කෙනා.

ප්‍ර: ඉල්හාම් ඊබ්‍රහිම්ද?

පි: ඔව් ඊබ්‍රහිම්

ප්‍ර: එතකොට ඔය ඉල්හාම් ඊබ්‍රහිම්ව හාදියාට හම්බ වෙලා තියෙනවද?

පි: මං ඉල්හාම්ව දැකලා තියෙන්නේ 2019 පෙබරවාරි 20.

ප්‍ර: කොහේදීද?

පි: ඒ කියන්නේ මාව එක්කගෙන ආවේ පස්යාලට. ඒ වෙලාවේ තමයි අබු බරා , අබු බරා කියලා තමයි එයාට කතා කරන්නේ.

ප්‍ර: ඉල්හාම්ට කතා කරන්නේ අබු බරා කියලා?

පි: ඔව්. ඒ නම තමයි මම දන්නේ අබුබරා කියලා. මේ CID එකෙන් ආවාට පස්සේ තමයි එයාගේ නම ඉල්හාම් කියලා මම දැන ගත්තේ.

ප්‍ර: එතකන් කතා කළේ එහෙමයි?

පි: ඔව්.

ප්‍ර: මේ අබු හින්ද් කියලා එක්කෙනෙක්ව දන්නවද හාදියා?

පි: මං එයාව දැකලා නැහැ.

ප්‍ර: හැබැයි සහරාන් අබුහින්ද් එක්ක කතා කරනවා හාදියාට ඇහිලා තියෙනවද?

පි: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ telephone එකෙන් කතා කරනවා?

පි: ඒ ත්‍රිමා, telegram APP එකෙන් එයා කතා කරනවා.

ප්‍ර: අබුහින්ද් කොහේ ඉන්න එක්කෙනෙක්ද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: එයා ඉන්දියා කියලාත් කතා කරලා තියෙනවා.

ප්‍ර: සහරාන් කියලා තියෙන්නේ එයා ඉන්දියාවේ ඉන්නවා කියලා?

පි: ඔව්.

ප්‍ර: කොයි කාලේ ද ඔය අබුහින්ද් එක්ක කතා කළේ ?

පි: මං දැකලා තියන්නේ 2018 ඉඳලා.

ප්‍ර: සාමාන්‍යයෙන් මොන වගේ දේවල් ගැනද කතා කරන්නේ ?

පි: ඒ කියන්නේ මෙයාගේ videos upload කරාද, ඒක යවන්නේ නැද්ද එහෙම කියලා අරාබිවලින් ලියලා තියෙන ඒවා translate කරාද, ඔහොම කියලා තමයි ඒගොල්ලන් කතාව කරන්නේ.

ප්‍ර: ඒවා තමයි ඇහිලා තියෙන්නේ?

පි: ඒ කියන්නේ safety ද කියලා මෙයාට අහනවා.

ප්‍ර: මොනවද safety ද කියලා?

පි: සහරාන් ඉන්න තැන safety කියලාත් අහනවා.

ප්‍ර: ඒ කියන්නේ සහරාන් පරිස්සමට ඉන්නවද , ප්‍රශ්නයක් නැද්ද කියලා මේ අබුහින්ද් අහනවා?

පි: ඔව්

ප්‍ර: මොකක්ද ඉතින් අබු හින්ද් ඒ වගේ දෙයක් අහන්න තියෙන උවමනාව?

පි: එයා තමා සිරියාවට ලින්ක් තියෙනවා කියලා එයා මඟින් තමයි, එයා තමයි පණිවිඩෙත් කියනවා.

ප්‍ර: අබුහින්ද්ට තමයි හාදියා කියන්නේ සහරාන් කිව්වා කියලා සිරියාවට ලින්ක් තියෙනවා කියලා ?

පි: ඔව්.

ප්‍ර: අර මං දැන් අර අබු බකර් ගැන ඇහුවානේ අර පොලිසියේ මහත්මයෙක් එයා ?

පි: ඔව්.

ප්‍ර: එයාව සාරා එහෙම දන්නවද කියලා හාදියා දන්නවද කියන්න ?

පි: මං දන්නේ සාරා ඒවා මං දැකලා නැහැ. සාරා 2016 ඉඳලා අර කාත්තන්කුඩියේ හිටියා. ඊට පස්සේ 2017 ඉඳලා කැකුණගොල්ලේ ඇවිල්ලා හිටියා අපේ අම්මලාගේ ගෙදර. ඊට කලින් දැකලා තියෙනවද කියලා මම දන්නේ නැහැ.

ප්‍ර: සාරා කොයි වගේ එක්කෙනෙක්ද හාදියා ?

පි: එයා සුදුයි, ටිකක් මහතයි

ප්‍ර: මං දැන් පින්තූරයක් පෙන්වනවා. මෙතන screen එකේ එයා කවුද කියලා හඳුනනවද කියලා කියන්නකෝ හාදියා?

පි: හරි මැඩම්. ඒ තමයි සාරා.

C – 918 ඡායාරූපය සාක්ෂිකාරියගේ අවධානයට යොමු කරා ස්වාමිනි. ඇය ඒ ඡායාරූපයේ සිටින්නේ සාරා නැමැත්තිය බවට හඳුනා ගනු ලබනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හාදියාට මතකද මේ පින්තූරය ගන්නවා එහෙම?

පි: ගත්තද කියලද

ප්‍ර: ගත්තේ කවද්ද, ගත්තේ කොහේදිද, ඒ ගත්ත එක ගැන මතකයිද?

පි: මතක නැහැ.

ප්‍ර: දැන් මේ හාදියා කිව්වා සහරාන් අබුහින්ද් එක්ක කතා කරනකොට අබුහින්ද් අහලා තියෙනවා කියලා සහරාන්ගෙන් ඉන්න තැන ප්‍රවේසම්ද කියලා safe ද කියලා නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට මං ඇහුවානේ ඇයි එහෙම අබුහින්ද් ඇහුවේ සහරාන්ගෙන් කියලා? ඒ කියන්නේ කොයි වෙලාවක හරි හාදියාට සහරාන් කියලා තියෙනවද මේ අබුහින්ද් කියන එක්කෙනා සහරාන් ගැන උනන්දුවෙන් , අවධානයෙන් ඉන්නවා කියලා?

පි: ඔව්.

ප්‍ර: එයා ඉන්දියාවේ ඉන්න එක්කෙනෙක්ද?

පි: එයා ඉන්දියා.

ප්‍ර: ඉන්දියාවේ කොයි පළාතේ ඉන්න කෙනෙක්ද?

පි: එහේ පළාතනම් මතක නැහැ.

ප්‍ර: දන්නේ නැද්ද මතක නැද්ද?

පි: මතක නැහැ.

ප්‍ර: දෙමළ කතා කරන එක්කෙනෙක් නේද?

පි: ඔව් දෙමළ කතා කරන එක්කෙනෙක්.

ප්‍ර: සාමාන්‍යයෙන් දැන් ඔය හාදියා ඒ කතා කරන ඒවා අහලා තියෙන අවස්ථා ගැන මතක් කළොත් කොච්චර කාලයකට සැරයක් අබුහින්ද් එක්ක කතා කරනවද සහරාන්?

පි: ඒ කියන්නේ ගෙදර ඇවිල්ලා ඉන්නකොට එයා ඉස්සෙල්ලා missed call ගහනවා telegram එකෙන්.

ප්‍ර: දැන් කවුද මේ missed call එක ගහන්නේ ?

පි: ඒ අබුහින්දි.

ප්‍ර: අබුහින්ද් එවනවා missed call එකක් සහරාන්ගේ phone එකට. එතකොට සහරාන් මොකද කරන්නේ ?

පි: ඊට පස්සේ තමයි සහරාන් ඒකේ තිබුණ record එක අහනවා. එවලා තිබුණු voice record එක.

ප්‍ර: ඊට පස්සේ කතා කරනවා?

පි: ඊට පස්සේ තමයි වැඩිය කතා කරන්නේ නැහැ. voice record තමයි යවන්නේ එයාට.

ප්‍ර: සහරාන් යවන්නේ voice record ?

පි: ඔව්.

Presidential Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: එතකොට අබුහින්ද්?

පි: එයත් වැඩිය voice record යවනවා. සමහර වෙලාවට තමයි phone එකෙන් කතා කරන්නේ.

ප්‍ර: ඒ කතා කරන වෙලාවට හරි එහෙම නැත්නම් voice recording න් හරි කොච්චර විතර වෙලාවක් තියෙන ඒවාද?

පි: ගොඩක් වෙලාවක් කතා කරනවා. කතාකරලා ඉස්සරවෙලා මං එතන හිටියොත් යන්න කියලා කියනවා.

ප්‍ර: ඒ කියන්නේ හාදියාට ඇහෙන්න කතා කළේ නැද්ද සහරාන්?

පි: නැහැ.

ප්‍ර: එතකොට ඒ කතා කරන එක්කෙනා අබුහින්ද් කියලා කොහොමද හාදියා දැන ගත්තේ?

පි: මං එයාගේ phone එකෙන් telegram එකෙන් check කරා.

ප්‍ර: කාගේද මේ?

පි: සහරාන්ගේ. ඒ phone එකෙන් ගොඩක් අයගේ අබු නම දාලා තිබුණා. එයාගේ නම විතරයි අබු හින්ද්දි කියලා තිබුනේ.

ප්‍ර: එතකොට අනිත් අයගේ නම්?

පි: අබුබරා, අබ්දුල්ලා, අබුමොහොමඩ්, හදීද් ඒ කියලා ගොඩක් අබු නම තිබුණා.

ප්‍ර: එතකොට ඒ නමයි අබු හින්ද් එකයි අතර තියෙන වෙනස මොකක්ද?

පි: ඒ හින්ද් කියලා තේරුම් දන්නේ නැහැ. අනිත් එක අහලා තියෙන නම. හින්දි කියලා මම අහලා නැහැ.

ප්‍ර: මේක නම ටිකක් වෙනස් කියලා තේරුණා?

පි: ඔව්.

ප්‍ර: ඒ පාර මොකද කළේ?

පි: ඊට පස්සේ තමා සහරාන්ට එයා කවුද කියලත් ඇහුවේ මං.

ප්‍ර: ඇහුවා සහරාන්ගෙන්?

පි: ඔව්.

ප්‍ර: එතකොට සහරාන් මොකද කිව්වේ?

පි: එයා කිව්වා ඉන්දියා එක්කෙනෙක් කියලා විතරයි කිව්වේ.

ප්‍ර: කොයි කාලේ වගේ ද අබු හින්ද් කතා කරන්න පටන් ගත්තේ ඔය සහරාන් එක්ක හාදියාට මතක විදියට?

පි: 2017 අන්තිම , 2018 සම්පූර්ණ කතා කරා 19 වෙනකම්.

ප්‍ර: 2018 සම්පූර්ණයෙන් කතා කරා 2019 වෙනකම්?

පි: ඔව්.

ප්‍ර: සාරාගේ අම්මා කොයි වෙලාවක හරි සාරා හොයාගෙන කැකුණගොල්ලට ආවාද?

පි: නැහැ.

ප්‍ර: නැද්ද එහෙම නැත්නම් හාදියා ඒක ගැන දන්නේ නැද්ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එයා 2019 පෙබරවාරි 19 වෙනකම් ඒගොල්ලෝ කවුරුත් ආවේ නැහැ.

ප්‍ර: ඇයි දැන් මට හාදියා කිව්වානේ 2019 පෙබරවාරි 19 වෙනිදා ආවායි කියලා කැකුණගොල්ලෙන්?

පි: ඔව්.

ප්‍ර: හාදියා කැකුණගොල්ලෙන් ඒ දවසේ යන්න ඉස්සර වෙලා හාදියා හිටපු කැකුණගොල්ලේ ගෙදරට පොලිසියේ කවුරුහරි ආවාද?

පි: 2018 ඉස්සෙල්ලාම ආවේ TID එකේ කියලාත් කිව්වේ. දෙන්නෙක් ආවේ.

ප්‍ර: 2018 කොයි කාලේ වගේද?

පි: මට හරියට මතක නැහැ පෙබරවාරි, ජනවාරි ඒ මාස කාලයේ වගෙත් ආවා. ඇවිල්ලා මුස්ලිම් එක්කෙනෙක් කියලා කිව්වා.

ප්‍ර: මේ TID ඒකෙන් ආපු අය?

පි: නම තවුෆික් කියලාත් කිව්වා. ඇවිල්ලාත් ඇහුවා සහරාන් කවද්ද ආවේ , එනවද කියලා ඊට පස්සේ මං කිව්වා නැහැ කියලා.

ප්‍ර: ඇයි එහෙම කිව්වේ හාදියා? දැන් එනවානේ සහරාන් හාදියා බලන්න?

පි: එනවා. සහරාන් කියලා තිබ්බේ කවුරුත් ආවොත් ඔයා කියන්න එපා කියලා. එයා ගැන විස්තරේ. ඒ නිසා මං කිව්වෙත් නැහැ. ඊට පස්සේ එතකොට සාරාත් හිටියා. ඊට පස්සේ එයා ප්‍රශ්න ඇහුවා මට ඔයා කවද්ද අන්තිම සහරාන්ව දැක්කේ කියලා?

ප්‍ර: කවුද ඇහුවේ මේ?

පි: තවුෆික් කියන එක්කෙනා.

ප්‍ර: තවුෆික් ඇහුවා හාදියාගෙන්?

පි: ඔව්.

ප්‍ර: එතකොට?

පි: එතකොට මං කිව්වා 2017 මාර්තු මාසේ 10 වෙනිදා තමයි එයා දැක්කේ කියලා මං කිව්වේ.

ප්‍ර: ඉතින් දැන් මේ හාදියා බොරු කියන්නේ නේද?

පි: ඔව්.

ප්‍ර: ඇයි එහෙම කිව්වේ? බොරු කිව්වේ ඇයි?

පි: එයා එහෙම කියලා තිබ්බේ ඔයා කාටවත් කියන්න එපා කියලා. මට තර්ජනය කරා. ඒ නිසා මං කිව්වෙත් නැහැ.

ප්‍ර: සහරාන් තර්ජනය කරා කියලා මේ හාදියා කියන හින්දා තමයි මේ කියලා නැත්තේ?

පි: ඔව්.

ප්‍ර: ඉතින් වෙන මොනවද තවුෆික් කියන ඔය TID එකෙන් ආපු නිලධාරියා ඇහුවේ?

පි: ඊට පස්සේ එයාත් ඇහුවේ call ගන්නවද කියලා.

ප්‍ර: කවුරු කාටද calls ගන්නවද කියලද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: සහරාන් මාත් එක්ක කතා කරනවාද කියලාත් ඇහුවා. මං කිව්වා නැහැ කියලා. ඊට පස්සේ එයා කිව්වේ දිගන ප්‍රශ්නයකට සහරාන් තමයි ඒවා කරලා තියෙන්නේ කියලා. මම කිව්වා මම ඒවා දන්නේ නැහැ. සහරාන් ඒ ප්‍රශ්නයකට නෙවෙයි කියලා මං කිව්වා අලියාර් හන්දියේ ප්‍රශ්නයකට තමයි එයා එළියට ගියේ. ඒ ප්‍රශ්න ගැන මම දන්නේ නැහැ . දිගන ප්‍රශ්න සහරාන් තමයි ඒක කරේ කියලා. එයත් කිව්වා නැහැ සහරාන් තමයි ඒවා කරේ කියලාත් එයා කිව්වේ.

ප්‍ර: කවුද මේ එයා කියන්නේ?

පි: තවුෆික් කියන TID එක්කෙනා.

ප්‍ර: තවුෆික් කියන අර TID එක් officer?

පි: ඔව්. ඊට පස්සේ එයා සහරාන්ගේ FB එකේ දාලා තිබුණ videos පෙන්නුවා.

ප්‍ර: කාටද පෙන්නුවේ ?

පි: තවුෆික්ගේ phone එකෙන් සහරාන්ගේ photo එක.

ප්‍ර: කාටද පෙන්නුවේ ඒ videos ?

පි: මට පෙන්නුවේ.

ප්‍ර: හාදියාට පෙන්නුවා. හාදියා දැක්කද ඒවා?

පි: ඔව්.

ප්‍ර: මොනවද ඒ තිබ්බ video ?

පි: ඒ වැඩිය නෙවෙයි නිකන් අර දිගන ප්‍රශ්නයකට ඒගොල්ලොන්ගේ කට්ටියගේ photo දාලා සහරාන් අත ඔහොම ගහලා තිබුණ photo තිබුණා එකේ.

ප්‍ර: ඔව් ඊට පස්සේ මොකද වුණේ ?

පි: ඊට පස්සේ එයා කිව්වා සහරාන් ආවොත් හරි මේ එයාගේ නම්බරය දීලා ගියේ. ඒ නම්බරයට call එක ගන්න කියලා.

ප්‍ර: ඔව් ඊට පස්සේ මොකද වුණේ?

පි: ඊට පස්සේ ආපහු වෙන කවුරුත් ආවේ නැහැ.

ප්‍ර: වෙන කවුරුත් ආවේ නැහැ?

පි: ඊට පස්සේ 2019

ප්‍ර: 2019 යේ කවුරුහරි ආවාද?

පි: 2019 පෙබරවාරි මාසේ 19 වෙනිදා CID එකෙන් 6 දෙනෙක් ආවා.

ප්‍ර: 6 දෙනෙක් ආවා?

පි: ඔව්.

ප්‍ර: ඒ කොයි වෙලාවේද ආවේ?

පි: ඒ 1.30 දවල්.

ප්‍ර: දවල් 1. 30ට විතර?

පි: ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒගොල්ලෝ ඇවිල්ලා මොකද වුණේ ? ඒ වෙලාවේ හාදියා ගෙදර හිටියද?

පි: මං ඒ වෙලාවේ ඊට කළින් ගේ හදලා තියෙනවා අලුත් ගෙයක්. ඒ

ප්‍ර: විනාඩියක් ඉන්න හාදියා ඔතෙන්ට එන්න ඉස්සරවෙලා අපි ආයේ අර 2018 තවුනික් TID එකේ ගෙදරට ආපු එක ගැන පොඩ්ඩක් කතා කරමු. දැන් ඒ වෙලාවේ සාරා හිටියද ගෙදර?

පි: හිටියා.

ප්‍ර: සාරා දැක්කද TID එකේ officerලා ඇවිල්ලා හාදියා එක්ක කතා කරනවා?

පි: එයා දැක්කා.

ප්‍ර: එයා ඒ හරියේ හිටියද?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන් ඔය සිද්ධියට පස්සේ ගෙදරට TID officersලා ආවා කියලා සහරාන්ට කවුරුහරි කිව්වද?

පි: ඒක කිව්වේ සාරා තමයි. එයාගේ හස්බන්ඩ්ට කියලා.

ප්‍ර: ඒ කියන්නේ කස්තූන්ට කියලා?

පි: කස්තූන්ට කියලා කස්තූන් තමයි සහරාන්ට කියලා තිබුණේ.

ප්‍ර: ඒක කොහොමද දන්නේ කස්තූන්ට කියලා කස්තූන් තමයි සහරාන්ට කිව්වේ කියලා?

පි: සහරාන් එක පාරටම ඇහුවා. Call කරා.

ප්‍ර: කාටද Call කළේ?

පි: සාරාට. සාරාගේ phone එකෙන් තමයි Call ගත්තේ. ඒ phone එකෙන් තමයි සාරා මට දුන්නේ ඔයාට සහරාන් කතා කරනව කියලා. මං කතා කරා. එයත් එක පාරටම ඇහුවා TID එකෙන් ආවාද කියලා. මම කිව්වා කවුද ඔයාට කිව්වේ කියලා. ඊට පස්සේ තමයි දැන් කස්තූන් කිව්වේ කියලා. ඊට පස්සේ මම දැන ගත්තා සාරා තමයි ඒවා කියලා තියෙන්නේ කියලා.

ප්‍ර: එතකොට එච්චරයිද ඇහුවේ සහරාන්. නැත්නම් ඊට වැඩිය තව මොනවාහරි කිව්වද?

පි: ඊට පස්සේ එයත් ඇහුවා. මොනවද කිව්වේ ඒගෝල්ලෝ මොනවද ඇහුවේ කියලා.

ප්‍ර: හාදියා මොකද කළේ?

පි: ඊට පස්සේ මං කිව්වා ඔයා කිව්වා වගේ මං කිව්වා ආවේ නැහැ කියලා තමයි මම කිව්වේ. ආ හරි කවුරුත් ආවොත් එහෙම තමයි කියන්න ඕනි කියලා එයත් කිව්වේ.

ප්‍ර: සහරාන් කිව්වා එහෙම?

පි: ඔව්.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: එතකොට දැන් කිව්වොත් එහෙම මොකද වෙන්නේ එහෙම මොකුත් වුණේ නැද්ද?

පි: එයා කිව්වා කිව්වොත් අර ඉස්සෙල්ලා කියලා තියෙනවා වගේ තමයි ඔයාට මං කරන්නේ කියලා ඉස්සෙල්ලා වෙලා කිව්වේ මට.

ප්‍ර: ඉස්සෙල්ලා කිව්වේ මොකක්ද?

පි: ඉස්සෙල්ලා කිව්වේ කවුරුත් ඇවිල්ලා පොලිසියෙන් හරි කවුරුහරි එයා ගැන විස්තර අහන්න ආවොත් කාටවත් එයා ගැන විස්තර කතා කරනවද එනවද කියලා ඇහුවොත් කියන්න එපා කියලා. කිව්වොත් ඔයාට මං මරණ තර්ජනය තමයි එයත් මට කිව්වේ. මරනවා කියලා.

ප්‍ර: ඉතින් හාදියා සහරාන්ගේ wifeනේ?

පි: එයා කිව්වා නෝනා වුණත් අම්මලා තාත්තා වුණත් එයාව කවුරුහරි ඉන්නවා කියලා මේ තැනක තමයි ඉන්නේ කියලා පෙන්නුවොත් කිව්වොත් ඒගොල්ලන් මරනවා කියලා තමයි එයත් කිව්වේ.

ප්‍ර: දැන් 2019 පෙබරවාරි 19 වෙනිදා CID එකෙන් ආවා කියලා කිව්වා නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒ වෙලාවේ එහෙනම් හාදියා ගෙදර හිටියානේ?

පි: ඔව්.

ප්‍ර: සාරා හිටියද ගෙදර?

පි: ඔව් හිටියා.

ප්‍ර: 6 දෙනෙක් විතර ආවායි කිව්වානේ CID එකෙන්?

පි: ඔව්.

ප්‍ර: ඇවිල්ලා ඒගොල්ලෝ මොනවා හරි ඇහුවද?

පි: ඒගොල්ලෝ ඇවිල්ලා එතකොට මං

ප්‍ර: ඒගෝලලෝ තනියමද ආවේ නැත්නම් හාදියාගේ අයියා කෙනෙක් එක්ක එහෙම ආවාද?

පි: මම අයියාව දැක්කේ නැහැ. පස්සේ තමයි අයියව දැක්කේ. ජීප් එකේ අයියා හිටියා.

ප්‍ර: මොන අයියාද මේ දැන් අයියලා දෙන්නෙක් ඉන්නවානේ හාදියාට. කවුද ඒ අයියා?

පි: අන්සාර්.

ප්‍ර: අර වාහන එහෙම?

පි: විකුණන එක්කෙනා.

ප්‍ර: එතකොට ඒගොල්ලන් දැන් ඔය CID එකේ ඒගොල්ලෝ ගෙදරට ඇවිල්ලා මොකක්ද වුණේ?

පි: ඒගොල්ලෝ ඇවිල්ලා ගේ ඇතුලේ කාමර ඔක්කෝම බැලුවා. ඒ check කරා. ඊට පස්සේ ඇහුවා ඔයා මොන කාමරයේද ඉන්නේ කියලා.

ප්‍ර: කාගෙන්ද මේ අහන්නේ ?

FAIR COMMENT — BY JEZEEM

පි: මටත් ඇහුවා CID එකෙන් ආපු එක්කෙනා.

ප්‍ර: හාදියා ඉන්නේ මොන කාමරයේද කියලද ඇහුවේ?

පි: ඔව්.

ප්‍ර: සාරාගෙන් ඒක ඇහුවේ නැද්ද?

පි: එතකොට සාරා හිටියේ අපේ ගෙදරින් පිටිපස්සේ පොඩි ගේ හදලා. ඒ ගෙදරින් තමයි සාරායි, ෆෙරෝසා කියලා එයත් හිටියේ. ඊට පස්සේ ඒගොල්ලන් කිව්වා ඉස්සරහට එන්න කියලා.

ප්‍ර: කාටද මේ එන්න කිව්වේ?

පි: CID එකෙන් ආපු කට්ටිය මටත් කිව්වා. මං හෝල් එකට ගියා. ඊට පස්සේ ඔයාට කට උත්තර ගන්න ඕනි කියලා කිව්වා.

ප්‍ර: CID එකෙන් කිව්වා දැන් මේ හාදියාට?

පි: ඔව්. ඊට පස්සේ ඒගොල්ලෝ photo පෙන්නුවා සහරාන්ගේ. ඒ photo එකේ මෙයාව දන්නවද කියලා මං කිව්වා ඔව් කියලා. කවුද කියලාත් ඇහුවා මං කිව්වා සහරාන්. මෙයාව අන්තිමට දැක්කේ කවද්ද කියලාත් ඇහුවා. මං 2017 මාර්තු මාසේ 10 වෙනිදා තමයි දැක්කේ කියලා කිව්වේ. මෙයා ගෙදරට ආවා නේද කියලත් ඇහුවේ. දෙසැම්බර් , ජනවාරි මාසවල මෙයා ආවා නේද කියලා. මං කිව්වා නැහැ කියලා. ඊට පස්සේ එහෙනම් එන්න කටඋත්තරය ගන්න ඕනේ කියලා. ඊට පස්සේ ඒගොල්ලෝ කට උත්තරය ගත්තා. ඊට පස්සේ කට උත්තරය අරගෙන තමයි අර වාහනයේ ඇතුලේ කවුද ඉන්නේ කියලත් ඇහුවේ. මං කිව්වා අයියා කියලා. ඊට පස්සේ තමයි ඒගොල්ලන් කිව්වේ අයියාව මාවනැල්ල පොලිසියට එක්ක යනවා කියලා.

ප්‍ර: ඇයි ඉතින් අයියාව එක්කන් යන්නේ මාවනැල්ල පොලිසියට?

පි: අයියා අර වාහනය විකුණලා තිබ්බේ.

ප්‍ර: ඒ කියන්නේ සහරාන්ගේ වාහනය?

පි: සහරාන්ගේ වාහනය.

ප්‍ර: වෑන් එක විකුණලා තිබ්බ හින්දා?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන් ඇයි එතකොට කිව්වේ මම ඉස්සෙල්ලා ප්‍රශ්නයක් අහනකොට කැකුණගොල්ලේ ගෙදර 2019 පෙබරවාරි 19 වෙනිදා වෙනකම් විතරයි හිටියේ කියලා කිව්වේ ඇයි? ඇයි එහෙම කිව්වේ?

පි: එතකොට මං ඒ ගෙදරින් තමයි හිටියේ 201

ප්‍ර: ඔව් දැන් CID එක ආවානේ එදා?

පි: ඔව්.

ප්‍ර: ඒ ආවාට පස්සේ මොනවාහරි සිද්ධ වුණාද?

පි: ඊට පස්සේ හවස ඇවිල්ලා ඒගෝල්ලෝ ගියා. හවස ඇවිල්ලා.

ප්‍ර: CID එක ගියා?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: CID එකේ කට්ටියක් අයියාව අරගෙන මාවනැල්ලට ගියා. ඊට පස්සේ සාරා තමයි එයාගේ husband කස්තුන්ට කියලා තිබුණේ මෙහෙම තමයි අන්සාර් ඒගොල්ලන් arrest කරන්න මාවනැල්ල පොලිසියට එක්කන් ගියා කියලා. ඊට පස්සේ ඒ විස්තරය සාරා තමයි කස්තුන්ට කියලා. කස්තුන් සහරාන්ට කියලා තිබුණේ. ඊට පස්සේ සහරාන් call එක ගත්තා සාරාට. මට phone එක දෙන්න කියලා. සාරා ඒ වෙලාවේ call එකෙන් කතා කරා. කවුද ආවේ කියලා. මං කිව්වා CID එකෙන් ආවා කියලා.

ප්‍ර: දැන් මේ අහන්නේ කවුද?

පි: සහරාන්.

ප්‍ර: සහරාන් අහනවා හාදියාගෙන්?

පි: ඔව්. මං කිව්වා CID එකෙන් 6 දෙනෙක් විතර ආවේ කියලා. අයියාව එක්කගෙන ගියා කියලා මං කිව්වේ. මම කිව්වා අයියා ඔයාගේ වෙනුවෙන් තමයි අයියාව arrest කරලා එයාව එක්කගෙන ගියේ කියලා මං කිව්වේ. එයා කිව්වා අයියා එයි. ඔයා ලෑස්ති වෙන්න කියලා .

ප්‍ර: මොනවටද?

පි: ඒගොල්ලන්ත් එක්ක ඉන්න.

ප්‍ර: කාත් එක්ක ඉන්නද?

පි: සහරානුත් එක්ක ඉන්න. ඊට පස්සේ සහරාන්

ප්‍ර: බබාලා?

පි: සහරාන් කිව්වා එයාගේ ළමයි දෙන්නාත් එක්ක ඔයා බඩු මොකුත් ගන්න එපා. මෙහේ ඉඳලා මං කට්ටිය එවන්නම් එන්න කියලා. මං කිව්වා මං එන්නේ නැහැ කියලා කිව්වම ඊට පස්සේ රෑ 9.00ට , 10.00ට විතර ආපහු සාරාගේ phone එකෙන් තමයි call එක ගත්තේ. ඒකෙන් කතා කරනකොට එයා කිව්වා ඔයා එන්න ඕනි නැත්නම් මං කට්ටිය යවනවා. ඔයාගේ අම්මලා තාත්තලා ඔක්කෝමලා එක්ක මළ ගෙදර කියලා ඔයා හිතන්න කියලා. ඊට පස්සේ තමයි තාත්තා කතා කළේ. තාත්තාට එයා බැන්නා.

ප්‍ර: ඇයි බැන්නේ? තාත්තා කිසි වැරැද්දක් කරලා නැහැනේ?

පි: තාත්තා වරදක් කරලා නැහැ. තාත්තාට කියලා තිබ්බා දුවව ඔයගොල්ලන්ට යන්න එපා කියලා තියෙන්නේ කියලා. ඩිවෝස් ඉල්ලන්නයි එයාටත් කියන්නේ කියලා. ඊට පස්සේ තාත්තා වැඩිය එයා කවුරුහරි කතා කළොත් එයා වැඩිය කතා කරන්නේ නැහැ. ඒ වුණාට තාත්තාට සහරාන් බැනලා තිබ්බා. තාත්තා කතා කළේ නැහැ. ඊට පස්සේ මට දුන්නා. ඊට පස්සේ එයත් කිව්වා සාරා, ෆෙරෝසා ඔක්කෝම තමා ලෑස්ති වෙන්නේ එන්න කියලා. මං කිව්වා එන්නේ නැහැ කියලා මං එයාටත් කිව්වේ. රෑ 2 වෙනකොට 3 වෙනකොට එයාගේ phone එකේ message එවලා තිබ්බා. ඔයා එන්නේ නැහැ මං මෙහේ ඉඳලා කට්ටිය

FAIR COMMENT BY JEZEEM

එවලා තියෙන්නේ කියලා. ඊට පස්සේ මං කිව්වා මං එන්නේ නෑ කවුරුත් එව්වොත් කියලා. ඊට පස්සේ තමයි අනිද්දා උදේ 6.00 වෙනකොට අම්මාලා ගියා අයියාව බලන්න මාවනැල්ල පොලිසියට. ඊට පස්සේ තමයි මං ඒගොල්ලන් කවුරුහරි ආවොත් ගෙදරින් අම්මලා තාත්තාලා අයියාලා මරණවා කියපු නිසා තමයි මං එළියට ගියේ බබාල දෙන්නාත් එක්ක අරගෙන.

ප්‍ර: කොහාටද ගියේ?

පි: මං ගියේ අපේ නැන්දම්මලා ගෙදර එක.

ප්‍ර: ඒ කොහේද?

පි: ඒ තියෙන්නේ ගෙදර ඉඳලා විනාඩි 5ක්, 10ක් විතරයි. ඒ ගෙදර ඉඳලා මං ගිහිල්ලා හිටියා.

ප්‍ර: ඇයි එහෙම ගියේ?

පි: ඉඳලා සහරාන් එන්න කිව්වානේ ඒක නිසා තමයි මං එහේ ඉඳලා ගියේ. ඊට පස්සේ ඒ ගෙදර ඉඳලා 12.00ට විතර සාරා call එක ගත්තා මෙහෙම තමයි මං කුරුණෑගල private hospital එකේ යන්න වගේ තමයි එන්නේ කියලා.

ප්‍ර: ඒ මොකටද?

පි: VOG doctor කෙනෙකුට පෙන්නන්නා වගේ තමයි එළියට එනවා කියලා.

ප්‍ර: සාරාට?

පි: ඔව් සාරා. එයා තමයි ඔයා ලෑස්ති වෙන්න කියලා මටත් කිව්වා සාරා. ඊට පස්සේ මං ලෑස්ති වෙලා හිටියේ. 12.30 වෙනකොට එයා ත්‍රීවිල් එකේ ආවේ. ඒ නැන්දලාගේ ගෙදරට.

ප්‍ර: එතකොට සාරා දැනගෙන හිටියාද හාදියා හිටියේ නැන්දම්මලාගේ ගෙදර කියලා?

පි: එයා දන්නවා.

ප්‍ර: එතකොට තමයි ඔය දැන් නැන්දාම්මලාගේ ගෙදර යන්න ඉස්සර වෙලා සාරාට කියලද ගියේ හාදියා එහේ යනවා කියාලා?

පි: මං කිව්වා. කියලා ෆෙරෝසාගේ Phone එක තමයි අරගෙන ගියේ.

ප්‍ර: එතකොට දැන් සාරා ආවාද හාදියාව ගන්න?

පි: 12.30 ට විතර ආවේ.

ප්‍ර: ඊට පස්සේ මොකද වුණේ ?

පි: ඒ 12.30 ඉඳලා කුරුණෑගල private hospital සෙත්සෙවණ එකට ගියා. ගිහිල්ලා එතකොට සාරාත් එක්ක connection එකේ හිටියා කස්තූන්. එයා තමයි කියන විදියට සාරා කරේ. ඒ hospital එකට ගිහිල්ලා ඇතුළට යන්න කිව්වේ. ඊට පස්සේ private hospital එක ඇතුළට ගියා. ගිහිල්ලා යන්න කළින් ත්‍රීවිල් එක යවන්න කියලා කිව්වේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කුරුණෑගල private hospital එක?

පි: ඔව්.

ප්‍ර: මොකක්ද ඒකේ නම?

පි: ආපු ත්‍රීවිල් එක යවන්න කියලා කිව්වේ. ඒකත් යැව්වා. යන්න කියලා එයාට ඊට පස්සේ ඇතුලට යන්න කිව්වා. private සෙත්සෙවණ කියලා hospital එකේ. ඒ hospital එකේ ඇතුළට ගිහිල්ලා විනාඩි 2,3 කින් පස්සේ ආපහු එළියට එන්න කියලා කිව්වේ.

ප්‍ර: කවුද කිව්වේ?

පි: කස්තූන් සාරාට කියනවා. ආපහු එළියට ආවා. ඇවිල්ලා කිව්වා ළඟ ඉන්න ත්‍රීවිල් එක නැඟලා පොඩි දුරකට ආපහු යන්න. නාරම්මල පැත්තට කියලා. ඊට පස්සේ ආපහු අර ත්‍රීවිල් එකේ නැඟලා සෙත්සෙවණ කොළඹ පාරේ ආපහු ඇතුළට පොඩි පාරෙන් තියෙනවා. ඒ පාරෙන් ගිහිල්ලා බැස්සා. එතෙන්ට ඇවිල්ලා ආපහු වෙන ත්‍රීවිල් එකක් ගන්න කියලා කිව්වේ. ඒ ත්‍රීවිල් ඒකේ තමයි අරගෙන නාරම්මල පැත්තට යන්න කියලා. යනකොට මුස්ලිම් පල්ලියක් තියෙනවා. ඒ පල්ලියට බහින්න කියලත් කිව්වේ. ඊට පස්සේ අර පල්ලියට බැස්සා. කොළ පාට ත්‍රීවිල් එකේ අතෙන්ට ඉන්න ඔයගොල්ලෝ යන්න කියලත් කිව්වේ. ඊට පස්සේ එක්කෙනෙක් හිටියා. එයා අතේ පෙන්නලා ඊට පස්සේ ඒ ත්‍රීවිල් එකට නැග්ගා. එයා ආපහු අරගෙන කුරුණෑගල පාරෙන් ගිහිල්ලා පස්යාල ගිහිල්ලා තමයි ආපහු ගිරිඋල්ල පාරට ත්‍රීවිල් එකෙන් ගියේ. ඒ යනකොට පස්යාල ගිහිල්ලා ආපහු ගිරිඋල්ල පාරෙන් දානකොට කස්තූන් කිව්වා අතෙන්ට නවත්වන්න කියලා.

ප්‍ර: කොතනද නවත්වන්න කිව්වේ?

පි: ඒ ආපහු ගිරිඋල්ල යන පාරට. ඒ පාරට නැවත්වුවා. නවත්වලා මාවයි, ළමයි දෙන්නායි, සාරායි බහින්න කියලාත් කිව්වා, ෆෙරෝසා හිටියා. ඊට පස්සේ කස්තූන් ත්‍රීවිල්කාරයාට කිව්වේ ඉස්සරහා අසාද් කියලා මුක්තාර් කියලා එක්කෙනෙක් ඉන්නවා කියලා එයාව එක්කන් යන්න. Bus stand එකට ගිහිල්ලා දාන්න Batticaloa බස් එකට කියලා කිව්වා. ඊට පස්සේ ඒ ත්‍රීවිල් ගියාට පස්සේ call එක ගත්තා අබු බරා කියලා. එයාට කිව්වා ත්‍රීවිල් ගියා ඔයගොල්ලෝ එන්න කියලා.

ප්‍ර: කවුද මේ අබු බරා කියන්නේ?

පි: අබුබරා කියන්නේ ඉල්හාම්ට.

ප්‍ර: ඉල්හාම්ට?

පි: ඔව්. ඊට පස්සේ තමයි රතු පාට කාර් එකෙන් අතෙන්ට ආවේ. ඒ කාර් එකේ නඟින්න කිව්වේ. ඊට පස්සේ තමයි අබු බරා කියලා කස්තූන් කතා කළේ. ඒ වගේ අබු තාරී කියලා හිටියා.

ප්‍ර: අබු තාරී කියන්නේ කවුද?

FAIR COMMENT
BY JEZEEM

පි: එයා රිස්කාන්. එයා මං ඉස්සෙල්ලා හඳුනලා තියෙනවා.

ප්‍ර: කොහේදීද එයාව හඳුනන්නේ ?

පි: එයාව කුලියාපිටිය එයාගේ ගෙදරින්. මං ගිහිල්ලා තියෙනවා ඒකේ. ඒ නිසා එයා මං දන්නවා. ඊට පස්සේ ඒ වෙලාවේ තමයි අබු බරා කියලා සහරාන් මෙයත් එක්ක තමා කතා කරේ කියලා මං දැන ගත්තේ. ඊට පස්සේ අතෙන්ට ඉදලා යනකොට ඉස්සෙල්ලා කටුවාපිටිය ගෙදර කියලා මං දන්නෙත් නැහැ. ඒ පාරේ යනකොට දෙපැත්තේම කුඹුරු තිබුණා. ඊට පස්සේ ගිහින් phone ගෙනවද කියලා සාරාට කස්තූන් ඇහුවේ. ඊට පස්සේ සාරා ඇහුවා ඔයාගේ phone එක දෙන්න වැඩ කරන්නේ නැහැ කියලා. මං ගාව තිබුණ phone එක එයාට දුන්නා. ඒ කාර් එකෙන් බැහැලා කස්තූනුයි රිස්කානුයි phone එකේ ඉමි නම්බර් එක ගලවලා, ගැලෙව්වා phone එකේ. කඩලා විසි කරේ.

ප්‍ර: කොහාටද විසි කළේ?

පි: ඒ කුඹුරු පැත්තට තමයි විසි කළේ.

ප්‍ර: කවුද මෙහෙම විසි කෙරුවේ?

පි: ඒ කස්තූනුයි රිස්කානුයි.

ප්‍ර: එතකොට ඒක නිකන්ම විසිකරාද නැත්නම් විනාශ කරලා විසි කරාද?

පි: විනාශ කරලා තමයි විසි කළේ. මේ ඉමි

ප්‍ර: මොනවා කරලාද විනාශ කරේ?

පි: ඒ අතෙන්ට තිබුණ මං දැක්කේ නැහැ සද්දේ තමා කඩන සද්දයක්. ඊට පස්සේ අබු බරා කියන එක්කෙනා ඉමි නම්බරය ගැලෙව්වාද කියලා ඇහුවා. ඊට පස්සේ ඔව් කියලාත් කිව්වා. ඉමි නම්බර් ඔක්කෝම ගලවලා තමයි ඒක විසිකළේ.

ප්‍ර: දැන් එතකොට හැබැයි අර නැන්දම්මලාගේ ගෙදරින් සාරා හාදියාව ගත්තේ VOG කෙනෙක් බලන්න යනවා කියලා නේද?

පි: ඔව්. Hospital යනවා කියලා තමා VOG එක්කෙනාට book කරලා තියෙන්නේ. ඔහොම යන්න තමා VOG ට පෙන්වන්න යන්න කියලා තමයි එන්න කියලා කිව්වේ. ඊට පස්සේ තමයි එයා කිව්වේ ඔය විදිහට තමයි ඒගොල්ලෝ එන්න කියලා කිව්වේ.

ප්‍ර: එතකොට ඒ මිසක් ඇත්තටම මේ VOG කෙනෙක් බලන්න ගියපු ගමනක් නෙවෙයි?

පි: නැහැ.

ප්‍ර: දැන් ඔය විදියට රතු පාට කාර් එකේ ගිහිල්ලා කොතෙන්ටද අන්තිමට ගිහිල්ලා නැවතුණේ?

පි: ඒ ගිහිල්ලා හවස 7.00යි 6.30 විතර අතෙන්ට යනකොට. කස්තූන් call කරා අබ්දුල්ලා බ්‍රදර් මේ දොර අරින්න කියලා ගේට්ටුවේ. අතෙන්ට

FAIR COMMENT
BY JEZEEM

යනකොට එක්කෙනෙක් බයික් එකෙන් බැස්සලා ගේට් එක ඇරියා. ඊට පස්සේ ඉවර වෙලා කිව්වා උඩ තට්ටුවට යන්න කියලා.

ප්‍ර: එතන ඔය පළාතේ නම මොකක්ද ඕකට කියන්නේ?

පි: මං ඒ කාලේ අතෙන්ට ඉන්න කාලේ මම දන්නේ නැහැ.

ප්‍ර: දැන් දන්නවද?

පි: දැන් දන්නවා.

ප්‍ර: මොකක්ද?

පි: කටුවපිටිය කියලා.

ප්‍ර: ඒ ගෙදර දැක්කොත් හඳුනන්න පුළුවන්ද?

පි: පුළුවන්.

ප්‍ර: අපි පින්තූරයක් පෙන්වන්නද?

පි: හා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවේ කටයුතු සාක්ෂිකාරිය හට සිය වැදුම් පිදුම් කිරීම සඳහා විනාඩි 20ක් කල් තබනවා. නැවත කොමිෂන් සභාව රාත්‍රී 7.00ට රැස් වෙනවා.
දැන් වෙලාව: ප.ව. 6.40

****

කොමිෂන් සභාව නැවත රැස්වෙයි.
දැන් වෙලාව: ප.ව.7.05
සාක්ෂිකරු: අබ්දුල් කාදර් ෆාතිමා හාදියා
(දෙමළ භාෂාවෙන්)ප්‍රතිඥා දී නැවත කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: හාදියා අර කාත්තන්කුඩියේ ඉන්න කාලයේදී සහරාන් අබ්දුල් රහුමාන් කියලා මහත්මයෙක් එක්ක ඔහුව දැන හඳුනගෙන තිබුණද?

පි: ඔව්.

ප්‍ර: කවුද මේ අබ්දුල් රහුමාන් කියන්නේ?

පි: එයා මන්ත්‍රී කෙනෙක් PMGG එකේ.

ප්‍ර: එතකොට අබ්දුල් රහුමාන් මහත්මයායි සහරානුයි අතර මොන වගේ සම්බන්ධයක්ද තිබ්බේ?

පි: ඒ කියන්නේ වැඩිය උදව්වත් ඒගොල්ලන්ට ඉල්ලුවේ නැහැ. නිකන් කතාබහ කරනවා.

ප්‍ර: නිකන් කතාබහ කරනවා?

පි: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඔය 2015 අවුරුද්දේදී election එකට ජනාධිපතිවරණයේදී ඒකේදී සහරාන් කාට හරි උදව් කරාද?

පි: ඒ කියන්නේ සහරාන්ගේ කට්ටිය ඒගෝල්ලෝ කියලා තිබ්බේ එයාට ඡන්දේ දාන්න කියලා.

ප්‍ර: කාටද?

පි: අබ්දුල් රහුමාන්ගේ ෂිබ්ලි ෆාරුක් ඒගොල්ලන්. සහරාන්ගේ කට්ටිය ඉන්න කට්ටියට. ඊට පස්සේ සහරාන් ඒගොල්ලන්ට කිව්වා කැමැත්ත ඔයගොල්ලොන්ට දෙයි කියලා.

ප්‍ර: ඒ කිව්ව දේ තේරුන් නැහැ හාදියා ඒකයි. ආපහු කියන්න

පි: එයා සහරාන්ට ඒගොල්ලෝ members ඉන්නවා NTJ පල්ලි එකේ. ඒගොල්ලන් කියලා තිබ්බේ ඡන්ද දාන්න කියලා අබ්දුල් රහුමාන්ට ශිබ්ලි ෆාරුක් ඒගොල්ලන් ඉල්ලුවා. ඊට පස්සේ සහරාන් කියලා තිබ්බා. කැමැත්ත අය ඔයගොල්ලන්ට දෙයි කියලා.

ප්‍ර: මගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් හාදියා කිව්වා හිස්බුල්ලාගේ කණ්ඩායම ජයග්‍රහණය කරපු වෙලාවේ election එක දිනලා ඉන්න අවස්ථාවේදී අර රතිඤ්ඤා පත්තු කරලා පල්ලියේ හිටපු රිල්වාන්ට තුවාල වුණා කියලා නේද?

පි: ඔව්. ඒ කියන්නේ පල්ලියේ වහල උඩයි, පල්ලිය ඇතුලෙයි තමයි දැම්මෙ. රිල්වාන්ට පොලුවලින් ගහලා තමයි නළලේ තුවාල තිබුණේ.

ප්‍ර: පොලුවලින් ගහලා තමයි රිල්වාන්ට තුවාල වෙලා තිබුණේ ?

පි: ඔව්.

ප්‍ර: ඒ ඔය ඒවගේ රිල්වාන්ට තුවාල වෙච්ච තව අවස්ථාවක් හාදියාට මතකද?

පි: ඔව්.

ප්‍ර: මොකක්ද ඒ වෙලාවේ තිබ්බේ?

පි: 2018

ප්‍ර: කොයි මාසේ වගේද?

පි: 2018. 09 මාසේ විතර ඒ වගේ තමයි මතක.

ප්‍ර: මොකක්ද වුණේ?

පි: එයා කාත්තන්කුඩි පාලමුන ප්‍රදේශයේ බෝම්බ හදලා testing කරන්න අරන් ගියා. ඒ අරන් ගියපු වෙලාව එතකොට මං හිටියේ කාත්තන්කුඩියේ. ඒ 7 වෙනකොට එයාගේ තාත්තාට call එකක් ආවේ රිල්වාන්ගේ තාත්තාට.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: රෑ 7.00 ද උදේ 7.00 ද?

පි: රෑ 7.00 ඒ call එකක් ආවා ටක් ගාලා එන්න කියලා.

****

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: කොහාටද?

පි: කොහාටද කියලා දන්නේ නැහැ. ඊට පස්සේ රිල්වාන්ගේ තාත්තාත් ත්‍රීවිල් එක අරගෙන ගියා. එයත් එක්ක සහරාන්ගේ දෙවැනි නංගී , husband ගියා ඒකට. ගිහිල්ලා තමා රිල්වාන් එක්කන් ආවේ අර සහරාන්ගේ දෙවනි නංගී හිදායාගේ ගෙදරට. අතෙන්ට අරන් එනකොට 9.00 විතරයි.

ප්‍ර: ඇ 9.00ද?

පි: ඇ 9.00යි. ඒ අරන් ඇවිල්ලා නංගීගේ ගෙදර තමා එයාව එක්කන් ඇවිල්ලා තිබ්බේ. එතකොට එයාට test කරනකොට short වෙලා තමයි පුපුරලා තියෙන්නේ කියලා. ඊට පස්සේ ඉස්සෙල්ලා test කරලා ගියා මං දන්නේ නැහැ. ඊට පස්සේ තමයි ඒකේ අනිද්දා තමයි දන්නේ ඒ test කරපු වෙලාව තමයි එයාට පුපුරුවේ එයාට තුවාල වුණේ කියලා.

ප්‍ර: දැන් හාදියාට ඔය තොරතුරු ලැබුණේ කාගෙන්ද?

පි: එහේ නැන්දම්මලා ඒගොල්ලෝ තමයි අතෙන්ට කියලා තිබ්බේ. මෙහෙම කියලා එයා testing කරන්න ගිහින් තියෙනවා කියලා. ඊට පස්සේ සහරාන් කතා කරා.

ප්‍ර: සහරාන් කොයි වෙලාවේද කතා කළේ?

පි: එයාගේ අම්මාගේ phone එකෙන් call එක ගත්තා telegram appවලින්. එහෙම තමා එයා කතා කළේ ඒ කතා කරන වෙලාවේ මං ගත්තා ඒ phone එක. ඊට පස්සේ තමයි කෝ අම්මා කියලා. මං කිව්වා අම්මාලා නංගීලාගේ ගෙදර ඉන්නවා කියලා. ඊට පස්සේ කියන්න එයාට කන්න ජාති මොකුත් දෙන්න එපා කියලා. ඊට පස්සේ තැඹිලි වතුර දෙන්න කියලාත් කිව්වේ. ඊට පස්සේ phone එක තිබ්බා. ඊට පස්සේ තමයි ඇ 12.00 වෙනකොට ආයේ call එකක් ආවේ මෙහෙම තමයි ඒගොල්ලෝ එතකොට දේශනා කරන්න දවස් 2ක් හම්බන්තොටද කොහේදෝ හිටියේ කියලා. එහේ ඉඳලා මම වාහනයේ යවන්නම්. තව චුට්ටක් එයාව තියා ගන්න කියලා. ඊට පස්සේ ඒ ගෙදරින් තමයි 4, 2.30 පාන්දර 3 වෙනකොට කට්ටිය ආවේ. ඒ වාහන එකේ ගෆූර් මාමායි, අසාද්, සෙයිනි, මිල්හාන් තව රවුෆ් කියලා එක්කෙනෙක්. ඒගොල්ලෝ හිටියා ෆර්දෝස් කියලා එක්කෙනෙක්. ඒගොල්ලන් ඇවිල්ලා හිටියා. ඒ ඇවිල්ලා 4.30 වෙනකොට එයා ඉස්සෙල්ලා රිල්වාන් කියලා තිබුණා Batticaloa hospital එකට මාව ගෙනියන්න එපා කියලා.

ප්‍ර: ඇයි ඒ? දැන් ඉස්සෙල්ලා ගෙනිව්වේ Batticaloa hospital එකටනේ ?

පි: ඔව්.

ප්‍ර: ඇයි මේ පාර එපා කියලා තියෙන්නේ?

පි: එයා කිව්වාලු Batticaloa hospital එකට ගෙනියන්න එපා කියලා. ඊට පස්සේ තමයි සහරාන් කතා කරලා තිබ්බේ ඒකට ගෙනියන්නේ නැහැ

FAIR COMMENT BY JEZEEM

කොළඹට එක්කන් යනවා කියලා. කට්ටිය එනවා එයාව එක්කන් යන්න කියලා. ඊට පස්සේ තමයි 4.30 වෙනකොට එයාව කාත්තන්කුඩි ඉඳලා එක්ක ගියේ කොළඹට.

ප්‍ර: හාදියා කිව්ව විදියට මේ සිද්ධිය වුණේ 2018 .09 මාසේ?

පි: ඔව් ඒ වගේ.

ප්‍ර: ඒ වගේම හාදියා කිව්වා ඒ සිද්ධිය වෙනකොට හාදියා හිටියේ කාත්තන්කුඩියේ කියලා?

පි: ඔව්.

ප්‍ර: නමුත් මීට ඉස්සරවෙලා හාදියා මං අහපු ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් කිව්වා 2017 මාර්තු මාසේ 10 වෙනිදා අලියාර් හන්දියේ සිදුවුණ සිද්ධියට පස්සේ හාදියා දරුවෝ දෙන්නාත් අරගෙන ගියා කියලා කැකුණගොල්ලේ අම්මලා ඉන්න ගෙදෙට්ට?

පි: ඔව්.

ප්‍ර: එතකොට එහෙනම් පැහැදිලි කරන්න ඔය රිල්වාන්ගේ සිද්ධිය 2018.09 මාසේ සිද්ධ වෙනකොට කොහොමද හාදියා කාත්තන්කුඩියේ ඉන්නේ කියලා?

පි: මං 2017 මාර්තු මාසේ 11 වෙනිදා අම්මලාගේ ගෙදර කුරුණෑගල කටුපොතේ ගෙදරින් තමයි මම හිටියේ අම්මලාත් එක්ක. ඊට පස්සේ ඒ 2017 මැයි මස ඒ කියන්නේ නෝම්බි කාලයේ 7 මාසේ වගේ. ඒ නෝම්බි දවස 26, 27 වෙනකොට නැන්දා call කරලා කිව්වා ළමයි දෙන්නාත් එක්ක එන්න කියලා කාත්තන්කුඩියට. ඊට පස්සේ මං තාත්තාට කියලා.

ප්‍ර: ඒ කියන්නේ සහරාන්ගේ අම්මා?

පි: ඔව්. ඊට පස්සේ මං තාත්තාලාට කියලා., මගේ තාත්තාට කාත්තන්කුඩියට මම ගිහිල්ලා දාන්න කියලා. ඊට පස්සේ මං තාත්තාත් එක්ක අපේ ඒ ගේ ඉඳලා රෑ බස් එකේ ගියා කාත්තන්කුඩියට. ඒ යනකොට පාන්දර 5.30ට විතර. ඒ ගිහිල්ලා එයාගේ සහරාන්ගේ දෙවැනි නංගිලාගේ ගෙදර තමයි ගිහිල්ලා හිටියේ. ඒ ගෙදරින් දවස් 8ක් විතර හිටියා. ඒ ඉන්නකොට තමයි සහරාන්ගේ අම්මා කිව්වා එන්න මස්සිනාවයි , මාමාවයි බලලා එන්න බන්ධනාගාරයේ ගිහිල්ලා. ඊට පස්සේ මං දුවව අරගෙන ගියා බන්ධනාගාරය බලන්න. බලලා ආවේ ගිහිල්ලා. ඊට පස්සේ ඒ කාලයේ තමයි එතකොට මං යනකොට ඒ සහරාන් හම්බ වෙන්නේ. කාත්තන්කුඩියේ ඉන්න කට්ටිය එයාව එක්ක යනවා රෑට. එක්කන් ඇවිල්ලා ආපහු පාන්දර 2, 3ට ආයේ එක්කන් එනවා. කට්ටියම හිටියේ එහේ. ඉන් පස්සේ දවසක් වෙනකොට එයාගේ අම්මායි , එයාගේ නංගීයි, නංගීගේ හස්බන්ඩ් මාව ගෙනිහින් අම්මලාගේ ගෙදරට යනවා. ඊට පස්සේ සහරාන් පුත්තලමේ ගෙට ගියා.

ප්‍ර: එහෙම ඉන්නකොට තමයි කාත්තන්කුඩියේදී රිල්වාන්ගේ මේ accident එක ගැන දැන ගන්න ලැබුණේ?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒ 2017 තමයි පළවෙනි පාර මං ගියේ. ඊට පස්සේ 2018 April මාසවලින් මම ගිහිල්ලා ආවේ. ආපහු තමයි හජ්ජි festival ඉවර වෙලා දවස් දෙකික් පස්සේ තමයි ආපහු කාත්තන්කුඩි නැන්දම්මලාගේ ගෙදර හිටියේ. ගියාට පස්සේ අනිත් දවසේ තමයි මෙයාට තුවාල වුණේ.

ප්‍ර: එතකොට දැන් ඔය සහරාන් එදා call කරා කියලා කිව්වානේ. මේ රිල්වාන්ට තුවාල වුණාට පස්සේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට කාට හරි සල්ලි දෙන්න කියලා කිව්වද රුපියල් ලක්ෂ 2 ½ ක් හරි 3ක් හරි?

පි: ඒ කියන්නේ කොයි වෙලාවේද

ප්‍ර: doctor කෙනෙක්ට සල්ලි දෙන්න කියලා කිව්වද ඔය මේ රිල්වාන්ගේ සිද්ධියට අදාලව ලක්ෂ 2 ½ ක් හරි 3ක් හරි?

පි: ඔව් ඒත් රිල්වාන් තුවාල වෙච්ච දවස නෙවෙයි. ඊට මාස 1 ½ කින් පස්සේ. එතකොට සහරාන් අපේ අම්මලාගේ ගෙදර ඇවිල්ලා හිටියා. එතකොට තමයි සහරාන්ට call එකක් ආවේ. රිල්වාන්ව අර arrange කරලා දුන්න doctorට සල්ලි දෙන්න ඕනි කියලා. එතකොට රිලා කියලා එක්කෙනෙක්. අබු ලිබා කියන්නේ එයාට. අබු ලිබා.

ප්‍ර: අබු?

පි: අබුලිබා. අබුලිබා කියලා එක්කෙනෙක් තමයි ඒ ඔක්කෝම කතා කරලා දුන්නේ කියලා.

ප්‍ර: කවුද doctor ත් එක්ක?

පි: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ අනිත් විදියට කියනවානම් රිලා?

පි: රිලා. එයා සෞදි තමයි වැඩ කරන්නේ.

ප්‍ර: රිලා වැඩ කරේ සෞදිවල?

පි: ඔව්. එයා යන්න කළින් අර doctor ලත් එක්ක හමුවෙලා කතා කරලා ඒගොල්ලන්ට සල්ලි 2 ½ක් දෙන්න ඕනි කියලාත් කිව්වේ. ඊට පස්සේ සහරාන් කිව්වා කොළඹ පැත්තේ කොහේ හරි arrange කරන්න එයාව ගිහින් හමුවෙන්න කියලා.

ප්‍ර: එහෙම තමයි ඒක වුණේ ?

පි: ඔව්.

ප්‍ර: සල්ලි එහෙම දුන්නද කියන්න දන්නවද හාදියා?

පි: ඒ කියන්නේ දුන්නා කියලා තමයි පස්සේ ඒගොල්ලන් කිව්වේ අර doctorට.

ප්‍ර: කවුද කිව්වේ?

පි: පස්සේ කියන්නේ 2019 මං දැන ගත්තේ සහරාන් දුන්නා ඒ කිව්වේ.

ප්‍ර: සහරාන් කිව්වේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්.

ප්‍ර: දැන් ඔය ඉස්පිරිතාලයට මඩකලපුවේ යන්නට බැහැ කියලා රිල්වාන් කිව්වා කියලා දැන් කිව්වා නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට එහෙමනම් රිල්වාන්ව ගෙනිව්වේ මොන ඉස්පිරිතාලයටද කියලා හාදියා දන්නවද?

පි: කොළඹ general hospital එකට තමයි ගෙනියයි කියලා කිව්වේ.

ප්‍ර: එහෙදී තමයි එතකොට ප්‍රතිකාර කෙරුවේ රිල්වාන්ට?

පි: ඔව්.

ප්‍ර: හාදියාට දැන ගන්න ලැබුණද රිල්වාන්ට තුවාල වුණේ කොහොමද කියලා ඉස්පිරිතාලේ අයට දැනුම් දුන්නද කියන කරුණ?

පි: ඒ ඉස්පිරිතාලේ කට්ටියට කියලා තිබුණේ එයා රත්තරං බඩු හදනකොට ගෑස් ලීක් වෙලා කියලා තමයි ඒක.

ප්‍ර: ගෑස් ලීක් වෙලාද නැත්නම් ගෑස් ටැංකියක් පුපුරලාද කොහොමද?

පි: ඒ කියන්නේ ගෑස් ටැංකියක් ඒකේ පුපුරලා කියලා තමා ඇතුළට එයාව admit කරේ කියලා තමයි කිව්වේ.

ප්‍ර: කවුද කිව්වේ?

පි : ඊට පස්සේ එයාගේ අම්මා කිව්වා මට.

ප්‍ර: ඒ කියන්නේ රිල්වාන්

පි: සහරාන්ගේ අම්මා

පි: සහරාන්ගේ අම්මා කිව්වා?

පි: ඔව්.

ප්‍ර: එහෙම තමයි admit කරලා තියෙන්නේ කියලා ?

පි: ඔව්.

ප්‍ර: ගොඩක් තුවාල වෙලා තිබ්බද රිල්වාන්ට?

පි: ඔව් ගොඩක් තුවාල වෙලා තිබ්බා.

ප්‍ර: හාදියා දැක්කද ඒ වෙලාවේ?

පි: ඒ වෙලාවේ කියන්නේ ඇඟිලි ඔක්කෝම එල්ලිලා තිබුණා. ඔළුව පැත්තෙත් තුවාල තිබුණා නළලේ. ඊට පස්සේ ඇස් එකක් කළු පාට වෙලා තිබුණේ. ලේ පෙරිලා තිබ්බා.

ප්‍ර: ලේ පෙරිලා තිබ්බා?

පි: ඔව්.

ප්‍ර: ගොඩක් තුවාල වෙලා තිබුණා නේද?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔය අබු ලිබා තමයි රිල්වාන්ට treat කරන අර දොස්තර සම්බන්ධයෙන් කටයුතු කරා කියලා කිව්වේ ?

පි: ඔව්.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට හාදියා දන්නවද ඒ දොස්තර මහත්තයා කවුද කියලා? එයා කොළඹ general hospital එකේ එක්කෙනෙක්ද?

පි: ඒ කියන්නේ එයා කොළඹ general hospital එකේ තමයි එයා වැඩ කරනවා කියලා කිව්වේ.

ප්‍ර: ඒ මහත්මයාගේ නම එහෙම දැන ගන්න හම්බවුණාද?

පි: ඒ කියන්නේ එයාගේ photos සහරාන්ගේ phone එකේ gallery එකේ තිබුණා.

ප්‍ර: සහරාන්ගේ phone එකේ gallery එකේ තිබුණා ඒ දොස්තර මහත්මයාගේ පින්තූර?

පි: එයාට තුවාල වුණාට පස්සේ මාසයක 1 ½ කට පස්සේ සහරාන් අම්මලා ගෙරදට ආවා. ඊට පස්සේ එයාගේ phone එකෙන් තමයි මම දැක්කේ. එයා doctor එක්කෙනෙක් කියලා. එයා සුදුයි, උසයි කෙනෙක්.

ප්‍ර: සුදු , උස එක්කෙනෙක්?

පි: ඔව්. වැඩිය උස නෙවෙයි සාමාන්‍ය උස එක්කෙනෙක්.

ප්‍ර: ඉතින් ඇයි හාදියා සහරාන්ගේ phone එකේ gallery එකේ ඒ දොස්තර මහත්මයාගේ පින්තූර තියෙන්නේ ?

පි: ඒකේ ඒ gallery එක විතරක් නෙවෙයි මං බැලුවේ. ඒකේ check කරා. ඒක බලනකොට අබු ලීබා කියලා එක්කෙනෙක් එයාගේ photo එවලා තිබ්බා.

ප්‍ර: අබු ලිබා තමයි අර රිලා කියන්නේ?

පි: ඔව්. එයා තමයි doctor කියලා එයාව තමා එයාගේ යාළුවා කියලා හඳුන්වලා තියෙන්නේ. කියලා එය general hospital එකේ තමයි වැඩ කරනවා කියලා එහෙම කියලා තිබුනේ ඒකේ.

ප්‍ර: කොයි වෙලාවේද හාදියා ඔය පින්තූර දැක්කේ gallery එකේ තියෙනවා? කොයි වෙලාවේද දැක්කේ?

පි: මම දැක්කේ හවස් වෙලාවේ. එයාගේ phone එක මම බැලුවේ.

ප්‍ර: දැන් රිල්වාන්ට තුවාල වුණානේ 2018.09 මාසේ?

පි: ඒ 1.30න් පස්සේ තමයි phone එකෙන් මම දැක්කේ photos.

ප්‍ර: ඒ කියන්නේ අර එදා පාන්දර 1.30ට? මාස 1 ½ කට පස්සේද?

පි: මාස 1 ½ කට පස්සේ. ඊට කලින් කතා කරලා තිබ්බා රිලා අබුලිබා කියන්නේ එයාගේ යාළු එක්කෙනෙක් තමයි කොළඹ general hospital එකේ ඉන්නේ. බයවෙන්න එපා එයා කතාකරලා බලලා කියලා තමයි ගියේ.

ප්‍ර: එතකොට මාස 1 ½ කට පස්සේ සහරාන්ගේ mobile එකේ හාදියා දැක්කා gallery එකේ මේ පින්තූර තියෙනවා?

පි: ඔව්.

ප්‍ර: දොස්තර මහත්මයාගේ නම දන්නවද හාදියා?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒ කියන්නේ නම ඒකේ තිබුණා. මට ඒ නම මතක නැහැ. එයාගේ රූපය මට මතකයි.

ප්‍ර: කොයි වෙලාවක හරි හාදියාට ඒ දොස්තර මහත්මයායි, අබු ලිබායි දකින්ට ලැබුණද?

පි: පැහැදිලි නැහැ.

ප්‍ර: ඒ කියන්නේ පින්තූරයක් නෙවෙයි. පණපිටින් දකින්නට හම්බුණාද ඒගොල්ලන්ව?

පි: නැහැ.

ප්‍ර: සහරාන්ව හම්බවෙන්න ඒගොල්ලෝ ආවාද හාදියා දන්න තරමට?

පි: නැහැ.

ප්‍ර: ඒ කියන්නේ හාදියා ඉන්න වෙලාවක ආවේ නැහැ ඒගොල්ලෝ.?

පි: නැහැ.

ප්‍ර: අර පින්තූර දැක්කා කියලා කිව්වානේ gallery එකේ.

පි: ඔව්.

ප්‍ර: එතකොට අබුලිබාගේ පින්තූරේයි අර දොස්තර මහත්මයා සුදු, ඒ තරම් උස නැති දොස්තර මහත්මයා. ඒ මහත්මාගේ පින්තූරයි වෙන වෙනමද තිබ්බේ . නැත්නම් එක පින්තූරයකද තිබ්බේ ?

පි: එක පින්තූරයක් දොස්තර මහත්මයාගේ විතරයි තිබුණේ. රිලාගේ අබුලිබා කියලා එයා post එකේ අර picture එකේ දාලා තිබුණ.

ප්‍ර: ඒ කියන්නේ වෙන වෙනම පින්තූර තමයි තිබ්බේ?

පි: ඔව්.

ප්‍ර: හාදියාට කොයි වෙලාවක හරි සහරාන් කිව්වද ඔය රිල්වාන්ට ප්‍රතිකාර කරපු treat කරපු doctorව හම්බ වෙන යන කතාවක් හරි හම්බුණ කතාවක් හරි ?

පි: ඒ කියන්නේ එයා ගෙදර එයාගේ මල්ලිට තුවාල වෙලා මාස 1 ½ න් පස්සේ අම්මාලාගේ ගෙරදට ආවා අපි. ඒ ඇවිල්ලා ඉන්න වෙලාවේ තමයි, එයාට call එකක් ආවේ.

ප්‍ර: කාගෙන්ද?

පි: කාගෙන්ද කියලා මං දන්නේ නැහැ. එයා කතා කරේ ඊට පස්සේ එයාගේ නමත් තිබුණා. මට දැන් මතක නැහැ. එයා කතා කළේ එයාව හම්බවෙන්න set කරන්න කියලා මං එන්නම් කියලා. ඊට පස්සේ අනිද්දා ඒගොල්ලෝ හම්බෙන්න තමයි සහරාන් එහේ ඉඳලා ආවේ කොළඹට.

ප්‍ර: කාව හම්බ වෙන්නද මේ ආවේ?

පි: අර doctorවයි අබු ලිබා කියන රිලාවයි. ඒගෝලලෝ හම්බවෙලා අර සල්ලි දෙන්න තමයි සහරාන් ආවේ.

ප්‍ර: දැන් මම අර අබු කියන නම් තියෙන සමහර ඒගොල්ලන් ගැන පොඩ්ඩක් දැන ගන්න ඕනි හාදියා. ඒක නිසා ඒක ගැන අපිට පොඩ්ඩක් පැහැදිලි කරන්න. මං කිව්වොත් හරිද සහරාන්ව හැඳින්වුයේ අබු උබෙයිදා කියලා?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එයාට කළින් තිබුණ නම අබු මුකාතිල් කියලා.

ප්‍ර: ඊට පස්සේ?

පි: ඊට පස්සේ එයාගේ මල්ලී බන්ධනාගාරයෙන් release වුණාට පස්සේ ඒ නම එයාගේ මල්ලීට කිව්වා එයා අබු මුකාතිල් කියලා.

ප්‍ර: මොකක්ද ඒකේ තියෙන වැදගත්කම?

පි: ඒ අබු මුකාතිල් කියන්නේ තන්දිගේ, ඒ කියන්නේ පුතා කියනවා වගේ එකක්. ඒකේ තමයි අබු මුකාතිල් කියලා කියන්නේ. ඒ වගේ පස්සේ සහරාන් අබු මුහාරික් කියලා තිබුණේ. ඒ 2017 එයා එයාගේ මල්ලී සෙයිනි release වුණායින් පස්සේ එයාට අබු මුකාතිල් කියලා තියලා එයා අබු මුහාරික් කියලා නම තිබුණා.

ප්‍ර: අබු මුකාතිල් කියලා ඊට පස්සේ ෂෙයිනිට ඒ නම දුන්නා?

පි: ඔව්. ඊට පස්සේ අබු මුහාරික් කියලා 2017 අන්තිම ඉඳලා 2019 අප්‍රේල් මාසේ 18,19 වෙනකම් එයාට අබු මුකාතිල් කියලා තමයි කියන්නේ.

ප්‍ර: කාටද ෂෙයිනිට?

පි: නැහැ.

ප්‍ර: එහෙනම්?

පි: sorry . අබු මුහාරික් කියලා කියන්නේ සහරාන්ට.

ප්‍ර: අබු මුහාරික් කියලා කිව්වා සහරාන්ට?

පි: ඔව්.

ප්‍ර: දෙවැනි එක තමයි අබු මුහාරික් කියන්නේ?

පි: ඊට පස්සේ තමයි අබු උබෙයිදා කියලා සහරාන්ට තුන්වෙනි නම කියන්නේ.

ප්‍ර: ඉතින් හාදියා කවුද මේ නම් දාන්නේ?

පි: ඒ නම ඒගොල්ලන් දානවා.

ප්‍ර: ඒගොල්ලෝ කියන්නේ ?

පි: ඒ සිරියාවලින් කට්ටියත් ඉන්නවා. ඒගොල්ලන් ප්‍රචාරය කරන කට්ටිය. එහේ ඉඳලා ගොඩක් අයට නම දාලා තියෙනවා. ඒ නමත් අරගෙන මේගොල්ලෝ අනිත් අයට දේශනා තියෙන දවස්වලට ඒගොල්ලන්ට ඒගොල්ලන් දෙනවා නැත්නම් අර ගොල්ලන් කැමති නම එගොල්ලන්ගේ කැමැත්තට ඒගොල්ලන් දානවා.

ප්‍ර: ඒ කියන්නේ මේ සහරාන් මේ නම් දානවා?

පි: ඔව්.

ප්‍ර: එතකොට අබු කිතාල් කියලා හඳුන්වන්නේ කවුද?

පි: එයාගේ මල්ලි රිල්වාන්ට.

ප්‍ර: අබු මුකාතිල් කියන්නේ?

පි: එයාගේ මල්ලී සෙයිනිට.

ප්‍ර: ආසාත්ට දාලා තියෙන නම දන්නවද?

පි: අබු මුක්තාර්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර: අබු අබ්දුල්ලා කියන්නේ?

පි: අසා මුබාරක්.

ප්‍ර: අබු ෆලා ?

පි: සාහිද් අබ්දුල්ලා.

ප්‍ර: මාවනැල්ලේ එක්කෙනා?

පි: මාවනැල්ලේ එක්කෙනා.

ප්‍ර: සාහිඩ් අබ්දුල්ලාව දැකලා තියෙනවා නේද හාදියා?

පි: මං කටුවපිටිය ගෙදර ආවායින් පස්සේ එයාව දැකලා තියෙනවා.

ප්‍ර: එයාගේ පින්තූරයක් දැක්කොත් අඳුරන්න පුළුවන්ද?

පි: පුළුවන්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: හාදියා අබු අමර් කියලා කවුරුහරි ඉන්නවද?

පි: අබු උමර්.

ප්‍ර: ඒ කියන්නේ අර මාවනැල්ලේ එක්කෙනා නේද?

පි: මාවනැල්ලේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: දැන් අර screen ඒකේ තියෙනවානේ පින්තූරයක්?

පි: ඔව්.

ප්‍ර: එයාව කළින් දැකලා තියෙනවද හාදියා?

පි: කළින් දැකලා නැහැ එයාව.

ප්‍ර: අපි තව පින්තූරයක් පෙන්නනවා. මේ පින්තූරයේ ඉන්න එක්කෙනාව දැකලා තියෙනවද?

පි: එයා අබු උමර්.

ප්‍ර: අබු උමර් කොහේ එක්කෙනෙක්ද?

පි: එයා මාවනැල්ලේ එක්කෙනා.

ප්‍ර: දැන් මං ඉස්සරවෙලා ප්‍රශ්නයක් ඇහුවාම අබු ෆලා කියන්නේ කවුද කියලා හාදියා කිව්වා මොහොමඩ් ඊබ්‍රහිම් සහිඩ් අබ්දුල් හක් කියලා නේද?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔය අබු උමර් කියලා හඳුනා ගත්ත එක්කෙනාගේ නම මොකක්ද?

පි: එයාගෙත් නම ඊබ්‍රහිම් සාදික් අබ්දුල් හක්.

ස්වාමිනි C – 165(A) ලේඛනයේ ඉන්නා තැනැත්තාව සාක්ෂිකාරිය විසින් හඳුනා ගන්නා ලද බව ගෞරවයෙන් සැළ කරනවා.

****

දැන් වේලාව : ප.ව.7.35

මෙතැන් සිට ල/ලේ : සචිනි මෙනවිය

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව : ප.ව. 07.35
පෙර සටහන් : නිල්මිණි මෙනවිය.
මෙතැන් සිට : සචිනි මෙනවිය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: එහෙම නම් දැන් අපි ඔබට දැන් පින්තූර දෙකක් පෙන්නනවා. දැන් බලන්නකෝ අර වම් පැත්තේ ඉන්න එක්කෙනාව ඉස්සෙල්ලා අඳුර ගත්තනේ හාදියා ?

උ: ඔව්.

ප්‍ර: දැන් මං අහන්නේ දකුණු පැත්තේ ඉන්න එක්කෙනාව ආයි මතක් කරලා බලන්න මතකද කියලා නැත්නම් තව පින්තූරයක් තියෙනවා පෙන්නන්න පුළුවන් මතකද?

උ: එයා අබු උමර් වගේ තමයි මතක.

ප්‍ර: එයා අබු උමර් වගේ පේන්නේ?

උ: ඔව්.

ප්‍ර: දැන් අබු උමර් කියලා කිව්වේ වම් පැත්තේ එක්කෙනානේ?

උ: ඔව්.

ප්‍ර: මම අහන්නේ දකුණු පැත්තේ එක්කෙනා?

උ: ඒ ෆලා කියන එක්කෙනා.

ප්‍ර: ෆලා?

උ: ඔව්.

ප්‍ර: ඒ තමයි අබු ෆලා?

උ: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක්.
ස්වාමීනි මෙම ලේඛනයේ C165 C වශයෙන් එය ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: දැන් ඔය මම අනිත් පින්තූර ටික ලෑස්ති කරනකම් හාදියා හාදියට අබු ෆලයි අබු උමරුයි හම්බවුණේ කොයි කාලේද?

උ: 2019 පෙබරවාරි ඒ කියන්නේ ෆලා කියන එක්කෙනා තමයි මුලින්ම දැක්කේ 2019 පෙබරවාරි 24, 25 දවස්වල.

ප්‍ර: කොහේදිද?

උ: කටුවපිටියේ අර කුලියට ගත්ත ගේට ඒ ගොල්ලො ඇවිල්ලා හිටියා.

ප්‍ර: ඒ ගෙදරට ඇවිල්ලා හිටියා?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඒ වෙලාවේ හාදියා එහෙ හිටියා නේද?

උ: ඔව්.

ප්‍ර: එයා තනියමද ඇවිල්ලා හිටියේ?

උ: එයයි ෆලා. අබු හදිල්. අබ්දුල්ලා. අබු සිලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් අබු ෆලාගේ හරි අබු උමර්ගේ හරි පවුලේ කවුරුත් ඒ ගොල්ලොත් එක්ක ආවද?

උ: ඒ ගොල්ලොත් එක්ක කටුවාපිටියට ආවේ නැහැ. ඒ ගොල්ලොන්ට වෙන සේෆ් හවුස් එකක් අරන් දුන්නා.

ප්‍ර: ඇයි මේ අබු ෆලාටයි , අබු උමර්ටයි සේෆ් හවුස් එකකට එන්න වුණේ කියන එක හාදියා දැනගත්තද?

උ: ඔව්.

ප්‍ර: මොකද්ද හේතුව?

උ: 2018 දෙසැම්බර් 26 වැනිදා මාවනැල්ල බුදුපිළිම කැඩුවා කියලා ඒ ගොල්ලොන්ට ඉන්න තැනක් නැහැ කියලා. පොලිසියෙන් හොයනවා කියලා තමා. ඊට පස්සේ සහරාන් එයාගේ යාළුවට කියලා සේෆ් හවුස් එකක් බලලා ඒ ගොල්ලොන්ට දුන්නේ.

ප්‍ර: එතකොට සහරාන් අබු ෆලාටයි , අබු උමර්ටයි උදව් කරන්න සහරානුත් ඒ දෙන්නත් අතර මොකද්ද තිබ්බ සම්බන්ධය? අපි නිකන් මිනිස්සුන්ට උදව් කරන්න යන්නේ නැහැනේ?

උ: ඔව්.

ප්‍ර: අපි දන්නව නම් හරි අපි යාළුවො නම් හරි ඒ වගේනේ උදව් කරන්නේ. දැන් සහරානුත් මේ දෙන්නත් අතර මොකක්ද් තිබුණු සම්බන්ධය කියලා හාදියා දැනගත්තද?

උ: ඔව් දැනගත්තා.

ප්‍ර: මොකද්ද?

උ: ඒ කියන්නේ ඒ ගොල්ලො සාදික් අබ්දුල් හක්, සාහිද් අබ්දුල් හක් අයියයි මල්ලියි. දෙන්නම මාවනැල්ලේ. එයා IS සංවිධානයට ඒ ගොල්ලො දිවුරුම් දීලා ඒ ගොල්ලොත් එක්ක ඉන්න ඕනෙයි කියලා. ඒ කියන්නේ IS එකේ ඒ ගොල්ලොත් එක්කම කරන්න ඕන කියලා තමා සහරාන් හම්බුවෙලා ඒ ගොල්ලො ඒ දේශනාවලට ගිහිල්ලා හිටියේ. ඊට පස්සේ තමා 2018 ඒ තව කට්ටිය ඉන්නවා ඉස්සෙල්ලා සහරාන් අඳුරන කට්ටිය. ඒ ගොල්ලන් තමයි එයාව සහරාන්ට කතා කරන්න ඒ ගොල්ලො තමා arrange කරලා තිබුණේ. ඊට පස්සේ තමා සහරාන් ඒ ගොල්ලො එක්ක සම්බන්ධ ඇති වුණේ.

ප්‍ර: එතකොට ඔය කාලේ සහරානුත් ගෙදර හිටියෙත් නැහැ හාදියා එක්ක හිටියෙත් නැහැ. එතකොට පොලිසියට භාර වුණෙත් නැහැ. සහරානුත් තැනින් තැන යමින් තමයි හිටියේ නේද?

උ: ඔව්.

ප්‍ර: ඒ වගේම තමයි මේ මාවනැල්ල සිද්ධියෙන් පස්සේ මේ අයියයි මල්ලියි ගෙදර හිටියේ නැහැ තමන්ගේ මාවනැල්ලේ අර වගේ තැන් තැන්වලට යමින් හිටියේ?

උ: ඔව්.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හාදියා දැනගත්තද වනාතවිල්ලුවේ මොකක් හරි සිද්ධියක් සිදුවෙලා තිබුණාද කියලා?

උ: මම දැනගත්තේ 2019 ජනවාරි මාසේ 17, 18 වගේ FB එකෙන් වනාතවිල්ලුවේ ඒ තිබුණා තැනකට බඩු අරවා අහුවෙලා FB එකේ දාල තිබුණේ.

ප්‍ර: FB එකේ දැන් හාදියා බලලද ඒක බැලුවේ එහෙම නැත්නම් කොහොමද ඒක ගැන දැනගත්තේ ?

උ: ඒ දැනගත්තේ සාරගේ FB එකෙන් තමා ඉස්සෙල්ලා ඒ FB එකෙන් තමා මං දැක්කේ . එයා පෙන්නුවා මට. ඒ FB එකේ ඉඳලා තමා. එයා කිව්වා එතැන තමයි ඒ ගොල්ලො Training කරන්න හිටියේ එතැන. ඒකෙන් ගත්ත බඩු තමා කියලා ඒ .

ප්‍ර: මොනවද මේ Training

උ: ඒ කියන්නේ ඒ ගොල්ලො සිරියාවේ කට්ටිය දිවුරුම් දීලා පස්සේ මාස 03 ක් මාස 06 ක් ඒ ගොල්ලොන්ට දැන් ආමී එකේ පොලීස් අයට වගේ Training දෙනවලු. ඒ වගේ Training කරන්න තමා අර ඉඩම් ගත්තේ කියලා කිව්වේ.

ප්‍ර: දැන් මොන වගේ දේවල්වලටද Training කරන්නේ? මාව් පාස් කරන්න ද? මොනවට ද?

උ: ඒ ගොල්ලො ඒකේ ඒ ගොල්ලොන්ට අර පීඨ වගේ Training කරන්න තමා.

ප්‍ර: එතකොට ඒ ගොල්ලන්ට වෙඩි තියන්න ඒ වගේ දේවල් කරන්නත් Training එහෙම දීලා තිබුණ ද කියලා දන්නවද?

උ: තව ඒකේ හිටියා සාජිත් කියලා අබු නජර් කියලා එක්කෙනෙක්. එයාට කරාටි පුළුවන් කියලා කිව්වේ. ඊට පස්සේ එයයි සාදික් අබ්දුල් හක් කියලා එක්කෙනෙක් එයා සිරියා ගිහිල්ලා ඇවිල්ලා කියලා එයා එහෙ ගිහිල්ලා Training ගත්තා කියලා ඒ දෙන්න තියාගෙන තමයි ඒ ගොල්ලන් Training කරන්න හිටියේ කියලා කිව්වේ.

ප්‍ර: එතකොට ඔය කරුණු කොහොමද හාදියා දැනගත්තේ?

උ: ඊට පස්සේ සාරා අර ෆොටෝ විතරයි පෙන්නුවේ. ඊට පස්සේ මං සහරාන්ට කෝල් එකක් ගත්තා. ඊට පස්සේ කිව්වා පස්සේ ගන්න කියලා. මං ආපහු ගත්තා . ඔය ගොල්ලො ඉන්න තැනක් ද ඒ කියලා ඒක සාරා කිව්වේ මං දන්නේ නැහැ. බඩු ඔක්කොම අහුවෙලා තියෙන්නේ කියලා ඔව් කියලා කිව්වේ.

ප්‍ර: මොනවද මේ බඩු අහුවෙලා තියෙන්නේ?

උ: ඒ එයාගේ අරගත්ත ඇසිඩ් කියන ඒවා. ඒ වගේ එයාගේ ඇඳුම් තිබ්බා.

ප්‍ර: කාගේ ඇඳුම්ද?

උ: සහරාන්ගේ.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ සහරාන් එතැන ඉඳලා තිබ්බා?

උ: ඔව්. ඊට පස්සේ මං ඇහුවා එයාට එයා කිව්වා අතන්ට තමයි අපි Training යන්න හිටියේ කියලා. ඒකේ ඊට ඉස්සෙල්ලා එයා Training යන්න කලින් එයා මට කිව්වා මී පැණි අරන් දෙන්න කියලා.

ප්‍ර: මොකටද මී පැණි?

උ: මං ඇහුවා එයාට. එයාට ලීටර් 10 විතර අරන් දෙන්න කියලා දහඅටදාහක් මට දුන්නා. මං මී පැණි මොකටද ඇහුවම එයා කිව්වේ කොළඹ කට්ටියට හොඳ මී පැණි හම්බවෙන් නෑ. කියලා. ඒ නිසා ඒ ගොල්ලොන්ට දෙන්න තමා කියලා එයා මට මුලින් කිව්වේ.

ප්‍ර: එතකොට දැන් ඔහොම හොඳ මී පැණි අරන් දෙන්න කියලා රු 18000 ක් හාදියාට දෙන කොට හාදියා කොහේද හිටියේ?

උ: මං එතකොට අම්මලාගේ ගෙදර හිටියේ.

ප්‍ර: කැකුණගොල්ලේ හිටියේ?

උ: ඔව්. ඒ සල්ලි දුන්නේ 2018 දෙසැම්බර් මාසේ.

ප්‍ර: ඉතින් සහරාන්ට ඔය වගේ මී පැණි ගන්න දෙන්න රු. 18000 ක් ඒ වගේ සල්ලි කොහෙන්ද?

උ: ඒ කලින් මං ඇහුවා ඔයාට කවුද සල්ලි දෙන්නේ කියලා. ඊට පස්සේ මට කිව්වේ නැහැ කවුද දෙන්නේ කියලා. මං එයාට අහලා තියෙනවා සල්ලි කොහෙන්ද වැන් ගත්තේ කොහොමද සල්ලි ඔයාට හම්බ වුණේ කියලා. එවැනි විස්තර මං කොහේද ඉන්නේ කියලා විස්තර ඔයා අහන්න එපා කියලා මට කියලා තිබුණා කියලා එයා කිව්වේ. ඒ නිසා මං ආපහු එයාගෙන් අහන්නේ නැහැ.

ප්‍ර: ඒවා ඇහුවේ නැහැ. හැබැයි ඉතිං සල්ලි දුන්නා දැන් ?

උ: සල්ලි 18000 ක් දුන්නා.

ප්‍ර: එතකොට මී පැණි ගෙනත් දුන්නද?

උ: ඊට පස්සේ මං order කරලා කලින් ඉඳලා කවුරු හරි ඉල්ලුවොත් order කරලා කට්ටියට දෙනවා. ඒ වගේ තමා එයාට ලීටර් 10 ක් විතර මං order කරලා ගත්තේ. ඊට පස්සේ එයා බුදුපිළිම case එකෙන් පස්සේ අනිද්දා ඒ කියන්නේ 2018 දෙසැම්බර් මාසේ 23 , 24 විතර මාවනැල්ලට ගියේ. ආබදීන් කියලා අබු ඉනා කියලා එයාට අබු නමක් කියනවා. එයාගේ ගෙදරින් ගියා. ඒ ගෙදර ගිහිල්ලා අනිත් දවසේ එනකොට තමා ඇවිල්ලා එයා ගෙදර ඉන්න වෙලාව තමයි පාන්දර call එකක් ආවේ සහරාන්ට.

ප්‍ර: කාගෙන්ද ආවේ?

උ: කාගෙන්ද කියලා මං දැක්කේ නැහැ. එයා කතා කරා. මේක තමයි ප්‍රශ්නය කියලා. මොන ප්‍රශ්නය කියලා සහරාන් ඇහුවේ. බුදුපිළිම කඩලා එක්කෙනෙක් අහුවෙලා කියලා කිව්වේ. ඔයගොල්ලොන්ට කවුද කිව්වේ කඩන්න කියලා. කාටද තිරණ ගත්තේ කියලා සහරාන් ඒ

FAIR COMMENT BY JEZEEM

ගොල්ලොන්ගෙන් ඇහුවා. දැන් කරන්න දෙයක් නැහැ කියලා සහරාන්ට ෂේක් කියලා කතා කරා. මටත් ඇහුණා එයා කියන දේ. ඊට පස්සේ සාරා ඒ වෙලාවේම ටක් ගාලා මගේ ඇඳුම් ටික ලෑස්ති කරලා දෙන්න මං යනවා ප්‍රශ්නයක් කියලා. ඊට පස්සේ එයා එක්කෙනෙක් ආවා බයික් එකේ. මුහුණ වහගෙන හෙල්මට් එකෙන්. ඇස් විතරයි පේන්නේ. එයත් එක්ක 09.30 ට විතර සහරාන් ගියා අපේ ගෙදර ඉඳලා.

ප්‍ර: එතකොට අර මී පැණි මොකටද දැන්?

උ: ඊට පස්සේ වනාතවිල්ලුව case එක අහුවුණාට පස්සේ තමයි එයා කිව්වේ. ඒ ගත්තේ Training වලට යන්න තමා කියලා . ඒකේ පාවිච්චි කරන ඒ කෑම වලට වඩා මී පැණි රට ඉඳි සෑම් සම් ඕන කියලා ඒවා තමයි එයා කිව්වේ.

ප්‍ර: ඒ අනුව තමයි මේ හාදියා ගිහිල්ලා මේවා ගත්තේ?

උ: ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: හාදියා මේ ප්‍රශ්නයක් තියෙනවා අහන්න. අර වනාතවිල්ලුවේ හම්බවුණා කියලා කිව්ව නේද FB එකේ ඔයා දැක්ක නේද පුපුරන ද්‍රව්‍ය එහෙම තිබ්බා කියලා සාරගේ FB එකෙන් දැක්කා කියලා කිව්වනේ?

උ: ඔව්.

ප්‍ර: ඒවා කෙහෙන්ද ගත්තේ කියලා ඔයාට කොයි වෙලාවක හරි දැනගන්න ලැබුණද?

උ: ඊට පස්සේ මං ඒවා දැනගත්තේ.

ප්‍ර: කොහෙන්ද ඒවා අරන් තියෙන්නේ?

උ: ඒ කියන්නේ හාරිස්කන් අබු නජ්ජාර් කියල එක්කෙනෙක් තමා ඒ වෙඩි බෙහෙත් එකේ අරන් දීලා තියෙන්නේ.

ප්‍ර: කෙහෙන්ද අරන් දීලා තියෙන්නේ?

උ: ඒ කොළඹට කොහේ හරි එයාට යන්න කියලා තිබුණේ . ඒ කොන්ඩ ඔක්කොම shave කරලා රැවුල ඔක්කොම කපලා තමයි යන්න කියලා තිබුණේ.

ප්‍ර: ඒ කියන්නේ අඳුරගන්න බැරි වෙන්න?

උ: ඔව්. ඒ වගේ.

ප්‍ර: කොළඹ කොහෙන්ද අරන් තියෙන්නේ?

උ: කොහෙන්ද කියලා මං දන්නේ නැහැ. ඒ හරිස්කාන් තමා වෙඩි බෙහෙත් අරන් දුන්නේ.

ප්‍ර: එයාගේ නම මොකද්ද ?

උ: එයාට අබු නම අබු නජ්ජාර්.

ප්‍ර: ඇත්ත නම මොකද්ද?

FAIR COMMENT — BY JEZEEM —

උ: හරිස්කාන්.

ප්‍ර: එතකොට එයාද ඔක්කෝම බඩු ටික අරන් තියෙන්නේ?

උ: එයා විතරක් නෙමේ. තව කට්ටියත් අරන් දීලාතිබෙනවා.

ප්‍ර: කවුද ඒ අනිත් අය මතක ද?

උ: ඩෙටනේටර් ඒවා ගත්තේ ඒවා අරන් දීලා තිබුණේ ෆිර්දෙරස් එයා .

ප්‍ර: එයාට අබු නමක් තිබ්බ ද?

උ: තිබ්බා මට මතක නැහැ.

ප්‍ර: වෙන කවුද ඒකට සම්බන්ධ වුණේ?

උ: ඊට පස්සේ තව එක්කෙනෙක් හිටියා ඒ කාත්තන්කුඩියේ එයත් රත්තරන් බඩු හදන එක්කෙනෙක් තමා.

ප්‍ර: එයාගේ නම මොකද්ද මතක ද?

උ: ජෙම්සිත් කියල එක්කෙනෙක්.

ප්‍ර: එයාටත් අබු නමක් තිබ්බ ද?

උ: අබු නම දන්නේ නැහැ.

ප්‍ර: වෙන කවුද?

උ: ඒ වගේ ඒ තුන්දෙනා අනිත් ඒ කට්ටිය පොඩි පොඩි උදව් කර ඒ Training Camp එකට කෑම ජාති එක්කෙනෙක් දාලා තිබුණලු. ඒවා ගන්න.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: හාදියා යූරියා කෙහෙන්ද අරන් තියෙන්නේ ?

උ: යුරියා ගත්තේ 2019 මාර්තු 25 , 26 වගේ ඔට්ටමාවඩි වාලච්චේන පැත්තේ ඉඳන් තමා ගත්තේ.

ප්‍ර: දැන් අපි අබු කියන නම්වලට ගිහිල්ලා ඒක ඉවර කරමු . මම දැන් පින්තූරයක් පෙන්වනවා හාදියාට . බලන්නකෝ මෙයාව අඳුරනව ද කියලා?

උ: ඔව්.

ප්‍ර: එයා කවුද?

උ: එයාට තමයි මුලින් අබුබරා කියලා කියන්නේ.

ප්‍ර: එකොට අබුබරාගේ නම මොකද්ද?

උ: එයාගේ නම ඊබ්‍රාහීම් ඉල්හාම්.

ප්‍ර: එයා තමයි අර කැකුණගොල්ලේ ඉඳලා කුරුණෑගලට සාරා ගෙනාවට පස්සේ හාදියාව VOG හම්බ වෙන්න යන්න ඕන කියලා එදා අර රතු කාර් එකක ඇවිල්ලා අරගෙන ගියේ නේද?

උ: ඒ කියන්නේ කුරුණෑගලට ආවනේ අපේ ගෙදරට. ඒ ඇවිල්ලා හිටියේ පස්යාල ගිරිඋල්ල පාරට තමයි එයා කාර් එකේ ඇවිල්ලා හිටියේ.

ප්‍ර: එයා තමයි ඒ නේද?

උ: ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට මම තව පින්තූරයක් පෙන්වනවා හාදියාට. මෙයාව කලින් දැකලා තියෙනවද?

උ: මම කලින් දැකලා නැහැ. පස්සේ තමයි එයා දැකලා තියෙන්නේ.

ප්‍ර: කොයි වෙලාවේද දැක්කේ එයාව?

උ: එයාව දැකලා තියෙන්නේ මේ CID එකට ආවට පස්සේ තමා මෙයාව දැකලා තියෙන්නේ.

ප්‍ර: CID එකට ආවට පස්සේ කොහොමද දැක්කේ?

උ: ඒ කියන්නේ ඒ ගොල්ලො පින්තූරය පෙන්නුවා. මෙයාව කවුද කියලා හඳුනනවාද කියලා.

ප්‍ර: එතකොට තමයි දැක්කේ?

උ: ඔව්.

ප්‍ර: මේ පින්තූරයේ ඉන්න කෙනාව දැකලා තියෙනව ද කලින්?

උ: නැහැ.

ප්‍ර: මෙයාව නම් දැකලා ඇති නේද?

උ: ඔව්.

ප්‍ර: කවුද ඒ?

උ: එයාට තමයි අබු අබ්දුල්ලා කියන්නේ.

ප්‍ර: අබු අබ්දුල්ලගේ නම මොකද්ද?

උ: අසාම් මුබාරක්.

ස්වාමීනි සාක්ෂිකාරිය විසින් හඳුනාගන්නා ලද එම ඡායාරූපය C 400 C ලෙස ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: මේ ඡායාරූපයේ ඉන්න කෙනා?

උ: කස්තුන්.

ප්‍ර: දැන් හාදියා කිව්වා සාරාගේ මහත්මයගේ නම කස්තුන් කියලා?

උ: ඔව්.

ප්‍ර: ඒ වගේම හාදියාගේ ගෙදර සාරා සහ කස්තුන් පදිංචිවෙලා හිටියා කියලා කිව්වා යම් කාලෙක?

උ: ඔව්.

ප්‍ර: ඒ කියන කස්තුනුයි මේ photograph එකේ පෙන්වන එක්කෙනයි දෙන්නම එක්කෙනාද?

උ: එක්කෙනා.

ප්‍ර: එතකොට කස්තුන්ට කියන අබු නම මොකද්ද?

උ: අබු මොහොමඩ් .

ස්වාමීනි සාක්ෂිකාරිය විසින් හඳුනාගන්නා ලද එම ඡායාරූපය දැනටමත් C 400 A ලෙස ලකුණු කොට ඉදිරිපත් කර තිබෙනවා.

ප්‍ර: මේ තැනැත්තාව දැකලා තියෙනව ද කලින්?

උ: නැහැ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තවත් ඡායාරූපයක් සාක්ෂිකාරියගේ අවධානයට යොමු කරනවා ස්වාමීනි.

ප්‍ර: මේ තැනැත්තාව?

උ: ආසාද්.

ප්‍ර: එයාගේ අබු නම මොකද්ද?

උ: අබු මුක්තාර්.

ස්වාමීනි සාක්ෂිකාරිය විසින් හඳුනාගනු ලැබූ එම ඡායාරූපය C 400 D වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

ප්‍ර: මේ ඡායාරූපයේ දැක්වෙන කාන්තාව දැකලා තියෙනව ද කලින් ?

උ: නැහැ.

ප්‍ර: ඔබ හිටපු යම් ස්ථානයකට ඇය ඇවිල්ලා තියෙනව ද?

උ: නැහැ.

ප්‍ර: හාදියා නියාස්ව දන්නවද?

උ: නියාස් දෙන්නෙක් ඉන්නවා.

ප්‍ර: එක නියාස් කෙනෙක් කියන්න එයා කවුද කියලා?

උ: එක්කෙනෙක් සහරාන්ගේ යාළු එක්කෙනෙක් ඉන්නවා නියාස් කියලා.

ප්‍ර: සහරාන්ගේ යාළු නියාස් කොහේද පදිංචි වෙලා හිටියේ?

උ: එයා කාත්තන්කුඩියේ.

ප්‍ර: එයා තාම ඉන්නව ද ජීවතුන් අතර?

උ: නැහැ.

ප්‍ර: එයා මැරුණද?

උ: මැරුණා.

ප්‍ර: එයා මැරුණේ මොනව වෙලාද?

උ: එයා සයින්දමර්දු blast එකේදී .

ප්‍ර: සයින්දමර්දු පිපිරීමෙන් මැරිච්ච නියාස් තමයි සහරාන්ගේ යාළුවා?

උ: ඔව්.

ප්‍ර: එයාට අබු නමක් තිබුණ ද?

උ: ඒ නම මට මතක නැහැ.

ප්‍ර: එතකොට අනිත් නියාස්?

උ: ඒ නියාස් සහරාන්ගේ පළවැනි නංගිගේ Husband .

ප්‍ර: එයාට අබු නමක් එහෙම තියෙනව ද, එයා සංවිධානයේ ඉන්නවද?

උ: එයාට නැහැ කියලා මං දන්නේ. එයා ගියාද කියලා දන්නේ නැහැ.

ප්‍ර: ඒ ගැන තොරතුරු දන්නේ නැහැ හාදියා?

උ: නැහැ.

ප්‍ර: ආබ්දීන් කියලා කියන්නේ කවුද හාදියා?

උ: එයා මාවනැල්ලේ එක්කෙනා. එයාට අබු නම අබු ඉනා කියලා කියන්නේ.

ප්‍ර: ඒ අබු ඉනාගේ ගෙදරට සහරානුයි හාදියයි දවසක ගියාද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ගිහින් තියෙනවා.

ප්‍ර: ඇයි ඒ?

උ: එයාගේ ගෙදරින් තිබ්බ අර දෙපාරක් විතර ගිහින් තිබෙනවා.

ප්‍ර: මොකටද ඒ ගියේ? ඒ ගොල්ලො නෑයෝද?

උ: නෑයෝ නෙමේ . සහරාන්ට එන්න කියලා මටත් කිව්වා යන් කියලා. ඊට පස්සේ මං ගියා.

ප්‍ර: එතකොට සහරාන් හාදියට කිව්වා හින්දා තමයි මේ අබු ඉනාගේ ගෙදරට හාදියා ගියේ?

උ: ඔව්.

ප්‍ර: මොකටද ගිහිල්ලා තිබුණේ?

උ: එයාගේ වෑන් එකෙන් තමයි ගිහිල්ලා තිබුණේ.

ප්‍ර: කාගේ වෑන් එකේද?

උ: සහරාන්ගේ.

ප්‍ර: ගියාට පස්සේ මොකද වුණේ?

උ: ගිහිල්ලා එක දවසක් හිටියා ආපහු ආවා අම්මලගේ ගෙදරට.

ප්‍ර: ඇයි එහෙම ගියේ?

උ: ඒ ඉස්සෙල්ලා එයාගේ යාළුවා කියලා තමයි මාව එක්කන් ගියේ. එක දවසක් ඒ ගෙදර නතර වෙලා හිටියා. අනිද්දා ආපහු අම්මලාගේ කැකුණගොල්ලට ආවේ. ආපහු 2018 December මාසේ 24, 25 ඒ දවස්වල මං ගියා. යන්න කලින් සහරාන් මට කියලා තිබුණා එක්කෙනෙක් ඉන්නවා කියලා ගැහැණු එක්කෙනෙක්. එයාගේ නම රිෆ්කා. මං එයාව කලින් අඳුරලා තියෙනවා. ඊට පස්සේ එයා කිව්වා එයාගේ Husband එයායි පොඩි ප්‍රශ්නයක් කියලා. ඒ නිසා ආබ්දීන් කියල එක්කෙනෙක් සහරාන්ට කියලා තියෙනවලු එයාගේ පවුල් ප්‍රශ්න හින්දා එයා දික්කසාද කරනවා කියලා එයාව. එහෙම කරොත් සහරාන්ට කියලා ඔයා එයාව බඳින්න කැමතිද කියලා.

ප්‍ර: කවුද මේ අහලා තියෙන්නේ?

උ: ආබ්දීන්. ඊට පස්සේ සහරාන් කිව්වා කැමති කියලා මං දැන් කියන්න බැහැ. ඒ ගොල්ලෝ දික්කසාද ඔක්කෝම දෙන්නම අයින් වුණාට පස්සේ මං හරි නැත්නම් වෙන කවුරු හරි මං එයාට බඳින්න කවුරු හරි Set කරලා දෙන්නම් කියලා. ඊට පස්සේ සහරාන් ඒ විස්තරය මටත් කිව්වා. මෙහෙමයි රිෆ්කාගේ Husband බොනවා එයාට වෙන affair තියෙනවා කියලා. ඒ හින්දා ආබ්දීන් කියලා එක්කෙනෙක් කිව්වලු රිෆ්කා කියන කෙනාව බඳිනවද කියලා . ඔයා කැමති ද කියලා මගෙන් ඇහුවා. මං කිව්වා ඔයා කැමතිනම් බඳින්න කියලා. මං කිව්වා මටත් අහන්න ඕනෙ ඔයාගේ අම්මලා තාත්තගෙන් අහන්න කියලා. අම්මලා තාත්තටත් ඇහුවේ නැහැ. ඊට පස්සේ කිව්වා මං ඉන්නම් ඒ ගෙදරට යන්න කියලා. ඒ නිසා තමයි 2018 දෙසැම්බර් මාසේ 24 ආබ්දීන්ලගේ ගෙදර ගියේ. ගියපු

Proceedings Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වෙලාවේ තමා අර රිෂ්කා කියලා එක්කෙනා එයාගේ ගෙදර ඇවිල්ලා හිටියා. ඊට පස්සේ එයා මට කතා කරා.

ප්‍ර: කවුද කතා කරේ?

උ: රිෂ්කා කියන කෙනා. මෙහෙම තමයි ප්‍රශ්නය කියලා. එයා Divorce ඉල්ලුවලු ඒකට එයා අත්සන් කරන්නේ නැහැ කියලා කිව්වේ. Registrar ගාවට ගියාලු. ඊට පස්සේ සහරාන්ට මෙහෙම තමයි ප්‍රශ්නය කියලා එයා කිව්ව ප්‍රශ්නය. ඊට පස්සේ සහරාන් කිව්වා මෙහෙම තමා ප්‍රශ්න ඔක්කෝම ඉවර වුණොත් ඔයා කැමැත්තෙන් මං බලෙන් කරන්නේ නැහැ. ඔයාගේ කැමැත්තෙන් එයාව Divorce කරලා ආවාට පස්සේ එක්කෝ මං නැත්නම් වෙන කවුරු හරි බඳින්න එක්කෙනෙක් බලලා දෙන්නම් කියලා කිව්වේ.

ප්‍ර: ඒකට තමයි එහෙ ගියේ නේද?

උ: ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: හාදියා මට තව ප්‍රශ්නයක් තියෙනවා අහන්න. අර වනාතවිල්ලුවේ හොයාගත්ත නේද ඩෙටනේටර් . ඔයාට දැනගන්න ලැබුණද ඒක කොහෙන්ද ගත්තේ කියලා?

උ: මම පස්සේ ඒවා දැනගත්තේ.

ප්‍ර: කොහෙන්ද ඒවා අරගෙන තියෙන්නේ?

උ: ඒ ගත්තේ පොලිස් කියලා එක්කෙනක්ට කියලා තමා ඒ බඩු ගත්තේ.

ප්‍ර: එයාගේ නම එහෙම කියලද දන්නේ?

උ: ඒ පොලිස් කියලා කතා කරනවා එයාගේ නම මට මතක නැහැ. ඒ ගත්තේ Eastern side එකෙන් තමයි.

ප්‍ර: නැගෙනහිර පළාතෙන්?

උ: ඔව්. ඒකේ කතා කරලා එයාට ගන්න දාලා තිබුණා ෆිර්දෝස් තමා. එයා තමා එයාට කතා කරලා ඩෙටනේටර් ගත්තේ. ඊට කලින් රිල්වාන්ට ඉස්සරවෙලා ඒ කියන්නේ LTTE කාලේ ඊට පස්සේ ඒ ගොල්ලොන්ට T55 වගේ වෙපන් තිබ්බා. ඒවා යකඩ වෙලා මොකක් හරි කියලා ඒවා දීලා අලුත් ඒවා ගන්නේ. ඊට පස්සේ රිල්වාන් එයාගේ ගෙදරින් ඉස්සෙල්ලා තිබුණ තැනක වලදාල ඒකේ තිබුණේ. පස්සේ ආමී එකෙන් ඔක්කොම චෙක් කරනවා කියලා ඒවා අරගෙන එයා වැඩ කරන කඩේ කුලියට ගත්ත ඒ ඉන්න බොස්ගේ කඩේට උඩ තට්ටුවේ තමයි තියාගෙන හිටියේ. ඊට පස්සේ ෆිර්දෝස් කියන එක්කෙනෙක්ට තමයි කතා කරලා ඒවා විකුණලා තියෙන්නේ. ඊට පස්සේ 2016 නොවැම්බර් මාසේ හරි දෙසැම්බර් හරි මතක හැටියට සහරාන්ට ගෙදරට සල්ලි තිබුණේ. ඊට

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පස්සේ ලක්ෂ 10 ක් විතර සහරාන් කිව්වා මේක අල්මාරියෙන් දාන්න කියලා.

ප්‍ර: කවුද ඒ සල්ලි සහරාන්ට දුන්නේ කියලා දන්නවද?

උ: ඒ කියන්නේ පස්සේ තමා කිව්වේ . කොළඹ එක්කෙනෙක් දුන්නා කියලා.

ප්‍ර: නම කිව්වේ නැද්ද?

උ: ඒ වෙලාවේ නම කිව්වේ නැහැ.

ප්‍ර: පස්සේ හරි කිව්ව ද?

උ: පස්සේ දැනගත්තා.

ප්‍ර: කවුද දුන්නේ?

උ: අබුබරා තමයි ඒ සල්ලි දුන්නේ කියලා.

ප්‍ර: ඉතුරු ටික කියන්න?

උ: ඊට පස්සේ ඒ සහරාන් එතකොට පල්ලියේ හිටියේ NTJ පල්ලියේ එයා Call කරලා කිව්වේ රිල්වාන් එනවා ගෙදරට. 60000 ක් නැත්නම් 75000 ක් හරි ඔයා ගණන් කරලා එයාට දෙන්න කියලා. මං 75000 ක් ගණන් කරලා එයාට දුන්නා. එයා ආවා දවල් වෙලාවට. පස්සේ එදා රෑ ඇවිල්ලා අයියයි මල්ලි දෙන්නම රහසින් කත කරා.

ප්‍ර: අයියයි මල්ලි කියන්නේ කවුද හාදියා?

උ: සහරානුයි, රිල්වානුයි. ඊට පස්සේ ඒ දෙන්නම කතා කරා මේ තමයි ෆිර්දෝස්ට සල්ලි දීලා තියෙනවා බඩු ගන්න කියලා. ඊට පස්සේ ඒකෙන් ගොඩාක් දවසකින් පස්සේ 2017 අලියාර් සිද්ධියෙන් පස්සේ ඔය දෙසැම්බර් මාසයේ ඔය 2017 ඒ මාසවලින් තමයි ෆිර්දෝස්ට දුන්න සල්ලිවලට ගත්ත බඩු ඒවා හරියන්නේ නැහැ කියලා ආපහු ලක්ෂයක් හරි දෙන්නම් මාරු කරන්න කියලා. ඊට පස්සේ දීලා තමා ඒ බඩු ආපහු ගත්තා කියලා. ඒ බඩු මොනවද කියලා ඒ වෙලාවේ මං දන්නේ නැහැ. ඊට පස්සේ තමා 2018 සහරාන් කතා කරපු වෙලාවේ තමයි දැනගත්තේ පොලිසියේ ඉඳලා ෆිර්දෝස්ට තමා වෙපන් ඒවා මාරු කරලා තියෙනවා කියලා ඒවටයි ඩෙටනේටර් දහදාහක් විතර ගන්න ඕන කියලා. ඒ ගන්න ෆිර්දෝස්ට තමා කියලා තියෙන්නේ අර පොලිසියෙන් කතා කරලා ගන්න කියලා. ඊට පස්සේ පොලිසියෙන් ඉල්ලුවලු ලක්ෂ තුනහමාරක හරි හතරක් දෙන්න කියලා. ඊට පස්සේ ආපහු සහරාන් රිල්වාන්ට කියලා තියෙනවා සල්ලි දෙන්න ඒවා ගන්න කියලා. ඊට පස්සේ කියද ගත්තේ කියලා මං දන්නෙත් නැහැ. තව සල්ලි එව්වා.

ප්‍ර: ඔබට මතකයක් තියෙනව ද මේ පොලිස් කියන මනුස්සයා ඇයි එයාට ඒ වගේ නමක් කියන්නේ කියලා?

උ: ඒ ගොල්ලො කිව්වේ පොලිස් මාර්ගයෙන් තමා ඒවා ගන්න ඕන කියලා කතා කරලා තිබෙන්නේ.

ප්‍ර: ඒ කියන්නේ එක්කෙනෙක් ගැන නෙවෙයි. පොලිසියේ ඉන්න කාගෙන් හරි ගන්න ඕන කියලා?

FAIR COMMENT — BY JEZEEM —

ඌ: ඔව්. ඊට පස්සේ ෆිර්දෝස්ට කියන එක්කෙනෙක්ට පොලිස් එක්කෙනා තමා සම්බන්ධයක් තිබුණා කියලා දැනගන්න හම්බවුණේ.

ප්‍ර: ඒ පොලිසියේ හිටපු සම්බන්ධකම තියෙන එක්කෙනාගේ නම එහෙම දැනගත්තද පස්සේ වෙලාවක?

ඌ: පස්සේ නමක් කිව්වා. මට ඒ නම මතක නැහැ.

ප්‍ර: එතකොට ඩෙටනේටර් එහෙම ගත්තේ 2016 විතරද?

ඌ: 2018 ඩෙටනේටර් ගත්තේ ඒවා.

ප්‍ර: 2018 ගත්තේ නේ?

ඌ: ඔව්.

ප්‍ර: අර නැගෙනහිර පළාතෙන්?

ඌ: ඔව්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: හාදියා පොලිස් ෆයිස්ව දන්නවද?

ඌ: දන්නවා මං.

ප්‍ර: කොහොමද දන්නේ?

ඌ: එයා කාත්තන්කුඩියේ කියලා.

ප්‍ර: එයා සහරාන් එක්ක ගොඩාක් සම්බන්ධකම් තිබුණ ද?

ඌ: ඒ පොලිස් ෆයිස් කියන්නේ එයා LTTE කාලේ හිටියේ. ඊට පස්සේ මැරිලා එයා රට ගියාලු පැනලා ගියා කියලා තමා කිව්වේ. ඊට පස්සේ එයා ලන්ඩන් එකේ හිටියලු. ඊට පස්සේ 2017/2018 පස්සේ මේ ගොල්ලො FB වලින් අර Video, Article ඒවා දානවා. ඒකට එයා against කියලා නියාස් එතකොට ඩුබායි හිටියේ. එයා සහරාන් එක්ක කතාබහ කරනවා.

ප්‍ර: කවුද හිටියේ ඩුබායිවල?

ඌ: නියාස් හිටියේ. ඊට පස්සේ නියාස් තමා ලන්ඩන් ෆායිස් මේ රටේ එනවා කියලා ලංකාවට . ඊට පස්සේ සහරාන් ඒ වෙලාවේ කතා කරේ ඒ ආපුවාහම එයාව දාමු කියලා. ඒ වෙලාවේ ඒ ගොල්ලො ෆෝන් එකෙන් කතා කරේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: කවුද ෆෝන් එකෙන් කතා කරේ හාදියා?

ඌ: සහරානුයි නියාස්

ප්‍ර: පොලිස් ෆායිස් කොයිහරි වෙලාවක කතා කරලා තියෙනවද?

ඌ: මං දන්නේ නැහැ කතා කරලා තියෙනවද කියලා. කලින් සහරාන් පොලිස් ෆායිස් එක්ක කතා කරලා තියෙනවා කියලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට අර ඉස්සෙල්ලා ඔයාගෙන් අහපු ප්‍රශ්නයට ඔයා කිව්වනේ අර ගෙදරක වැළලුවා කියලා මොකක් හරි? තුවක්කුවක්ද වැළලුවේ?

උ: ඔව්. ඒ LTTE කාලේ තිබුණු තුවක්කු කියලා කිව්වේ. මං බැඳලා 2009 ඒ අම්මලාගේ ගෙදර හිටියා. සහරාන්ගේ.

ප්‍ර: එතකොට මේ තුවක්කු තිබ්බේ සහරාන් ගාවද?

උ: ඒ තිබුණේ එයාගේ මල්ලි ගාව. රිල්වාන් ගාව.

ප්‍ර: කියක් විතර තිබ්බ ද?

උ: ඒ එකක් තිබුණා . ඒ ගොල්ලන් කිව්වා ඉස්සෙල්ලා ආරක්ෂාවට ඒවා ගත්ත කියලා. එහෙම කියලා ඒත් කිව්වා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: එතකොට මේ හාදියා දන්නවද ආමී මොහිදීන් ගැන?

උ: දන්නවා.

ප්‍ර: කොහොමද දන්නේ ?

උ: ඒ එයාව දන්නේ 2015, 2016 වගේ. එයා NTJ පල්ලියට යනවා එනවා. ඒ වෙලාවේ මං NTJ පල්ලියේ වම් පැත්තේ තමා කුලියට හිටියේ. ඒ වෙලාවේ තව එයාගේ ගෙදර තිබුණේ තුන්වැනි ගෙදර. ඒ නිසා මං එයාව දැකලා තියෙනවා.

ප්‍ර: එයා සහරාන්ගේ යාළුවෙක්ද?

උ: ඒ කියන්නේ පල්ලියට ඇවිල්ලා යනවා. එයත් එක්ක කතාබහ කරනවා.

ප්‍ර: මොහොමඩ් සෆ්රාන් දන්නවද ගාල්ලේ එක්කෙනෙක්?

උ: ඔව්.

ප්‍ර: කොහොමද හම්බවෙලා තියෙන්නේ?

උ: එයා ඉස්සෙල්ලා මුලින් දැකලා තියෙන්නේ. එයා අපේ අක්කලාගේ ගෙදරින් බෝඩින් වෙලා ඉගෙන ගත්තේ කැකුණුගොල්ලේ. Science ඉගෙන ගත්තේ Bio. ඒකට බෝඩින් වෙලා හිටියා. එතකොට අපේ ගෙදරින් බෝඩින් Boys ලා හිටියා.ඒ ගොල්ලොත් එක්ක ඇවිල්ලා කතා කරනවා. එයා දන්නවා සෆ්රාන් ගාල්ලේ එක්කෙනා කියලා.

ප්‍ර: එතකොට කොහොමද හම්බවුණේ සහරාන්ට?

උ: ඊට පස්සේ 2016 කාත්තන්කුඩියට ඇවිල්ලා හිටියා. ඇවිල්ලා NTJ පල්ලියේ කතා කරලා ඊට පස්සේ රෑ කෑම ලෑස්ති කරන්න කියලා සාරා මටත් කිව්වා. මං ඇහුවා එයාට කවුද එන්නේ කියලා රෑට. නැහැ නැහැ එක්කෙනෙක් ගාල්ලෙ එක් කෙනෙක් ඇවිල්ලා හිටියා. මං එයාව අඳුරලා තියෙනවා. මං කිව්වා මෙයා සෆ්රාන් කියලා. ඔව් කියලා එයා කිව්වේ.

ප්‍ර: අබු උමර්ව දන්නව ද?

උ: ඔව්.

ප්‍ර: කොහොමද දන්නේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඒ මාවනැල්ල බුදුපිළිමේ එයා තමා

ප්‍ර: උමෙයිර් මොහොමඩ් දන්නවද?

උ: නම හරියට කියන්න.

ප්‍ර: උමෙයිර් මොහොමඩ්. එහෙනම් කියන්න අබු උමර්? මාවනැල්ලේ එක්කෙනා?

උ: ඔව්. මාවනැල්ලේ එක්කෙනා.

ප්‍ර: හාදියා දන්නව ද මිනුඩීන්ව? දෙහිවල එක්කෙනෙක්?

උ: නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: හාදියා අබු හම්සර් කියල නමක් අහලා තියෙනවද?

උ: අහලා තියෙනවා.

ප්‍ර: අබු හම්සර් කියල නමක් අහලා තියෙනවා?

උ: ඔව්.

ප්‍ර: එයාගේ ඇත්ත නම අහලා තියෙනව ද මතකයක් තියෙනව ද ?

උ: ඒ ඇත්ත නම මතක නැහැ දැන්. මං අබු හම්සර් කියලා කතා කරනවා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: මිල්හාන් ?

උ: ඔව් දන්නවා.

ප්‍ර: මිල්හාන්ව කොහොමද දන්නේ?

උ: එයා කාත්තන්කුඩියේ.

ප්‍ර: එයා මොනව කරන එක්කෙනෙක් ද හාදියා?

උ: එයා MLT කියලා Course එක ඉවර කරලා හිටියා. ඊට පස්සේ රට ගියා එයා.

ප්‍ර: මොන රටේද කටාර්ද?

උ: ඒ මට මතකයේ නැහැ. ඊට පස්සේ ලංකාවට ආවා 2017. ඇවිල්ලා නවුෆර්ලගේ ගෙදර හිටියා. ඊට පස්සේ දවස් දෙකකින් පස්සේ සහරාන් ඇවිල්ලා හිටියා. නවුෆර්ලාගේ ගෙදර. ඒගොල්ලො තවත් කට්ටිය ඇවිල්ලා හිටියා කතා කරලා. ඊට පස්සේ සහරාන් ගෙදරට ආවා. අපේ අම්මලාගේ ගෙදරට. ඇවිල්ලා තමා නවුෆර් එක්ක කතා කරේ මිල්හාන් ගියාද කියලා. ඊට පස්සේ නැහැ කියලත් කිව්වා තව.

ප්‍ර: එතකොට මිල්හාන් ගොඩක් කාලයක් 2019 ලංකාවේ හිටියද?

උ: එයා 2017 ඉඳලා දිගටම ලංකාවේ තමා හිටියේ.

ප්‍ර: එතකොට සහරාන්ව හම්බුවෙන්න එහෙම ඇවිල්ලා තියෙනවද?

උ: ඊට පස්සේ සහරානුත් එක්ක තමයි එයා හිටියේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: සහරානුත් එක්ක තමයි මිල්හාන් හිටියේ?

උ: ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: හාදියා අහලා තියෙනව ද මේ රේඩියෝ Channel එකක් රිෂාලා FM කියලා?

උ: ඔව් .

ප්‍ර: කවුද ඒක කෙරුවේ හාදියා?

උ: ඒකේ කාත්තන්කුඩියේ නව කාත්තන්කුඩි එකේ නජීම් කියලා එක්කෙනෙක් ඉන්නවා එයා තමා ඒක කරන්නේ.

ප්‍ර: වෙන කවුරුත් නජීම් එක්ක ඒක කෙරුවද?

උ: නජීම් එක්ක තව කට්ටිය Team එකක් තියෙනවා.

ප්‍ර: ඒකේ මොනවද හුහක් කියන්නේ?

උ: ඒ කියන්නේ ඉස්ලාමික් අර කාසිදා කියලා සින්දු වගයක් ඒවා දානවා. සාහරාන් දේශනාවක් මවුලවීලගේ දේශනාවක් තියෙනවා.

ප්‍ර: සහරාන්ගේ දේශනාත් ඒකේ ගියාද?

උ: ඒක මට මතකයේ නැහැ. එයාගේ ඒවා වැඩිය දාලා නැහැ ඒකේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: හාදියා දන්නවාද 2017 අවුරුද්දේ දී හුස්නි මුබාරක් කියලා එක්කෙනෙක්ගේ wedding එකක් තිබ්බා?

උ: හුස්නි මුබාරක්ගේ wedding එක තිබ්බා කියලා එයාගේ FB , Messenger වලින් මං දැනගත්තේ.

ප්‍ර: මං මීට පස්සේ ගෙවල් වගයක පින්තූර වගයක් පෙන්වනවා. එතකොට කියන්න හාදියා ඒ ගෙවල් මීට ඉස්සෙල්ලා දැකල තියෙනවද දැකලා තියෙනව නම් කොහේ ද කියල. දැන් ඔය කැකුණගොල්ලෙන් පිටත්වෙලා ගියා කියලා කිව්වනේ 2019 පෙබරවාරි මාසේ 19 වැනිදා?

උ: 20.

ප්‍ර: එතකොට හාදියා ඊට පස්සේ තැන් තැන්වල නැවතුණා ද?

උ: ඔව්.

ප්‍ර: ඒ කියන්නේ ගෙවල්වලද නැවතුණේ?

උ: ඔව්. Rent එකට ගත්තේ ඒ ගෙවල්වල තමයි නැවතිලා හිටියේ.

ප්‍ර: එතකොට සහරානුයි හාදියායි විතරක් නෙවෙයි ද තනියම හිටියේ?

උ: නැහැ තව කට්ටිය හිටියා.

ප්‍ර: ඒ තැන්වලට ගියාට පස්සේ එළියට එහෙම ගියාද?

උ: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඒ පාරවල් එහෙම මතක ඇති නේ?

උ: මතකයේ තියෙනවා.

ප්‍ර: දැන් මම ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් හාදියා කිව්වා මේ 2019 පෙබරවාරි මාසේ 19 වැනිදා හාදියා ඒ වගේම සාරා ,ෆෙරෝසා, එතකොට හාදියගේ දරුවෝ දෙන්නා මේ ඔක්කෝමලා අන්තිමට අර රතුපාට කාර් එකේ අබුබරාගේ නේ?

උ: ඔව්.

ප්‍ර: අබුබරාගේ රතුපාට කාර් එකේ ඒ වාහනයට නැගලා ගියා කියලා කිව්වනේ?

උ: ඔව්.

ප්‍ර: කොහාටද ගියේ හාදියා ?

උ: කටුවාපිටිය ගෙදරට.

ප්‍ර: එතකොට අපි දැන් එක තැනක් පෙන්වනවා . එතැන හාදියා මීට ඉස්සෙල්ලා දැකලා තියෙනව නම් කියන්න. මේ ඇවිල්ලා CCTV footage පෙන්වන්නේ ඇවිල්ලා. හාදියා ඔය පාර දැකලා තියෙනව ද ගිහිල්ලා තියෙනව ද ඔය පාරේ කලින්? ඇතුළට යන්න ඕන අර කොනටම ? මතකද?

උ: ඒ කියන්නේ මේ වගේ පාර තමා. ඒ වගේ පාර තමා අර කටුවාපිටිය.

ප්‍ර: ඒ වගේ පාරක ගියේ කොහේට යන්න ද? මොන වගේ තැනැක්ද ඒක? නම මොකද්ද?

උ: ඩොන් ඩේවිඩ් මාවත කටුවාපිටිය.

ස්වාමීනි C 345 CD තැටියේ තිබෙන දර්ශන ඇය විසින් හඳුනාගනු ලබන බව ගෞරවයෙන් සඳහන් කරනවා.

ප්‍ර: එතකොට ඔය කටුවපිටියට ගෙදරට හාදියා ෆෙරෝසා සාරා හාදියාගේ දරුවෝ දෙන්නා යන කොට අබුබරාත් එක්ක කවුද ඒ ගෙදර හිටියේ?

උ: 2019 පෙබරවාරි 20 හවස 07.00 විතර ඇති යන කොට. ඒ ගෙදරින් අබ්දුල්ලා කියලා එක්කෙනෙක් තමයි දොර ඇරියේ ඉස්සෙල්ලා.

ප්‍ර: මට පොඩි ප්‍රශ්නයක් දැන් තියෙනවා. මොකද හාදියා කිව්වා කැකුණගොල්ලෙන් පිටත් වුණේ 2019 පෙබරවාරි 19 වැනිදා කියලා?

උ: නැහැ මිස් එහෙම කිව්වේ නැහැ. 2019 පෙබරවාරි 19 CID එකේ ඉඳලා ගෙදරට ආවේ කියලා කිව්වේ මං.

ප්‍ර: එදාම නෙවෙයිද පිටත් වුණේ?

උ: නැහැ මිස් අනිද්දා.

ප්‍ර: 20 වැනිදා පිටත් වුණේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට දැන් හාදියා කියන්නේ CID එක පෙබරවාරි 19 වැනිදා 2019 හාදියාගේ කැකුණුගොල්ල ගෙදරට ආවා. සහරාන් ගැන ප්‍රශ්න කෙරුවා එදා තමයි අන්සාර්ව පොලීසියෙන් අරගෙන ගියේ.

FAIR COMMENT BY JEZEEM

පි: ඔව්.

ප්‍ර: එතකොට 20 වැනිදා ඊට පහුවදා හාදියාව නැන්දම්මලාගේ ගෙදර ඉන්න කොට තමයි සාරා කෝල් එකක් දීලා ගෙන්න ගත්තේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට 20 වැනිදා තමයි දැන් මේ කියන දේවල් හාදියා කියන ඔක්කෝම සිදු වුණේ?

උ: ඔව්.

ප්‍ර: එතකොට කටුවාපිටිය ගෙදරට ගියෙත් 20 වැනිදා?

උ: 20 වැනිදා හවස 07.00 ට විතර.

ප්‍ර: ඒ වෙලාවේ අබ්දුල්ලා තමයි ගෙදර හිටියේ?

උ: ඔව්.

ප්‍ර: සහරාන් ආවාද ගෙදරට කොයි වෙලාවේ හරි?

උ: ඒ ආවේ එදා රෑ 11.30 ඒ වෙලාවට විතර ආවේ.

ප්‍ර: වෙන කවුරු හරි ඔය ගෙදරට ආවද?

උ: එයත් එක්ක ඒ අපි ඉස්සෙල්ලා අබුබරා කියල එක්කෙනෙක් බස්සලා එයා ගියා.

ප්‍ර: ඒ කියන්නේ හාදියාලාව බස්සලා අබුබරා ගියා?

උ: අබුබාරයි රිස්කාන් කියලා ඒ දෙන්නම තමා ගියේ. ගිහිල්ලා තමයි 11.30 ට විතර සහරාන් එක්කන් ආවේ.

ප්‍ර: ඒ කියන්නේ නැවතත් රිස්කාන් සහ අබුබරා සහරාන් එක්ක ආවද?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ සහරාන් කොච්චර දවසක් හිටිය ද ඔය ගෙදර?

උ: ඒ ඇවිල්ලා ආපහු උදේ එයා ගියා. ගිහිල්ලා එයාගේ ලැප්ටොප් බඩු ටික අරන් ආවා. අනිද්දා ඒ කියන්නේ 21 ආවේ හවස වෙලා වගේ. ඒ අරන් ඇවිල්ලා ඊට පස්සේ වෙන කෙහේවත් එයා ගියේ නැහැ. ඊට පස්සේ එයත් කිව්වා තව කට්ටිය එනවා පිරිමි අය කියලා කිව්වේ. ඒ ගෙදර පල්ලෙහා තට්ටුවේ කාමරයක් තිබුණා.

ප්‍ර: දැන් කොයි වෙලාවක හරි CCTV කැමරා එහෙම ඔය ගෙදරදි දැක්කද හාදියා?

උ: ඒ ගෙදරින් CCTV කැමරා තිබුණා කස්තුනුයි සාරා හිටිය කාමරේ.

ප්‍ර: ඒ කාමරේ කොහේද තිබ්බේ?

උ: ඒ පල්ලෙහා තට්ටුවේ. ඒ ගොල්ලො දෙවැනි කාමරේ. කුස්සිය පැත්තේ තියෙන්නේ පළවෙනි කාමරේ.

ප්‍ර: දැන් කොහොමද හාදියා දැනගත්තේ කස්තුන් සහ සාරා හිටිය කාමරේ CCTV කැමරා තිබුණා කියලා?

උ: මං ඒ කාමරේ යනවා එයාගේ කාමරේ ඇතුළේ. ඒ ගියපු වෙලාවට තමයි මං දැක්කේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඔය CCTV කැමරා ඒ කාමරේ තිබුණා කියලා හාදියා කිව්වාහම CCTV කැමරා කාමරේ හයි කරලා තිබුණ ද නැත්නම් මොකක් හරි ඇතුළේ තිබුණ ද?

උ: එහෙ බෑග් එක ඇතුළේ තිබුණා.

ප්‍ර: එතකොට දැන් ඇහුවේ නැද්ද මොකටද මේ CCTV කැමරා කියලා හාදියා?

උ: ඒ වෙලේ ඇහුවේ නැහැ. පස්සේ මං ඇහුවේ. ඊට පස්සේ කිව්වා ඒ ගොල්ලො ඉන්න ගෙවල්වලින් හයි කරනවා කියලා.

ප්‍ර: ඒ ගොල්ලො ඉන්න ගෙවල් කිව්වේ කවුද?

උ: කලින් ඒ ගොල්ලො හිටපු ගෙවල්වල හයි කරලා තිබුණලු.

ප්‍ර: ඒ කියන්නේ සාරාලා හිටපු තැන්වල?

උ: නැහැ සහරාන් ඉස්සෙල්ලා හිටපු මල්වානේ ගෙදරක ඒ ගෙදර ඉන්න කාලෙත් හයි කරලා තිබුණා.

ප්‍ර: මල්වානේ කොහේද ගෙදර තියෙන්නේ?

උ: මල්වානේ සේෆ් හවුස් ඒ ගොල්ලෝ 2018 විතර ඒ සේෆ් හවුස් එකේ හිටියා. රිල්වාන් තුවාල වුණායින් පස්සේ ඒ කියන්නේ 2018/09 වැනි මාසේ විතර ආපහු වෙන ගෙයක් ගත්තලු.

ප්‍ර: දැන් මට තව ප්‍රශ්නයක් අහන්න තියෙනවා. අර රිල්වාන් තුවාල වෙලා ඔය General Hospital එකේ හිටියනේ ?

උ: ඔව්.

ප්‍ර: ඒ වෙලාවේ දී හාදියා දන්නවද මාවනැල්ලේ ඊබ්‍රාහීම් සහෝදරයෝ? අබුබරායි අනිත් එක්කෙනා කවුද?

උ: අබුෆලා, අබු උමර්

ප්‍ර: අබුෆලායි, අබු උමරුයි?

උ: ඔව්.

ප්‍ර: ඒ අයගෙන් කවුරු හරි ඔය රිල්වාන් එක්ක General Hospital එකට ගියාද කියලා කියන්න admit කරන වෙලාවේ?

උ: ඒ admit කරන මාවනැල්ලේ එක්කෙනෙක් තමා ගිහින් තියෙනවා කියලා එයාගේ අම්මා මටත් කිව්වා.

ප්‍ර: කවුද ඒ?

උ: එයා සාහිද් කියලා කිව්වේ.

ප්‍ර: කොහොමද ඒ සාහිද් තමයි admit කරන කොට General Hospital එකට ගියේ කියලා හාදියා දැනගත්තේ?

උ: එයාගේ අම්මා කිව්වා.

ප්‍ර: කාගේ අම්මද?

උ: සහරාන්ගේ අම්මා.

ප්‍ර: සහරාන්ගේ අම්මා කිව්වේ?

උ: ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් එතකොට එහෙම තමයි දැනගත්තේ ඔය සහරාන්ගේ අම්මා කියලා මේ රිල්වාන්ව admit කරන්න ගියපු කෙනාගේ නම?

උ: ඔව්. මාවානැල්ලේ එක්කෙනෙක් තමා admit කරන්නේ . එයාගේ නමත් නෙමේ. රිල්වාන්ට සාහිද් කියලා තමා admit කරලා තියෙන්නේ. ඒ කියන්නේ ඊබ්‍රාහීමේගේ පුතා කියලා වගේ තමා එයාව admit කරන්නේ කියලා එහෙම කරේ කියලා කිව්වේ.

වේලාව: ප.ව.08.35
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ සචිනි මෙනවිය.
වෙලාව ප.ව.8.35
මෙතැන් සිට නිල්මිණි මෙනවිය විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : එතකොට අපි හරියටම කියනවා නම් රිල්වාන්ව General Hospital එකට Admit කරන වෙලාවේ ඒ Admit කරන්න ගියේ ඔය මාවනැල්ලේ ඊබ්‍රාහිම් පවුලේ සහෝදරයෝ දෙන්නගෙන් එක්කෙනෙක් නේද?

පි : ඔව්.

ප්‍ර : කටුවාපිටිය ගෙදර කොච්චර කාලයක් හිටියද හාදියා?

පි : 2019 February 20 ඉඳලා මාර්තු 3 වෙනිදා වෙන කල් ඒ උදේ වෙනකල් අර ගෙදර හිටියා.

ප්‍ර : කටුවාපිටියේ ගෙදර?

පි : ඔව්. ඒ කාලේ 2019 මාර්තු මාසේ 10 වෙනිදා එඩේරමුල්ල ගෙදර ගිහිං තියෙනවා. ඒ ගෙදරින් තමයි අබූඋමර් කියලා එක්කෙනාගේ නෝනත් ඒ ගෙදර තමයි හිටියේ. එයායි එයාගේ බබයි. ඒ වෙලාවේ තමයි අබුනජා කියලා එක්කෙනෙක් මං ඒ වෙලාවේ තමයි අඳුනන්නේ

ප්‍ර : කවුද ඒ අබුනජා කියන්නේ?

පි : එයා කියන්නේ මාවනැල්ලේ එක්කෙනෙක් තමා.

ප්‍ර : එයාගේ නම දන්නවද?

පි : සාජිත් මවුලවි කියන්නේ එයාට.

(මේ අවස්ථාවේදී සාක්ෂිකාරියට ඡායාරූපයක් පෙන්වා සිටි)

ප්‍ර : මේ ගෙදර දැකලා තියෙනවද?

පි : ඔව්. ඒ තමයි එඩේරමුල්ලේ ගෙදර.

ප්‍ර : ඒ එඩේරමුල්ලේ ගෙදර?

පි : ඔව්.

<u>ස්වාමීනි C1256 වශයෙන් සාක්ෂිකාරිය විසින් එඩේරමුල්ලේ නිවස ලෙස හඳුනා ගන්නා ලද එම නිවස දැක්වෙන ඡායාරූපය ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා.</u>

ප්‍ර : එඩේරමුල්ලේ මේ ගෙදරට ගියේ කවුරු කවුරුද ?

පි : ඒ ගෙදරට..

ප්‍ර : හාදියා කවදා වගේද ගියේ?

පි : 2019 මාර්තු මාසේ 10 වෙනිදා.

ප්‍ර : කවුරු කවුරුද ගියේ?

Prosecutor's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි : මමයි, ළමයි දෙන්නයි, සහරානුයි. ඒ අබ්දුල්ලා තමයි Van driving අරන් ගියේ.

ප්‍ර : දැන් මේ ගෙවල්වලට සල්ලි දෙන්න ඕනනේ ඒවා ගන්න?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒවට සල්ලි කොහෙන්ද?

පි : පස්සේ තමයි ඒකට කවුද වියදම් කළේ කියලා 2019 February මාසේ 22 න් පස්සේ තමයි මම දැන ගත්තේ.

ප්‍ර : කොහොමද දැන ගත්තේ?

පි : සහරාන්ගෙන් මම ඇහුවා එයාට මේ වගේ කුළියට හරි ගණන් කියලා. ඊට පස්සේ සහරාන් කිව්වා මේ විතරක් නෙමෙයි තව ගේ දෙකක් තියෙනවා කියලා. ඊට පස්සේ මම ඇහුවා එයාට කවුද ඒකට වියදම් කලේ කියලා. එයා කිව්වා කොළඹ එක්කෙනෙක් ඉන්නවා යාළු එක්නෙක්. එයා තමා ඒ ඔක්කොටම වියදම් කරන්නේ කියලා. මම ඊට පස්සේ ඇහුවා කවුද කියලා. එයා කිව්වා ඕගොල්ලෝ එක්කන් යන්න ආවේ අබුබරා කියලා. එයා තමයි ඒකට වියදම් කරන්නේ කියලා කිව්වා.

ප්‍ර : එතකොට දැන් මේ ගෙදරට කවුරු හරි සහරානුත්, හාදියත්, දරුවෝ දෙන්නත් ඇරෙන්න ඒ ගෙදරට වෙන කවුරු හරි ආවද?

පි : ඒ කියන්නේ එඩේරමුල්ලේ ගෙදරට මං යන කොට ඒ ගෙදර හිටියා නවුෆර් මවුලවි.

ප්‍ර : ඒ කියන්නේ හාදියාගේ බාප්පා?

පි : ඔව්. එයයි, අබුඋමර්,

ප්‍ර : දැන් ඇයි මේ නවුෆර් මවුලවි එතන ඉන්නේ, එයා දැන් කැකුණගොල්ලෙනේ?

පි : එයා කැකුණගොල්ල.

ප්‍ර : ඔව් ඉතින් නවුෆර් මවුලවි මොනාද ඩේරමුල්ලේ කරන්නේ?

පි : එයා ඒ ගෙදර ඉඳලා අරාබි ඒකේ ළමයින් තුන්දෙනෙක් හිටියලු. ඒගොල්ලන්ට අරාබි උගන්වනවාලු.

ප්‍ර : එහේ ඉඳන් ඒකයි කළේ?

පි : ඔව්.

ප්‍ර : කොච්චර දවසක් හිටියද ඔය ගෙදර?

පි : ඒ ගෙදර ඒගොල්ලෝ, කොච්චර දවස්ද මම ඒ කියන්නේ උදේ ගිහිල්ලා ආවේ පැය 2 ක් විතර ඒ ගෙදර හිටියා.

ප්‍ර : වැඩි වෙලා හිටියේ නැහැ එඩේරමුල්ලේ ගෙදර?

පි : නැහැ.

****

Presidential Secretariat Copy

FAIR COMMENT — BY JEZEEM —

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : හාදියාට පස්සේ හරි කවුරු හරි කිව්වද ඒ ගෙදර කාගෙද කියලා?

පි : ඒ Rent එකට ගත්ත ගෙදර කියලා තමා කිව්වේ.

ප්‍ර : කාගේද ගෙදර කියලා දැන ගත්තේ නැද්ද?

පි : ඒ කියන්නේ අබ්දුල්ලා තමා බලලා ගත්තේ. ඒගොල්ලො අර ගේ එක්කෙනාට එක්කෙනාට තඩියගේ ගෙදර කියලා තමයි කියන්නේ මම එයාව දැකලා නැහැ.

ප්‍ර : කාගේ ගෙදරද?

පි : මහත එක්කෙනෙක් කියලා තමයි නමක් කියන්නේ නැහැ.

ප්‍ර : තඩියගේ ගෙදර?

පි : ඔව්.

ප්‍ර : නම දන්නේ නැද්ද?

පි : නම දන්නේ නැහැ එයාගේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඒ එඩේරමුල්ලේ ගෙදරට කොයි වෙලාවක හරි සාදික් ගේ නෝනා සහීජා ආවද?

පි : ඒ ගෙදරින් තමා එයා හිටියේ එඩේරමුල්ල ගෙදරින්.

ප්‍ර : ඒ ගෙදර තමා හිටියේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට එහේ ටිකක් වෙලා ඉඳලා ඊට පස්සේ ආයේ කටුවාපිටියට ගියාද?

පි : ඔව්.

ප්‍ර : ආයේ කටුවාපිටියේ කොච්චර කල් හිටියද?

පි : ඊට පස්සේ ඊට කලින් February 25 විතර පානදුරට ගියේ.

ප්‍ර : ආ.. පානදුරට ගියා?

පි : ඔව්.

ප්‍ර : ඇයි පානදුර ගියේ?

පි : පානදුරට ගියේ සහරාන් කිව්වා උදේම ලෑස්ති වෙන්න කියලා මට. ළමයින් දෙන්නත් එක්ක. මං කිව්වා ඇයි කියලා. නැහැ මෙතනට Meeting එකක් තියෙනවා කියලා කිව්වා.

ප්‍ර : කොහේද?

පි : කටුවාපිටියේ ගෙදර

ප්‍ර : ඒක නිසා දැන් යන්න ලෑස්ති වෙන්න කියලා කිව්වා?

පි : ඔව්. ඊට පස්සේ බරා කියලා එක්කෙනෙක් එයා කාර් එක අරන් එනවා කියලා කිව්වේ.

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : ඒ දිනේ හරියට මතකද හාදියා?

පි : ඔව් ඒ දවස්වල 25 ඒ දවස්වල තමයි එයා ආවේ.

ප්‍ර : කොයි මාසෙද හරියටම ?

පි : February මාසේ.

ප්‍ර : 2019?

පි : 19.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : පානදුර ගෙදර දැක්කොත් හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන්.

ප්‍ර : අපි දැන් පෙන්නනවා Photos වගයක්

(ඡායාරූප කිහිපයක් තිරයේ දිස්වීමට සලස්වයි)

මේ ගෙදර හඳුවනවද?

පි : ඔව්.

ප්‍ර : කොහේද ඒ ගෙදර තියෙන්නේ?

පි : පානදුර සරිකාමුල්ල පාරේ.

ප්‍ර : පානදුර, සරිකාමුල්ල පාරේ ගෙදර?

පි : ඔව්.

ප්‍ර : එතකොට මොන ගෙදරද?

පි : නස්මියා විලා

ප්‍ර : නස්මියා විලා මේ ගෙදරට තමයි 2019 පෙබරවාරී මාසේ 25 වෙනිදා ගියා කියලා කිව්වේ සහරාන් එන්න කියලා?

පි : ඔව්.

ප්‍ර : දැන් සහරාන් අරගෙන ගියාද හාදියාවයි, බබාලා දෙන්නවයි?

පි : ඔව් උදේ 8 ට විතර කටුවාපිටියේ ඉඳලා පිටත් වුණේ පානදුරට. ගිහිල්ලා. ගිහිල්ලා..

ප්‍ර : මොකක්ද කියන්න හාදියා?

පි : ඒ ගෙදරින් ගිහිං දාලා එයාගේ මල්ලී හිටියේ ඒ ගෙදරින් තමා.

ප්‍ර : කොයි මල්ලීද?

පි : රිල්වාන්.

ප්‍ර : රිල්වාන් හිටියා මේ ගෙදර?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන්නේ හාදියලා යන වෙලාව වෙන කොට රිල්වාන් ඒ ගෙදර හිටියා?

පි : ඔව්.

ප්‍ර : රිල්වාන් විතරද හිටියේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඒ ගෙදරින් රිල්වාන්, රිස්කාන්, ෆෙරෝසා, ආසත් ඒගොල්ලෝ හිටියේ ඒ ගෙදර තමා.

ප්‍ර : දැන් ඔය සාරත් එක්කනේ ගියේ කටුවාපිටිය ගෙදරට?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් සාරට මොකද වුණේ?

පි : ඒ සාරා ඒ ගෙදර හිටියා. ඒගොල්ලෝ කිව්වා මෙතනට Meeting එක තියෙනවා කියලා.

ප්‍ර : එතකොට සාරා කටුවාපිටිය ගෙදර හිටියා?

පි : ඔව්.

ප්‍ර : හැබැයි හාදියයි බබාලා දෙන්නයි පානදුර ගෙදරට ආවා?

පි : ඔව්.

ප්‍ර : පානදුර ගෙදර කොච්චර දවස් හිටියද?

පි : ඒ එදා උදේ ගිහිල්ලා ආපහු රෑ 8.00ට විතර තමයි ආවේ.

ප්‍ර : ඒ කියන්නේ නැවත කටුවාපිටියට ගියාද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ ගෙදරට අර එදා මීටිමක් තියෙනවා කියලා කිව්වනේ?

පි : ඔව්.

ප්‍ර : ඒ ගෙදර කවුරුත් ඒකට ආපු අය හිටියද?

පි : එහේ මං කවුද ආවේ කියලත් දන්නේ නැහැ. ඒකේ කට්ටිය 15 ක් විතර කට්ටිය ඇවිල්ලා හිටියා කියලා කිව්වේ.

ප්‍ර ; එතකොට දැන් ආපහු හාදියලා යන කොට ගෙදර කවුරු හරි හිටියද?

පි : එතකොට කවුරුත් නැහැ ඒ ගෙදරින්.

ප්‍ර : සාරා?

පි : සාරා ඒ ගෙදරින් තමා හිටියේ. ආපු පිරිමි කට්ටිය වැඩිය ඇවිල්ලා හිටියලු. ඒගොල්ලන් ගියා.

ප්‍ර : එතකොට සහරාන්?

පි : සහරාන් ආවේ මාව පානදුරට බරාත් එක්ක ඉල්හාම්ත් එක්ක මාව එක්ක යන්න.

ප්‍ර : නමුත් දැන් මීටිමට එතකොට සහරාන් සහභාගී වෙන්නේ නැද්ද?

පි : Meeting එකට තමා, Meeting එක පටන් ගන්න ඉස්සෙල්ලා තමයි මාව පානදුර ගෙදරට දාලා එයාගේ මල්ලි එක්කගෙන ආවේ කටුවාපිටිය ගෙදරට.

ප්‍ර : එතකොට දැන් ආයෙමත් කටුවාපිටියට ආවා, එතකොට කටුවාපිටියේ කොච්චර දවස් හිටියද හාදියා?

පි : ඊට පස්සේ මාර්තු 18 වෙන කල් හිටියා ආපහු පානදුර ගෙදරට ගියේ.

ප්‍ර : කොහේද හිටියේ මාර්තු 18 වෙන කල්?

Presidential Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

පි : කටුවාපිටිය ගෙදරින්.

ප්‍ර : කටුවාපිටිය ගෙදර හිටියා මාර්තු 18 වෙන කල්, එතකොට ඇයි මේ මාර්තු 18 ආයෙත් මාරු වෙන්නේ ඒ ගෙදරින් කටුවාපිටිය ගෙදරින්?

පි : ආපහු කටුවාපිටිය ගෙදරට ෆෙරෝසා එයා විතරයි ඉන්නේ කියලා එයාගේ husband කියලා තිබුණා සහරාන්ට. ඊට පස්සේ අපි ඒ ගෙදරට ගියා.

ප්‍ර : කොයි ගෙදරටද?

පි : පානදුර ගෙදරට.

ප්‍ර : ඒ ගියේ 2019 මාර්තු මාසේ 18?

පි : 16,17 ඒ දවස්වල.

ප්‍ර : 16,17 කියන දවස්වලින් එකක. එතකොට ඒ ගෙදර කවුද හිටියේ?

පි : ඒ ගෙදර හිටියේ සහරාන්ගේ මල්ලි රිල්වාන්. රිස්කාන්, ආසත්, ෆෙරෝසා, මීසන් කියලා සනස්තින් එයත් හිටියා.

ප්‍ර : එතකොට ඒ ගෙදර කොච්චර කාලයක් හිටියද?

පි : දවස් 5 ක් හිටියා එහේ.

ප්‍ර : ඔය හිටපු හැම තැනම Fridges තිබ්බද?

පි : ඔව්.

ප්‍ර : ලොකු ඒවද පොඩි ඒවද?

පි : ඒ කියන්නේ ඒ පානදුර ගෙදර?

ප්‍ර : ඔව් විශේෂයෙන්ම පානදුර ගෙදර.

පි : පානදුර ගෙදර Fridge එක තිබුණා.

ප්‍ර : කොච්චර විතර ලොකු එකක්ද ඒක?

පි : එහේ සාමාන්‍යයෙන් පොඩි Fridge එකක්.

ප්‍ර : පොඩි Fridge එකක් තිබ්බා හරි ?

පි : ඔව්. අනිත් එක Deep Freezer එකක් තිබුණා සුදු පාට එකක්.

ප්‍ර : ඔය Deep Freezers ඔය හිටපු හැම Safe house එකකම තිබ්බද?

පි : නැහැ. Fridge තිබුණා අනිත් ගෙවල්වල.

ප්‍ර : Deep Freezers කොහේද තිබ්බේ?

පි : ඒ පානදුර ගෙදර තිබුණා.

ප්‍ර : පානදුර ගෙදර පොඩි Fridge එකක් තිබ්බා. Deep Freezer එකක් තිබ්බා?

පි : ඔව්.

ප්‍ර : Deep Freezers කීයක් තිබ්බද?

පි : එකක් තිබුණේ.

ප්‍ර : එකයි, පොඩි Fridge එකයි එහෙමද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : දැන් අර ඉස්සර වෙලා දැක්ක පානදුර ගෙදර අපි ආයේ පෙන්නනවා. අඳුන ගත්තනේ මේ ගෙදර හාදියා?

පි : ඔව්.

ප්‍ර : අපි මේ ගෙදර තව පිංතූරයක් පෙන්නන්නම්?

පි : හරි.

(මේ අවස්ථාවේ ඡායාරූපයක් පෙන්වයි)

ප්‍ර : අපි දැන් පෙන්නන ඡායාරූපයත් ඒ පානදුර ඒ ගෙදර ඡායාරූපයක් නේද?

පි : ඔව්.

<u>ස්වාමීනි මෙම ඡායාරූපය C1257 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා</u>.

ප්‍ර : ඔය පානදුර ගෙදර කොච්චර කල් හිටියද හාදියා?

පි : ඒකේ මාර්තු මාසේ 16, 17 ඉඳන් දවස් 5 ක් හිටියා.

ප්‍ර : දවස් 5 ක් හිටියා?

පි : ඔව්.

ප්‍ර : ඒ අතරේදී ඔය ගෙදරට කවුරු හරි ආව ගියාද?

පි : ඒ වෙලාවේ ඒ ගෙදරට කවුරුත් ආවේ නැහැ.

ප්‍ර : ඇයි ඉතින් එතකොට මාර්තු 16. 17 වෙන කල් විතරක් හිටියේ එහේ?

පි : එහේ නිකම් ඒ ගෙදරට ගියා. ගිහිල්ලා හිටියා. පානදුර ගෙදරට.

ප්‍ර : ඔව් ගිහිල්ලා ඊට පස්සේ ඇයි එච්චර කල් විතරක් හිටියේ?

පි : දවස් 5 ක් හිටියා ඒ ගෙදර.

ප්‍ර : දවස් 5 ක් හිටියා?

පි : ඔව්.

ප්‍ර : ඇයි දවස් 5 ක් විතරක් හිටියේ?

පි : ඊට පස්සේ කටුවාපිටිය ගෙදරට ආවා.

ප්‍ර : ආයෙමත් ගියා කටුවාපිටිය ගෙදරට?

පි: : ඔව්.

ප්‍ර : එතකොට දැන් කටුවාපිටිය ගෙදර ආපහු කොච්චර කාලයක් හිටියද?

පි : ඒකේ දවස් 8 ක් විතර හිටියා.

ප්‍ර : ඊට පස්සේ ආයෙමත් මේ තැන මාරු වුණාද?

පි : ඔව්.

ප්‍ර : ඇයි ඒ?

පි : ඊට පස්සේ කිව්වා ඒකේ STF එකෙන් check කරනවා හෙරොයින් ඒවා බලන්න check කරනවා කියලා කිව්වේ. ඊට පස්සේ එහේ Safety නැහැයි කියලා ඒගොල්ලන් කිව්වා වෙන Safe house

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එකක් බලනවා Apartment එකක් බලනවා කියලා. ඊට පස්සේ තමයි April මාසේ 3 වෙනිදා කොළඹ ලකී ප්ලාසා එකට ආවේ.

ප්‍ර : ලකී ප්ලාසාවල ගෙයක් ගත්තා එහෙමද?

පි : ඔව්.

ප්‍ර : එතකොට එහේට ආවේ කවදද?

පි : ලකී ප්ලාසාවලට?

ප්‍ර : ඔව්.

පි : ඒකේ 2019 April 3 වෙනිදා.

ප්‍ර : කවුරු කවුරුද ආවේ?

පි : මමයි, ළමයි දෙන්නයි, සහරාන්, සාරා, කස්තූන්. අබ්දුල්ලා,

ප්‍ර : ෆෙරෝසා?

පි : ෆෙරෝසා, අසාද් ඒගොල්ලනුත් ආවා.

ප්‍ර : දැන් ඔය හාදියා කිව්ව විදියට කටුවාපිටිය ඉඳලා තැන් තැන්වලට සැරින් සැරේ ගිහිල්ලා තියෙනවානේ?

පි : ඔව්.

ප්‍ර : ඒ තැන් තැන්වලට ගියේ මොන වාහනයෙන්ද?

පි : එහේ අලුත් වාහනයක් ගත්තා 2019 February 23, 24 වාගේ පොඩි වාහනයක්.

ප්‍ර : මොකක්ද වාහනය?

පි : පොඩි වෑන් එකක් ගත්තා.

ප්‍ර : කවුද ගත්තේ?

පි : ඒ ගත්තේ අබ්දුල්ලා.

ප්‍ර: : දැන් ඒකේ තමයි ඔක්කොමලා ගියේ, එහේ මෙහේ ගියේ ඒකේ තමයි?

පි : ඔව්.

ප්‍ර : දැන් අප්‍රේල් 3 වෙනිදා ලකී ප්ලාසා එකට ගිහිල්ලා හාදියා ඔය නම් කිව්ව විදියට හාදියා, බබාලා දෙන්නා, ෆෙරෝසා, එතකොට සාරා, අසාද්, අබ්දුල්ලා, එතකොට සහරානුත් ගියාද?

පි : ඔව්.

ප්‍ර ; කොච්චර දවස් හිටියද ලකී ප්ලාසා එකේ?

පි : ඒකේ දවස්, April 3 වෙනිදා ඉඳලා 19 වෙන කල් හිටියේ ඒ ගෙදරින්.

ප්‍ර : ඒ කියන්නේ අප්‍රේල් 19 වෙනිදා වෙනකල් ද?

පි : ඔව්. දවල් වෙන කල් ඒ ගෙදර හිටියා.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : පොඩ්ඩක් ඉන්න හාදියා දැන් ඔයා කිව්වානේ අබ්දුල්ලා තමා ගත්තේ කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ අබ්දුල්ලා කියන්නේ සාමාන්‍යයෙන් නිකම් අබ්දුල්ලද නැත්නම් අබු අබ්දුල්ලද?

පි : නැහැ සර් අබු අබ්දුල්ලා.

ප්‍ර : එයාගේ නම මුබාරක් ද?

පි : අසාම් මුබාරක්

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඊට පස්සේ ඔය ගෙදර ලකී ප්ලාසා එකේ ඉන්න කොට ඒ ගෙදරට කවුරු හරි ආවද?

පි : ලකී ප්ලාසා ගෙදරට එයාගේ මල්ලී පානදුරේ ඉඳලා ඇවිල්ලා හිටියා.

ප්‍ර ; මොන මල්ලීද?

පි : රිල්වාන්.

ප්‍ර : වෙන?

පි : ඊට පස්සේ ඉල්හාම්, අබුබරා එයත් ඇවිල්ලා හිටියා. අබුතාරික් කියලා රිස්කාන් එයත් ඇවිල්ලා හිටියා. සනස්තින්.

ප්‍ර : කවුද මේ සනස්තින් කියන්නේ?

පි : එයා කුළියාපිටියේ ඇතුන්ගහ කොටුවේ එක්කෙනා.

ප්‍ර : ඇතුන්ගහ කොටුවේ කෙනා එයත් ආවා?

පි : ඔව්.

ප්‍ර : මොකටද ඒගොල්ලෝ ආවේ?

පි : ඒගොල්ලෝ ඒ ගෙදරට ඇවිල්ලා ඉන්නවා, වැඩිය හිටියේ නැහැ ඒ ගෙදරින්, ඒකේ ඇවිල්ලා ආපහු කතා කරලා යනවා එනවා.

ප්‍ර : එනවා යනවා ඒගොල්ලන්?

පි : ඔව්.

ප්‍ර : එතකොට කොච්චර දැන් දවස් ඔය ගෙදර හිටියද එතකොට. දැන් ගිහිල්ලා අප්‍රේල් 19 වෙනිදා වෙන කල්නේ හිටියේ?

පි : ඔව්.

ප්‍ර : ඔය වෙන කොට මොකක් හරි තව සහරාන්ට Call එකක් ඇවිල්ලා එහෙම මොකක් හරි වුණාද?

පි : ඔව්.

ප්‍ර : ඒ මොකක්ද වුණේ?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : ඒ April 3 වෙනිදා එතකොට එයාගේ මල්ලී රිස්කාන් කට්ටිය හිටියා පානදුරේ Safe House එකේ.

ප්‍ර ; ඒ කියන්නේ රිල්වානුයි, රිස්කානුයි කට්ටිය හිටියා?

පි : ඔව්.

ප්‍ර : එතනින් මොනවා හරි පණිවිඩයක් ආවද?

පි : ඔව් සහරාන්ට Call එකක් ආවා.

ප්‍ර : මොකක්ද ආව ?

පි : කිව්වා මෙහෙම තමයි ගෙදර අයිතිකාරයා ටක්ගාලා කියන්නේ නැතුව ගේ ඇතුළට එනවා කියලා. ඊට පස්සේ කිව්වලු එයාගේ මල්ලී තුවාල වෙලා හිටියා. ඒ මල්ලීගේ කාමරයේ ඇතුලේ දාන්නේ නැහැ ලොක් කරන නිසා. අයිතිකාරයා කිව්වලු ගෑණු කවුරුත් නැද්ද කියලා. ඒක රිස්කාන් කිව්වලු ඒගොල්ලෝ Hospital ගිහිල්ලා එයා කිව්වලු මම නෝනව එක්කන් එන්නම් කියලා අයිතිකාරයා. ඊට පස්සේ

ප්‍ර : මොකටද මේ නෝනව එක්ක ගෙන එන්නේ?

පි : ඒ අයිතිකාරයා බලන්න ඕනේ කියලා. ඊට පස්සේ හා කියලා රිස්කාන් කිව්වලු ඔයා එක්ක ගෙන එන්න කියලා. ඒගොල්ලෝ Hospital ගිහිල්ලා මට ටක් ගාලා එන්නම් කියලා කිව්වලු. ඊට පස්සේ ඕන නැහැ කියලා එයා සාලේ ඉස්සරහට ඇවිල්ලා ගියාලු. ආපහු එයා කිව්වලු අතන තියෙන බඩු ඔක්කොම මාරු කරමු කියලා.

ප්‍ර : මොන බඩුද, ඒ ගෙදර තියෙන ඒවා?

පි : ඒ ගෙදර තියෙන බඩු

ප්‍ර : ගෙදර තියෙන බඩු?

පි : ඔව් මාරු කරමු කියලත් කිව්වා. ඊට පස්සේ සහරාන් කිව්වා නිකම් වෙලාවට ඒවා අරන් යන්න එපා Office වෙලාව තියෙන්නේ උදේ 7 ට ඒ වගේ School ඉවර වෙලා 2 ½ , 2 ට ඒ වගේ Office ඉවර වෙන 5, 5 ½ වෙලාවට තමයි ඒවා අරන් යන්න කියලා කිව්වේ කටුවාපිටිය ගෙදරට.

ප්‍ර ; එතකොට මොනවද ඔය ගෙනියන්න තියෙන බඩු?

පි : ඒගොල්ලෝ කතා කලේ ඒකේ ගත්ත යූරියා කියලා ඉස්සෙල්ලා ඒගොල්ලෝ 2019 මාර්තු 26 ඒ දවස්වල කස්තුනුයි, රිස්කාන්, අබ්දුල්ලා ඒ තුන්දෙනාම ගියා ඔට්ටමාවඩි වාලච්චේන පැත්තට. ඒ පොලොන්නරුවේ ඉඳලා Call එකක් ආවා සහරාන්ට අබු මොහොමඩ් ෂේක් මේ පැත්තේ යූරියා නැහැ කියලා. ඊට පස්සේ දිගටම අම්පාර හරි බලාගෙන යන්න කියලත් කතා කලේ සහරාන්. එතකොට මම එයා ලඟ හිටියා. මම ඊට පස්සේ එයා

Fair Comment BY JEZEEM

phone එකෙන් කතා කරලා තිබ්බා. මම ඇහුවා මොකටද යූරියා කියලා. නැහැ වැඩකට කියලත් කිව්වා. ඊට පස්සේ මම කිව්වා අපේ ගෙදර කුඹුරු වැඩ කරනවා තාත්තා. ඒකට යූරියා ගන්නවා කියලා මම කිව්වා. කොච්චරද ගන්නේ කියලත් ඇහුවා. මම කිව්වා ඒ කුඹුරු අක්කරයක් තියෙනවා නම් වැඩියෙන් දෙනවා. තාත්තට කිලෝ 5 ක් 10 ක් 20 ක් එහෙම දෙනවා කියලා. එහෙම නම් මදි කියලත් එයා කිව්වා. මම කිව්වා ඇයි මොකක් හරි ඒ කියන්නේ එළවළු ජාති මොකක් හරි ඕගොල්ලන්ට වත්තේ තියනවද කියලා. එයා කිව්වා වැඩකට කියලත් කිව්වා අහන්න එපා කියලා. ඊට පස්සේ තමයි Call එකක් ආවේ ඔට්ටමාවඩි වාලච්චේනෙන් ගත්තා කියලා. කීයද තිබුණේ කියලත් ඇහුවා. ඒක තමයි කිලෝ 25 ක් විතර බෑග් එකක තියෙනවා තිබුණු ඔක්කොම ගන්නත් කියලා කිව්වේ. ඒවත් අරගෙන ආපහු ඒගොල්ලෝ එන කොට Call එකක් ගත්තා සහරාන්ට. කොයි ගෙදරටද අරන් එන්නේ කියලා. සහරාන් කිව්වා පානදුර ගෙදරට ගිහිං දාන්න කියලා. ඊට පස්සේ ඒකේ පානදුර ගෙදරින් දාලා ආපහු සහරාන් එක්කරගෙන යන්න අනිද්දා ආවේ කටුවාපිටිය ගෙදරට. ඇවිල්ලා සහරාන් එක්කරගෙන ගියා. යන්න කලින් කස්තුන් සහරාන්ගේ Phone එකට message එවලා තිබුණා ඒකේ බඩු list එකක්. ඒකේ තිබුණා රතුපාට ලොකු bucket එකක්, ඒ වගේ සයිකල් බෝල්, සෙලෝ ටේප් ඒ වගේ බඩු list එකේ තිබුණා. Safety Jacket කියලා ඒ ඔක්කොම තිබුණා ඒකේ. ඊට පස්සේ සර් මම ඇහුවා එයාට මොනවද මේ බඩු කියලා. ඇයි ඔයා message එක බැලුවේ කියලා ඇහුවා. නැහැ ඒ නිකම් කියලා එයා කිව්වේ. ඊට පස්සේ තමයි අර ගෙදර April 3 වෙනිදා අර ගෙදරට ගියාම ඒ ගෙදරින් දවල් වෙලාවේ තමයි Call එකක් ආවේ සහරාන්ට අයිතිකාරයා ඇවිල්ලා ඉන්නවා කියලා පානදුර. ඊට පස්සේ සහරාන් ඒ කාටද රිස්කාන්ට කියලා තිබුණේ හවස වෙලාවට බඩු මාරු කරමු කියලා. ඊට පස්සේ තමයි කටුවාපිටිය ගෙදරට ඒ බඩු ටික ඔක්කොම මාරු කලේ.

ප ; හාදියා දැන් ඔය කිව්ව විදියට හාදියා දැනන් හිටියා නේද සහරාන් ගොවිතැන් කලේ නැහැ කියලා?

පි : තේරුනේ නැහැ

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

මේ අවස්ථාවේදී රාත්‍රී ආහාරය සඳහා කොමිෂන් සභාවේ කටයුතු රාත්‍රී 9 පසු වී විනාඩි 30 දක්වා කල් තබනවා.

****

දැන් වෙලාව : ප.ව.9.40

රාත්‍රී ආහාරයෙන් පසු නැවත කොමිෂන් සභාව කැඳවයි.

සාක්ෂිකාරිය: අබ්දුල් කාදර් ෆාතිමා හාදියා

දෙමළ භාෂාවෙන් ප්‍රතිඥා දී නැවත කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අශේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: හාදියා මම අහපු ප්‍රශ්නයකට උත්තර දෙන ගමන් ඉස්සරවෙලා හාදියා කිව්වා අප්‍රේල් 3 වෙනිදා ලකී ප්ලාසා ගෙදර ඉන්නකොට සහරාන්ට call එකක් ඇවිල්ලා අර ගෙදර අයිතිකාරයා මේ ඇවිල්ලා පානදුරේ ගෙදර ඒ සාලයට එයා ආවා. ඒ ගෙදරට එයා නිතර එනවා. ඒක නිසා එතන ඉන්න එක පරිස්සම් නැහැ කියලා not safe කියලා සහරාන්ට පණිවිඩයක් ආවා කියලා. ඒ අනුව කරන්න ඕනි මොකක්ද කියන එක ගැන සහරාන් උපදෙසක් දුන්නද?

පි: ඒ කියන්නේ එයා කිව්වා ඉස්සෙල්ලා එයාගේ මල්ලි තුවාල වෙලා හිටියා. එයාට ඇස් එකක් වැඩ කරන්නේ නැහැ. ඒ කියන්නේ ඇස් එකක් ගත්තා. අනිත් එකේ එයාට වැඩිය පේන්නේ නැහැ. පොඩි වෙලා ඇස් එකක්. ඊට පස්සේ ඇඟිලි 9ක් විතරයි අර damage වෙලා ඒ 9 අයින් කරලා තිබුණේ. එකක් විතරයි තිබුණේ ඇඟිලි. ඒ නිසා එයාව දැක්කාම ප්‍රශ්නයක් වෙයි කියලා මුලින්ම එයා කිව්වේ.

ප්‍ර: අපි පින්තූරයක් පෙන්නුවොත් ඒක රිල්වාන්ගේද කියලා කියන්න පුළුවන්ද?

පි: හරි. ඔව්

ප්‍ර: ඒ රිල්වාන් නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට මොකද වුණේ? දැන් ඔය වෙනකොට එය වගේ තමයි ඒගොල්ලන් තත්ත්වය. අත් දෙකේම ඇඟිලි නැද්ද ?නැත්නම් එක අතක විතරද?

පි: අත් දෙකෙන්ම එකක් විතරයි තමයි තියෙන්නේ.

ප්‍ර: එක ඇඟිල්ලක් විතරයි තියෙන්නේ ?

පි: ඔව්.

ප්‍ර: ඒ අර explosion එක, blast එක වෙලාවේ තමයි මේක වුණේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: blast එක

ප්‍ර: හැබැයි ඒක ඒගොල්ලන් කිව්ව විදියට ගෑස් සිලින්ඩරයක් පුපුරලා නෙවෙයිනේ?

පි: නැහැ නැහැ.

ප්‍ර: මොනවා වෙලාද?

පි: එයා බෝම්බ එක හදලා testing කරන්න තමයි ගිහිල්ලා තියෙන්නේ.

ප්‍ර: මොනවා හදලාද?

පි: බෝම්බ එක හදලා.

ප්‍ර: එතකොට සහරාන් කිව්ව උපදෙස ගැන කියන්නකෝ?

පි: කොතනද මිස්

ප්‍ර: රිල්වාන් දැන්, පානදුරේ ගෙදර තමයි ඔය වෙලාව වෙනකොට හිටියේ. එතකොට අප්‍රේල් මාසේ 3 වෙනිදා call එකක් ආවා සහරාන්ට. පානදුර ගෙදර අයිතිකාරයා කියන්නේ නැතුව නිතර එනවායි ගෙදරට. ඒ නිසා ඒක safe නෑ කියලා ?

පි: ඔව්.

ප්‍ර: ඒ නිසා දැන් හාදියා කිව්වා ටික වෙලාවකට ඉස්සරවෙලා සහරාන් උපදෙස් දුන්නා කියලා පානදුරේ ගෙදර තියෙන බඩු උදේ ඉස්කෝලේ වෙලාවේ නැත්නම් ඔෆිස් වෙලාවේ නැත්නම් හැන්දෑවේ, ඔෆිස් වැඩ ඇරිලා යන වෙලාවේ ඒ වගේ වෙලාවක ගිහිල්ලා කටුවපිටියේ ගෙදරට දාන්න කියලා. ඊට පස්සේ මොකද වුණේ?

පි: ඊට පස්සේ දාන්න කියලාත් කියලා තිබුණා. ඒ වෙලාවේ රිස්කාන්ට කියලා තිබුණා රිල්වාන් අර කාමරයක දාන්න කියලා. එයාව ඒ ඇතුලේ ගිහිල්ලා ඉන්න කියලාත් කිව්වේ.

ප්‍ර: ඒ කියන්නේ රිල්වාන්ව පේන්නේ නැති වෙන්න තියන්නද?

පි: ඔව්. ඊට පස්සේ රිස්කාන්ට එහෙම කියලා තිබුණා සහරාන්. ඊට පස්සේ තමයි අර බඩු ටික අබ්දුල්ලා ඒ වෙලාවට හරියට මාරු කරයි කියලාත් කිව්වා කටුවපිටිය ගෙදරට. ඊට පස්සේ 4 වෙනිදා සහරාන් ගියා ආපහු. ඒ අබ්දුල්ලා තමයි

ප්‍ර: කොහාටද ගියේ සහරාන්?

පි: අබ්දුල්ලා ඇවිල්ලා සහරාන් එක්කන් ගියේ.

ප්‍ර: කොහාට ගියේ කියලා දන්නවද හාදියා?

පි: ඒ කියන්නේ කොහේද කියලා දන්නෙත් නැහැ මං හරියට පස්සේ තමයි කටුවපිටියේ ගෙදරට ගිහිල්ලා තියෙනවා කියලා.

ප්‍ර: කවුද කිව්වේ?

පි: ඒ සහරාන් තමයි පස්සේ කිව්වේ.

ප්‍ර: සහරාන් හැබැයි හැමදේම වගේ හාදියාට කියලා තියෙනවා නේද?

පි: ඔව්.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට හාදියා සහරාන් කටුවපිටිය ගෙදරට ගිහිල්ලා ඊට පස්සේ නැවත ආවාද හාදියලා හිටපු තැනට?

පි: ආපහු දවස් 3ක් 4කින් පස්සේ ආවේ එයා.

ප්‍ර: එතකොට එතකන් ලකී ප්ලාසා එකේ හිටියේ වෙන කවුද?

පි: මමයි, ළමයි දෙන්නයි, සාරා, ෆෙරෝසා ඒ තුන් දෙනා හිටියා.

ප්‍ර: එතකොට දැන් ඔය කෑම කන්නේ ඒවාට සල්ලි එහෙම කොහොමද?

පි: ඒකට ආසත් කියලා එක්කෙනෙක් එයයි කස්තූනුයි ගිහිල්ලා තමයි බඩු ඔක්කොම අරන් ඇවිල්ලා අර ගෙදරින්, ඒගොල්ලන් අරන් ඇවිල්ලා අපිට දීලා ගියා. ඊට පස්සේ තමයි දවස් තුනකින් පස්සේ සහරානුයි කස්තූනුයි ආවේ ඒ ගෙදරට.

ප්‍ර: දැන් ඔය ගියපු ගෙවල්වල හාදියලා බඩු අරගෙන ගියාද ලී බඩු වගේ දේවල් එතකොට උයන්න ඕනි දේවල්, වොෂින් මැෂින් වගේ ඒවා එහෙම නැත්නම් ඒවා ඒ ගෙවල්වල තිබුණද?

පි: ඒ කියන්නේ කටුවපිටිය ගෙදර ඉන්නකොට ඒගොල්ලෝ ගත්තේ සල්ලිවලට. ලකී ප්ලාසා ආවාට පස්සේ ඒ ගෙදරින් තිබුණා බඩු ඔක්කොම.

ප්‍ර: ඒ ගෙදර බඩු ඔක්කොම තිබ්බා?

පි: ඔව්.

ප්‍ර: එතකොට ලකී ප්ලාසා ගෙදර ඔය වගේ අප්‍රේල් 19 වෙනිදා වෙනකම් හිටියද?

පි: ඔව්.

ප්‍ර: එතකොට එහෙන් ගියේ ඇයි?

පි: එහේ ඉඳලා 2019 අප්‍රේල් 18 වෙනිදා රෑ සහරාන් ආවා කොල්ලුපිටියේ ගෙදරට.

ප්‍ර: කවදාද ආවේ?

පි: සහරාන්.

ප්‍ර: date එක?

පි: 2019 April 18 හවස. සහරානුයි කස්තූනුයි තමයි ආවේ. ඇවිල්ලා තමයි ඒගොල්ලන් රෑ ළමයි දෙන්නා එක්ක සෙල්ලම් කර කර හිටියා සහරාන්. ඊට පස්සේ තමයි කිව්වේ ලොකු විස්තරයක් තියෙනවා ඔයාට කියන්න ඕනි කියලා.

ප්‍ර: කවුද මේ කිව්වේ සහරාන්?

පි: සහරාන්.

ප්‍ර: එහෙම කිව්වේ හාදියාට?

පි: ඔව්.

ප්‍ර: එතකොට හාදියා ඇහුවද මොකක්ද කියලා?

පි: මොකක්ද කියලා මං ඇහුවේ. මම කිව්වා ලොකු මොකක් හරිද නැත්නම් මොනවද කියලා. ඒකේ සහරාන් කිව්වා මං කියන්නම් කියලා පස්සේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එයා ඊට පස්සේ විස්තරය කිව්වා. ඒ කියන්නේ මං 2017 , එයා සහරාන් 2017 ඉඳලා හැංගිලා හිටියාලු. එයාව පොලිසියෙන් තව කට්ටිය එයාව හොයන්න දාලා තියෙනවා කියලා එයාට අරාංචි වුණාලු. ඒ හින්දා ඒගොල්ලෝ වෙන තැනකට යනවා කියලා කිව්වේ. හිජ්රා යනවා කියලාත් කිව්වේ.

ප්‍ර: හිජ්රා කියලා කියන්නේ මුස්ලිම් නොවන තැනක ඉඳලා ඒ මුස්ලිම් රාජ්‍යයකට යනවා කියන එක නේද?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඇහුවේ නැද්ද භාදියා ඔයා කොහාටද යන්නේ සහරාන්?

පි: ඊට පස්සේ මං එයාට එයා හිජ්රා යනවා කියලා කිව්වා වෙන තැනකට. මං ඒ වෙලාවේ එයාටත් ඇහුවා කොහේද යන්නේ කියලා. එයා කිව්වා කොහේද යන්නේ කොහොමද යන්නේ කියලා ඔයා අහන්න එපා. මං කිව්වා එයාට රටවල් යන්න බැහැ කියලා. අපි කොහේ හරි යනවා කියලා ඒගොල්ලන්ගේ යාළුවෝ set එක තමා යනවා කියලා. එයා කොහේද යන්නේ කවද්ද යන්නේ කියලා ඒවා කිව්වේ නැහැ. Eastern side එකේ safe house 3ක් අරන් තියෙනවා කියලත් කිව්වේ. ඒකට එක්කෙනෙක් ඉන්නවා maintain කරන්න නියාස්. එයා බලනවා කියලාත් කිව්වේ.

ප්‍ර: දැන් ඉස්සරවෙලා මගේ ප්‍රශ්නයකට උත්තර දෙන ගමන් භාදියා කිව්වා නියාස් කියලා දෙන්නෙක් ඉන්නවා කියලා?

පි: ඔව්.

ප්‍ර: එක්කෙනෙක් තමයි සහරාන්ගේ sisterගේ husband. අනිත් එක්කෙනා තමයි සහරාන්ගේ යාළුවා?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔය safe houses maintain කරන නියාස් ඔය දෙන්නාගෙන් කවුද?

පි: ඒ සහරාන්ගේ යාළුවා.

ප්‍ර: ඊට පස්සේ?

පි: ඊට පස්සේ ඒ පැත්තේ එයා ඉන්නවා කියලාත් කිව්වා. සහරාන්ගේ අම්මා , තාත්තා, මල්ලී සෙයිනි, එයාගේ නෝනායි , රිල්වාන්ගේ නෝනයි , ඒවගේම එයාගේ නංගී , එයාගේ husband , හිදායාගේ husband. ඒගොල්ලෝ ඒ පැත්තේ ඇවිල්ලා ගේ 3ක් අරන් තියෙනවා.

ප්‍ර: ඒ කියන්නේ කොයි පැත්තේද ඔය ගෙවල් හදලා තියෙන්නේ ?

පි: Eastern side එකේ කියලා තමයි අපිට කිව්වේ.

ප්‍ර: Eastern side ඒ කියන්නේ නැගෙනහිර පළාතේ?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒ පැත්තෙන් ගේ 3ක් අරන් තියෙනවා කියලා තමයි කිව්වේ. ඊට පස්සේ කිව්වා ඔයගොල්ලන් ලෑස්ති වෙන්න හෙට කාත්තන්කුඩි ඉඳලා එනවා ඔයගොල්ලන් එක්ක යන්න. වාහනය කියලත් කිව්වේ.

ප්‍ර: දැන් එතකොට මෙහෙම සහරාන් හාදියාට කිව්වායි කියලා කියන්නේ අප්‍රේල් මාසේ 18 වෙනිදා?

පි: ඔව්

ප්‍ර: හරි ඊට පස්සේ?

පි: ඊට පස්සේ එදා එහෙම එය විස්තරය කිව්වා ඒගොල්ලන් හිජ්‍රා යනවා කියලා. ඔයාව එයාගේ අම්මාටයි, මල්ලීටයි බලන්න කියලා තියෙන්නේ. ඒ වගේ එයාගේ පුතාව බලන්න ඕනි කියලා එයාගේ මල්ලීට කියලා තියෙනවාලු. ඒවගේ මාව ගෙදර යවන්නේ නැතුව ඒගොල්ලන් ගාව තියා ගන්න කියලා තිබුණා. ඒ කියලා එයා විස්තරය කිව්වා. කොහොම උනත් අපේ අම්මලා ගෙදර යන්න එපා කියලා තිබුණේ.

ප්‍ර: ඇයි ඒ?

පි: එහේ මං අම්මලා ගෙදර ගියොත් මාව ආයේ CID එකෙන් ඇවිල්ලා arrest කරයි කියලා. එහෙම කියලා තිබුණේ එයා. ඊට පස්සේ ඒ පැත්තෙන් ගිහිල්ලා ඉන්න. කොහොම හරි අපි යනවා ඒ පැත්තට කියලා එයා කිව්වේ.

ප්‍ර: කොයි පැත්තටද?

පි: Eastern side එකේ. අපි ඉන්න තැන ගිහිල්ලා ඉන්න කියලා ඉස්සරවෙලා කිව්වේ. පස්සේ අපි එන්නම් ඒ පැත්තට කියලා එයත් කිව්වා. ඊට පස්සේ තමයි උදේ 19 උදේ සාරා ඇවිල්ලා ඇහුවේ මොකක් හරි ඒගොල්ලෝ මොනවද කිව්වේ කියලා මටත් ඇහුවා. මං කිව්වා ඒගොල්ලෝ වෙන තැනකට යනවා හිජ්‍රා යනවා කියලා කියනවා. ආ එහෙමද කිව්වේ කියලත් ඇහුවා. මං කිව්වා ඔව් කියලා. ඊට පස්සේ වෙන මොකුත් කිව්වේ නැද්ද කියලත් ඇහුවා. මං කිව්වා නැහැ කියලා. එහෙනම් ඉද්දා මොකක් හරි කිව්වද කියලා. ඒ කියන්නේ මැරුණම දුකින් ඉන්න ඕනි මාස 4යි දවස් 5ක්. ඒකට තමයි ඉද්දා කියන්නේ. ඒකට මොකක් හරි කිව්වද කියලා. මං කිව්වා නැහැ ඒ සම්බන්ධව මොකුත් කිව්වේ නැහැ කියලා. නැහැ නැහැ කියලා ඊට පස්සේ සාරා කස්තූන්ට කියලා. කස්තූන් තමයි සහරාන්ට අහලා තිබ්බේ. ඉද්දා ඉන්නකොට ගෑනු අය කොහොමද සුදු ඇඳුම්ද නැත්නම් තද පාට ඇඳුම්ද අඳින්න ඕනි කියලා. ඊට පස්සේ සහරාන් කියලා තිබ්බාලු තද පාට නැතුව ලා පාට වගේ සුදු ඒ පාට හොඳයි කියලා තිබුණාලු.

ප්‍ර: ඒ කොයි වෙලාවේද ඔය කියලා තිබුණේ?

පි: ඒ 2019 April 19 උදේ වෙලාවට. ඊට පස්සේ තමයි ඒ වෙලාවට එයා කිව්වා. ඊට පස්සේ එයා කිව්වා ඔයගොල්ලන් ලෑස්ති වෙන්න කියලා.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උදේ පාන්දර 5.30 , 6.00ට විතර. එයා කිව්වා මං පොඩ්ඩක් එළියට ගිහිල්ලා එන්නම් කියලා.

ප්‍ර: කවුද මේ ලෑස්ති වෙන්න කියලා එළියට ගිහිල්ලා එන්නම් කියලා ගියේ?

පි: සහරාන්. ඊට පස්සේ සහරාන් කිව්වා යාළුවා එනවා.අබු බරා. මං එයත් එක්ක එළියට පොඩ්ඩක් ගිහිල්ලා එන්නම් කියලා ඊට පස්සේ ගිහිල්ලා ආපහු ආවා 7.30ට විතර, 8.00ට විතර ආවා. ඇවිල්ලා සහරාන් ලකී ප්ලාසා ඉඳලා ඉල්හාම් බාරා කියන එක්කෙනා එක්ක ගියා. ඊට පස්සේ කාත්තන්කුඩි ඉඳලා එක්කෙනෙක් ආවා වාහනයෙන්. ෆෙරෝසා, ආසදුත් ඒගොල්ලන් එක්ක තමයි ආවේ. ඇවිල්ලා 8.30ට විතර ඒගොල්ලෝ ඇවිල්ලා. ඊට පස්සේ කිව්වා ලෑස්ති වෙන්න ඔයගොල්ලන් ඇඳුම් ටික ඔක්කොම කියලා. අර ගෙදරින් තිබුණ බඩු ටික ඒවාත් ලෑස්ති කරන්න කියලා. ඊට පස්සේ ඒවාත් ලෑස්ති කරලා තිබ්බා.

ප්‍ර: ඒ කියන්නේ ලකී ප්ලාසා එකේ තිබුණ බඩු?

පි: ඔව්. අපේ බඩු. ඒගොල්ලන්ගේ නෙවෙයි. මේගොල්ලන්ගේ ගත්ත බඩු කියලා ලෑස්ති කරන්න කිව්වේ. ඒ බඩුත් ලෑස්ති කරලා තිබ්බා. ඊට පස්සේ තමයි කිව්වේ 12 වෙනකොට මෙහේ ඉඳලා යන්න ඕනි කියලා. පානදුර ගෙදරට. ඊට පස්සේ ඒ ගෙදර ඉඳලා 12ට වැන් ස්ටාට් වෙන් නැහැ කියලා ආපහු 1.30ට විතර කොල්ලුපිටියේ ගෙදර ඉඳලා පානදුරට ගියේ. ඒ ගෙදරින් 2, 2.15 වෙනකොට ඒ ගෙදරින් ගිහිල්ලා හිටියා පානදුර. ඒ ගෙදර ගියාම ගොඩක් ඉස්සර වෙලාම බැස්සේ පිරිමි අය තමයි. බැහැලා..

ප්‍ර: දැන් කවුරු කවුරුද ඔය පානදුර ගෙදරට ගියේ ලකී ප්ලාසා ඉඳලා?

පි: මමයි , ළමයි දෙන්නායි

ප්‍ර: සහරාන්?

පි: සහරාන් එයයි එයාගේ සාරා, ෆෙරෝසා , කස්තූන්, ආසත්, වැන් driver ඒකේ ආවේ රිෆාස් කියලා කාත්තන්කුඩි එක්කෙනා.

ප්‍ර: කී දෙනෙක්ට ඒ වැන් එකේ යන්න පුළුවන්ද?

පි: ඒ ලොකු වැන් 12ක් විතර යන්න පුළුවන් ඒකේ.

ප්‍ර: ලොකු වැන් එකක්ද?

පි: ඔව්. ඒ වැන් එකෙන් තමයි.

ප්‍ර: ඊට පස්සේ දැන් ගියේ ඔය පානදුර ගෙදරට?

පි: ඔව්.

ප්‍ර: ඒ ගිහිල්ලා මොකද වුණේ?

පි: ඒ ගෙදරට ගියාම ඒ ඉස්සරහා තියෙන දොරෙන් අපි ගියා එතෙන්ට. පොඩි සාලේ තියෙන්නේ. ඊට පස්සේ තමයි ලොකු සාලයක් තියෙන්නේ. ගියාම ටක් ගාලා ඇවිල්ලා කිව්වා අසාත්, මේ පැත්තෙන් යන්න එපා ගෑනු. එහා පැත්තෙන් එන්න කියලා. ඇතුලට යන්න කියලා. ඊට පස්සේ ඉස්සරහා තියෙන දෙවැනි දොර ගාවින් තමයි ඇතුලට ගියේ.

ප්‍ර: ඇයි එහෙම කියලා තියෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි: ඒ කවුද ඒ මොකටද කියලා මං දන්නේ නැහැ. පස්සේ ඒකේ ඇතුළට ගියාම තමයි පුතා ඇවිල්ලා කිව්වේ අම්මා අපි හඳුනන්නේ නැති අය ගොඩක් ඉන්නවා සාලේ කට්ටිය කියලත් කිව්වා. ඊට පස්සේ ඒ වෙලාවේ තමයි මං කිව්වා තාත්තාට එන්න කියන්න කියලා. ඊට පස්සේ මං එයාටත් ඇහුවා. ඊට පස්සේ එයා කිව්වා නැහැ යාළුවොත් ඇවිල්ලා හිටියා. සිකුරාදා දවස. ඒ හින්දා ඒගොල්ලෝ බිස්නස් අද සිකුරාදා දවස හින්දා මෙහේ ඇවිල්ලා ඉන්නේ කියලා. ඊට පස්සේ කිව්වා දැන් කාලා ලෑස්ති වෙන්න 4.30ට. Eastern side එකේ යන්න කියලා.

ප්‍ර: ඔය උදේ ද නැත්නම් හැන්දෑවේද?

පි: ඒ හැන්දෑවේ. දවල් වෙලාව. ඊට පස්සේ අපි කාලා ලෑස්ති වෙනකොට තමයි 35000ක් දුන්නේ යනකොට

ප්‍ර: කවුද දුන්නේ?

පි: සහරාන්. මට දුන්නේ 35000ක්. යනකොට හරි ගිහිල්ලා හරි ඔයගොල්ලෝ ඇඳුම් ගන්න කියලා.

ප්‍ර: මොනවටද මේ ඇඳුම් ගන්නේ?

පි: ඇඳුම් ගන්න කියලා තිබුණේ ඊට පස්සේ එයා කිව්වා අපි හිටියොත් එනවා. නැත්නම් අපි මැරුණොත් කොහොම වුණොත් දන්නේ නැහැ. හිටියොත් එනවා කියලා කිව්වා. ඒ වුණාට කමක් නැහැ ඔයගොල්ලෝ යනකොට හරි ගිහිල්ලා හරි සුදු ඇඳුම් ගන්න කියලා 35000ක් දුන්නේ. ඒ 35000.

ප්‍ර: කාටද සල්ලි දුන්නේ?

පි: මට දුන්නේ. ඊට පස්සේ 4.30 කොල්ලුපිටියේ ඉඳලා යනවා.

ප්‍ර: එතකොට දැන් නිකන්වත් ඇහුවේ නැද්ද ඇයි මේ අපි සුදු ඇඳුම් ගන්න ඕනි කියලා හාදියා සහරාන්ගෙන්?

පි: එයාට මං ඇහුවා. එයා කිව්වා අපි හිජ්රානේ යන්නේ. වෙන තැනකට යනවා අපි කවුරු මොකක් හරි වෙලා අපි මැරුණොත් නැත්නම් හිටියොත් එනවා කියලත් කිව්වා එයා. කොහොම වුණත් ආරංචි වුණොත් අපි මැරුණොත් ඔහොම කියලා අරාංචි වුණොත් දුකින් ඉන්න කියලා කිව්වේ එයා. ඒක තමයි සුදු ඇඳුම් අඳින්න කියලත් කිව්වේ.

ප්‍ර: ඊට පස්සේ මොකද වුණේ?

පි: ඊට පස්සේ යනකොට තමා සාරා කිව්වේ යන ගමන් සුදු ඇඳුම් අරන් යං කියලා. මං කිව්වා ගිහින් බලමු කියලා. ඊට පස්සේ නැහැ නැහැ යනකොටත් අරන් යං කියලා තමයි මේ පැත්තේ වහලා තිබ්බා කොළඹ පැත්තේ. ගිරිඋල්ල පාරේ යනකොට තමයි ජයසුන්දර ටෙක්ස්ටයිල් කියලා සිංහල කඩෙකින් ඒක ඇරලා තිබ්බා.

ප්‍ර: ගිරිඋල්ලේ?

පි: ගිරිඋල්ලේ. ඒ කඩෙන් , ඊට පස්සේ එයා කිව්වා මේ කඩෙන් ගමු කියලා ඇඳුම් අරන් යං කියලා. ඊට පස්සේ තමයි රිල්වාන් Driverට කියලා

FAIR COMMENT BY JEZEEM

නැවැත්වුයේ. නවත්වලා තමයි ඒ කඩෙන් ගිහිල්ලා සුදු ඇඳුම් එකට තිබුණේ skirt & blouse තමා. ඒ ගත්ත ඒවා ඒ මුස්ලිම් අය අඳින විදියට තමයි අත්දිග බ්ලවුස් එකයි, දිග ස්කර්ට් එකයි තමයි ගත්තේ. ඇඳුම් ඔක්කෝම 9ක් විතර ගත්තේ. සෙල්ලම් බඩු 2ක්, 3ක් විතරයි ගත්තේ. ඔක්කෝම විසිනවදහස් හත්සිය ගණනක් බිල් එකේ තිබුණා.

ප්‍ර: එතකොට ඔය කීයට විතරද ජයසුන්දර ටෙක්ස්ටයිල්ස් එකට ගියේ?

පි: ඒකට ගියේ වෙලාව හවස 7.30 විතර ඒ වෙලාව.

ප්‍ර: දැන් මම පින්තූරයක් පෙන්නුවොත් ඒ කොතනද කියලා කියන්න පුළුවන් වෙයිද හාදියාට බලලා?

පි: හා

ස්වාමිනි ඡායාරූපයක් සාක්ෂිකාරියගේ අවධානයට යොමු කරන්න අවසර පතනවා. CCTV දර්ශන වගයක් පෙන්නුම් කරනවා ස්වාමිනි.

ප්‍ර: මේ මෙතන කොනේ තියෙන ඒ වෑන් එක කාගේද?

පි: ඒ රිෆාස් කියලා එක්කෙනාගේ.

ප්‍ර: අර දැන් Driving seat එක පැත්තට යන එක්කෙනා කවුද?

පි: එයා තමයි රිෆාස්.

ප්‍ර: රිෆාස්ද ඔය වාහනය එළෙව්වේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඒ වාහනයේ පැත්තට කාන්තාවෝ 2ක්ද තුන්දෙනෙක්ද?

පි: තුන් දෙනෙක්.

ප්‍ර: තුන් දෙනෙක් ගියානේ?

පි: ඔව්.

ප්‍ර: ඒ කවුද?

පි: ඒ ඉස්සරවෙලා ඇතුළට ගියේ සාරා. ඊට පස්සේ මං ගියා. ඊට පස්සේ ෆෙරෝසා.

ස්වාමිනි මෙම අවස්ථාවේ සාක්ෂිකාරියගෙන් C – 822 CCTV දර්ශන අඩංගු තැටිය වාදනය කරමින් තමයි මේ ප්‍රශ්න අහන්නේ.

ප්‍ර: දැන් බලන්න අපි මේ කොතන ඇතුළත දර්ශනයක්ද?

පි: ඒ කඩේ ඇතුලේ දෙවැනි තට්ටුව.

ප්‍ර: ඒ කියන්නේ ජයසුන්දර ටෙක්ස්ටයිල්ස් එකේ ඇතුළ?

පි: ඔව්.

ප්‍ර: දැන් අර පඩිපෙළ නැහගෙන එනවා නේද කට්ටියක්. පළවෙනියට එන්නේ කවුද ?

පි: ඒ සාරා.

ප්‍ර: දෙවැනියට එන්නේ කවුද?

පි: ඒ මම.

ප්‍ර: එතකොට බබාව වඩාගෙන එන එක්කෙනා කවුද?

පි: ඒ ෆෙරෝසා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කාගේ බබාද ඒ වඩාගෙන එන්නේ?

පි: මගේ දුව.

ප්‍ර: දුවව?

පි: ඔව්.

ප්‍ර: එතකොට දැන් මෙතන මේ හිටගෙන ඉන්නේ එතකොට ?

පි: ඒ වැන් Driver.

ප්‍ර: ඔහුගේ නම මොකක්ද කිව්වේ?

පි: රිෆාස් .

ප්‍ර: දැන් මෙතනින් ඇයි ලා පාට ඇඳුම් ගන්නේ නැතුව සුදු පාට ඇඳුම් ගත්තේ? දැන් සහරාන් කිව්වායි කිව්වානේ ලා පාට ඇඳුම් ඇන්දාට කමක් නැහැ කියලා. එතකොට ලා පාට ඇඳුම් බලන්නේ නැතුව ඇයි අර ඔක්කොම සුදු පාට ඇඳුම් තමයි දැන් අර counter එකේ තියන්නේ නේද?

පි: ඔව්.

ප්‍ර: ඇයි ඒ සුදු පාට ඇඳුම් ගත්තේ?

පි: එයා සාරා කිව්වා ලොකු ස්කර්ට් බිලවුස් තියෙන්නේ. ඒ වුණාට කමක් නැහැ සුදු පාට ගමු කියලා කිව්වා. අනිත් පාට ගවුම් එක කොටයි. එක්කෝ අත් නැහැ ඒවාවලට. ඊට පස්සේ skirt & blouse ඉස්සරහ දැක්කාම ඒවා ගමු කියලා තමයි ඒ ගත්තේ.

ප්‍ර: කොයි වෙලාවක හරි උපදෙසක් ලැබුණද හාදියාට සහරාන්ලා හිජ්රත් කරනවා. ඒ කියන්නේ ජිහාඩ් කර ගන්නවා. එතකොට හාදියලාත් ඒ ආකාරයට කර ගන්නට කියලා?

පි: එහෙම කර ගන්න කියලා කිව්වේ නැහැ මටනම්.

ප්‍ර: හාදියාට කිව්වේ නැහැ කියලා කියන්නේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට හාදියා කියන්නේ ඇයි මේ සුදු ඇඳුම් ගත්තා කියලා?

පි: ඒ ගත්තේ එයා කිව්වා එයා මැරුණොත් ආරංචි වුණොත්

ප්‍ර: ඒ කියන්නේ සහරාන් මැරුණා කියලා ආරංචි වුණොත්?

පි: ආරංචි වුණොත් මාස 4යි දවස් 10ක් දුකින් ඉන්න කියලා තමයි ඒ ගන්න කියලා තිබුණේ.

ප්‍ර: ඒ තමයි අර ඉද්දා පීරියඩ් එක?

පි: ඔව්.

ප්‍ර: ඒ සඳහා තමයි අඳින්න කියලා කිව්වේ?

පි: ඔව්.

ප්‍ර: ඉතින් එතකොට ඒකට දිගටම අඳින්න ඔය ගත්ත ඇඳුම් දෙක තුන ඇද්ද?

පි: ඒ මාස 4යි දවස් 10කට ඇති කියලා තමයි ගත්තේ.

ප්‍ර: ඇඳුම් කීයක් ගත්තාද එතකොට හාදියාට?

පි: මං දෙකක් ගත්තේ.

ප්‍ර: ඉතින් මාස 4යි දවස් 10කට ඇඳුම් 2ක් ඇද්ද?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි: ඒ කොහොමද කියලා මං දන්නේ නැහැ. ඒ වුණාට මං දෙකක් ගත්තා. පස්සේ බලමු කියලා තමයි මං දෙකක් ගත්තේ. සාරා තමයි එයා 4ක් ගත්තා. ෆෙරෝසා 3ක් ගත්තේ. ඊට පස්සේ සාරා කිව්වා ගන්න කියලා. මං කිව්වා පස්සේ බලමු කියලා තමයි මං 2ක් ඒ වෙලාවේ ගත්තේ.

ප්‍ර: හරි දැන් ජයසුන්දර ටෙක්ස්ටයිල් එකෙන් මේ ඇඳුම් ගත්තාට පස්සේ දැන් ඒකට සල්ලි 35000ක් දුන්නා කියලා කිව්වානේ සහරාන්?

පි: ඔව්.

ප්‍ර: ඊළඟට එතනින් කොහාටද ගියේ?

පි: ඒ ඇඳුම් අරගෙන ඊට පස්සේ ගියා. නාරම්මල පාරේ යනකොට දකුණු පැත්තේ මුස්ලිම් පල්ලියක් තිබුණා. ඒ පල්ලි ඉස්සරහා පොඩි හොටෙල් එකක් තිබුණා. ඒ හොටෙල් එකෙන් මොකක් හරි කන්න ඕනි කියලා රිල්වාන් කිව්වාම ඒ රිෆාස් තමයි ගිහිල්ලා කෑම අරන් ආවේ. අපි ඇතුළට ගියා. ඊට පස්සේ වෑන් එක ඇතුළේ තමයි කාලා වඳින්න ඕනි කියලා කිව්වේ. ඊට පස්සේ තමයි පල්ලිය ඇතුළට වාහනය ගත්තේ.

ප්‍ර: ඊට පස්සේ පල්ලියට ගියා?

පි: ඔව්.

ප්‍ර: දැන් කොහේ තියෙන පල්ලියටද ගියේ?

පි: ඒ කියන්නේ පාර අයිනේ තියෙන පල්ලිය.

ප්‍ර: නම දන්නේ නැද්ද එතන?

පි: ඒ නම දන්නේ නැහැ මට.

ප්‍ර: එතකොට පල්ලියට ගිහිල්ලා වැන්දා? කෑම කෑවා ඉස්සරවෙලා ඊට පස්සේ පල්ලියට ගිහින් වැන්දා?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ?

පි: ඊට පස්සේ ආපහු ගියා. නින්දවූර්වලට. ඒ කියන්නේ නින්දවූර් යනකම් මම දන්නේ නැහැ Batticaloa කාත්තන්කුඩි පහුවෙලා call එකක් ආවා රිල්වාන්ට. කොහේද ඉන්නේ කියලා. ඊට පස්සේ රිල්වාන් කිව්වා කාත්තන්කුඩි පහුවෙලා එන ගමන් කියලා.

ප්‍ර: දැන් ඔය කියන තැන් තැන්වලට ගියපු එක අන්තිමට ඔය නින්දවූර් ගෙදරට ගියපු එක ඒකට ඉස්සරවෙලා කොයි වෙලාවක හරි දලුවාකොටුවේ පැත්තේ ගෙදරකට ගියාද?

පි: නැහැ.

ප්‍ර: නැහැ?

පි: නැහැ.

ප්‍ර: එතකොට නින්දවූර්වලට තමයි එහෙමනම් හාදියා ඊට පස්සේ ගියේ?

පි: ඔව්.

ප්‍ර: නින්දවූර්වලට ගියේ කවදාද?

FAIR COMMENT BY JEZEEM

පි: ඒ කියන්නේ 2019. මෙහේ ඉඳලා 4.30 හවස. එහේ ගිහිල්ලා නින්දවූර් ගෙදරට යනකොට පාන්දර 2.30යි.

ප්‍ර: ඒ කියන්නේ 20 පාන්දර 2.30යි?

පි: ඔව්.

ප්‍ර: කවුරු කවුරුද දැන් එතකොට නින්දවූර් ගෙදරට ගියේ?

පි: මමයි , ළමයි දෙන්නයි, සාරා , ෆෙරෝසා, සාරාගේ මල්ලි රිල්වාන්, වෑන් Driver

ප්‍ර: මොන වාහනයේද ගියේ?

පි: ඒ රිෆාස්ගේ වාහනයේ තමයි ගියේ.

ප්‍ර: දැන් අර ජයසුන්දර ටෙක්ස්ටයිල්ස් එකට ඔයගොල්ලන් ගියා කියලා අපි දැක්ක වාහනයෙන්?

පි: ඔව්.

ප්‍ර: එතකොට අපිට කියන්න නින්දවූර් ගෙදරට යනකොට නින්දවූර් ගෙදර කවුරුහරි හිටියද?

පි: ඒ ගෙදරින් සහරාන්ගේ අම්මායි තාත්තයි , සෙයිනි, සෙයිනිගේ නෝනා, එයාගේ ළමයි දෙන්නායි, එයාගේ නංගී හිදායා, එයාගේ ළමයි එක්කෙනෙක් හිටියා දුව, එයාගේ හස්බන්ඩ් රිෂාත් හිටියා. ඊට කළින් අපේ ගෙදර පෙන්වන්න අපිට තැනක් නැහැ කියලා රිල්වාන් කිව්වා පාරට ඇවිල්ලා ඉන්න කියලා නියාස්ට. ඒ පාරෙන් නියාස් ඇවිල්ලා හිටියා.

ප්‍ර: ඔය නියාස් කියලා කියන්නේ සහරාන්ගේ යාළුවා?

පි: සහරාන්ගේ යාළුවා. එයා තමයි අර නින්දවූර් ඉස්සරහා බයික් එකේ ගියේ. ඊට පස්සේ තමයි ඒකේ ඇතුලෙන් ගියාම ඒක ඇතුලට ගිහිල්ලා විනාඩි 20ක් වගේ ඒ ගෙදර ඇතුලේ හිටියේ. ඊට පස්සේ රිල්වාන් අරගොල්ලන්ට කිව්වා මේ වාහන එකේ අනිත් ගෙවල්වලට ඔයගොල්ලන් දාන්න ලෑස්ති වෙන්න කියලා. ඊට පස්සේ තමයි සෙයනි , සෙයිනිගේ නෝනා, සෙයිනිගේ ළමයි, රිල්වාන්ගේ නෝනා, ළමයි, ඒගොල්ලන් ලෑස්ති වුණේ. ඒගොල්ලොත් එක්කගෙන අට්ටලච්චේනෙයි පැත්තෙන් ගේ එකක් අරන් තිබුණා. ඒ ගෙදරින් තමයි සෙයිනියි, සෙයිනිගේ නෝනායි, ළමයි දෙන්නායි , සාරා , ෆෙරෝසා ඒ ගෙදර හිටියා.

ප්‍ර: ආමි මොහිදින් ඒ පැත්තේ හිටියද? අට්ටාලච්චනයේ ගෙදර?

පි: එතකොට එයා ඒ ගෙදර හිටියේ නැහැ.

ප්‍ර: එතකොට එතන හාදියලාගේ රත්තරං බඩු ගලවලා කවුරුහරි දුන්නද?

පි: ඒ කියන්නේ 2019 අප්‍රේල් 25 හවස ගියා ඔලුවිල් පාලමුනෙයිට.

ප්‍ර: හරි අපි එතෙන්ට එමු හෙමිට. අපි දැන් නින්දවූර්වලට යමුකෝ. එතකොට නින්දවූර් ගෙදරට යනකොට හාදියා කිව්වා එතන තව කට්ටිය හිටියා කියලා නම් කෙරුවානේ දැන් ඒගොල්ලන්ව?

FAIR COMMENT — BY JEZEEM

පි: ඔව්

ප්‍ර: එතකොට ඒ ගෙදර බඩු එහෙම තිබුණද?

පි: ඒ කියන්නේ ඒ ගෙදරින් ෆ්‍රිජ් එකක්, වොෂින් මැෂින්, ගෑස් ලිපක් එහෙම බඩු තිබුණේ ඒ ගෙදරින් ඇදුම් එක්ක.

****

දැන් වෙලාව : ප.ව.10.05

මෙතැන් සිට ල/ලේ : සචිනි මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව ප.ව.10.05
පෙර සටහන් : නිල්මිණි මෙනවිය.
මෙතැන් සිට සචිනි මෙනවිය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජීනසේන මෙනවිය:</u>

ප්‍ර : බෙසම් වගේ ඒවා තිබුණද? ගෑස් සිලින්ඩර්ස් තිබුණද?

පි : ඒ ගෙදරින් තිබුණා සිලින්ඩර්ස්.ගෑස් ළිප.

ප්‍ර : Backpacks තිබ්බද, පිටේ එල්ලන් යන ඒවා? Backpacks. ජෙනරේටරයක් තිබ්බද?

පි : ඒකේ පස්සේ කාමරයේ බඩු තිබුණා.

ප්‍ර : එහෙනම් මම මේ පෙන්නන පිංතූර හාදියා අඳුරනවද බලන්නකෝ.

(C874 සාක්ෂිකාරියගේ අවධානයට යොමු කරනවා ස්වාමීනි කොනේම පිංතූරය ස්වාමීනි)

ප්‍ර : ඒ පිංතූර දෙකේ තියෙනවා එකම ගොඩනැගිල්ල නේද අඳුරන්න පුළුවන්ද?

පි : ඔව්.

ප්‍ර : කොහේ තියෙන ගෙයක්ද ඒක?

පි : නින්දවුර්.

ප්‍ර : දැන් හාදියලා ගියේ නින්දවුර්ඔය පෙන්නන ගෙදරටද?

පි : ඒ ගෙදර තමයි ඉස්සෙල්ලා ගියේ

ප්‍ර : අර නින්දවුර් ගෙදරට වම් පැත්තේ තියෙන ගෙදර කාගේද ඒක?

පි : ඒක කාගේද කියලා මම දන්නේ නැහැ.

ප්‍ර : හාදියා දන්නේ නැහැ, කමක් නැහැ. නමුත් ඔය පිංතූරේ පෙන්නන දකුණු පැත්තේ තියෙන ගෙදර තමයි හාදියලා හිටියේ නේද?

පි : ඔව්.

ප්‍ර : අපි දැන් close-up එකක් පෙන්නනවා මෙතන වාහනයක් තියෙනවා unregistered. ඒක තියෙන්නේ අර හාදියලා හිටපු ගෙදරට වම් පැත්තේ තියෙන ගෙදර ගාව තියෙන පොඩි ගරාජ් එකක් වගේ කැල්ලක. ඒ වාහනය හාදියා දන්නවද කාගෙද කියලා?

පි : ඒ කියන්නේ සහරාන් කොල්ලුපිටියේ අපි ඉන්න කොට කිව්වා එයාගේ මස්සිනාට ඒ කියන්නේ හිදායාගේ husband ට වාහනයක් ගන්න කියලා.

ප්‍ර ; මොන වාහනයද අලුත් වාහනයක් ගන්න කියලද?

පි : අලුත් වාහනයක් ගන්න කියලා තමයි එයාටත් කිව්වේ. ඊට පස්සේ ගත්තද කියලා පස්සේ මම දන්නේ ඒ වෙලාවේ එයා කියලා

FAIR COMMENT BY JEZEEM

තිබුණා. ඊට පස්සේ ඒ ගෙදර ගියාම කතා කළා වාහනය ගත්තා කියලා. ඒ වුණාට මම ඒ ගෙදර පිටිපස්සේ දොර අරින්නේ නැහැ. වහලා තිබුණේ. නැන්දා විතරක් හදිසි වුණොත් දොර ඇරලා කතා කරනවා.

ප : කාටද කතා කරන්නේ?

පි : පිටිපස්සෙන් ගෙදර කට්ටියත් එක්ක. නමුත් වාහනය ගත්තා කියලත් කතා කලා. Unregistered වාහන එකක්, අනිත් තව වාහනයකුත් ගත්තා.

ප : ඒ කියන්නේ වාහන 2 ක් ගත්තා?

පි : ඔව්.

ප : දැන් අපි පෙන්නන්නේ ස්ක්‍රීන් එකේ ඒවායින් එකක්ද? One of those vehicles

පි : ඒවාගේ තමයි තව නිකල් පාට වගේ එකක් ගත්තේ.

ප : එතකොට දැන් මම ගේ ඇතුලේ පිංතූර වගයක් පෙන්නනවා.
(මේ අවස්ථාවේදී එම පිංතූරු තිරසේ දිස්වේ)
මේ හරි නේද එතකොට ඒ වාහනය?

පි : ඔව්.

සාක්ෂිකාරිය C875 ඡායාරූපය හඳුනා ගන්නවා ස්වාමීනි.

(තවත් පිංතූරයක් සාක්ෂිකාරියට පෙන්වා සිටී)

ප : දැන් අර ස්ක්‍රීන් එකෙන් මේ ලොකු කරලා පෙන්නන ඡායාරූපය බලන්නකෝ ඒ Photograph එකේ තියෙනවා නේද Backpacks?

පි : ඔව්.

ප : ඒ Backpacks තිබුණද නින්දවුර් ගෙදර?

පි : එහේ තිබුණේ ඇඳුම් දාලා තිබුණ bags තමයි ඒවා.

ප : ඇඳුම් දාලා තිබුණ මේ Backpacks වල. ඒ Backpacks කොහෙන් ගත්තද දන්නේ නැහැ නේද හාදියා?

පි : ඒ කොහෙන් ගත්තද දන්නේ නැහැ.

ප : කාගේ ඇඳුම්ද තිබ්බෙ ඒවයේ?

පි : ඒගොල්ලන් හිටිය නැන්දලා..

ප : කවුද ඒගොල්ලෝ?

පි : සහරාන්ගේ අම්මා, එයාගේ නංගී හිදායා. ඒ වගේ නෆ්නා මගේ ඒ bags තමයි තිබුණේ.

ප : අපි දැන් තව ඡායාරූපයක් පෙන්නනවා.

<u>ස්වාමීනි අර Backpacks තියෙන ඡායාරූපය C881 කියලා ලකුණු කරලා ඉදිරිපත් කර තියෙන්නේ.</u>

(තවත් ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වා සිටී)

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඊළඟට දැන් ඔබට පෙන්වන මේ ඡායාරූපයේ තියෙනවා රතුපාට බෙසන් තියෙනවා, එතකොට ජෙනරේටර් එකක් තියෙනවා, ලොකු සිලින්ඩරයකුයි,පොඩි එකකුයි තියෙනවා, ස්කේල් එකක් තියෙනවා, ලැප්ටොප් එකක් තියෙනවා, ඔය තියෙන දේවල් නින්දවුර් ගෙදර තිබ්බද?

පි : ඔව්.

ප්‍ර : තිබ්බා?

පි : ඔව්.

<u>ස්වාමීනි C879 ඡායාරූපයෙහි තිබෙන දේ සාක්ෂිකාරිය විසින් හඳුනා ගන්නවා.</u>

ප්‍ර : එතකොට හාදියා කියන විදියට කොච්චර දවස් හිටියද නින්දවුර් ගෙදර?

පි : ඒ ගෙදරින් ආපහු අපි 20 පාන්දර ගියා සයින්දමර්දු ගෙදරට.

ප්‍ර : හැබැයි ඉතින් ඔය ගෙදරට ආවෙත් 20 නේද?

පි : 20 පාන්දර තමයි අර ගෙදරට පාන්දර 2 ½ ට අර ගෙදරට ගියේ.

ප්‍ර : ඉතින් 20 පාන්දර නින්දවුර් ගෙදර ඇවිල්ලා ඇයි ආයෙමත් 20 ඔය ගෙදරින් ගියේ?

පි : ඒ ගෙදර ඉඳලා අනිත් කට්ටිය එක්ක ගෙන ගියේ ෂෙයිනිට තව ගෙයක් අරන් තිබ්බා අට්ටාලවේන පැත්තේ. ඒ ගෙදරට ෂෙයිනියි ෂෙයිනිගේ නෝනයි ළමයි දෙන්නයි, සාරා ෆෙරෝසා ඒ ගෙදරට ගිහිං දාලා ඊට පස්සේ අපි සහින්දමර්දු ගෙදරට ගියේ.

ප්‍ර : කවුද ගියේ සහින්දමර්දු ගෙදරට?

පි : ඒ සහින්දමර්දු ගෙදරට මමයි, ළමයි දෙන්නයි, රිල්වාන්, නෆ්නා, එයාගේ ළමයි දෙන්නයි ගියේ.

ප්‍ර : එතකොට මේ සහරාන්ගේ අම්මා?

පි : ඒගොල්ලෝ නින්දවුර් ගෙදර හිටියේ.

ප්‍ර : සහරාන්ගේ තාත්තා?

පි : එයත් නින්දවුර් ගෙදර හිටියේ.

ප්‍ර : ඒගොල්ලෝ ඔක්කොම නින්දවුර් ගෙදර හිටියා?

පි : ඔව්.

ප්‍ර : එතකොට සාරලා ගියා අට්ටාලව්චේනේ ගෙදර. සයින්දමර්දු ගෙදරට ගියා හාදියායි, බබාලා දෙන්නයි, රිල්වානුයි, රිල්වාන්ගේwife ?

පි : නෝනයි.

ප්‍ර : එතකොට අට්ටාලව්චේන ගෙදරදී වුණේ මොකක්ද කියන්න හාදියා දන්නේ නැද්ද?

පි : ඒ කියන්නේ අට්ටාලව්චේන ගෙදරින් ෂෙයිනිලා හිටියා ඒ ගෙදර.

ප්‍ර : දැන් සාරා හිටියෙත් ඒ ගෙදරනේ?

පි : ඒ ගෙදර තමයි හිටියේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් 20 නේ ඔය ගෙදරට ගියේ සයින්දමර්දු ගෙදරට හාදියා?

පි : ඔව්.

ප්‍ර : දැන් ඒ ගෙදර ඉන්න කොට ඔය ගෙදරට තව කට්ටිය ආවද සයින්දමර්දු ගෙදරට?

පි : කවුරුත් ආවේ නැහැ නියාස් තමයි එළියට යන්නේ එන්නේ.

ප්‍ර : හාදියලා ගෙදරට වෙලා ඉන්නවා?

පි : ඔව්.

ප්‍ර : ඔය ගෙදරට කොයි වෙලාවක හරි සහරාන්ගේ අම්මයි, තාත්තයි ආවද?

පි : ඒ ගෙදරට ආවේ නැහැ, පස්සේ 26 වෙනිදා තමයි එතකොට අපිත් හිටියේ නැහැ ඒ ගෙදරින්. ඒ ගෙදර ඉඳලා ආපසු 23 ගියේ නින්දවුර් ගෙදරට.

ප්‍ර : ඇයි නින්දවුර් ගෙදරට ගියේ ආපහු?

පි : ඒ එයාගේ අම්මා කෝල් කරලා කිව්වා 21 මෙහේ blast එක කළා කියලා සහරාන්. ඉන් පස්සේ 21 ඉඳලා 22 වාහනය නැති හින්දා 23 වාහනයත් අරන් ආවේ නියාස්.

ප්‍ර : අපි දැන් එහෙනම් blast එකට එමුකෝ. දැන් 20 වෙනිදා ඉස්සරවෙලා නින්දවුර් ගෙදරට ගියා. ඊට පස්සේ එතනින් ගියා හාදියා සයින්දමර්දු ගෙදරට. එතකොට ඔය කියන blast එක වුණේ 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා කියලා මං කිව්වොත් හරිද?:

පි ; ඔව්.

ප්‍ර : කොහොමද හාදියා ඒ blast එක ගැන දැන ගත්තේ?

පි ; මම දැන ගත්තේ ඒ 2019 April 21, 10 ½ , 11 වෙලාව ඇති

ප්‍ර : දැන් එදා blast කිහිපයක් වුණානේද?

පි : කීයද කියලා මම දන්නේ නැහැ ඒ වෙලාවේ.

ප්‍ර : මොකක්ද ඇත්තටම හාදියා දැන ගත්තේ?

පි : එයා රිල්වාන්ගේ නෝනා තමයි ඇවිල්ලා කිව්වේ ඔයා සුදු ඇඳුම් ගත්තද කියලා. මම කිව්වා ඔව් කියලා. ඒ ඇඳුම ඔයා අඳින්න කියලා තමයි එයත් කිව්වේ ඉස්සෙල්ලා.

ප්‍ර : එතකොට හාදියා ඇහුවද මං මොකටද සුදු අඳින්නේ කියලා.

පි : ඒ වෙලාවේ මං එයාටත් ඇහුවා . ඊට පස්සේ කිව්වා ඒගොල්ලන් හිජ්රා යනවා කියලා ඒගොල්ලන්ට කිව්වේඒගොල්ලන් blast කරනවා කිව්වා ඒ නිසා ඒගොල්ලෝ කොළඹ පැත්තේ blast කරගෙන තියෙනවා කියලා කිව්වේ. ඒ වෙලාවේම සුදු ඇඳුම් අඳින්න කියලා කිව්වා. ඊට පස්සේ 11 ½ ට විතර තමා මං ඒ සුදු ඇඳුම ඇන්දේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හාදියා ඇන්දා ඒ සුදු ඇඳුම?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් හාදියා දැන ගත්තද කවුද මේ blast කරගෙන තියෙන්නේ කියලා?

පි ; ඊට පස්සේ තමා ඒගොල්ලොන් කිව්වේ 8 දෙනෙක් විතර එය කළා කියලා.

ප්‍ර : දැන් ඔය අනිත් අය blast කර ගත්තට හාදියට ප්‍රශ්නයක් නැහැනේ?

පි : නැහැ.

ප්‍ර : හාදියට සම්බන්ධකමක් තියෙන කෙනෙක් ඒක කර ගත්තොත් තමයි හාදියට ප්‍රශ්නේ තියෙන්නේ. එතකොට හාදියට සම්බන්ධයක් තියෙන කෙනෙක් ඔය blast එකක් කරගෙන තියෙන බව හාදියට හරියටම නිශ්චිතව දැන ගන්න ලැබුණද?

පි : ඒ කියන්නේ එදා 21

ප්‍ර : ඔව්.

පි : ඉන් පස්සේ තමා එයාගේ මල්ලීට මම කතා කලේ. ඒ මල්ලී කිව්වා ඒගොල්ලොන් තීරණය කලේ 8 දෙනෙක් විතර නෙමෙයි තව 20 ක් විතර ඒ කට්ටිය set වෙලා හිටියා කියලා. මං කිව්වා ඇයි එහෙම කරේ කියලා. එයා කිව්වා පිටරටවල අපේ මිනිස්සුත් මරණවා කියලා ඕගොල්ලොන් දන්නේ නැහැ. එහෙම කියලා කිව්වේ. ඊට පස්සේ එයා කිව්වා මෙහෙම තමා අයියය,. එයාගේ යාළුවයි එක්කෙනෙක් බරා කියලා හොටෙල් එකේ blast කලා කියලා. ඉන් පස්සේ පස්සේ තමයි Church වලින් ගොඩාක් ළමයි මැරුණා කියලා කිව්වේ. කතා කලා ඒගොල්ලෝ නමුත් ඒකට සතුටු වෙලා කතා කලේ.

ප්‍ර ; කවුද ඒකට සතුටු වෙලා කතා කලේ?

පි : එයාගේ මල්ලී.

ප්‍ර : ඇයි ඒ සතුටු වුණේ?

පි : ඒ කියන්නේ Christian ගොඩාක් අය මේ blast එකෙන් කස්තුන්ගේ පල්ලියෙන් තමයි, ඒකත් අසාද්ගේ තනි ඒ කියන්නේ පොඩි ළමයි ඒගොල්ලන් තමයි ගොඩාක් blast වෙලා කියලා එයා කිව්වේ. පිටරටවලින් ඔයාට මේ හදිසි නැහැ අපේ පොඩි ළමයින් තමයි පිටරටවලින් ඒගොල්ලෝ මරණවා කියලා? මම කිව්වා පොඩි ළමයින් ඒගොල්ලන්ට තේරෙන්නේ නැහැ ඇයි එහෙම කළේ කියලා. ඔයාට ඒවා පැහැදිලි කරන්න බැහැ දැන් ඒගොල්ලන් කරලා ඉවරයි කියලත් එයා කිව්වේ.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් හාදියා මට පොඩි ප්‍රශ්නයක් තියෙනවා. හාදියට සහරාන් එයා කරන හැම දෙයක්ම වගේ කිව්වනේ නේද?

පි : ඔව්.

ප්‍ර : දැන් ඉස්සර වෙලා මම කිව්වාම හාදියා පිලිගත්තා සහරාන් කරන දේවල් හාදියට කිව්වා කියලා. එතකොට හාදියා දැන් දැන ගෙන හිටියා යූරියා එකතු කළා සහරාන්. ඒ වගේම ඩෙටනේටර්ස් වගේ දේවල් එකතු කෙරුවා. ඇසිඩ් වගේ දේවල් එකතු කෙරුවා. දැන් හාදියා ඒ වගේ දේවල් එකතු කරන්නේ නිකම් දේවල්වලට නෙමෙයි නේ, නේද? ඒ කියන්නේ මොකක් හරි විනාශකාරී දෙයක් කරන්න. හාදියට සාමාන්‍ය දේවල් ගැන හොඳට තේරෙනවානේ. එතකොට හාදියට ඒ වෙලාවේ හිතුනේ නැද්ද මේ මගේ මහත්තයා කරන්න යන්නේ ලොකු වැරැද්දක්, ලොකු අපරාධයක් කියලා?

පි : ඒකියන්නේ මිස් කවද්ද?

ප්‍ර : ඒ කියන්නේ දැන් මං මේ 21 වෙනිදට ඉස්සරවෙලා ගැන තමයි හාදියාගෙන් අහන්නේ. හාදියා මම අහන ප්‍රශ්නවලට උත්තර දීලා මට කිව්වනේ යූරියා සහරාන් එකතු කරන බව හාදියාට තේරුණා. ඒ වගේම සහරාන් IS එකේ බෙල්ල කපන පිංතූර, Videos බලපු බවත් හාදියා දන්නවා. ඒ වගේම යම් යම් අවස්ථාවල්වලදී හාදියා දැනගෙන හිටියා සහරාන් එක එක Training කලා කියලා නේද? එතකොට වනාතවිල්ලුවේ තිබිලා ඇසිඩ් තිබ්බ ඒවා හම්බ වෙලා තිබුණා. ඊළඟට ඒ වගේම එතන තිබිලා ඩෙටනේටර්සුත් හම්බ වෙලා තිබුණා කියලා කිව්වනේ, ඒ වගේ ගොඩාක් දේවල් හම්බ වෙලා තිබුණා. දැන් වනාතවිල්ලුවේ තිබ්බ බඩු හාදියා දැන ගෙන හිටියද CID එක හොයාගෙන තිබුණා කියලා. CID එක ඒ බඩු හොයා ගත්තට පස්සේ හාදියා දැක්කද සහරාන් කලබල වෙලා තිබුණා? එතකොට ඔය වගේ හාදියා හොඳට දන්නවානේ සහරාන්ව නේද ඇයි දැන් 2009 ඉඳලානේ හාදියා සහරාන් එක්ක ජීවත් වෙන්නේ. එතකොට සහරාන් මේ කරන්න යන්නේ මොකක් හරි ලොකු විනාශකාරී දෙයක් කියලා හාදියාට හිතුනා නේද?

පි : ඔව්. ඒ කියන්නේ ඒගොල්ලන්ට මං ඇහුවා ඒ වෙලාවේ ඇයි බඩු එකතු කරන්නේ කියලා. ඒක කිව්වේ අපි නිකම් එකතු කරනවා කියලා තමයි මම ඇහුවම කිව්වේ. මං කිව්වා යූරියා ගොඩක් හොයා ගත්තද කියලා. ඒ වුණාට මම දන්නේ නැහැ යූරියාවලින් මොනවද හදන්නේ කියලා. ඉන්පස්සේ එයාටත් මං ඒවෙලාවෙත් ඇහුවා එයා කිව්වා නැහැ. ඊට පස්සේ එයා කිව්වා ඒ කියන්නේ අපි දැන් නෙමෙයි අවුරුදු 5 ක් හරි 10 කින් හරි ගියාට පස්සේ මේකට

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අපි පිටරටවලින් ඉස්තිෂාඩ් කියලා වාහනයෙන් බෝම්බ හදලා එවනවා එහෙම කියලා blast එහෙම කරනවා කියලා

ප : ඉස්තිෂාඩ් එක?

පි : ඔව් ඒ කියන්නේ රානුව පොලිස් අය තියෙන කැම්ප්වල එහෙම ගහනවා කියලා තමයි කිව්වේ ඉස්සෙල්ලා.

ප : දැන් එහෙම කරන එක හරිද හාදියා?

පි : ඒක වැරදියි.

ප : එතකොට දැන් රිල්වාන් කිව්වා කියලා කිව්වා අර පුපුරපු තැන්වල විශේෂයෙන්ම පල්ලිවල වෙන්න ඇති පොඩි ළමයින් මැරිලා හිටියා කියලා. දැන් හාදියටත් පොඩි අය ඉන්නවානේ. ඒ වෙන කොට පුතා හිටියා දුව හිටියා. එතකොට දැන් හාදියා කිව්වා පොඩි ඒගොල්ලන්ට කිසි දෙයක් තේරෙන්නේ නැහැ කියලා. හාදියා හිතන්නේ ඒ වගේ දෙයක් පොඩි ළමයින්ට කරන එක හොඳයි කියලද?

පි : නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : හාදියා, හිදායා නෙමෙයි නේ හාදියා නේද?

පි : ඔව්.

ප : දැන් මේ සහරාන්ට 98 A, මොහිදීන් පල්ලිය පාර, කාත්තන්කුඩියේ ගෙදරක් තිබ්බා නේද?

පි : ඔව්.

ප : ඒකට මොකද වුණේ?

පි : ඒ ගේ එයාගේ අම්මගේ මහ ගෙදර ඒ.

ප : ඒක දිගටම තිබ්බද?

පි : ඒක තිබුණා. ඉන් පස්සේ 2016 ඉඳලා එයාගේ මල්ලී රිල්වාන් ඒ ගෙදර හදලා ඒකෙන් තමයි හිටියේ.

ප : එතකොට අප්‍රේල් 21 වෙනකනුත් 2019 ඒ ගෙදර තිබ්බද?

පි : ඒ කාත්තන්කුඩි ඒ ගෙදර ඒක තිබුණා.

ප : දැන් හාදියාට මතකද මේ 2018 ජූලී මාසේදී කාත්තන්කුඩි පාලමුනෙ ගෙදරක යම් දෙයක් වුණා කියලා ඔයාට දැන ගන්න හම්බ වුණාද?

පි : පැහැදිලි කරන්න.

ප : 2018 ජූලී මාසේදී පන්ති 3 ක් ගැන මතකද?

පි : දේශනාවල් තිබුණා කාත්තන්කුඩි පාලමුනෙ ප්‍රදේශයේ. ඒ කාත්තන්කුඩි පාලමුනෙ ladies ලට තිබුණ දේශනා.

ප :: එතකොට ඔයාට මතකද කබීර් හෂීම්ගේ නමක් මතකද?

Registrar Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පි : මතකයි.

ප්‍ර : ඒ කබීර් හෂීම්. එතකොට එයාගේ සම්බන්ධීකරණ ලේකම් කෙනෙක් ගැන මතකද?

පි : මතකයි.

ප්‍ර : මොකක්ද ඒකේ මතකයේ තියෙන්නේ ඔයාට?

පි ; 2019 මාර්තු මාසේ 10 න් පස්සේ මාවනැල්ල ඒ කියන්නේ මාවනැල්ල පැත්තේ තස්ලිම් කියලා කබීර් හෂීම්ගේ Secretary එයා ඊට කලින් එයාව මෙහෙම එයාව ගිහිල්ලා මරන්න කියලා නවුෆර් තමා මුලින්ම සහරාන්ට ඒ උපදේශය දුන්නේ.

ප්‍ර : ඔයා ඒක දැනගෙන හිටියද?

පි : මං එතකොට කටුවාපිටිය ගෙදර තමයි හිටියේ සහරාන් එක්ක තමයි හිටියේ.

ප්‍ර : එතකොට ඔයාට ඇහුනද ඒ උපදෙස දෙනවා?

පි : ඔව්. ඊට පස්සේ සහරාන් නවුෆර්ට ආයෙත් Voice Recorder එක එව්වා මං බලනවා ෂේක් කියලා තමයි එව්වේ. ඒකට බලන්නේ නැහැ..

ප්‍ර : එතකොට සහරාන් නවුෆර්ට කතා කළේ ෂේක් කියලද?

පි : ඔව්.

ප්‍ර : හරි කියන්නකෝ ඉතින්?

පි : ඉන් පස්සේ ෂේක් මං ඒක බලන්නම් කියලත් කිව්වා. ඊට පස්සේ ඒකේ යන්න එයාව shoot කරන්න කලින් ඒවා බලන්න දෙන්නෙක් යවලා බලන්න ඕනේ කොහොමද කියලා ඊට පස්සේ දැන්ම කට්ටිය යවන්න ඕනේ කියලා කතා කලේ.

ප්‍ර : ඊට පස්සේ?

පි : ඊට පස්සේ තමා මාර්තු මාසේ දින හරියට මතක නැහැ ඒ වෙලාවට පාන්දර 12 ½ ට විතර කටුවාපිටියේ ගෙදර ඉඳලා අබ්දුල්ලා. අබු අබ්දුල්ලා, අබුෆලා, අබුල් හදික්, අබුසිලා ඒ කට්ටිය ගියේ. බයික් එකෙන් ගියා අබුෆලා. ඒගොල්ලන් තමා

ප්‍ර : ඒ කියන්නේ ෂෙයිනි නියාස් කියන අයද?

පි : නැහැ නැහැ එතකොට ඒගොල්ලන් හිටියේ නැහැ.

ප්‍ර : නම් ටික කියන්න කවුද ගියේ හතර දෙනා?

පි : ඒ කියන්නේ ඒගොල්ලන්ගේ අබු නම කියන්න ඕනද?

ප්‍ර ; ඔව් ඒ ටික ආපහු කියන්න?

පි : අබුෆලා, අබුසිලා, අබුල් හදීක්, අබු අබ්දුල්ලා.

ප්‍ර : ඒ කට්ටිය මොකටද ගියේ කියලා දන්නවද?

පි : අබුෆලා බයික් එකේ ගියා. අනෙක් කට්ටිය වෑන් එකෙන් තමයි ගියේ.

ප්‍ර : කොහේටද ගියේ කියලා දන්නවද?

Page 145 of 196

- 2251 -

පි : ඒ වෙලාවේ මම දන්නේ නැහැ කොහේද යනවා කියලා. ඊට පස්සේ තමා පාන්දර යන කොට ඒගොල්ලන් සද්දයක් 12 ට 12 ½ විතර ඊට පස්සේ තමයි ඒගොල්ලන් ගියේ.

ප්‍ර : ඒ කියන්නේ 12 ½ ට තමයි ගියේ?

පි : ඔව් කටුවාපිටිය ගෙදර ඉඳලා 12 ½ ට තමයි ගියේ.

ප්‍ර : හරි ඊට පස්සේ?

පි : ඊට පස්සේ ගිහිල්ලා තමා පාන්දර 3, 4 ට වගේ සහරාන්ට call එක ආවා. ඊට පස්සේ සහරාන් පල්ලෙහාට ගියා. ඊට පස්සේ ඒ කියන්නේ තක්බීර් අල්ලාහු අක්බර් කියලා සද්දයක් ඇහුනා. ඊට පස්සේ මං දන්නේ නැහැ මොනවද කියලා එයා පල්ලෙහාට ගියා. එතකොට කස්තුන් හිටියා ගෙදර. එයා කස්තුන් එක්ක තමයි පල්ලෙහා අර කාමරයේ හිටියේ. ඊට පස්සේ උදේ ආපහු එයා උඩට ආවා. මම ඒ වෙලාවේ එයාට ඇහුවා ඇයි සද්දේ රෑ කට්ටිය කොහේද ගියේ කියලා, එයා කිව්වා නැහැ. ඊට පස්සේ උදේ සාරා Facebook එක බලන කොට තමා මාවනැල්ලේ තස්ලිම්ට වෙඩි තියලා තියෙන්නේ කියලා එයාගේ picture ත් එක්ක ගෙදර කට්ටිය අඬන Videos තිබුණේ. ඊට පස්සේ ඒගොල්ලන්ගෙන් මම ආපහු ඇහුවා කවුද කියලා, පස්සේ තමයි සහරාන් කිව්වේ මෙහෙම තමයි කියලා.

ප්‍ර : දැන් හාදියා ඉස්සෙල්ලා කිව්වා නේද අර 2016 දී විතර මට හරියටම මාසේ මතක නැහැ නවුෆර් සහරාන්ට Pen drive එකක් දුන්නා කියලා?

පි : ඔව්.

ප්‍ර : අර යුද්ධ සහ බෙලි කපන එක ගැන?

පි : ඔව්.

ප්‍ර : නවුෆර් ඊට පස්සේ වෙන මොනවද කෙරුවේ සහරාන්ට?

පි ඊට පස්සේ නවුෆර් රට ගියා එයාටPen එක දීලා. ඊට පස්සේ දෙන්නම Telegram වලින් තමයි contact කරන් කතා කරන්නේ.

ප්‍ර : එතකොට ඒ කතා කරන දේ හාදියාට ඇහෙනවද සමහරක් වෙලාවට?

පි : ඒ වෙලාවට ලං වෙන කොටත් අහලා තියෙනවා ඊට පස්සේ අරාබි වලින් කතා කරනවා දෙන්නම.

ප්‍ර : දෙන්නම අරාබිවලින්ද කතා කරන්නේ?

පි : ඔව්. එහෙම කතා කරනවා.

ප්‍ර : සහරාන්ට සිංහල කතා කරන්න පුළුවන්ද?

පි : එයාට සිංහල බැහැ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සිංහල කතා කරන්න බැහැ නේ. නමුත් අරාබි භාෂාව කතා කරන්න සහරාන්ටයි නවුෆර්ටයි දෙන්නටම පුළුවන්?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔයා ඉස්සෙල්ලා කිව්වානේ අබු හින්දි කියලා ඉන්දියාවේ එක්කෙනෙක් සහරාන්ට messages එවනවා සහරාන් එයාට messages යවනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ messages ආවේ දෙමළ භාෂාවෙන් කියලා කිව්වා නේද?

පි : දෙමළ භාෂාවෙන්.

ප්‍ර : ඒකේ මොනවද තිබ්බේ, ඉන්දියාවෙන් සහරාන්ට එවපු පණිවිඩවල මොනවද තිබ්බේ?

පි : ඒ කියන්නේ Voice Recorder එකේ තමයි තිබ්බේ.

ප්‍ර : ඔව් Voice Recordings වල මොනවද තිබ්බේ?

පි : ඒ කියන්නේ එයා කරපු දේශනාව FB වලින් දාලා තිබුණා. ඊට පස්සේ එයා සමහර වෙලාවට උපදෙස් දෙනවා මෙහෙමයි කරන්නේ කියලා ඒකේ තිබුණා.

ප්‍ර : මොනවද උපදෙස් දෙනවා කියන්නේ?

පි : ඒ දේශනාවට ඒ පැත්තේ ඉන්දියාවේ පැත්තේ IS කට්ටියත් හිටියාලු. ඒ අවුරුදු 15 ක්ද කොහේද ඒ පොඩි කොල්ලො එක්කෙනෙක් ඒකට ගිහිල්ලා blast කළාලු. ඒ ගැන විස්තරයත් එයාට එවලා තිබුණා.

ප්‍ර : ඒ කියන්නේ දැන් ඉන්දියාවේ ඉන්න එක්කෙනා තමයි ඒක සහරාන්ට එවන්නේ?

පි : ඔව්.

ප්‍ර : එහේ කරන දේවල් ගැන?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ කියන එක්කෙනාද ඔය ගිහිල්ලා blast කරනවා ගැන කියන්නේ? කවුද ඒක කරලා තියෙන්නේ කියලා කිව්වද අබු හින්දි?

පි : අබු හින්දි එයා කිව්වා එයා පොඩි වයසේ කියලා එයාගේ විස්තර එවලා තිබ්බා. සහරාන්ගේ Phone එකේ.

ප්‍ර හා එතකොට අබු හින්දි පොඩි ළමයෙක් කියලද, තරුණ කෙනෙක් කියලද?

පි : නැහැ.

ප්‍ර : එහෙනම්?

පි : අබු හින්දි කියන්නේ එයා ලොකුද පොඩිද කියලා මම දන්නේ නැහැ ඒ IS සංවිධානයේ පොඩි කොල්ලෙක් තමාblast එක කලා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියලා සිරියාවලින් ගිහිං එයා blast කලා කියලා ඒ විස්තරය තමයි සහරාන්ට phone එකෙන් Telegram වලින් එවලා තිබ්බේ.

ප්‍ර : එතකොට දැන් ඔය සහරාන්ට ඔය සල්ලි හුඟක් දුන්නේ කවුද? පිටරටින් ආවද නැත්නම් ලංකාවේ කවුරු හරි දුන්නද?

පි : ලංකාවේ.

ප්‍ර : කවුද දුන්නේ?

පි : අබුබරා කියලා තමා ඔක්කොටම වියදම් කරනවා කියලත් එයා කිව්වේ.

ප්‍ර : එයාගේ නම විතරද හාදියාට කිව්වේ?

පි : ඔව්.

ප්‍ර : වෙන කාගේවත් නම් කිව්වේ නැද්ද?

පි : වෙන කාගෙත් කිව්වේ නැහැ අබුබරා කියලා තමයි එයත් කිව්වේ.

ප්‍ර : එතකොට ඔය සහරාන්ලයි අනෙත් අයත් එක්ක කවුරු හරි දේශපාලනඥයෝ සම්බන්ධ වෙලා හිටියද?

පි : නැහැ.

ප්‍ර : හිටියේ නැහැ?

පි : නැහැ.

ප්‍ර : ඒ කට්ටිය හම්බ වෙන්න ගියාද?

පි : නැහැ.

ප්‍ර : කිසිම දේශපාලනඥයෙක් ගැන කතා කරනවා හාදියාට ඇහිලා නැද්ද?

පි : දේශපාලන කට්ටියට Against වලට තමයි එයා කතා කරන්නේ.

ප්‍ර : ඒ කියන්නේ කාගේවත් නම කියනවා ඇහිලා නැද්ද?

පි : නැහැ.

ප්‍ර : අර සාරාට කිව්වා නේද 20 දෙනෙක් විතර ප්‍රහාරයට සම්බන්ධ වෙන්න හිටියා කියලා?

පි : 20 ක් විතර හිටියා කිව්වා.

ප්‍ර : ඇයි 20 ම ඉඳලා නැත්තේ එතන?

පි : ඊට පස්සේ ආපහු දෙවෙනි පාර දෙවෙනි attack එකට තමයි ඒගොල්ලන් යන්න ඉන්නේ කියලත් කිව්වේ.

ප්‍ර : ඒ කියන්නේ 8 දෙනෙක් මැරුණත් අනෙත් ඉතුරු අය දෙවෙනි attack එකකට යන්නේ කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ කට්ටියගේ නම් එහෙම හාදියාට ඇහුනද කියනවා?

පි : ඒ කියන්නේ 24 වෙනිදා එයාගේ අම්මලා හිටියා නින්දවුර් ගෙදරින්. ඒ ගෙදර ඉන්න කොට තමයි එයත් කිව්වේ එයාගේ අම්මලා ඉස්සරහා කොළඹ පැත්තේ තව කට්ටියත් හිටියා පොඩි

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වයසේ තමයි කියලා. එක්කෙනාට අවුරුදු 24, 25 ක් ඒ වගේ 26 ක එක්කෙනෙක් ඔහොම කියලා වයසත් කිව්වා එයා.

ප : එයා කියලා කිව්වේ කවුද?

පි : රිල්වාන් කිව්වේ එයාගේ අම්මලට.

ප : ඒ 24, 26 වයස අයගේ නම් එහෙම කියනවා ඇහුණද?

පි : නම මට මතක නැහැ වයසත් කිව්වා.

ප : කොහේද කියලා කිව්වද?

පි : කොළඹ පැත්තේ කියලා කිව්වේ.

ප : එච්චරයිද කිව්වේ?

පි : ඔව්.

ප : එතකොට 26 වෙන කල් මුකුත් වුණේ නැහැනේ කොළඹ නේද?

පි : ඔව්.

ප : එතකොට ඒ සම්බන්ධයෙන් ඇයි එහෙම වුණේ නැත්තේ කියලා රිල්වාන් කිව්වද ඔයාට?

පි : ඒගොල්ලන් කිව්වා ඉන් පස්සේ අනිත් කට්ටියට දැන් curfew දාලා ප්‍රශ්නේ කියලා ඒගොල්ලන් කිව්වේ. පස්සේ තමා තව ඒකට දිවුරුම් දීලා කට්ටියක්. ඒගොල්ලන් ඒකට කැමතියි කියලා කැමැත්ත අරගෙන තමයි දෙවෙනි ප්‍රහාරය කරන්න ඕනේ කියලා ඒගොල්ලෝ කතා කලේ. ඒ ඔක්කොම භාර දීලා ගියේ ෂෙයිනිට කියලා කතා කරලා.

ප : මොනවා භාරදීලද ගියේ?

පි : ඒ කියන්නේ සහරාන් කියපුවා වගේ දේශනාව, Article ලියන ඒවා ඔක්කොම ෂෙයිනිට කරන්න ඕන කියලා තමයි කියලා තිබුනේ කියලා තමා කතා කරේ. ඉන්පස්සේ රිල්වාන් එයාගේ අයියටත් කිව්වා ෂෙයිනිට ඔයා තමයි අයියා බලන්න ඕනේ කියලා.

ප : එතකොට දැන් අබුහින්ද් කියන එක්කෙනා හැරෙන්න සහරාන්ට පිටරටවල කවුරු හරි හැමදාම නැත්නම් හුඟක් වෙලාවට කතා කෙරුවද?

පි : පිටරටවලින් කියන්නේ ගොඩක් අය ඒකට සම්බන්ධ messenger එයත් එක්ක chat කරනවා. කටාර්වල හිටියා කට්ටිය. සෞදිවලින් හිටියා කට්ටිය. ඒගොල්ලන් එක්ක chat කරනවා messenger වලින්.

ප : ඒ chat කරන්නේ ඒ කට්ටිය මොනවද කියන්නේ? මොනවා ගැනද කතා කරන්නේ?

Presidential Secretariat's Copy

FAIR COMMENT BY JEZEEM

පි : ඒ කියන්නේ chat කරනවා විතරයි, message මං ඒවා වැඩිය බලලා නැහැ. ඒ වෙලාවේම එයා delete කරනවා සමහර ඒවාmessageවල.

ප්‍ර : ඒවෙලාවේම delete කරනවා?

පි : ඔව්.

ප්‍ර : අර සහරාන්ගේ පල්ලිය හදන්න අර සිංගප්පූරුවේ එක්කෙනාට අමතරව වෙන කවුරු හරි එක්කෙනෙක් ලොකු ගානක් දුන්නද?

පි : ඒ පල්ලියේ කට්ටිය ඔක්කොම එකතු වෙලා සීට්ටුවක් දාලා තිබ්බා. ඒ සල්ලි ඔක්කොම අරගෙන තමයි ඒ ගොල්ලෝ ඒක හැදුවේ.

ප්‍ර : සහරාන් හාදියාට කිව්වද කවදා හරි නුවරඑළිය පැත්තේ අපි ඉන්න කොට මේ අපි ඉන්න ගෙදරට පොලීසියෙන් ආවා කියලා?

පි : ඒ කියන්නේ පස්සේ තමා එහේ ඉන්න කොට කියලා නැහැ, මෙහේ ඇවිල්ලා පස්සේ තමයි මම දැන ගත්තේ. ඒගොල්ලෝ දේශනා කරන්න ගිය ගෙදරට පොලීසිය ආවා කියලා.

ප්‍ර : එහෙම කිව්වද?

පි : ඔව්.

ප්‍ර : කවුද කිව්වේ?

පි : ඒ කියන්නේ 2019 කටුවාපිටියේ ආවායින් පස්සේ තමයි ඒ කතාව කිව්වේ.

ප්‍ර : ආ ඒ කියන්නේ බෝම්බ පුපුරන්න ඉස්සර කිව්වද ?

පි : ඉස්සෙල්ලා.

ප්‍ර : සහරාන් කිව්වද කතාව?

පි : ඔව්.

ප්‍ර : මොනවද වෙන කිව්වේ ඒක ගැන?

පි : ඒ කියන්නේ ඒ ගෙදරට පොලීසි එක ඇවිල්ලා හිටියා කියලා.

ප්‍ර : ඇවිල්ලා?

පි : ඇවිල්ලා check කරාලු. ඊට පස්සේ කට්ටිය හිටියාලු. අනිත් එකේ weapon තිබුණලු. ඒකේ ලොකු එක අරගෙන මිල්හාන් අබුසිලා කියන එක්කෙනෙක් ඒකළිඳ ඇතුලට දාලා තිබ්බා කියලා.

ප්‍ර : ඒ කියන්නේ තුවක්කුව ළිඳ ඇතුළට දාලා?

පි : ඔව්. ඒකේ දැම්මලු. අනිත් එකේ පොඩි එකක් සහරාන්ගේ ලැප්ටොප් බෑග් එකේ තිබුණලු. ඒක ඇතුලේ රත්තරන් බඩුත් තිබුණලු. ඒකෙන් පොලීසියෙන් check කරන කොට එයා ඒweapon එකෙන් ඒ ගොල්ලන් මෙහෙම කරලා තමයි බැලුවලු. ඒ වුණාට අහුවුණේ නැහැ කියලා කිව්වා.

ප්‍ර : weaponඑක බෑග් එකේ තිබිලා තියෙනවද?

FAIR COMMENT — BY JEZEEM —

පි : ඔව්. එයා රත්තරන් බඩු විතරයි එළියට ගත්තේ කියලා කිව්වේ.

ප්‍ර : එතනින් මොනවා හරි අරන් ගිහිල්ලා තිබ්බද පොලීසිය?

පි : නැහැ. ඊට පස්සේ කට්ටියගේ Identy එහෙම check කළා කියලා එහෙම කතාවක් කිව්වේ.

ප්‍ර : සහරාන්ද කිව්වේ ඒ ගැන?

පි : ඔව්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර : හාදියා 2019 පෙබරවාරී මාසේ 20 වෙනිදා කැකුණුගොල්ලේ ගෙදරින් අම්මයි තාත්තයි දාලා හාදියා ආවට පස්සේ තැන් තැන්වලට ගියානේ ගෙවල් වලට?

පි : ඔව්.

ප්‍ර : Safe Houses කිහිපයකට ගියා කිව්වා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ වගේම හාදියා එක එක තොරතුරු සහරාන්ලා කරන දේවල් ගැන දැන ගත්තා කියලා කිව්වා?

පි : ඔව්.

ප්‍ර : එතකොට කොයි වෙලාවක හරි හාදියා ගෙදරට කතා කරන්න එහෙම උත්සාහ කළේ නැද්ද?

පි : ඒ කියන්නේ මං කිව්වා..

ප්‍ර : ඒ කියන්නේ Telephone කරලා දැන් තාත්තත් එක්ක හාදියා ගොඩක් කිට්ටුයිනේ, එතකොට හාදියා මං ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නෙකට පිළිතුරු දෙන ගමන් කිව්වා තාත්තා එක වෙලාවක හාදියාට කිව්වා කියලා පුතා ඔයා Divorce වෙන්න කියලා. දැන් මම අහන්නේ 2019 පෙබරවාරී මාසේ 20 වෙනිදා එහෙම ගෙදරින් ආවට පස්සේ ඔය නැවත 2019 නින්දවුර් වලට ගියානේ අප්‍රේල් මාසේ 20 වෙනිදා. ඒ වෙනතුරු කොයි වෙලාවක හරි හාදියාගේම අම්මටයි, තාත්තටයි කතා කරලා හාදියා ඉන්නේ කොහේද. මොකද වෙන්නේ කියන දේවල් ගැන ඒගොල්ලන්ට කියන්න පුළුවන්කම තිබ්බද?

පි : නැහැ. ඒ කියන්නේ මං 2019 February 20 ආවයින් පස්සේ මං එයාට ඉල්ලුවා මං ගෙදරට යන්න ඕනේ ඒගොල්ලන් එක්ක කතා කරන්න ඕන කියලා.

ප්‍ර : කාටද කිව්වේ?

පි : සහරාන්ට. ඉන් පස්සේ එයා කිව්වා බලන්න ඕනේ දැන් CID එකේ කට්ටිය ඒ පැත්තේ ඉන්නවා කියලා ආරංචි වුණා කියලා. ඊට පස්සේ නවුෆර්ගේ පුතා එයාව එවලා තමයි අපේ ගෙදරින් බලන්න

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියලා ඒ පුතා තමයි නවුෆර්ට පණිවිඩය කියලා නවුෆර් සහරාන්ට පණිවිඩය කියලා තිබුණේ.

ප්‍ර : නවුෆර්ගේ පුතාගේ නම මොකක්ද?

පි : අබ්දුල්ලා.

ප්‍ර : එතකොට අර ඉස්සරවෙලා අබ්දුල්ලා ගැන කිව්වේ මේ අබ්දුල්ලා ගැනද?

පි : නැහැ.

ප්‍ර : ඒ වෙන අබ්දුල්ලා කෙනෙක්?

පි : ඔව්.

ප්‍ර : එතකොට අබ්දුල්ලා තමයි පණිවිඩය දැන් දෙන්නේ නවුෆර්ට?

පි : ඔව්.

ප්‍ර : මොනවා ගැනද දෙන්නේ?

පි : එයා කිව්වා මං ආවටම පස්සේ ආපහු CID එකෙන් ආපහු ඒ ගෙදර ඇවිල්ලා ඔක්කොම check කලාලු. දවස් 2 කට, 3 කට කලින් දිගටම එක එක්කෙනා ඇවිල්ලා අහනවාලු. එහෙම කියලා ඒ විස්තර නවුෆර්ට එයාගේ පුතා කියලා තිබ්බා.

ප්‍ර : එතකොට දැන් එක අතකින් සහරාන් ඔය යම් යම් හේතූ දීලා ගෙදර ඒගොල්ලන් එක්ක සම්බන්ධ වෙන්න අවස්ථාවක් ලැබුණේ නැහැ කියලා කිව්වානේ හාදියාට?

පි : ඔව්.

ප්‍ර : එතකොට සාරා කොහොමද, සාරා දැන් යාළුයිනේ හාදියත් එක්ක?

පි : ඔව්.

ප්‍ර : සාරා ඉඩ දුන්නද හාදියට ගෙදරට කෝල් කරන්න, ගෙදරත් එක්ක සම්බන්ධ වෙන්න?

පි : එහෙම නෙමෙයි, එහෙම සම්බන්ධ වෙන්න අවස්ථාවක් තිබුණේ නැහැ. ගෙදරට ගන්නේ නැහැ.

ප්‍ර : ඇයි එහෙම කියන්නේ?

පි : ඒ කියන්නේ ඒ phone එකෙන්නෙට්සිම් දාලා වෙන App එකේ Threem App එකේ දාලා දුන්නා. ඒ Appවලින් Link කරලා තිබ්බේ සහරාන්ගේ අම්මයි, ඒ වගේ සාරාගේ Link එකයි, සහරාන්ගෙයි, ෆෙරෝසගේ Link එක විතරයි ඒකේ Add කරලා දාලා දුන්නේ. ඒ Threem App වලින් තමයි කතා කලේ.

ප්‍ර : එතකොට එහෙම Applications දාලා දුන්නාම කතා කරන්න පුළුවන් වෙන්නේ ඒ Applicationsවලට Addකරලා තියෙන අයත් එක්ක විතරද?

පි : ඔව්

Prisoner's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට එහෙම නම් Telephone එකක් තිබ්බේ නැද්ද හාදියට හාදියගේම අම්මයි තාත්තයිත් එක්ක වෙනම කතා කරන්න?

පි : එහෙම තිබුණේ නැහැ ඒකේ දාලා තිබ්බේ නෙට් සිම් විතරයි කියලා සහරාන් කිව්වා phone හදලා දෙන කොට Normal call මේකෙන් ගන්න එපා. ගන්නත් බැහැ කියලා.

ප්‍ර : ගන්න බැහැ කියලා කිව්වා?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව හාදියා කියන්නේ හාදියාට ඕන වුණාට ගෙදරට කතා කරන්න අම්මා තාත්තට කතා කරන්න පුළුවන්කමක් හාදියාට තිබුණේ නැහැ කියලද?

පි : ඔව්.

ප්‍ර : දැන් මං හාදියගෙන් අහලා ප්‍රශ්න කෙරුවනේ අට්ටාලව්වේනේ ගෙදරට සාරයි, ෆෙරෝසයි, සෙයිනිගේ නෝනයි, සෙයිනියි ගියපු අවස්ථාවයි, එතකොට සයින්දමර්දු ගෙදරට හාදියයි, හාදියගේ බබාලා දෙන්නයි, රිල්වානුයි, රිල්වාන්ගේ නෝනයි ගියපු ඒ ගමන ගැන. ඒ 20 වෙනිද නේ ගියේ?

පි : ඔව්.

ප්‍ර : 20 වෙනිදා රෑ හාදියට call එකක් ආවද සහරාන්ගෙන්?

පි : ඔව් call එකක් ආවා 20 රෑ 12 ට විතර, 12, 12 ¼ ට විතර කොල් එක ආවේ.

ප්‍ර : මොනවා කියලද ආවේ?

පි : ඒකේ එයාගේ මල්ලීගේ phone එකෙන් රිල්වාන්ගේ phone එකට තමා call එකක් ආවේ.

ප්‍ර : හැබැයි රිල්වාන් දැන් හිටියේ සයින්දමර්දු ගෙදර හාදියත් එක්කනේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ කියන්නේ සහරාන් කතා කළේ රිල්වාන්ගේ phone එකට කියලද?

පි : ඔව්.

ප්‍ර : මොකක්ද කිව්වේ සහරාන්?

පි : ඒ call අරගෙන කොහොමද කියලත් ඇහුවා, ගේ හොඳයිද කියලා. ඒකේ මොනවද අඩුපාඩු කියලත් ඇහුවා. ළමයි දෙන්නා කෝ, මම කිව්වා නිදි කියලා. කෑවද කියලත් ඇහුවා. ඊට පස්සේ අපි කොහොම හරි එන්න තමයි ඉන්නේ කියලත් කිව්වා. බලන්න ඒ පැත්තට එන්න තමයි කිව්වේ එයා. ඊට පස්සේ මම කිව්වා බබාලා ඔයාව ඇහුවා කියලා. මං හෙට ගන්නම් කියලා තමා ඊට පස්සේ ඒ phone එක දෙන්න කියලා මල්ලිට දුන්නේ. එයාගේ නෝනගේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අතින් තමා රිල්වාන්ගේ නෝනා නන්නා එයාට තමා phone එක දුන්නේ. ඊට පස්සේ තමයි මල්ලී එයත් එක්ක කතා කලේ.

ප : දැන් ඊට වැඩිය කතා කරන්න හම්බ වුණේ නැද්ද සහරාන් එක්ක එදා?

පි : ඊට පස්සේ call එකක් ගත්තේ නැහැ එයා.

ප : දැන් එදා එතකොට හාදියා නිදා ගන්න ඇතිනේ, නේද?ඒ කතා කරලා ඉවර වුණාට පස්සේ නිදා ගත්තානේ?

පි :: ඊට පස්සේ ඔව් නින්ද ගියා.

ප : දැන් පහුවදා නැගිටින කොට හාදියා ඒ ගෙදරට සයින්දමර්දු ගෙදරට මොනවා හරි බඩු එහෙම ගෙනල්ලා තිබුණද?

පි : ගෙනල්ලා තිබුණා.

ප : මොනවද ගෙනල්ලා තිබ්බේ?

පි : ඒ ගෙදරින් ගොඩාක් අර සාලේ පොඩි තමයි ගේ. ඒ සාලේ හිස් බෑග් තිබුණා. රතුපාට bucket තිබුණා. ලොකු bucket 3 යි, පොඩි බේසම්, පොඩි, පොඩි ඒවා තිබුණා. ඒ වගේ Van seat එකක් තිබුණා ඒකේ.

ප : අර 20 වෙනිදා යන කොට ඔය බඩු තිබුණේ නැහැනේ ඒ ගෙදර?

පි : මුකුත් තිබුණේ නැහැ.

ප : එතකොට දැන් හාදියා ඇහුවේ නැද්ද කාගෙන් හරි කොහෙන්ද මේ බඩු කියලා?

පි : මම ඇහුවා ඊ එතකොට සහරාන් කතා කරලා මල්ලීට කතා කලා. ඒ කතා කරන වෙලාවේ මටත් ඇහුනා මෙහෙම තමා රිල්වාන් අයියට, සහරාන්ට කිව්වේ මං බලන්නම් ඒ එන ලොරි එකේ බඩු බලලා අපි මෙතනට හරි store එකට හරි ඒ ඔක්කොම ගන්නම් කියලා තමයි කතා කලේ. ඊට පස්සේ නියාස් ඉන්නවා කියලත් කිව්වා. නියාස් ඒක බලයි කියලා තමා රිල්වාන් සහරාන්ට කිව්වේ.

ප : එතකොට නියාසුත් දැන් සයින්දමර්දු ගෙදරට ඇවිල්ලා එහෙමද?

පි : ඔව්.

ප : දැන් ඔය වෙලාව කීයට විතර ඇද්ද දවසේ, ඒ කියන්නේ ඔය 21 වෙනිදා?

පි :: ඒ කියන්නේ උදේ 21 පාන්දර තමා කතා කලේ.

ප : ඊට පස්සේ තමයි අර රිල්වාන්ගේ wife ඇහුවයි කියලා කිව්වේ සුදු ඇඳුම් අඳිනවද කියලා නේද?

පි : ඔව්.

ප : දැන් ඊට පස්සේ ඒ කියන්නේ නන්නා තමයි ඇහුවේ මේ ප්‍රශ්නේ?

පි : ඔව්.

ප : ඒ වගේම හාදියා කිව්වා හාදියා සුදු ඇඳුම් ඇන්දා කියලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : නෑනා සුදු ඇඳුම් අඳින්න කියලා කිව්වාම හාදියාට හාදියා එක පාරටම හා කියලා ඒ ඇඳුම් ඇන්දද?

පි : නැහැ.

ප්‍ර : එහෙනම්?

පි : මම ඇනේඳ් නැහැ.

ප්‍ර : ඇයි ඇනේඳ් නැත්තේ?

පි : ඇයි කියලා එයා blast කලා කියලා තමයි කිව්වේ.

ප්‍ර : කවුද කිව්වේ?

පි : රිල්වාන්ගේ නෝනා.

ප්‍ර : කවුරු blast කලා කියලාද කිව්වේ?

පි : සහරාන්. ඊට පස්සේ මම ඇන්දේ නැහැ. ගොඩාක් වෙලාවකට පස්සේ ඒගොල්ලන් නැන්දා, සහරාන්ගේ අම්මට කියලා තිබුණා මෙහෙම තමයි එයා ඇඳුම අඳින්නේ නැහැ කියලා. ඊට පස්සේ තමයි එයා කෝල් අරගෙන කිව්වේ ඒ ඇඳුම ඇඳගන්න කොහොම වුණත් ඔයා එයත් එක්කනේ ජීවත් වුණේ ඒක හින්දා ඔයාගේ husband ඔයා දුකින් ඉන්න ඕනේ කියලා තමා අඳින්න කියලත් එයා කතා කලා phoneඑකෙන්. ඊට පස්සේ තමයි ඒක අඳින්න අඳින්න කියලා කිව්වාම තමයි 11 ½ ඒ වෙලාවට මං අර සුදු ඇඳුම ඇනේඳ්.

ප්‍ර : ඒ කියන්නේ හාදියා කියන්නේ මේ සහරාන්ගේ අම්මා කතා කරලා කිව්වා හාදියාට සුදු අඳින්න කියලා, තවත් කරුණු කිව්වා සහරානුයි හාදියයි එකට හිටියා, එකට ජීවත් වුණා කියලා, ඊට පස්සේ තමයි එහෙම කතා කලාට පස්සේ තමයි හාදියා මේ වගේ සුදු ඇඳුම් ඇන්දේ කියලා නේද?

පි : ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : හාදියා ඇයි මුලින්ම සුදු ඇඳුම් ඇනේඳ් නැත්තේ?

පි : මම ඇනේඳ් නැහැ එයා එහෙම blast කලා කියලා කිව්ව හින්දා. මං කිව්වා කොහේද කියලා. Hotel වලින් මිනිස්සු ඔක්කොම මැරිලා කියලා. මං කිව්වා ඇයි එහෙම කරේ කියලා. ඒවා හොඳ නැහැ ඇයි මිනිස්සු මරලා එයා ඇයි ගියේ කියලා. ඒ හින්දා මට හිතුනේ නැහැ ඒ ගැන දුක් වෙන්න ඕනේ කියලා. ඒ නිසා මං ටිකක් වෙලා ඉඳලා තමා ඒගොල්ලන්ගෙන් බේරෙන්න තමයි මං ඒ සුදු ඇඳුම ඇනේඳ්.

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර : දැන් ඔය blast එකක් ගැන කිව්වානේ, දැන ගන්න ලැබුණා කියලා. එතකොට දැන් සාරා කොයි වෙලාවක හරි නැහැ මම මෙහෙම අහන්නම්කෝ.

මුවාත් කියන්නේ සාරාගේ husband නේ?

පි : නැහැ කස්තූන්.

ප්‍ර : කස්තූන් කියන්නේ සාරාගේ husband නේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය 21 වෙනිදා වෙච්ච නැත්නම් කරපු blast වල කස්තූනුත් යම් අවස්ථාවකදී පුපුරුවා ගෙන මැරුණා කියලා දැන ගන්නට ලැබුණද හාදියාට?

පි : ඒ වෙලාවේ 11 ½ න් පස්සේ තමා ඒගොල්ලන් කිව්වේ මේ මේ කට්ටිය සහරාන්ගේ මල්ලි රිල්වාන් එයා තමා කිව්වේ මැරිලා කියලා, ඔක්කොම blast කලා කියලා. නමුත් ඒගොල්ලෝ Photos, Videos මම දැක්කේ නැහැ ඒ වෙලාවේ. පස්සේ තමා 24 වෙනිදා තමා නින්දවුර් ගෙදරදී සාරා ඇවිල්ලා එයාගේ husband ගේ Photos පෙන්නුවා. කටුවාපිටියේ අපේ ඉස්සෙල්ලා හිටිය, Rent එකට හිටිය ගේ ඉස්සරහා තියෙන ලොකු පල්ලියක තමා එයා ගියේ කියලා. ඒ පල්ලියේ තමයි ගොඩාක් අය මැරිලා කියලත් කිව්වේ.

ප්‍ර : අර බබාලා එහෙම මැරිලා තිබුණේ ඒ පල්ලියේ?

පි : ඒ පල්ලියේ එයා ඇතුළට යන කොට ළමයි එක්කෙනෙක් ඔළුවේ අත ගාගෙන තමා ඇතුළට ගියේ. ඒවත් එයා පෙන්නුවා මට වීඩියෝ එකේ.

ප්‍ර : එතකොට ඒ blast සිද්ධ වුණාට පස්සේ අබුහින්ද් කියලා කතා කලා කියලා කිව්වානේ ඔය නිතර සහරාන් ඉන්දියාවේ එක්කෙනෙක්ට?

පි : ඔව්.

ප්‍ර : ඒ අබුහින්ද්ට මොනවා හරි ලංකාවෙන් යැව්වද කියලා කියන්න දන්නවද හාදියා?

පි : ඔව් එයා රිල්වාන්ට contact කලා අබුහින්ද් කියලා.

ප්‍ර : ඒ කවදද?

පි : ඒ 21.

ප්‍ර : කීයට විතරද?

පි : 21, 8 ½ ට, 9 ට විතර අබුහින්ද් කියලා එයාට call එකක් ඇවිල්ලා තිබුණා.

ප්‍ර : උදේ ද, හැන්දෑවේද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒ කියන්නේ ඒ වෙලාව උදේ වෙලාව කියන්නේ පාන්දරත් නෙමෙයි ටිකක් දවල් වෙලාවට වගේ තමයි callඑකක් ආවේ. ඊට පස්සේ හදලා ඉවරද කියලා Videos ඔක්කොම නෑ කියලා කිව්වා. ඕගොල්ලෝ ඉන්න තැනත් Safety ද කියලත් ඇහුවා. Safetyඑකෙන් ඉන්න කියලත් කිව්වා. ඊට පස්සේ කිව්වා ඉක්මණට ඒවා කරලා මට යවන්න කියලා. Send කරන්න කියලත් කිව්වා. මං ඒකට සිරියාවට නායකයාට යවන්න ඕනේ කියලා ඒගොල්ලෝ ඒකේ ඒගොල්ලන්ට ඉදිරිපත් කරන්න ඕනේ කියලා ඒගොල්ලන්ගේ මෙහෙම තමයි blast කලේ IS සංවිධානය කියලා. එහෙම කියලා එයාගේ මල්ලී පස්සේ ඒවා කතා කලේ.

ප්‍ර : ඒ කියන්නේ රිල්වාන්?

පි : රිල්වාන්. ඊට පස්සේ එයාගේ මල්ලී සෙයිනිට තමා එදා උදේ පාන්දර ඇවිල්ලා තිබුණ බඩු එකේ සහරාන්ගේ Laptopයි, කස්තුන්ගේ Laptop, Hard disk යි 3 ක් විතර, ගොඩාක් Pen drives තිබුණා. ඒවත් Laptopයි, Hard disk අරගෙන රිල්වාන් කිව්වේ සහරාන්ගේ යාළුවා නියාස්ට ඒවත් අරගෙන ඉක්මණට සෙයිනිට දෙන්න කියලා. ඊට පස්සේ සෙයිනිට රිල්වාන් Telegram App වලින් කතා කරලා කිව්වේ ඉක්මණට Videos ඔක්කොම Edit කරලා ටක් ගාලා එවන්න හින්ද් ඒක ඉල්ලනවා කියලා. ඊට පස්සේ තමා 4 ½ ඒ වෙලාව වෙන කොට එයත් ඔක්කොම හදලා ආපහු රිල්වාන්ට සෙයිනි send කරලා එවලා තිබුනේ. ඊට පස්සේ තමයි රිල්වාන් අබුහින්ද් කියන එක්කෙනාට ඒ Videos ඔක්කොම එවලා තිබුණේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

ප්‍ර : දැන් හාදියා අප්‍රේල් 21 ට ඉස්සෙල්ලා ඔයා කිව්වා අර ඔයාට සුදු ඇඳගන්න කිව්වා කියලා ඇවිල්ලා. මතකද ඒක?

පි : අඳින්න කියලත් කිව්වා. ඔව්.

ප්‍ර : කවුද සුදු අඳින්න කියලා කිව්වේ කියලා මතකද?

පි : ඒ කිව්වේ ඉස්සෙල්ලා රිල්වාන්ගේ නෝනා නෆ්නා.

ප්‍ර : නෆ්නා නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට අබුහින්ද්ගෙන් call එක?

පි : ඔව්.

ප්‍ර : ඒක ආවේ ඒ ඔයාට සුදු අඳින්න කියන එකට ඉස්සෙල්ලද පස්සේද?

FAIR COMMENT BY JEZEEM

පි : ඉස්සෙල්ලා call එකක් ආවා අබුහින්දි කියලා රිල්වාන්ට. ඊට පස්සේ එයා කතා කලා අබුහින්දි කියලා තිබුණා. ඊට පස්සේ එයාට කතා කරා මෙහෙම තමයි කියලා එයාට අපි ඉන්නේ safety එකේ තමයි කියලා කිව්වේ. ඊට පස්සේ කිව්වා එයා කතා කලේ මොකක්ද කියලා මට ඇහුණේ නැහැ. ඊට පස්සේ අපේbrother ට කියන්නම් කියලා ඒක හදන්න කියලා Videos මම එවන්නම් කියලා තමයි එයා කිව්වේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර : දැන් ඒ Video එක මොන භාෂාවෙන් එවන්න ඕනද කියන එක පිළිබඳව මොනවා හරි උපදෙසක් එහෙම දුන්නද කියලා කියන්න දන්නවද හාදියා?

පි : ඒ කියන්නේ භාෂාව ඒගොල්ලෝ දන්නේ නැහැ.

ප්‍ර : Language දෙමළෙට එහෙම පරිවර්ථනය කරලා එවන්න කිව්වද? කොහොමද කිව්වේ කියලා ඒක දන්නේ නැහැ?

පි : 21ඒගොල්ලෝ දිවුරුම් ගත්ත Video එක කියලා

ප්‍ර ; දිවුරුම් ගත්ත Video?

පි : ඔව්.

ප්‍ර : ඒ Video දැක්කද ?

පි : මං ඒ වෙලාවේ දැක්කේ නැහැ ඒ Video

ප්‍ර : පස්සේ වෙලාවක දැක්කද?

පි : පස්සේ තමා ඒ Video එක මං දැක්නේ.

ප්‍ර : ඒ කොයි වෙලාවේ වගේද දැක්කේ?

පි : ඒ 24, 25 වෙන කොට තමා එයාගේ සාරාගේ Phone එකෙන් කට්ටියගේ Photos, 8 දෙනාගේ Photos පොඩි seconds 12 අර පොඩි Video එකක් දාලා ඒගොල්ලන්ට අබු නම දාලා තිබුනේ 8 දෙනාගේම නම. ඒවායින් දැක්කේ මම. ඊට පස්සේ කිව්වා එක් එක්කෙනා ඒගොල්ලෝ උපදෙස් අර දේශනා වගේ පොඩි පොඩි විනාඩි 30 ක් පැයක් විතර ඒ කට්ටිය දේශනා කරලා තිබුණා කියලා.

ප්‍ර : දැන් නවුෆර් මවුලවි ඔය අබුහින්ද් එක්ක මොකක් හරි සම්බන්ධයක් තිබුණද?

පි : ඔව් තිබුණා.

ප්‍ර : මොකක්ද තිබුණ සම්බන්ධය?

පි : නවුෆර් මවුලවිට අබුහින්දි කියන එක්කෙනෙක් අරාබිවලින් ඒ කියන්නේ ඒගොල්ලන්ගේ IS කියන්නේ පිටරටවලින් ගොඩාක්

FAIR COMMENT BY JEZEEM

දේවල් අරාබිවලින් තියෙනවා. ඒවා Translate කරන්න නවුෆර්ට යවලා තියෙන Pdf වලින්. ඒකෙත් නවුෆර්ට ඉස්සෙල්ලා එවලා පස්සේ කිව්වලු මේක Translateකරලා එවන්න කියලා. එය පරක්කු වුණාම තමයි සහරාන්ට කියලා තිබුනේ මම නවුෆර්ට ෂේක්ට එවලා තිබුණේ Pdf වලින් අරාබි පොඩ්ඩක් Translateකරලා එවන්න කියලා ඉක්මනට කියලා. ඒ වෙලාවේ තමයි මම දැන ගත්තේ අබුහින්දි කියන එක්කෙනෙක් නවුෆර් එක්කත් සම්බන්ධතාවයක් තිබුණා කියලා.

ප්‍ර : එතකොට මේ සහරාන් එක්ක සම්බන්ධතාවය තිබුණ අබුහින්ද්දුයි නවුෆර් මවුලවි එක්ක සම්බන්ධතාවය තිබුණු අබුහින්ද්දුයි ඒ දෙන්නම එක්කෙනෙක් නේද?

පි : එක්කෙනෙක්.

ප්‍ර : ඒ අබුහින්ද් මොකටද ඔය blast වල Video එක එවන්න කියලා තිබ්බේ?

පි : ඒ එවන්න කියලා තිබ්බේ සිරියාවේ ඉන්න නායකයා අබු බක්කර් අල්බග්ඩාඩි කියලා එයාට යවන්න ඕනේ කියලා තමයි එයා ඉක්මණට එවන්න කියලා තිබුණේ.

ප්‍ර : ඒ අනුව සෙයිනි ඒක හැදුවද?

පි : ඒක Edit කරලා සෙයිනි රිල්වාන්ට එවලා තිබුණා. රිල්වාන් තමා අබුහින්ද්ට ඒක sent කලේ.

ප්‍ර : එතකොට දැන් ඔය 21 වෙනිදානේ, 22, 23 වගේ දවස්වල මොනවා හරි වුණාද?

පි : 23 අලුත් වාහනය ගන්න ඕන කියලා නියාස් මුලින් ගිහිල්ලා උදේම ගිහිල්ලා බලලා ආවේ. ආපහු ඇවිල්ලා එයා එන්න කලින් රිල්වාන් මටත් කිව්වා නෑනා මෙහෙම තමයි ඔයා ගැන බලන්නේ අයියා ලක්ෂ 80 ක් විතරයි දුන්නේ කියලා. ඒ සල්ලිවලට වාහනයක් ගන්නේ කියලත් කිව්වේ. ඒ සල්ලි වලින් ලක්ෂ 25 ක් විතරයි දැන් නියාස් බලන්න ගිය වාහනය ගන්න. මං කිව්වා ඒ සල්ලි මටත් ඕනේ නැහැ කියලා. නැහැ ඔයාගේ බබාට තමයි ඒ ලක්ෂ 80 ක් දුන්නේ. ඒ සල්ලි වලින් ඔයාට තමයි ඒ වාහනය ගන්නේ. ඒ වාහනය නියාස්ගේ නමට තමා ලියලා ගන්නෙත් කියලා එයාගේ මල්ලී කිව්වේ.

ප්‍ර : එතකොට දැන් මොකද වෙන්නේ භාදියාට, භාදියාව කවුද බලා ගන්නේ?

පි : ඊට පස්සේ ඒ වාහනය ආපුවාට පස්සේ එයා කිව්වා ලෑස්ති වෙන්න නින්දවුර් අම්මලා ඉන්නේ කියලා. ඊට පස්සේ එයාගේ අම්මලාගේ ගෙදර එදා 1, 1 ½ වෙන කොට ඒ නින්දවුර් ගෙදරට ගියේ.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : මේ ගියේ කවද්ද 23 වෙනිදා?

පි : 23 වෙනිදා.

ප්‍ර : ඇයි ඉතින් ඒ නින්දවුර් ගෙදරට ගියේ?

පි : එයාගේ අම්මා කිව්වා මාව එක්කගෙන එන්න කියලා. ඒ ගෙදරට. ඊට පස්සේ තමා එයාගේ මල්ලී කිව්වා ඔයා ලෑස්ති වෙන්න අම්මා ඔයාව නින්දවුර් ගෙදරට එන්න කියලා.

ප්‍ර : එතකොට බබාලත් එක්කද එතනට ගියේ?

පි : බබාලත් එක්ක, රිල්වාන්ගේ නෝනා නෆ්නා එයාගේ ළමයින්ත් එක්ක තමා ගියේ.

ප්‍ර : එහේ දවස් කීයක් හිටියද?

පි : එහේ 23 ඉඳලා 25 හවස වෙන කල් නින්දවුර් ගෙදර හිටියේ.

ප්‍ර : එතනට වෙන කවුරු හරි ආවද ඔයගොල්ලන් ඉන්න අතරේදී?

පි : ඒ ගෙදරට 24 ඇ වෙන කොට 8 ½ , 9 විතර බයික් එකේ එක් කෙනෙක් ආවා.

ප්‍ර : කවුද ඒ ආවේ?

පි: : එයා කවුද කියලා මම දන්නෙත් නැහැ, නියාස් තමයි එයා තමයි ඉස්සෙල්ලා ගිහිල්ලා කතා කලේ. කවුද කියලා. ඉන් පස්සේ නමත් කිව්වා. මෙයා ඉන්නවද කියලා. නැහැ කියලා කිව්වා. ඊට පස්සේ 24 ඇත් ඒ වගේ ඇවිල්ලත් ඇහුවා කියලා කිව්වේ. ඊට පස්සේ තමා කිව්වේ ගේ අයිතිකාරයා ඒ ගෙදර ඕන කියලා කිව්වේ.

ප්‍ර : මොන ගෙදර අයිතිකාරයාද?

පි : නින්දවුර් අයිතිකාරයා වෙන ගේ බලන්න කියලා කියනවා. කාත්තන්කුඩි කට්ටියට ඒගොල්ලන් දැන් මේ blast එකෙන් පස්සේ බයයි කියලා මට වෙන ගේ බලන්න කියලා ඒක ඒගොල්ලන්ට අස් කරලා දෙන්න කියලා කිව්වා කියලා. ඊට පස්සේ තමා 25 උදේ නියාසුයි, රිෂාඩ්, සෙයිනියි ඒගොල්ලොන් ගේ යාළුවෝ හිටියා ඔලුවිල් පාලමුනෙ සියාම් කියලා එක්කෙනයි, එයාගේ යාළුවා තව එක්කෙනෙක් හිටියා. ඒගොල්ලන් එක්ක ගිහිල්ලා ගේ බලලා ආවේ ඒ පැත්තේ. පස්සේ ඇවිල්ලා කිව්වා එකක් තිබුණා කියලා. ඒ ගේ සල්ලිවලට දීලා ගන්න ඕන කියලා තමා කතා කරේ. ඊට පස්සේ 25 හවස ලෑස්ති වෙන්න කියලා කිව්වේ රිල්වාන්. සෙයිනියි. එතකොට ඒ ගෙදරින් ඒ රිල්වාන් කියලා තිබුනේ මාවයි ළමයින් දෙන්නයි ඒ වගේ සෙයිනියි සෙයිනිගේ නෝනයි එයාගේ ළමයින් දෙන්නයි, සාරා ෆෙරෝසා ඒගොල්ලන්ත් එක්ක යන්න කියලා. ඒකේ ගිහිල්ලා ෆෙරෝසා කල්මුණේ නේ ඒ හින්දා අර ගෙදර ගන්න පුළුවන් කියලා එයාගේ identity පෙන්නලා තමයි ලියන්න කියලා තිබුණේ. ඊට පස්සේ යන කොට ලක්ෂ 19 යි 70,000, 75,000 ක්

FAIR COMMENT BY JEZEEM

විතර සල්ලි දුන්නා මට. මම ඒ සල්ලිත් අරන් ගියා. යන වෙලාවේ තමයි,

ප්‍ර : ඒ කියන්නේ 19 ලක්ෂ හැත්තෑ දාහක් ද දුන්නේ?

පි : ඔව්. ඒ යන්න වෙලාවේ තමයි එයාගේ මල්ලි රිල්වාන් සෙයිනිට කිව්වා ඕගොල්ලන් Safety ට මේ cheque දුන්නා ඒක පරිස්සමින් අරන් යන්න කියලත් කිව්වේ. ඊට පස්සේ සෙයිනි ඉස්සරහයින් ඉන්න නිසා පිටිපස්සේ වාහනයේ වැන් එකේ පිටිපස්සේ ෂීට් එකේ සාරා ෆොරෝසයි හිටියා. අරගොල්ලන්ට අර බෑග් එක දුන්නා. ඊට පස්සේ කිව්වා ඒ ගෙදරින් ගිහිල්ලා ඔලුවිල් පාලමුනෙට ගියේ. ඒ යන කොට 6 ½ විතර.

ප්‍ර : ඒ කියන්නේ 26 වෙනිදා උදේ 6 ½ විතර ඇති?

පි : 25 හවස 6 ½ ට.

ප්‍ර : ඊට පස්සේ?

පි : ඒ ගෙදර ගිහිල්ලා ඊට පස්සේ අපි ඇතුලට යන්න කියලා කිව්වේ. ඒ වෙලාවේ ඒ ගෙදර අයිතිකාර නෝනලා කවුරුවත් ඒ ගෙදර හිටියේ නැහැ. පිරිමි විතරයි සියාම් විතරයි හිටියේ ඒ ගෙදර. ඊට පස්සේ ඒගොල්ලන් කිව්වා ඕගොල්ලන් ඇතුලට එන්න. අපි අර ගන්න තියෙන ඒ ගේ අයිතිකාරයා හම්බ වෙලා එන්නම් කියලා. පිරිමි අය ගිහිල්ලා ආවා. ඇවිල්ලා කිව්වා ඒක හරි යන්නේ නැහැ එයා දෙන්නේ නැහැ කියලා කියනවා ආපහු කියලා.

ප්‍ර ඇයි ඒ ?

පි : එයා blast එකෙන් පස්සේ කට්ටියට ගේ දෙන්න බයයි කියලා.

ප්‍ර : මේ 21 වෙනිදා වුණු blast එකෙන් පස්සේ ගෙවල් දෙන්න බයයි කියලා කිව්වා?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ?

පි : ආපහු කට්ටිය ඔක්කොම සියාම් කියන්නේ එයාගේ ගෙදර තමා අපි හිටියේ එදා රෑ.

ප්‍ර : කවුද මේ සියාම් කියන්නේ?

පි : ඒ සෙයිනිගේ යාළුවා කියන එක්කෙනෙක්.

ප්‍ර : එයා ඉන්නේ කොහේද?පාලමුනෙ

පි : එයා ඔලුවිල් පාලමුනෙ තමා බැඳලා ඉන්නේ. එයාගේ ගම කල්මුණ.

ප්‍ර : එතකොට දැන් කොච්චර දවස් හිටියද සියාම්ලගේ ගෙදර?

පි : එහේ 26 එයාගේ ගෙදර දවල් වෙන කල් 2, 2 ½ වෙන කල් වෙන ඒ ගෙදර හිටියා. ඊට පස්සේ නියාස් සහරාන්ගේ යාළුවා ආවා අපි එක්ක යන්න. ඊට පස්සේ කට්ටියට කිව්වා ලෑස්ති වෙන්න කියලා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඊට කලින් උදේ කිව්වේ 26 උදේ ඕගොල්ලන්ට තිබුණා සෙයිනි කිව්වා එයාගේ නෝනාට අරගොල්ලන්ට තියෙන සල්ලියි, රත්තරන් බඩුයි ඒවා තිබුණොත් ඒ සියාම්ලට දීලා යං කියලා. යන කොට පාරවලින් check කරනවා කියලා. ඒ හින්දා සල්ලි ගනන් කරලා කීයද කියලා රත්තරන් බඩු අර සල්ලි ඒ උඩින් හාදියා නම් ඒ මුල් අකුරු විතරයි දාලා ලියලා දෙන්න කියලා. ඊට පස්සේ තුන්දෙනාම මමයි, සාරා, ෆෙරෝසා ඒ සල්ලි වලින් SF කියලා දාලා තිබුණේ. ඒවයි සාරා ෆෙරෝසාගේ රත්තරන් බඩු ඔක්කොම දාලා අෆිරීන්ට දුන්නේ,අෆරීන් තමා සෙයිනිට දීලා ඒවා සියාම්ට ඒක දුන්නේ තියා ගන්න, පස්සේ ගන්න කියලා.

ප්‍ර : පස්සේ ගන්නම් කියලා දුන්නා?

පි : ඔව්.

ප්‍ර : එතකොට රත්තරන් බඩුත් දුන්නා?

පි : රත්තරන් බඩුත් දුන්නා.

ප්‍ර : ඒ කරලා කොහාටද ගියේ ඕගොල්ලන්?

පි : අපි ගියේ සයින්දමර්දු ගෙදරට.

ප්‍ර : කවුරු කවුරුද ගියේ දැන් එතකොට සයින්දමර්දු ගෙදරට?

පි : මමයි, ළමයි දෙන්නයි, අෆ්රීන් එයාගේ ළමයින් දෙන්නයි සෙයිනියි. සාරා, ෆෙරෝසා, නියාස්.

ප්‍ර : එතකොට සෙයිනියි, සෙයිනිගේ ළමයිනුත් ගියා නේ?

පි : ඔව්.

ප්‍ර : සහරාන්ගේ නංගී?

පි : එයා එතකොට ඒගොල්ලෝ සහරාන්ගේ අම්මා සහරාන්ගේ තාත්තා, එයාගේ නංගී හිදායා, එයාගේ husband රිෂාඩ් ඒගොල්ලෝ හිටියේ නින්දවුර් ගෙදර 26 දවල් වෙන කොට අපි වාහනයේ නැග්ගට පස්සේ තමයි නියාස් කිව්වේ ඒගොල්ලෝ නින්දවුර් ගෙදර ඉඳලා මම ඒගොල්ලෝ අරන් ගියා සයින්දමර්දු ගෙදරට දාලා ආවේ කියලා. ඒගොල්ලෝ සයින්දමර්දු ගෙදර තමයි ඉන්නවා කියලත් කිව්වේ. ඊට පස්සේ තමා අපිව එක්කන් එනවා කියලා නියාස් කිව්වේ අතනට කතා කලේ.

ප්‍ර : එතකොට දැන් නියාසුත් ඕගොල්ලනුත් එක්ක ඒගෙදරට ආවා?

පි : ඔව්.

ප්‍ර : එදා සයින්දමර්දු ගෙදරට ගියාට පස්සේ ඒ වටේ කවුරු හරි ඒ කියන්න neighbors ලා කවුරු හරි ඔය ගෙදරට ආවද, ඕගොල්ලන් හිටපු ගෙදරට ආවද?

පි :: අපි සයින්දමර්දු කුළියට ඉන්න ගෙදරට ඉස්සරහා මුස්ලිම් පල්ලියක් තිබුණා. ඒ පල්ලි එකේ ඉන්න සභාපති ඒ කට්ටිය තමා

FAIR COMMENT — BY JEZEEM —

ආවේ මුලින්ම. ඇවිල්ලා ගේ අයිතිකාරයට කතා කළා. ගේ අයිතිකාරයා තමා සහරාන්ගේ යාළුවා නියාස් එයාව කතා කලේ.

ප්‍ර : නියාස්ට අයිති ගෙයක්ද ඒ සයින්දමර්දු ගෙදර?

පි : ඒ කුළියට තමා ගත්තේ නියාස් තමා ඒ ඔක්කොම බලලා ගත්තේ. ඊට පස්සේ නියාස්ට කිව්වා නියාස් පොඩ්ඩකට එළියට එන්න කියලා. ඊට පස්සේ නියාස් එළියට ගියා. මෙහෙම තමා කට්ටිය ඇවිල්ලා ඉන්නේ, ඔයත් එක්ක කතා කරන්න ඕනේ කියලා, ඊට පස්සේ නියාස් ගිහිල්ලා කතා කලා. ඊට පස්සේ පල්ලියේ සභාපති කිව්වලු ඔයගොල්ලෝ කාත්තන්කුඩි ඉඳන් එහේ ගිහිල්ලා GS ට රාලහාමිගෙන් සහතිකය අරගෙන මේ ප්‍රදේශවලින් කුළියට ඉන්නවා කියලා තාවකාලික කියලා ලියුමක් අරන් එන්න කියලා තිබුණා.

ප්‍ර : මොකක්ද ඒකට හේතුව?

පි : හේතුව කියන්නේ දැන් මේ සිද්ධියෙන් පස්සේ ඒගොල්ලෝ බලන්න ආවලු කොහේද ඉඳලා ආවද කියලා. ඒගොල්ලෝ සැකයෙන් තමා ආවේ කියලා කතාවක් කෙරුනා. ඒ හින්දා ඒ ගොල්ලන්ට ග්‍රාමසේවක සහතික ඕන කියලා පල්ලියේ සභාපති කිව්වලු.ඊට පස්සේ නියාස් ඒගොල්ලන්ට කිව්වලු මම හෙට උදේ ගෙනල්ලා දෙන්නම් කියලා. ඊට පස්සේ නියාස් ආපසු ඇතුලට ඇවිල්ලා ඒ විස්තර ඔක්කොම කිව්වේ.

ප්‍ර : එතකොට තමයි දැන් හාදියා ඒ ගැන දැන ගත්තේ ?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ දැන් කාට හරි ඕන වුනාද, ආ.. දැන් ඒ ගෙදරට දැන් බඩුත් ගෙනල්ලනේ තියෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : උදේ නැගිටින කොට බඩු ගෙනල්ලා තියෙනවා දැක්කා කියලා කිව්වනේ එදා 21 වෙනිදා උදේ?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔය ගෙදර තියෙන බඩු එහෙම අස් කළාද?

පි : ඒ කියන්නේ අස් කරලා තිබුණේ නැහැ ඔක්කොම තිබුණා බඩු. ඒ හින්දා තමා 23 ගියේ නින්දවුර්වලට. ඊට පස්සේ තමා 26 පල්ලි සභාපති බලලා ඉස්සෙල්ලා ගියා. ඒ යන්න කලින් කිව්වා වටේ ඉන්න ගෑණු තුන්දෙනෙක් බලන්න ඕන කියලා ඇතුලේ.

ප්‍ර : ඒ කවදද මේ 25?

පි : 26 හවස් වෙලා.

ප්‍ර : ඒගොල්ලන් ආවද වත්ත ඇතුලට?

පි : ඔව් ඇතුලට තුන් දෙනෙක් ආවා.

ප්‍ර : ඒගොල්ලෝ ඇවිල්ලා මොකද කිව්වේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඇවිල්ලා සාලේ තමා හිටියේ. නැන්දා තමා සහරාන්ගේ අම්මා තමයි ඒගොල්ලන් එක්ක කතා කලේ. ඇයි බඩු අස් කරන්නේ නැත්තේ කියලා ඒගොල්ලනුත් ඇහුවලු. නැහැ දැන් නේ ආවේ තව වුට්ටකින් තමා අස් කරන්න ඕනේ කියලත් කිව්වලු. ඊට පස්සේ බලලා ඒගොල්ලන් ගියා. ආපහු ගිහිල්ලා තමා ආයි 6.40 ට විතර වගේ ආයි පල්ලියේ කට්ටිය ආවේ. ඇවිල්ලා කිව්වා CID දෙන්නෙක් ඇවිල්ලා ඉන්නවා කියලා. ගේ ඇතුලේ check කරන්න ඕනේ කියලා. ඊට පස්සේ තමයි නියාස් ඇවිල්ලා රිල්වාන්ට කිව්වේ ඒක. රිල්වාන් ඊට පස්සේ කිව්වා කවුරුත් එන්න එපා කියන්න කියලා.

ප්‍ර : රිල්වාන් කිව්වා?

පි : ඔව්.

ප්‍ර : කාටද කිව්වේ?

පි : නියාස්ට. ඊට පස්සේ නියාස් එළියට ගිහිල්ලා කැමති නැහැ කියලා ඇතුලට එන්න එපා කියලත් කියලා තිබුණා.

ප්‍ර : ඒ ගෙදරට රෑට දාන්න ලයිට්ස් තිබුණද?

පි : ලයිට් තිබුණා. ඒ වෙලාවේ තමයි ඒගොල්ලන් Video ගත්තේ.

ප්‍ර : කවුද Video ගත්තේ?

පි : Video කලේ එයා රිසාත් සහරාන්ගේ හිදායගේ නංගීගේ husband. එයාගේ තාත්තයි රිල්වානුයි සෙයිනියි, සෙයිනිගේ ඔඩොක්කුවේ එයාගේ පුතායි හිටියා.

ප්‍ර : එතකොට හාදියා කොහේද හිටියේ?

පි : මම හිටියේ කාමරේ. ඊට පස්සේ ඒ වෙලාවේ මං කාමරේට හිටියා. ඒගොල්ලෝ කිව්වා අනිත් අයට සාලෙට එන්න කියලා. ඒ Video කලේ ඒගොල්ලෝ. Video කරන කොට

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : හාදියා අර සාලෙට එහා පැත්තේ කාමර 2 ක් තිබ්බනේ?

පි : සාලෙත් එක්ක ඉස්සරහා එක කාමරය තියෙනවා.

ප්‍ර : පිටිපස්සේ?

පි : පිටිපස්සේ කුස්සිය ඉස්සරහාත් කාමරයක් තියෙනවා.

ප්‍ර : ඔව් ඒක තමයි, කොයි කාමරේද ඔයා හිටියේ?

පි : මම හිටියේ කුස්සියට ඉස්සරහා තියෙන කාමරයේ.

****

FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,</u>

ප්‍ර : එතකොට දැන් හාදියාට ඔය වෙන කොට බබාලා දෙන්නෙක් හිටියානේ පුතයි, දුවයි?

පි : ඔව්.

ප්‍ර : පුතා කොහේද හිටියේ?

පි : පුතා ඒ වෙලාවේ නැන්දම්මා ගාව හිටියේ.

ප්‍ර : එතකොට නැන්දම්මා කොහේද හිටියේ?

පි : නැන්දම්මා හිටියේ සාලේ තමා.

ප්‍ර : සාලේ හිටපු අය ආයේමත් කියන්න පුළුවන්ද හාදියාට?

පි : පුළුවන්.

ප්‍ර : කියන්නකෝ?

පි : සහරාන්ගේ අම්මා, තාත්තා,

ප්‍ර : තාත්තට ඒ වෙන කොට ඇවිදින්න එහෙම පුළුවන්ද නැත්නම් Wheel chair එකක් එහෙම පාවිච්චි කළාද?

පි : නැත්නම් Wheel chair පාවිච්චි කලේ රිල්වාන් තුවාල වුණා ඒකට ගත්ත නැත්නම් Wheel chair එක තමයි.

ප්‍ර : නැත්නම් තාත්තට Weal chair එකක් අවශ්‍ය වුණේ නැහැ?

පි : නැහැ.

ප්‍ර : ඔය ගේ ඇතුලේ මෝටර් සයිකල් එකක් එහෙම තිබුණද ඒ වෙලාවේ?

පි : ඒ අන්තිමට ඒගොල්ලන් සද්දෙට කතා කලා බයික් එක ඇතුලට ගන්න කියලා.

ප්‍ර : ඇයි ඒ?

පි : ඊට පස්සේ කිව්වා ඒගොල්ලෝ මෙහෙම තමයි blast කරනවා කියලා.

ප්‍ර : ඒ නිසා බයිසිකලය ගත්තා ඇතුලට?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් අම්මයි. තාත්තයි දෙන්නම හිටියා සහරාන්ගේ ඇතුලේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට රිල්වාන් හිටියද?

පි : රිල්වාන් හිටියා.

ප්‍ර : සෙයිනි හිටියද?

පි : සෙයිනි හිටියා එයාගේ නෝනා අත්රින් එයත් හිටියා, එයාගේ ළමයින් දෙන්නා, රිල්වාන්ගේ නෝනා, එයාගේ ළමයින් දෙන්නයි, හිදායා, එයාගේ හම්බ වෙන්න දවස් 2 යි, 30 වෙන කොට එයා date දාලා තිබුණේ. බඩේ බබා තිබුණා. ඊට පස්සේ

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එළියට නියාස් හිටියා. සාරා ෆෙරෝසා, මමයි, දුවයි හිටියේ. පුතා නැන්දම්මා ගාව තමා හිටියේ.

ප්‍ර : එතකොට පුතා නැන්දම්මා ගාවනේ හිටියා කිව්වේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට කොයි වෙලාවක හරි හාදියා පුතාට කතා කලාද?

පි : මම කතා කළා.

ප්‍ර : ඇයි එහෙම පුතාට කතා කළේ?

පි : මං කතා කලේ ඒගොල්ලෝ මටත් කිව්වා අපි blast කරනවා කියලා. ඒවෙලාවේ මම කිව්වා එහෙම කරන්න එපා කියලා. ඒගොල්ලෝ කිව්වා අපේ කට්ටිය ඔක්කොමව වට කරලා ඉන්නවා කියලා.

ප්‍ර : කවුද වට කරලා ඉන්නේ?

පි : ඒ පොලිස් අය රවුමේ ඇවිත් ඇති කියලා තමා ඒ ගොල්ලෝ කිව්වේ. ඒක නිසා අපි ඒගොල්ලන්ට අහු වෙන්නේ නැතුව දෙවියොට යං කියලා තමයි කිව්වේ. මම කිව්වේ එහෙම කරන්න එපා කියලා ඊට කලින්.

ප්‍ර : කාටද කිව්වේ හාදියා එහෙම?

පි : එයාගේ මල්ලී. සහරාන්ගේ මල්ලී රිල්වාන්, සෙයිනි මට එහෙම කිව්වේ. එහෙම තමයි කරන්න ඉන්නේ කියලා. මම කරන්න එපා කියලා කිව්වා. එක්කෝ මාව එළියට දාලා කරන්න කියලා. මට එළියට යන්න අවස්ථාවක් තිබුණේ නැහැ ගෙදරින්.

ප්‍ර : ඇයි එහෙම බැරි වුණේ යන්න එළියට?

පි : ඒ ගෙයි වටේම තාප්ප.

ප්‍ර : නමුත් ඉතින් ඉස්සරහා ගේට්ටුවෙන් යන්න පුළුවන්නේ?

පි : ඉස්සරහා ගේට්ටුවේ ඉබ්බා දාලා තිබුණා.

ප්‍ර : ඉබ්බා දාලා තිබුණා?

පි : ඉබ්බා දාලා තමයි ඒ ගේට්ටුවේ තිබුණේ.

ප්‍ර : දැන් සාලේ ඒගොල්ලෝ වාඩි වෙලා හිටියානේ?

පි : වාඩිවෙලා හිටියා පිරිමි 3 දෙනයි, සෙයිනිගේ පුතා එයාගේ ඔඩොක්කුවේ හිටියා. රිල්වාන්ගේ වම් පැත්තේ එයාගේ නෝනයි, එයාගේ ළමයින් දෙන්නා හිටියේ.

ප්‍ර : එතකොට අර පිටිපස්සේ කුස්සියෙන් එළියට යන්න දොරක් තියෙනවානේ?

පි : ඒ පැත්තෙන් දොරක් තියෙනවා.

ප්‍ර : එතනින් ගියේ නැද්ද එළියට?

පි : ඒ පැත්තෙන් ගියේ නැහැ. ඒ කියන්නේ ඒ කුස්සියෙන් එහා පැත්තේ Washroom එක තියෙනවා. ඒ පැත්තෙන් දොර තිබුනා ඒකේ.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : එතකොට Washroom එකට කොයි වෙලාවක හරි ගියාද හාදියා?

පි : මම ගියා. ඔව්.

ප්‍ර : ඇයි Washroom එකට ගියේ?

පි : ඒගොල්ලෝ කිව්වා මෙහෙම තමාblast කරනවා කියලා ඒ වෙලාවේ. ඊට පස්සේ මම පුතාට ඉස්සෙල්ලා කතා කලා. පුතා ඇවිල්ලා මගේ ලඟට ඇවිල්ලා ඊට පස්සේ එයා ගියා. මං කිව්වා යන්න එපා පුතේ කියලා. නැහැ මම බලන්න යන්නේ කියලා ඉන් පස්සේ නැන්දා කතා කරලා පුතාව ගත්තේ.

ප්‍ර : ඇයි නැන්දා කතා කෙරුවේ, ඒ කියන්නේ සහරාන්ගේ අම්මා නේද?

පි : ඔව්.

ප්‍ර : ඇයි කතා කෙරුවේ?

පි : ඉන් පස්සේ මම කිව්වා පුතා මං ගාව තමයි ඉන්න ඕනේ කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

මේ අවස්ථාවේදී සාක්ෂිකාරිය ඉතා සංවේදීව සාක්ෂි ලබා දෙන බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : කියන්නකෝ හාදියා?

පි : ඊට පස්සේ එයා කිව්වා සහරාන්ගේ අම්මා ඒ ටික වෙලාවකින් මම Washroom එකට යන්න කලින් සහරාන්ගේ අම්මා ඒ ගෙදරින් තිබුණ සල්ලි ටිකයි, රත්තරන් බඩු ඒවා ටික අරගෙන ඉස්සරහා තියෙන දොරේ වෙනකල් යනවා කියලා මම දැක්කේ. ඊට පස්සේ ආපහු ඇවිල්ලා තමා ඒ වෙලාවට මම පුතාට කතා කරගෙන හිටියේ. ඊට පස්සේ තමා පුතාව ඒ නැන්දා කිව්වේ මගේ පුතාගේ පුතා කියලා එයා කිව්වේ. ඊට පස්සේ තමයි මං දුවව වඩාගෙන තමා Washroom එකට ගියේ. ඒ ගිහිල්ලා විනාඩි 10 ක් 15 ක් විතර මම ඇතුලට හිටියා. ඒ ගිහිල්ලා සද්දේ නැති හින්දා තමා මං ආපහු ආවේ. ඇවිල්ලා දුවගෙන ඇතුලට ගියා කුස්සිය ඉස්සරහා තියෙන කාමරයට. ගිහිල්ලා දුවත් කාමරයේ ඉන්න කොට තමා කට්ටිය ඔක්කොම වට කරගෙන හිටියා. සාරාත් බෝම්බ පාර්සලයක් එයත් බැඳගෙන හිටියා.

ප්‍ර : සාරාත් බැඳගෙන හිටියා?

පි : ඔව්.

ප්‍ර : කොහේද බැඳගෙන හිටියේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඒ බඩේ තමා.

ප්‍ර : එතකොට අනිත් අය?

පි : අනිත් අය කියන්නේ සහරාන්ගේ මල්ලි රිල්වාන්

ප්‍ර : ඔව්.

පි : එයත් බැඳගෙන තමයි හිටියේ.

ප්‍ර : එතකොට සෙයිනි?

පි : සෙයිනි නැහැ. ඒ වෙලාවේ කිව්වා මම Washroom එකේ ඉදලා එන කොට ඇවිල්ලා එතනට සාරා කතා කලා. දුවව අරගෙන එන්න කියලා සාලයට. මම කිව්වා නැහැ රිල්වාන් කිව්වා ඒ වෙලාවේ weapon අරගෙන නියාස් එළියේ ඉන්නේ එයාට දෙන්න කියලා. ඒ වෙලාවේ සෙයිනි ඇවිල්ලා එළියට ගියා. ආපහු ඇතුලට ආවා මම දැක්කේ නැහැ. ඊට පස්සේ තමා දුව ඇතුලට හිටියා සාරා අන්තිමට කතා කලේ සාරා තමා. එයා කිව්වා ඇතුලට යන්න එපා ඔයා. ඔයා ඊට පස්සේ අමාරුවේ වැටෙයි කිව්වා ඉතුරු වුණොත්.

ප්‍ර : කවුද කිව්වේ එහෙම?

පි : සාරා කිව්වේ.

ප්‍ර : සාරා කිව්වේ කාටද?

පි : මට කිව්වේ.

ප්‍ර : ඒ කියන්නේ මේ සාලෙට යන්න එපා කියලද කිව්වේ?

පි : ඔව්.

ප්‍ර : සාරා කිව්වා එහෙම?

පි : ඔව්.

ප්‍ර : එතකොට මොකක්ද හාදියා කලේ?

පි : ඊට පස්සේ මං ගියේ නැහැ එහෙන් කතා කරන වෙලාවේ තමයි වෙඩි සද්දෙත් ඇහුනේ. ඒ වෙඩි සද්දෙන් පස්සේ තමා මොකද වුණේ කියලා මම දන්නේ නැහැ ඊට පස්සේ. ඊට පස්සේ සිහිය ආවට පස්සේ ගොඩක් වෙලා දුව කකුල් ගාවට හිටියේ.

ප්‍ර : වෙඩි සද්ද කීයක් විතර ඇහුණද?

පි : එකක් විතරයි ඇහුණේ.

ප්‍ර : එකයිද ඇහුණේ?

පි : එකක් විතරයි ඇහුණේ සද්දයක්.

ප්‍ර : එතකොට දැන් ඔය දවසේ කීයට විතර ඇද්ද 26 වෙනිදා හාදියා ඕක වෙන කොට?

පි : 7 යි 7 ¼ වෙන කොට

ප්‍ර : ඇ 7 යි 7 ¼වගේ වෙන කොට.?

පි : ඔව්.

ප්‍ර : එතකොට අර සාරා කිව්වනේ එහාට යන්න එපා කියලා කිව්වානේ?

Prosecution Secretary Copy

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : ඒ මොකක් හින්දද යන්න එපා කියලා කිව්වේ?

පි : එයා කිව්වා ඇතුලට යන්න එපා ඉන් පස්සේ ඔයා ඉතුරු වුනොත් ඔයාව ඒගොල්ලන් ගන්නවා කියලා තමයි එයා කිව්වේ. Arrest කරයි කියලා. ඊට පස්සේ ඔයාට තමයි අමාරු කියලා එහෙම කිව්වේ. ඒ නිසා මම එහේ ගියේ නැහැ සාලෙට. දොර ගාව ඉන්න කොට තමයි වෙඩි සද්දයක් ඇහුණේ.

ප්‍ර : එතකොට ඒ වෙලාවේ වෙඩි සද්දේ ඇහෙන කොට හාදියා හිටියේ දොර ලඟ?

පි : ඔව්.

ප්‍ර : කොතන දොර ලඟද?

පි : ඒ කුස්සිය ඉස්සරහා තියෙන දොර ගාව හිටියේ.

ප්‍ර : කුස්සිය ගාව තියෙන දොර, එතකොට එතනින් ඉස්සරහාට ගියොත් සාලේ, දකුණු පැත්තට ගියොත් කාමරය?

පි : ඉස්සරහා තියෙන්නේ කුස්සිය ඒ ඉස්සරහා තමා කාමරය. ඒ කාමරයේ තමයි මම හිටියේ. මේ පැත්තට යන කොට දකුණු පැත්තට සාලේ.

ප්‍ර : දකුණු පැත්තේ සාලේ ඔව් එතකොට හාදියා ගියේ කොයි කාමරයටද?

පි : කුස්සිය ඉස්සරහා තියෙන කාමරයට.

ප්‍ර : කුස්සියෙන් ඉස්සරහා තියෙන කාමරයට ගියේ. එතනට ගියාට පස්සේ මොකද වුණේ හාදියා?

පි : ඊට පස්සේ දන්නේ නැහැ මට සිහිය ආවට පස්සේ බලන කොට දුව කකුල් ගාව හිටියේ.

ප්‍ර : එතකොට ඒ කියන්නේ හාදියාට ඇහුණේ වෙඩි සද්දයක් ඇහුණා ඊට පස්සේ සිහිය නැති වුණාද?

පි : ඔව්.

ප්‍ර : හැබැයි දුවත් හාදියා ගාව තමයි හිටියේ?

පි : දුව කාමරය ඇතුලේ හිටියේ.

ප්‍ර : කොයි වෙලාවේද සිහිය ආවේ?

පි : වෙලාව දන්නේ නැහැ එතකොට කලුවරයි. අහස පේනවා. ඊට පස්සේ තමා දුව කකුල් ගාව හිටියේ. ඇඩුවා වතුර ඕනේ කියලා.

ප්‍ර : දුව ඉල්ලුවා වතුර?

පි : වතුර.

ප්‍ර : මොකක්ද කෙරුවේ හාදියා?

පි : ඊට පස්සේ මට නැගිටින්නත් අමාරුයි, මම බැලුවා කකුල් ගාව bottle එකේ තිබුණා මෙරෙන්ඩා බෝතල් එකක්. ඒකේ වතුර පුරවලා තිබ්බා කලින්. වතුර ඒකේ චුට්ටක් තමයි තිබුණේ. ඒ වතුර

FAIR COMMENT BY JEZEEM

අරගෙන ආපහු මම නැගිට්ටා, නැගිටින්නත් අමාරුයි, ආපහු හිමිහිට නැගිටලා අර කාමරයේ ජනෙල් පැත්තේ බිමට වාඩි වෙලා හාන්සි වෙලා හිටියා. පස්සේ තමා මං බබාට වතුර පෙව්වේ.

ප්‍ර : එතකොට දැන් කොයි වෙලාවක හරි ගිනි ගන්නවා දැක්කද?

පි : ගිනි ගන්නවා කිව්වේ අර දොරට ගිනි ගත්තා.

ප්‍ර : ඒ කාමරයට, දැන් ඔය හාදියා හිටපු කාමරයේ දොර ගිනි ගන්නවා දැක්කා නේද?

පි : ඔව්.

ප්‍ර : දැන් දුව වතුර ඉල්ලුවාම දුවට වතුර දුන්නා නේද?

පි : ඔව්.

ප්‍ර : එහෙම සිහිය ඇවිල්ලා කොච්චර විතර වෙලාවක් හිටියද?

පි : එහෙම ටිකක් වෙලා හිටියා.

ප්‍ර : ඊට පස්සේ සිහිය නැති වුණේ නැහැනේ?

පි : ඊට පස්සේ දන්නේ නැහැ, ඊට පස්සේ තව ටිකක් වෙලා දුව මගේ අත ගාව මේ පැත්තේ හිටියා. වෙව්ලනවා එයත්. ඊට පස්සේ සෙයිනි ඇවිල්ලා ඒ කාමරයේ පිටිපස්සේ අර මං හිටිය කාමරයේ ඇවිල්ලා කතා කළා.

ප්‍ර : ඒ කියන්නේ දැන් ඔය හාදියා හිටපු කාමරයේ ජනේලයක් තියෙනවානේ?

පි : ඔව්

ප්‍ර : ඒ ජනේලයෙන් එළියේ තියෙනවා නිකම් ඇවිදින්න පුළුවන් බිමක් වගේ තීරයක් තියෙනවා?

පි : ඔව්.

ප්‍ර : එතකොට සෙයිනි ආවේ කොතනින්ද?

පි : ඒ කාමරයේ ජනෙල් පැත්තෙන් ආවා.

ප්‍ර : ඒ කාමරයේ ජනේලයෙන් ආවා, ඇතුලට ආවේ නැහැනේ?

පි : නැහැ.

ප්‍ර : එළියේ ඉඳලා කතා කලාද?

පි : එළියේ ඉඳලා තමයි කතා කලේ.

ප්‍ර : මොනවද කිව්වේ?

පි : එයා කිව්වා නැනා ඔය එළියට එනවද කියලා. දෙපාරක් තුන්පාරක් විතර එයත් ඇහුවා. මං ඒකට මුකුත් කිව්වේ නැහැ. ඊට පස්සේ ටිකක් වෙලාවකින් පස්සේ ආයි වෙඩි සද්දයක් දුරින් ඇහෙනවා වාගේ මට ඇහුණා. ඊට පස්සේ තමයි ඒ ටිකක් වෙලාවකින් පස්සේ ගෑණු එක්කෙනාගේ සද්දෙත් ඇහුණා.

ප්‍ර : මොකක් ද ඒ ගෑණු එක්කෙනාගේ සද්දේ ඇහුණේ?

Parliament Secretary's Copy

FAIR COMMENT — BY JEZEEM —

පි : ඒ සද්දේ එයා කවුද ඉන්නේ කවුද ඉන්නේ කියලා තමා ඉස්සෙල්ලා කවුද කවුද කියලා එයා දෙමළෙන් කතා කරන සද්දෙත් මට ඇහුණා.

ප්‍ර : කතා කළේ මොන භාෂාවෙන්ද?

පි : දෙමළ භාෂාවෙන්.

ප්‍ර : එතකොට ඔය ගොඩක් කල් ඔය පවුලේ අයත් එක්ක හාදියා ජීවත් වෙලා තියෙනවානේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ කටහඬ කාගෙද කියන එක හඳුන ගන්න පුළුවන් වුණාද?

පි : ඒ කියන්නේ මට ඒ වෙලාවේ ඒ කට හඬ සාරගේ වගේ ඒකේ ඇතුලේ තව දෙන්නෙකුගේ කට හඬ එයාගේ වගේ තියෙනවා. ඒ නිසා මං ඊට පස්සේ හැරිලා බැලුවා. මේ පැත්තේ සද්දෙට එක්කෙනෙක් හිටගෙන හිටියා.

ප්‍ර : කවුද හිටගෙන හිටියේ?

පි : ගෑණු එක්කෙනා. ඊට පස්සේ එයාගේ මුහුණේ මෙතනට වෙනකල් ලේ පෙරිලා වගේ තමයි රතුපාට වෙලා තමයි මුහුණ දැක්කේ. ඊට පස්සේ ඇඳුම් වාගේ පිච්චිලා තිබුණා.

ප්‍ර : එයා ඇඳලා හිටපු දේවල් මොනවද ඒ වෙලාවේ?

පි : ඒ කියන්නේ ඇඳුම් පිච්චිලා තමයි තිබුණේ.

ප්‍ර : ඔක්කොම පිච්චිලාද තිබුණේ?

පි : බාගෙට පිච්චිලා වගේ තමයි ඇඳුම් මට පෙනුනේ. රතුපාට වගේ මුහුණ.

ප්‍ර : මුහුණ රතුපාට වගේ තිබ්බා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ කවුද කියන එක හාදියා හඳුන ගත්තද?

පි : ඒ කියන්නේ හරියටම ඒ වගේ සාරගේ කියලා මට ඒ මුහුණ හරියට පේන්නේ නැහැ. නමුත් එයාගේ වගේ තමයි ඇඟ shape එක. උස ඔක්කොම තිබුණේ.

ප්‍ර : එතකොට මුහුණ හරියට පෙවුන් නැති වුණාට එයාගේ ඇඟ ගැන විස්තර දකින්න පුළුවන් වුණානේ?

පි : ඔව්.

ප්‍ර : දැන් හාදියා හිටියේ ඔය කාමරයේ කොයි හරියේ ද?

පි : ඒ කුස්සියේ ඉස්සරහා තමයි.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : හාදියා, ඉස්සෙල්ලා හාදියා කිව්වානේ ද පවුලේ කට හඬවල් දෙකක් විතර සමාන අය හිටියා කියලා?

පි : ඔව්.

ප්‍ර : මතකද?

පි : ඔව් මතකයි.

ප්‍ර : කාගේ කාගේ කට හඬවල්ද සමාන?

පි : ඒ කියන්නේ සහරාන්ගේ නංගී හිදායාගේ කට හඬයි, ආෆ්රීන්ගේඒ වගේ තියෙනවා.

ප්‍ර : කවුද සහරාන්ගේ නංගිගෙයි

ප්‍ර : නංගිගෙයි ආෆ්රීන්ගේ කට හඬත් ඒ වගේ තියෙනවා.

ප්‍ර : ආෆ්රීන් කියන්නේ?

පි : සෙයිනිගේ නෝනා.

ප්‍ර : ඔව්

පි : සාරාගේ වගේ තමයි

ප්‍ර : ඒ තුන්දෙනාගේම කට හඬවල් සමානයි?

පි : ඔව්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>:

ප්‍ර : දැන් අර දොර ගිනි ගන්නවා දැක්කා කියලා කිව්වනේ හාදියා?

පි :: ඔව්.

ප්‍ර : මම පිංතූරයක් පෙන්නනවා හාදියට

පි : හරි.

(මේ අවස්ථාවේදි පිංතූරයක් සාක්ෂිකාරියට පෙන්වා සිටී.)

ප්‍ර : මේ පෙන්නන පිංතූරේ තියෙන මොකක් හරි හඳුනන්න පුළුවන්ද හාදියට ? බලන්න හොඳට. අපිට තවත් එකක් පෙන්නන්න පුළුවන්?

පි : ඒ ගේ ඇතුලේ. ඒකේ තමා.

ප්‍ර : ඒ ගේ ඇතුලේ හරි, ඒ කාමරය නේද?

පි : ඔව්.

ප්‍ර : ඒ කාමරය තියෙන්නේ ඔය කුස්සිය ඉස්සරහා තියෙන කාමරයද?

පි : ඔව්.

ප්‍ර : ඔය කාමරය ඇතුලෙද හාදියයි දුවයි හිටියේ?

පි : ඔව්.

ස්වාමීනි C905 ඡායාරූපය සාක්ෂිකාරිය විසින් හඳුනා ගන්නවා.

ප්‍ර : එතකොට එතන ඒ කාමරයට ඇතුල් වෙන දොර ගිනි ගත්තා කියලා කිව්ව නේද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : එතකොට මම දැන් මේ පෙන්වන ඡායාරූපය හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන්.

ප්‍ර : එතකොට මේ දොරක් තියෙනවානේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ගිනි ගත්තේ ඒ පේන්න තියෙන දොරද?

පි : ඔව්.

ප්‍ර : දැන් හාදියා හිටියේ ඔය කාමරයේ කොයි හරියේද කියලා අපිට පෙන්නන්න?

පි : මම හිටියේ මේ හරියේ.

ප්‍ර : ඒ කියන්නේ ජනේලේ ගාවද?

පි : ඔව්, ජනේලේ ලඟ නෙමෙයි පොඩ්ඩක් ඇතුලේ හිටියේ. එතකොට ඒ කාමරයේ ඉන්න කොට එළියේ Kitchen side ඔක්කොම පේනවා එතනට.

ප්‍ර: : ඒ කියන්නේ හාදියා හිටපු තැනට Kitchen එක පේනවද ඒකද කියන්නේ?

පි : ඔව්

<u>ස්වාමීනි සාක්ෂිකාරිය මේ ඡායාරූපයත් හඳුනා ගනු ලැබුවා. ඒ අනුව එම ඡායාරූපය C1258 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.</u>

ස්වාමීනි සාක්ෂිකාරියගේ අවධානය මේ පිංතූරය යනුවෙන් විමසමින් ඇයට පෙන්වන ලද එම ඡායාරූපය තමයි C1258 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනු ලැබුවේ. එයින් පෙන්වන්නේ දොරක් බාගෙට පිච්චිච්ච අවස්ථාවක්. එය පසුව ගන්නා ලද ඡායාරූපයක්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

ප්‍ර : හාදියා අර ෂෙයිනි ජනේලේ ගාවට ඇවිල්ලා කතා කෙරුවා කියලා කිව්වානේ?

පි : ඔව්.

ප්‍ර : ෂෙයිනි දැක්කද ඔයා ඒ වෙලාවේ එතන ඉන්නවා?

පි : එයා තමා ජනෙල් පැත්තෙන් ඇවිල්ලා කතා කළේ.

ප්‍ර : ඇයි ඔයාගේ නම කිව්වේ ඒ වෙලාවේ?

පි : එයා නෑනා එනවද කියලා එතකොට බබා මං ගාව තමයි හිබුණේ. හිටියේ. ඒ වෙලාවේ තමයි නෑනා ඔයා එළියේ එනවද එනවද කියලා දෙපාරක් විතර ඇහුවේ. ඊට පස්සේ අහලා එයා ගියා. ටිකක්

FAIR COMMENT BY JEZEEM

වෙලාවකින් පස්සේ තමා වෙඩි සද්දයක් දුරින් වගේ මටත් ඇහුණේ.

ප : හාදියා අර මේ සහරාන්ට පල්ලි හදන්න ෂිබ්ලි ෆාරුක් සල්ලි දුන්නද?

පි : ෂිබ්ලි ෆාරුක් දුන්නේ නෑ

ප : අර ආමි මොහිදීන් අලියාර් හන්දියේ වුණු සිද්ධිය සම්බන්ධයෙන් පොලීසියෙන් හෙව්වා නේද?

පි : ඔව්.

ප : එතකොට ඒ කාලේ ආමි මොහිදීන් කාත්තන්කුඩියේ හැමෝටම පේන්න එයාගේ අර කඩේ කරගෙන හිටියද?

පි : ඒ කියන්නේ

ප : Tailor shop එකක්?

පි : Tailor shop එක තිබුනේ ආමි මොහිදීන්ගේ නෙමෙයි.

ප : ආමි මොහිදීන්ගේ නෙමෙයිද?

පි : ඒක එරාවුල් අන්වර් කියන එක්කෙනාගේ.

ප : එතකොට අලියාර් හංදියේ සිද්ධියෙන් පස්සේ ආමි මොහිදීන් කාටවත් පේන්න එළියේ හිටියේ නැද්ද?

පි : ඒ හිටියේ නැහැ හැංගිලා හිටියේ කියලා තමා ඒ කාලේ සහරාන් ඒගොල්ලන් කිව්වේ. ආමි මොහිදීන් හැංගිලා ඉන්නවා කියලා.

ප : හාදියත් දැක්කේ නැද්ද ආමි මොහිදීන් එළියේ කාත්තන්කුඩියේ ඉන්නවා?

පි : ඒ කියන්නේ.

ප : මිනිස්සුන්ට පේන්න ඉන්නවා දැකලා නැද්ද?

පි : එහෙම දැකලා නැහැ මං.

ප : ඔයා දන්න තරමට එයා හැංගිලා හිටියේ?

පි : හැංගිලා තමයි ඉන්නවා කියලත් කිව්වේ.

ප : දැන් ඔය කණ්ඩායමේ නායකයා හැටියට කවුරු හරි හිටියද, නැත්නම් ඊට පස්සේ මොනවා හරි වුණාද කට්ටියක් නායකයා වෙන්න?

පි : ඒකේ සහරාන් නායකයා කියලා කියනවා. ඊට පස්සේ අනෙක් එක්කෙනා නවුෆර් කියලා තමා කතා කළේ.

ප : කවුද එහෙම කියන්නේ?

පි : සහරාන් තමා මම ඇහුවාම කිව්වේ ඒගොල්ලන් කරනවා කියලා එයා කිව්වා මං තමයි නායකයා කියලා එයත් කිව්වේ. ඊට පස්සේ එයාගෙන් පස්සේ නවුෆර් කියලා කිව්වේ. දෙවෙනියා.

ප : ඒ කියන්නේ සහරාන්ට පස්සේ නවුෆර් තමයි කණ්ඩායමේ දෙවෙනියා හැටියට?

පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට සහරාන් ඒක කිව්වේ කොයි කාලෙද කියලා මතකද?

පි : ඒ 2018 අර class එකේ එන්න කියලා තිබුණා. ඒ වෙලාවේ තමයි මං එයාට ඇහුවේ

ප්‍ර : අර පාලමුනෙ

පි : පාලමුනෙ Ladies ලට තිබුණ class එකේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

C 905 සාක්ෂිකාරියගේ අවධානයට යොමු කරනවා ස්වාමීනි

ප්‍ර : හාදියා ආයි මම අර පිංතූරය ගෙනාවා. මට පොඩ්ඩක් කියන්න මේක හාදියාට මතකද දන්නේ නැහැ, මේ එක පැත්තක කොණක්. ඒ කියන්නේ මේක ඇත්තටම මෙන්න මෙතන මේ පැත්තේ තියෙන්නේ

පි : ඔව්.

ප්‍ර : ඒ පැත්තේ අයින හාදියා හිටපු තැනයි මට දැන ගන්න ඕනේ. ඊට පස්සේ මට තව ප්‍රශ්නයක් තියෙනවා අහන්න ඒකයි, මෙතන එහා පැත්තේ තමයි හිටගෙන ඉන්න එක්කෙනා ගාව තමයි අර ඉස්සෙල්ලා මං පෙන්නපු දොර තියෙන්නේ.

පි : ඔය වගේ වෙන Photos නැද්ද?

ප්‍ර : ඒ වගේ සම්පූර්ණ එකක් නැහැ. ඒකයි වෙලා තියෙන්නේ ඔය ගත්තු ඒවයේ. ඒක මතක නැහැ නේ හරි?

පි : ඔව්.

ප්‍ර : කමක් නැහැ එතකොට දැන් මේ ජනේලය,C905 පෙන්වා ප්‍රශ්න කරනවා ස්වාමීනි,
මේ තමයි ජනේලය?

පි : ඔව්.

ප්‍ර : එතකොට එහෙම නම් ජනේලෙට ඉස්සරහා පැත්තට වුණාම ඒ පැත්තේ තමයි දැන් දොර තියෙන්නේ, අර පිව්විච්ච දොර?

පි : දොර තියෙන්නේ ඉස්සරහා තමා.

ප්‍ර : ඒ පැත්තේ. මට දැන් කියන්න හාදියා කොතනද වැටිලා හිටියේ කියලා?

පි : මං වැටිලා තිබුණේ ඉස්සෙල්ලා දොර ගාව වැටිලා තිබුණා.

ප්‍ර : දොර ගාව වැටිලා තිබුණා. හැබැයි ඉතින් දොර ගිනි ගන්නවානේ?

පි : දොර ගිනි ගන්න කොට තමා පිටේ මට ගිනි ගත්තාම තමා මට සිහිය ඇවිල්ලා තිබුණා. ගිනි ගත්තට පස්සේ. ඊට පස්සේ තමයි මං නැගිටලා හිටියේ වාඩිවෙලා. ඉඳගෙන හිටියේ. ඉන් පස්සේ තමයි අතෙන්ට ඉඳලා මම නැගිටලා වතුර බෝතල අරගෙන ඒ ජනේලේ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ලහට නෙමෙයි පොඩ්ඩක් ඇතුළට තමා ආපහු හාන්සි වෙලා හිටියේ.

ප : එතකොට දැන් අර ගැහැණු කෙනෙක්ව දැක්කයි කියාල කිව්වානේ එයා දෙමළෙන් ඇහුවයි කියලා කිව්වා කවුද ඇතුලේ ඉන්නේ කියලා?

පි : ඔව්.

ප : එහෙමද ඇහුවේ, කවුද ඇතුලේ ඉන්නේ කියලද ඇහුවේ?

පි : ඇතුලේ ඉන්නේ කියලා නෙමෙයි.

ප : එහෙනම්?

පි : කවුද කවුද කියලා ඊට පස්සේ කවුද ඉන්නේ කියලා තමා ඒ සද්දේ ඇහුණේ මට.

ප : කවුද කවුද කියලා ඇහුවා?

පි : ඔව්.

ප : කවුද කවුද ඉන්නේ?

පි : ඔව්.

ප :: එතකොට එයාව දැක්කයි කියලා කිව්වනේ හාදියා?

පි : ඔව්.

ප :: හාදියා එයාව දැක්කේ මේ කාමරයේ කොතන ඉන්න කොටද?

පි : ඒ එතෙන්ට වැටිලා ආපහු මං නැගිටලා ජනෙල් ගාව, ඒ කියන්නේ ජනෙල් ගාව නෙමෙයි පොඩ්ඩක් ඈත්වෙලා මං හිටියා. එතකොට එහෙම බලන කොට කුස්සිය එහෙම පේනවා එතෙන්ට.

ප :: කුස්සිය එතකොට පේනවා මේ හාදියා හිටපු තැනට?

පි : ඔව්.

ප :: මට තේරෙනවා. දැන් අපි හිතමු හාදියා දැන් ඔය ඉන්න තැන තමයි වැටිලා හිටියේ.

පි : ඔව්.

ප : දැන් ඔතනට කුස්සිය පේනවා?

පි : ඔව්.

ප :: කොයි තරම් දුරින්ද ඒ දෙමළෙන් කතා කරපු කවුද කවුද, කවුද ඉන්නේ කියන එක්කෙනා ඇහුවේ?

පි : ඒ කියන්නේ මං කාමරයේ ඇතුලේ හරියට කුස්සිය ඇතුලට යන්න ඕනේ අතනට තියෙන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : හාදියා දැන් ඔයා ඔතන සාක්ෂි කූඩුවේ ඉන්නවානේ?

පි : ඔව්.

ප :: ඔතන ඉඳලා අපිට පෙන්නන්න ඔයාගේ ඉස්සරහා තැනක් ඒ එදා අර ගෑණු එක්කෙනා දැක්කේ කොතනද කියලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

(මේ අවස්ථාවේදී භාෂණ පරිවර්ථකට ඇය පවසන ස්ථානයේ සිට ගැනීමට සභාපති විනිසුරුතුමා දන්වා සිටී)

පි : ඒවගේ එතන පේනවා.

(මේ අවස්ථාවේදි සාක්ෂිකාරිය සාක්ෂි කූඩුවේ සිට කොමිෂන් සභාවේ භාෂා පරිවර්ථක සිටගෙන සිටින තැනක් කොමිෂන් සභාවට පෙන්වයි. එම ස්ථාන 2 අතර දුර අඩි 5 ½ ක් පමණ වන බවයි)

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : එතකොට දැන් ඔය වගේ කොච්චර වෙලාවක් හාදියා දුවත් එක්ක ඔය කාමරයේ හිටියද?

පි : ඒක ඇතුලේ හිටියා. ඊට පස්සේ

ප්‍ර :: හැබැයි දැන් මං අහපු ප්‍රශ්නෙකට පිළිතුරු දෙන ගමන් හාදියා කිව්වානේ අර දොරත් ගිනි ගන්නවා කියලා?

පි : ඔව්.

ප්‍ර :: ඉතින් කොහොමද කාමරයේ හිටියේ?

පි : එහේ ඉස්සෙල්ලා උඩින් තමයි ගිනි ගත්තේ. ඒ වෙලාවට තමයි මං පිටේ ඒකට දැනුනේ. ඊට පස්සේ තමයි ඒ වෙලාවේ මං ඉඳගෙන හාන්සි වෙලා ඉඳලා වැටිලා තිබුණේ.

ප්‍ර : මයික් එකට අපි කතා කලේ නැත්නම් ලියන්න බැරි වෙනවා නේ, මයික් එකට කතා කරන්න. ආයි කියන්න කෝ ඒ උත්තරය?

පි : ඒ කියන්නේ දොර ගාව තමයි වැටිලා තිබුණේ..

ප්‍ර : දැන් හැබැයි දොර ගිනි ගන්නවා. එතකොට?

පි : ඊට පස්සේ සිහියට ආවාම මම බලන කොට උඩ ඉඳලා තමයි ගිනි ගත්තේ දොර. ඔහොම තමා වැටුනේ උඩ ඉඳලා. ඊට පස්සේ තමයි පිටේ තුවාල තිබුණේ. ඒ ඉඳගෙන හිටියා මං. නැගිටලා ඊට පස්සේ තමයි දුව වතුර ඉල්ලන කොට නැගිටලා ආපහු අර ජනෙල් ගාව අයිනේ පොඩ්ඩක් ඇත් වෙලා හිටියේ.

ප්‍ර : එතකොට සෙයිනි ඇවිල්ලා කතා කලේ ඔය දැන් මට පැහැදිලි කරපු උත්තරය දැන් හාදියා පැහැදිලි කරපු ඔය කොයි වෙලාවේද?

පි :: ඒ කලින් සිහිය ආවාම මං නැගිටලා ජනෙල් පොඩ්ඩක් ඇතුලට මං හිටියා. ටිකක් වෙලාවකට පස්සේ තමයි ෂෙයිනි ඇවිල්ලා කතා කලේ ජනෙල් පැත්තෙන් ඇවිල්ලා.

ප්‍ර :: ඒ වෙන කොට දුව වතුර ඉල්ලලා වතුර දීලා ඉවරද නැත්නම්

පි : ඉවරයි.

ප්‍ර :: ඒක ඉවරයි. ඊට පස්සේ තමයි එතකොට ෂෙයිනි කතා කලේ?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප :: ෂෙයිනි කතා කරන්න ඉස්සර වෙලාද අර ගැහැණු කෙනාව දැක්කේ එහෙම නැත්නම් ෂෙයිනි කතා කළාට පස්සේද?

පි : සෙයිනි කතා කළාට පස්සේ තමයි.

ප :: ෂෙයිනි කතා කරන්න ඉස්සර වෙලා පිපිරුම් සද්දයක් මුකුත් ඇහුණද?

පි : එහෙම සද්දයක් නම් ඇහුණේ නැහැ මට.

ප :: ඇහුණේ නැහැ, එතකොට ෂෙයිනි කතා කළේ පිපිරුම් සද්දයක් ඇහෙන්න ඉස්සර වෙලා?

පි : ඔව්.

ප :: කොයි වෙලාවක හරි ඇහුණද පිපිරුම් සද්දයක්?

පි : ඒ කියන්නේ ෂෙයිනි කතා කරලා ගියාට පස්සේ තමයි දුරින් වෙඩි සද්දයක් ඇහුණේ.

ප :: වෙඩි සද්දයක් වගේ ඇහුණා දුරින්?

පි : ඔව්.

ප :: එතකොට ෂෙයිනි කතා කරලා ගියාට පස්සේ කොයි තමයි අර ගැහැණු කෙනා ඇවිල්ලා හාදියා කියන්නේ දෙමළෙන් කවුද ඉන්නේ කියලා ඇහුවා කියලා?

පි : ඔව්.

ප :: එතකොට ඒ වෙන කොට අර වෙඩි සද්දේ ඇහිලද නැත්නම් තාම ඇහිලා නැද්ද?

පි : ගැහැණු කෙනා කතා කරන කොටද?

ප :: ඔව්.

පි : ඊට පස්සේ ඒ ගෑණු කතා කරන කොට සද්දයක් නැහැ.

ප :: ඒ කියන්නේ ඒ සද්දෙට පස්සෙද ගැහැණු කෙනා එහෙම කතා කලේ?

පි : ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : හාදියා දැන් ෂෙයිනි ඇවිල්ලා ජනේලේ ලඟින් කතා කළානේ. ?

පි : ඔව්.

ප :: ඒ වෙලාවේ ඔයාගේ දුව සද්ද එහෙම කෙරුවේ නැද්ද, කෙරුවද?

පි : ඒ කියන්නේ දුව අඬමින් තමයි හිටියේ. මං අත්ම තමයි දුව හිටියේ. ඒ ටික වෙලාවකින් තමයි සෙයිනි ඇවිල්ලා කතා කලේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප : එතකොට දැන් ඔය එදා මුළු රෑම ඔය කාමරයට වෙලා ද හිටියේ හාදියා?

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පි : ඒකේ ඇතුලේ තමයි හිටියේ.

ප්‍ර :: එතකොට දැන් කොයි වෙලාවේද ඔය කාමරෙන් එළියට ආවේ හාදියා?

පි : ඊට පස්සේ ආපහු..

ප්‍ර : තනියම එන්න පුළුවන්කම තිබ්බද ඒ කාමරෙන් එළියට?

පි : යන්න බැහැ ආයි නැගිටිනවා අත උස්සන්නත් බැහැ බර වගේ තිබුණා.

ප්‍ර :: ඇඟ බරයි වගේ තිබුණා?

පි : ඔව්.

ප්‍ර :: එතකොට තනියම නැගිටගෙන යන්න විදියක් නැහැ ඒකයි මේ කියන්නේ හාදියා?

පි : ඔව්..

ප්‍ර :: ඉතින් මොකද වුණේ?

පි : ඊට පස්සේ ඇතුලේ කාමරය ඇතුලේ තමයි හිටියේ.

ප්‍ර :: කොච්චර වෙලා ඔහොම හිටියද?

පි : ඒ වෙලාව දන්නේ නැහැ, ඊට පස්සේ මං ජනෙල් පැත්තේ එහෙම බලන කොට එළිවෙලා තිබුණා. ඊට පස්සේ ටික වෙලාවකට පස්සේ තමයි කොළපාට ඇඳුම් ඇඳගෙන කට්ටිය හිටියා.

ප්‍ර :: ඒගොල්ලන් ඇතුළට ආවද?

පි : ඊට පස්සේ මට හරියට සිහියක් ඒ දන්නේ නැහැ. Hospital ගෙනිච්චට පස්සේ එහෙන් තමයි කිව්වේ ඔයා Hospital එකට ඇවිල්ලා ඉන්නේ කියලා.

ප්‍ර :: එතකොට දුවට මොකද වුණේ? දුවත් ඔය වගේ එළිවෙනකල්ම හාදියත් එක්ක ඔය කාමරයේ හිටියද?

පි : ඔව් මං ගාව තමයි දුවත් හිටියේ.

ප්‍ර :: එතකොට දැන් හාදියාව Hospital එකට ගෙනිච්චා කිව්වානේ අර කොළපාට ඇඳුම් ඇඳගත්ත අය?

පි : ඔව්.

ප්‍ර :: පස්සේ දැන ගත්තද ඒගොල්ලෝ ආමි එකේ අය කියලා?

පි : පස්සේ තමයි ඒගොල්ලෝ කිව්වේ ඔයා Hospital එකේ ඉන්නවා කියලා. ඊට පස්සේ හොඳටම දවස් 4 ක් විතර ගියාට පස්සේ තමයි කිව්වේ ආමි එකෙන් තමයි ඔයාව ගත්තේ කියලා.

ප්‍ර :: එතකොට දුවට මොකද වෙලා තිබුණේ?

පි : මං දුවව දැක්කේ ඒ Hospital එකෙන් දවස් 4 කින් පස්සේ තමා.

ප්‍ර :: එතකොට දුව පරිස්සමට හිටියා නේද?

පි : ඔව්.

Prosecutor's Copy

FAIR COMMENT BY JEZEEM

ප : දැන් මම පිංතූරයක් පෙන්නනවා මේකේ තියෙන ඇඳුම දැකලා තියෙනවද?

පි : ඔව්.

C908 සාක්ෂිකාරියගේ අවධානයට යොමු කරනවා ස්වාමීනි.

ප :: කොහේදී ද දැකලා තියෙන්නේ කවුද ඒක අඳින්නේ?

පි : ඒකේ තිබුණේ සයින්දමර්දු ගෙදරින්. ඒ ගත්තේ සහරාන්ලා අන්තිම 20 වෙනිදා April දිවුරුම් ගන්න ගත්ත ඇඳුම් තමා.

ප :: එතකොට සයින්දමර්දු ගෙදර කොහොමද ඒක තිබ්බේ?

පි : ඒකේ එයාගේ මල්ලී රිල්වාන් කිව්වා ඒගොල්ලෝ ඇඳුම් ගෙනල්ලා තියෙනවා කියලා. ඒගොල්ලෝ අන්තිමට ඇදගෙන තියපු ඇඳුම් තමා ඒ බෑග් එවලා තියෙනවා කියලත් කිව්වේ.

ප :: ඒ ඇඳුම් එවලා තිබුණද ඒගොල්ලෝ?

පි : ඔව්.

ප :: දැන් එතකොට සයින්දමර්දු ගෙදර තමයි C908 තියෙන ඇඳුම තිබ්බේ?

පි : ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : හාදියාට දැන ගන්න ලැබුණද ඔය දිවුරුම කෙරුවේ කොහේද කියලා?

පි : ඒ කොහේද කියලා කොයි ගෙදරද කියලා මම හරියට දන්නේ නැහැ. මම ඇහුවා ඊට පස්සේ සාරා කිව්වා Apartment කියලා. කොහේ Apartment කියලා මම ඇහුවා ලකී ප්ලාසාද කියලා, එයා ඒ වෙලාවේ කිව්වේ ලකී ප්ලාසා වෙන්න ඕන කියලා.

ප : ගල්කිස්ස පැත්තේ තියෙන Apartment එකකට ගිහිල්ලා තියෙනවද හාදියා?

පි : ඒකට මං ගියේ නැහැ, ඒකේ ඒගොල්ලෝ February sorry April 12 ඒ Rent එකට ගේ බැලුවා කියලා කිව්වා. ඒ කියන්නේ පස්සේ තමයි දැන ගත්තේ මං එයාගේ නංගී හම්බ වෙන්න ගිහිං බලලා ගත්තේ කියලා.

ප :: එතෙන්ට ගිහිල්ලා නැද්ද හාදියා?

පි : මං ගියේ නැහැ එතෙන්ට.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර :: හාදියා තව අපිට සාක්ෂි දීලා තියෙන හින්දා අපිට යම් ප්‍රශ්න වගයක් අහන්න තියෙනවා හාදියාගෙන්. හාදියාලා තව ළමයෙක් හදන්න හැදුවද?

පි : නැහැ.

ප්‍ර : හාදියාට කියන්න පුළුවන්ද සහරාන් මෙහෙම වුණේ කොහොමද?

පි : ඒ සහරාන් ඉස්සෙල්ලා මං බැන්දට පස්සේ 2009 බැන්දේ. ඒ කාලේ එයා හොඳට තමයි හිටියේ. ඒ කියන්නේ මිනිස්සුන්ට උදව් කරලා කට්ටියත් එක්ක කතා බහ කරලා තමයි හිටියේ. 2016 වෙන කල් ඒ කියන්නේ අන්තිම වෙන කල් හොඳට හිටියා. නමුත් 2017 වෙන කොට පොඩ්ඩ පොඩ්ඩ වෙනස් වෙලා තිබුණා. ඊට පස්සේ නවුෆර් හම්බ වුණාට පස්සේ තමයි එයා IS පැත්තකට එයා ගිහිං තිබුණේ.

ප්‍ර :: ඒ කියන්නේ හාදියා කියන හැටියට සහරාන්ව වෙනස් කෙරුවේ නවුෆර් ද?

පි : ඔව්.

ප්‍ර : නවුෆර් කොයි විදියටද සහරාන්ව වෙනස් කෙරුවේ?

පි : ඒ කියන්නේ ඉස්සෙල්ලා Pen drive එක දුන්නා. ඊට පස්සේ නිතරම සහරාන් එක්ක කතා බහ කරනවා. ඇ වෙලාවෙත් එහෙම ගොඩක් වෙලාවක් කතා කරනවා. ඊට පස්සේ ඉස්සෙල්ලා NTJ පල්ලියේ ඉන්න කාලේ ත්‍රස්තවාදී ක්‍රමයට එහෙම හිටියේ නැහැ එයා. හොඳට මිනිස්සුන්ට උදව් කරගෙන අරවා සුද්ද කරලා, School වල ගිහිල්ලා එහෙම කරගෙන හිටිය. ඊට පස්සේ තමා එයා ඒ Videoඑහෙම බලලා පස්සේ තමයි එයා වෙනස් වුණේ. ඉන් පස්සේ නවුෆර්ත් එක්ක නිතරම කතා කර කර තමා එයත් එක්ක join වෙලා තමයි අලියාර් හංදියෙන් පස්සේ තරහා වෙලා ඊට පස්සේ එයා කිව්වා ඒක තමා හොඳ chance එක අපිට කියලත් එයා කිව්වා. ඒ පල්ලියේ ඉඳලා අයින් වෙන්න හොඳ වෙලාව කියලා, ඒ හොඳයි කියලා තමයි පස්සේ එයා කිව්වේ 2019.

ප්‍ර : හරි හාදියා දැන් නවුෆර් මවුලවි හාදියාගේ මාමනේ?

පි : බාප්පා.

ප්‍ර : බාප්පා වෙනවානේ?

පි : ඔව්.

ප්‍ර : බාප්පා ඔය විදියද ඒ කාලේ ඉඳලම, නැත්නම් කොයි කාලෙද බාප්පා වෙනස් වුණේ?

පි : එයා මං එයාගේ ගැන හරියට දන්නේ නැහැ. ඒ 2016 ඉඳලා තමයි ඒ දෙන්නම හොඳටම කතා බහ කරනවා. ඒ කාලේ ඉඳලා තමයි, ඉස්සෙල්ලා නවුෆර්ට තිබුණාද කියලා මං දන්නේ නැහැ.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දන්නේ නැහැ, මොකද නවුෆර් 2009 නේ පිටරට යන්නේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට හාදියාට

පි : ඒ කාලේ මං සහරාන් එයත් එක්ක කතා කරන නිසා මං එයත් එක්ක කතා බහ කරන්නේ නැහැ.

ප්‍ර : අවුරුදු 14යි නේ හාදියාට ඒ කාලේ, 2009 නවුෆර් පිටරට යන කොට?

පි : ඔව්.

ප්‍ර : එතකොට නවුෆර් ගැන එච්චර දැනුමක් නැද්ද ඒ කාලේ?

පි : ඒ කාලේ මං ඒ කියන්නේ සහරාන් බැන්දට පස්සේ දෙන්නම කතා කරන නිසා මං කතා කරන්නේ නැහැ, පුංචිත් එක්ක විතරයි කතා කරන්නේ.

ප්‍ර : දැන් සහරාන් මුස්ලිම් නැති අයත් එක්ක යාළුකමක් තිබ්බද?ඒ කියන්නේ ඒ කට්ටියත් එක්ක කතා කරනවද නැත්නම් ඔයා දන්න කාලේ ඉඳලම මුස්ලිම් අයත් එක්ක විතරද සම්බන්ධතා තිබ්බේ?

පි : ඒ කියන්නේ දැන් කොහේ හරි ගමනක් යන කොට හරි බස්වල හරි එයාට සිංහල දන්නේ නැහැ කතා බහ කරන්න. ඒ වුණාට කට්ටිය හිටියොත් ඒගොල්ලන්ට seat එක දීලා ඔහොම කරලා දෙමළ කට්ටියත් එක්ක කතා බහ කරමින් තමා යන්නේ.

ප්‍ර : ඒ කියන්නේ එයා අනිත් මුස්ලිම් නැති අයත් එක්ක යාළුකම් තියා ගන්න හැදුවද?

පි : ඔව්.

ප්‍ර : ඉතින් නවුෆර් මවුලවිට කොහොමද පුළුවන් වුණේ සහරාන් ඔහොම වෙනස් කරන්න ඔය හාදියා කියන හැටියට?

පි : මං හරියට දන්නේ නැහැ, එයා පිටරටවලින්, කටාර් ගිහිල්ලා ඔක්කොම ඉවර කරලා ආවා 2016. ඒ ඇවිල්ලා තමයි මෙහෙම එයාව වෙනස් කලේ. කලින් එයාට තිබුණද කියලා හරියට මං දන්නේ නැහැ.

ප්‍ර : දැන් අර අලියාර් හංදියේ සිද්ධියේදී කවුරු හරි දේශපාලනඥයෙක්ගේ කට්ටි දෙකට සහයෝගය දැක්වුවාද?දැන් රණ්ඩුවක් වුණා 10 වෙනිදා. 2017 මාර්තු 10 වෙනිදා අලියාර් හංදියේ රණ්ඩුවක් වුණානේ

පි : ඔව්.

ප්‍ර : සුන්නතුල් වල් ජමාත් අය සහ සහරාන්ගේ කණ්ඩායමේ අය?

පි : ඔව්.

ප්‍ර : එතකොට පොලීසියට දැම්මානේ සහරාන්ගේ කණ්ඩායමේ කිහිප දෙනෙකුයි සුන්නතුල් වල් ජමාත් අයයි?

පි : ඔව්.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒ වෙලාවේ දේශපාලනඥයෝ මේ කට්ටියට යම් සහයෝගයක් දුන්නද? කවුද ඒ?

පි : ඒ හිස්බුල්ලා කියලා තිබුණලු.

ප්‍ර : හිස්බුල්ලා මොනවද කියලා තිබ්බේ?

පි : හිස්බුල්ලා කියලා තිබුණා කියලා එයාගේ අම්මා කිව්වේ සහරාන්ගේ අම්මා. හිස්බුල්ලා මෙයාව සහරාන් එන්න කියලා එයාව බලලා එයාට ඇප අරන් දෙන්නම් කියලා පොලීසියට භාර දීලා කොහොම හරි කතා කරලා එයාට ඇප අරන් දෙන්න කියලා තමයි කියලා තිබුණේ.

ප්‍ර : ඒ කියන්නේ හිස්බුල්ලා සහරාන්ගේ අම්මට කියලා තිබ්බා සහරාන්

පි : අම්මට නෙමෙයි.

ප්‍ර : එහෙනම්?

පි : ඒගොල්ලන්ගේ පල්ලියට යන එක්කෙනාට කියලා තිබුණාලු.ඒ වෙලාවේ තමයි සහරාන්ගේ අම්මට ඒගොල්ලන් කියලා තිබුනේ.

ප්‍ර : හිස්බුල්ලා කියලා තිබුණා කාට හරි පණිවිඩයක් සහරාන්ට එන්න කියන්න එයා උසාවියට ඉදිරිපත් කරන්න

පි : ඔව් ඉදිරිපත් කරලා Release කරන්නම් කියලා තමයි

ප්‍ර : වෙන කවුද සහරාන්ට උදව් කරන්න හැදුවේ ඒ කාලේ?

පි : ඊට පස්සේ කාත්තන්කුඩි පොලීසියේ OIC නිශාන්ත සිල්වා කියලා

ප්‍ර : එයා මොනවද කරන්න හැදුවේ?

පි : එයා ඉස්සෙල්ලා අර අලියාර් හංදියට Permission දුන්නේ නැහැ.

ප්‍ර : මොනවද දුන්නේ නැත්තේ Permission?

පි : Permission දුන්නේ නැත්තේ. ඊට පස්සේ කතා කරලා තමා ඒගොල්ලෝ මොහොක හරි අනික් වැඩ කරන අය මොකක් හරි දෙන්න ඕනේ කියලා එතකොට සහරාන් හිටියේ නැහැ ගෙදර, එයා පල්ලියේ හිටියේ දෙන්නෙක් ගිහිං තිබුණා

ප්‍ර : සල්ලි දුන්නද?

පි : ඒගොල්ලෝ බොන්න හරි කන්න හරි අරන් දෙන්න කියලා

ප්‍ර : කාටද දීලා නැත්තේ?

පි : සහරාන්ගේ පල්ලියේ දෙන්නෙක්ට කියලා තිබුණේ.

පි : නිශාන්ත සිල්වා ද කියලා තිබුණේ?

පි : නැහැ නැහැ නිශාන්ත සිල්වාගෙන් පස්සේ ඉන්න දෙන්නෙක්ලු.

ප්‍ර : නම් මතක නැද්ද?

පි : නම් මතක නැහැ ඒගොල්ලන්ගේ.

ප්‍ර : නිශාන්ත සිල්වා ගේ නම කිව්වේ ඇයි?

පි : එයා OIC කියලා කියලා තිබුණා සහරාන්.

Property of Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට නිශාන්ත සිල්වා යටතේ ඉන්න තව දෙන්නෙක්?

පි : ඔව්. ඊට පස්සේ ඒ සහරාන්ගේ යාළුවෝ දෙන්නා ඊට පස්සේ සහරාන්ට call කරලා මෙහෙම තමා කන්න මොකක් හරි නැත්නම් බොන්න මොකක් හරි ඉල්ලනවා කියලා. මුකුත් දෙන්න එපා ඒ මං ඒගොල්ලන්ට දෙන්නේ නැහැ, මුකුත් දෙන්නේ නැහැ කියලා ඊට පස්සේ තමයි නිශාන්ත සිල්වාට කතා කරලා තමයි ඒ Permissionගත්තා කියලා සහරාන් කිව්වේ.

ප්‍ර : එතකොට නිශාන්ත සිල්වාට සහරාන්ද කතා කෙරුවේ?

පි : ඊට පස්සේ සහරාන් ගිහිල්ලා එයාගේ තව Translator එයා සිංහල කතා කරන්න දන්නේ නැහැ. ඒ නිසා තව එක්කෙනෙක් එක්කරගෙන ගිහිල්ලා තමයි කතා කරලා ඒකට පෙන්නලා තමා ඒPermission එක ගත්තේ.

ප්‍ර : එතකොට වෙන කවුද එතකොට සුන්නතුල් වල් ජමාත් පැත්තට කවුරු හරි දේශපාලනඥයෙක් කතා කෙරුවද සහ උදව් කෙරුවද?

පි : කවුරුත් උදව් කරලා නැහැ.

ප්‍ර : නැහැ නැහැ සහරාන්ගේ කට්ටියට නෙමෙයි අනිත් කට්ටියට රවුල් මවුලවිගේ?

පි : රවුල් මවුලවිගේ කට්ටිය පොලීසියට ඒ වගේ Lawyers ලට සල්ලි දීලා තියෙනවා කියලා කියලා තිබුණා. ඊට පස්සේ නිශාන්ත සිල්වා සහරාන්ගේ පල්ලියට එන එක්කෙනාට කියලා තිබුණලු සහරාන්ට එන්න කියන්න මං කොහොම හරි ඒක ඉවර කරලා case ඉවර කරලා දෙන්න කියලා. ඊට පස්සේ සහරාන් සල්ලි එවලා තිබුණා නිශාන්ත සිල්වාට දෙන්න කියලා. එතකොට ඒ වෙලාවේ සහරාන් අපේ අම්මලාගේ ගෙදර තමයිලු හිටියේ. ඒ සල්ලි දෙන්න කාත්තන්කුඩි පොලීසියෙන් නිශාන්ත සිල්වාට කියලා කතා කලා.

ප්‍ර : සල්ලි දුන්නද?

පි : ඉන් පස්සේ සල්ලි දෙන්න කියලා තමයි සහරාන් කතා කලේ.

ප්‍ර : දුන්නද නැද්ද කියලා දන්නේ නැද්ද?

පි : ඒවා මං දන්නේ නැහැ අනිවාර්යයෙන් දෙන්න ඕන කියලා තමයි සහරාන් කතා කලේ.

ප්‍ර : ඊට පස්සේ ඒ කියන්නේ සහරාන් කාත්තන්කුඩියේ ටික කාලයක් ඉන්න කොට පොලීසිය හෙව්වේ නැද්ද සහරාන්ව?

පි : ඒ 2017 මැයි මාසේ අන්තිමට එයා අම්මලගේ ගෙදරින් තමා හිටියේ දවස් 42 ක් 45 ක් විතර.

ප්‍ර : කවුරුත් හෙව්වේ නැහැ ඒ කාලේ?

පි : නැහැ.

ප්‍ර : එතකොට ඒ කාලේ වෙන කොට අර ඉල්ලපු සල්ලි දීලා ඉවරද?

FAIR COMMENT BY JEZEEM

පි : ඒ දන්නේ නැහැ මං දුන්නද කියලා.

ප්‍ර : සහරාන් හුඟක් සැරයක් ඔය විදියට කාත්තන්කුඩි ඇවිල්ලා හිටියද මිනිස්සුන්ට පේන්න, නැත්නම් කොහොමද ආවේ?

පි : ඒ ගිහිල්ලා ඇතුලේ ඒ නංගිලාගේ ගෙදර හිදායා එයාගේ ගෙදර තමයි ඉන්නේ. රෑ වෙලාවට ඒ පැත්තේ ඉන්නවා ෆිර්දෝස්, අබ්දුල් රවුෆ් කියලා එක්කෙනෙක්. ඒගොල්ලන් රෑට ඇවිල්ලා එක්ක යනවලු. රවුෆ් කියලා එක්කෙනෙක්ට ඉඩමක් තියෙනවා ඔල්ලිකුලමේ. ඒකෙන් ගිහිං කතා කරනවලු.

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : හාදියා ඔබ විස්තර කරපු විදියට සහරාන් මේ විදියට පුපුරුවාගෙන මැරෙන්න උත්සාහයක් දරනවා කියන එක ඔබ දැනන් හිටියේ නැහැ කිව්වනේ?

පි : ඔව්.

ප්‍ර : ඔබ හිතන විදියට ඇයි සහරාන් මේ වගේ පුපුරුවාගෙන මැරෙන්න හැදුවේ මෙච්චර ඉක්මණට?

පි : ඒගොල්ලෝ අන්තිමේ ඒගොල්න්ලෝ ඉස්සෙල්ලා 2019 ඒගොල්ලන් ආවට පස්සේ කිව්වා ඒගොල්ලගේ Schedule එකේ තිබුණා කියලා ගොඩාක් කාලෙකින් පස්සේ දැන් මං මුකුත් කරන්නේ නැහැ කියලා තමා කතාව කලේ. පස්සේ තමා අවුරු 5 ක් හරි 10 ක් හරි යන්න ඕන කියලා. නමුත් බුදු පිළිම case එකෙන් පස්සේ ඒකේ arrest කරලා බන්ධනාගාරයේ පිරිමි අහුවෙලා තිබුණා කියලා. ඊට පස්සේ ඒගොල්ලෝ meeting එකෙත් තිබුණලු සහරාන් නවුෆර්, මිල්හාන්, සාදික්, සාහිද් ඒ කට්ටියත් එක්ක ඒගොල්ලෝ තීරණයක් ගත්තාලු ඒකේ සාදික් කියලා එක්කෙනෙක් කියලා තිබුණලු ඒ බන්ධනාගාරයට මොනවා හරි ගහලා හරි ඒගොල්ලෝ එළියට ගන්න ඕන කියලා. ඒ වෙලාවේ සහරාන් කිව්වලු එහෙම ඉක්මණට කරන්න බැහැ කියලා. නැහැ අපේ කට්ටිය ඇතුලේ නේ ඉන්නේ ඒගොල්ලන්ව ගන්න ඕන කියලා. ඒ වෙලාවෙත් සහරාන් ඔහොම කරන්න බැහැ කියලා තමයි එයා කිව්වේ. ඊට පස්සේ ඇතුලෙන් කට්ටිය තොරතුරු එනවා මේ වෙලාවට උසාවි එක්ක යනවා ඒ බස්වලින්. ඊට පස්සේ එහෙම එහෙම තොරතුරු ඒ ඇතුලේන් ඒගොල්ලන්ට දීලා තිබුනා. ඒකෙන් Follw කරන් ගියාලු කට්ටිය. ඔහොම කියලා ඒගොල්ලන් කියලා තිබුනා. ඊට පස්සේ තමා ඒගොල්ලෝ plan

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කලාලු ගහන්න. ඒ කියන්නේ 50 ක් නැත්නම් 80,100 ක් විතර කට්ටිය එකතු වෙලා පොලිස්වලටයි, බන්ධනාගාර වලටයි ඒවට ගහන්න ඒගොල්ලන් හිටියේ කියලත් කිව්වේ.

ප්‍ර : දැන් හාදියාට මේක දැන ගන්න හම්බ වුණේ සහරාන්ගෙන් නේ?

පි : ඊට පස්සේ තමයි සහරාන් ඒවත් කියලා තිබුණේ.

ප්‍ර : එතකොට දැන් එහෙම කරන්න හිතපු සහරාන් මේ අප්‍රේල් මාසේ මුල වෙන කොට 2019 අප්‍රේල් මුල වෙන කොට දැන් මෙහෙම කට්ටිය එක්ක එකතු වෙලා පුපුරුවා ගන්න හැදුවේ හාදියාටත් නොදන්වා හදිස්සියේම එයාට කොහෙන් හරි බලපෑමක් වුණාද?ඔයා දන්නවද බලපෑම කියන එක. Force කරලා කවුරු හරි නැත්නම් කවුරු හරි පිටිපස්සේ හිටියද මෙහෙම කරන්න කියලා?

පි : ඒ කියලා දන්නේ නිතරම එයා අබුබරා, අබ්දුල්ලත් එක්ක තමා කතා කරන්නේ.

ප්‍ර : ඒ කියන්නේ අබුබරා අබ්දුල්ලා කියන්නේ දෙන්නෙක්ද එක්කෙනෙක්ද?

පි : දෙන්නයි. ඒ දෙන්නම කතා කරනවා කතාව අතනට යන්න බලන්නේ යන්න කියලා තමයි කතා කරන්නේ. ඉතින් ඒ විස්තරය අහන කොට එයත් කියන්නේ කොහේද යන්නේ කියලා. ඊට පස්සේ තමා ඒගොල්ලෝ කතා කලේ මං කාමරයේ හිටියොත් ඒගොල්ලෝ සාලේ ගිහිල්ලා කතා කරනවා. Hotel වලට යනවා කියලා කිව්වා. මං හිතුවේ නිකම් ගිහිල්ලා කවුරු හරි හම්බ වෙනවා කියලා. ඒගොල්ලෝ April 15 හරි 10 නෙමෙයි 13 හරි 14 වලදි අබු හම්සාව හම්බ වෙන්න යන්න ඕන කියලා තමා කතා කලේ. ඊට පස්සේ අබු හම්සට කතා කරලා තමයි ඒගොල්ලෝ ආවේ. ඇවිල්ලා කස්තූනුයි සහරානුයි කතා කරලා තිබුණා මේවා හරියට කරන්න ඕනේ ඒ කියන්නේ බලන්න යන තැනකට ඒ වෙලාවට යන්න ඕනේ කියලා. ඒවා කතාවට මං ඉතින් වැඩිය හිතුන්නේ නැහැ මේ වගේ blast කරනවා කියලා.

ප්‍ර : දැන් බැරි වෙලාවත් පොඩ්ඩක් හරි දැන ගන්න හම්බ වුණා නම් හාදියාට මේ සහරාන් මේ වගේ ලොකු විනාශයක් කරන්න හදන්නේ කියලා ඇත්තටම ඔයා මොකද කරන්නේ?

පි : ඒ කියන්නේ මං ඒවට කැමති නැහැ. මං එයාගේ තර්ජනය නිසා තමයි එයත් එක්ක හිටියේ.

ප්‍ර : එයාගේ තර්ජන දැන් 18,19 වෙන කොට තවදුරටත් තිබුණද?

පි : ඒ කියන්නේ

ප්‍ර : අප්‍රේල් මාසේ?

FAIR COMMENT
BY JEZEEM

පි : April මාසේ 18, 19 යන්න කලිනුත් හිටියා ඔයා ඒගොල්ලන්ගේ සහරාන්ගේ අම්මා ඒගොල්ලන් එයාගේ මල්ලී රිල්වාන් ඒගොල්ලන්ට තමා ඔයාව බාර දුන්නේ කියලා. ඒ නිසා මං ඒගොල්ලන්ට ඔයා ඔයාගේ ගෙදර යන්න එපා කියලත් කිව්වා. මට තිබුණ Phone එකත් ගත්තා. ඒ ගිහිල්ලා මල්ලී Phone අරන් දෙයි නැත්නම් එයා එනවා කියලා කිව්වා ආවොත් අරන් දෙනවා කියලත් තමයි කිව්වේ. ඊට පස්සේ 19 Phone එකත් ගත්තා.

ප්‍ර : දැන් හාදියාට තේරෙන විදියට මේ අප්‍රේල් මාසේ 21 සිද්ධිය වුණාට පස්සේ කොළඹ blast වුණාට පස්සේ දැන් ඔය රිල්වාන් සහ අනික් ඔය සෙයිනි ඔය කට්ටිය බලාපොරොත්තු වෙලා හිටියේ මොනවා කරන්නද ඔයාට තේරිච්ච විදියට?

පි : ආපහු ඒගොල්ලෝ තව attack එකක් කරන්න ඕනේ කියලා තමයි කතා කරන්නේ.

ප්‍ර : ඒක ඔයාට ඇහුණද?

පි : ඔව්.

ප්‍ර : කවදද ?

පි : 24.

ප්‍ර : මොනවද ඒකේ කිව්වේ ඒගොල්ලෝ?

පි : ඒකේ කිව්වේ මේ පළවෙනි attack එකට 8 දෙනෙක් ගියා. ඒවා මදි කියලා තමා කතා කළේ. ඊට පස්සේ කිව්වා ගොඩාක් church වලට තමා එහෙම කරන්න ඕනේ අනික් Hotelවල නමුත් ඒ කියන්නේ පොලිස් කැම්ප් වල එහෙමයි කියලා පස්සේ කට්ටිය එකතු කරලා තමයි එහෙම දෙවෙනි attack එක කරන්න ඕනේ කියලා එයාගේ මල්ලී සෙයිනි, රිල්වාන්, රිෂාඩ් එයාගේ අම්මලා තාත්තා සහරාන්ගේ නංගී ඒ වෙලාවේ ඉන්න ඒගොල්ලෝ තමා රිල්වාන්, ෂෙයිනි කතා කළේ.

ප්‍ර :: දැන් හාදියා එහෙම ඒ අය කතා වෙනවා ඔයාට ඇහුණම බය හිතුනේ නැද්ද?

පි : මට බය හිතුනා.

ප්‍ර :: ඉතින් ඔයාට තිබුණානේ දරුවෝ දෙන්නත් එක්ක පැනලා යන්න එහෙනම්?

පි : පැනලා යන්න මට අවස්ථාවක් තිබුණේ නැහැ.

ප්‍ර :: ඒ මොකද?

පි : ඒ ගෙදරින් මං සයින්දමර්දු ගෙදර ඉන්න කොට රිල්වාන් එයාගේ නෝනයි තමයි හිටියේ. ඒ ගෙදරින් නියාස් එළියට ගියොත් lock කරලා එයාගේ නෝනා තමා යතුර තියා ගන්නේ. එයා තමා ගිහිල්ලා දොර අරින්නේ. එහෙමත් මම ඇතුලේ තමයි හිටියේ.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නින්දවුර් ගෙදර ගිහිල්ලත් එහෙමයි ගේ ඇතුලේ තමා එළියට ගියේ නැහැ. 25 තමා කිව්වේ එයාගේ රිල්වාන් ඔයත් යන්න ඔලුවිල් පාලමුනෙටඒ ගේ බලන්න කියලා. ඒ නිසා තමයි ඒගොල්ලෝ මාව එළියට එක්කරගෙන ගියේ. ෂෙයිනිට කිව්වලු බලා ගන්න කියලා.

ප : ඒ කියන්නේ හාදියා ඔයාව නිකම් හිරකරලා වගේද ඒගොල්ලෝ තියාගෙන හිටියේ?

පි : ඔව් එයා කියලා තිබුණලු.

ප : එයා කියන්නේ කවුද?

පි : සහරාන් එයාගේ මල්ලී රිල්වාන්ට කියලා තිබුණලු එයාව එයාගේ, මාව ගෙදරට යවන්නේ නැතුව ඒගොල්ලන්ට බලා ගන්න කියලා.

ප : දැන් ඔය 21 න් පස්සේ ඔයා ඔය සයාන්දමර්දු ඒ පැත්තේ ගෙවල්වල දවස දෙක නැවතිලා හිටියනේ?

පි : ඔව්.

ප : ඔය ඉන්න කොට පොඩ්ඩක් හරි උත්සාහයක් කලේ නැද්ද call එකක්වත් දෙන්න අම්මට ඔයාගේ අම්මට?

පි : එහේ මං ඇහුවා, මගේ අම්මට කතා කරන්න රිල්වාන්ට. එයා කිව්වා දැන් ප්‍රශ්නෙයි කියලා. ගෙදරට ගන්න බැහැ කියලා. අපිත් Normal callගන්නෙ නැහැ කාටවත් කියලා කිව්වේ. මං ඔයාට පස්සේ දෙන්නම් කියලා තමයි එයා කිව්වේ. call අරන් දෙන්නම් කියලා.

ප :: ඒ කියන්නේ ඔයා Try කරපු එක ඒගොල්ලන් කැමති වුණේ නැහැ කියන එකයි call ගන්නවට?

පි : ඔව්.

ප : දැන් 21, 22, 23, 24 වගේ වෙන කොට හාදියාට තේරුණාද, දැනුනද තව ලොකු විනාශයක් වෙන්න යනවා කියන එක පැහැදිලිවම?

පි : ඒ කියන්නේ 24 ඒගොල්ලෝ කතා කලා තව Attack එකක් කරන්න ඕනේ කියලා.

ප : එතකොට සාරත් එක්ක හාදියා මේක ගැන කතා කලේ නැද්ද මේගොල්ලෝ තව දෙයක් කරන්න යනවා නේද කියලා?

පි : සාරා කතා කළා එතකොට මමයි, සාරයි, ෆෙරෝසා, ෂෙයිනිගේ නෝනා ආෆ්රීන් කාමරයේ ඉන්න වෙලාවේ තමයි ඒ Video බලලා කිව්වේ ඒවා මදි තව Attack එකක් කරන්න ඕනේ කියලා සාරා කතා කලේ. ඊට පස්සේ තමා සාරා කිව්වේ ආෆ්රීන්ට ඒකේ කියන්න ඕනේ ඔයාගේ මහත්තයාට තමයි තව කට්ටියව උත්සාහ කරන්න ඕනේ කියලා. අනිත් අයව ලෑස්ති කරන්න කියලා එයා

FAIR COMMENT BY JEZEEM

ගොඩාක් උපදෙස් දුන්නා ෂෙයිනිගේ නෝනාට ආෆ්රීන්ට. එයා ඔයා ගිහිල්ලා ඔයාගේ මහත්තයට කියන්න කියලා:

ප්‍ර : ඒ කියන්නේ හාදියා දැන් ඔයාට තේරෙන්නේ සාරත් මේ විනාශ කරන වැඩ වලට උදව් කලා කියලද?

පි : ඔව්. කොල්ලුපිටියේ ලකී ප්ලාසා එකේ ඉන්න කාලේ April මාසේ එයා Search කළා Google වලින්. ඒ කියන්නේ

ප්‍ර : එයා කිව්වේ කවුද සාරාද?

පි : සාරා. එයා Googleවලින්Search කලා Church ඒ වගේ කෝවිල්වල, ඒ කෝවිල්වල Search කරලා තමා කතා කලේ එයාගේ ගම කලවංචිකුඩි ඒ පැත්තෙන් කෝවිලට අර එක කාලයක් තියෙනවාලු ඒ කාලෙකට ගොඩාක් අය එනවා කියලා. ඒ කාලේ බලලා තමයි ඒගොල්ලන්ට හොඳ shot දෙන්න ඕන කියලා Attack කරන්න ඕනේ ඒ පැත්තෙන් තමයි කියලා එයත් කිව්වේ. මං කිව්වා ඇයි ඔයා එහෙම Search කරන්නේ කියලා ඒ Photos Searchකරලා ඔහොම හරි ගියේ කාමරයට. කස්තුන්ට පෙන්නන්න

ප්‍ර : දැන් හාදියාට පෙනෙන විදියට සාරා දෙමළ කෙනෙක්නේ?

පි : ඔව්.

ප්‍ර : එයා ආගම මාරු කරලා මුස්ලිම් වෙලා මේ විදියට විනාශ කරන්න සූදානම් වුණේ කාගේ උවමනාවටද?

පි : එයා කියන හින්දා මම දන්නේ.එයා කියලා තිබුණා එයා ඉගෙන ගන්න කාලේ Bio ඉගෙන ගන්න Private class වලට ගියා කියලා. ඒ class වලට මුස්ලිම් අයත්. දෙමළ අයත් ඇවිල්ලා ඉගෙන ගන්නවා කියලා. ඒ වෙලාවේ තමා SLTJ කියලා ශ්‍රී ලංකා තවුහිද් ජමාත් කියලා කට්ටිය ඒකේ කෙල්ලෝ හිටියලු. ඒගොල්ලන් එක්ක කතා බහ කරලා අතෙන්ට රණ්ඩු වෙලා ඔයාගේ ආගම බොරු කියනවා කියලා දෙපැත්තම යාළු දෙන්නම කතා කරලා කිව්වලු ඊට පස්සේ සාරා අරගොල්ලන්ට ශ්‍රී ලංකා තවුහිද් ජමාත් ඉන්න කෙල්ලොන්ට කිව්වලු ඔයාගේ ආගම් පොත මට ගෙනල්ලා දෙන්න කියවලා මං බලන්නම් මගේ ආගම හරිද නැත්නම් ඕගොල්ලන්ගේ ආගම හරිද කියලා බලන්න. ඊට පස්සේ ඒ යාළුවා එයාට අපේ ඉස්ලාම් ආගම කුර්ආනය එයාට Translate දෙමළින් එයාට දුන්නලු. ඊට පස්සේ එයා ඒක ගෙදරට අරන් යන්න බය නිසා එයා අනිද්දා ඇවිල්ලා අරන් යන්නම් කියලා Dictionary එකේ උඩ තියෙන උරය ගලවලා තමා කුර්ආනය අරගෙන ගෙදරට ගිහිල්ලා තිබුණලු. ඒකෙන් Bio ඉගෙන ගන්නවා කියලාරෑ වෙලාවට තමා එයාගේ දැනුමෙන් කුර්ආනය ඉගෙන

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ගත්තලු. සතියක්, සති දෙකක්. ඒ ඔක්කොම කියෙව්වට පස්සේ තමයි එයාට හිතුනලු ඉස්ලාම් ආගමට හැරෙන්න ඕනේ කියලා. ඒ වෙලාවෙම අනිද්දා එයාගේ අම්මා එතකොට ඩුබායි හිටියා වැඩ කරමින්. එයාව බලන්නේ එයාගේ ආච්චි. එයාට කියලා ගියාලු මම මෙහෙම තමා Tutorialයනවා කියලා. ඔයා යනවට කමක් නැහැ මුස්ලිම් කට්ටියත් එක්ක යාළුවෙන්න එපා කියලා තමයි කිව්වලු බස් එකේ නගින කොට. ඊට පස්සේ ඒක ගිහිල්ලා යාළුවට හම්බවෙලා දැන් ඔයාලගේ ආගමට මං එන්න ඕනේ මොනවද කොහොමද කියලා එයාගේ යාළුවාගෙන් ඇහුවලු. යාළුවා කිව්වලු මෙහෙම තමයි Link එකේ තියෙනවා මං ඒ Link එක දෙන්නම් ඒ Link එක ඔයා Contact කරන්න කියලා. කොහේද කියලා ඇහුවාම කොළඹ Head Office එකේ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් තියලා තියෙන්නේ කියලා. ඊට පස්සේ තමයි සාරා ඒ Linkඑක අරගෙන කොළඹ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් එකේ අබ්දුල් රාසික් කියලා එක්කෙනෙක් එක්ක කතා කලේ. කතා කරලා කිව්වලු මං ඔගොල්ලන්ගේ ආගමට එන්න ඕනේ දැන් එන්න ඕනේ කියලා කිව්වම කිව්වලු ඔයා කැමැත්තෙන්ද එන්නේ කියලා. ඔව් කියලා කිව්වලු.එහෙනම් ඔයා එන්න ඊට පස්සේ එයාට කිව්වලු සාරාට රාසික් ඔයාගේ Identity යි, Birth certificate හදිස්සි බඩු ඒවා විතරක් අරගෙන එන්න කියලා. කොහොමද එන්න ඕනේ කියලා සාරා ඇහුවලු රාසික්ට. එයා කිව්වලු ඔයා Batticaloae වෙන කල් එන්න කියලා. Batticaloa Gv Private Hospital එක තියෙනවා අතෙන්ට ඇවිල්ලා බහින්න කියලත් කියලා තිබුණලු. අතෙන්ට ගියාලු ඊට පස්සේ කිව්වලු නිල්පාට ත්‍රීවිල් එකක් තියෙනවා කියලා ඒ ත්‍රීවීල් එකෙන් නගින්න කියලා ඒකේ මුස්ලිම් SLTJ Members ලා තමා ගෑනු එක්කෙනයි පිරිමි එක්කෙනෙකුයි ඒ ගොල්ලෝ එයාව එක්කරගෙන පුත්තලමට ගිහිල්ලා ආපහු කොළඹ එකට එක්කරගෙන ආවලු. එක්කන් ඇවිල්ලා තමයි එයාට ඉස්ලාම් ආගමට හරවන්න ඒකේ තියෙන්නේ දොවා කියන්නේ ගාථා වගේ ඒවා කියලා එයාව ඉස්ලාම් ආගමට ආවලු. ඊට පස්සේ කිව්වලු ඒගොල්ලන් වඳින විදිය ගොඩාක් දේවල් මං ඉගෙන ගන්න ඕන කියලා මට ඒ තියෙන class එක කොහේද තියෙන්නේ කියලා SLTJ ඒගොල්ලන් class එකේ දෙනවා මල්වානේ පැත්තේ. එහේ ඉදලා තමයි ඊට පස්සේ සාරා ඉගෙන ගත්තේ. ආපහු එයා ගෙදර ඉඳලා ආවයින් පස්සේ එයාව හොයනවාලු අම්මලා ඒ කියන්නේ පුංචියි, එයාගේ ආච්චියි. අම්මා එතකොට රට හිටියලු. ඊට පස්සේ ඔක්කොම හොයලා එයාගේ number එකට call එකක් ගත්තාලු

FAIR COMMENT BY JEZEEM

ඔයා කොහේද ඉන්නේ කියලා. ඊට පස්සේ කිව්වලු මං මෙහෙම තමා ඉස්ලාම් ආගමට ඇවිල්ලා කියලා කිව්වලු. දැන්මම ඔයා එන්න කියලා අම්මා වහ බෝතලය පෙන්නලා ඔයා දැන්මම එන්න නැත්නම් අම්මා මැරෙනවා කියලා. ඊට පස්සේ එයා කිව්වලු බෑ කියලා, ආපහු මං බොන්නද කියලත් ඇහුවලු. ඊට පස්සේ තමා එයාගේ මාමයි, පුංචියි ආච්චිලා ගිහිල්ලා තිබුණේ කොළඹට. ඇවිල්ලා සාරාව එක්කන් ගියාලු. ඊට පස්සේ ඒ ගිහිල්ලා දවස් 3 කින් පස්සේ අම්මා අබුඩාබි ඉඳලා ඇවිත් තිබුනලු ඇවිල්ලා ඊට පස්සේ හිටියලු අම්මට අසනීප වෙලා හිටියලු. ඒකේ හජ්ජි Festival එක තිබුනලු එදා. හජ්ජි Festival එක ඉවර වෙලා අනිත් දවසේ. අම්මට කිව්වලු අම්මා ඔයාව Private Hospital එකෙන් ඒකේ ඇතුලේ ගිහිල්ලා Doctor එක්කෙනෙක් VP කෙනෙක් channel කරලා මං පෙන්නනම් කියලා ඔහොම ආපහු ගෙදර ඉඳලා එන්න කලින් ආපහු SLTJcall කරලා අබ්දුල් රාසික් contact කරලා කිව්වලු මං ආයේ ආවොත් මං එන්නම් ආයේ මං ගෙදරට එන්නේ නැහැ කවුරු මුකුත් කිව්වත් මං එන්නේ නැහැ කියලා. ඔයා හරියට එනවා නම් ආපහු යන්න එපා අපිට සැරින් සැරේ එහෙන් ගන්න බැහැ කියලා කිව්වලු. ආපහු හරි එනවා කියලා හිතලා අර බඩු එයාගේ Identity යි, Birth certificate ඔක්කොම අරගෙන ආවලු Batticaloa Hospital එකට. ඇවිල්ලා ඒකේ ඇතුලේ ගිහිල්ලා Doctor එක්කෙනෙක් VP කෙනෙක් channel කරලා අම්මට ඇතුලට ගිහිං කිව්වලු අම්මා ඔයා ඇතුලට යන්න මං Washroom යන්නම් කියලා. ඊට පස්සේ අම්මව ඇතුලට දාලා එයා ටක් ගාලා ඇවිල්ලා ඒකෙන් දුවගෙන ගියාලු Batticaloa General Hospital පැත්තට. එහේ කලුවරයිලු එයා ඇවිදින් යනවා අම්මා එයාව හොයාගෙන ත්‍රීවීල් එකෙන් පිටිපස්සෙන් ගියාලු. ඒත් අම්මා දැක්කේ නැහැයිලු එයාව. ඔහොම කියලා තමයි එයා බස් එකේ නැගලා ගියාලු. දෙන්නෙක් ඇවිල්ලා හිටියාකියලා එයා කිව්වේ. ඊට පස්සේ තමා සිකුරාදා දවසේ කොළඹ SLTJ එකට ඇවිල්ලා හිටියලු. සිකුරාදා දවස 12 ට අපි කට්ටිය ඔක්කොමලා එදා Off වෙලා වඳින්න අපේ විශේෂ දවස සිකුරාදා ඒ දවස්වල කට්ටිය ඔක්කොම කඩවල් ඔක්කොම වහලා පල්ලියට ඇවිල්ලා වඳින්න වෙලාව එයාට කිව්වලු ඔයා පොඩ්ඩක් උඩට එන්න කියලා සාරාට SLTJ රාසික් කියලා එක්කෙනෙක් කියලා තිබුණලු. ඊට පස්සේ රාසික්ගේ අම්මා කවුරු හරි හිටියලු පල්ලියේ එයත් එක්ක තමා කතා බහ කරලා හවස 4, 4 ½ වෙන කොට SLTJ පල්ලි එකේ Members ලා 5 දෙනෙක් හිටියලු කොල්ලෝ set එක.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඒගොල්ලන්ට රස්මිනුයි රාසික් ඇහුවලු අර කොල්ලෝ 5 දෙනාට දෙමළ එක්කෙනෙක් ඉස්ලාම් ආගමට ඇවිල්ලා ඉන්නවා එයාට කවුරු හරි උදව් කරන්න එයා මේ දෙපාරක් ඇවිල්ලා තියෙන්නේ එයාව කවුරු හරි බඳින්න කැමතිද කියලා. පස්දෙනාම මුහුණ බල බල පස්සේ කිව්වලු කස්තුන් තමා බඳින්නේ කියලා කිව්වලු. ඊට පස්සේ කස්තුන් කැමතියි කියලා කිව්වලු. ඒ වෙලාවේම SLTJ රාසික් කියලා එක්කෙනෙක් ඒ වෙලාවට කස්තුන්ට එයාට මොනවා හරි දීලා තමා අපි ඒ කට්ටිය ඒ වෙලාවේ Register කරන්නේ. එතකොට එයාට සල්ලි තිබුනලු රාසික් හෝ රස්මින් කියලා එක්කෙනෙක් සල්ලි 5000 ක් දීලා තමා ඒ Register කලේ. කරලා ඒගොල්ලන්ට වෙන ගෙයක් මල්වානේ පැත්තේ බලලා තමා එහේ හිටියලු. එහේ ඉන්න කාලේ තමයි මල්වානේ ඉඳලා ආපහු මර්දමුන පැත්තේ ගිහිං තිබුණලු. මරදමුනේ ඉඳලා ආපහු එයා කිව්වලු අම්මා අබුඩාබියට දෙන්නම ගන්නවා කියලා. සාරාව විතරයි පාස්පෝට් ඔක්කොම කරගෙන ගත්තා කියලා කිව්වේ. කස්තුන් ගේ Passport යි සාරාගේPassportයි හදලා තමයි තිබුනලු. ඒ වුනාට අම්මා කිව්වාලු කස්තුන් Passportඑකේ ප්‍රශ්නයක් ඉස්සෙල්ලා ඔයා එන්න කියලා. ඊට පස්සේ සාරාව මාස 3 කට වීසා හදලා තමා ගත්තේ අබුඩාබියට. එයා එහේ ගිහිල්ලා හිටියේ කියලා කිව්වේ.

ප්‍ර : දැන් හාදියා ඔය කියන විස්තරය අනුව මේ ඔක්කොම හාදියාට මේ සාරා සැරින් සැරේට කියපු දේවල්නේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට සාරා මේ සහරාන් සහ මේ එයාගේ කට්ටිය බෝම්බ පුපුරුවා ගන්න යනවා කියන එක අප්‍රේල් 21 න් පස්සේ ඔයාට සාරාගෙන් දැන ගන්න ලැබුණද සාරා මුල ඉදලා දැනගෙන හිටියා කියලා අඩුම ගානේ මාර්තු මාසේ 25 න් පස්සේ?

පි : එයා කිව්වා එයා දන්නවා කියලා ඒ වෙලාවට English වලින් එයාට English පුළුවන් සාරට. ඒ බෝම්බ හදපු විදියත් සමහර අය Englishවවන කස්තුන්ට අමාරු නිසා එයාට අහනවලු මේක කොහොමද කියලා. එයත් එයාට කියනවලු මෙහෙමයි කියලා. ඊට පස්සේ කස්තුන් තමා ඒවා හැදුවේ කියලා 21 blast එකෙන් පස්සේ එයා කිව්වේ. එයා දන්නවලු කොහේද attack කරනවා කියලා එහෙම කියලා පස්සේ තමා ඒ විස්තරය එයා කිව්වේ.

ප්‍ර : ඒ කියන්නේ කවදද එයා ඒවා දැන ගත්තා කියලා ඔයාට කිව්වේ?

FAIR COMMENT BY JEZEEM

පි : මටත් කිව්වේ ඒ කියන්නේ මාර්තු මාසේ අන්තිම දවස්වල ඉඳලා ඒ කියන්නේ April ඒගොල්ලෝ පල්ලි වල church වල බලන්න ගියා. හෝටල්වල බලන්න ගියා කියලා එයත් කිව්වා.

ප්‍ර : එයත් ගිහිල්ලද බලන්න?

පි : එයා ගියේ නැහැ, පිරිමි අය විතරයි ගිහිං තියෙන්නේ කියලා.

ප්‍ර : එතකොට හාදියා ඔයා දැනන් හිටියද එක්කෝ නැත්නම් සාරා පස්සේ ඔයාට කිව්වද සාරට ඉන්දියාවේ ඉඳලා කවුරු හරි යාළුවෝ නිතර කතා බහ කරලා මේ විස්තර ගැන ඇහුවා කියලා?

පි : ඒ ගැන විස්තර ඇහුවා කියලා එයා මුකුත් කිව්වේ නැහැ. ඉන්දියාවල කට්ටියත් ඉන්නවා කියලා එයා කියනවා. එයාගේ FB වලින් එයා IS ගැන සම්බන්ධ ගොඩක් දේවල් තමයි FB වලදාන්නේ. ඒකට ගොඩාක් අය comment කරනවාlikes එහෙම දානවා. ඉන් පස්සේ messenger වලින් එයා message කරනවා.

ප්‍ර : එයාට පිටරට අයත් එක්ක සම්බන්ධකම් තිබුණ බව ඔයා දන්නවා ඒ කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : මගේ අන්තිම ප්‍රශ්නේ, දැන් ඔක්කොම වෙලා ඉවරනේ?

පි : ඔව්.

ප්‍ර : දැන් හාදියා මේ වෙච්ච දේ ගැන මොනවද හිතන්නේ? මේ සහරාන් සහ එයාගේ මේ ක්ලික් එක එයාගේ යාළුවෝ ටික එක්කහු වෙලා මේ කරපු දේ ගැන හාදියා මොකද හිතන්නේ?

පි : මං හිතන්නේ ඒගොල්ලෝ කරපු වැරදි කියලා.

ප්‍ර : මේක ගැන අඩුම ගානේ සති 3කට, 4 කට ඉස්සර ඒ කියන්නේ අප්‍රේල් 21 ට සති 3, 4 කට ඉස්සෙල්ලා හරි හාදියා දැනන් හිටියා නම් සාරා කිව්වෙත් නැහැනේ ඒ දවස්වල?

පි : නැහැ.

ප්‍ර : දැනන් හිටියා නම් ඔයා මොකද කරන්නේ?

පි : මං ඒගොල්ලන් එක්ක ඒ කියන්නේ 2019 February මාසේ ඒගොල්ලෝ මෙහෙට ආවට පස්සේ කටුවාපිටියට සතියක් විතර එහේ ඉවසගෙන හිටියා ගෙදරට කොහොම හරි contact කරගෙන දෙයි කියලා. නමුත් Phone එකක් අරන් දුන්නා මට නෙට් සිම් දාලා තමයි දුන්නේ. ඉන් පස්සේ ඔහොම බලා ගෙන හිටියා මාස 2 ක් වෙනවා මට එළියට යන්න අවස්ථාවක් තිබුනේ නැහැ ඒගොල්ලෝ කතා බහ කරන විදියට බලන කොට ලොකු ලොකු දේවල් තමා කතා කලේ. අරයව Shoot කරන්න ඕනේ. මෙයාව Shoot කරන්න ඕනේ, අරයව බලන්න යනවා කියලා තමයි කතා

Presidential Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

බහ කරන්නේ. ඒ නිසා මට එළියට යන්න හරි අවස්ථාවක් තිබුනේ නැහැ. ඒ වෙලාවේ එහෙම තිබුණොත් මම එළියට කොහොම හරි එළියට ගිහිල්ලා ඒ ගැන විස්තරය මම කියනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප : හාදියා මගේ එක ප්‍රශ්නයක් තියෙනවා අවසාන වශයෙන්, අර April 21 ට පස්සේ ඔයා රිල්වාන් එක්ක එහෙම හිටියානේ?

පි :: ඔව්.

ප : TV ත් බැලුවද සැරින් සැරේට?

පි : TV තිබුණේ නැහැ.

ප : රිල්වාන් කොයි හරි වෙලාවක කිව්වද මේ තවත් තැනක පුපුරවන්න ගියා ඒක වුණේ නැහැ කියන එක?

පි : ඒ කියන්නේ?

ප : ඒ කියන්නේ තවත් හෝටලයක පුපුරන්න ගියාට පිපිරුණාද නැද්ද කියන කතාවක් රිල්වාන් කතා කෙරුවද?

පි : ඒ කියන්නේ

ප : ටජ් හෝටලයේ?

පි : එක්කෙනෙක් ගියාලු

ප : මොකක්ද රිල්වාන් කිව්වේ ඒ ගැන ?

පි : ඒ කියන්නේ ඔක්කොම එක වෙලාවට තමා Time set කරාලු. ඒ කියන්නේ රිල්වාන් ඒවා මට හරියට පැහැදිලි කලේ නැහැ. සාරා තමයි ඒවත් කිව්වේ.

ප : මොකක්ද set කරපු Time එක?

පි : ඒ ඔක්කොම 8.45 ට Church වල ආරාධනාවක් තියෙනවා කියලා. ඒ ආරාධනා වෙලාවට තමා ගහන්න ඕනේ කියලා 8.45 ට ඒ වෙලාව තිබුණලු. ඒ වෙලාවට තමයි ඔක්කොමලට Watch එහෙම අරගෙන හදලා තිබුණා කියලා කියලා තිබුණේ.

ප : මොනවද හදලා තිබුණේ?

පි : වෙලාවට පුපුරන්න.

ප : හා එකම වෙලාවට පුපුරන්න කතා කරලා තිබ්බේ?

පි : ඔව්.

ප : ඊට පස්සේ?

පි : ඊට පස්සේ තමයි සාරා කිව්වා එක්කෙනෙක් තව Hotel එකකට ගියා ඒකෙන් තාම මුකුත් දාලා තිබුනේ නැහැ FB එකෙන් කියලා. ඊට පස්සේ එයාගේ නෝනා කවුද කවුද නැහැ තව එක්කෙනෙක්

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කොළඹ එක්කෙනෙක් කියලා තමා කිව්වේ. ඊට පස්සේ තමා දෙහිවල හෝටලයේ පිපිරුනා කියලා කිව්වේ.

ප්‍ර : එතකොට සාරා දැනගෙන හිටියද අර ටාජ් හෝටලයට පුපුරවන්න ගිය එක්කෙනා ගැන?

පි : ඒ ඉස්සෙල්ලා කට්ටිය බලන්න ගියා කියලා කිව්වා. ගාල්ලේ පැත්තේ බීච් සයිඩ් එකේ හික්කඩුවේ කොහේද. ඒ පැත්තේ කොළඹබීච් සයිඩ් එකේ ගෝල් ෆේස් පැත්තේ. ඒ වගේ ගොඩාක් හෝටල්වල බලන්න කට්ටිය ගියාලු. ඒ වෙලාවට ලොකු ලොකු Hotel එක තමයි බලන්න ගියා කියලා එයා කිව්වේ.

ප්‍ර : හාදියා තව එක ප්‍රශ්නයක් තියෙනවා හාදියා දන්නවද මේ සහරාන්ගේ කණ්ඩායම මේ කතෝලික පල්ලි සහ කතෝලික මිනිස්සු ඇයි ඉලක්ක කර ගත්තේ මේ ප්‍රහාරයට?

පි : පස්සේ, ප්‍රහාරයට පස්සේ මම දැන ගත්තේ. නිවුස්ලන්ඩ් වෙලේ අපේ මුස්ලිම් කට්ටිය Christian කට්ටිය තමයි ඒගොල්ලන් තමා මුස්ලිම් කට්ටිය මරලා තියෙනවා කියලා තමා ඒ නිසා ඒගොල්ලෝ ඒ රටවලින් අපේ මුස්ලිම් මිනිස්සු මරලා මෙහේ ලංකාවට ඇවිල්ලා හොඳට Fun එකේ ඉඳලා යනව කියලා එයා කියනවා. ඒ නිසා තමා කතෝලික කියන්නේ ඒකෙත් කොටසක් තියෙනවා එයා කියන්නේ අපේ මූසානබී, ඒගොල්ලෝ ඊසස් කියලා ඒගොල්ලෝ අර පිළිම වගේ හදලා ඒගොල්ලොව අදහනවා කියලා. ඒ නිසා තමයි ඒගොල්ලන් එක්ක ගහන්න ඕන කියලා එයා කතාව කිව්වේ. ඒ කියන්නේ පස්සේ ප්‍රහාරයට පස්සේ එයාගේ මල්ලි ෂෙයිනි කියලා තිබුණේ.

ප්‍ර : සාරා පස්සේ වෙලාවක කිව්වද මේ බෝම්බ ප්‍රහාරය එල්ල කරන්න ගිය පුද්ගලයින් සමඟ එයාට contact කරන්න පුළුවන් කමක් තිබ්බා කියන එක, ඒ කියන්නේ ත්‍රීමා ඇප් එකෙන් ඒ කට්ටියට කතා කරන්න telephone එකෙන් එදා 21 වෙනිදා?

පි : 21 වෙනිදා

ප්‍ර : උදේ, සාරාට ඒ බෝම්බ දාන්න ගිය අයට කතා කරන්න පුළුවන්කමක් තිබ්බද අර ත්‍රීමා ඇප් එකෙන්?

පි : එයා 21 උදේ එයාගේ husbandකස්තුන් එක්ක කතා කලා කියලා එයා කිව්වේ. කතා කරලා තමා ඉන් පස්සේ Phone එකේ ඔක්කොම Analyze කරලා තමයි යනවා කියලා අන්තිමට කතා කරලා කිව්වලු කියලා කිව්වේ.

ප්‍ර : අනිත් අයට කතා කෙරුවද නැද්ද කියලා කිව්වද?

පි : ඒවා මං දන්නේ නැහැ.

****

Prosecution Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

දැන් වේලාව ඔක්තෝම්බර් 24 වන සෙනසුරාදා උදෑසන විනාඩි 0035 යි.
සාක්ෂිකාරිය මුදා හරිමි.
කොමිෂන් සභාවේ කටයුතු අද දින පෙරවරු 10 තෙක් කල් තබනවා.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM